# PROCEEDINGS OF THE
# NATIONAL ARCHAEOLOGY SYMPOSIUM
# 2022



DEPARTMENT OF ARCHAEOLOGY

# Proceedings of the National Archaeology Symposium 2022

**Department of Archaeology**
**Colombo 07**

**Proceedings of the**
**National Archaeology Symposium – 2022**

© **Department of Archaeology**
ISSN – 2386-1290

**Consultancy**
Prof. Karunasena Hettiarachchi
Prof. A.A.D. Amarasekara
Prof. P.B. Mandawala
Dr. Malini Dias
Dr. Senarath Dissanayake
Dr. Nimal Perera
Dr. Arjuna Thanthilage

**Editorial Board**
Prof. Anura Manatunga
Archt.J.D. Wijethilake
Senior Lecturer Kalyani Wijesundara
Senior Lecturer Kithsiri Mihira Bandara
Senior Lecturer Dilini Gunarathne

**Managing Editors**
A.M.A. Dilhani Dilrukshika
Anuradha Kaluarachchi
Ajantha Saman Kumari
Nishanthi Ranasinghe
Wasana Sirimalwaththa
Kalpa Asanga
Sameera Henerath
L.D. Hettiarachchi

**Layout Editing**
Madhuka Neranjali Sandamali

**Cover Page**
Arjuna Samaraweera

**Special Assistance**
Thilak Wasantha Bandara
Chamila Pathirana

**Published by**
Department of Archaeology
Sir Marcus Fernando Mawatha
Colombo 07

# Authors Descriptions


| | | |
|---|---|---|
| **1.** | ඩී. ඒ. සසිඳු දිල්ශාන් වීරසිංහ | පුරාවිද්‍යා විශේෂවේදී (සිව්වන වසර)<br>ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| **2.** | මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි | ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| **3.** | අයි.එම්.ටී. ඉලංගසිංහ | කථිකාචාර්ය<br>චිත්‍ර කලා අධ්‍යයනාංශය<br>දෘශ්‍ය කලා පීඨය<br>සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය |
| **4.** | එච්. දිනේත්‍රා තරංගනී | සංවර්ධන නිලධාරී<br>ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය (බස්නාහිර)<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| **5.** | පූජ්‍ය කැලේගම ජිනරතන හිමි | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය<br>අනුරාධපුරය |
| **6.** | ගාමිණී සමරනායක | විශ්‍රාමලත් කෞතුකාගාර ස්ථානභාර නිලධාරී<br>මිහින්තලේ |
| **7.** | පී.ජී.සී.එම්.ටි.බණ්ඩාර | බාහිර කථිකාචාර්ය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| **8.** | **H. M. C. Mendis** | **Independent Researcher**<br>**Editor-Department of Archaeology** |
| **9.** | ඩබ්. එම්. කල්‍යාණි විජේසුන්දර | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සිංහල අධ්‍යයනාංශය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| **10.** | දීපාංජලී ඇල්ලෙපොළ | පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී<br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව<br>බදුල්ල |
| **11.** | මැදගේ පාලින්ද රසාංගිත් මැදගේ | බාහිර කථිකාචාර්ය<br>දෘශ්‍ය කලා සහ සැලසුම්කරණය සහ ප්‍රාසාංගික<br>කලා අධ්‍යයන ඒකකය<br>මානව ශාස්ත්‍ර පීඨය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| **12.** | සඳමාලි කමල්චන්ද්‍ර බද්දේගම | බාහිර කථිකාචාර්ය<br>ලලිත කලා අධ්‍යනාංශය<br>දෘශ්‍ය කලා සහ සැලසුම්කරණය සහ ප්‍රාසාංගික<br>කලා අධ්‍යයන ඒකකය<br>මානව ශාස්ත්‍ර පීඨය |
| **13.** | පුරාවිද්‍යාඥ මංජුල කරුණාතිලක | කෞතුකාගාර භාරකරු<br>ශ්‍රීමත් ජෝන් කොතලාවල අනුස්මරණ<br>කෞතුකාගාරය,<br>කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය |

14. එස්. ආර්. එල්. රෝසා
ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ
බාහිර කථිකාචාර්ය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

15. කසුන් රුහිරු මධුසංක
අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී
මානව වංශ විද්‍යා අංශය
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

16. ඩබ්.එම්. චින්තක සඳරුවන්
සංවර්ධන නිලධාරී
වාස්තුවිද්‍යා සංරක්ෂණ අංශය
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ප්‍රධාන කාර්යාලය

17. මල්ෂා මධුශානි රණසිංහ
සංවර්ධන නිලධාරී
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
බදුල්ල

18. ආචාර්ය දම්මි බණ්ඩාර
පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී
අභිලේඛන හා නාණක විද්‍යා අංශය
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

19. නර්මදා දක්ෂිණි විතානගේ
සහකාර කථිකාචාර්ය
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

**20. W.L.A. Buddisha Jayashan Weerasuriya**
**Temporary Lecturer**
**Department of Archaeology**
**University of Peradeniya**

21. පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි
සංවර්ධන නිලධාරී
අභිලේඛන හා නාණක විද්‍යා අංශය
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

22. තනුර දයානන්ද
පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී
අභිලේඛන හා නාණක විද්‍යා අංශය
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

23. පූජ්‍ය බැරගම සද්ධානන්ද හිමි
අධ්‍යයනාංශ ප්‍රධාන
පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

24. නිලංක උදාර ජයරත්න
පුරාවිද්‍යා නිලධාරී
අභයගිරි ව්‍යාපෘතිය
මධ්‍යම සංස්කෘතික අරමුදල
අනුරාධපුරය

25. චමෝද් සඳරුවන්
පුරාවිද්‍යා (විශේෂ) උපාධි (උපාධි අපේක්ෂක)
පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

26. සුභසිංහ ආරච්චිගේ ප්‍රසන්න
සංවර්ධන නිලධාරී
මධ්‍යම පළාත් සභාව

27. ටී.කේ.ඊ. සෙනෙවිරත්න
පුරාවිද්‍යා (විශේෂ) උපාධි (උපාධි අපේක්ෂක)
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

28. ඒ.එච්.එම් ජනක මහේෂ් අතපත්තු
අභ්‍යාසලාභී උපාධිධාරී

යාපහුව පුරාවිද්‍යා කලාප කාර්යාලය

29. ආර්.එම් ලක්මාල් රත්නායක
අභ්‍යාසලාභී උපාධිධාරී
යාපහුව පුරාවිද්‍යා කලාප කාර්යාලය

30. චම්පා වික්‍රමආරච්චි
පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී
අභිලේඛන හා නාණක විද්‍යා අංශය
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

31. පී.ඩබ්ලිව්.සී.කේ. රන්තිලිණී
සංවර්ධන නිලධාරී
රසායන සංරක්ෂණ අංශය
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
මහනුවර

32. එච්.කේ. දීපිකා දිල්හානි අත්තනායක
පුරාවිද්‍යා (විශේෂ) උපාධි (උපාධි අපේක්ෂක)
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**මෙම ප්‍රකාශනයෙහි ඇතුලත් පත්‍රිකාවල අන්තර්ගතයේ වගකීම ඒ ඒ ලේඛකයා සතුවේ.**

**Authors bear the responsibilities of the contents of their papers in this publication**.

# Contents

**Page**


**1.** **මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවලට අයත් ප්‍රකාශිත ශිලාලේඛන කිහිපයක් නැවත කියවීම** 1
ඩී. ඒ. සසිඳු දිල්ශාන් වීරසිංහ
මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි

**2.** **පෙණ ගොබ රාශියකන් යුතු නාග රුව චිත්‍රණය කිරීමේ දී ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා විශද කළ නිර්මාණ ශක්‍යතාවථ (වසම්මලේ හා ගිරාපොකුණුහෙල බිතු සිතුවම් ඇසුරෙන්)** 10
අයි.එම්.ටී. ඉලංගසිංහ

**3.** **වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු පිළිබඳ ලියූ ප්‍රශස්ති කාව්‍යයක්** 23
එච්. දිනේත්‍රා තරංගනී

**4.** **අනුරාධපුර ගල්කඩවල අප්‍රකාශිත ටැම් ලිපිය පිළිබඳ විමර්ශනයක්** 34
මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි
පූජ්‍ය කැලේගම ජිනරතන හිමි
ගාමිණී සමරනායක

**5.** **අනුරාධපුර යුගයේ දේශිය නාට්‍ය කලාව පිළිබද පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආශ්‍රයෙන් සිදුකරන අධ්‍යයනයක්** 39
පී.ජී.සී.එම්.ටි.බණ්ඩාර

**6.** **LiDAR and its Application for Archaeology in Sri Lanka: A Case Study from Balana Fort** 49
H. M. C. Mendis

**7.** **මහියංගණ රජ මහා විහාරය සතු ලෝහ පත්තිරුවල අන්තර්ගතය සහ ප්‍රකාශන විධික්‍රමය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයයනයක්** 58
ඩබ්. එම්. කල්‍යාණි විජේසුන්දර
දීපාංජලී ඇල්ලෙපොළ

**8.** **යුරෝපීය යටත් විජිතකරණය සහ දේශීය ගෘහ නිර්මාණ කලාව** 69
මැදගේ පාලින්ද රසාංගිත් මැදගේ

**9.** **දොඩන්දූව ශෛලබිම්බාරාමය විහාරස්ථානයේ සිතුවම්හි නිරූපිත යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්** 80
සඳමාලි කමල්චන්ද්‍ර බද්දේගම

**10. ගන්නෑ පත්තුවේ ශිලා ලේඛන පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්** **90**
පුරාවිද්‍යාඥ මංජුල කරුණාතිලක

**11. සංස්කෘතික උරුම කළමනාකරණයේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටලු: 1940 අංක 09 දරන පුරාවස්තු ආඥාපනත ප්‍රමුඛ ව්‍යවස්ථාපිත නීති ඇසුරින්** 104
එස්. ආර්. එල්. රෝසා

**12. ස්ත්‍රීත්වය, මාතෘත්වය, හා ප්‍රාග් ඓතිහාසික සංකේත : රාවණා ඇල්ල කැණීමෙන් හමුවූ ශෛලමය මූර්තියක් ඇසුරෙන් සිදු කළ ප්‍රජානන පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්** **113**
කසුන් රුහිරු මධුසංක

**13. නූතන ස්තූප සංරක්ෂණය; පුරාවිද්‍යාත්මක අගයන් ආරක්ෂා කරමින් කාලීන අවශ්‍යතා සපුරා ගැනීම** **118**
ඩබ්.එම්. චින්තක සඳරුවන්

**14. පුරාවිද්‍යා උරුම කළමනාකරණය සඳහා මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම** **126**
මල්ෂා මධුශානි රණසිංහ

**15. පූර්ව බ්‍රාහ්මී "අ" අක්ෂරයෙහි සම්මත රූපය නූතන තාක්ෂණය භාවිතයෙන්** **132**
ආචාර්ය දම්මි බණ්ඩාර

**16. ඓතිහාසික ගනේඋඩ රජමහා විහාරයේ සඳකඩපහණ පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්** **139**
නර්මදා දක්ෂිණි විතානගේ

**17. Re-reading of the Sigiriya Lion** **147**
W.L.A. Buddisha Jayashan Weerasuriya

**18. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් වෙහෙරබැදිකන්ද ආරාම සංකීර්ණයෙහි ඇති අප්‍රකාශිත ගිරි ලිපි පිළිබඳ අධ්‍යයනයක්** **154**
පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි
තනුර දයානන්ද

**19. උතුරු මැද පළාතෙන් හමු වූ අප්‍රකාශිත ශිලා ලේඛන කිහිපයක් පිළිබඳ අධ්‍යයනයක්** **161**
පූජ්‍ය බැරගම සද්ධානන්ද හිමි
පූජ්‍ය ගම්මහේගේවැව අමිත හිමි
ගාමිණී සමරනායක
තිලංක උදාර ජයරත්න
චමෝද් සඳරුවන්

**20. මහනුවර රාජධානියේ යුද හේවායින් හා එහි සංවිධාන ව්‍යූහය පිළිබඳව තුලනාත්මක අධ්‍යයනයක්** 169
සුභසිංහ ආරච්චිගේ ප්‍රසන්න

**21. පස්යොදුන් රට ස්තූප පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්** 180
ටී.කේ.ඊ. සෙනෙවිරත්න

**22. යාපහුව රාජධානියේ පුරාණ වැව පිළිබඳව වාරි පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්** 189
ඒ.එච්.එම් ජනක මහේෂ් අතපත්තු
ආර්.එම් ලක්මාල් රත්නායක

**23. අම්පාර වෙහෙරගල ආරණ්‍ය සේනාසන අප්‍රකාශිත සෙල්ලිපි පිළිබඳ අභිලේඛනාත්මක අධ්‍යයනයක්** 199
චම්පා වික්‍රමආරච්චි
ආචාර්ය දම්මි බණ්ඩාර

**24. පුරාවිද්‍යා උරුමයන් සංරක්ෂණය උදෙසා නැනෝ තාක්ෂණයෙහි උපයෝගීතාව** 212
පී.ඩබ්ලිව්.සී.කේ. රන්තිලිණි

**25. රත්නපුර දිස්ත්‍රික්කයේ වලව් පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් ඃ මහවලතැන්න වලව්ව, මොරහැල උඩවෙල වලව්ව, ඉද්දමල්ගොඩ වලව්ව, එලමල්පේ වලව්ව, විකිලිය වලව්ව** 224
එච්.කේ. දීපිකා දිල්හානි අත්තනායක


# මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවලට අයත් ප්‍රකාශිත ශිලාලේඛන කිහිපයක් නැවත කියවීම

**ඩී. ඒ. සසිඳු දිල්ශාන් වීරසිංහ**
**මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි**

ඓතිහාසික සන්දර්භයන් පෝෂණය කිරීමෙහිලා ශිලා ලේඛන මූලාශ්‍රයෝ අතිශය වැදගත් වෙති. ක්‍රිස්තු පූර්ව තෙවැන්නේ පටන් රචනා වූ ශිලා ලේඛන සම්ප්‍රදායක් අප සතු වීම එකී සන්දර්භයන් ප්‍රතිනිර්මාණය පූරණය කරයි. ශිලා ලේඛන නිවැරදිව කියවීම සහ අර්ථ නිරූපණ ඉදිරිපත් කිරීම ඉතා සියුම්ව සිදු කළ යුත්තේ එම නිසාවෙනි. Inscription of Ceylon Vol.I (IC) සහ Epigraphical Notes Nos. 1-18 ග්‍රන්ථයන්හි ප්‍රකාශිත ශිලා ලේඛන නිවැරදි කිරීම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණයි. එහිදී මහනුවර දිස්ත්‍රික්කයට අයත් බඹරගල සහ මොලගොඩ ලිපිත්, මාතලේ දිස්ත්‍රික්කයට අයත් අලුවිහාරේ, පිදුරංගල, දඹුල්ල, හුලංගමුව හා කිඹිස්ස යන ස්ථානවල වූ ලිපිත් නිවැරදි කරන්නට විය. මේ අතරින් අක්ෂර වරදවා හඳුනා ගැනීම්, වචන මඟ හැරීම්, ශිලා ලේඛනයේ ප්‍රකාශිත පෙළ හා නොගැළපීම්, ශිලා ලේඛනයේ නොමැති අක්ෂර කියවීම් හඳුනා ගැනීමට හැකි විය. ක්ෂේත්‍ර ගවේෂණ, අභිලේඛන ග්‍රන්ථ සහ ක්ෂේත්‍රයේ ප්‍රාමාණික උගතුන්ගේ උපදෙස් මත මෙම ශිලා ලේඛනවලට අදාළ වඩා සාධාරණ කියවීම ඉදිරිපත් කිරීමට හැකි විය. ඒ අනුව මෙම සම්මන්ත්‍රණ පත්‍රිකාව වර්තමාන සහ අනාගත පර්යේෂකයන්ට අගනා මූලාශ්‍රයක් වනු ඇත.

**මොලගොඩ**

පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මොලගොඩ ග්‍රාම නිලධාරී වසමෙහි කොටමුදුන්ගල රජමහා විහාරය (මොලගොඩ රජමහා විහාරය) පිහිටා ඇත. මෙහි පූර්ව බ්‍රාහ්මී එක් ශිලා ලේඛනයකි. ලිපිය සටහන් ලෙනෙහි පියස්සේ ඉදිරිපස කොටසක් ගැලවී වැටී ඇති අතර, ලෙන් ලිපිය අද වනවිට දැක ගත නොහැකිය (ඡායාරූප අංක 01). නමුදු කටාරමක් පැවති බවට සාධක පමණක් ශේෂව පවතී. ලෙන් ලිපියේ **පරුමක ශුරි පුතහ** යන්නට පරව ඇති **පරුමක** යන්න ප්‍රකාශිත පෙළෙහි දක්වා නොමැත. ඒ අනුව මොලගොඩ ලෙන් ලිපිය මෙලෙස පූරණය විය යුතුය.





**(Paranavitana,1970:PL.LXXXIX,No.812)**

පෙළ: පරුමක-ශුරි-පුතහ පරුමක-බමණ-දතකහ ලෙණෙ ශගශ

අර්ථය : ප්‍රමුඛ සූරියගේ පුත් ප්‍රමුඛ බ්‍රාහ්මණ දත්තගේ ලෙන සංඝයාටය

**කිඹිස්ස**

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉනාමළුව ග්‍රාම නිලධාරී වසමේ පොතාන ශ්‍රී උපුලාදේවි පුරාණ ගල්ලෙන් රජමහා විහාරය පිහිටා තිබේ. මෙහි ඇති පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනය Epigraphical Notes Nos.1-18හි ප්‍රකාශයට පත් කර ඇත. ලිපියේ පළමුව සඳහන් **පරුමක තිශ** (Dias1991:No.13,No.9) යන්න අතර පිහිටි **බක** (ඡායාරූප අංක 02) යන්න කියවා නොමැත. ඒ අනුව කිඹිස්ස ලෙන් ලිපියේ පෙළ පහත පරිදි සකස් විය යුතුය.




**(Ibid)**

**පෙළ:** පරුමක බක-තිශ පුත පරුමක ති[ශ] ලෙණෙ

**අර්ථය** : ප්‍රමුඛ බක තිස්ස[ගේ] පුත්‍ර පරුමක තිස්ස[ගේ] ලෙන

**දඹුල්ල**

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාගොල්ල ග්‍රාම නිලධාරී වසමෙහි රංගිරි දඹුලු රජමහා විහාරය පිහිටා ඇත. **'පරුමක-චුඩශ ලෙණෙ ශුද[ශනෙ]'**(Paranavitana 1970:No.856) යනුවෙන් පරණවිතාන සඳහන් කළ ද **ශුදශනෙ** ලෙස කියවිය හැකි අක්ෂර ස්පර්ශ ලාංඡන පිටපතෙහි නොවේ. Dambulla Project - First Archaeological Excavation and Reseach Reportහි ප්‍රකාශයට පත් නොවූ ශිලා ලේඛනයක් ලෙස දක්වා ඇති එක් පිටපතක ඉහත දැක්වූ පිටපතෙහි අක්ෂර, ලක්ෂණ, අක්ෂර අතර පරතරය හා සමානතාවක් දක්වයි. පරණවිතානගේ ස්පර්ශ ලාංඡනයට හසු නොවූ ලිපියේ අග කොටසක් දඹුල්ල ව්‍යාපෘතිය මඟින් කළ ගවේෂණයේදී අනාවරණය කරගත් අතර, එය නව ශිලා ලේඛනයක් ලෙස පළකර ඇත. නමුත් මේ ලිපි ද්විත්වයම එකකි.



**(Ilangasinha1988:PL.43)**

**පෙළ:** [ප]රුමක චොඩග ලෙණෙ [ච]තු [දිශ] ... ශගශ

**අර්ථය:** ප්‍රමුඛචෝඩගේ ලෙන සතර දෙසින් පැමිණෙන සංඝයාට (Ilangasinha1988:No.27)

**අලුවිහාරේ**

මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අලුවිහාරේ ග්‍රාම නිලධාරී වසමෙහි අලුවිහාර රජමහා විහාරය පිහිටා තිබේ. පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි හයක් මෙහි වන අතර ඉන් තුනක් Inscription of Ceylon Vol.Iහි ප්‍රකාශයට පත් කර තිබේ. අලුවිහාරයේ පහළ ලෙන් විහාරයේ **(උපශක)-ශුමන**ගේ සහ **දේවතෙර**ගේ (Paranavitana 1970:No.820) නාමයන් කොටා තිබේ. ප්‍රකාශිත පෙළෙහි සඳහන් ශුමන යනු උපාසකයකු නොව භික්ෂූන් වහන්සේ නමක බව ශිලා ලේඛනය පිළිබඳ පරීක්ෂා කිරීමේදී පැහැදිලි විය. ඒ අනුව ලිපියේ පෙළ සහ අර්ථය පහත පරිදි නිවැරදි විය යුතුය.



**අභිලේඛන හා නාණක විද්‍යා අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

**පෙළ:** මහ-ශුමන-[තෙ]රහ ...[දෙව] තෙරහ ලෙණෙ

**අර්ථය:** මහා සුමන තෙරුන්ගේ ... දේව තෙරුන්ගේ ලෙන

අලුවිහාරයේ ලිපියෙහි (IC. Vol.II 821) දායක ශිවගුත්තගේ නමට පූර්වයෙන් අක්ෂර දෙකක ශේෂයන් නිරීක්ෂණය කළ හැකිය. ඒ බව ප්‍රකාශිත පෙළෙහි දක්වා නැතත් **ශිවගුත්ත**ගේ නමට පූර්වයේ වන ශේෂිත අක්ෂරයන් අනුව ඔහු සමකාලීන බතවරයකු වන්නට ඇතැයි අනුමාන කළ හැකිය.



**අභිලේඛන හා නාණක විද්‍යා අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

**පෙළ:** [බත]ශිවගුතහ

**අර්ථය:** හර්තෘසිවගුත්තගේ

අලුවිහාරයේ අපාය නිරූපණය කෙරෙන කුටිය (බැලුම් ගේ) පිහිටි ලෙනෙහි (IC. Vol.I :822) ලිපිය සටහන් වී තිබේ. ප්‍රකාශිත පෙළට වඩා වැඩි අර්ථයක් ලිපිය තුළින් අනාවරණය කර ගත හැකිය. ඒ අනුව මෙම ලිපියේ ප්‍රකාශිත පෙළ පහත පරිදි නිවැරදි කළ හැකිය.



**අභිලේඛන හා නාණක විද්‍යා අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**

**පෙළ:** (දා) දෙවශ[හ] ශුම[න] හ අඩි

(දාදා) [කු]ප[ච] පති


**අර්ථය:** දේවගේ ද සුමනගේ ද ඇළ, ළිදෙහි පැන්

ශිලා ලේඛනයේ දෙවන පෙළෙහි **[කු]ප[ච]**සහ **පති** අතර අක්ෂර කිහිපයක හිඩැසක් දැක ගත හැකි අතර, එහි අක්ෂරයක් සටහන් කර තිබූ බවට සාධකයක් හෝ නිරීක්ෂණය කළ නොහැකිය. පළමු පෙළෙහි **දෙවශ[හ]** සහ **ශුම[න]** අතරත් **හ අඩි** අතරත් එක් අක්ෂරයකට පමණ ප්‍රමාණවත් හිඩැසක් පවතී. ලෙන් පියස්සේ එම ස්ථානවල කඩතොලු බහුල වීම නිසා අක්ෂර සටහන් නොකරන්නට ඇතැයි සිතිය හැකිය.

## පිදුරංගල

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පිදුරංගල ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටා ඇති පිදුරංගල රජමහා විහාරයෙහි පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි තුනක් දැකිය හැකිය. මෙම ලෙන් ලිපිවලින් දෙකක් Inscription of Ceylon Vol.Iහි ප්‍රකාශයට පත් කර තිබුණද එම ලිපිද නිවැරදි විය යුතුය.

ප්‍රධාන ලෙන් විහාරයේ කටාරමට පහළින් මෙම ලිපිය (IC.Vol.I :No.873) සටහන් කර තිබේ. (ඡායාරූප අංක 03) පේළි තුනකින් යුක්ත ශිලා ලේඛනයක් බවට හඳුනා ගන්නා පරණවිතානගේ කියවීමට වඩා, පේළි දෙක බැගින් වූ ශිලා ලේඛන දෙකක් එහි සටහන්ව ඇති බවට සිරිමල් රණවැල්ල ඉදිරිපත් කර ඇති පෙළ වඩා සාධාරණය.



**(Ranawella 1984:259,PL 35)**

**පෙළ:** (අ) කොලගම-ශිවපුත-මඣිමයශ ඣිතය තිශ-දෙවිය ලෙණෙ

(අඅ) ශගශ (Ranawella 1984:No.16)

**අර්ථය** : කොලගම සිවගේ පුත්‍රයා වන මජ්ඣිම කුමරුගේ දුහිතෘ, තිස්සා දේවියගේ ලෙන සංඝයාට දෙන ලදී.

රණවැල්ල ඉදිරිපත් කළ අර්ථයෙහි කොලගම ශිවගේ පුත් මජ්ඣිම සාමාන්‍ය පුද්ගලයකු ලෙස හඳුනා ගෙන ඇත. මඣිම + අය යන්න සන්ධි වීමෙන් පෙළෙහි **මඣිමය** යන්න සටහන් වී තිබේ. පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවල "අය" යන්නේන් කුමාරයා අර්ථ ගැන්වෙයි. ඒ අනුව කොලගම ශිවගේ පුත්‍ර මජ්ඣිම කුමාරයකුව සිටි බව ප්‍රකට වේ.

මෙම ලෙනෙහිම උක්ත ශිලාලේඛනයට ආසන්නව ඊට පහළින් ඇති මෙම ලිපියේ අක්ෂර, සාපේක්ෂව ප්‍රමාණයෙන් කුඩාය. මෙම ලිපියේ **ශදඑ මඩන** (Paranavitana 1970:No.873) පරණවිතානගේ කියවීමට වඩා රණවැල්ලගේ **දධමඩන** (Ranawella 1984:No.17) කියවීම නිවැරදි සේ පෙනෙයි. අද වන විට මෙම ලිපියේ **ය දධමඩනගරෙදි** අක්ෂර සහ නෙළුම් මල සංකේතය වැසී යන පරිදි සිමෙන්ති ආලේප කර තිබීම කනගාටුවට කරුණකි.



**(Paranavitana 1970:PL.XCVI,No.873)**


**පෙළ:** (දා) තිශ දෙවිය දධමඩන (නෙළුම් මලක සංකේතයක්) ගරේදිඩගම වි[මන]

(දාදා) ග-බරිය

**අර්ථය :** ගරදිඩගම වි[මන]ගගේ භාර්යාව වූ තිස්සා දේවියගේ දධමඩන [නම් වූ ලෙන]

(Ranawella 1984:No.17)

ප්‍රධාන ලෙන් විහාරයට මීටර් 100ක් පමණ ගිනිකොන දෙසින් වූ ලෙනෙහි පිහිටි පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනය (IC. Vol.I: No.874) ප්‍රකාශයට පත් කර තිබේ. ශිලා ලේඛනයේ ආරම්භක කොටස පතුරු ගැලවී යාමකට ලක්ව ඇතත් ඉතිරි අක්ෂර සියල්ලම කියවිය හැකි තත්ත්වයේ පවතී (ඡායාරූප අංක 04). පරණවිතාන **කණණ** (Paranavitana 1970:No.874) ලෙස කියවා ඇති පදය **කණික** ලෙස පැහැදිලිව කියවිය හැකිය.




**(Ranawella1984:260,PL 37)**

**පෙළ:** **...** කණික තිශහ ලෙණෙ

**අර්ථය** :**...** කණික තිස්සගේ ලෙන

**බඹරගල**

මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වැවේගල ග්‍රාම නිලධාරී වසමෙහි බඹරගල රජමහා විහාරය පිහිටා ඇත. මෙහි ඇති පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි හතරම Inscription of Ceylon Vol.Iහි ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අතරින් **පශදෙ, ශගයෙ** පදවල තාලුජ ශ නිවැරදිව කියවා ඇතත් **අනුරදශ** යන්නෙහි අග අක්ෂරය 'ශ' ලෙස වැරදියට කියවා ඇත (IC. Vol.I:No.816). එය 'ස' ලෙස කියවීම නිවැරදිය.





(Paranavitana 1970:PL.XC.No.816)

පෙළ: පරුමක-අනුරදස දනෙ [ශි]ල-පශදෙ ශගයෙ දිනෙ

අර්ථය: ප්‍රමුඛ අනුරාධගේ දානය [වන] ශෛලමය ප්‍රාසාදය සංඝයාට දෙන ලදී.

## හුලංගමුව

මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දොඩම්දෙණිය ග්‍රාම නිලධාරී වසමෙහි ඇඹිල්ල රජමහා විහාරය පිහිටා තිබේ. මෙහි වන පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන ද්විත්වයම Inscription of Ceylon Vol. Iහි ප්‍රකාශයට පත් කර තිබේ. මෙහි ඇති අනෙක් ලිපියෙහි **ශගශ** යන්න පැහැදිලිව කියවා ඇතත් (IC. Vol. I: No.825) එහි එසේ කියවීමට සාධක නොමැති පසුබිමක (ඡායාරූප අංක 05) ලිපියෙහි පෙළ පහත පරිදි නිවැරදි කළ හැකිය.



**(Paranavitana,1970:PL.X C,No.825)**

පෙළ: උපශක-උගශ ලෙණෙ ශ[ගශ](දකුණේ සිට වමට නොපිටට)

අර්ථය: උපාසක උග්ගගේ ලෙන සංඝයාටයි

**ඡායාරූප ඇමුණුම**



**ඡායාරූප අංක 01 : මොලගොඩ ලෙන් පියස්සේ ඉදිරිපස කොටස ගැලවී ඇති ආකාරය**



**ඡායාරූප අංක 02 : කිඹිස්ස ලිපියේ "බක" අක්ෂර**



ඡායාරූප අංක 03 : පිදුරංගල **IC** 873 ලිපිය



ඡායාරූප අංක 04 : පිදුරංගල
**IC:** 874 ලිපිය



ඡායාරූප අංක 05 : හුලංගමුව
**IC** :825 ලිපිය



ඡායාරූප අංක 06 : අලුවිහාරේ
**IC** 821 ලිපිය

**මූලාශ්‍රය**

රණවැල්ල, සිරිමල්. (2004). **සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය.**කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
Dias, Malini.(1991). ***Epigraphical Notes*.**Colombo: Department of Archaeology.
Ilangasinha, Mangala.(1988). ***Dambulla- Through Inscriptions*.** Basnayake, H.T., Dambulla Project-First Archaeological Excavation and Reseach Report (April-December 1983), Central Cultural Fund, Ministry of Cultural Affairs, Colombo, Sri Lanka.
Paranavitana, S.(1970). ***Inscription of Ceylon Vol.I.***Colombo : Department of Archaeology.
Ranawella, S.(1984). ***Epigraphy.*** Bandaranayake, Senaka., Sigiriya Project- First Archaeological Excavation and Reseach Report (January-September 1982), Central Cultural Fund, Ministry of Cultural Affairs, Colombo, Sri Lanka.

# පෙණ ගොබ රාශියකින් යුතු නාග රුව චිත්‍රණය කිරීමේදී ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා විශද කළ නිර්මාණ ශක්‍යතාව: (වසම්මලේ හා ගිරාපොකුණුහෙල බිතු සිතුවම් ඇසුරෙන්)

අයි.එම්.ටී. ඉලංගසිංහ

## හැඳින්වීම

**දේවානම්පියතිස්ස** රජ සමයේදී සිදු වූ **මහින්දාගමනය** ලක්දිව ථේරවාදී බුද්ධ ධර්මයේ සහ ශිෂ්ටාචාරයේ කේන්ද්‍රීය සාධකය විය (සෙනෙවිරත්න 2001:56). බුදු දහම ලක්දිව ස්ථිර ලෙස ස්ථාපිත වීමෙන් ඉක්බිතිව කලා ශිල්පවල නව්‍ය ප්‍රවර්ධනයක් ඇති විය (කුමාරස්වාමි 1962:2). ඉක්බිති, ශ්‍රී ලාංකේය **බිතු සිතුවම්** කලාව රාජ්‍ය අනුග්‍රහය ලදුව ස්ථාවර විය. එකී බිතු සිතුවම් සඳහා ප්‍රමුඛ පදනම වූයේ බෞද්ධ ප්‍රස්තුතයන්ය. මුල්කාලීන විදර්ශනාධූර භික්ෂූන් වහන්සේලා උදෙසා පූජා කළ ගල් ලෙන්වල පෘෂ්ඨ මත බදාම ස්තරයක් අතුරා මටසිලිටු කර නොයෙක් මල්කම්, ලියකම් හා බෞද්ධ ප්‍රස්තුතයන්ගෙන් හෙබි අලංකාර චිත්‍ර කර්මයන් කරවා (විසුද්ධි මාර්ගය 2017:23) සඟ සතු කොට පූජා කරන ලදී. ක්‍රි.පූ. දෙවන සියවසේදී පමණ ව්‍යාප්ත වූ මෙම කටාරම් ලෙන් (සන්නස්ගල 1964:39) පෘෂ්ඨ මතුපිට, කපරාරු බිත්ති, මැදුරු හා උද්‍යාන ආදි ස්ථාන ගණනාවකබිතු සිතුවම් ව්‍යාප්ත විය (හේවාපතිරණ 2012:5) දේශීය අමුද්‍රව්‍ය ඇසුරෙන් සකසා ගත් බදාම ස්තරයක් සකසා (සිල්වා 1990:25) දේශීය ශාකසාර හා පාෂාණ වර්ණක ඇසුරෙන් සකසා ගත් වර්ණ මගින් (වජිර හිමි 1995:14) බිතු සිතුවම් නිමවා ඇත. අනුරාධපුර හා පොලොන්නරු අවධිවල බිතු සිතුවම් ස්ථාන අතර අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මිහින්තලය ආශ්‍රිතව පිහිටි **වසම්මලේ** හා අම්පාර දිස්ත්‍රික්කයට අයත් පානම ආශ්‍රිතව පිහිටි අප්‍රකට පුදබිමක් වූ **ගිරා පොකුණුහෙල** යන බිතු සිතුවම් ස්ථාන විශේෂත්වයක් ළඟා කර ගනී. **වසම්මලේ** හා අප්‍රකට පුදබිමක් වූ **ගිරා පොකුණුහෙල** යන ස්ථාන ද්වයෙහිම **පෙණ ගොබ රාශියකින්** යුතු **නාග රුව** චිත්‍රණය කළ බිතු සිතුවම් ශේෂ හඳුනා ගත හැකිය. මෙම බිතු සිතුවම් සඳහා රජු හා රදල පාලකයෝ ප්‍රමුඛ අනුග්‍රාහකත්වය සැපයූහ.

## පර්යේෂණයේ අරමුණ:

චිත්‍ර ශිල්පීන් බිතු සිතුවම් සඳහා ප්‍රස්තුත සපයා ගෙන ඇත්තේ බෞද්ධ සාහිත්‍යයෙනි. චිත්‍ර ශිල්පියා  සිතුවම් පින්තාරු කිරීමේදී බිතුසිතුවම්වල ප්‍රස්තුතයනට අදාළව දෘශ්‍යමය සාධක (චරිත, ද්‍රව්‍ය, පරිසරය) රාශියක් සංඥා ලෙස භාවිත කර ඇත. මෙකී හැඟවීම් සංඥා ලෙස **වසම්මලේ** හා අප්‍රකට පුදබිමක් වූ **ගිරාපොකුණුහෙල** යන බිතු සිතුවම් ස්ථානවල **පෙණ ගොබ රාශියකින්** යුතු **නාග රුව** චිත්‍රණය කිරීමේදී ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා විශද කළ නිර්මාණ ශක්‍යතාව හඳුනා ගැනීම පර්යේෂණයේ **අරමුණ** විය.

**පර්යේෂණ ගැටලුව :**

පෙණ ගොබ රාශියකින් යුතු නාග රුව චිත්‍රණය කිරීමේදී ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියාගේ නිර්මාණ ශක්‍යතාව විශද කෙරෙන අංග මොනවාද ?

**උපන්‍යාසය :**

ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා **වසම්මලේ** හා **ගිරාපොකුණුහෙල** යන බිතු සිතුවම් ස්ථානවල පෙණ ගොබ රාශියකින් යුතු නාග රුව චිත්‍රණය කිරීමේදී, ස්වාභාවිකත්වය නිර්මාණශීලීව යොදා ගත් ආකාරය, නිදහස් රේඛාව, සනත්වය ගොඩ නැගීම ආදි නිර්මාණ ශක්‍යතා විශද කෙරෙන බව හඳුනා ගත හැකිය.

**ක්‍රමවේදය :**

ස්ථානීය නිරීක්ෂණ මගින් සාකල්‍යයෙන්ම අත්විඳ ලබාගත් බිතු සිතුවම් ඡායාරූප, දළ සටහන්, තොරතුරු ආදි දත්ත, බිතු සිතුවම් පිළිබඳ ප්‍රකාශිත ග්‍රන්ථ, ලිපි ලේඛනවල විස්තෘත දත්ත හා තොරතුරු, විධිමත් **ක්‍රමය**කට ගොනු කෙරිණි. ඒවා නිරීක්ෂණයෙන් හා පරිකල්පනයෙන් දෘශ්‍යමය රූ සංඥා බිතු සිතුවම්වල ඇති සංකේත, රූපක, තේමා ආදියෙහි ඓතිහාසික පැවැත්ම, ඒවාගේ සංස්කෘතික නිරූපණ විලාසයන් කාලය හා අවකාශය හරහා ඒවා විචල්‍යයන්ට භාජනය වූ ආකාරය, බිතු සිතුවම් සතු ශිල්පීය ශක්‍යතා හා සංස්කෘතික අනන්‍යතාවයන්, දෘශ්‍ය රූප ස්ථානගත කිරීම, ශිල්පීය ශක්‍යතාව, කේවල චිත්‍ර ශිල්පීන් හා ගුරුකුලවල දෘශ්‍යමය ශිල්පීය න්‍යායන් හා ප්‍රඥප්තීන්; පිළිබඳව කථන ගෙතීමේදී **රූපාර්ථවේදය** (Iconography) **පර්යේෂණයේ ක්‍රමවේදය** ලෙස භාවිත කෙරිණි. **රූපාර්ථවේදී ක්‍රමවේදය** අනුව, බිතු සිතුවමෙන් නිරූපිත ප්‍රමුඛ ප්‍රස්තුතය කුමක් වුවද එහි එක් දෘශ්‍ය රූපයක් (නාග රුව) කේවල ලෙස ගෙන එහිදී චිත්‍ර ශිල්පියා විශද කළ නිර්මාණ ශක්‍යතාව පිළිබඳව දෘශ්‍යමය විශ්ලේෂණයක් සිදු කෙරිණි. ප්‍රමුඛ ලෙස බිතු සිතුවම්හි ප්‍රස්තුත පිළිබඳ කථන ගෙතීම, ඒවාගෙන් නිරූපිත දෘශ්‍ය රූපයන්හි නිර්මාණ ශක්‍යතා හඳුනා ගැනීම ආදි ඉතා පුළුල් දෘෂ්ටියකින් සිදු කළ දෘශ්‍යමය විශ්ලේෂණයක් සඳහා රූපාර්ථවේදී ක්‍රමය භාවිත විය. මෙම පර්යේෂණයේදී ශාස්ත්‍රීය ලේඛන මූලධර්ම අනුව පාදක සටහන් හා මූලාශ්‍රය නාමාවලිය සැකසීමේදී ඒ.පී.ඒ. ශෛලියේ හත්වන සංස්කරණය (APA Style 7th edition) භාවිත කෙරිණි.

**විශ්ලේෂණය :**

**නාග සංකල්පය**

ඓතිහාසික අවධියේ සිටම නාග වන්දනය පෙර අපර දෙදිග රටවල්වල ව්‍යාප්තව තිබී ඇති අතර, එය වඩාත් ප්‍රකට ඉන්දියානු සංස්කෘතිය තුළය (ජානගේ 2000දෙසැම්බර්:65). ඊශ්වරගේ ගෙල වටා නාගයකු සිටින අතර විෂ්ණුගේ පිටුපස සිටිනුයේ අනන්ත නම් සප්ත පෙණ ගොබ සහිත නාගරාජයාය. නාග

සංකේත සහිත කාසි, නාග දේවාල, නාග රූව සහිත ශෛලමය ස්තම්භ, කැටයම්, මූර්ති ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවලින් හඳුනාගත හැකිය.

ඓතිහාසික පුරාණෝක්තිවලට අනුව පෘථිවි භාරය උසුලන දිසා ආශ්‍රිත නාගයෝ අට දෙනෙක් වෙති. අනන්ත, තුලිත, වාසුකී, සංඛපාල, තක්ෂක, මහා පද්ම, පද්ම, කර් කෝටක ආදි වන මෙම කණ්ඩායම් අතුරින් අනන්ත හා තුලිත යන කාණ්ඩ බ්‍රාහ්මණ කුලයට අයත්ය. ගිනි පැහැයෙන් යුක්ත ඔවුන්ගේ පෙණ දහසකි. වාසුකී හා සංඛපාල යන කාණ්ඩය ක්ෂත්‍රිය කුලයට අයත් ය. ඔවුහු ශ්වේත වර්ණයෙන් යුක්ත පෙණ ගොබ 700කින් හෙබි නාගයෝ ය. නීල වර්ණයෙන් හා පෙණ ගොබ 700කින් හෙබි කක්ෂක හා මහා පද්ම නාග කාණ්ඩය වෛශ්‍ය කුලයට අයත්ය. පද්ම හා කර්ටෝටක නාගයෝ ශුද්‍ර වංශිකයෝ වෙති (මල්දෙණිය 2016:189). හින්දු ආගමේ දේව කතාවක් අනුව විෂ්ණු දිව්‍ය රාජයා නිදාගනුයේ ආදි කාලීන මහා සාගරයේ දහසක් හිස් ඇති "ශේෂ" නාග රාජයා මතය (බෂාම් 1995:384). අනවතප්ත විල හරහා පීනා යන නාග කන්‍යාවියන් මාමල්පුරම් කැටයම්වල නිරූපණය කර ඇත.

බෞද්ධ සාහිත්‍යයෙහිද නාග රූව පිළිබඳ විස්තර සඳහන් වේ. නන්දෝපනන්ද නම් මහත් සෘද්ධි බල සහිත නාග රාජයාගේ මිථ්‍යා දෘෂ්ටිය බුදුන් වහන්සේ බිඳලූ ආකාරය විද්‍යාචක්‍රවර්තීහු බුත්සරණෙහි විස්තර කරති (බුත්සරණ, 84-85.). නාගයාගේ පෙණය නිසා අනෙක් සර්පයන්ගෙන් වෙන්ව සුවිශේෂී තත්වයක් ලබාදෙයි. සර්පයින් පමණක් නොව "නාග" යටතට ගැනෙන කාණ්ඩ ගණනාවක් වෙසෙන අතර, චිත්‍ර ශිල්පීන් එම සියලුම කාණ්ඩ නාගයා නම් සර්පයාගේ හැඩය භාවිත කර ගොඩ නගා තිබේ. සාගරයේ හා ජලය ආශ්‍රිතව වෙසෙන විශාල නාගයන් පිළිබඳව බෞද්ධ සාහිත්‍යයේ විස්තර කෙරෙයි. තථාගතයන් වහන්සේට සත්වන සතියේදී මුචලින්ද නාගරාජයා කළ සත්කාර පිළිබඳව මුල් බුදුසමය විස්තර කරයි (චන්දවිමල හිමි 2015:235-236). පාසරාසී සූත්‍ර අටුවාවට අනුව මුචලින්ද යනු ආධ්‍යාත්මික ගුණාංග සහිත සෘද්ධිබල සහිත නාගයෙකි. දීඝ නිකායේ මහා සමය සූත්‍රයේ භාග්‍යවතුන් වහන්සේ අසලට පැමිණි නාගයන් පිළිබඳ සඳහන්වේ (දීඝනිකාය, මහා සමය සූත්‍රය 142-143). **"....නයෙක් වී නම්,පොළෝ කිමිද යෙයි..."** ලෙස ගුරුළුගෝමීන් විසින් විරචිත අමාවතුරෙහි දක්වා තිබේ (අමාවතුර, 2001: 14). බුදුන් වහන්සේ උරුවෙල් කාශ්‍යපගේ කුටිය තුළ සිටින ඉතා භයානක නාගයකු දමනය කළ බව සඳහන් වේ (ස්ට්‍රෝං2008:161). ඒරකපත්‍ර නම් නා රජ කුසිය දියණිය සමග බුදුන් සරණ ගිය කතා පුවතක් බෞද්ධ සාහිත්‍යයේ විස්තර කෙරෙයි (මෛත්‍රෙය හිමි 2008:97-99). බුදුන් වහන්සේ නර්මදා නා රජුගේ ඇරයුමින් නර්මදා නදී තීරයෙහි පාද ලාංඡනය තැබූ බව සඳහන් වේ ( මෛත්‍රෙය හිමි 2008:163). වර්තමානය දක්වාද "නාග" නම් නොදියුණු ගෝත්‍රයක් ඇසෑමයේ දිවිගෙවන බව බෂාම් පෙන්වා දෙයි (1995:405).

ලක්දිව විසූ මහත් සෘද්ධි ඇති චූලෝදර මහෝදර නා රජුන් පිළිබඳවද තථාගතයන් වහන්සේ මණිඅක්ඛිත නම් නා රජුගේ ඇරයුමින් දෙවන වර ලක්දිවට වැඩම කළ බවද විස්තර කරයි (මහාවංශය2012:3-5). සැළලිහිණි සන්දේශය විස්තරයේදී නාගයන් පිළිබඳව මෙසේ විස්තර කරයි.

මහමෙර පතුලෙහි පිහිටා ඇතැයි සලකන දිව්‍යය නාගයන්ගේ වාස භූමියයි. මොවුන්ට කැමති විටෙක නොයෙක් වෙස් මවා ගැනීමේ සෘද්ධියක් හා රජ මැති ඇමැති ආදීන්ගේ වශයෙන් පාලන බලයකුදු ඇති සම්පත්තියෙන් ආඪ්‍ය වූ ශිෂ්ට සම්පන්නව වෙසෙන හිසෙහි පෙන මඩුල්ලක් ඇති මනුෂ්‍යය කොටසක් (සුමනජෝති හිමි 1957:29).

අරිසෙන් අහුබුදුට අනුව නාග යනු නැව්වලින් ගමන්ගත් නාවුකයන්ය (ඇන්තනී 2006:15-16). නාගයා ගෝත්‍ර හැඟවීමේ සංකේතයක් ලෙස හා වන්දනාමාන කළ සංකේතයක් බවට සාධක හමුවේ. ශිලා ලේඛනවලද නාග යන පදය හමු වෙයි. සිරිනාග, මහානාග, බල්ලාටනාග ආදි රජ නාමයන්ගෙන්ද, නාගදීප, නයිනතීවු, නාඔටුන්න, නයිවිල, නයිගල ආදි ප්‍රදේශයන්ගෙන්ද ශ්‍රී ලංකාවේ නාගයන් විසූ බව හඳුනා ගත හැකිය.


**වසම්මලේ**

ක්‍රි.පූ. පස්වන සියවසේ **පණ්ඩුකාභය කුමරු** සහ ක්‍රි.ව. පස්වන සියවසේ **1 වන කාශ්‍යප** රජතුමා මෙම ස්ථානයේ සැඟවී සිටි බව එහි ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තු දැන්වීම් පුවරුවේ දක්වා ඇත. මෙම ස්ථානය මොණරගල ලෙස හඳුන්වා ඇති අතර, මෙම පර්වතය හඳුන්වා ඇත්තේද මොණරගල නමිනි. (සිල්වා 1990:37). මෙහි ඇති කාන්තා චිත්‍රය පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් සඳහන් නොකළ ද රේඛා සටහනක් "*මොණරගල ලෙන් ගෙයි චිත්‍රයක්*" ලෙස නම් කර ඉදිරිපත් කර ඇත (චාර්ල්ස් 2000:34).

මිහින්තලය යාපනය පාරේ මිහින්තලය හංදියේ සිට සැතපුම් දෙකක් පමණ පසු කළ විට රජරට විශ්වවිද්‍යාලය ආසන්නයේ වම්පසට වැටුණු මාර්ගයේ තේක්ක වත්තක් මැදින් මඳ දුරක් ඇවිද ගිය විට විශාල වසම්මලේ පර්වතය හමු වේ. වසම්මලේ ඉපැරණි පුදබිමකි. මෙම ස්ථානය ප්‍රදේශවාසීහු වසුප්මලේ ලෙසද හඳුන්වති. පෞරාණික අවධියට අයත් නටබුන් ප්‍රදේශය පුරා විසිරී ඇති අතර, පොකුණක් ආශ්‍රිත විවෘත ලෙනක විශාල ප්‍රමාණයේ බිතු සිතුවමක ශේෂ හඳුනා ගත හැකිය.

පාෂාණ පෘෂ්ඨය මත ඉතා තුනී හුණු පිරියමක් ආලේප කර ඒ මත බිතු සිතුවම් නිර්මාණය කර ඇත. බිතු සිතුවම් බොහෝ විනාශ වී ඇති අතර, ශේෂයන් හඳුනා ගත හැකිය. ඉතිරිව ඇති චිත්‍ර සටහන් අනුව විශාල ප්‍රමාණයේ පෙණ ගොබ රාශියකින් යුතු නාග රුවක් තිබූ බව හඳුනා ගත හැකිය. නාගයාගේ දකුණුපස පෙණ ගොබ කිහිපයක් සහ දරණය ගැසුණු නාග ශරීරයෙහි කොටසක් ඉතිරිව ඇත. කහ පැහැය මුසු රඹ පැහැය, දුඹුරු රත හා නිල් පැහැ පලාවන් කොළ යන වර්ණ භාවිත කළ බව දුර්වර්ණ වූ සායමෙන් හඳුනා ගත හැකිය. නාගයාගේ දකුණු පසින් නාගයාගේ ශරීරයට සාපේක්ෂව ඉතා කුඩා ප්‍රමාණයේ කාන්තා රුවක් නිමවා ඇත. එය ප්‍රමාණාත්මකව නාගයාගේ එක් පෙණ ගොබයකටත් වඩා කුඩාය. ඇය නුහුරු ඉරියව්වකින් වාඩි වී සිටිනුයේ සුරතට බරදී වමත නවා ඉහළට ඔසවා ගනිමිනි. ඉතා තුනී බදාම ස්තරයේ ලා පැහැයක් අතුරා ඒ මත තද පැහැයේ රේඛා ගොඩනගමින් මූලික හැඩතල ගොඩනගා ඇත. පූර්ණ වට පියයුරු පැහැදිලිව දක්වා ඇති අතර දෑතේ හා ගෙලෙහි ආභරණ දක්වා ඇත. විශාල නාගයා සිටින

ප්‍රදේශය සෙ.මී.334ක් පුරා පැතිර ඇත. නාගයා ගිනි පැහැයෙන් හා පෙණ රාශියක් සහිත බැවින් අනන්ත හා තුලිත වර්ගයට අයත් බ්‍රාහ්මණ කුලයේ නාග රාජයකු බව හඳුනා ගත හැකිය. නාගයාගේ වක්‍ර වූ දඟර ශරීරයේ පෙන්වා ඇති ආකාරය මුරගල්වල නිරූපිත සප්ත පෙණ සහිත නාගයාගේ ශරීරයට බෙහෙවින් සමානය.



**1 රූපය : බදාම මත වර්ණ (වසම්මලේ)**

**ගිරාපොකුණුහෙල**

ගිරාපොකුණුහෙලට එක් පසෙකින් වෙදගම මාර්ගයත්, තවත් පසෙකින් සැලව වැවත්, තවත් පසෙකින් **ආකාශ චෛත්‍යයත්** පිහිටා ඇත. **ආකාස චේතිය** පිළිබඳ මුල්වරට සඳහන් වනුයේ **කාවන්තිස්ස** රජ සමයේදීය. ආකාස චේතිය සමීපයෙහි, චිත්තලපබ්බතයට නුදුරුව **කොටපබ්බත විහාරය** තිබූ බවත් එයම **කොටගල, කොටපවු,කොටදොර, කෙළපව්** යන නාමයන්ගෙන් හැඳින් වූ බවත් පෙන්වා දෙයි (නිකලස් 1979:74). **නාග ලෙණ** වූයේද මේ සමීපයේ වන අතර, එහි නටබුන් සොයාගෙන නොමැති බවද පෙන්වා දෙයි (නිකලස් 1979:74). **කිත්තිගාම** හෙවත් **කැතිගම, අච්ඡගල්ල විහාරය** ආදි විහාර පිහිටා ඇත්තේද **ආකාස චේතිය** සමීපයේය. කෙසේ වුවද මේ සමීපයේ වන විහාරාරාම බොහොමයක් ගොඩ නඟන ලද්දේ ක්‍රි.පූ. දෙකේදී පමණ විසූ **ගෝඨාභය** හා **කාවන්තිස්ස** යන රජවරුන් විසිනි. එබැවින් **ගිරාපොකුණුහෙල** පිහිටි කටාරම් ලෙන්, සෙල්ලිපි, බිතු සිතුවම් ඇතුළු නටබුන් සියල්ල ක්‍රි.පූ. දෙවන සියවසට පමණ අයත් බව සැලකිය හැකිය.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පානම ආශ්‍රිත වෙදගම ගිරාපොකුණුහෙල පිහිටා ඇත. පොතුවිල් පානම ප්‍රධාන මාර්ගයෙන් පානම දක්වා පැමිණිය හැකිය. පානම සිට කුමන අභය භූමිය දක්වා දිවෙන මාර්ගයේ මද දුරකින් හමු වන පානම වැව අසල මාර්ගයෙන් දකුණට හැරී ගමන් කොට බොහෝ දුරකින් නැවත වම්පසට හැරී වනය තුළට ප්‍රවේශව, වනාන්තරයේද බොහෝ දුරක් ගමන් කළ පසු

ගිරාපොකුණුහෙල හමුවේ. ගිරාපොකුණුහෙලට ප්‍රවේශ විය හැක්කේ **ගිරාපොකුණ** තරණය කිරීමෙනි. මෙම පොකුණ වර්තමානයේ ජරාජීර්ණව තිබුණද ජලයෙන් පිරී ඇත.

ගිරාපොකුණුහෙල ආශ්‍රිතව ගල් කුලුනු, ලෙන්ලිපි, ගිරිලිපි, කෙමි, චෛත්‍ය නටබුන් ආදී වාසී සෙල් චිත්‍ර ආදී බොහෝ නටබුන් විසිර පවතී. පර්වතය පාමුල පොළොව මට්ටමේ සිට ඉහළින් දර්ශනය වන විවෘත ලෙනක බිතු සිතුවම් පිහිටා ඇත. විශාල ගල්තලාව මත තවත් පර්වතයක පිහිටි ස්වාභාවික ලෙනෙහි කටාරම් කොටා සෙල්ලිපි පිහිටුවා ඇත. විවෘත දිගු ලෙනෙහි දකුණු පස බිතු සිතුවම් ශේෂ හඳුනා ගත හැකිය.

සමස්ත සිතුවමේ බොහෝ ප්‍රමාණයක් විනාශ වුවද හැඩතල දැකිය හැකිය. පෙණගොබ කිහිපයකින් යුත් විශාල නාග රාජයෙකු සහ එයට දකුණු පසින් දර්ශනය වන මානව රුවක් පැහැදිලිව හඳුනා ගත හැකිය. පාෂාණ පෘෂ්ඨය මත සුමට කර අතුරන ලද බදාම ස්තරය මත බිතු සිතුවම් ගොඩ නගා ඇත. චිත්‍රය පුරාම ලා රතට හුරු කහ පැහැය පදාස ලෙස අතුරා ඒ මත තද පැහැයේ රේඛා ලෙස මූලික හැඩතල ගොඩ නගා ඇත. නාගයාගේ පෙණ හා සිලින්ඩරාකාර දිගැටි ශරීරය රේඛාවලින් සියුම්ව වෙන් කර දක්වා ඇත. රේඛාව කෙළවර රඹ පැහැයේ සායම මදක් අඳුරු කර මූලික හැඩතල ගොඩ නගා ඇත. නාග ශරීරය පුරාම ඉතා සංයමයෙන් කළ තිත් රටාවකි. දකුණු පස සිටින මානව රුව ස්ත්‍රී රුවක්ද පිරිමි රුවක්ද යන්න පැහැදිලි නැත. වාඩි වී සිටින ඉරියව්ව පූජක රුවක් ලෙස හඳුනා ගත හැකිය. එහෙත් විවෘත උඩුකය නග්න ශරීරයෙහි පියයුරු ලෙස සැලකිය හැකි වටකුරු රේඛා සමූහයකි. දකුණතෙහි යම් උපකරණයකි. ආභරණ ආයිත්තම් ඉතා සියුම්ව ගොඩ නගා ඇත. ඉතා රිද්මයානුකූල රේඛා සටහන් පරිණත චිත්‍ර ශිල්පියකුගේ නිර්මාණ ශක්‍යතාව විශද කරයි. වාඩි වී පාද නවා සිටින ඉරියව්ව පුල්ලිගොඩ දේව රූපවලට බෙහෙවින්ම සමානත්වයක් දරයි. දකුණත සමීපයේ යම් විවෘත භාජනයක් වැනි හැඩයක් හඳුනා ගත හැකිය. වම් පස ශේෂ වී ඇති බිතු සිතුවම් අතර ලා කහ පැහැයට හුරු රත් පැහැය මත තද පැහැයෙන් කළ තිත සහිත සිතුවම් කොටස් හමුවේ. එය ඇතැම් විට නාගයාගේ ශරීරයේ කොටසක් විය හැකිය.



**2 රූපය : බදාම මත වර්ණ (ගිරාපොකුණුහෙල)**

## නාග රුව චිත්‍රණය කිරීමේ නිර්මාණ ශක්‍යතාව

### අ) චිත්‍රණය සඳහා සාහිත්‍යමය ප්‍රස්තුතයන්හි ආභාසය

චිත්‍ර ශිල්පියා නාග රුව ගොඩනැගීමේදී සාහිත්‍යමය ප්‍රස්තුතයන් පිළිබඳ අවධානය යොමු කරමින් යම් දාර්ශනික අදහසක් ජනිත කිරීමට අපේක්ෂා කර තිබේ. නාග සංකේත තුළ ගුප්ත අර්ථයක් මෙන්ම ගෞරවයක්ද ජනිත කෙරෙයි. නාග ලොව හා නාග ස්වරූපය පිළිබඳව විස්තර කළ වර්ණනා හා පුරාණෝක්තිවල ආභාසය ලබාගත් චිත්‍ර ශිල්පියා පරිසරයේ හමු වන නාගයාගේ දෘශ්‍ය රුව ප්‍රතිනිර්මාණය කරමින් නාග යන හැඩය ගොඩ නගා තිබේ. මහා කාල නම් නාග රාජයාට පෙණ ගොබ සියයක් තිබූ බව සඳහන් වේ (ජානගේ 2000 දෙසැම්බර්:67). නාගයාගේ අනන්‍යතාව පෙන්වන ප්‍රබලම අංගය වනුයේ පෙණ ගොබයයි. පෙණ රාශියක් පෙන්වීම මගින් නාග රාජයාගේ ප්‍රබලත්වය සංකේතවත් කර තිබේ. නාග හා නාගිනී රූ මනුෂ්‍යය ස්වරූපයෙන් දක්වා ඇති අතර, හඳුනා ගැනීම පිණිස හිස් වැසුමට හෝ පිටුපසින් නාග පෙණය සහිත හැඩයක් නිර්මාණය කරයි. කලාකරුවා නාගයාගේ සංකේතය දාර්ශනික ආධ්‍යාත්මීය ගුණාංගයක් තීව්‍ර කිරීම පිණිස භාවිත කරයි. නාග සංකේතය මගින් බහු අර්ථ සංජානනය කරන අවස්ථාද හමුවේ. කාලය දැක්වීම, දීර්ඝායුෂ අපේක්ෂා කිරීම, ජලය හා සෞභාග්‍යය හැඟවීම සඳහා සංකේතයක් ලෙසද නාග රුව භාවිත කරයි. නාග ලොව වසන මහාකාල නම් නාග රාජයාට දීර්ඝායුෂ හිමි බව සඳහන් වේ (ජානගේ 2000 දෙසැම්බර්: 67). නාගයා ජලයට අධිපති වන අතර, වර්ෂාව ඇති කිරීමේ ශක්තියක්ද නාගයා සතු බව කියවේ. ඌරු සිටාන වැව, පොවන්කුලම, මහන්කණ්ඩි වැව, හොරොව්වල ආදි ස්ථාන ගණනාවක පෙණ කිහිපයක් සහිත නාග රුව නිරූපණය කළ කැටයම් එලක හමුවේ. මහකණ්ඩිය වැව් සොරොව්වේ පෙණ හතක නාග රුවක් සහ දෙපස නාග මානවිකාවන් දෙදෙනෙකුද නිරූපිතය. නාග පොකුණේ හා කළුදිය පොකුණේ දියෙන් මතු වන ආකාරයේ නාග රූ ගොඩ නගා ඇත. මෙම රූප මගින් ජලය හා එමගින් ලබා ගන්නා සමෘද්ධිය පිළිබඳව සංකේතවත් කර ඇත. පුන්කලසක් අත දරා සිටින මුරගලේ කැටයම් කර ඇති නාග රාජයා අනෝතප්ත විලෙහි වසන ජලයට අධිගෘහිත අනන්ත නම් නාග රාජයා බව ටී.ඩී. දේවේන්ද්‍රගේ අදහසයි (ජානගේ 2000 දෙසැම්බර්:70 පි). **වසම්මලේ** හා **ගිරාපොකුණුහෙල** යන බිතු සිතුවම් ස්ථානවල පෙණ ගොබ රාශියකින් යුතු නාග රුව චිත්‍රණය කර ඇති අතර, මෙම ස්ථාන ද්වයෙහිම ජලය පිරුණු පොකුණු දක්නට ලැබේ.

### ආ) ස්වාභාවිකත්වය හා නිර්මාණශීලීබව

සාහිත්‍යයේදී කියැවෙන චරිත, ස්ථාන, සිදුවීම් ආදි සියලු දේ නිමැවීමේදී ස්වාභාවික දේවල් සහ ඉන්ද්‍රිය ගෝචර නොවන දේවල් නිසඟයෙන්ම නිර්මාණශීලී ස්වභාවයකට පත්වේ. අනුරාධපුර හා පොලොන්නරු යුගයේ ශිල්පීන් ඉතා දක්ෂ අන්දමින් ස්වාභාවිකත්වය හා නිර්මාණශීලී බවින් යුක්තව බිතු සිතුවම් ගොඩ නගා ඇත.

වසම්මලේ හා ගිරාපොකුණුහෙල යන ස්ථාන ද්වයෙහිම නාග රුව නිර්මාණය කර ඇත. නාග ගෝත්‍රිකයන්, පරිසරයේ වෙසෙන නාගයා, නාග දිව්‍යමය බල සහිත කණ්ඩායම, නාග රාජයන් ආදි විවිධ කණ්ඩායම් පිළිබඳව සාහිත්‍යයේදී ජනශ්‍රැතිවල විස්තර කෙරේ. මොවුන් කිසිවකුත් මිහිපිට අපගේ නෙතට ගෝචර නොවේ. එහෙත් අපට පරිසරයේදී හමු වන්නේ නාග යන සර්ප විශේෂය පමණි. එබැවින් චිත්‍ර ශිල්පියා නාග යන නමින් කවර කණ්ඩායමක් වුවද සර්පයාගේ හැඩය අනුව චිත්‍රණය කර ඇත. ස්වාභාවික නාගයෙකුගේ මූලික හැඩය හොඳින් නිරීක්ෂණය කර නාග චරිතය ගොඩ නගා තිබේ. නාගයාගේ පෙණය හොඳින් අධ්‍යයනය කර ඇස, හොම්බ කෙළවර හා විෂ දළය මුඛයෙන් එළියට විදා සිටින ආකාරය ස්වාභාවික නාගයාගේ ආකාරයෙන්ම ගොඩ නගා පෙණය මධ්‍යයෙන් සමාන වර්ණයන්ගෙන් යුතු වෘත්ත රටාවක් ඉහළ සිට පහළට දක්වමින් කොරපොතු සංකේතයක් ලෙස දක්වා තිබේ. පෙණයේ කොරපොතු හැඩය හැඟවීම පිණිස එහි නැම්ම සහිත දාරය හඟවමින් එක ළඟ පුන පුනා සමානව ගලායන තිත් ගොඩ නගා ඇත. එයින් පෙණයේ මූලික හැඩය තීව්‍ර කර තිබේ. නාගයාගේ ප්‍රබලත්වය තීව්‍ර කෙරෙනුයේ දීප්තිමත් ඇස හා ඒ අසලින්ම යොදා ඇති දිගු විෂ දළයෙනි. ස්වාභාවික නාගයාට ඇත්තේ එක් පෙණයක් වුවද නාග රාජයා යන අරුත ගම්‍ය වීම පිණිස, නාග රාජයා සතු  ප්‍රබලත්වය, බලය අභිමානය හැඟවීම පිණිස පෙණ රාශියක් ගොඩ නගා තිබේ. පෙණ රාශියක් තිබුණද එකම නාගයෙකු ලෙස සිලින්ඩරාකාර එක් කඳකින් යුතුව නිරූපිතය. එක් ශරීරයකින් හිස් රාශියක් මතු වීම ප්‍රබල බලපරාක්‍රමයක්ද සංකේතවත් කරයි. පෙණය ගොඩ නැගීමේදී ගිරාපොකුණුහෙල චිත්‍ර ශිල්පියා හා වසම්මලේ චිත්‍ර ශිල්පීන්ගේ මූලික වෙනස්කම් හඳුනා ගත හැකිය. ගිරාපොකුණුහෙල චිත්‍ර ශිල්පියා පෙණය ගොඩ නැගීමේදී තිත වැඩිපුර ප්‍රමාණයක් භාවිත කර තිබේ. එහෙත් මූලික හැඩය ගොඩ නැගීමේ හා නිර්මාණශීලී ස්වභාවයේ සමානතා හඳුනා ගත හැකි ය. නාගයාගේ සිලින්ඩරාකාර කඳේ හැඩය ගොඩ නැගීමේදී එක් එක් දාරවල ස්වභාවය සහ වක්‍ර ස්වභාවයත් නැමී වක්‍ර වන ස්වභාවයත් පිළිබඳවත් මූලික අවධානය යොමු කර තිබෙන අතර, තිත ක්‍රමානුකූලව යෙදීම හා ලා සහ අඳුරු පැහැය භාවිත කිරීම මගින් මතු කර තිබේ. ස්වාභාවික නාගයාගේ දක ගත හැකි කොරපොතු ගොඩ නැගීම කෙරෙහි අවධානය යොමු කර නැත. එබැවින් චිත්‍ර ශිල්පියාට අවශ්‍ය වී තිබෙනුයේ ස්වාභාවික නාගයා ඒ අයුරින්ම ප්‍රතිනිර්මාණය කිරීම නොව ස්වාභාවිකත්වයේ අනුසාරයෙන් නිර්මාණශීලී නාගයෙකු නිර්මාණය කිරීමටය. මුචලින්ද, නන්දෝපනන්ද වැනි නාග රාජයන් දිව්‍යමය තත්වයන් ළඟා කර ගෙන සිටින බැවින් ස්වාභාවිකත්වය ඒ අයුරින්ම ගොඩ නැගීම ඉවත හරිමින් නිර්මාණාත්මක කාර්යයේදී දිව්‍යමය තත්වයන් ළඟා කර ගැනීමට චිත්‍ර ශිල්පියා උනන්දු වෙයි. පෙණ රාශියකින් තේජස, බල පරාක්‍රමය හා නාගරාජ යන සංකල්පයද, ස්වාභාවිකත්වය ඉක්ම වූ නිර්මාණාත්මක අංග ලක්ෂණවලින් දේවත්වය පිළිබඳ අදහසක්ද, නාගයාගේ ස්වාභාවික අංගවලින් නාගයා යන හැඟවීම් සංඥාර්ථයද ලබා දෙමින් චිත්‍ර ශිල්පියා නාග සංකල්පය පිළිබඳව විශිෂ්ට අදහසින් නරඹන්නාට ලබා දෙයි. ඒ සඳහා චිත්‍ර ශිල්පියා භාවිත කළ දෘශ්‍යමය උපක්‍රමය වූයේ ස්වාභාවිකත්වයේ ආභාසය ලබා ගනිමින් නිර්මාණශීලී සිතුවමක් වෙත ප්‍රවේශ වීමයි. පහත දැක්වෙන ස්වාභාවික නාග රූපය සහ චිත්‍රය සංසන්දනය කර බැලීමෙන් මෙම තත්වය අවබෝධ කර ගත හැකිය.



**3 රූපය**

**බදාම මත වර්ණ (වසම්මලේ)**


**ඇ) තිත ආශ්‍රයෙන් හැඩය මතු කිරීම**

තිත රේඛාවේ ආරම්භකම අවස්ථාවයි. රේඛාව යනු තිත් සමූහයක එකතුවකි. චිත්‍ර ශිලපීන් තිත රේඛාවත් සමග මිශ්‍රව හා තිත වෙන් වෙන්වද භාවිත කර තිබේ. තිත සිතුවම අලංකාරවත් කරන මෝස්තර රටාවක් ලෙසද, යම්කිසි අවස්ථාවක හැඟවීමක් හෝ අර්ථයක් සංජානනය කිරීම වෙනුවෙන්ද භාවිත කර ඇත. පින්සලය, ඇඟිල්ල හෝ යම්කිසි උපකරණයක් තැබීම (Touch) මගින් තිත ගොඩ නැගේ. තිත තැබීමේදී චිත්‍ර ශිල්පියා මූලික අරමුණක් සහිතව පින්සල එක තැනක තබමින් එක් ස්ථානයකට කේන්ද්‍රගත වේ. එහිදී නිදහසේ නිරායාසයෙන් පින්සල භාවිත කර ඇත. එහෙත් වේගය, ජවය ආදිය එහි දක්නට නොලැබේ. තිත චිත්‍ර ශිල්පියා නිසඟයෙන් ළඟාකර ගත් ශිල්පීය ශක්‍යතා ලක්ෂණ වන පුහුණුව හා පරිණතභාවය පිළිබඳව ප්‍රකට කළ හැකි අංගයක්ද නොවේ. බිතු සිතුවම් ශිල්පියා තිත් තැබීම පිළිබඳ එවැනි න්‍යායාත්මක හෝ ශිල්ප විද්‍යාත්මක ප්‍රවේශයක් ලබා නොගත්තද තිත නිර්මාණ කාර්යයන් සඳහා බොහෝ සේ භාවිත කර තිබේ. තිත තැබීමේදී චිත්‍ර ශිල්පියා සතුව නිසඟයෙන්ම ගොඩ නැගෙන ක්‍රියාවලියක් වූයේ ශික්ෂණයයි. තිත් මෝස්තර රටාවක් ගොඩ නගන චිත්‍ර ශිල්පියා සතුව ඉතා සියුම් දෘශ්‍ය ශික්ෂණයක් ගොඩ නැගේ. ඒ අයුරින්ම රේඛාවේ භාවිතාවට වඩා කාලයක් තිත් භාවිත කිරීමේදී වැය කිරීමට සිදු වේ. එබැවින් තිත් භාවිත කිරීමේ දී චිත්‍ර ශිල්පියා බිතු සිතුවම සමග වැඩිපුර කාලයක් සහ විනයක් යෙදවීමට සිදු වේ.

තිත යම් විටෙක හැඟවීම් සංඥාවක් ලෙසද භාවිත කෙරේ. වසම්මලේ බිතු සිතුවම්වල හා ගිරාපොකුණුහෙල බිතු සිතුවම්වල නාග රාජයාගේ පෙණ ගොබය හා නාගයාගේ ශරීරය හැඟවීම පිණිස තිත භාවිත කර තිබේ. වසම්මලේ චිත්‍ර ශිල්පියා තිත භාවිත කර ඇත්තේ තිත අනෙක් රේඛා සමග මිශ්‍ර කිරීමෙනි. එම තිත් සමූහය එකට යා කළ විට වක්‍ර රේඛාවක් ගොඩ නැගේ. නාගයාගේ වක්‍ර උඩට නෙරූ පෙණ ගොබය හැඟවීම පිණිස තිත භාවිත කර ඇත. තිත් සමූහය එක දිගට සමාන්තරව පුන පුනා ගලා

යමින් වක්‍රාකාර රේඛාවක් ලෙස නරඹන්නාට හැඟවීම හැඩයක මූලික අණුවක් ලෙස තිත භාවිත කෙරේ. තිත හෝ තිත් කිහිපය පමණක් වෙනම ගත් කල අර්ථශූන්‍ය වෙයි. තිත් සමූහයම අනෙකුත් රේඛා, වර්ණ හා හැඩ සමග සම්මිශ්‍රණය වී ඇති ආකාරය සහ තිත් මගින් හඟවන හැඩය පිළිබඳ නිරීක්ෂණය කළ හොත් නාගයාගේ පෙණ ගොබය පිළිබඳව මූලික අවබෝධයක් ලබා ගත හැකිය. ඒ අනුව වසම්මලේ චිත්‍ර ශිල්පියා තිත බිතු සිතුවම් අතර හැඟවීමේ සංඥාවක් ලෙස භාවිත කර ඇත. වසම්මලේ බිතු සිතුවම් අතර තිත නාගයාගේ ශරීරය (කඳ ප්‍රදේශය) දෘශ්‍යමය විස්තර කථනය කෙරෙන අංගයක් ලෙස භාවිත කර ඇත. නාගයාගේ රවුම් සිලින්ඩාකාර ශරීරය හොඳින්ම නම්‍යශීලීය. එය වක්‍රයකට සමාන ආකාරයට නවා සිටින ආකාරය නාගරාජ මුරගල්වල දක්නට ලැබේ. එම වක්‍රව නැගී සිටින ආකාරය හැඟවීම පිණිස භාවිත කරන දෘශ්‍යමය උපක්‍රමයක් ලෙස තිත භාවිත කර තිබේ. වක්‍ර හැඩය මූලික රේඛා ද්වයෙන් වට කර හැඩය මතු කර තිබන අතර ශරීරයේද කෙළවරට තද පැහැය යොදා තිබේ. මධ්‍යය ලා රඹ පැහැයෙන් යුක්ත ය. ශරීරයේ වක්‍ර බව සිලින්ඩරකාර බව හොඳින්ම තීව්‍ර වීම පිණිස චිත්‍ර ශිල්පියා තද රත් පැහැයෙන් සම ප්‍රමාණයෙන් තිත සම පරතරයකින් රේඛාව ගොඩ නැගෙන ආකාරයට පුන පුනා ගොඩ නගා තිබේ. එය වක්‍ර කඳෙහි හරස් අතට දිවෙන රේඛාවන් සමූහයක් ලෙස ගොඩනගා ඇත. වසම්මලේ චිත්‍ර ශිල්පියා තිත හැඟවීමේ දෘශ්‍ය සංඥාවක් ලෙස භාවිත කර ඇත.

ගිරාපොකුණුහෙල චිත්‍රශිල්පියාද විශාල පෙණ ගොබ රාශියක් සහිත නාග රුව හැඟවීම පිණිස තිත භාවිත කරයි. ගිරාපොකුණුහෙල චිත්‍ර ශිල්පියා ප්‍රථමයෙන්ම නාගරුව චිත්‍රණය කර, ලා කහ රඹ පැහැය අතුරා ඒ මත තද දුඹුරු රතු පැහැයෙන් වට රේඛා ගොඩ නගා තිබේ. එම වට රේඛා කෙළවරෙන් අඳුරු කර මූලික පෙණ ගොබවල හා ශරීරයේ හැඩය නිර්මාණය කර ඇත. ඉන් ඉක්බිති ලා රඹ පැහැති ශරීරය පුරා අපිළිවෙළින් සම්පූර්ණ ශරීරය වැසෙන සේ තිත් යොදා ඇත. එම තිත් අතර පරතරය යම් සමාන අවකාශයක් තබා ගැනීමට චිත්‍ර ශිල්පියා වගබලා ගෙන තිබේ. වසම්මලේ චිත්‍ර ශිල්පියා නාගයාගේ හැඩය දැක්වීමට තිත තැබුවද ගිරාපොකුණුහෙල චිත්‍ර ශිල්පියා හැඩය පෙන්වීම පිණිස නොව, නාග ශරීරයෙහි ස්වභාවය කොරපොතු ආදිය නරඹන්නාට හැඟවීමේ දෘශ්‍ය සංඥාර්ථය වෙනුවෙන් තිත භාවිත කර තිබේ. ගිරාපොකුණුහෙල චිත්‍ර ශිල්පියාද අතිදක්ෂ පුහුණු ශිල්පියෙකි. ඔහු තිත තැබීමේදී චිත්‍ර ශිල්පියෙකු සතු ඉවසීම, ශික්ෂණය, ඒ සඳහා කළ යුතු කැපවීම හා නිර්මාණය නිමා කිරීම සඳහා ලබා ගත යුතු කාලය පිළිබඳව මනා පරිචයක් සතු වූවකු  බව පැහැදිලිය.



**4 රූපය : බදාම මත වර්ණ (වසම්මලේ - නාග රූපය)**



**5 රූපය : බදාම මත වර්ණ (වසම්මලේ - නාග රූපය)**




**6 රූපය : බදාම මත වර්ණ (ගිරාපොකුණුහෙල - නාග රූපය)**

**ඈ) ඝනත්වය ගොඩනැගීම**

ඝනත්වය බිතු සිතුවම් මගින් තීව්‍ර කිරීමට ඉපැරණි චිත්‍ර ශිල්පියා උනන්දු වී තිබේ. බිතු සිතුවමක ඝනත්වය, රිද්මය, වටකුරු බව, දැන්වීමේ සරලව මූලික ඝන හැඩය වටරේඛා දෙකකින් වෙන් කරමින් සහ හැඩය පිළිබඳ අදහසක් ලබාදෙයි. බිතු සිතුවමක ඝනත්වය යනු චිත්‍ර ශිල්පියා හා නරඹන්නා අතර සිදු වන සංඥාත්මක ද්වතාවයකි. එය වඩාත් සාර්ථක වනුයේ චිත්‍ර ශිල්පියා ලබාදෙන සංඥාව නරඹන්නා ග්‍රහණය කර ගැනීමේ ශක්‍යතාව මත පදනම්වය. චිත්‍ර ශිල්පියා ඝනත්වය පිළිබඳව සංඥාවක් ලබාදෙයි.

වසම්මලේ බිතු සිතුවම් ශිල්පියා වටකුරුබව, ඝනත්වය පෙන්වීම සඳහා තිත පුනා පුනා යෙදීම භාවිත කර තිබේ. වක්‍ර හැඩය, යම් ද්‍රව්‍යයක මානව හෝ සත්ව රූවක වක්‍ර හැඩය ඝනත්වය මතු කිරීමට තිත් සමූහයක් පුන පුනා යෙදීම යම් ක්‍රමානනුකූල දෘශ්‍ය ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. මෙම පියවරවලදී ඍජු සිලින්ඩරාකර හැඩයක ඝනත්වය සලකුණු කිරීම දුරස්ව සමාන දුරකින් පවතින රේඛාවේ හැඩය කෙටි තිත් මගින් ද සලකුණු කළ හැකිය. එම තිත් සමූහය එකතු වී මූලික සිලින්ඩරාකාර හැඩයේ වක්‍ර බව තීව්‍ර කිරීම පිණිස උපකාර වෙයි. එක සමාන දුරකින් පිහිටි තිත් සමූහය මගින් දිගු සිලින්ඩරාකාර වක්‍ර බටයක් වැනි හැඩයක් නිර්මාණය කළ හැකි ය. වසම්මලේ චිත්‍ර ශිල්පියා ද එලෙසින්ම තිත් මගින් සර්පයකුගේ වක්‍ර ශරීරය නිර්මාණය කර ඇත. වසම්මලේ බිතු සිතුවම් ශිල්පියා නාග රුවෙහි කඳ නිර්මාණය කිරීමේදී මෙම තිත් සහිත රේඛාත්මක හැඩතලය ඉතා උපක්‍රමශීලීව යොදා ගෙන තිබේ. එය ඉතා පරිණත චිත්‍ර ශිල්පියෙකුගේ නිර්මාණාත්මක පරිණතබවෙහි දෘශ්‍ය විලාසයකි. එය සර්පයෙකුගේ කඳෙහි ඝනත්වය ගොඩ නැගිය හැකි ඉතා සරලම, පුහුණු ශිල්පියෙකුගේ දෘශ්‍ය නිර්මාණ සාක්ෂරතාව පෙන්විය හැකි හොඳම හා පහසුම ශිල්ප ක්‍රමයකි. තිත භාවිත කරමින් හැඩතල ගොනු කිරීම අනුරාධපුර යුගයේ චිත්‍ර ශිල්පීය උපක්‍රමයක් බවටද පත්ව ඇත.



**7 රූපය :**
**සිලින්ඩරාකාර වක්‍ර ස්වභාවය තිත් මගින් නිරූපණය කිරීම**
**(කඩදාසි මත රේඛා)**



**8 රූපය:**
**බදාම මත වර්ණ**
**(වසම්මලේ - නාග රූපය)**

වසම්මලේ නාග රුවෙහි කඳ වක්‍ර හැඩය නැවත වක්‍රයක් බවට පත්වන ආකාරයට පිහිටුවා ගෙන ඇති නිසා (මුරගලෙහි නාග රුවෙහි කඳ පිහිටි ආකාරයට) එම තිත් සමූහය එක ලක්ෂයක සිට සමානව විසිරී යන ආකාරයට දැක්විය හැකි වන අතර එය බිතු සිතුවම් ශිල්පියෙකුගේ මූලික දෘශ්‍ය අධ්‍යයනයෙහි පරිණත අවස්ථාවක් ලෙස සනිටුහන් කළ හැකිය. ගිරා පොකුණු හෙලෙහි නාග පෙණය හා කඳ ගොඩ නැගීමේදී තිත භාවිත කළද එහිදී රේඛාව මගින් මූලික වක්‍ර හැඩය ගොඩ නගා ඇති අතර තිත නාග රාජයාගේ පෙණ කොර පොතු පිළිබඳව හැඟවීමේ සංඥාවක් ලෙස භාවිත කර ඇත. ගිරා පොකුණු හෙල බිතුසිතුවම්වලදී වසම්මලේ බිතු සිතුවම්වල මෙන් තිත් සීමිත ප්‍රමාණයක් භාවිත කර හැඩය ඝනත්වය තීව්‍ර කරනු වෙනුවට තිත් විශාල ප්‍රමාණයක් යොදා හැඩතලය හා ඝනත්වය ගොඩ නගා ඇත. වසම්මලේ බිතු සිතුවම්වලදී නාගයාගේ විශාල පෙණ ගොබයෙහි වක්‍ර බව හා නැමීම යන පෙණ ගොබයේ ඝනත්වය හැඟවීම සඳහාද තිත භාවිත කර ඇත. මූලික රේඛා යුගලය, එක් පසෙක වන වෘත්තාකාර මෝස්තර රටාව අනෙක් පස මදක් අඳුරු කළ පෙණ ගොබයේ කෙළවර අතර වන හැඩය හැඟවීම පිණිස සමාන පරතරයක් සහිතව රේඛා ආකාරයට තිත ගොඩ නගා ඇත. එයින් පෙණ ගොබයේ ඝනත්වය හොඳින්ම නරඹන්නාට සංජානනය කෙරෙයි.

### නිගමනයඃ

ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා **වසම්මලේහා ගිරා පොකුණු හෙල** යන බිතුසිතුවම් ස්ථානවල පෙණ ගොබ රාශියකින් යුතු නාග රුව චිත්‍රණය කිරීමේදී, ස්වාභාවිකත්වය නිර්මාණශීලීව යොදාගත් ආකාරය, නිදහස් රේඛාව, ඝනත්වය ගොඩනැගීම ආදී නිර්මාණ ශක්‍යතාවන් විශද කෙරෙන බව **නිගමනය** කළ හැකිය.

### මූලාශ්‍රය


ඇන්තනී., ජේ. (2006). **මහා සිංහලේ වංසකතාව.** කොළඹ : ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

කුමාස්වාමි, ඒ. කේ. (1962). **මධ්‍යකාලීන සිංහල කලා.** (පරි.) සෝමරත්න, ඇම්. කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

චන්ද්‍රවිමල හිමි, ආර්. (2015). **අභිධර්මයේ මූලික කරුණු.** ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය

චාර්ල්ස්, එස්.පී. (2000). **පාරම්පරික සිංහල බිතුසිතුවම්.** මධ්‍යම සංස්කෘතික අරමුදල.

ජයරත්න., පී. (2008). **බුද්ධ චරිතය.** (අනු.). ස්ට්‍රෝං., ජේ.එස්. සංහිඳ මුද්‍රණ හා ප්‍රකාශන

තිලකසිරි, එස්. සහ මනම්පේරි, පී. (2001). (සංස්.). **අමෘතාවහ නම් බුද්ධ චරිතය හෙවත් බුත්සරණ.** රත්න පොත් ප්‍රකාශකයෝ.

ධර්මකීර්ති හිමි, එන්. එස්. (2017). (සංස්.) **විසුද්ධි මාර්ගය.** කොළඹ : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

ධර්මකීර්ති හිමි, එන්.එස්. (2017).(සංස්.) **විශුද්ධි මාර්ගය.** කොළඹ : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

බෂාම්. ඒ. එල්. (1995). අසිරිමත් ඉන්දියාව. (පරි.) කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

මද්දුමාගේ, එම්. (2013). (සංස්.) **සරල සිංහල දීඝ නිකාය.** කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මල්දෙණිය., එස්.ජී. (2016). **පොලොන්නරුවේ පැරණි ස්මාරකයන්හි චිත්‍රගත සැරසිලි මෝස්තර.** කර්තෘ ප්‍රකාශන.

විජේසේකර,එන්. (1964). **පැරණි සිංහල බිතුසිතුවම්.** (පරිඃ) ඇස්.සී.ටී.ක්‍රියැන්නස්. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

සන්නස්ගල, පී.බී. (1964). **සිංහල සාහිත්‍ය වංශය.** කොළඹඃ ලේක් හවුස් මුද්‍රණාලය.

සුමනජෝති හිමි, ජී. (1957). (සංස්.) **සැළලිහිණි සන්දේශය.** ප්‍රකාශක නාමය සඳහන්ව නැත.

සුමංගල හිමි, එච්.එස්., දේවරක්ෂිත බී., සහ තවත් අය. (2012 ). **මහාවංශය සිංහල.** (සංස්.). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සෙනෙවිරත්න, ඒ. (2001). **සිංහල ශිෂ්ටාචාරයේ උදාගිර මිහින්තලාව.** කොළඹ :ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හිරියන්න, ඇම්. (2014). සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය. (පරි.) කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
හේවාපතිරණ, ඩී. (2012). **ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව**, කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
Bandaranayake, S. (2006). The rock and Wall paintings of Sri Lanka. Pannipitiya: Stamford Lake.
Geiger, W. (1986). *THE MAHAWAMSA*. unesco-Ministry of Cultural Affairs

**ආශ්‍රිත ලිපිඃ**

ජානගේ, වී. (2000 දෙසැම්බර්). නාග වන්දනයේ ඓතිහාසික පසුබිම හා නාග සංකේත. *නිශ්ශංක.* 1(1), 64-72.
වජිර හිමි,එච්.(1995). "ශ්‍රී ලංකාවේ පැරණි බිතු සිතුවම් සඳහාතලය සකසා ගැනීම." *සංස්කෘතිකපුරාණය.* 1 කලාපය, 12 වෙළුම , කොළඹ ඃ සංස්කෘතික කටුයුතු දෙපාර්තමේන්තුව, පිටු.14-16.
වික්‍රමසිංහ, එන්. (1990). බිතුසිතුවම්-ක්‍රිඃවඃ 800-ක්‍රිඃවඃ 1200. *චිත්‍ර කලාව.* 5, 51-70.
සිල්වා, ආර්.ඩී. (1990). චිත්‍ර කලාව - ආදි යුගය ක්‍රිඃපූඃ 247-ක්‍රිඃවඃ 800 තෙක්. *චිත්‍ර කලාව.* 5, 3-49.
සිල්වා, ආර්.ඩී. (1990). "චිත්‍ර කලාව ආදි යුගය ක්‍රිඃපූඃ 247-ක්‍රිඃවඃ 800 තෙක්." *චිත්‍ර කලාව*, 5 කලාපය, කොළඹ ඃ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. පිටු.3-49.
Bal , M. , Bryson , N. , (1991) " Semiotics and Art history ",*The Art Bulletin*, Vol.73 , No. 2 ,PP 242 – 256.

# වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු පිළිබඳ ලියූ ප්‍රශස්ති කාව්‍යයක්

එච්. දිනේත්‍රා තරංගනී

## හැඳින්වීම

රාජ්‍ය පාලකයකුගේ හෝ කීර්තිමත් පුද්ගලයන්ගේ ගුණ වර්ණනා කරමින් ලියැවුණ ගී කාව්‍ය විශේෂයක් ප්‍රශස්ති කාව්‍ය ලෙස හඳුන්වන අතර සිරිත, වර්ණනාව, වත සහ විරුදාවලිය යනාදිය ද මේ සඳහා භාවිත වේ. ප්‍රශස්ති කාව්‍යයෙහි අපර නාමය 'විරුද' වන අතර, සකු භාෂාවෙන් විරුද කාව්‍යය වශයෙන් ව්‍යවහාර කරයි. අතීතයේ දී වන්දිභට්ටයන් රාජ සභාවෙහි දී රජවරුන්ගේ ගුණ වර්ණනාවට ලක් කර ඇති අතර, එවැනි ගුණ වර්ණනා ඇසීමෙන් සතුටු වන රජවරුන් විසින් ඔවුන් සඳහා තෑගි බෝග පිරිනැමීමට ද කටයුතු කරන ලදී. මුවදෙව්දාවත, පරවි සන්දේශය සහ මයූර සන්දේශය වැනි සන්දේශ කාව්‍යයන්හි ද ප්‍රශස්ති කාව්‍යයන්හි ලක්ෂණ දැකගත හැකි වුව ද කෝට්ටේ යුගයේ දී තනි පුද්ගලයෙකුගේ ගුණ වර්ණනා කරමින් ලියූ පැරකුම්බා සිරිත මුල්ම ප්‍රශස්ති කාව්‍යය ලෙස හඳුන්වනු ලැබේ. හයවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව.1415-ක්‍රි.ව.1467) වෙනුවෙන් ගැයූ ප්‍රශස්ති කාව්‍යයක් වන මෙහි කවි 140කි. මහනුවර යුගයේ දී ප්‍රශස්ති කාව්‍ය රචනා වීමේ වර්ධනයක් දක්නට ලැබෙන අතර, රජවරුන් උදෙසා ප්‍රශස්ති ගායනා කිරීම මේ කාලයේ දක්නට ලැබෙන විශේෂත්වයකි. මෙහි දී අධ්‍යයනයට ලක් කර ඇත්තේ නරේන්ද්‍රසිංහ රජතුමා පිළිබඳව ලියූ ප්‍රශස්ති කාව්‍යයකි. නරේන්ද්‍රසිංහ රජු වෙනුවෙන් රචනා වී ඇති ප්‍රශස්ති කිහිපයක්ම හඳුනාගත හැකි අතර, නරේන්ද්‍රසිංහ හටන, නරේන්ද්‍රසිංහ වර්ණනාව, නරේන්ද්‍රසිංහ රාජකීය විරුදාවලිය, නරේන්ද්‍රසිංහ භවනිය, නරේන්ද්‍රසිංහ ආශිර්වාදය, නරේන්ද්‍රසිංහ ස්තුතිය යනාදිය ඒ අතර වේ. මේ අතරින් හමු වූ නරේන්ද්‍රසිංහ වර්ණනාව සහිත පුස්කොළ ලේඛනයක් මෙහිදී සාකච්ඡා කෙරේ. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ක්‍රි.ව. 1707-ක්‍රි.ව.1739) මහනුවර යුගයේ රාජ්‍ය පාලකයෙකු වන අතර ඔහු දෙවන විමලධර්මසූරිය රජුගේ (ක්‍රි.ව.1687-ක්‍රි.ව.1707) පුත්‍රයෙකි.

## අරමුණ

නරේන්ද්‍රසිංහ වර්ණනාව නමින් හඳුන්වන ප්‍රශස්ති ලේඛන කිහිපයක් පිළිබඳ ව ම වාර්තා වී ඇති අතර, ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු පිළිබඳ මෙම පුස්කොළ ලේඛනයෙහි අන්තර්ගතය පිළිබඳ අධ්‍යයනය කිරීමට අපේක්ෂිතය.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී සාහිත්‍ය විමර්ශනය සහ සම්මුඛ සාකච්ඡා යනාදි ක්‍රමවේදයන් භාවිත කරන ලදී. ජේ.ඊ. සේදරමන් 1970 දී ප්‍රශස්ති කාව්‍ය රසය නම් ග්‍රන්ථයෙහි නරේන්ද්‍රසිංහ වර්ණනාව ඉදිරිපත් කර ඇත. එමෙන්ම හියු නෙවිල්ගේ පුස්කොළ ලේඛන නාමාවලියෙහි නරේන්ද්‍රසිංහ රජු හා සම්බන්ධ ප්‍රශස්ති

කිහිපයක්ම හඳුනාගත හැකි අතර, නරේන්ද්‍රසිංහ වර්ණනාව නමින් සඳහන් කරන ලද ලේඛන 03කි. ඒ පිළිබඳව ද පූර්ව අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙහි පළමු පුස්කොළ පත්ඉරුව දක්නට නොලැබෙන හෙයින් විරිඳු කාව්‍යයන් අංක කිරීමේ දී දෙවන පත් ඉරුවේ පළමු කාව්‍ය අංක 01 ලෙස ගනිමින් අංකනය සිදු කර ඇත.

**සාකච්ඡාව**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පස්යොදුන් කෝරළයේ, පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරලුගොඩ ග්‍රාමයේ පදිංචි මද්දහෙට්ටිගේ පියසේන මහතා සතු මෙම පුස්කොළ පොත ඔහුගේ පියා වූ මද්දහෙට්ටිගේ ඇඩ්ඩින් මහතාගෙන් හිමි වූවකි. මෙම පුස්කොළ ලේඛනයෙහි පත් ඉරු 31ක් තිබිය යුතු නමුත් එහි පත් ඉරු 02ක් අස්ථානගත වී ඇත. ඒ අනුව පළමු පත් ඉරුවත් 17වන පත් ඉරුවත් දැකගත නොහැකි වන අතර, 18 වන පත් ඉරුවෙහි අනෙක් පස (පසුපස) කිසිවක් සටහන් කර නොමැත. මෙහි කම්බාව දැවයෙන් නිම කර ඇති අතර, එය කැටයම් රහිත ඍජුකෝණාස්‍රාකාර කම්බාවකි. සාමාන්‍යයෙන් පත් ඉරුවක දිග 27.3cm වන අතර, පළල 4.9cm කි. කවි ලියා ඇති පත් ඉරුවක පේළි 08ක් දැකගත හැකි වන අතර, එක් පසෙක කවි 08කි. ඇතැම් අවස්ථාවල එය 2-3 දක්වා වෙනස් වන අවස්ථා ද ඇති අතර, සින්දු සහිත පත් ඉරුවක් පේළි 5-8 අතර ලියා ඇති අතර, එය 13වන පත් ඉරුවෙන් ආරම්භ වේ. අංකනය කිරීම සඳහා අක්ෂර මෙන්ම හින්දු අරාබි ඉලක්කම් ද යොදා ගෙන ඇති ආකාරයක් දක්නට ලැබේ. ඒ අනුව අක්ෂර වම්පස කෙළවරේ මධ්‍යයට වන්නත් හින්දු අරාබි ඉලක්කම් දකුණු පස කෙළවරේ මධ්‍යයට වන්නත් සටහන් කර ඇත.

රම්මලක අදිකාරම් විසින් පළමු නරේන්ද්‍රසිංහ වර්ණනාව රචනා කරන ලදැයි පිළිගන්නා අතර, ඔහු සංස්කෘත, පාළි, දෙමළ ආදි භාෂාවන්හි හසළ බුද්ධිමතෙකි (සේදරමන් 1970:xvi). මේ හේතුවෙන් ප්‍රශස්ති කාව්‍යයට ද ඔහුගේ භාෂා හැකියාවන් එක් වී ඇති ආකාරයක් දක්නට ලැබේ. නරේන්ද්‍රසිංහ රජුගේ අගබිසව මධුරාපුරයෙන් ගෙන්වූ කාන්තාවක වන අතර ඇයගේ මරණයෙන් රජු කම්පාවට පත් වූ බව ද වාර්තා වේ. මේ අනුව නරේන්ද්‍රසිංහ රජු තම බිසවට දැඩි සේ ඇලුම් කරන්නට ඇති අතර, එය ප්‍රශස්ති කවියා, තම අභිප්‍රායන් සඵල කර ගැනීමට උපයෝගී කර ගන්නට ඇත. ඒ අනුව ප්‍රශස්ති කාව්‍යය සඳහා දකුණු ඉන්දියානු භාෂාව යොදා ගැනීමෙන්, රාජ සභාවේ දී රජ බිසව සතුටු කර එමගින් රජුගෙන් වරප්‍රසාද ලබා ගැනීමට හැකිවන්නට ඇතැයි ද උපකල්පනය කළ හැකි වේ. එහි ප්‍රතිඵලයක් ලෙස දකුණු කේරල භාෂාවක් වන මලයාලම් භාෂාව යොදාගත් අවස්ථා මෙහි හඳුනාගත හැකි වේ (ඡායාරූපය 01).

> "සෙකනි කතාන් කිනසේ කිසෙන්තරි එනවරු පෙත්ත නිල්මෙල යි ද චක්‍රපානි
> සෙල්ලා ඉරපෙපන්තා මුඩිනාග මෙත්ත මෙති කුලු රගු මාදවර්..." (49)

එහෙත් රම්මලක අදිකාරම් ලියූ බවට සලකන ප්‍රශස්ති කාව්‍යයෙහි මෙවැනි මලයාලම් භාෂාව භාවිත වූ කාව්‍යයක් දක්නට නොලැබේ. මේ හේතුවෙන් ප්‍රශස්ති කාව්‍යය පිටපත් කිරීමේ දී එකතු කළ නව එකතු

කිරීමක් ලෙස මෙය සැලකිය හැකි වේ. එමෙන්ම පාලි හා සංස්කෘත භාෂා ද යොදා ගත් අවස්ථා දක්නට ලැබෙන අතර ම, සිංහලෙන් ලියන ලද කවිවලට ද මෙම භාෂාවල වචන යොදාගත් අවස්ථා දක්නට ලැබේ. තව ද රජු මෙම භාෂාවන් දැන සිටි බවට ද අදහසක් මෙහි දැකගත හැකි ය.

"මන් දැඩි ප්‍රතිකල් දෙමලො ලඤෙසි - බන් -එ ජටා ලාඩය සන්නසි
නන් දෙස වල මේ බාසා විසෙසි පින්වත් අපහිමි දැන නෙක තෙසි" (60)

නරේන්ද්‍රසිංහ රජු උගතුන් ප්‍රිය කළ බවත්, ශාස්ත්‍රීය හෝ ආගමික හෝ විවාද කරවමින් එයින් විනෝද වූ බවත් වාර්තා වේ (වාචිස්සර හිමි2014:18). එමෙන්ම ජෝසප් වාස්, ජේකම් ගොන්සාල්ස්වේස්, ගස්කොන් යන විදේශිකයන් රජුගේ මිතුරන් වූ අතර රජ බිසව ද මධුරාපුරයෙන් ගෙන්වන ලද තැනැත්තියකි. ඔවුන් සමග ගනුදෙනු කිරීම හේතුවෙන් රජු මෙම භාෂා තේරුම් ගැනීමට ප්‍රමාණවත් භාෂා හැකියාවකින් යුතු අයෙකැයි උපකල්පනය කළ හැකිවේ.

මෙම ප්‍රශස්ති කාව්‍යයෙහි අවසානයේ දී වෙනත් පුද්ගලයෙකු ලවා ලියවා ගත් බවක් හෝ ප්‍රතිපාදන ලබා දුන් බවක් හෝ සඳහන් නොවේ. එහෙත් "බබිගේ සින්දු පොතයි" යනුවෙන් ප්‍රශස්ති කාව්‍යය අවසන් කර ඇති අතර, ඒ අනුව මෙහි රචකයා බබී නම් පුද්ගලයා විය යුතු ය. එමෙන් ම තනතුරු නාමයක් හෝ ප්‍රදේශයක් පිළිබඳව ලියා නොමැති හෙයින් ඔහු ස්වාධීන තැනැත්තෙකි. විශේෂයෙන් ම ඔහු භාෂා හැකියාවන්ගේ ප්‍රවීණයෙකු විය යුතුවේ. එහෙත්,

"....පසිඳු කල ලොව ඉසුරු ශපතින් දෙලොව හිමි වූ සුර රදෙක්ම ය
විරිඳු කිවි වනවලක හිමි නරෙන්‍ද්‍රසිංහ ගන මෙකුලෙක්ම ය" (38)

යනුවෙන් ලියා ඇති අතර, එය ඉහත පරිදි කියවීමෙන් වනවලක නම් භික්ෂූන් වහන්සේ කළ බවට උපකල්පනය කළ හැකි වේ. නමුත් හැරල්ඩ් වේරගොඩ බස්නායක නිළමෙතුමා සතු නරේන්ද්‍රසිංහ වර්ණනාව සේදරමන් පහත පරිදි කියවා ඇත (1970:98).

"....පසිඳු කල ලොව ඉසුරු සැපතින් දෙදෙව් ලොව හිමි සුර රදෙක්මය
විරිඳු රුපු සිඳ වන ලෙස හිමි නරෙන්‍ද්‍රසිංහ ගත මෙ කුලක්මය" (41)

එමෙන්ම මෙය "විරිඳු කිවිව නව ලක හිමි නරෙන්‍ද්‍රසිංහ ගන මෙ කුලෙක්මය" යනුවෙන් ද කියවිය හැකිවේ. මෙම කවියෙහි අනෙක් පද පේළිවලින් ද නරේන්ද්‍රසිංහ රජු වර්ණනා කරන අතර, මේ කාව්‍ය පිටපත් කිරීමේ දී සිදුව ඇති අක්ෂරමය වෙනස්කම් ද විය හැකි ය. ඒ අනුව මෙය රජු වර්ණනා කිරීමට ගත්තක් මිස කතුවරයා දැක්වීමක් නොවේ (ඡායාරූපය 02).

1869 දී මෙම ලේඛනය ලියා ඇති බව අවසන් පත් ඉරුවෙහි සටහන් කර ඇති අතර, එය නරේන්ද්‍රසිංහ රජුගේ මියයාමෙන් වසර 140කට පසු ලේඛනගත කරන ලද්දකි. ඒ අනුව මෙම ප්‍රශස්ති කාව්‍යය රම්මළක අදිකාරම් ලියූ නරේන්ද්‍රසිංහ වර්ණනාවෙහි පිටපතක් ද විය හැකි ය. එහෙත් සේදරමන් විසින් ඉදිරිපත් කරන ලද නරේන්ද්‍රසිංහ වර්ණනාවෙහි සඳහන් වන ඇතැම් කවි හා සින්දු මෙහි ඇතුළත් නොවන අතර, නව කවි හා සින්දු කිහිපයක් ම දක්නට ලැබේ. එම වර්ණනාවන්හි ආගමික කාර්යයන් හා රණ ශූරත්වය වර්ණනාවට ලක් කර ඇත.

ඊට අමතරව සේදරමන් ඉදිරිපත් කළ ප්‍රශස්ති කාව්‍යයෙහි සඳහන් වචන හා අක්ෂර අසමාන වන අවස්ථා ද හමු වේ.

"යොගවන්ත නරේන්ද්‍රසිංහ නිරි දා
සිරිපාද පංකජ නැම ද තොපි නොයි දා...."(58)

සේදරමන් ඉදිරිපත් කරන්නේ පහත පරිද්දෙනි.

"යොගවන්ත නරේන්ද්‍රසිංහ නිරි දා
දෙ පන්කජ නොවැඳ තොපි නොසි දා...." (72)

මේ අනුව සැලකීමේ දී මෙම ප්‍රශස්ති කාව්‍ය ලිවීමේ දී රචකයා නව කාව්‍ය කිහිපයක් එකතු කර ඇති අතර, ඒ ඔහු මින් පෙර ඇසූ වෙනත් වර්ණනා හෝ ඔහු විසින් එකතු කරන ලද ඔහුගේ ම නව අදහස් හෝ විය හැකි ය.

ප්‍රශස්ති කාව්‍යයෙහි නරේන්ද්‍රසිංහ රජු හැඳින්වීමට බුවිසුරා, රබපති, රම්බපති, දිනේන්ද්‍ර, හරිස්චන්ද්‍ර, මහිපා යනාදි වචන යොදා ගෙන ඇති අතර, ඔහුගේ පරපුර හා වංශය පිළිබඳ ව පහත පරිදි සටහන් කර ඇත්තේ ය.

"සිංහනූප කුල ධීරා
විමලධර්ම ස්වාමි ශේෂට කුමරා
උදුල නරෙන්‍දරසිංහ ග මෙහීරා" (75)

නරේන්ද්‍රසිංහ රජුගේ රාජ්‍ය කාලයේ දී දේශපාලනික වියවුල් කිහිපයක් ම සිදු වී ඇති අතර, ඒ අතරින් රදලවරුන්ගෙන් ඇති වූ බලපෑම් ප්‍රධාන වේ. මන්දාරම් නුවර දී රජු ඝාතනය කිරීමට ඇති කළ කැරැල්ලක් මෙන්ම හේවාහැට දී ද තවත් කැරැල්ලක් සිදු වූ බව වාර්තා වේ. මෙලෙස රජුට හානි කිරීමට වඩිග පෙළපත්වලින් එන රදලවරු උත්සාහ දැරූහ (අභයසිංහ 2017:29). මෙවැනි අවස්ථාවල දී රජතුමා දැඩිව

ක්‍රියා කළ ආකාරයක් දක්නට ලැබෙන අතර, මරණීය දණ්ඩනය ලබා දීමට ද ක්‍රියා කර ඇත. විශේෂයෙන් ම නරේන්ද්‍රසිංහ වර්ණනාවෙහි හා ශෘංගාරයෙහි රචකයා වූ රම්මළක අදිකාරම් ද රජුගෙන් වරප්‍රසාද ලැබූ පුද්ගලයෙකි. මහවැලි ගඟේ ඇති වූ සිදුවීමක දී රජු ඝාතනය කිරීමට තැත් කිරීමේ වරදට ඔහුට මරණීය දණ්ඩනය ලබා දීමට කටයුතු කර ඇත්තේ ය (සුමනජෝති හිමි වර්ෂය 102). රජු අශිෂ්ට ගති පැවතුම් ඇති භයානක මිනිසෙකැයි ද කෲර පාලකයෙකැයි ද වැලන්ටයින් සඳහන් කරනු ලැබේ (දිසානායක 1997:89). එමෙන් ම කලහකාරී පුද්ගලයෙකු ලෙස ඔහුගේ සේවකයන් මැසිවිලි නැගූ බව ද වාර්තා වේ. සී.ජේ. සිමන්ද රජු ඔහුගේ පියා මෙන් නොව වහා කිපෙනසුලු පුද්ගලයෙකු යැයි ප්‍රකාශ කර ඇත (දිසානායක 1997:90). මෙවැනි චරිත ලක්ෂණ සහිත නරේන්ද්‍රසිංහ රජතුමා රණකාමී පුද්ගලයෙකු ලෙස වර්ණනාවන්ට ලක් කරනු ලැබේ.

"තුග තුරඟ රොහනා හු - භුජ ගන කුල සරිනා
චතුරඟනී කර සේනා - දිසා සමන්විත ලංකා හාර කරණ
අග රඟ මි-නෙවු පරරාජ කිරීට - බිරජිත මුදු චරණ
සුබ මහ ලො සතු බව නාම නරෙන්‍ද්‍රසිංහ මහි දරනා - ලංකාපති" (58)

"හෙන උදක් ගැසුවොත් සිපත් රොසි නේ
තුඟුමද ඇතෙක්වත් දෙපළ වෙයි නිසි නේ
මිහි මෙකල්දිව නරෙන්‍ද්‍රසිංහ රජු නේ
ඔබ සරි රජෙක් තව ඇද්ද - මු දෙර නේ" (83)

එමෙන්ම රජු හා බේද වී යුධ කිරීමට සැරසීම හුදෙක් ජීවිත ආශාව නොමැති වීමක් ද යනුවෙන් ප්‍රශ්න කරයි.

"යොගවන් තෙද නරෙන්ද්‍රසිංහ නිරි ඳු
සිරිපාද පංකජ නැමද තොපි නොයි ඳු
මොඩකන් යුද කරණු රුපු සැම ඳු
ගෙවුනාද පින් කල පමන තොපි පෙර ඳු" (58)

"වීර පැරකුම් නරෙන්‍ද්‍රසිංහ මිහිප ල්
සිරිසර නැර උරබිත බජන කල හැම ක (ල්)
ගොර දුදනො කරණ පෙරලී අවු ල්
නරලොව හැර පරලොව යඬ සරිවද ක ල්" (82)

"බුද්ද සස්නය මෙලක පවතින ක ල්
ලක සිද්ද නොමවෙයි සතුරු පෙරලි අවු ල්

යුද්ද මොඩනි මෙ තොප දිවි ඇති   ක    ල්
මහ බැද්ද මිස දෙරණ කුමට ගෙව    ල්"(84)

"වන්ස සූරිය කුලඟ පෙර නිරිඳු            න්
කැල පිත් පිඩක් වන නරෙන්‍ද්‍රසිංහ නිරිඳු න්
සස මගින් උදක් යුද කරණු රුපු නිරිඳු  න්
උකුසන් පිසස් රකුසඬ මගුලකි දු         න්"(85)

තව ද රාජ්‍ය පාලන කාලය තුළ ලංකාව එක්සේසත් කර පාලනය කරන බවට ද දක්වමින් රජු වර්ණනාවට ලක් කර ඇති අවස්ථා කිහිපයක් ම හමුවේ. වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයෙහි ලක්දිව ඕලන්ද ජාතිකයන් වෙළඳ කටයුතු සිදු කළ අතර, ඔවුන් රජු සමග හිතවත් ව කටයුතු කර ඇති බවක් වාර්තා වේ. එයට හේතු වන්නට ඇත්තේ ස්වකීය වෙළඳාම දියුණු කර ගැනීමට රාජ්‍ය පාලකයාගේ සහය ලබා ගැනීම විය හැකි ය. එම හිතවත්කම කෙසේද යත් ලන්දේසීන් රජුට බල්ලන් සහ කුකුළන් පවා ගෙනවිත් දුන් බව ද වාර්තා වේ (වාචිස්සර හිමි 2014:166).

"කොප සිතින් ගිරි අඟනන් වනසා නොයෙක් කරවා වදහින් සා
එකසත් කරවා සිරිලක් පුරාවා නොයෙක් දෙස කීර්ති පසන් සා
දීප සක්විති රාජ නි රාජ නරේන්‍ද්‍රසිංහ දිනා දීපවන්          සා
මෙ ලකත් එකසත් කර සිත්සෙ රකින් සුරා දීප තෙ රගුවන්  සා" (56)

මෙහි පළමු පෙළ සේදරමන් දක්වනුයේ "කොප සිතින් නිරිඳුන් අහිතත් වනසා - නොයෙක් දෙස කරවාවද හින් සා" යනුවෙනි. එය වඩාත් අර්ථවත් බවක් පෙනේ.

එමෙන්ම ලන්දේසීන් ඔහු විස්කි බෝතලයෙන් නහවා ලන්දේසි නෞකා හරහා ආනයනය කළ විදේශීය බිසෝවරුන්ගේ පහසින් අන්ධ කර දැමූ බව වාර්තා වේ (මහාමේඝ 2015). එමෙන් ම රජු සුරාවට හා සංගීත ලෝල පුද්ගලයෙකු වූ බව ද මෙම ප්‍රශස්ති කාව්‍යයෙහි ම අන්තර්ගතයන් අතර වේ. මේ හේතුවෙන් නරේන්ද්‍රසිංහ රජුට සෙල්ලම් නිරිඳු යනුවෙන් අන්වර්ථ නාමයක් ද පැවතිණ.

"සත්‍ය වචන හරිස්චන්‍ද්‍ර
රාජ නිත්‍ය - ලොල සංගීත
සු බොජාමත්‍ය වර
දිරි සුහක හරි තෙජා ප්‍රත්‍වි පාල
කුල බන්දු සරොජා" (61)

"ගඟදර සුරනි බසෙ මුහුදු රඟ
යස දස දිග පුව්බොධා
ශ්‍රීඟාරික නව-නාට්‍ය-විනොද
ලංකාපති පර රාජ විරොජා" (62)

සාමාන්‍යයෙන් ප්‍රශස්ති කාව්‍යන්හි අන්තර්ගත වන ශෘංගාරාත්මක විරහ කාව්‍යයන් මෙහි ද දක්නට ලැබේ. ඒ තුළ විරහව මෙන් ම ආදරය දැකගත හැකි වේ.

"වදු වැඩු සෙනෙහසින් අප ගුරුවරුන් වෙත මා ඉන්න වා
සදරණ බස් දෙමින් සමහන් ලොබින් අප මෙහි ගෙන්න වා
එදු සිට සිව් ශරට රතිකන් නොහැර මා අනු දන්න වා
අදු වෙන බස් නරෙන්‍ද්‍රසිංහරද සරිද නොවැඩම ඉන්න වා"(88)

"බැළු පට සළු වියන් වට තිර අතුට මුදු සළු යහන තේ
සදු කවුමද කුසුම් පෙති නෙක සුදඳ දුන් දී නොනව තේ
යොදු දිය යහනක් ලෙසින් එහි ශදු සුරිදු ගෙ විම නේ
නිදු වන ශප කින්ද සකිසඳ නරෙන්‍ද්‍රසිංහ නාවොත් වෙ තේ" (90)

ප්‍රශස්ති ගී ගායනා කරන පුද්ගලයාගේ අභිප්‍රාය රජු සතුටු කරමින් ත්‍යාග ලබා ගැනීමයි. මෙලෙස ප්‍රශස්ති ගායනා කරන පුද්ගලයන් වෙත රජු ත්‍යාග ලබා දුන් බව මෙම ප්‍රශස්තියෙහි සඳහන්වේ.

"....බොග කිව්බස ඇඳිනෙ දෙමිනෙක තිළිනෙ
ඉන්‍ද්‍රදීප සෙ දින දින සිරිලංකා පති දෙව නරෙන්‍දර" (27)

නරේන්ද්‍රසිංහ රජු ඕලන්ද ජාතිකයන් සමග හිතවත් ව කටයුතු කිරීමෙන් කතෝලික පූජකයන්ට කතෝලික ආගම ප්‍රචාරය කිරීමට අවකාශය සකස් වී තිබිණ. එහෙත් රජු බුදු දහමට විරුද්ධව ක්‍රියා නොකළ අතර, ඒ පිළිබඳ උනන්දුවකින් කටයුතු කළ බවක් මුල්කාලීන ව දක්නට නොලැබේ. මේ හේතුවෙන් නරේන්ද්‍රසිංහ රජ දවස ශාසන පරිහානියක් සිදු වෙමින් පැවති බව සඟරජවතෙහි සඳහන් වේ (නාගසිංහ 2017:10-12). සරණංකර සංඝරාජ හිමියන් වහන්සේ ලංකාවට උපසම්පදාව රැගෙන එන ලෙස කිහිප වරක් ඉල්ලා සිටිය ද රජු ඒ පිළිබඳ උනන්දුවක් දැක් වූ බවක් නොපෙනේ. එහෙත් සරණංකර හිමියන්ට බෞද්ධ ග්‍රන්ථ රචනා කිරීම සඳහා අනුග්‍රහය ලබා දුන් අතර, සාරාර්ථ සංග්‍රහය රචනා කිරීමෙන් සතුටට පත් ව කුණ්ඩසාලේ විහාරයේ පවා නවත්වා ගෙන සිටි බව වාර්තා වේ (වාචිස්සර හිමි 2014:165). මෙකල රජතුමා ආගමික වෙහෙර විහාර ඉදි කරමින් ප්‍රතිසංස්කරණ කටයුතු කළ බව මහාවංසයෙහි මෙන් ම මන්දාරම්පුර පුවතෙහි ද විස්තර කර ඇත. එමෙන් ම මහියංගණය, අනුරාධපුරය, සමන්තකූට පර්වතය යනාදි ස්ථානයන්හි පුද

පූජා පැවත්වූ බව සුළු රාජාවලියෙහි ද සඳහන් වේ (ජයවර්ධන 1914:25). මෙලෙස නරේන්ද්‍රසිංහ රජු හා බුදු දහම සම්බන්ධව රම්මළක අදිකාරම් ලියූ බවට සලකන මුල් ප්‍රශස්ති කාව්‍යයෙහි සඳහන් නොවන කරුණු කිහිපයක් මෙම ප්‍රශස්ති කාව්‍යයෙහි අන්තර්ගත වේ.

"බුදුබව ලත්ත උතුන් සදහන් දෙසූ - ඔබවා කෙලෙස් මලසුන් කර මුලිනුපුටා
නිවන් පලලත් උතුන් සදහන් කරගත් වෙතටා - හන්ෂයනා" (98)

"උත්තමඟ මුනිංද්‍ර සරණ නිත්ත වදන සර සඟගෙල - ලෙන
සත්ත හරිස්වඥ තරණ චිත්ත
අමුත ගුණ තිවිදන භක්ති දුර ලොක සාසනෙ දෙවා නිති
සත්ත සතක ධම්ම දුන හද්‍ර සටක සෙ පනෙ" (116)

මෙම සියලු වර්ණනාවන් අතරින් රජුගේ ශරීර ශෝභාව ද වර්ණනාවට ලක් කර ඇති අතර, එය ශෘංගාරාත්මක බවින් යුක්ත ස්වභාවයක් දැකගත හැකි වේ.

"නිති සස වරුද දවණ දිසි පිරි චඥ නෙත
නිල මින ඉඥර නඳ රඹ පරුඥ- ප්‍රත දිසිරත
පබලා ගහණ රණකුස දිගු තුගුණ බලා
කුමු කුරුතුවට දුලගෙලල කලාමඩල උරණෙ
ගත ල සිරි වන්නෙ යුවල කර සුරවර හිදීකර වැනෙන්
සකල තුනු දුටු දන මන තුටුව නෙත් මෙ නරවර රතිපතියුරු
පොරණ නරෙඥසිංහ තුනුරු සිරිති මෙ වැනි දුටති
ආල රමනි සිතු ලෙස අනුරාග මතිනී නෙතු නිදි පමන නොගනී" (124)

එමෙන්ම නරේන්ද්‍රසිංහ රජුට අමතර ව අතීත රාජ්‍ය පාලකයන් පිළිබඳ ව මෙහි සඳහන් කර ඇති අතර, විජය රජතුමා (ක්‍රි.පූ. 543 - ක්‍රි.පූ. 505), කාවන්තිස්ස රජතුමා (ක්‍රි.පූ. 205 - ක්‍රි.පූ. 161), දුටුගැමුණු රජතුමා (ක්‍රි.පූ. 161 - ක්‍රි.පූ. 137) මෙන් ම දෙවන රාජසිංහ රජතුමා (ක්‍රි.ව. 1635 - ක්‍රි.ව. 1687) පිළිබඳ ව සඳහන් වේ. ඔවුන්ගේ ක්‍රියාකාරකම් පහත පරිදි ඉදිරිපත් කර ඇත.

"පොරණ **මාගන් තිස්ස** රජ කල මරණපත් සඟනකු දැ කා
දෙවණ බව හිමි කරුනු කර මගෙ කුසුම දෙව යදී බස ත කා
දෙරණ පති **දුටුගැමුනු නරනිඳු** දිනිය එ බව නො සල කා
නරණ **රජසිංහ දෙවන** බවදුනි නරෙඥසිංහ රජ සිරිල කා" (33)


"උතුම් මෙ නර නිඳුම් හට යුග මුතුම් **රජසිංහ** නරව රා
යකුම් ලෙස රුදුරු ප්‍රන ප්‍රතිකල් මුලිං සිඳ බිඳ හැම වරා...." (35)

"වරාකර කුල සිරිවර පවර නරෙන්ද්‍රසිංහ නිරින් ද
පුරානිත සෙ සිරිලක ජයගත් **විජයිදු** සිරින් ද...." (64)


මෙම පුස්කොළ පොතෙහි අවසන් පත් ඉරුවෙහි දකුණු පස ඉහළ කෙළවරෙහි ඇඟිලි සලකුණක් සටහන් ව පවතින අතර එය මාපට ඇඟිලි සලකුණකට සමාන ය. (ඡායාරූපය 03) එය බබී නම් පුද්ගලයාගේ විය යුතු ය. එමෙන් ම මෙය පත් ඉරුවෙහි ඉහළ සිට තබන ලද ඇඟිලි සලකුණකි. එය තම අයිතිය සනාථ කිරීමට යොදා ගත්තේ ද නැතහොත් අහම්බෙන් සටහන් වූයේ ද යන්න විමසා බැලිය යුතු වේ. සාමාන්‍යයෙන් පුස්කොළයෙහි අක්ෂර කපා කළු මැදීමෙන් පසු ව, අක්ෂර හැරුණු කොට අනෙක් ප්‍රදේශවලින් කළු පැහැය ඉවත්ව යයි. ඒ අනුව මෙය කළු මැදීමෙන් පසු ව පුස්කොළයෙහි අහම්බෙන් සටහන් වූවා විය හැකි ය. නමුත් අනෙක් පත් ඉරුවල මෙවැනි සලකුණක් දැකගත නොහැකි ය.

## නිගමනය


නරේන්ද්‍රසිංහ රජු පිළිබඳ ලියා ඇති මෙම ප්‍රශස්ති කාව්‍යයෙහි අර්ථ රසයට වඩා ශබ්ද රසයට මුල් තැනක් දී ඇත. මේ හේතුවෙන් අර්ථ රහිත අක්ෂර එකතු වීම් දක්නට ලැබෙන අතර, මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන් ම සින්දු ආශ්‍රයෙන් හඳුනාගත හැකි ය. එමෙන්ම නරේන්ද්‍රසිංහ රජු ලක්දිව එක්සේසත් කරන ලෙස ඉල්ලීම, ප්‍රශස්ති කිහිපයක ම දක්නට ලැබේ. කාව්‍යයෙන් පවසන අදහස ම සින්දු තුළ අන්තර්ගත කර ඇති අතර, එම අදහස ම පාලි හා සංස්කෘත භාෂාවන්ගෙන් ලියූ අවස්ථා ද දක්නට ලැබේ. මෙම ප්‍රශස්ති කාව්‍යයෙහි ශෘංගාරාත්මක බවට සාපේක්ෂව වැඩි වශයෙන් රජුගේ රණකාමීත්වය හා ශරීර ශෝභාව වර්ණනාවට ලක් කරයි. එකිනෙක සම්බන්ධ වන ආකාරයක්, කාව්‍යන්හි දක්නට නොලැබෙන අතර, ශබ්ද රසයට ගැළපෙන ලෙස පද ගැළපීමක් සිදු කර ඇත. මෙම ප්‍රශස්ති කාව්‍යයෙහි සඳහන් වන විරිඳු කාව්‍යයන් හියු නෙවිල්ගේ පුස්කොළ පොත් නාමාවලියෙහි නිදර්ශන අතර දක්නට ලැබෙන අතර, එය රම්මළක අදිකාරම් ලියූ බව දක්වන සේදරමන්ගේ කෘතියෙහි ද දක්නට ලැබේ. එහෙත් රම්මළක අදිකාරම් විසින් ලියන ලද ප්‍රශස්ති කාව්‍යයෙහි සඳහන් නොවන විරිඳු කිහිපයක් ම මෙහි අන්තර්ගත වන අතර, එය වර්තමාන කතුවරයා එක් කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකිවේ. කෙසේ වුව ද නරේන්ද්‍රසිංහ රජුගේ රණකාමීත්වය, බල තේජස වර්ණිත පුස්කොළයෙහි සටහන් වූ ප්‍රශස්ති කාව්‍යයක් වන මෙය, තනතුරු නාම රහිත පුද්ගලයෙකුගේ ද පබැඳුම් සහිත ප්‍රශස්ති කාව්‍යයක් ලෙස මෙන්ම, ඇඟිලි සලකුණක් සහිත පුස්කොළ ලේඛනයක් ලෙස ද වැදගත් වේ.



ඡායාරූපය 01



ඡායාරූපය 02



ඡායාරූපය 03

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අභයසිංහ, පී.ඇම්.සී. (2017). **උඩරට විත්ති**. කොළඹ: සී/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

අමරසිංහ, රිසිමන්.(2009).**සිංහල ප්‍රශස්ති සහ හටන් කාව්‍ය පිළිබඳ සාමාජීය සාහිත්‍යමයඅධ්‍යයනයක් (ක්‍රි.ව. 1412 සිට ක්‍රි.ව.1620 දක්වා**.කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ජයවර්ධන, සී.ඩී.ඇස්.කේ.(1914). (සංස්.) **සුළු රාජාවලිය**.බුත්ගමුව : විද්‍යාලෝක මුද්‍රණ යන්ත්‍රාලය.

දිසානායක, කුසුම්. (පරි), (1997). **උඩරට රාජධානිය (1600-1782)**, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

නාගසිංහ, ප්‍රේමසිරි.(2017). (සංස්.) **සඟරජවත**. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

**මහාවංසය.**(2007).දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

වාචිස්සර හිමි, කොටගම.(2014).**සරණංකර සංඝරාජ සමය**.බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශකයෝ.

සන්නස්ගල, පුංචිබණ්ඩාර සහ ගුණසේකර, ලීල්.(1966). **ප්‍රශස්ති හටන් කාව්‍යයන්හි ගීතය**. සාහිත්‍යය තෛමාසික සඟරාව(දස වැනි වර්ෂය). සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සුමනජෝති හිමි, දෙගම්මැද. **ශෘංගාලංකාරය හෙවත් නරේන්ද්‍රසිංහ රාජ ස්තුතිය**.

සේදරමන්, ජේ.ඊ.(1970). **ප්‍රශස්ති කාව්‍ය රසය.** කොළඹ : ඇම් ඩී ගුණසේන සහ සමාගම.

Deraniyagala, P.E.P.(1954).***Sinhala Verse (Kavi) vol .01***.Ceylon: Government press.

Deraniyagala, P.E.P. (1954).***Sinhala Verse (Kavi) vol .02***.Ceylon: Government press.
Somadasa, K.A.D. (1990). ***Catalogue of the Hugh Nevil collection of Sinhala Manuscriptin the British Museum vol.04***. British Library.
Somadasa, K.A.D.(1993).***Catalogue of the Hugh Nevil collection of Sinhala Manuscript in the British Museum vol.05***. British Library.
https:// Mahamega.lk/2015/03/11/**kumakdha-me-shapaya,**2022/05/20

# අනුරාධපුර ගල්කඩවල අප්‍රකාශිත ටැම් ලිපිය පිළිබඳ විමර්ශනයක්

**මහාචාර්ය කරුණාසේන හෙට්ටිආරච්චි**

**කැලේගම ජිනරතන හිමි**

**ගාමිණී සමරනායක**

## හැඳින්වීම

ශිලාලේඛනයක් යනු කිසියම් රටක ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී අතිශය උපකාර වන මූලාශ්‍රයක් වන බව තහවුරු කොට ඇති සත්‍යයකි. ඉතිහාසයට නව කරුණු එක් කරන අප්‍රකට ශිලාලේඛන විශාල ප්‍රමාණයක් තවමත් ලංකාවේ විවිධ පළාත්වල පවතී. පසුගිය දා එබඳු ටැම් ලිපියක් අනුරාධපුර **ගල්කඩවල ශෛලබිම්බාරාම** විහාරයෙන් සොයා ගත හැකි විය. ගල්කඩවල වැව ආසන්නයේ පිහිටි මෙම විහාරස්ථානයෙහි විහාර මන්දිරයට ප්‍රවේශ වන දොරටුවට ආසන්නයෙන් මෙම ටැම් ලිපිය දැනට සිටුවා ඇත. මුහුණත් සතරකින් යුතු ටැඹෙහි උස සෙ.මී. 50ක් වන අතර මුහුණත්වල පළල සෙ.මී. 23ක් වේ. එහි ඝනකම සෙ.මී. 17කි. ලිපියෙහි උස සෙ.මී. 23ක් හා පළල සෙ.මී. 17ක් වේ. ටැඹෙහි අකුරු සටහන්ව ඇත්තේ එක් මුහුණතක පමණක් වන අතර ඊට අයත් වන්නේ අක්ෂර පේළි පහක් පමණි. තවත් මුහණත් දෙකක බල්ලෙකුගේ රුවක්ද කපුටෙකුගේ රුවක්ද ඉතා හොඳින් උන්නතව මූර්තිමත් කොට ඇත. මෙම රූප උන්නතව දැක්වීම තරමක් දුර්ලභ ලක්ෂණයකි.

## පර්යේෂණ ක්‍රමවේදය

ක්ෂේත්‍ර ගවේෂණය, පුස්තකාල අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත රැස් කිරීම ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය විය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට මෙම ලිපිය පිළිබඳ වාර්තා වී ඇති බවක් දක්නට නොලැබුණි. මෙම සෙල්ලිපියෙහි වාර්තා වී ඇත්තේ **මහ වැවෙහි** කුඹුරු ඉඩම් පරිභෝජනය කරන්නන් (ඉඩම් භුක්ති විඳීම වෙනුවෙන් පනවන ලද නීති) නීති උල්ලංඝනය කරන්නේ නම් ඔවුන් බලු කවුඩන් වන බවය.

ලිපියෙහි කතුවරයෙකු හෝ කාලය පිළිබඳ කිසිදු සඳහනක් නැතත් අක්ෂර ලක්ෂණ අනුව ක්‍රිස්තුවර්ෂ දහවන සියවසට පමණ අයත් සේ ගත හැකිය. මෙම ලිපියෙන් ගල්කඩවල වැව පිළිබඳවත්, පැරණි ඉඩම් භුක්තිය, සමාජයේ පැවති ආගමික සංකල්ප පිළිබඳව හා නූතනයේ ශිලාලේඛනය පිහිටා ඇති ශෛල බිම්බාරාම විහාරයේ ඉතිහාසය පිළිබඳවත් සොයා බැලීමට අවස්ථාවක් වනු ඇත.

**සාකච්ඡාව සහ ප්‍රතිඵල**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විශ්‍රාමික කැණීම් හා කෞතුකාගාර නිලධාරී ගාමිණී සමරනායක මහතා දෙපාර්තමේතුවෙහි සේවය කරන සමයේ දී කළ ක්ෂේත්‍ර චාරිකාවක් අතරතුර අනුරාධපුර නගරයට උතුරු දෙසින් වූ **ගල්කඩවල** නම් ග්‍රාමයෙහි **ශෛලබිම්බාරාම** විහාර භූමියෙහි තිබූ මෙම සෙල්ලිපිය නිරීක්ෂණය වී ඇත. එම විහාරස්ථානය ගල්කඩවල වැවට ආසන්නයෙන් පිහිටා තිබීමද විශේෂත්වයකි. කුඩා ප්‍රමාණයේ ශිලාලේඛනයක් වූ මෙය පිටපත් කොට ලියාපදිංචි කර හෝ ප්‍රකාශයට පත්කර ඇතිදැයි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අභිලේඛන අංශ ප්‍රධාන සහකාර අධ්‍යක්ෂ නාමල් කොඩිතුවක්කු මහතාගෙන් විමසා බැලීමේදී පැහැදිලි වූයේ එය පිටපත් කිරීමකට හෝ ප්‍රකාශයට පත් කිරීමකට ලක්ව නොමැති බවය. ඒ අනුව දෙපාර්තමේන්තුවෙහිද දැනුවත් භාවය මත එම ලිපිය පිටපත් කොට මෙසේ ප්‍රකාශයට පත් කිරීමට හැකියාව ලැබීම භාග්‍යයකි. මෙම ශිලාලේඛනය මේ වන විට පවතින්නේ වැව් බැම්මට ආසන්නයෙන්ම බටහිර දිගින් වූ විහාර භූමියෙහිය. සිරිපතුල් ගල් ගණනාවක් හා තවත් ශෛලමය අවශේෂ බොහොමයක් එම විහාර භූමියෙහි පවත්නා බැවින් මෙම විහාරය පැරණි එකක් යැයි අනුමාන කළ හැකිය. එපමණක් නොව මෙහි විහාර ගෘහය තුළ ඇති ප්‍රතිමා වහන්සේද ගලින් කරවන ලද්දකි. දැනට විහාරස්ථානය පාලනය වන්නේ අභයගිරි විහාරය මගිනි. කෙසේ වෙතත් මෙම විහාර භූමියෙහි ඉතිහාසය ගැන අවසන් නිගමනයකට එළඹිය හැක්කේ නිසි අධ්‍යයනයක් කිරීම තුළින් පමණි. එසේම සෙල්ලිපියේ මුල් පිහිටීම මෙම ස්ථානයෙහිම දැයි කීමටද නොහැකිය. කෙසේ වෙතත් එය මෙම වැව හා බද්ධව පිහිටුවන ලද එකක් බවට කිසිදු සැකයක් නැත. ලිපියේ සඳහන්ව ඇති **මහවැව, ගල්කඩවල වැව** නමින් වර්තමානයේ හඳුන්වනු ලබන මෙම වැව බව ලිපියෙන් තහවුරු වෙයි.

මෙම ගල්කඩවල වැව අනුමාන වශයෙන් අක්කර 150ක පමණ භූමි කලාපයක් ජලයෙන් වසා ගෙන සිටියි. එම ජලය රඳවා ගෙන ඇත්තේ මීටර් 800ක් පමණ දිග වැව් බැම්මක් ආධාර කොට ගනිමිනි. එසේම එහි ජලයෙන් කුඹුරු අක්කර 250ක පමණ ප්‍රමාණයක් වාර්ෂිකව අස්වද්දනු ලැබේ. මෙම වැව පෝෂණය වන්නේ **කරඹෑව** වැවෙහි ජලයෙනි. ගල්කඩවල වැවෙහි ජලය වැව් බැම්මෙන් උතුරු දෙසින් පිහිටි කුඹුරු පෝෂණය කරමින් ගලා ගෙන ගොස් **මල්වතු ඔයට** එක් වේ. යල සහ මහ දෙකන්නයෙහිම සිඳී නොපවතින මෙම වැව විසින් වැව හා මල්වතුඔය අතර නිම්න කලාපය හොඳින් පෝෂණය කරනු ලැබීමද සුවිශේෂ කරුණකි.

මෙම ටැම් ලිපිය එතරම් විශාල වූ එකක් නොවේ. මුහුණත් සතරකින් යුතු ටැඹෙහි උස සෙ.මී. 50ක් වන අතර ටැඹෙහි අකුරු සටහන්ව ඇත්තේ එක් මුහුණතක පමණක් වන අතර අක්ෂර පේළි පහක් පමණක් ඇත. තවත් මුහණත් දෙකක බල්ලෙකුගේ හා කපුටෙකුගේ රුවක් උන්නතව මූර්තිමත් කොට ඇත.







DEPARTMENT OF ARCHAEOLOGY SRI LANKA

ලිපියෙහි පෙළ

1. **මහවැවු කැ**
2. **බැලි කුම්බුර් ලද්**
3. **කෙනෙක් මෙ උ**
4. **ලඟ කවුඩු**
5. **බලු වෙත්වා**

**අර්ථ** - මහ වැවට අයත් කුඹුරු ඉඩම් ලද අය (අදාළ නීති) ඉක්මවා කටයුතු කරන්නේ නම් (ඔවුන්) බල්ලන් හා කපුටන් වෙත්වා.

ඉහත අරුත්වලට අනුව **ගල්කඩවල වැව** අතීතයේදී **මහවැව** යනුවෙන් හඳුන්වා ඇති බව පැහැදිලි වෙයි. මහවැව යන නාමය අනුරාධපුර ඇතුල් නුවරින් ලද ටැම් ලිපියකද සඳහන් වෙයි. ඉන් අදහස් වන්නේ **නුවරවැව** බව සඳහන් කරයි (RanaWella 2001: 340). එසේම අනුරාධපුර **ඔලුගල් මූකලාන** නම් ස්ථානයෙන් හමුවූ ලිපියකද අභයගිරි විහාරයට අයත් මහවැව පිළිබඳවද සඳහන්ය (RanaWella 2001: 350). මල්වතුඔයෙහි දකුණු ඉවුරෙහි පිහිටි නුවරවැව හැඳින්වීම සඳහා පරණවිතානට අනුව පැරණි සෙල්ලිපිවල යෙදී ඇත්තේ **නකරවවි** යන පදයයි (Paranavitana 1983: 90). ඒ අනුව ඇතුල් නුවරින් හා අනුරාධපුර ඔලුගල්මූකලානෙන් හමුවූ එම සෙල්ලිපි දෙකෙහි කියැවෙන මහවැව ගල්කඩවල වැව වීමට බෙහෙවින් ඉඩකඩ ඇත. මෙම ලිපි දෙකම අයත් වන්නේ Vවන කාශ්‍යප (ක්‍රි.ව. 914-923) රජුට වීමද මෙම කරුණ සනාථ වීමට ඉවහල් වන තවත් සාධකයකි. ඔලුගල්මූකලානෙන් හමු වූ සෙල්ලිපියට අනුව මහවැව

කණ්ඩවා ඇත්තේද එම රජුමය. එම කරුණ ශිලාලේඛයෙහි දක්වා ඇත්තේ ***අබය්ගිරි වෙහෙර මහවැ කණ්ඩැ*** ආදී වශයෙනි. (RanaWella 2001: 350) බැලූ බැල්මට අබය්ගිරි **වෙහෙර මහවැ** යන වාක්‍ය ඛණ්ඩයෙන් අභයගිරි විහාර සීමාවේ ඇති වැවක් හැඟවෙතත්, ඇත්ත වශයෙන්ම අභයගිරියට අයත් යන අර්ථය ගැනීම වඩාත් යෝග්‍ය වෙයි. **මහ වැ කණ්ඩැ** යන පදයෙන් අපට අරුත් දෙකක් ගත හැකිය. එකක් නම් තිබෙන වැවක් කාලීන අවශ්‍යතාව අනුව නැවත හාරා විශාල කිරීමයි, අනෙක නම් අළුතින්ම වැවක් හැරීමයි. මෙයින් පළමුවන අදහස ගැනීම වඩා සුදුසු සේ හැඟෙයි. අභයගිරි ආරාමයෙහි කටයුතු පවත්වාගෙන යාම සඳහා මෙම වැව Vවන කාශ්‍යප රජතුමා එම ආරාමයට පවරන්නට ඇතැයි සිතිය හැකිය. වැව පිහිටා ඇත්තේ අභයගිරි ආරාම සංකීර්ණයෙහි සිට කිලෝමීටර් දෙකක් පමණ උතුරු දිශාවෙනි. වර්තමානයෙහි මෙහි ඇති විහාරයද අභයගිරි විහාරයෙන් පාලනය වීමද සුවිශේෂ කරුණකි. තවත් අතෙකින් මෙම ලිපියෙහි අක්ෂර ලක්ෂණද Vවන කාශ්‍යප රජුගේ ශිලාලේඛනවල අක්ෂර ලක්ෂණවලට හැම අතින්ම සමාන වන හෙයින් මෙය එම රාජ්‍ය සමයෙහි පිහිටු වන ලද ශිලාලේඛනයක් ලෙස ගැනීමට කිසිදු බාධාවක්ද නැත.

මෙම ලිපියෙහි **කැබැලි කුම්බුර් ලද් කෙනෙක්** යන්නෙන් අදහස්කොට ඇත්තේ වැව යටතෙහි අස්වද්දන ලද කුඹුරු ඉඩම් ලබා ගත්තවුන්ය. අනුරාධපුර යුගයෙහි ආරාමවල හිමිකාරීත්වය තිබූ ඉඩම් ජනතාවගේ යැපීම සඳහා ලබා දුන් බවට බොහෝ සාධක ශිලාලේඛනවලින් හා වංශකථාවලින් හෙළි වෙයි. ජල බදු, බිම් බදු, මත්ස්‍ය බදු, ආරාමවලට ගෙවා ඇත්තේ ඉම ඉඩම් පරිහරණය කළවුන් විසිනි (Paranavitana 1983: 63-67). අභයගිරි කපාරාරාම සංස්කෘත ශිලාලේඛනයෙහිද විහාරයෙහි කටයුතුවල නියැළී සිටින කර්මාන්තකරුවන් උදෙසා කුඹුරු ඉඩම් ආදිය ලබා දිය යුතු බව අවධාරණය කොට ඇත (අමරවංශ හිමි 1969: 159). ගල්කඩවල ලිපියෙන් අදහස් කර ඇත්තේ මහවැවෙහි ඉඩම් ලබා ගත්තවුන් පනවා ඇති නීති උල්ලංඝනය නො කළ යුතු බවය. මෙම ලිපියෙහි එම නීති කවරේ දැයි සඳහන් කර නැතත් ඒවා ඒවන විට සම්මතව තිබෙන්නට ඇති බවට සැකයක් නැත. යමෙකු එම නීති උල්ලංඝනය කරන්නේ නම් **මෙ උලඟ කවුඩු බලු වෙත්වා** යනුවෙන් ඔවුන් බලු කපුටන් වෙත්වායි, ශාප කර ඇත. නීතිමය දඬුවම් දීමකින් තොරව කර්ම ඵලය මත විපාක වශයෙන් ලැබිය යුතු මෙබඳු ශාප පාඨ බොහොමයක් ක්‍රිස්තුවර්ෂ අටවන සියවසෙහි සිටම ශිලාලේඛනවලින් අපට දැක ගත හැකිවෙයි (කුලතුංග 2002).

**නිගමනය**

අපගේ අවධානයට යොමු වූ ගල්කඩවල ශිලාලේඛනය කුඩා වුව ද අනුරාධපුර යුගයේ වාරි කටයුතු පිළිබඳ අදහසක් ලබා ගත හැකි අතර එම වැවෙහි පැරණි නාමය හඳුනා ගැනීමට ද උපකාර වෙයි. එපමණක් නොව අනුමානාත්මක වශයෙන් මෙම ලිපිය Vවන කාශ්‍යප රාජ්‍ය සමයට අයත් විය හැකි බව තීරණය කළ හැකි වීමද සුවිශේෂ කරුණකි. මේ හැර මෙතෙක් අප්‍රකාශිතව තිබූ මෙම සෙල්ලිපිය අනාගත පර්යේෂකයන්ගේ අවධානයට ලක්වීමට ඉඩ ඇති එකක් විය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරවංශ හිමි, කොත්මලේ. (1969). **ලක්දිව සෙල්ලිපි,** කොළඹ : සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

කුලතුංග, ටී.ජී. (2002). **අභිලේඛන ශාප පාඨ.** නාවින්නඃ තරංජි ප්‍රින්ටර්ස්.

Paranavitana, S. (1983). ***Inscriptions of Ceylon*** *Vol. 11, part 1*. Colombo : Department of Archaeoogy.

Ranawella, S. (2001). ***Inscriptions of Ceylon*** *Vol. V, Part I*. Colombo : Department of Archaeoogy.

# අනුරාධපුර යුගයේ දේශිය නාට්‍ය කලාව පිළිබඳ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ආශ්‍රයෙන් සිදුකරන අධ්‍යයනයක්

පී.ජී.සී.එම්.ටී.බණ්ඩාර

## හැඳින්වීම

ලොව ඉපැරණිතම කලා මාධ්‍යයන් අතර ප්‍රමුඛ අංගයක් වන නාට්‍ය කලාව අන් බොහෝ කලා මාධ්‍යයන්ගේ එකතුවෙන් උපන් මාතෘ කලාවක් සේ ගැනේ. නෘත්‍ය, ගීත, වාදන, චිත්‍ර, කැටයම් මෙන් ම සාහිත්‍යය ද නාට්‍ය කලාවෙහිලා සුසංයෝගීත ය (මනෝරත්න 2015:19). නාට්‍ය යන්න ඉංග්‍රීසි බසින් ‘Drama’ යනුවෙන් හැඳින්වේ. ‘නාට්‍ය’ යනු දෘශ්‍ය කාව්‍ය, නාටකය යන අරුත් දනවන පදයකි (මලලසේකර 1993:223). පෙරදිග නාට්‍ය නියමයන්ට අනුව නාට්‍ය යනු සතර අභිනය මඟින් ලෝකයේ පැවැත්ම අනුකරණය කිරීම යි (පඤ්ඤාකිත්ති හිමි 2007:244). නාට්‍ය යනු කිසියම් දෙයක් අනුකරණය කිරීම යැයි ග්‍රීක දාර්ශනික ඇරිස්ටෝටල් පඬිවරයා ද පවසා ඇත (සුරවීර 1984:12). මෙම පෙර’පර දෙදිග මතවාදයන් අනුව නාට්‍යයේ දී අනුකරණය ප්‍රධානතම ශිල්ප ක්‍රමය ලෙස භාවිත වන බව පෙනී යයි. ප්‍රේක්ෂකයා ඉදිරියේ යම්කිසි නිරූපණයක් ඉදිරිපත් කිරීම නාට්‍යයේ දී සිදුවේ. එහි දී නිරූපණ ශිල්පීයා  “නාට්‍යකරුවා”, “නළුවා” ලෙස හැඳින්වේ. නළුවා තමා නිරූපණය කරන චරිතයට සුදුසු අංගහාර දැක්වීම, වේෂභූෂණ භාවිතය නාට්‍යයේ දී දැකිය හැකි ය. නාට්‍යයේ මූල රූපය යමක් අනුකරණය යැයි වටහා ගතහොත් අපගේ පූර්වතමයන් එවැනි අනුකරණ විවිධ අභිචාර උදෙසා සිදු කළ බව දැකිය හැකිවේ. නාට්‍ය කලාවේ තිඹිරිගෙය ලෙස සැලකෙන ග්‍රීසියේ එකී කලාවේ මූලාරම්භය සිදුවනුයේ ද දියෝනීසියස් දෙවියාට පැවැත් වූ පූජාවක් සඳහා සිදු කළ අභිචාරයක් ලෙසිනි (බණ්ඩාර 2020:34). දේශීය සමාජයේ නාට්‍ය කලාවේ මූලාරම්භනය ද එවැනි අභිචාර අනුසාරයෙන් සිදු වූ බවට සාක්ෂි සපයා ගත හැකි ය.ලෝක පරිමාවෙන් බැලූ කල දේශීය නාට්‍ය කලාවේ සම්භවය එතරම් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් නොකියන බවත් දේශීය නාට්‍ය මූලය ගැමි නාටක ඇසුරේ පවතින බවත් බොහෝ දෙනාගේ අදහසයි. නමුත් දේශීය නාට්‍ය කලාවේ මූලය ගැමි නාටකය දක්වා ලඝු කළ නොහැකි බව චිරන්තන සාහිත්‍යගත කරුණු මගින් මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අනුසාරයෙන් ද පෙන්වා දිය හැකි ය. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ අනුරාධපුර යුගයේ නාට්‍ය කලාව පිළිබඳ අධ්‍යයනය සඳහා භාවිත කළ හැකි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය කවරේ ද? යන්නයි. අනුරාධපුර සමයේ පැවති දේශීය නාට්‍ය කලාවේ ස්වරූපය හඳුනා ගැනීමත්, සමකාලීන ව පැවති අනෙකුත් කලා ප්‍රවාහයන් අතර නාට්‍ය කලාවට පැවති වැදගත්කම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින් පෙන්වා දීමත් පර්යේෂණයේ අරමුණ විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පර්යේෂණය සිදු කෙරිණි. පුස්තකාල විමර්ශනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් දත්ත රැස් කිරීම සිදු කළ අතර, සමකාලීන සාහිත්‍ය මූලාශ්‍රය අනුසාරයෙන් ගම්‍ය වන නාට්‍ය කලාව පිළිබඳ වන සටහන් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අනුසාරයෙන් තහවුරු කර ගනිමින් දත්ත විශ්ලේෂණය කළේ ය. අනුරාධපුර යුගයේ දේශීය නාට්‍ය කලාව

පිළිබඳ අධ්‍යයනයේ දී එය ප්‍රධාන වශයෙන් ධාරා ත්‍රිත්වයක් යටතේ හඳුනාගත හැකි ය. තන්තිරිමලේ බිල්ලෑව ආදී ආදි මානව ගුහා චිත්‍ර අනුසාරයෙන් ගොඩ නැගිය හැකි නාට්‍ය කලාවේ ආදිතම යුගය එහි පළමුවැන්න යි. දේශීය සමාජයේ පැවති ආගමික පුද පූජා හා සම්බන්ධ නෘත, නෘත්‍ය, නාට්‍ය ලක්ෂණ මෙන් ම මෙරට රාජසභා ප්‍රභූ මන්දිර අනුසාරයේ පැවති භාරතීය ආභාසය සහිත නාට්‍ය ශාස්ත්‍රගත සංකල්ප හා සමපතනය වන ප්‍රභූ නාට්‍ය කලාව ද යන මෙම අංග ත්‍රිත්වය ඔස්සේ අනුරාධපුර යුගයේ නාට්‍ය කලාව පිළිබඳ අධ්‍යයනයට බඳුන් කළ හැකි ය.

### ප්‍රාග් බෞද්ධ යුගයේ දේශීය නාට්‍ය කලාව

ප්‍රාග් ඓතිහාසික මානව සාධක රැසක් දිවයිනේ විවිධ ප්‍රදේශ ඇසුරින් හමුවේ. මෙම මානව ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය කළ යුතු වන්නේ සමකාලීන පුරාවිද්‍යාත්මක සාධක මතිනි. එහි දී ගුහා චිත්‍ර ඉතා වැදගත් සංරචකයකි. ඇල්ටමීරා, ලැස්කෝ වැනි ආදි මානව ගුහාචිත්‍ර තරම් සංකීර්ණ නොවුව ද දේශීය ආදි මානව රේඛා චිත්‍ර ද ඔවුන් සතුව පැවති අනුකරණමය උපචාර පිළිබඳ යම් ඉඟියක් සපයනු ලබයි. තන්තිරිමලේ (රූපසටහන-01) හා බිල්ලෑව (රූපසටහන-02) යන ස්ථාන අධ්‍යයනය කළ හැකි චලන රූපී මානව රූප ඊට උදාහරණයකි. බිල්ලෑව ගුහා චිත්‍රයේ පුද්ගලයන් දෙදෙනෙකි. ඔවුන් සතරැස් කොටුවක් තුළ නිරූපණය කර ඇත. එය කිසියම් සුවිශේෂී බවක් මෙම සිතුවම් තුළට ගැබ් කිරීමට ගත් උත්සාහයක් බව දක්නට ලැබේ. මෙම සිතුවමේ ඇති විශේෂත්වය නම් ඔවුන් යම් හිස් පළඳනාවක් දරා සිටින ස්වභාවයක් නිරූපණය කර තිබීම යි. එය ඔවුහු කිසියම් භූෂණයක් ගෙන්වා ගත් බව ප්‍රකට කරවති. ඔවුන් දෙදෙනා අත් නවා රවුමට තබා සිටින අතර, පාදවලින් ද චලනය වන ස්වභාවයක් නිරූපණය කරයි. කිසියම් කතාවක් හෝ සිදුවීමක් මොවුන් විසින් නිරූපණය කෙරෙන බව ඉන් ගම්‍යමාන වේ. මෙම රූපයෙන් පැවසෙනුයේ කුමක්දැයි නිගමනයකට එළඹීමට සමකාලීන ලෝක මට්ටමේ මෙවැනි චිත්‍ර කිහිපයක් කෙරේ අවධානය යොමු කිරීම සුදුසු බව පෙනේ. ඉන්දියාවේ පංචිමාර්හි නිම්බු භෝජ් (Nimbu Bhoj) ගුහාවේ දැක්වෙන එක් සිතුවමක කොණ්ඩය බඳින ලද ස්ත්‍රියක පුරුෂයෙකුට යමක් පවසන ස්වරූපයේ සිතුවමක් දක්නට ලැබේ (රූපසටහන-03). චීනයේ සුංජියැන් (Zuojiang) ගංගා නිම්නයේ ගුහා චිත්‍ර අතර අත් ඉහළට එස වූ පුද්ගලයෝ දෙදෙනෙක් වෙති (රූපසටහන-04). ඔවුන් අසල සත්වයන් බඳු රූප ද දක්නට ඇත (Lorblancbet 2001,238). ඔවුන්ගේ ඉනේ ද යම් උපකරණ රැඳී ඇත. මොවුන් කිසියම් ප්‍රීතිමත් නර්තනයක යෙදෙන බව දක්නට ඇත. දඩයම සඵලවීමෙන් පසුව ඔවුන් ප්‍රීතියට පත් වූ බවත් දඩයම නැවත සාර්ථකව සිදුවීම සඳහා එවැනි සාර්ථක වූ අවස්ථාවක් අනුකරණය කළ බවත් මානව විද්‍යාඥයෝ පවසති. බිල්ලෑවේ හා තන්තිරිමලේ චිත්‍ර ද එබඳු අනුකරණමය අභිචාරයක් දනවන නිරූපණයක් ලෙස සලකතොත් මෙම දෘශ්‍ය මූලාශ්‍රය දේශීය නාට්‍ය කලාවේ මූල ස්වරූපය පිළිබඳ දැක්වෙන දැනට සපයා ගත හැකි ආදිතම සටහන් බව පෙනී යයි.

ආගම අභිචාර හා අත්‍යන්තයෙන් සබැඳි ක්‍රියාකාරකමකි. ලෝක මට්ටමින් සලකතත් නාට්‍යයේ මූලය බොහෝ විට ආගම අනුසාරයෙන් සකසනු බව දක්නට ලැබේ. මේ පිළිබඳ අධ්‍යයනයේ දී මහාවංශය

පණ්ඩුකාභය රජුගේ නැකැත් කෙළිය පිළිබඳ දක්වන සටහන ඉතා වැදගත් වේ. වංශකතාවට අනුව පණ්ඩුකාභය රජු (ක්‍රි.පූ. 474 - ක්‍රි.පූ. 367) චිත්තරාජ යක්‍ෂයා හා සම අසුන්ගෙන දෙව් මිනිස් නැටුම් කරවමින් ප්‍රීති වූ බව දක්වා තිබේ. මෙහි දී පණ්ඩුකාභය රජු මියගිය චිත්තරාජ හා සම අසුන් ගත්තේ කෙසේද යන්න පැන නගින ගැටලුවකි. රජු යක්‍ෂයාගේ රුවක් සාදා තමා හා සම අසුන් ගන්වන්නට ඇතැයි මහාවංශ විස්තරය අනුව පෙන්වා දිය හැකි ය.

ඒ අනුව රජු යම් අභිචාරාත්මක රංගයක් සිදු කළ බව දක්නට ලැබේ. රජු එකල පිළිගත් ජන ප්‍රධානියෙකු හා මියගිය ආත්මයක වූ චිත්තරාජ හා තමා අතර සාම්‍යයක් දක්වා තමා ද චිත්තරාජ මෙන් විශ්වාස කටයුතු බලවත් අයෙකු බව අභිවහනය කිරීමට උත්සුක වූ බව දක්නට ලැබේ. ඒ අනුව ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට පාලකයන් අතර පැවති අභිචාර අතර නාට්‍යමය "සමාරෝපණය" සිදු වූ බව හඳුනා ගත හැකි ය. මේ පිළිබඳ තහවුරු කළ හැකි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය නොමැති නමුත් ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට අභිචාර අතර නාට්‍ය කලාව පැවති බව මේ අනුව පැහැදිලි ය.

## අනුරාධපුර යුගයේ නාට්‍ය කලාව

මහින්දාගමනය මෙරට සමාජ සංස්කෘතික දේශපාලනික ආර්ථික ආදි සකලවිධ ක්ෂේත්‍රයන්හි පෘථුල වෙනසක් ජනිත කළ කේන්ද්‍රීය සංරචකයෙකි. දේශීය සමාජය හා බුදුසමය එකිනෙක ඉතා ප්‍රබල ලෙස සහබද්ධ වූ අතර, රාජ්‍ය පාලනයේ සිට සාමාන්‍ය ජන ජීවිතය දක්වා එහි බලපෑම ඇති විය. ලක්දිව ස්ථාපිත වූ ථේරවාද බුදුසමය පුද්ගල ආධ්‍යාත්මික විමුක්තිය මූලික කරගත් දහමක් වූ බැවින් බුදු සමයෙන් නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලාවන්ට අනුබලයක් නොලැබුණ බව සරච්චන්ද්‍ර පවසයි (2013:31-33). නමුත් සරච්චන්ද්‍රගේ මෙම අදහස හා එකඟවිය නොහැකි බව පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය මූලාශ්‍රය අනුසාරයෙන් පෙන්වා දිය හැකි ය. එම මූලාශ්‍රයන්ට අනුව අනුරාධපුර සමයේ දී බුදු සමයානුගත පුද පූජා හා සම්බන්ධ ප්‍රාසාංගික කලාවන් මෙන් ම රාජසභා කේන්ද්‍ර කර ගත් ප්‍රාසාංගික කලා ශිල්පීන් ද වෘත්තිය මට්ටමේ කලාකරුවන් ද සිටි බව පෙනී යයි.

නෘත, නෘත්‍ය සම්බන්ධ ඉපැරණිම පුරාවිද්‍යාත්මක සාධක මිහින්තලයෙන් හමුවේ. මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේ බටහිර වාහල්කඩ දැකිය හැකි වාමන රූප අතර සිටින වාමනයන් ගණ දෙවියන් උදෙසා පූජාවක් පවත්වන සෙයක් නිරූපිතය (රූපසටහන-05). බෙර, නලා ආදිය වයන වාමනයෝ සරල නෘත්‍ය ලීලා දක්වති. කයිතාලම් හඬවන වාමනයන් හා සරල අංගහාර දක්වන මෙම වාමන රූප අනුරාධපුර මුල් සමයේ පැවති ආගමික පුදපූජා පිළිබඳ ඉඟිකරනු ලබයි. තත්සමයේ පැවති බෞද්ධ ආගමික පූජා අතර පෙරහැර පිළිබඳ නිතර සඳහන් වේ. මහා බෝධිය වැඩමවීමේ දී, ථූපාරාමයේ ධාතු නිධානය ආදි අවස්ථාවන්හි එබඳු පෙරහැර පැවති බව වංශ කතාවන්හි දක්වා ඇත. නාට්‍යයේ මූල රූපය වන නෘත, නෘත්‍ය ලක්‍ෂණ මෙම ආගමික පෙරහැර අනුසාරයෙන් බිහිවූ බව පෙනේ. මෙහි සංවර්ධිත අවස්ථාවක් ලෝවාමහාපායේ කුලුනු හිස්හි දක්වන වාමන රූප මගින් නිරූපණය වේ. ලෝවාමහාපායේ වාමන රූප

පෙළ විමර්ශනය කරන චාල්ස් ගොඩකුඹුරේ (1961:12) ඉන් නිරූපණය වනුයේ ගණ රූප මධ්‍යයේ සිටින ගණ ප්‍රධානියෙකු සතුටු කිරීමට කරවන ලද නැටුමකැයි පවසයි. මෙම වාමන රූප සංවර්ධනයට පත් නෘත්‍ය ලීලා සහිත වාමන රූ පෙළකි. ඉතා පැහැදිලි ලෙස භරත නාට්‍යම්, නෘත්‍ය සම්ප්‍රදායට අයත් අංගහාර දක්වන වාමන රූප අතර කයිතාලම්, බෙර හා උඩැක්කි වයන්නෝද වෙති. සමකාලීන බෞද්ධ ආගමික පුද පූජා විෂයෙහි භාවිත වූ නෘත්‍ය ලීලා මගින් මෙම නිරූපණයන් සඳහා ආභාසය ලැබෙන්නට ඇත.

මෙම මූලික නෘත, නෘත්‍ය ලීලාවන් දැක්වූ ශිල්පීන් ක්‍රමයෙන් නාට්‍යමය රංගයන් ඉදිරිපත් කරන තත්ත්වයට පත් වූ බව අනුරාධපුර සමයේ මුල්භාගයට අයත් ශිලා ලේඛන මගින් පෙන්වා දිය හැකි ය. ක්‍රි.පූ 3 වන සියවසේ සිට ලියවුණු පූර්ව බ්‍රාහ්මීය ශිලා ලේඛන කිහිපයකම "නඩ" හා "නට" යන පදය අන්තර්ගත වේ. ඉන් නාට්‍ය ශිල්පීන් හෝ නෘත්‍ය ශිල්පීන් හැඟවෙන බව විද්වත් මතයයි (රණවැල්ල 2004:155). මොවුන් විසින් සිදුකරන ලද ලෙන් පූජාවන් පිළිබඳ එම ලිපිවල සඳහන් වේ.

**මැදගම ලිපිය**

නඩ තිසක බරිය පරුමකලි හුම(න)ය ලෙනෙ

නළු තිස්සගේ භාර්යාව වන ස්ත්‍රී ප්‍රධානී හුමනගේ ලෙනයි (Paranavitana No:910).

මෙහි දී තිස්ස නම් නළුවාගේ භාර්යාව ස්ත්‍රීන්ගේ ප්‍රධානියෙකු බව දක්වා තිබේ. ඇය මෙම ලෙන පූජාකර ඇති අතර නළුවාට සමකාලීනව සැලකිය යුතු සමාජ බලයක් පැවති බව මින් ගම්‍ය වේ.

**සැස්සේරුව ලිපිය**

ගපතිතට වුඩහ ගය(ත)න සමුදය නට චලුය ඣීත (Paranavitana No:1005).ගෘහපති නළු වුඩගේ ස්වාමි දියණිය වූ සමුදය නළු චුලගේ දියණියයි.

1. **ගොබිකන් - අග ක(වි)න පරුමකන නට**
   **චුලන ලෙනෙ අගත - අනගතවතු-දිය ශංශ**
2. **නට චුලන ඣීන නට - දම ( ඣය) ඣ සමුදය.** (Paranavitana No:642).

නගර ශෝභනිය කමීනාගේ මුණුබුරු චුල නම් නළුවාගේ ලෙන පැමිණියා වූත් නොපැමිණියා වූත් සතර දෙස සංඝයාට (දෙනලදී) නළු චුලගේ දියණිය වන නළු ධම්මගේ භාර්යාව වන සමුද්දාගෙ සිතුල් පව්ව කොරවක්ගල ලිපිය

**තොට ගමිය ගපති ඔ කදක තිස පුත උපාසක නට තිසස දෙනෙ සගස පදිතිතෙ**

තොටගම්හි ගෘහපති ඔඩක තිස්සගේ පුත් වූ උපාසක නළු තිස්ස සංඝයාට දුන් දානය යි (Paranavitana 1970 : No.642).

මෙම ලිපියේ දැක්වෙන '**උපාසක නට**' යන්න ඉතා වැදගත් යෙදුමකි. ඉන් මෙම නළුවා තෙරුවන් සරණ ගිය බෞද්ධ උපාසකයෙකු බව දැක්වේ. එසේම ඔහු බෞද්ධ උපාසකයෙකු ලෙස භික්ෂූන්ට ලෙනක් ද කරවා පුදා ඇත. එසේ නම් සමකාලීන නළුවන් බුදු සමයට අනුග්‍රහ දැක්වූ බවත් බුදු සමයානුගත ආමිස ප්‍රතිපත්ති පූජා විෂයෙහි ඔවුන්ගේ දායකත්වය ලැබුණු බවත් මින් මොනවට තහවුරු වේ. මෙම ශිලා ලේඛන මගින් දැක්වෙන තොරතුරු අනුව මෙම නළුවන්ට සමාජයේ සුවිශේෂී පිළිගැනීමක් පැවති බවත් ඔවුන්ට යම් ධනයක් හිමි සමාජයේ යම් ස්ථාවර බවක් ලබාගත් පිරිසක් බව ඔවුන් ලෙන් කරවා පූජා කර තිබීමෙන් පැහැදිලි වේ.

වංශකතාගත සාධක අනුව ද අනුරාධපුර සමයේ මුල් භාගයේ රාජ වරප්‍රසාද ලැබූ රජුට සමීප ව කටයුතු කළ ශිල්පීනියන් පිළිබඳ තොරතුරු හමුවේ. මාගම රජ කළ මහානාග යුවරජු ලලාට ධාතුව ඇතුල් නුවර තබා නාටක ස්ත්‍රීන් ලවා වැන්ද වූ බවත් ඔවුන් අත තිබූ පඤ්චාංගික තූර්යයන් ගසා ධාතූන් වහන්සේට පූජා පැවැත්වූ බවත්, 'ධාතූන් වහන්සේ අවුත් වඩිත්ව යි නාටක ස්ත්‍රීන්ට මෙහෙවර කීවාහු ය. නාටක ස්ත්‍රීහු නානාවිධ වස්ත්‍රාභරණයෙන් සැරසී රජගෙයින් නික්ම ධාතූන් වහන්සේ වැද තමන්ගේ ම අත තුබූ තුබූ පඤ්චාංගික තූර්යයන් ගයා මහත්වූ පූජා කළාහු' (ධාතුවංශය 2019:444) යනුවෙන් දැක්වේ. එසේ ම කාවන්තිස්ස රජුගේ කාලයේ දී සිදු වූ සේරු නුවර චෛත්‍යයේ ධාතු නිධානයේ දී රජු, අමාත්‍යන් මෙන්ම සියලු 'නාටක ස්ත්‍රීන්ද' තමා පැලඳි ආභරණ ගලවා චෛත්‍යයට පූජා කළ බව 'සියලූ නාටක ස්ත්‍රීහු තම පලන් ආභරණ පිදුවාහුය' (ධාතුවංශය 2019:616) යනුවෙන් තවදුරටත් දක්වා ඇත. එසේ ආභරණ පිදීමට තරම් ඔවුන්ට ආර්ථික ශක්තියක් හා රාජානුග්‍රහයක් පැවති බව දක්නට ලැබේ. උක්ත දැක් වූ සැස්සේරුව ලිපියේ නාට්‍ය පවුලක් පිළිබඳ තොරතුරු දැක්වේ. පවුල් වශයෙන් විශාල නාට්‍ය ශිල්පීන් ප්‍රමාණයක් මෙකල සිටින්නට ඇත. දුටුගැමුණු රජු (ක්‍රි.පූ 161-177) මහා ථූපය බඳනා උත්සවයට දේව කන්‍යාවන් බඳු නාටිකාවන් පිරිවරා සක්දෙව් විලසින් සැපත් වූ බව 'මිහිපති තෙම මොනවට සැරසුණා වු දේව කන්‍යාවන් හා සමාන වු නාටිකාවන් විසින් පිරිවරන ලදුව' (මහාවංශය 2019:121) යනුවෙන් දක්වා ඇත. එපමණක් නොව තව ද, ථූප වංශයට අනුව මහා ථූපයේ ධාතු නිධානයට රජු ගොස් ඇත්තේ එක් දහස් හයසියයක් නළඟනන් පිරිවරා ගනිමින් බව ථූපවංසයෙහි හඳහන් වී ඇත්තේ 'ආභරණ පලන් සුජාතා නම් දිව්‍යාංගනාව භාව හා සමාන වූ සොළොස් දහසක් නාටක ස්ත්‍රීන් පිරිවරා' (සිංහල ථූපවංශය 1968:148) යනුවෙනි. තව ද, භාතිකාභය රජු (ක්‍රි.පූ 22 - ක්‍රි.ව 01) මහා ථූපයට එකල විසූ ශ්‍රේෂ්ඨතම නළු නිළියන් ලවා පූජා පැවැත් වූ බව සඳහන් කරන අවස්ථාවේ නළු නිළියන් හැඳින්වීමට **සෙටඨක නට නාටිකා** (දීප වංශය 2018:102) යන පදය භාවිත කර ඇත. මහාවංශය නිළියන් හඳුන්වා ඇත්තේ '**නාටකී**' යන පදයෙනි. ශිලා ලේඛනයන්හි '**නට** ','**නඩ**' යන පදය මගින් නළුවා යන්න විවරණය කර ඇත. මෙයින් සැස්සේරුව හා සිතුල්පව්ව කොරවක්ගල ලිපියේ ඇති **'නට '** යන පදය දීපවංශයේ ද දක්නට ඇත. මෙම පාලි පදය රඟ දක්වන්නා හෝ නැටුම් ශිල්පියා යැයි

'In Four epigrapbs referancs is made to action or dancers ( N nata or Nada' (paranavithana 1970: Intro.XCVI) යනුවෙන් සඳහන් වේ.

වර්තමාන වෘත්තීන් සැලකිල්ලට ගැනීමේ දී නැටුම් ශිල්පියා (නැට්ටුවා) හා නාට්‍ය ශිල්පියා (නළුවා) යනු වෘත්තීන් දෙකක නියුතු ශිල්පීන් දෙදෙනෙකි. නැටුම් ශිල්පියාගේ මාධ්‍ය රිද්මයානුකූල අංග චලනය වන අතර, නාට්‍ය ශිල්පියාගේ මාධ්‍ය සතර අභිනය යි. භරතමුණිට අනුව නළුවා විවිධ භාවයන්ගෙන් හා අර්ථවලින් යුක්ත වූ ස්ථායිභාව, සාත්විකභාව සහ ව්‍යභිචාරිභාව ඇසුරු කරන්නාවූ පුද්ගලයෙකු විය යුතු බව 'නානා භාවයන්ගෙන් හා අර්ථයන්ගෙන් යුක්තවූ ස්ථායිභාව, සාත්විකභාව, ව්‍යවහාරිභාව ඇසුරු කරන්නා වූ රසයෙන් නැණවතුන් විසින් දෘශ්‍ය කාව්‍යන්හි මල්මෙන් විසුරුවා හල යුත්තාහ.' (මාරසිංහ 2016:225) සඳහන් වේ.

පූර්වෝක්ත ලේඛනයන්හි දක්වෙන 'නට' යනු නළුවා නම්, ඔහුගේ කාර්ය භාර්ය වන්නට ඇත්තේ අවස්ථාවක් අනුකරණය හා සමාරෝපණයට භාජනය කිරීමත් ය. භාරතීය නාට්‍ය දෘෂ්ටියට අනුව නර්තනය හා නාට්‍ය අතර ඇත්තේ ඉතා සුළු වෙනසකි. නැටුම් චතුර්විධ අභිනයෙන් යුක්ත වූ කලට නාට්‍ය ලෙස සලකන බව නාට්‍ය ශාස්ත්‍රයේ දක්වේ.

> 'චතුර්ධාභිනයොපෙත - ලක්ෂණාවෘත්තිතොබුධ,
> නර්තනං නාට්‍ය චත්‍යුක්තං - සර්ව ත්‍රොභිනයො භවෙත'(පඤ්ඤාකිත්තිහිමි 2007:266)

ආරම්භයේ දී භාරතීය නාට්‍ය හා නර්තනය ද එකීය ස්වරූපයකින් නිපන් බව පෙනී යයි. සමකාලීන දේශීය සමාජයේ ද එය එසේ ම වූ බව ක්‍රි.ව. හතරේ දී පමණ රචනා වූ දීපවංශයේ නටන හා නාටක කරවන (**නට නාටක**) ( 2018:102) යන පදය යොදා තිබීමෙන් පැහැදිලි වේ. සංස්කෘත නාට්‍යයේ 'නටී' යනු, එහි එන සූත්‍රධරට සහය වන ජ්‍යෝෂ්ඨ නිළියකි. ශ්‍රී හර්ෂ විසින් රචිත රත්නාවලියේ 'නටී' සූත්‍රධර හා සංවාදයක යෙදේ. ඇය නාට්‍ය ඉදිරියට රැගෙන යාමට සහය වන්නී ය. විශේෂයෙන් ම නිළියන්ගේ අංග රචනය භාර ව කටයුතු කළේ ද 'නටී' ය (වොල්ට 2016:26). සංස්කෘත නාට්‍යයට අනුව 'නට' යනුවෙන් නළුවා හැඳින් වූ අතර, 'නටී' යනු, නිළිය හැඳින්වීමට ව්‍යවහාරික පදය විය. එහෙයින් නාට්‍ය කලාවේ සඳහන් නළුවා පිළිබඳ ඉඟියක් ක්‍රි. පූ දෙවන සියවස හා ක්‍රි.ව පළමුවන සියවස අතර කාල පරිච්ඡේදයේ දී ශ්‍රි ලංකාවේ රචිත සෙල්ලිපිවලින් අනාවරණය බව පෙනේ.

1950 දී අනුරාධපුර කුට්ටම් පොකුණේ මධ්‍යයේ තිබී සොයා ගත් ලෝකඩ නළඟන රුව ද සමකාලීන නාට්‍ය ශිල්පිනියකගේ ස්වභාවය හඳුනා ගැනීමෙහිලා ඉතා වැදගත් සංරචකයකි. (රූපසටහන-06) කිසියම් භ්‍රමණ චලනයක යෙදෙන ස්වභාවයෙන් යුත් මෙම නළඟන දකුණතින් කටකාමුඛ මුද්‍රාව දක්වන අතර, වම් අත තරමක් ඔසවා ඇත. අසංයුක්ත හස්ත මුද්‍රාවක් වන මෙමඟින් නාට්‍යයේ දී පවන් සැලීම, කැඩපත ධාරණය කිරීම, කැඩීම, චරණය, මල්මාලා දැමීම ලණුවක් ඇදීම වැනි අභිනයන් දක්වන බව නාට්‍ය

ශාස්ත්‍රයේ දැකිය හැකි ය. එසේ ම අනුරාධපුර ඇතුල් නුවර මහාපාලි දාන ශාලාවට නුදුරින් සිදු කළ කැණීම් මගින් හමු වූ අණ්ඩාකාර පළිගු මුද්‍රාවේ දැක්වෙන නිළිය ද සුවිශේෂී ය. (රූපසටහන-07) ඇය අලංකාර හිස් පලදනාවකින් යුක්ත වන අතර, ඇගේ දකුණු අතේ මලකි. 0.016×0.012 හා ප්‍රමාණ වන මෙම මුද්‍රාවේ සනිටුහන් නිළිය අලංකාර යටිකය වස්ත්‍රයක් දරා සිටී. ඉනෙහි අත රඳවා සිටින ඇය පාද තබා ඇත්තේ නද්‍යාවර්ත ස්ථානගත පාද ස්වරූපයෙනි. දෑඩි සතුට, විලාසය සහ ශෘංගාරය දැනවීම (පඤ්ඤාකිත්ති හිමි 2004:65) ඉන් අභිනය කිරීම සංස්කෘත රංග ශිල්පි ගත න්‍යායකි. එසේ ම අභයගිරියේ කැණීම්වලින් හමු වී මේ වනවිට අභයගිරි කෞතුකාගාරයේ තැම්පත් අණ්ඩාකාර කානේලියන් මුද්‍රා අතර ඇති නිළියකගේ රුව සමකාලීන නිළියකගේ වේෂ භූෂණ පිළිබඳ යම් සාධකයකි (රූපසටහන-08). ඇය ගෙල පලඳනාවක් පැලඳ සිටින අතර, වම් අත ඉනෙහි තබා ඇත. දකුණතින් මෘග ශිර්ෂ මුද්‍රාව දක්වයි. ඉන් ශක්තිය, 'මෙහි දන් මෙය වෙයි' යන්න පැවසීම අර්ථ ගැන්වේ (පඤ්ඤාකිත්ති හිමි 2004:69). ඇයගේ වේෂභූෂණ ස්වභාවය කිසියම් නාට්‍යක චරිතයක් සඳහා සූදානම් වූ නිළියකගේ ස්වරූපය මනාව විදහා දක්වයි. එසේ ම සීගිරි චිත්‍ර මගින් ද සමකාලීන රාජ පරිවාර ස්ත්‍රීන් නාට්‍ය කලාව පිළිබඳ දැන සිටි බව හඟවයි. සීගිරි චිත්‍ර මගින් නිරූපණය වන ලලනාවන්ගේ හස්ත මුද්‍රාවන්හි භරතමුණි නාට්‍ය ශාස්ත්‍රයෙහි ලා දක්වන මුකුල්, කපිත්ත, හා අලපද්ම වැනි මුද්‍රා දක්නට ලැබේ. මෙම මුද්‍රා චිත්‍ර ශිල්පියා රංගනයේ යෙදෙන මෙම ලලනාවන්ගේ ස්වභාවය දැක ඒ අනුව ධාරණය කරගනිමින් සීගිරි බෙයදේ චිත්‍රණය කරන්නට ඇත. රාජ නාටිකාංගනාවන් අනුරාධපුර මුල් සමයේ පටන් රජු අනුසාරයේ රැඳී සිටි බව උක්ත දැක් වූ මහාවංශයෙහි ඇතුළත් දුටුගැමුණු පුවතේ දක්වන රජු පිරිවරා නළගනන් ගමන් ගත් බව දක්වන පුවතින් ගම්‍යමාන වේ. අනුරාධපුර මධ්‍ය භාගය වනවිට ද රජුන් එම සිරිත් අනුගමනය කරන්නට ඇත. ලක්දිව බුදු සමය ව්‍යාප්ත වී ස්ථාපිත වුව ද රාජ්‍ය පාලකයන් භාරතීය ක්ෂත්‍රිය රාජ්‍යයන් අතර පැවති සම්ප්‍රදායන් ක්‍රියාත්මක කළ බව පෙන්වා දේ (ආරියපාල 2018:28-45). දඩයම් කෙළිය, මධුපානෝත්සව, ජල ක්‍රීඩා මෙන්ම නැටුම්, ගැයුම් වැනි ප්‍රාසාංගික කලාවන් ද රස විඳීමට රජුන් ක්‍රියා කළ බව ඔහු පෙන්වා දේ. එසේ නම් සීගිරි චිත්‍ර මගින් නිරූපිත ලලනාවන් ද යටත් පිරිසින් භාරතීය සංස්කෘත නාට්‍ය පිළිබඳ දැනුම සහිත වූවන් බව ඔවුන්ගේ හස්ත මුද්‍රා මගින් මෙන් ම නෙතග බැල්ම හා වේෂභූෂණ මගින් ද පෙන්වා දිය හැකි ය. නාට්‍ය ශාස්ත්‍රයට අනුව හරිත පැහැති වස්ත්‍ර දරන්නෝ දිව්‍ය අප්සරාවෝ ය. කහ පැහැති වස්ත්‍ර දරන්නෝ සිද්ධාංගනාවෝ වෙති. එසේ ම හිස් මුදුන් කොට කෙස් වැටිය බැඳීමෙන් දිව්‍යගංනාවුන්ගේ වේෂ භූෂණයන්ට අයත් බව එහි වැඩි දුරටත් දක්වා තිබේ (පඤ්ඤාකිත්තිහිමි 2004:245). සීගිරි ලලනාවන් ද දිව්‍යංගනාවන්, සිද්ධාංගනාවන් සෙයින් කහ හා කහ මිශ්‍ර රතු වර්ණ හා කොළ පැහැති වස්ත්‍ර දරා සිටින අතර, කෙස්වැටි මුදුන් කොට බැඳ අලංකාර ව සරසා ඇත. මෙම දෘශ්‍ය මූලාශ්‍රය මගින් සමකාලීනව පැවති රාජ සභා නළගනන්ගේ ස්වරූපය පිළිබඳ හඳුනා ගත හැකි ය. කාශ්‍යප රජුන්ගේ අභාවයෙන් පසු සීගිරිය රජ මාළිගයක් නොවූ අතර, එය සැණකෙළි පැවැත් වූ භූමියක් බව ක්‍රි.ව 07 - 09 සියවස් අතර ලියවුණු සීගිරි කුරුටු ගී අධ්‍යයනයට බඳුන් කළ පරණවිතාන පෙන්වා දේ (paranavitana 1956:ccxv). ක්‍රි.පූ පළමුවන සියවසෙන් පසු මහා දාඨික මහා නාග රජු (ක්‍රි.පූ 167-186) විසින් සිදු කරන ලද ගිරිභාණ්ඩ පූජා නම් සැණකෙළියක් විස්තර කරන මහාවංශ ටීකාව සීගිරි පව්ව අවට යොදුනක් පමණතැන් සරසවා ඒ යන මග නැටුම් ගී සහිත සැණකෙළි කළ බව දක්වයි (වංසත්ථප්පකාසිනී 2001:511). මෙම ගිරිභාණ්ඩ පූජාව බඳු සැණකෙළි

ක්‍රිස්තුවර්ෂ 07-09 සියවස්වල දී සිගිරිය කේන්ද්‍ර කර ගනිමින් ද පවතින්නට ඇත. සීගිරි චිත්‍ර කිසිසේත් ම නාට්‍ය ජවනිකාවක සිතුවමක් නොවේ. නමුත් එම ලලනාවන් දක්වන හස්ත මුද්‍රා නාට්‍යයෙහි භාවිත වන ශාස්ත්‍රීය මුද්‍රාවීම සැලකිය යුත්තකි. සමකාලීන සිත්තරා සතුව පවා නාට්‍ය ශාස්ත්‍රය පිළිබඳ දැනුම තිබූ බව මින් ගම්‍යමාන වේ.

ඒ අනුව සරච්චන්ද්‍ර දක්වන,'නාට්‍ය කලාව රාජකීය විනෝදාස්වාදයක් බවට පත් නොවූයේ කිසිවෙකු නාට්‍යයක් රචනා නොකළ නිසාත් යටත් පිරිසෙන් උගතුන් අතර ප්‍රකටව තිබුණු සංස්කෘත නාට්‍යවත් පරිවර්තනය නොකළනිසාත් යැයි සිතිය හැකි ය' (සරච්චන්ද්‍ර 3013:28) යන මතය සාවද්‍ය බව දක්නට ලැබේ. සංස්කෘත නාට්‍ය භාරතයේ දියුණුවට පත්වන ක්‍රි.ව 1-10 අතර, කාල පරාසයේ දේශිය ශිලාලේඛන අතර මෙන් ම වංශකතා සාහිත්‍ය අතර ද දක්වෙන නාට්‍ය ශිල්පීන් පිළිබඳ උක්ත දැක්වූ සටහන් අනුව ඔවුන් සමාජයේ උසස් පිළිගැනීමක් පැවති ධනය හිමි, රජු හා සමීපව කටයුතු කළ රජ වාසලේ නෘත්‍ය නාට්‍ය සිදු කළ ශිල්පීන් බව පෙනීයයි.

**සමාලෝචනය**

ඒ අනුව අනුරාධපුර යුගයේ මුල් භාගයේ ආදී මානව චිත්‍ර නිරූපණ මගින් මෙරට නාට්‍ය කලාව අභිචාර හා පූජා කර්ම අනුසාරයෙන් පැන නැගි බව පැහැදිලි වේ. එම නාට්‍ය කලාව ක්‍රමයෙන් බුදු සමයේ ආභාසය හා මෞරිය කලාවේ ආභාසය මඟින් සංවර්ධනයට පත් වූ අතර, බෞද්ධ පුද පූජාවන් විෂයෙහි නාට්‍යකරුවන් සක්‍රීයව දායක වූ බවත් ඔවුන් බුදු සමයට අනුග්‍රහ පිණිස ලෙන් විහාර පවා පිදූ බවත් උක්ත දැක් වූ සාධක මගින් මනාව හඳුනා ගත හැකිය. එසේ ම රජුන්ගේ රාජ ප්‍රසාදය ලබමින් ප්‍රභූ කලාවක් ලෙස ද දේශිය නාට්‍ය කලාව ස්ථාපිත ව පැවති බවත් සමකාලීනව භාරතයේ පැවති නාට්‍ය ශාස්ත්‍ර ගත සංකල්ප හා සංස්කෘත නාට්‍ය පිළිබඳ දැනුම ලක්දිව නාට්‍ය ශිල්පීන් සතු වූ බවත් මනාව පැහැදිලි වේ. එබැවින් ඇතැම් උගතුන් දක්වන පරිදි දේශිය නාට්‍ය කලාවේ මූලය හුදු ගැමි නාටකය මඟින් පැන නගින ඓතිහාසික යුගය තෙක් දිව නොයෙන කලාවකැයි පැවසීම සාවද්‍ය බව මේ අනුව මනාව හඳුනා ගත හැකි ය.

**මූලාශ්‍රය**


කැකුලන්දල, කෝෂලී. (2014). **ලක්දිව පැරණි නර්තන කලාව.** ජා- ඇලඃසමන්ති පොත් ප්‍රකාශකයෝ.
කුමාර,චන්දන රුවන්. (2020). **අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවේ සංගීතය.** කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ.
කුලතුංග,ටී.ජී. (2014). **පුරාණ අභයගිරි විහාරය.** කොළඹ : මධ්‍යම සංස්කෘතික අරමුදල.
ගොඩකුඹුරේ,චාල්ස්. (1961).'සිංහල නාට්‍ය හා වාදන කලා'. **කලා සඟරාව,මාර්තු කලාපය.** කොළඹඃ ශ්‍රීලංකා කලාමණ්ඩලය.
ඤාණානන්ද හිමි, පොහොද්දර මුල්ලේ. (2018). (සංස්). **දීපවංශය.** නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (2007). (සංස්.)**නාට්‍ය ශාස්ත්‍රය- පළමු වැනි කොටස**. කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. (2007). (සංස්.) **නාට්‍ය ශාස්ත්‍රය- දෙවැනි කොටස.** කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ.

බණ්ඩාර,තරිඳු, (2020).**නාට්‍ය කලාවේ මූලිකාංග.** නුගේගොඩ :සරසවි ප්‍රකාශකයෝ.

විජයසූරිය, බලගල්ලේ. (1986). (සංස්). **සිංහල ථූපවංශය.** කොළඹ.

මනෝරත්න, ජයලත්. (2015).**සිංහල නාට්‍යයේ ප්‍රාසාංගික කලාත්මක වර්ධනය.**කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ.

මලලසේකර, ගුණපාල. (1996).**ඉංග්‍රිසි සිංහල ශබ්ද කෝෂය.**කොළඹ : ගුණසේන යන සමාගම.

**මහාවංශය.** (2009). නැදිමාල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

මාරසිංහ, වොල්ටර්. (2016).**සංස්කෘත නාට්‍ය හා රංග ශිල්පය.**කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ.

විජේරත්න, එච්.ඩබ් විමල් (2019). (සංස්). **ධාතුවංශය.**

සරච්චන්ද්‍ර, එදිරිවීර. (2013).**සිංහල ගැමි නාටකය.** කොළඹ : ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර, ඒ.වී. (1984). (පරි).**ඇරිස්ටෝටල් කාව්‍ය ශාස්ත්‍රය.** කොළඹ: ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්.


Lorblancbet, Michal. (2001). (Ed.**)** ***Rock Art is the old word***. Aryan Books international

Paranavitana,S. (1956).***Sigiri Graffity***.***vol.I.***London: Oxford University Press.


Paranavitana, S. (1966). ***Ceylon and malayasia***.Colombo: Lake house investments limited.




**(රූපසටහන-01)**



**(රූපසටහන-02)**
**(lorblancbet 2001:338)**



**(රූප සටහන-03)**
**(lorblancbet 2001:201)**



**(රූප සටහන-04)**
**(lorblancbet 2001:117)**



(රූප සටහන-05)



(රූප සටහන-06)
(කුමාර 2020:240)

# LiDAR and its Application for Archaeology in Sri Lanka: A Case Study from Balana Fort

**H. M. C. Mendis**

## 1. Introduction to LiDAR Technology

Light Detection and Ranging (LiDAR) is an emerging remote sensing tool for many disciplines. It is a laser scanning technology that fires optical pulses from a laser which accurately measures distance, based on a precise measurement of time, and combines these measurements into a collection of coordinates (Opitz and Cowley, 2013). The geodetic position of each laser return is correlated to navigational information which are stored as point clouds as the first and raw form of data (Opitz, 2013, p.20). Further processing of these spatial data can create highly accurate ground surface models (topographic details) with elevation data from which a plethora of analyses may be performed.

Airborne Laser Scanning (ALS) is another term used for this, but in actuality refers to the overall method and delivery platform, whereas LiDAR is the technology involved. Therefore as the name suggests, Airborne Laser Scanning comprises of an aircraft or UAV (platform), the laser scanner, positioning and georeferencing equipment and data recording systems (Opitz, 2013, p.16). The best advantage of ALS is its ability to scan extensive swathes of terrain.

## 2. Its Applications in Archaeology

While LiDAR remote sensing technology has existed since the 1970s, it was only in the 1990s and early 2000s that the technology became viable for commercial and research applications (Opitz, 2013, p.15); which immediately saw potential in archaeological surveying and mapping.

LiDAR's use in archaeology has two applications. One is the scanning of a single monument to create a digital 3D representation of it. This can be used for a variety of applications in heritage

management, such as for virtual reality, digital preservation, and mapping for conservation and restoration.

The second is as a remote sensing tool for archaeological prospection. This can be considered the most important application of the technology for archaeology. Its ability to cover vast areas in a short time together with its ability to filter out tree cover, has proven it to be an accurate and efficient method for surveying expansive forested regions for archaeological features which a feat a traditional ground survey would be less equipped to do. Depending on various factors such as powerful lasers, very high resolution surface models can be created using LiDAR data such at 0.5x0.5 meters pixel resolution or even less. This greatly enables the detection and interpretation of micro topographic features, at times even few centimetres in size (Evans et al, 2013).

The primary data collection of LiDAR are processed to create *point clouds* which are stored as X, Y, Z coordinates with attribute information such as GPS time, scan angle etc (Opitz, 2013, p.20). These datasets are further processed using various interpolation techniques to create products like Digital Elevation Models (DEM) or Digital Surface Models (DSM), which are stored in raster format. These surface models can be analysed in a GIS software where through the manipulation of parameters such as colour manipulation, histogram stretch, and hillshade, interpretative images can be created, and surface features of archaeological importance can be identified. Additionally, more visualizations using algorithms can be created taking into account surface characteristics such as slope, orientation, concavity, convexity and degree of prominence (Kokalj and Hesse, 2017). Visualizations such as sky-view factor, local dominance, negative and positive openness, cumulative visibility etc. can be created through the Relief Visualization Toolbox (RVT) application of the Research Centre of the Slovenian Academy of Sciences and Arts. The choosing of the type of visualizations depends on the topography of the site, where ideally more than two visualizations should be used to derive different images for comparison.

The next step will be more familiar to the archaeologist - detection and interpretation. The resulting image can be read like a map, where then depending on the experience of the archaeologist, potential archaeological features can be traced out.

In the various stages of processing the LiDAR data, it has to be noted that the data is not objective and that various assumptions are used through the initial processing (Opitz and Cowley, 2013, p.6; Opitz, 2013, p.20). Therefore an understanding of how the terrain models are influenced by factors such as data collection parameters, processing techniques, classification errors and interpolation methods will assist in a more sound interpretation of the final images (Opitz, 2013). This is more compounded by the fact that two different skillsets are required in LiDAR data processing and interpretation; i) technical knowledge or the ability to manipulate the digital data and, ii) knowledge of the archaeological landscape or in other words the 'traditional skills' of the archaeologist in observation and interpretation. Therefore close collaboration between the ALS specialist and the archaeological interpreter will enhance the final output (Opitz and Cowley, 2013, p.7).

Nevertheless, the very final step in any LiDAR survey should be ground truthing as the data may show only 'potential' archaeological features (van der Schriek and Beex, 2017, p.102; Doneus and Kühteiber, 2013, p.38; Opitz and Cowley, 2013, p.6). The typical archaeological field survey would be conducted, but with the LiDAR maps helping to pinpoint specific locations and giving an overall landscape perspective of the terrain being surveyed the survey would be more successful.

LiDAR surveys for prospection and heritage management have been dominant in North and Central America and Continental Europe over the past decade (Opitz and Cowley, 2013; van der Schriek and Beex, 2017; Kokalj and Hesse, 2017; Chase at el, 2013). The first LiDAR project in Asia (Opitz and Cowley, 2013, p.8) was conducted in Cambodia in 2012 on Angkor, the capital city of the ancient Khmer Empire. The survey which covered 370sqkm revealed extensive formally planned urban landscape features such as around the famous Angkor Wat temple, which were previously barely known due to thick vegetation cover (Evans et al, 2013). The results of this project was also the subject of a lecture of ICOMOS Sri Lanka in 2018 by the lead researcher.

## 3. Application of LiDAR in Sri Lanka

The use of LiDAR technology in Sri Lankan archaeology was first pioneered in 2017-2018 with the 'Digitizing Our Heritage' project. This project was a collaboration between the Commonwealth

Scientific and Industrial Research Organization (CSIRO) of Australia, the private 3D printing firm RCS2 Technologies, the University of Moratuwa, and the Department of Archaeology. This project used drone based LiDAR for mapping and documenting important archaeological monuments using the *Hovermap*, a 3D LiDAR mapping system developed by CSIRO. The sites included Sigiriya, Dambulla Temple, Thuparamaya, Isurumuniya, Mudukondapola, Nikasalanuwara, Kandegama, Galle fort and several sites in Polonnaruwa. The system created a digital map of the monument which was next used to print 3D models, which will be of immense value for heritage professionals. (Gunaratne, 2017; Daniel, 2018).

Airborne Laser Scanning for surveying studies has seen a lack in Sri Lankan archaeology, despite its great potential. A literature study showed no known research which employed LiDAR for archaeological prospection. This is understandably due to the high cost involved in using an aircraft for scanning.

However, it was found that the Sri Lanka Survey Department has had LiDAR data since 2015, which has been obtained for disaster risk management and geospatial information. This data has been made available (at modest payments) to the public and covers seven districts thus far (complete districts of Colombo, Gampaha, Kegalle, Nuwara Eliya and partial regions of Kalutara, Kandy and Badulla), at pixel resolutions of 1x1m for Colombo and Gampaha and 2x2m for the rest. LiDAR data are provided in the formats of Point Cloud, DEM, DSM, Contours, and Rapid Ortho Photo and can be obtained with relative ease via email.

## 4. Case study of Balana

In order to test the LiDAR data of the Survey Department for archaeological prospection, the site of the Balana fort was chosen as it is well studied by the author. The Balana fort is a ruined Kandyan period fortress located on a hill 20km west of the city of Kandy in the Central Province of Sri Lanka. An area of 46.2 hectares or 0.46 sqkm of the site covering much of its hill was obtained under the DEM format (raster file of 2x2 meter pixel resolution).

Two visualization techniques were used for the analysis. First was Simple hillshade with overlay of elevation profile which was performed within QGIS itself (figure 1). This technique enabled a

general outlook of the fort in its landscape with the elevation and topographic data. Second, the Sky-View Factor visualization, which was processed through the Relief Visualization Toolbox (RVT) application (figure 2). Sky-View Factor (SVF) is considered an alternate to shaded relief modelling (hillshading) as it overcomes the directional problems of the latter (Kokalj and Hesse, 2017). It focus on the illumination by measuring the portion of the sky visible from a given point. Thus flat terrain and convex features have higher illumination in contrast to features with depressions. This visualization was most useful in the present context for detecting trench like features in relation to the fortification.

The results showed the main fort in clear visibility of its surroundings and allows for an understanding of the terrain that would not have been possible before. Due to the relatively low resolution of the LiDAR data, not much of the micro topography or smaller archaeological features were visible; however, through the observation of the Sky-view factor image (figure 2), a large trench like feature along the north-east end of the fort was detected. This is awaiting ground truthing, the results of which will be published in more detail in a later publication.

## 5. LiDAR for Sri Lankan archaeology, future potentials

Apart from the analyses that could be derived from the LiDAR of Balana, it was mainly performed as a test to examine the suitability of the 2x2 meter pixel DEMs for archaeological prospection. High resolution LiDAR DEMs can reach 0.5 meters pixels, thus making this 2x2 meter relatively low resolution. In the case of Balana, a single-lined wall identified previously was not quite visible; even the main fort's outline is barely visible. This is in contrast to 0.5m DEMs where such mico-topographic features would be visible.

Nevertheless, having LiDAR data available in Sri Lanka is a huge leap for heritage management and research in the country; as the existing 2x2 meter resolution DEMs are still very useful for detection of larger topographic features and other spatial analyses using DEMs such as predictive modelling, least-cost path (movement) analysis and viewshed analysis (Verhagen, 2017).

The LiDAR data made available by the Sri Lanka Survey Department should be considered as secondary data when obtaining such for archaeological studies, as its primary data collection was

done for environmental and other agencies. Therefore assumptions and classifications used to create the point clouds and DEMs would not have taken into account archaeological landscapes. Hence it would be prudent to obtain the Point Cloud data itself with all metadata available (which the author was unable to do as yet).

As expressed above, this easily accessible data could be used for a variety of archaeological research in Sri Lanka. This situation is similar to that of the UK and the Netherlands where LiDAR data collected by government environmental agencies was widely adopted by the archaeological community (Opitz and Cowley, 2013, p.8).

As mentioned above, the best use of LiDAR is when it is used for extensive areas under forest cover and if project-specific Airborne Laser Scanning surveys with powerful lasers are conducted, higher resolution data can be obtained for better results; this will also give more control over the data collection parameters and to understand and reduce errors (Opitz, 2013).

While Evans et al (2013) identifies the similarities and future opportunities of employing LiDAR surveys to tropical forested regions like Mesoamerica and Southeast Asia, the same can be said of South Asia. Sri Lanka still has large swathes of lands with archaeological sites under forest cover, such as those of the Dry zone. Surveying these with LiDAR would yield unique landscape results and help narrow down on field surveying. It is hoped that this introduction of LiDAR for archaeology in Sri Lanka would inspire researchers to embrace this new (freely available) technology and explore our understanding of the past even deeper.





**Figure 01 – Balana fort and hill with hillshading and elevation overlay**





***Figure 02 - Balana with Sky-view factor***





**Figure 03 - Balana with standard hillshade compared to Google Earth satellite image**





**Figure 04 - Plan of the fort of Balana (Chryshane Mendis, 2020)**

## References

Bofinger, J. and Hesse, R., 2011. As far as the laser can reach… Laminar analysis of LiDAR detected structures as a powerful instrument for archaeological heritage management in Baden-Württemberg, Germany. In: D.C. Cowley, ed. 2011. *Remote Sensing for Archaeological Heritage Management.* Brussels, EAC, p.161-171.

Chase, A.F., D. Z. Chase, and Weishampel, J. F., 2013. The Use of LiDAR at the Maya Site of Caracol, Belize. In: D.C. Comer, and M.J. Harrower, eds. *Mapping Archaeological Landscapes from Space.* New York, Springer, p.187-197.

Daniel, Shannine., 2018. Digitizing Sri Lanka's Heritage for Tomorrow's Generations. *Roar Media* [online] Available at: https://roar.media/english/life/in-the-know/digitizing-sri-lankas-heritage-for-tomorrows-generations

Davis, S. et al., 2010. *Boyne Valley Landscapes Project. Phase III Summary Report.* Dublin, University College Dublin.

Doneus, M., and Kühteiber, H., 2013. Airborne Laser Scanning And Archaeological Interpretation – Bringing Back The People. In: Rachel S. Opitz and David C. Cowley, ed. 2013. *Interpreting Archaeological Topography, Airborne Laser Scanning, 3D Data and Ground Observation.* Oxford. Oxbow books, P.32-50

Evans, D.H. et al., 2013. Uncovering archaeological landscapes at Angkor using lidar. *PNAS* 110 (31): p.12595–12600.

Gunaratne, Najira., 2017. Preserving Our History with Lidar. *Roar Media* [online] Available at: https://roar.media/english/tech/insights/preserving-our-history-with-lidar

Kokalj, Ž., and Hesse, R., 2017. *Airborne laser scanning raster data visualization: A Guide to Good Practice*. Ljubljana: Založba ZRC.
Mendis, H. M. C., 2020. *Fortifications and the Landscape: A GIS Inventory and Mapping of Kandyan and Dutch Fortifications in Sri Lanka*. Masters Thesis, University of Amsterdam.
Opitz, R., L. Nuninger, and Fruchart, C., 2012. Thinking topographically about the landscape around Besançon (Doubs, France). In: S.J. Kluiving, and E.G.B. Guttmann, eds. *Landscape Archaeology between Art and Science. From a Multi- to an Interdisciplinary Approach*. Amsterdam, Amsterdam University Press, p.395-412.
Opitz, R. S, and Cowley, D. C., 2013. Interpreting archaeological topography: lasers, 3D data, observation, visualisation and applications. In: Rachel S. Opitz and David C. Cowley, ed. 2013. *Interpreting Archaeological Topography, Airborne Laser Scanning, 3D Data and Ground Observation*. Oxford. Oxbow books, p.1-12
Opitz, R. S., 2013. An Overview Of Airborne And Terrestrial Laser Scanning In Archaeology. In: Rachel S. Opitz and David C. Cowley, ed. 2013. *Interpreting Archaeological Topography, Airborne Laser Scanning, 3D Data and Ground Observation*. Oxford. Oxbow books, p.13-31
van der Schriek, M., and Beex, W., 2017. The application of LiDAR-based DEMs on WWII conflict sites in the Netherlands. *Journal of Conflict Archaeology*, 12(2), p.94-114, DOI: 10.1080/15740773.2017.1440960
Verhagen, J. W. H. P. et al., 2017. Spatial analysis in archaeology: moving into new territories, in C. Siart et al., eds. *Digital Geoarchaeology, Natural Science in Archaeology*. DOI 10.1007/978-3-319-25316-9_2
Course materials for elective '*Tutorial Archaeology and GIS*', MA and RMA programme, 2019/2020, Faculty of Humanities, University of Amsterdam.

# මහියංගණ රජ මහා විහාරය සතු ලෝහ පත්තිරුවල අන්තර්ගතය සහ ප්‍රකාශන විධික්‍රමය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ඩබ්. එම්. කල්‍යාණි විජේසුන්දර**
**දීපාංජලී ඇල්ලෙපොළ**

## හැඳින්වීම

අතීත මිනිසා තම දැනුම පරම්පරාවෙන් පරම්පරාවට රැගෙනවිත් එකී අද්දැකීම් සටහන් කර තැබීමට විවිධ ලේඛන මාධ්‍ය භාවිත කළහ. ඒ අනුව ශෛලමය පෘෂ්ඨයක් මත ලේඛනය කිරීම සිදු වූ මුල් යුගයේ එම ශෛලමය උරුමයෙහි ඊට ඍජු සම්බන්ධතාවක් පැවති කරුණක් අරබයා එය සිදු වී ඇති අතර ලේඛනය ප්‍රාථමික ස්වභාවයක් පෙන්වයි. අනතුරුව එහි අන්තර්ගතය, පෘෂ්ඨය හෝ ව්‍යුහය සමඟ පමණක් නොව ඉන් ඔබ්බට වූ කරුණු අරබයා වුව ද විශේෂයෙන් සකස් නොකළ එහෙත් සුදුසු වෙනත් පෘෂ්ඨයක් මත ලේඛනය සිදු විය. ක්‍රමයෙන් සමාජීය අවශ්‍යතා පෘථුල වීමත් සමඟ ලේඛනයේ අවශ්‍යතාව ද පෘථුල වෙමින් ස්වාභාවික පෘෂ්ඨවල ලේඛනය වෙනුවට ඒ වෙනුවෙන් ම සකස් කළ හා අවශ්‍ය පරිදි ස්ථානගත කළ හැකි පෘෂ්ඨ මත ලේඛනය සිදු වූ හෙයින් පැරණි දේශීය ලේඛන සමුදායක් අප සතු ව පවතී. මේ අතර වංසකතා හා පත්තිරුවලට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. ක්‍රිස්තු වර්ෂාරම්භයට පෙර සිට ම ඓතිහාසික වශයෙන් වැදගත් වන මහියංගණ රජමහා විහාරයේ ප්‍රදර්ශනයට තබා ඇති පත්තිරු විශාල ප්‍රමාණයකි. මෙම විහාරයට පූජා කර වර්තමානයේ එහි ප්‍රදර්ශනයට තබා ඇති පිත්තල, තඹ, රන් ආලේපිත හා මිශ්‍ර ලෝහ මාධ්‍යවලින් නිර්මාණය කර ඇති ලෝහ පත්තිරුවල අන්තර්ගතය සහ ප්‍රකාශන විධික්‍රමය පිළිබඳ විමසා බැලීම මෙම පර්යේෂණයේ දී සිදු කෙරිණි.

## පර්යේෂණ අරමුණු

ලෝහ පත්තිරු නිර්මාණය කිරීම සහ ඒවා ලේඛන කටයුතු සඳහා යොදා ගැනීම වර්තමානය වන විට එතරම් දැකිය නොහැකි ය. අතීතයේ දී බොහෝ අවස්ථාවල යම් දේශපාලන හෝ ආගමික අරමුණක් හේතු කරගෙන සිදු කළ ප්‍රදානවල දී ලෝහ පත්තිරුවල ලේඛනය කිරීම සිදු විය. මේ සඳහා අතීතයේ භාවිත කළ තාක්ෂණික සහ ශිල්පීය ක්‍රම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ඒවායෙහි අන්තර්ගත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සහ වර්තමානය වන විට අප්‍රකට ව ඇති වටිනා පත්තිරු ගවේෂණය කිරීමට පර්යේෂකයන් තුළ අභිප්‍රේරණයක් ඇති කරවීම පර්යේෂණ අරමුණු වශයෙන් යොදා ගන්නා ලදී.

**පර්යේෂණ ක්‍රමවේදය**

දුර්ලභ ලේඛන ප්‍රවේණි පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පර්යේෂණ විධික්‍රම වශයෙන් ලිඛිත මූලාශ්‍රය පරිශීලනය සහ සහභාගිත්ව නිරීක්ෂණය යන ක්‍රමවේද භාවිත කරන ලදී. පර්යේෂණ නියැදිය වශයෙන් මහියංගණ රජමහා විහාරය සතු හාරසියයකට අධික ලෝහ පත්තිරු අතරින් අධ්‍යයනයේ පහසුව සඳහා පත්තිරු සියයක් පමණක් විමර්ශනය සඳහා පර්යේෂක අවධානය යොමු විය. නියැදිය තෝරා ගැනීමේ දී පත්තිරු නිර්මාණය කළ ලෝහය, පත්තිරුවල ප්‍රමාණය, හැඩය, අන්තර්ගතය සහ නිර්මාණාත්මක බව ආදි කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සහේතුක නියැදියක් තෝරා ගන්නා ලදී.

**සාකච්ඡාව සහ ප්‍රතිඵල**

පුරාණ ලංකාවේ ලේඛනය සඳහා භාවිත කළ ලේඛන ද්‍රව්‍ය විමර්ශනය කිරීමේ දී ඊට භාරත ලේඛන කලාවේ ආභාසය ලැබී ඇති බව පැහැදිලි ය.

> අතීතයේ භාරතයේ ලේඛනය සඳහා බුරුජ පොතු, කපු රෙදි, දැව පුවරු, උණ පතුරු, සත්ව හම්, ඇත්දත්, පුවරු, ලෝහ තහඩු, ගඩොල්, වළං, සෙල්, පුස්කොළ යනාදිය අමුද්‍රව්‍ය ලෙස භාවිත කර ඇත. මේ අතුරින් කාබනික අමුද්‍රව්‍යවලින් සකස් කළ ලේඛන සුලබ නොවේ. ඊට හේතු වූයේ එවැනි ලේඛන අමුද්‍රව්‍ය ඉන්දියාවේ සුලබ නොවීම නිසා බව පවසතත් උණ පතුරු හෝ දැව මත ලේඛන ඡේදනය කළ බව බියුලර්ගේ අදහසයි (උද්ධෘතයි : ලගමුව 2006: 57).

ශෛලමය පෘෂ්ඨයක ලේඛනය ඇරඹුණ ද ක්‍රමයෙන් ලෝහ පෘෂ්ඨ මත ලිවීම ආරම්භ වූ බවට රන්, රිදී සහ තඹ පත්තිරු සාක්ෂ්‍ය දරයි. ලේඛන කටයුතු සඳහා රන් පත් භාවිත කළ බවට වංශකතාගත තොරතුරු තිබුණ ද දැනට විද්‍යමාන එක ම රන් පත ක්‍රිස්තුවර්ෂ දෙවන ශතවර්ෂයට අයත් වල්ලිපුරම් රන් සන්නස යි (Muller 1883:112). 1936 වර්ෂයේ හෝ ඊට නුදුරු කාලයක වල්ලිපුරම් රන්පත සහ වෙනත් කුඩා පුරාවස්තු කිහිපයක් විෂ්ණු කෝවිලට අයත් භූමි භාගයෙහි පැරණි ගොඩනැගිල්ලක අත්තිවාරම තුළ තිබී සොයා ගත් බව පරණවිතාන පවසයි (1992:9). වටිනා ලෝහ ලේඛනය සඳහා භාවිත කිරීමට තරම් සාමාන්‍ය ජනයාට හැකියාවක් නොතිබීම නිසා එදා රන් පත් භාවිතය විරල වන්නට ඇතැයි සිතිය හැකි ය. පසුකාලීන ව ලේඛන ද්‍රව්‍යයක් වශයෙන් තඹ ලෝහය බහුල ව භාවිත කිරීම දැකිය හැකි ය. මෙතෙක් ලැබී ඇති පැරණිතම තඹ පත වන්නේ විජයබාහු රජතුමාගේ පනාකඩුව (EZ vol.v. pp18-20) තඹ සන්නස යි.

'ලේඛන කලාව' ඓතිහාසික ලේඛනවලට මුල පිරුවා වූ ද ශිෂ්ටාචාරයක් හඳුන්වා දුන්නා වූ ද නාගරික විප්ලවයේ අනිවාර්ය අතුරු නිෂ්පාදනයකි (Childe 1950 : 24). සිංහල ජනකවි සම්ප්‍රදායේ හමුවන 'තල මල වරුණෙහි' තල්ගසින් ලබා ගත හැකි ප්‍රයෝජන පිළිබඳ සඳහන් කරන අවස්ථාවේ දී 'ගොබය සොඳයි

දස ධර්මය ලියවන්න' යනුවෙන් දක්වා ඇත. නිශ්ශංක මල්ල රජතුමාගේ (ක්‍රි.ව. 1189-1198) දඹුලු ගිරි ලිපියෙහි පුස්කොළවල ලේඛනයට වඩා තඹ ලෝහයේ ලේඛනගත කිරීම කල් පවත්නා බව සඳහන් කරන්නේ මෙසේ ය.

> ... ව්‍යවස්ථා කොටැ දස්කම් කළවුන්ට (දෙන) හිර සඳැ පමුණු (වෙ)යන් මීයන් විසින් සෝපද්‍රව (වූ තල්) පතැ ලියා දියෙ (හැ)ඳි හිරි සෙ නොකොටැ උන් උන්ගේ වංශානුගත වැ බොහෝ කල් පවත්නා නියායෙන් තම්බ පතැ පමුණු හසුන් ලියවා දී තාම්බ්‍ර ශාසන පවත් කරවා ... (EZ. vol. I ,128).

> (දස්කම් කළවුන්ට ඉර හඳ පවත්නා තෙක් දෙන පමුණු දීමනා වේයන් මීයන් විසින් විනාශ කරන තල්පත්වල ලියා දී දියෙහි ඇඳි ඉරි සේ (නිෂ්ඵල) නොකොට උන් උන්ගේ වංශානුගත ව බොහෝ කල් පවත්නා සේ තඹපත්වල පමුණු දීමනා කොටවා දී තාම්‍රශාසන දීම ආරම්භ කොට ... (වික්‍රමසිංහ 2000: 64).

කෙසේ වෙතත් පසුකාලීන ව පහසුවෙන් ආරක්ෂිත ව එහා මෙහා ගෙන යාමේ පහසුව සහ රන් පත් තරම් මිල අධික නොවූ නිසා තඹ පත් ජනප්‍රිය වන්නට ඇත. ක්‍රමයෙන් තඹවලට සීමා නොවී රිදී, රන් ආලේපිත සහ මිශ්‍ර ලෝහ භාවිතයෙන් තනා ගත් පත්තිරු ලේඛනයට යොදා ගැනීමට හුරු විය. පුස්කොළ ලේඛන සම්ප්‍රදායේ දී උපයෝගි කර ගන්නා තල ගසේ ගොබයෙහි පත්‍ර කිසියම් ක්‍රමවේදයකට අනුව ලේඛනයට සුදුසු පරිදි සකස් කර අවශ්‍ය ප්‍රමාණවලට කපා ගන්නා අතර ඒවා පත්තිරු වශයෙන් සැලකෙයි. මෙම පත්තිරුවල අනුරුවකට සමාන වන ආකාරයෙන් විවිධ ලෝහ මාධ්‍ය උපයෝගි කරගෙන ලේඛනයට සුදුසු පරිදි පෘෂ්ඨය සකස් කර ගත් ලෝහ තහඩු මෙම පර්යේෂණයේ දී 'ලෝහ පත්තිරු' වශයෙන් හඳුන්වයි.

සන්නස් ප්‍රදානයෙන් ගම්බිම් ලබා ගත් ආගමික ආයතන රැසක් ලංකාවේ දැකිය හැකි ය (තිස්සකුමාර, වර්ෂය සඳහන් නොවේ: 43). එසේ ම ආගමික ආයතනවලට පූජා කළ ගම්බිම් සහ වෙනත් ප්‍රදාන පිළිබඳ ව ද සඳහන් වේ. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයට අයත් මහියංගණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූජා නගර ග්‍රාමයේ පිහිටා ඇති ඓතිහාසික මහියංගණ රජමහා විහාරය ක්‍රිස්තු-පූර්ව 6වන සියවසට තරම් දිගු ඉතිහාසයකට උරුමකම් කියන බව 'ඒ මහා යක්ෂ සමාගමයට ද පැමිණි සර්වඥ තෙම එහි සමාගම මැද ඔවුන්ගේ හිස්මතුයෙහි මහියංගණය ථූපයාගේ ස්ථානයෙහි අහස්කුස් වැඩ සිටි සේක් (2 පිට: 23-25 ගාථා) යනුවෙන් මහාවංසයෙහි සඳහන් වේ. අතීතයේ 'මියුගුණ' නමින් හැඳින් වූ මෙම ස්ථානය මහවැලි ගඟ සමීපයේ පිහිටි 'බිම්තැන්න' යන අදහසින් භාවිත වේ. ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වටිනාකම් ඇති මහියංගණ විහාරස්ථානය සතු ව පුරාවිද්‍යාත්මක ස්මාරකවලට අමතර ව පුරාවස්තු ද වාර්තා වේ. ඒ අනුව මෙම විහාරස්ථානයේ ස්ථාපිත කර ඇති කෞතුකාගාරය මෙකී විහාරස්ථානය හා තදාසන්න ප්‍රදේශවල ඉතිහාසය පිළිබඳ දෙස් විදෙස් නරඹන්නන්ට තොරතුරු ලබා දෙන අධ්‍යයන කේන්ද්‍රස්ථානයක් වශයෙන් සුවිශේෂ වේ.

මහියංගණ විහාරස්ථානයට දිගු ඉතිහාසයක් සස්වාමික වුව ද එතරම් දිගු ඉතිහාසයක් නොමැති ගොඩනැගිල්ලක පිහිටා මෙම කෞතුකාගාරයෙහි ප්‍රදර්ශිත පුරාවස්තු හා කෞතුක වස්තු ඓතිහාසික වටිනාකමින් යුක්ත ය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිසංවිධානය කරන ලද මෙම කෞතුකාගාරයේ බිම් මහලෙහි ප්‍රදර්ශනයට තබා ඇති විවිධ ලෝහ මාධ්‍ය උපයෝගි කර ගනිමින් නිර්මාණය කරන ලද ලෝහ පත්තිරුවලින් හෙළිවන ලේඛන සහ ශිල්පීය විධික්‍රම පිළිබඳ මෙහි දී විමර්ශනය කෙරිණි.

## අන්තර්ගතය සහ ප්‍රකාශන විධික්‍රම

2017-2018 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මහියංගණ විහාර පරිශ්‍රයේ ඇති කෞතුකාගාරයේ පුරාවස්තු වාර්තා කිරීම සඳහා යොදන ලද අංක ම මෙම අධ්‍යයනයේ දී ද පත්තිරු නම් කිරීම සඳහා උපයෝගි කරගත් බව සඳහන් කළ යුතු ය. මෙම ලෝහ පත්තිරු නිර්මාණය කිරීමේ දී එම පත්තිරුවලට ගැළපෙන හා අදාළ කරුණු ඉදිරිපත් කිරීමේ දී විවිධ ප්‍රකාශන ක්‍රම උපයෝගි කර ගෙන ඇති බව විමර්ශනයේ දී පැහැදිලි විය. ප්‍රාදේශීය වෙනස්කම්, ලේඛන හැකියාව, ඉඩ සැලසුම් කිරීම, ලේඛනය හැසිරවීම, විෂය කරුණු ඉදිරිපත් කිරීම, අක්ෂර සංයෝජනය සහ කරුණු ඉදිරිපත් කිරීමේ දී උපයෝගි කර ගත් විවිධ සන්නිවේදන ක්‍රම මෙම ලෝහ පත්තිරු අධ්‍යයනයේ දී හඳුනා ගන්නා ලද මූලික ලක්ෂණ වේ. එම ලක්ෂණ උපයෝගි කර ගනිමින් පත්තිරුවලට යොදා ඇති විවිධ ප්‍රකාශන විධික්‍රම ක්‍රම පිළිබඳ පහත පරිදි සාකච්ඡා කළ හැකි ය.

### 1. විවිධ ප්‍රමාණවලට පත්තිරු සකස් කිරීම

මෙහි දී විවිධ පුද්ගලයන්ගේ ආර්ථික ශක්‍යතාව, සකස් කර ගැනීමේ සහ ලිවීමේ පහසුව මෙන් ම අන්තර්ගත කරුණු කෙරෙහි ද සැලකිලිමත් වෙමින් විවිධ ප්‍රමාණයන්ට පත්තිරු සකස් කර තිබේ. දිග 5 cm සිට 33 cm දක්වාත් පළල 2.8 cm සිට 6.2 cm දක්වාත් ප්‍රමාණවලට පත්තිරු සකස් කර ඇත. තෝරා ගත් නියැදියට අනුව 17/BD/0002/0644 දරන පත්තිරුව (*1.ඡායාරූපය*) අවම දිගින් යුක්ත වන අතර 17/BD/0002/0432 දරන පත්තිරුව උපරිම දිගින් යුක්ත වේ. අඩුම පළල පත්තිරුව අංක 17/BD/0002/0403 වන අතර පළලින් වැඩි ම අංක 17/BD/0002/0350 දරන පත්තිරුව (*2.ඡායාරූපය*) යි.

### 2. විවිධ ලෝහ වර්ග භාවිත කර තිබීම

තඹ, පිත්තල මිශ්‍ර ලෝහ, රිදී මිශ්‍ර ලෝහ, තඹ මිශ්‍ර ලෝහ හා රන් ආලේපිත යනාදි වශයෙන් විවිධ ලෝහ වර්ග භාවිත කර ඇති බව නිරීක්ෂණය විය. එම ලෝහ කැබලි ලේඛනයට සුදුසු පරිදි මතු පිට පෘෂ්ඨය තුනී කොට සුමට කර නම්‍යශීලී ආකාරයෙන් සකස් කර ඇත.

**3. පත්තිරුවල තනි පැත්තක ලිවීම**

පූජාවිධි සංකල්පයෙන් ලේඛනය කර ඇති බොහෝ කෙටි පත්තිරුවල තනි පැත්තක පමණක් ලේඛනය කර ඇති ආකාරය දැකිය හැකි ය. මෙහි දී තනි පේළියේ සිට පේළි 11 දක්වා ගාථා පාඨයන් ලේඛනය කළ පත්තිරු නියැදියෙහි ඇති බව නිරීක්ෂණය විය. 17/BD/0002/0432 දරන දම්සක් පැවතුම් සූත්‍රයේ ධර්ම කොටස් ඇතුළත් පත්තිරුවෙහි ( 33cm x 4cm ) වටකුරු අලංකාර අක්ෂරවලින් පේළි අටක් ලියා ඇත.

**4. පත්තිරුවල දෙපස ලිවීම**

ලේඛනයට තෝරා ගත් ධර්ම කරුණුවල අන්තර්ගතය සහ ප්‍රමාණය අනුව ඇතැම් පත්තිරුවල දෙපස ම ලියා ඇත. විශේෂයෙන් ම දිගින් වැඩි පත්තිරුවල දෙපස ම සූත්‍රවලින් තෝරා ගත් ධර්ම පාඨ ලියා ඇති බව නිරීක්ෂණය විය. අංක 17/BD/0002/0610 (14cm x3cm) දරන සතිපට්ඨාන සූත්‍රය ඇතුළත් මෙම පත්තිරුවෙහි දෙපස ම පේළි 4 බැගින් තිරස් රේඛා මත ලියා ඇත.

**5. පත්තිරු මත තිරස් රේඛා යෙදීම**

විශේෂයෙන් ම ප්‍රමාණයෙන් දිගු මෙන් ම කෙටි පත්තිරුවල තිරස් රේඛා ඇඳ ඒ මත අදාළ කරුණු ඉදිරිපත් කර තිබේ. මෙම රේඛා ඉතා සියුම් ආකාරයට නිර්මාණය කර ඇත. දිගු පේළි ලිවීමේ දී ඍජු බව පවත්වා ගැනීම, වාක්‍ය ඛණ්ඩවල නිරවද්‍යතාව පවත්වා ගැනීම, ලේඛනයේ විධිමත් බව සහ අලංකාර නිමාව ආදිය වෙනුවෙන් මෙම ක්‍රමය භාවිත කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. අංක 17/BD/0002/0364 දරන තඹ ලෝහ මාධ්‍යයෙන් නිර්මිත ඍනකමින් ඉතා තුනී පත්තිරුව (*ඡායාරූප අංක:3*) තිරස් අතට යෙදූ රේඛා යොදා ගෙන ඇති බව දැකිය හැකි ය.

**6. තිත වෙනුවට කුණ්ඩලය භාවිත කිරීම/ විරාම ලක්ෂණ යොදා ගැනීම**

පත්තිරුව මත ලිවීම සඳහා වානේ තුඩකින් සකස් කළ පන්හිඳක් භාවිත කිරීම නිසා අදාළ කරුණු ලියා අවසන් කිරීමේ දී බොහෝ අවස්ථාවල තිත භාවිත කර නොමැති බව නිරීක්ෂණය විය. විරාම ලක්ෂණ නොමැති ව ලියා ඇති අවස්ථා ද දක්නට ලැබුණ අතර සමහර පත්තිරු මත තිත වෙනුවට කුණ්ඩලය යොදා ඇත. 'කුණ්ඩලාකාර ලකුණ, පුස්කොළ පොත්හි වාක්‍ය අවසානය දක්වන ලකුණ හෙවත් දඟරයක් ආකාරයට යොදන සංකේතය' (සරසවි ශබ්දකෝෂය 2013:383) යි. තිත භාවිත කිරීමේ දී කුඩා සිදුරක් ඇතිවීම වළක්වා ගැනීමට මෙම ක්‍රමය යොදා ගන්නට ඇත. බැඳි අක්ෂර යොදා ගනිමින් හල් ලකුණ යෙදීමට ඇති අවස්ථා අවම කර ගෙන ඇති ආකාරය ද මෙම පත්තිරු නිරීක්ෂණයේ දී දැක ගත හැකි විය.

අංක 17/BD/0002/0610 දරන (11cm x2.9cm) පටිච්ච සමුප්පාදය සටහන් කර ඇති පත්තිරුවෙහි (*ඡායාරූප අංකඃ 4*) කුණ්ඩල 10ක් පමණ දක්නට ලැබිණ. අංක 17/BD/0002/0620 (21cm x 5cm) දරන පත්තිරුවෙහි (*ඡායාරූප අංකඃ 5*) 'සබ්බ පා පස්ස අකරණං' ගාථාව ලියා ඇත. එහි කොමාව, ද්විත්ව කොමාව, තිත සහ තිත් කොමාව දක්නට ඇති අතර අංක 17/BD/0002/0653 (22.5cm x 4.5cm) දරන අලංකාර වටකුරු අක්ෂරවලින් ලියා ඇති පත්තිරුවෙහි (*ඡායාරූප අංකඃ 6*) හර්ෂාදි ලකුණ සහ කොමාව දක්නට ලැබිණි.

**7. පොතක් ආකාරයට සකස් කර තිබීම**

එක සමාන දිගින් හා පළලින් යුත් පත්තිරු කිහිපයක් ගෙන එහි වම් පස සිදුරු විද පුස්කොළ පොතක් ආකාරයට ලෝහ පත්තිරු පොත් සකස් කර ඇත. මේවායෙහි සූත්‍රයක් අවසන් වන තෙක් ම ලේඛනය කර ඇති බව නිරීක්ෂණය විය. 17/BD/0002/0637 (35cmx5cm) දරන තඹ පත්තිරුව (*ඡායාරූප අංකඃ 7*) මත මහා සතිපට්ඨාන සූත්‍රය ලියා ඇති කුලතුංග මුදියන්සේලාගේ නවරත්න විසින් බුද්ධවර්ෂ 2499 දී මහියංගණ විහාරයට පූජා කරන ලද පත්තිරු 70කින් යුත් තඹ පත්තිරු පොතකි. 17/BD/0002/0646 දරන පත්තිරුවෙහි ද සතිපට්ඨාන සූත්‍රය ලියා තිබුණ ද එහි ඇත්තේ පත්තිරු 19කි.

**8. පිට වැස්මක් සහිත ලෝහ පත්තිරු**

පොතක පිට කවරයක් යොදන ආකාරයට පත්තිරුවට අදාළ ලෝහය ම උපයෝගි කර ගනිමින් පත්තිරුවට මතු පිටින් හා යටින් අලංකාර කරන ලද ලෝහ කවර දෙකක් යොදා පොතක් සකස් කර තිබෙන අවස්ථා ද හමු විය. මෙය විටෙක ලෝහ පෙට්ටියක් ආකාරයෙන් ද දර්ශනය වන අතර එහි අභ්‍යන්තරයට පත්තිරු බහාලුමක් වශයෙන් යෙදිය හැකි පරිදි ද පිට කවරය සකස් කර ඇත. පූජා විධි සංකල්පයෙන් භක්තියක් හා අලංකාර ගෙන දෙන ආකාරයෙන් නිමවීමේ තාක්ෂණික නිපුණතා ඇති පිරිස් මෙවැනි නිර්මාණ කරන්නට ඇත. අංක 17/BD/0002/0424A දරන තරමක් ඝනකම ඇති *(ඡායාරූප :8)* පිත්තල ලෝහ තහඩුවකින් පත්තිරු රැඳවීමට සකස් කළ කම්බයකට සමාන ඉහළ කොටසේ වෘත්තාකාර පෙති දැක ගත හැකි රාමුවකි.

**9. විවිධ අක්ෂර වර්ග සහ විවිධ ලේඛන ප්‍රයෝග**

විවිධ ප්‍රමාණයෙන් විවිධ ආකාරයෙන් අක්ෂර වර්ග හඳුනා ගත හැකි විය. කුඩා ප්‍රමාණයේ වටකුරු, විශාල ප්‍රමාණයේ වටකුරු, කෝණාකාර, දිගු අක්ෂර, ලතා අක්ෂර, ඒකමිතික නොවන අක්ෂර සහ අලංකාර ලෙස ඉස්පිලි, පාපිලි යෙදූ අක්ෂර දක්නට ලැබිණ. තෝරාගත් නියැදියෙහි විවිධ අක්ෂර වර්ග භාවිත කරමින් ලියා ඇති පත්තිරු අතර උදාහරණ වශයෙන් අංක 17/BD/0002/0633 දරන පත්තිරුවෙහි (*ඡායාරූප :9*)

ගජාක්ෂර ද අංක 17/BD/0002/0470 දරන පත්තිරුවෙහි කාක අක්ෂර (දිගැටි අක්ෂර) ද අංක 17/BD/0002/0479 දරන පත්තිරුවෙහි අලංකාර අක්ෂර ද භාවිත කර ලියා ඇත.

**10. ප්‍රාර්ථනා වැකි සඳහන් ව තිබීම**

බුදු වේවා, බුදු වෙම්වා, නිවන් දකිත්වා වැනි ප්‍රාර්ථනා පාඨ බොහෝ පත්තිරුවල සටහන වී ඇති බව නිරීක්ෂණය විය. අංක 17/BD/0002/0474 දරන මිශ්‍ර ලෝහවලින් කර ඇති පත්තිරුවෙහි ප්‍රාර්ථනා පාඨ සහ උදාන පාඨ සඳහන් කුඩා අක්ෂරවලින් ලියා සිදුරු දෙකක් ඇති පත්තිරුවකි. පූජා කර ඇති පත්තිරු අතර මියගිය පුද්ගලයන් උදෙසා නිවන් සැප ප්‍රාර්ථනා කරමින් ලියන ලද පත්තිරු ද ඇති බව නිරීක්ෂණය විය. අංක 17/BD/0002/0626 දරන මිශ්‍රලෝහවලින් කර ඇති පත්තිරුවෙහි තඹ මාධ්‍යයෙන් නිර්මිත කෙටි පත්තිරුවෙහි පාලි භාෂා බැඳි අක්ෂරයෙන් හා ඇතැම් ස්ථානවල මිශ්‍ර සිංහල හල් කිරීම සහිත ව "සබ්බ පාපස්ස අකරණං" ගාථාව ලේඛනගත කර ඇත. ඊට පහතින් මිශ්‍ර සිංහල අක්ෂරයෙන් "බී .ඇම්. ද. සිල්වාට නිවන් සැප ලැබීම මෙයින් සාර්ථක වේවා" යනුවෙන් සඳහන් කර ඇත.

**11. කර්තෘ / පරිත්‍යාග කළ අය සහ කාලය**

ලෝහ පත්තිරු මත ලෝහ පත්තිරුවල ලිවීමේ විධික්‍රමය දන්නා වෙනත් ලේඛකයෙකු ලවා හෝ ශිල්පියෙකු ලවා ලේඛනය කර ඇති බව පත්තිරු අවසානයට සටහන් කර ඇත. අංක 17/BD/0002/0641 දරන තඹ පත්තිරුවෙහි 'ගංඇති රාළ විසින් ලියවා' ඇති උදාන පාඨයක් සහිත ය. 17/BD/0002/0336 අංක දරන පත්තිරුවෙහි "ක්‍රිස්තු වෂී 1954 වූ සැප්තැම්බර් නවවන දින කත්තට ඇම්. කේ හෙන්ද්‍රික් සිංඤෝ විසින් දෙන ලදි" යනුවෙන් ද 17/BD/0002/0413 දරන ක්‍රි.ව. 1917 දී පූජා කරන ලද පත්තිරුවෙහි *(ඡායාරූප අංකː 10)* 'බුද්ධවර්ෂ 2461' ලෙස ද සඳහන් කර ඇත.

ලෝහ පත්තිරු පූජා කිරීමේ දී දින වකවානු, පුජා කළ පුද්ගලයන් ආශ්‍රිතව ම දක්වා තිබීම, බුද්ධවර්ෂ, ක්‍රිස්තුවර්ෂ සහ ශක වර්ෂ හින්දු අරාබි ඉලක්කමෙන් ද වචනයෙන් ද දක්වා ඇති බව නිරීක්ෂණය විය.

**12. අලංකරණ හෝ මෝස්තර රටා යෙදීම**

පත්තිරුව මධ්‍යයේ දී අදාළ කරුණු සටහන් කර තිරස් හෝ සිරස් අතට පත්තිරු අග අගලක පමණ තීරු බෙදා එම තීරු ඇතුළත අලංකාර ජ්‍යාමිතික මෝස්තර රටා යොදා තිබූ පත්තිරු දැක ගත හැකි විය. අරිම්බුව, පලාපෙති, ගල් බිංදුව, ලියවැල් ආදිය ඒ අතර වේ. අංක 17/BD/0002/0340 ( *ඡායාරූප අංකː11*) දරන තුනී තඹ ලෝහ පත්තිරුවෙහි සිරස් රේඛා මගින් සමපාතික ව කොටස් තුනකට බෙදා බුද්ධ, ධම්ම සහ සංඝ ගුණ ලියා ඇත. ඒ වටා අලංකාර පලා පෙති මෝස්තරයක් නිර්මාණය ඇත. 17/BD/0002/0424

(A) දරන තරමක ඝනකමින් යුතු පොතක ආකාරයෙන් පිත්තල තහඩුවක් භාවිතයෙන් පත්තිරු රඳවා තැබීමට සකස් කළ කරන ලද කම්බයකට සමාන රාමුවකි. රාමුවේ ඉහළ කොටසේ වෘත්තාකාර උත්තල හැඩයෙන් නිර්මාණය කළ පෙති මත අර්ධ මාණික්‍යමය පාෂාණ රැඳවීමට යොදා ගත් කුඩා රාමු දැකිය හැකි ය. රැඳවුම් 16ක් තිබුණ බව සඳහන් වුව ද වාර්තා කර ඇත්තේ ඒ වන විට තිබුණ රාමු 13ක් පමණකි. මුලු හතරරෙහි තරමක් විශාල පාෂාණ රැඳවුම් තිබුණ ද පාෂාණ හතරක් පමණක් ඉතිරි වී ඇත. තැඹිලි, රතු සහ සුදු යන වර්ණයෙන් අර්ධ මාණික්‍යමය පාෂාණ හඳුනා ගත හැකි ය. පාලි බැඳි අකුරින් නිර්මාණය කරන ලද වර්ෂය, අන්තර්ගත කරුණු පිළිබඳ ව සහ පොසොන් පොහොය දිනය දක්වා ඇත්තේ ' ශ්‍රී බුධවරුෂ 2461 භික්ෂු ප්‍රාතිමෝක්ෂ - අභිධම්ම මාත්‍රිකාපාලි ' යනුවෙනි.

එහි පසු කොටසේ තඹ මාධ්‍යයෙන් නිර්මිත අංක 17/BD/0002/0642 (3.7x 3.1cm) දරන තුනී පත්තිරුවකි. මිශ්‍ර සිංහල අක්ෂරයෙන් බුධ, සිකුරු, සෙනසුරු හා කුජ යන ග්‍රහයන් හා සම්බන්ධ යන්ත්‍රයක් ජ්‍යාමිතික මෝසතරය මත ඇඳ ඇති ආකාරය පැහැදිලි ව දැකගත හැකි ය. **අංක 17/BD/0002/0638** දරන පත්තිරුවෙහි (*ඡායාරූප :12*) වම් පස පද්මාසනයක වැඩ හිඳින බුදුන් වහන්සේගේ හිඳි පිළිරුවක් සහ දකුණු පස සීවලි මහ රහතන් වහන්සේගේ පිළිරුවක් ඉතා අලංකාර අයුරින් නිර්මිත ය. තව ද තිත් මගින් සමානුපාත ව අඳින ලද කොටු 56ක සීවලි යන්ත්‍රය ලියා ඇත. ලේඛනයේ අවසානයේ " එකසිය අට වරක් " වශයෙන් මිශ්‍ර සිංහල අක්ෂරයෙන් දක්වා ඇත. අංක 17/BD/0002/0402 දරන පත්තිරුව වටා දර්ශනීය ලිය වැලක් පමණක් දක්නට ඇත.

**13. පත්තිරුවල කොන් සකස් කිරීම**

අංක 17/BD/0002/0393 දරන පත්තිරුව (*ඡායාරූපඃ 13*) තඹ ලෝහ මාධ්‍යයෙන් තිරස් අතට පේළි 06කින් කුඩා ප්‍රමාණයේ අලංකාර අක්ෂර භාවිත කරමින් ලියා ඇත. පත්තිරුව දෙපස අර්ධකවාකාරයෙන් හැඩකර ඇති බව විශේෂයෙන් නිරීක්ෂණය විය.

17/BD/0002/0403 අංක දරන පත්තිරුවෙහි (*ඡායාරූපඃ 14*) කුඩා ප්‍රමාණයේ පාලි බැඳි අක්ෂරවලින් පත්තිරුවේ දෙපස ම සතිපට්ඨාන සූත්‍රය විරාම ලක්ෂණ භාවිත නොකර පද බෙදීමක් සිදු නොකර එක පෙළට ලියා ඇත. එක් පැත්තක පේළි 7ක් වන සේ ලියා පත්තිරුවේ අග කොන් වෘත්තාකාර ලෙස හැඩ කර ඇත. මෙහි දී පත්තිරුව හතර පැත්තේ කොන් වක්‍රකාර ව කපා හැඩ කොට නිර්මාණය කර ඇති බව ද නිරීක්ෂණය විය.

**නිගමනය සහ සමාලෝචනය**

ප්‍රස්තුත මාතෘකාවට අදාළ ව තෝරා ගත් නියැදියෙහි ලෝහ පත්තිරුවල භාවිත කර ඇති විවිධ ලේඛන ශෛලීන් සහ එහි අන්තර්ගත විෂය කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරිණි. ඒ අනුව තිත

වෙනුවට කුණ්ඩලය යොදා ගැනීමෙන් පත්තිරුවේ නිමාව සහ පැවැත්ම ආරක්ෂා කර ගෙන ඇත. පත්තිරුවක හැඩය තරමක් වෙනස් කර අලංකරණයක් ලබා දීමට පසුකාලින පත්තිරු නිර්මාණය කළ අය උත්සාහ දරා ඇති බවට ද නිදසුන් හමු විය. විවිධ ප්‍රදේශවලින් මෙම විහාරස්ථානය වන්දනා කිරීමට පැමිණෙන බැතිමතුන්, ගම්වාසීන් ධර්මාවබෝධය පිණිස සහ මළගිය ඥාතීන්ට නිවන් සුව ප්‍රාර්ථනා කිරීමේ අරමුණින් පත්තිරු පූජා කර ඇති බව අධ්‍යයනයේ දී සනාථ විය. සමස්තයක් වශයෙන් සලකා බැලීමේ දී ඒවා විවිධ විෂය යටතේ වර්ගීකරණය, ලේඛන අන්තර්ගතය හඳුනා ගැනීම, පත්තිරු පරිත්‍යාග කිරීම සඳහා නිර්මාණය කිරීමේ දී උපයෝගි කර ගෙන ඇති ප්‍රකාශන විධික්‍රම හා ඒවායෙහි උපයෝගීතාව පිළිබඳ සුවිශේෂතා හඳුනා ගැනීමට හැකිවිය.

**රූප සටහන්**





**1.17/BD/0002/0644** **2.17/BD/0002/0350**





**3.17/BD/0002/0364** **4.17/BD/0002/0610**



**5. 17/BD/0002/0620**



**6. 17/BD/0002/0653**



**7.17/BD/0002/0637**



**8.17/BD/0002/0424 A**




9. **17/BD/0002/0633**



10. **17/BD/0002/0413**



11. **17/BD/0002/0340**



12. **17/BD/0002/0638**



13. **17/BD/0002/0393**



14. **17/BD/0002/0403**

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

**චංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ වාර්තාව. (2017-2018**) බදුල්ල : ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
ඩයස්, මාලනී. (1992). **වල්ලිපුරම් රන් පත.** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
තිස්ස කුමාර, ආනන්ද. (වර්ෂය සඳහන් නොවේ). **සිංහල සන්නස් හා තුඩපත්.**
ලගමුව, ආරිය. (2006) **ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව.** බත්තරමුල්ල : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
වික්‍රමසිංහ, දොන් මර්තීනු ද සිල්වා. (2000). **ශිලාලේඛන සංග්‍රහය - I වෙළුම.** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
**සරසවි සිංහල -සිංහල ශබ්දකෝෂය.** (2013). නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ
ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ සහ ශ්‍රී දේවරක්ෂිත පඬිතුමා, බටුවන්තුඩාවේ. 1957. **මහාවංසය -ප්‍රථම භාගය.** රත්නාකර යන්ත්‍රාලය
Childe, Gorden V. (1954). *What Happened in History*. Penguin Books
Paranavitana, S. (1955). *Epigraphia Zeylanica Vol. V, Part – I* Colombo: Department of Archaeology
Muller, Edward. (1883). *Ancient Inscriptions in Ceylon*. Turbner London 1883
Wicramasinhe, D.M.D.Z. (1912).*Epigraphia Zeylanica Vol. I*. London: Oxford

* 2021-2022 මහියංගණ රජ මහාවිහාර කෞතුකාගාරයේ වර්තමානයේ තැන්පත් කර ඇති පත්තිරු සහභාගිත්ව නිරීක්ෂණය

# යුරෝපීය යටත් විජිතකරණය සහ දේශීය ගෘහ නිර්මාණ කලාව

**මැදගේ පාලින්ද රසාංගිත් මැදගේ**

## ප්‍රවේශය

ක්‍රි.ව. 1505 දී ශ්‍රී ලංකාව පෘතුගීසින්ගේ බලයට නතු වීමෙන් පසු ව එහි පාලන ක්‍රමය වෙරළබඩ තීරය පුරා ක්‍රියාත්මක විය. පෘතුගීසින් බලයෙන් පහකර දමා ලන්දේසීන් විසින් වෙරළබඩ තීරයේ බලය ක්‍රි.ව. 1640 දී තහවුරු කර ගන්නා ලදී. ඉන්පසු මෙරටට නීති මධ්‍යස්ථාන, ආගමික මධ්‍යස්ථාන, රෝහල්, පාසල්, පාලකවරුන්ගේ නිල නිවාස, ගබඩා, යුධ අවි ගබඩා, සිර කඳවුරු ආදි බොහෝ ගොඩනැගිලි ලන්දේසි ගෘහ නිර්මාණ ලක්ෂණවලට අනුව ඉදි කෙරිණි. ඉන් වසර 156කට පසුව, ක්‍රි.ව. 1796 දී ඉංග්‍රීසි ජාතිකයින් විසින් ලන්දේසීන් සතුව පැවති වෙරළ තීරයේ බලය තමන් සතුකර ගැනීමෙන් පසු මුළු දිවයිනෙහි ම බලය අත්පත් කර ගන්නා ලදී. මෙලෙස පාලන බලය විවිධ අවස්ථාවල දී බටහිර ජාතිකයන්ට නතු වූ අතර, ඔවුහු පාලන කටයුතු සඳහා විවිධ ගොඩනැගිලි නිර්මාණය කළහ. එහි දී තම මාතෘ භූමියෙහි වූ ගෘහ නිර්මාණ කලාවට අනුව මෙරට ගොඩනැගිලි නිර්මාණය කිරීමට පෙලඹිණි. මේ නිසා පෙර නොමැති වූ විවිධ ගෘහ නිර්මාණ අංග දේශීය වාස්තු විද්‍යාවට එකතු වීම සිදු විය. ප්‍රධාන වශයෙන් ආගමික ගොඩනැගිලි මෙන් ම පරිපාලන ගොඩනැගිලි ද, නිර්මාණය කරනු ලැබී ය. එහි දී අවශ්‍යතාව පදනම් කර ගෙන මෙන් ම අලංකාරය සඳහා ද මෙම නව අංග එකතු කර ගන්නා ලදී. මුල්කාලීන ව යුරෝපීයන් විසින් ගොඩ නඟන ලද ගොඩනැගිලිවල පමණක් මෙම අංග දැක ගත හැකි වූ අතර, පසුකාලීන ව නිර්මාණය වූ දේශීය ගොඩනැගිලිවලට ද, මෙම අංග එකතු විය.

## පෘතුගීසි යුගයේ පොදු ගෘහ නිර්මාණ ලක්ෂණ

ක්‍රි.ව. 1505දී ලංකාවට පැමිණෙන පෘතුගිසීහු වෙරළබඩ තීරය අල්ලා ගැනීමට සමත් වූහ. ඔවුන්ගේ ආගම ප්‍රචාරණයේ අවශ්‍යතාවත් සමගම වෙළෙඳ ඒකාධිකාරයක් ගොඩ නැගිමේ අරමුණ ඉතා ප්‍රබල විය. පෘතුගීසි ආගමනයත් සමගම ආගම ප්‍රචාරණය සහ භූමිවල පදිංචිය මූලික පරමාර්ථය කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස දේවස්ථාන, බලකොටු, භාණ්ඩ රැස්කර තබා ගැනීමට ගබඩා ආදිය සකස් කර ගන්නා ලදී. පාලන බලය අල්ලා ගන්නා ප්‍රදේශවල බලය තහවුරු කර ගැනීමට බලකොටු නිර්මාණය කරන ලදී.

යටත් විජිතකරණයේ ප්‍රතිඵලයක් ලෙස ලංකාවට එක් වූ නවමු අංගයක් ලෙස ක්‍රිස්තියානි දේවස්ථාන දැක්විය හැකි ය. මෙම ගොඩනැගිලි එවකට ඔවුන්ගේ දේශයේ පැවති ගෘහ නිර්මාණ අංග අනුව නිර්මාණය කරන්නට විය. පෘතුගිසීන් එවකට දේශ ගවේෂණයේ මුල්ම කණ්ඩායමක් වීමත්, මූල්‍ය ශක්තිය අතින් ප්‍රබල නොවීමත් නිසා දැවැන්ත ගෘහ නිර්මාණ ඉදි කිරීමට හැකියාව නොලැබුණි. මේ නිසා ම මුල්කාලීන දේවස්ථානයන්හි ඉදිරිපස විශාලවත් පසුපස කුඩාවටත් නිර්මාණය කරන ලදී. පසුපස බොහෝ විට මඩුවක

ස්වරූපයෙන් නිර්මාණය විය. එය ලංකාවේ එතෙක් පැවැති ගෘහ නිර්මාණ කලාවට නුපුරුදු නුහුරු ලක්ෂණයක් විය. ගොඩනැගිලිවල ඉදිරිපස පෙනුම වඩා විශාල ව තැනීම ලංකාවේ ගෘහ නිර්මාණ කලාවට එකතු වූයේ පෘතුගීසී ආගමනයෙන් පසු ව ය. ශ්‍රී ලංකාවේ පුරාණ පාලකයන්ට ධනය පෙන්වීමට අවශ්‍ය නොවී ය. ගම්මානවල ජීවත් වූ ජනතාවට තම වත්කම් පෙන්වීම හෝ සමාජගත කිරීමක් සිදු වූයේ නැත. ඔවුහු එකම රටාවකට ජීවත් වූහ. සමාජවල උස් පහත් භේදයක් නොතිබුණි. නමුත් පෘතුගීසීන්ගේ ආගමනයත් සමඟ මෙම කරුණු වෙනස් විය. අනුරාධපුර, පොලොන්නරු යුගවල සිටම රජ මාළිගා, ප්‍රභූ නිවාස පමණක් විශාලව නිර්මාණය විය. නමුත් පෘතුගීසී ආගමනයත් සමඟ මුහුදුබඩ පළාත්වල සාමාන්‍ය ජනයාට ද, තමන් පිළිබඳ ප්‍රෞඪත්වය මෙන්ම තම බලය පෙනෙන ලෙස ජීවත් වීමට හැකිවිය. ඒ අනුව සාමාන්‍ය ජනයා ද, විශාල නිවාස නිර්මාණයට පෙලඹිණි.

පෘතුගීසිහු ලංකාවට පැමිණ බලකොටු නිර්මාණය කරන්නට වූහ. සතුරු ආක්‍රමණවලට මුහුණදීමේ දී ගොඩබිමෙන් අනතුරු සිදුවේ යැයි සිතා ගොඩබිම දෙසට මුහුණලා බළකොටු නිර්මාණය කරන්නට විය. පෘතුගීසි සමයේ ගොඩනැගිලි ඉදිරිපස විශාල වුව ද, එය සරල ලෙස නිර්මාණය විය. යටත්විජිත ගෘහ නිර්මාණකරණයේ දී ලාංකික පරිසරයට ගැළපෙන පරිදි ගෘහ නිර්මාණකරණයක් සිදු වූයේ පෘතුගීසීන් අතිනි. එලෙස නිර්මාණය වූ "පිල" නම් ගෘහ නිර්මාණ අංගය එක් උදාහරණයකි. ක්‍රි.ව. 1618 වන විට පෘතුගීසිහු ලංකාවේ ගොඩනැගිලි ඉදි කරන්නට වූහ. විශේෂයෙන් ම යුධ බලය සංවිධානය කළ බලකොටු සහ ආගමික විශ්වාසයක් වූ කතෝලික ආගම හා බැඳුණු දේවස්ථාන නිර්මාණය කරන්නට විය. පෘතුගීසීන් ලංකාවේ බලය තහවුරු කළ පසු එය ලංකාවේ සංස්කෘතියට බලපාන්නට විය. කතාබහ, බඩු මුට්ටු, ගෘහ නිර්මාණයන් ලාංකේය ජන සමාජයට එකතු විය. විශේෂයෙන් ම ගෘහ නිර්මාණ කලාව තුළ එවකට පෘතුගීසි ලක්ෂණ අන්තර්ගත විය. ඔවුන් ගොඩ නැගූ තනි මහල් ගොඩනැගිලිවල ඉදිරිපස විශේෂ අවධානයකින් යුතු ව නිර්මාණය කිරීමට ඔවුහු යොමු වූහ. මෙකල ලංකාවේ ඔවුන් ඉදි කළ ගොඩනැගිලිවල සාධක අවම වුව ද, ඔවුන්ගේ බලය තහවුරු වූ වෙනත් රටවලින් හමුවන සාධක මඟින් ඔවුන්ගේ කලාව පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය. 16 වන සහ 17 වන සියවස්වල ඉන්දියාවේ බටහිර වෙරළ තීරය ආසන්න ප්‍රදේශවල මලයාහි සහ මලක්කාහි මේ පිළිබඳ තොරතුරු හමුවේ. මේ ප්‍රදේශවල නිදසුන් අනුව පෘතුගීසීන් ගොඩනැගූ දෙමහල් ගොඩනැගිලි හමු වේ. මුහුදු ප්‍රදේශයේ මෙම ගොඩනැගිලි පැවති හෙයින් ජල වාෂ්පවලට ඔරොත්තු දෙන පරිදි ඒවා නිර්මාණය කර ඇත. දෙමහල් ගොඩනැගිලි, අධික බෑවුම් සහිත පීර ගහන ලද වහලක් සහිත ව නිර්මාණය කර ඇත. ඉහළ මහලයේ පැත්තකින් පඩිපෙළකි. මෙහි ජනේල කුඩා මෙන්ම විශාලව ද, ශක්තිමත් රාමුවකින් යුක්තව ද නිර්මාණය කර ඇත.

මොවුන්ගේ ගෘහ නිර්මාණ කලාව අනුව වැරැන්ඩාවක් (පිල) ඉදිරිපසට එක් විය. එය පළල්ව නිර්මාණය විය. එමෙන් ම පාමුල පඩි පෙළ නිර්මාණය විය. අතීතයේ ලංකාවේ ජනේල වෙනුවට කවුළු බහුල ව භාවිත විය. පෘතුගීසීන් තම ගොඩනැගිලි සඳහා බිම් මට්ටමේ සිට ජනේල නිර්මාණය කිරීම සුවිශේෂී තත්වයකි. පෘතුගීසි ආගමනයත් සමඟ විශාල විවෘත කළ හැකි ජනේල නිර්මාණය ආරම්භ විය. ජනේලය හැමවිට ම පියන් සහිතව වැසීමට හැකි පරිදි නිර්මාණය විය. වීදුරු භාවිත නොවී ය. 18වන සියවස

මධ්‍යයේ පටන් වීදුරු එකතු වන්නට විය. නමුත් ඇතැම් අවස්ථාවල උසස් ගොඩනැගිලි සඳහා පමණක් වීදුරු භාවිත විය. මෙලෙස නිර්මාණය වූ දෙමහල් ගොඩනැගිලිවල භාවිත වූ අංග අතර විශේෂත්වයක් හිමි වූ අංග දෙකක් විය.

01. Flush Window Grilles — මෙය ජනේලයකට යෙදූ යකඩ රාමුවකි. දෙමහල් ගොඩනැගිල්ලේ ඉහළ මහලයේ ඉදිරියට නෙරා එන ආකාරයෙන් තනා ඇත.

02. Musharabies — ගොඩනැගිලිවල සඳලු තලයන්, ලීයෙන් සහ පෙදරේරු තාක්ෂණයෙන් නිම විය. ඇතැම් අවස්ථාවල වැරුන්ඩා සහිත ව ඉදිවිය. මේවා සෑම විට ම මුහුදුකරයේ ජල වාෂ්පවලට ඔරොත්තු දෙන අයුරින් නිර්මාණය වී ඇත.

ඉන්දියාවේ කොචිංවල පිහිටි 17වන සියවසේ මැද භාගයට අයත් ගොඩනැගිල්ලෙහි දක්නට ලැබෙන ලක්ෂණ අතර (දෙමහල් ගොඩනැගිලිවල) වහලය අධික බෑවුම් සහිත වීම, උළු සෙවිලි කර තිබීම යනාදි ලක්ෂණ හඳුනාගත හැකි ය. ඊට අමතර ව සාලයත්, විශාල විවෘත කාමරයක්, ගොඩනැගිල්ලේ පිටුපස උද්‍යානයක ආකාරයත්, ඉහළ මහලයේ පෞද්ගලික කාමර, වැරුන්ඩා සහිතව කුඩා ජනේල ආදිය විය. මෙම ජනේල විශාල ශක්තිමත් රාමු සහිත විය. ඊට අමතර ව ප්‍රධාන රාමුවට අමතර ව අභ්‍යන්තරයේ තවත් රාමුවක් වූ අතර, එහි කොටස් කිහිපයක් විය. බොහෝ විට මේවා නිර්මාණය සඳහා ඔප දමන ලද සිප්පි කටු විශේෂ භාවිත කරන ලදී.

පෘතුගීසී මූලයක් සහිත ව ඉදි වූ ගොඩනැගිලිවල සාලය සහ වැරුන්ඩාව ඉදිරිපස භාවිතයට ගෙන ඇත. පළල් අවකාශයක් සහිත විය. කෙළවරින් ඉහළ මහලට නගින තරප්පු පෙළ විය. මේ ගොඩනැගිලි ඉදිකිරිමේ දී ඔවුන් කුලුනු භාවිත කර ඇත. මේවා බොහෝ විට වැඩි මුදලක් යොදවමින් ගොඩ නගන ලද ගොඩනැගිලිවල දක්නට ලැබේ. අඩු මුදලින් කළ ගොඩනැගිලිවල ඔප දමන ලද ජනේල නොවූ අතර, ජනේලය, පනේලවලට බෙදා නොතිබුණි. එසේ නොවන අවස්ථාවල දී ජනේලය, පනේලවලට බෙදා මෝස්තර යොදා තිබුණි.

පෘතුගීසි යුගයේ භාවිත වූ ප්‍රසිද්ධ ජනේල ආකෘතියක් ලෙස Double Arch Window’s (ද්විතීයික ආරුක්කු සහිත ජනේල) හැඳින්විය හැකි ය. ලංකාවේ මෙවැනි ජනේලවලට නිදසුන් මාතර ලන්දේසී පල්ලියකින් හමුවේ. ලංකාවේ දැනට ශේෂ ව පවතින ගොඩනැගිලි අතර, ඇති ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන විට ලාංකික ගෘහ නිර්මාණ කලාවේ ජනේල භාවිතය අඩුවෙන් සිදුවිය. නමුත් ඒ පෘතුගීසින්ගේ පැමිණීමට පෙර ය. ගොඩනැගිලිවල බිම් මට්ටමට ආසන්න ව ජනේල භාවිත නොවූ අතර, එලෙස ජනේල භාවිතය යුරෝපීය අලංකරණ අංගයකි. යුරෝපීයන් අතර විශාල විවෘත ජනේල, ග්‍රිල් සහිත ව භාවිත විය. යකඩින් කරන ලද රාමු සහිත මේවාට ජනේල පියන් ද භාවිත විය. බොහෝ විට දේශගුණයට ඔරොත්තු දීමට සහ පෞද්ගලිකත්වය උදෙසා භාවිත විය. නමුත් මේ සඳහා වීදුරු භාවිතය දුර්ලභ දෙයක් විය. එසේත්

නැතිනම් ඔප දැමීමට ලක්කරන ලද තෙල් කඩදාසි ද, අමතරව බෙලි කටු ද, එනම් ලෝකයේ නැගෙනහිර ප්‍රදේශ ආශ්‍රිත ව ආනයනය කරන ලද දේවල්වලින් ජනේල අලංකරණය කරන ලදී.

පෘතුගීසින් විසින් පල්ලි ඉදි කරන ලදී. ලංකාවේ පල්ලි ඉදි කිරීමේ දී නිශ්චිත ක්‍රමවේදයක් නොවී ය. පෘතුගීසි දේවස්ථාන ඉදි කිරීමේ දී අභ්‍යන්තරයට දැව කුලුනු භාවිත කළ අතර, පිටත බිත්ති නිම වූයේ ඝන බදාමයෙනි. මේ දේවස්ථානවල භාවිත කළ දොර සහ ජනේල නිර්මාණය වූයේ දේවස්ථාන අභ්‍යන්තරයට සූර්යාලෝකය උපරිමයෙන් ඇතුළු වන ආකාරයට ය. විශේෂයෙන් ම පෘතුගීසින්ගේ පල්ලිවල ද්වියිතීක ආරුක්කු සහිත ජනේල දක්නට ලැබේ. ලංකාවේ යුරෝපීය ක්‍රමයට ගොඩ නඟන ලද පැරණි ගොඩනැගිලිවල මේ අංගය දක්නට ලැබේ. මාතර සහ යාපනය ප්‍රදේශ ආශ්‍රිතව ලන්දේසීන් විසින් ඉදි කරන ලද රෙපරමාදු දේවස්ථානවල ද, මෙම පෘතුගිසී අංගවලට උදාහරණ දක්නට ලැබේ.

පෘතුගීසින්ගේ ගොඩනැගිලි අතර ප්‍රධාන ස්ථානයක් අඹරාමය වහලක් සහිතව නිම වූ දේවස්ථානවලට හිමි වේ. විශාල විවෘත අවකාශයක් සහිතව නිම වූ දේවස්ථානයන්ගේ මුගොප්පුව හෙවත් ප්‍රාසාද මුඛයක් දක්නට ලැබේ. එමෙන් ම ආරුක්කු භාවිත මේ දේවස්ථාන බැරොක් ශෛලියට අයත් ලක්ෂණයන්ගෙන් යුක්තව නිර්මාණය විය. දේවස්ථාන නිර්මාණය පෘතුගීසි යුගයේ වැදගත්ම අංගයක් බවට පත් විය. පෘතුගීසී ගොඩනැගිලි කලාවේ දක්නට ලැබුණු තවත් අංගයක් ලෙස Solar Type Window's අංගය දැක්විය හැකි ය. මෙම Solar Type Window's සමහර අවස්ථාවල පොළව මට්ටමේ සිට වහලය දක්වා උස් වූ අතර, ඇතැම් ඒවා පනේල දෙකක් සහිත වූ අතර ඇතැම් ඒවා පනේල තුනක් සහිතව ද නිර්මාණය විය. එක් ආරුක්කුවක ජනේල රාමු දෙකක් හෝ තුනක් වූ අවස්ථා ද වේ. මේ ජනේලය නිර්මාණය වූයේ බඳින ලද බිත්තියට සම්බන්ධව ය. Solar Type Window's භාවිත වන සෑම අවස්ථාවක දී ම නිවසේ විසිත්ත කාමරය ආලෝකවත් විය. ජනේලයකින් සෑම විට ම ආලෝකය ලැබිණි. කාමර සඳහා කුඩා ජනේල ද භාවිත වූ අතර, කාමරවල බිත්ති දෙපැත්තේම ජනේල වූ අවස්ථා ද වේ. මේ ජනේල සඳහා ඔවුන් එක් එක් අවස්ථාවල දී ලීවලින් හෝ යකඩවලින් කරන ලද රාමු භාවිත විය. සිවිලිම සඳහා චතුරාස්‍රාකාර හැඩති බාල්කවල ආධාරකයක් ලෙස ගලින් හෝ ලීයෙන් කරන ලද Brackets භාවිත විය. බොහෝ විට ඔවුන්ගේ ගොඩනැගිලිවල Wall Garden එනම් බිත්තිවලින් වට කරන ලද අභ්‍යන්තර ගෙමිදුලක් විය. පෘතුගීසි යුගයෙන් පසු ලංකාවේ විදේශ ආරුවක් සහිත ගොඩනැගිලි ඉදි වීම ඇතිවිය.

### ලන්දේසී යුගයේ පොදු ගෘහ නිර්මාණ ලක්ෂණ

තමන්ගේ බලය තහවුරු කර ගනිමින් වසර 150කට ආසන්න කාලයක් ලංකාවේ ජීවත් වූ ලන්දේසීහු ක්‍රි.ව. 1640 දී ලංකාවට පැමිණියහ. ලන්දේසීන් විසින් පෘතුගීසින්ගෙන් ගාලු බලකොටුව යටත් කරගෙන පාලන බලය අත්පත් කර ගත් අතර ක්‍රි.ව. 1658 දී කොළඹ සහ යාපනයේ බලය තහවුරු කර ගන්නා ලදී. ඒ අනුව ක්‍රි.ව.1786 වර්ෂය දක්වා ලංකාවේ පහතරට වෙරළබඩ තීරය ලන්දේසී පාලන බලයට යටත් විය. 17 වන සහ 18 වන සියවස්වල දී ලන්දේසීහු ඔවුන්ට අයත් යටත්විජිතවල තම භූමියේ පැවති ගොඩනැගිලි කලාවට

සමාන ගොඩනැගිලි ඉදි කළහ. පෘතුගීසින්ගේ බලය ප්‍රචලිත ව තිබූ ප්‍රදේශවලින් ඔවුන් පලවා හැර ලන්දේසීහු බලය අල්ලා ගෙන පෘතුගීසින් විසින් තනන ලද ගොඩනැගිලි බොහොමයක් ම විනාශ කර දැමූහ. එයට ප්‍රධාන හේතුව වූයේ ඔවුන් ක්‍රිස්තියානු ආගමෙහි නිකායන් දෙකක අනුගාමිකයන් වීමයි. බොහෝ දුරට පෘතුගීසි පල්ලි මෙලෙස විනාශයට පත් විය. සමහර ගොඩනැගිලි ලන්දේසී ගෘහ නිර්මාණ කලාවට අනුව නවීකරණය කරන ලදී.

ලන්දේසීහු තම රට වූ නෙදර්ලන්තයේ වාස්තු විද්‍යාවට අනුව මෙරට විවිධ ගොඩනැගිලි ඉදි කළහ. නෙදර්ලන්තයේ වාස්තු විද්‍යාව ප්‍රධාන වශයෙන් සැකසී තිබුණේ වෙළෙඳාම සහ වාරිමාර්ග පදනම් කර ගනිමිනි. නිවාස යටින් වාරි මාර්ගයට පිවිසීමට සහ නිවස යට තම බෝට්ටුව නවතා තැබීමට ඔවුන්ගේ මුල් බිමේ හැකියාව තිබුණි. නිවාස ඉදි වූයේ පේළි වශයෙනි. අනතුරු ව පාරත් ඉන් පසු ඇළ මාර්ගයත් වූ අතර, අනෙක් පස ද එලෙසින් ම සැකසී තිබුණි. ඇළ මාර්ගය හරහා තැනින් තැන පාලම් ද විය. මේ ක්‍රමය අනුව ඔවුන් ලංකාවේ ද, ගොඩනැගිලි ඉදි කළ අතර, එය කොටු රටාවක් ලෙස දැකිය හැකි ය. ප්‍රධාන නගර කේන්ද්‍ර කර ගනිමින් ලන්දේසීහු තම ගොඩනැගිලි ඉදි කළහ. බොහෝ විට තනි මහලේ ගොඩනැගිලි වූ අතර, මහල් නිවාස ද විය. නිවසේ ඇතුළත කාමර අන්තර් සම්බන්ධතාවකින් යුක්ත විය. ලන්දේසි පාලන යුගයේ දී විශාල කුලුනු සහිත උස් ගොඩනැගිලි ඉදි කිරීම ඇරඹිණි. ගාල්ල, මීගමුව, මාතර, කොළඹ සහ යාපනය නගරවල ඇති ලන්දේසි බලකොටු හා දේවස්ථාන ද නිදසුන් ය. මැද මිදුල සහිත පැරණි ප්‍රභූ නිවාස ලන්දේසි පාලනයෙන් ලැබුණු දායාද වේ. ගෘහ නිර්මාණ ශිල්පය හා සම්බන්ධ කර්මාන්ත ලංකාවේ ආරම්භ කළ බවට මොරටුවේ වඩු කර්මාන්තය හා කැලණියේ උළු කර්මාන්තය නිදසුන් ය. ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පය හා බැඳුණු වචන මාලාවක් ද සිංහල භාෂාවට එක්ව අද දක්වා ම භාවිතයේ පවතී. ඉස්තෝප්පු, සොල්දරේ, තරප්පු, බාල්ක, ජනේල, කාමර, බරාඳ, බාස්, අල්මාරි සහ ඉස්කුරුප්පු ආදි යෙදුම් ඉන් කිහිපයකි.

ලන්දේසී සමයේ මුල් වකවානුව තුළ මෙරට තහවුරුව තිබූ ගෘහ නිර්මාණ කලාවේ දක්නට ලැබුණේ පෘතුගීසි ලක්ෂණත්, ස්වදේශික ලක්ෂණත් සහමිශ්‍රණය වූ ලන්දේසී ගෘහ නිර්මාණ කලාවක ලක්ෂණ ය. ලාංකේය ගෘහ නිර්මාණ කලාවට ලන්දේසී බලපෑම වඩාත් එල්ල වී සිංහල භාෂාවට පාරිභාෂික වචන රැසක් සහ නව තාක්ෂණික ක්‍රම ද උරුම විය. ලන්දේසීන්ගේ පාලන බලය ඉංග්‍රීසින් යටතට පත් වූ පසු ලන්දේසීන් ඉදි කළ බොහෝ බලකොටු සහ ගොඩනැගිලි විනාශ නොවුව ද ඇතැම් ඒවා බ්‍රිතාන්‍ය පාලකයන් සහ ජනතාව අතින් ප්‍රතිසංස්කරණයට ලක්විය. පෘතුගීසි යුගයේ ගොඩනැගිලිවල තිබූ සරල දොරටු ලන්දේසී යුගයේ දී වෙනස් විය. ගොඩනැගිලිවල ඉදිරිපස ප්‍රතාපවත් ව අලංකාරයෙන් යුක්තව ඉදිකරන ලදී. මුල් වකවානුව තුළ ඔවුන් විසින් ගොඩනගන ලද සහ පෘතුගීසින් විසින් නිර්මාණය කරන ලද බලකොටුවල ජීවත් වී ඇත.

උදාහරණ - ගාල්ල බලකොටුව, මාතර බලකොටුව, යාපනය බලකොටුව

මේ අතුරෙන් විශාලතම බලකොටුව වන්නේ ගාල්ල බලකොටුවයි. ඕලන්ද ගොඩනැගිලි නිර්මාණය කළේ ඔවුන්ටම විශේෂ වූ ගෘහ නිර්මාණ ලක්ෂණවලට අනුව ය. වෙළෙඳාමේ ප්‍රබල කොටස්කරුවන් වූ ඔවුන් ලංකාවෙන් ගෙනයන බඩු විශාල නැව්වලින් ප්‍රවාහනය කරන ලදී. එලෙස භාණ්ඩ ප්‍රවාහනය සඳහා පැමිණි නෞකාවල තමන්ගේ ගොඩනැගිලි නිර්මාණය සඳහා අවශ්‍ය ගඩොල් ගෙන එන ලදී. එලෙස ගෙන ආ ගඩොල්වලින් ගොඩනැගිලි ඉදි කරන ලදී. මෙම තුනී කහ පැහැති ගඩොල් නැව් බර දැරීම සඳහා ගෙන ආ ගඩොල් ය. එමෙන් ම කහ පැහැති ගඩොල් ලන්දේසි යුගයේ ගොඩනැගිලි හඳුනා ගැනීම සඳහා වන විශේෂ සාධකයකි. ලන්දේසීන් විසින් ඉදි කරන ලද ගොඩනැගිලි ලංකාවේ සීමාසහිත වුව ද, ඒ අතර බලකොටු සහ පල්ලි වැදගත් ය. ඔවුන් පෘතුගීසී ක්‍රමයෙන් වෙනස් ව තමන්ගේ ම ශෛලියට තැනූ ගොඩනැගිලි සංඛ්‍යාත්මකව වැඩි වූ අතර ඒවා තනි තට්ටුවේ ගොඩනැගිලි ලෙසින් ඉදි විය. විශාල ඕලන්ද ගොඩනැගිලි කිහිපයක් ගොඩ ඟගුණු අතර, ආණ්ඩුකාර නිවාස, පූජකාරාම, රජයේ සේවකයන්ගේ සමාජ ශාලා ආදිය ඒ අතර විය. මේවා මහල් දෙකකින් යුක්ත විශාල ඒවා වූ අතර, බොහොමයක් පෘතුගීසින් පළමු ව ඉදි කර දෙවනුව ලන්දේසීන් අතින් නවීකරණය වූ ඒවා ය. මුල්කාලීන ලන්දේසී ගොඩනැගිලිවල දොරටු සහ ජනේල විශාල නොවූ අතර, අලංකාර දිගු පටි සහිත සරනේරු, දොරවල් සහ ජනෙල් පියන් සඳහා භාවිත විය.

ඔවුන් භාවිත කළ ජනේල පළල් ය. උසට සරිලන පරිදි පැතලි සම්භාව්‍ය රාමුවකින් යුක්තව නිම කර තිබේ. ගොඩනැගිලිවල දොරකඩ සහ ද්වාරය ඉදිරිපස සම්භාව්‍ය ලක්ෂණ පළ කළ ත්‍රිකෝණාකාර පෙඩිමන්ට් එකක් විය. සමහර අවස්ථාවල පෙඩිමන්ට් එකෙහි ස්වරූපය වෙනස් වූ අවස්ථා වේ. මේ ලක්ෂණය ඕලන්ද යුගයේ අවසානය වනතුරු දක්නට ලැබුණි. ලන්දේසීන් විසින් නිර්මාණය කරන ලද ලී කවුළු සහ රාමු ඝන සහ පළල් ලී භාවිතයෙන් නිම විය. සාමාන්‍ය වර්ගයේ ජනේල චතුරස්‍රාකාර වූ අතර, පියන් සහිත ව නිර්මාණය විය. ගොඩනැගිල්ලේ ඉදිරිපස දොරටුවල ඉහළින් ද, බලකොටුවල දොරටුවල ද, පෙඩිමන්ට් භාවිත වූ බව පෙනේ. මේ ලක්ෂණය පෘතුගීසී වාස්තු විද්‍යාවෙන් ලබා ගත් ලක්ෂණයක් වුව ද, ලන්දේසීන් එය භාවිත කළේ වෙනස් ලක්ෂණ සහිත ව ය. ලන්දේසීන් විසින් භාවිත කරන ලද සම්භාව්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ලන්දේසී යුගයේ අවසානය වනතෙක් ම පැවතිණි. කුලුනු, ජනේල, කවුළු බොහොමයක් නිර්මාණය වූයේ ලීයෙනි. ඔවුන් බහුල ව භාවිත කළ ජනේල වර්ගය වූයේ පහත දැක්වෙන ආකාරයේ ජනේලයන් ය. මුල් යුගයේ ක්‍රි.ව. 1640 - ක්‍රි.ව. 1720 කාලයේ නිර්මාණය වූ ගොඩනැගිලිවල නිවසක විශාල විවෘත කාමර වැදගත් අංගයක් විය. සාමාන්‍ය සැලැස්මක මධ්‍ය දොරටුව පිහිටා ඇත. දෙවන යුගයේ දී මුහුදුබඩ තීරයේ නගර ආශ්‍රිත ව සහ වතු ආශ්‍රිත ව මේ යුගයේ ගොඩනැගිලි දක්නට ලැබේ. දොරවල් සහ පියන් එක් ජනේලයක් වශයෙන් සමස්ත ඒකකය එකට ගොඩ නගන ලද අවස්ථා වේ. එමෙන් ම බැරොක් ශෛලිය භාවිතයෙන් අලංකාර රටා සහිතවත් ගොඩ නගන ලද අවස්ථා වේ. මේ යුගයෙන් පසු එනම් දෙවන යුගයෙන් පසු බහුල ව භාවිත වූයේ එක දොරකට ජනේල දෙකක් හෝ තුනක් ආදි වශයෙනි. මෙහි දී ඔවුන් ජනේල වර්ග දෙකක් බහුල ව භාවිත කර ඇත. මෙවැනි ආකාරයට තනන ලද ගොඩනැගිලි ප්‍රභූ ගොඩනැගිලි විය. අඩු වියදමක් යටතේ ඉදි කළ ගොඩනැගිලිවලට ජනේල යෙදූ දොරවල් හෝ ජනේල භාවිත නොවී ය. වේගයෙන් වැසිය හැකි ජනේල සහ දොරවල් ලන්දේසීන් අතර

ජනප්‍රිය ය. දෙවෙනි යුගයේ දී දොරට ඉහළින් ආලෝක කවුළු (Fan Light) භාවිතය සිදු විය. ක්‍රි.ව. 1740 දී ජනේල සහ දොරවල්වලට ඉහළින් භාවිත විය. පටු බරාදයකින් යුතු කුලුනු රූසකින් යුතු නිවාස ගොඩනැගිලි කලාවට එකතු වූයේ ඕලන්ද ගෘහ නිර්මාණ කලාවේ දී ය. ගොඩනැගිලි ඉදි කිරීමේ දී ඔවුන් විසින් විශාල බාල්ක භාවිත කරන ලදී. දෙවැනි ලන්දේසී යුගයේ දී නිවාස සැලසුම් කරන ලදී. ඇතුළු වන ශාලාව පටු වන ආකාරයටත් දෙපස පිහිටි කාමර විශාලවත් නිර්මාණය කරන ලදී.

ගෙමිදුල පැත්තකින් කුඩා කාමර ගණනාවක් විය. දෙමහල් ගොඩනැගිලිවල මැද මිදුලක් අභ්‍යන්තරයේ විය. දෙමහල් ගොඩනැගිලිවල දෙකෙළවර මැද මිදුල විය. බිම් මහලේ සේවක නිවාස, රථ වාහන නැවතුම්පළවල් විය. එවකට යුරෝපයේ බැරොක් සහ රොකොකෝ කුරෙන්ති භාවිත කළහ. ලන්දේසී යුගයේ අවසාන භාගය වන විට දී, ගොඩනැගිලි විශාලවත් ශෝභමානවත් දොර, ජනේල පියන් සියුම් සහ අලංකාර විය. මේ කාලය වනවිට ප්‍රංශ කලාව පැතිර ගිය අතර, නව සම්භාව්‍ය ශෛලියේ ආභාසය ද එකතු විය. ක්‍රි.ව. 1790 වන විට French Window's හඳුන්වා දෙන ලදී. විශාල ආරුක්කු ද්විතීයික රාමුවකින් යුක්ත දොරවල් භාවිත කර ගත් කාමර එකිනෙක අතර සම්බන්ධ විය. එසේම ප්‍රංශ කලාවේ ආභාසය ලත් ගොඩනැගිලි අලංකාර ව ඉදි කිරීම ද සිදු විය. ලන්දේසීන්ගේ ගෘහ නිර්මාණ කලාවේ ශේෂයන් ප්‍රබල ව හමු වන ස්ථානයක් වන්නේ කොළඹ කොටුව ආණ්ඩුකාර මන්දිරය යි.

**බ්‍රිතාන්‍ය යුගයේ පොදු ගෘහ නිර්මාණ ලක්ෂණ**

ක්‍රි.ව.1796 දී මුල් කාලයේ දී, බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ දැකිය හැකි ප්‍රධාන ස්ථානයක් වශයෙන් කොළඹ පිහිටි අද්මිරාලගේ නිවාසය හඳුනා ගත හැකි ය. විශාල කාමර සහිත අද්මිරාල් නිල නිවාසය පටු ඇතුල් වීමේ ශාලාවකින් යුක්ත ය. විශාල කාමර, මැද මිදුල් සහිත ව මේවා නිම වූ අතර, විශාල පළල් දොරවල් විය. මෙම නිවාසවල කාමර සඳහා පළල් ආරුක්කු, ද්විත්ව දොරවල් භාවිත විය. කපරාරු කරන ලද පෙදරේරු ක්‍රම භාවිත කරන ලදී. ජනේල සෘජුකෝණාස්‍රාකාර ය. මේ යුගයේ නිම වූ ගොඩනැගිලිවලින් නාගරික ගොඩනැගිලිවල විශේෂ වෙනසක් වේ. ප්‍රභූවරුන්ගේ නිවාස සුඛෝපභෝගී විය. මේ නිවාසවල සිවිලිම් සහිත ව ඉතා අලංකාර ව ගෘහ නිර්මාණාත්මක අංග එකතු වූ ගොඩනැගිලි විය. බොහෝ නිවාස දෙමහල් විය. මධ්‍යයේ පියගැට පෙළ, අලංකාර අත්වැලකින් සහ ඔප දැමූ අගනා කැටයම්වලින් යුතු ගෘහ භාණ්ඩ වර්ග, අලංකාර පහන් දැක ගත හැකි ය. නමුත් මේ ක්‍රමයට සමගාමී වන පැරණි ඕලන්ද ක්‍රමයට අනුව කරන ලද ගොඩනැගිලි 20වන සියවස අගවන තෙක් නිර්මාණය වූ බව පෙනේ. බ්‍රිතාන්‍යයෙන් ලාංකික ගෘහ නිර්මාණ කලාවට හඳුන්වා දුන් Louver පතුරු දොරවල් විය. මේ ගොඩනැගිලිවලට පිටතින් සුළං ලැබීමට යෝග්‍ය වන පරිදි වාතාශ්‍රය ලැබීමටත් නිවසේ අභ්‍යන්තරයට වැසි වතුර වැටීම වැළැක්වීමටත් විවර සහිත ජනේල සහ දොරවල් කිහිපයකි. පතුරු සහිත ජනේල සහ දොරවල් මුල දී විශාල වූ අතර, සකස් කළ හැකි අයුරින් නිම විය. පසුකාලීන ව මෙම දොරවල් සහ ජනෙල් වෙනස් කළ නොහැකි අයුරින් නිර්මාණය කරන ලදී. 19වන සියවස, ගොඩනැගිලි කලාවේ සුවිශේෂතම අවධිය විය. මෙකල කෝපි සහ තේ වතු ආශ්‍රිතව බ්‍රිතාන්‍ය ගොඩනැගිලි ඉදිවීම ආරම්භ විය. මෙම නිවාස බ්‍රිතානයේ ජීවත් වූ ධනවතුන්


භාවිත කළ Villas ගණයේ විශාල ප්‍රාසාදවල කුඩා ප්‍රමාණයේ අනුකෘතීන් විය. මෙම වර්ගයේ නිවාස බංගලා නමින් හඳුන්වයි. 19වන සියවසේ මධ්‍යය භාගය වන විට බොහෝ සේ නව ගොඩනැගිලි ඉදි කිරීම ආරම්භ විය. මෙහි දී රජයේ සහ පෞද්ගලික නිවාස වැදගත් තැනක් ගන්නා ලදී. ඉහළ මට්ටමේ අලංකරණ අංගවලින් යුක්ත විය. මේවා සඳහා පුනරුද සහ නව සම්භාව්‍ය යුගයේ භාවිත කළ කුලුනු, ජනේල මෙම නිර්මාණ සඳහා ද යොදා ගත් අතර, ඒවා ගොතික් ශෛලියට අනුව ගොඩ නගන ලදී.

ගොතික් ශෛලියට අනුව කළ දේවස්ථාන සහ පාසල් දැක ගත හැකි ය. මේ සඳහා Pointed Arch භාවිත කරන ලදී. වාත්තු කරන ලද යකඩ මේ ගොඩනැගිලි ඉදි කිරීමට භාවිත වූ ප්‍රබල මාධ්‍යයක් වේ. මෙතෙක් කල් ගොඩනැගිලිවල වහලවල් බිත්තිවලින් වෙන් ව යමින් වහලවල් සහ බිත්ති වෙන් වෙන් ව ඉදි කිරිම යුරෝපයේ දී භාවිත කරන ලදී. බරින් අඩු සැහැල්ලු ද්‍රව්‍ය භාවිත කර ගොඩනැගිලි ඉදි කිරිම වැදගත් ය. වාත්තු කළ යකඩ ක්‍රි.ව. 1638දී එංගලන්තය විසින් හඳුනා ගනු ලැබීය. ක්‍රි. ව. 1850දී මහා බ්‍රිතාන්‍ය සිය යටත්විජිත සඳහා වාත්තු කළ යකඩ ආනයනය කරන ලදී. ක්‍රි.ව. 1870 - ක්‍රි.ව. 1880 දක්වා කාල පරාසයේ දී වාත්තු කළ යකඩ ආනයනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වාත්තු කළ යකඩ ඉතා බහුල ව භාවිත කිරීමත් ලංකාවේ ගෘහ නිර්මාණ කලාවෙන් දැක ගත හැකි ය. දියතලාවේ පිහිටි අද්මිරාල් නිල නිවාසය මුළුමනින් ම වාත්තු කළ යකඩ භාවිත කර ඉදි කරන ලද්දකි. කොළඹ කොටුව දුම්රියපොළ ඉදි කිරීම සඳහා ද, වාත්තු කළ යකඩ භාවිත විය. විශේෂයෙන්ම දුම්රිය ස්ථානවලට (New Ceylon Railway Station) වාත්තු කළ යකඩ භාවිත කරන ලදී. එසේ ම 19වන සහ 20වන සියවස්වල දී ස්ටීල් වානේ සහ කොන්ක්‍රීට් බහුල ව භාවිත විය. මේවා විශාලවත් මහල් කිහිපයකින් යුක්තවත් ඉදි විය. මේ අනුව ඉදි කරන ලද ගොඩනැගිලි ගණනාවක් ම ලංකාවේ කොටුව ආශ්‍රිත ව දක්නට ලැබේ. එකල බැංකු, වෙළඳ කටයුතු සඳහා මෙම ගොඩනැගිලි භාවිත විය. කොළඹ 07 කුරුඳුවත්ත ප්‍රදේශය ආශ්‍රිතව නිර්මාණය වූ බොහෝ නිවාස ඉන් පෙර තිබූ නිවාසවලට වඩා විශාල ව ඉදි විය. මෙම නිවාස බොහොමයක් බැරොක් ශෛලිය අනුව ඉදි වූ අතර, බ්‍රිතාන්‍යයේ කුඩා ප්‍රාසාද මෙන් විය.


සමාජ තත්ත්වය මත වූ ගෘහ නිර්මාණ කලාවක් මේ අනුව බිහිවිය. සමාජ තත්ත්වය සහ මූල්‍ය වටිනාකම් මත ඒවායේ ස්වභාවයත් තීරණය විය. 18වන සියවසේ අග භාගයේ දී යුරෝපය කේන්ද්‍ර කරගෙන සිදු වූ වෙනස්කම් රාශියකි. එනම් ලෝක යුද්ධය, කාර්මික විප්ලවය, ප්‍රංශ නව සම්භාව්‍යවාදය, සෞන්දර්යවාදය, විදුලිබල උත්පාදනය යන මෙම සියල්ලේ ම අනුසාරයෙන් සිදු වූ වෙනස්කම් ලාංකේය වාස්තු විද්‍යාවට හඳුනා ගන්නට ලැබීම විශේෂත්වයකි. මේ කාලවකවානුව තුළ මෙරටට පැමිණ පදිංචි වූ බ්‍රිතාන්‍ය නව වතු පාලකයන් එවකට ඔවුන් අනුගමනය කළ යටත්විජිත යුගයේ වාස්තු විද්‍යාව එපරිද්දෙන්ම නඩත්තු කළ අතර ඔවුන් "කොමේට් ස්ටයිල්" ලක්ෂණය අනුගමනය කර ගෙන ඉදි කරන ලද නිවාස වැදගත් ය. මෙම ගොඩනැගිලි සඳහා ටස්කන් කුලුනු භාවිතය වැදගත් ය. එකල ඉදි වූ විශාල ප්‍රමාණයේ නිවාසවලට අමතර ව කුඩා ප්‍රමාණයේ සෑම නිවාසයක් සඳහා ම මැද මිදුලක් විය. මුහුදුකරයේ නගරවල ඉදි කරන ලද වලව් සඳහා නිවාසයේ ඉදිරිපස අමුත්තන් වෙනුවෙන් ඉදි වූ බරාදයක් සහිත නිවාස විය. බොහෝ නිවාස ඉදි වූයේ වීදී දෙපස පෙළට වන්නට ය. එම නිවාසවල බොහෝ විට නිවසේ ඉදිරිපසින් බැලූ විට


ගොඩනැගිල්ලේ අභ්‍යන්තරයේ මිදුල තෙක් දෘශ්‍ය පථයට හසු වේ. එමෙන් ම මෙලෙස ඉදි වූ නිවාස අතර "පැවිලියන් ටයිප්" නම් වූ නිවාස වේ. මෙම කුලුනුවලින් යුක්ත පෝටිකෝවක් සහිත නිවාස වේ. ඉස්තෝප්පුවේ දෙකෙළවර ඉදිරිපස පිහිටි කාමර වේ. ටෙරාකොටා ටයිල් පෝටිකෝවත්, මැද සාලයෙත්, වැදගත් කාමරවලත් වූ අතර, ගෘහයේ අනෙක් කාමරවලට ගොම මැටි භාවිත විය.


"ටෙරස් හවුස්" නම් මෙම නිවාස උස් වේදිකාවක් මත විය. අලංකාර ගරාදි වැඩවලින් මෙය යුක්ත විය. බ්‍රිතාන්‍ය අවධියේ නිර්මාණය වූ බංගලා සඳහා බොහෝ අංග ඇතුලත් විය. පැරිස් ක්‍රමයට නිම වූ ඔප දමන ලද ලී වැඩ දැක ගත හැකි ය. දොර, ජනේල, කුලුනු, පියගැට පෙළවල් දැක ගත හැකිවේ. 19වන සහ 20වන සියවසේ මුල් භාගයේ බ්‍රිතාන්‍ය සමයට අයත් නිවාස පිළිබඳ හොඳම නිදසුනක් ලෙස කොළඹ Mount Marryහි දුම්රිය නිල නිවාස දැක්විය හැකි ය. මෙම නිවාස ඉංග්‍රීසී ක්‍රමයට අනුව තට්ටු දෙකකින් ඉදිරිපස සහ පසුපස වැරැන්ඩාවකින් ද, කුඩා කාමර හතරකින් ද, නාන කාමරයකින් ද සමන්විත වෙයි. නිවාස ඉදිරිපස සම්භාව්‍ය ක්‍රමයට තැනූ කුලුනු දැකගත හැකි ය. බැල්කනියේ බර දරා සිටින්නේ මේවා ය. බැල්කනිය මුළුමනින් ම ලීවලින් නිමවා ඇත. ගොඩනැගිල්ලේ ජනේල සහ දොරවල් ආරුක්කු ස්වරූපයක් ගනී. එකල නිවාසවල වහල නිර්මාණය කිරීමට භාවිත වූ ක්‍රමයකට වහලේ නිර්මාණය කර ඇත. බොහෝ විට වහල තට්ටු (තල) දෙකක් හෝ තුනක් ලෙස නිර්මාණය කර ඇත. මේ වහල සඳහා පිලිස්සූ උළු භාවිත වීම දැකිය හැකි ය. තව ද 19වන සියවසේ ඉදි වූ ගොඩනැගිලි පළල් පටු බරාදයක් (වැරැන්ඩා) සහ කවුළු වැඩි ගණනාවකින් යුක්ත විය. මේවා ඕලන්ද බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස හා වඩා ආරක්ෂා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකි ය. මහල් නිවාස ඉදි කිරීමේ දී විශාල බාල්ක භාවිතය සිදු කරන ලදී. ලන්දේසී යුගයේ දී නිර්මාණය වූ ගාල්ල බලකොටුවේ 75% ක් පමණ ගොඩනැගිලි බ්‍රිතාන්‍ය අවධියේ ඉදි වූ ඒවා ය. ඉදිරිපස පෙනුම පිළිබඳ වැදගත් වූයේ මෙලෙස වාහන පැමිණීමත් සමඟ ය. බ්‍රිතාන්‍ය යුගයේ අවසානයේ දී වාහන භාවිතය සාමාන්‍ය වූ පසු ජන ජීවිතයට අනුකූල ව ගොඩනැගිලි කලාව ඉදි වූ අතර, නව අංග ද ඒ අනුව එකතු විය.




**පෘතුගීසි ගොඩනැගිලිවල සඳලු තල,**
**ලීයෙන් සහ පෙදරේරු තාක්ෂණයෙන් නිම වූ මෂ්රබීස් නමැති අංගය**









**Double Arch Window's**
**The Krays Church - Jaffna**

**Double Arch Window's**
**Matara Dutch Church**


**French Casement Windows**





**නෙදර්ලන්තයේ නිවාස සැලසුම් අනුව නිර්මාණය වූ නිවාස ක්‍රම**





**ලන්දේසි නිවසක සැලසුමක්**




**මෙම ජනේල වීදුරු රාමු සහිතව හෝ තෙල් කඩදාසි හෝ ඔයිස්ටර් (සිප්පි කටු) භාවිතයෙනි. වීදුරු කලාතුරකින් භාවිත විය.**



**ආලෝක කවුළු නොමැති ජනේලයන්**



ලංකාවේ දී භාවිත වූ විවිධ කුරෙන්ති විශේෂයන්



**Classical Triangular Pediment**



**Classical Weal Pediment**

මාතර තාරකා බලකොටුව

**මූලාශ්‍රය**

අලුත්වත්ත, එම්. පු. (2008). **ශ්‍රී ලාංකීය ලන්දේසී ගෘහනිර්මාණ සම්ප්‍රදාය**. ගනේමුල්ල: ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්.
පෙරේරා, නිස්සංක. (2011). **ශ්‍රී ලංකාවේ ලන්දේසී බලකොටු**. කොළඹ-10: එස්. ඇන්ඩ් එස්. ප්‍රින්ටර්ස්.
මහින්ද හිමි, උණුවතුරබුබුලේ. (2007). **දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර**. වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය.
ලලිතකලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. (2017). **ජයතු.** දළුගම: කැලණිය විශ්වවිද්‍යාලය.

## Web Site

Department of National Museum, (n.d.), Dutch Museum. [online] Available at:<https://museum.gov.lk/web/index.php?option=com_regionalm&task=regionalmuseum&id=1&Itemid=76&lang=en>[Accessed 10 May 2022].
Department of National Museum, (n.d.), Maritime Museum. [online] Available at:<https://museum.gov.lk/web/index.php?option=com_regionalm&task=regionalmuseum&id=8&Itemid=79&lang=en>[Accessed 15 May 2022].

# දොඩන්දූව ශෛලබිම්බාරාමය විහාරස්ථානයේ සිතුවම්හි නිරූපිත යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

සඳමාලි කමල්චන්ද්‍ර බද්දේගම

## ප්‍රවේශය

ශ්‍රී ලංකාව යටත් විජිතකරණයේ පළමු පියවර 15 වන සියවසේ දී සිදු විය. එනම් ක්‍රි. ව. 1505 පෘතුගීසීන් ලංකාවට පැමිණීමත් සමග ය. නමුත් පෘතුගීසීන්ට පසුව පැමිණි ලන්දේසි ජාතිකයන්ගේ අරමුණ වූයේ තම වෙළෙඳාම වඩා පෘථුල ලෙස ව්‍යාප්ත කිරීම යි. අනතුරු ව පැමිණි බ්‍රිතාන්‍ය ජාතිකයන්ගේ අභිප්‍රාය වූයේ අධිරාජ්‍ය ගොඩනැගීම ය. එය කොතරම් ප්‍රබල වීද යත් ලොව 2/3 ක ප්‍රමාණයක් ඔවුන්ගේ යටත්විජිත බවට පත් කර ගැනීමට ඉංග්‍රීසීන්ට හැකි විය. මෙසේ සිදු වූ ක්‍රියාදාමයේ අවසන් ප්‍රතිඵලය වූයේ ලක්දිව ස්වෛරීභාවයට ප්‍රබල තර්ජනයක් එල්ල වීම ය. ලක්දිව තිබූ සියලු සංස්කෘතික හර පද්ධතීන් එකී බලපෑමට ප්‍රබල ලෙස නතු විය. දේශපාලනික, ආගමික, සමාජීය වශයෙන් පමණක් නොව කලාවෙහි ද එකී බලපෑමේ ලක්ෂණ නොඅඩුව දක්නට ලැබුණි. ඒ අනුව යටත්විජිත යුගයේ ලාංකේය ජන ජීවිතයට බද්ධ වූ අංග බෞද්ධ බිතු සිතුවම් කලාව තුළින් ද විද්‍යමාන විය. .මේ නිසා සිදු වූයේ යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ නිස්සාරත්වයත්, බෞද්ධ චර්යාවේ උදාරත්වයත් පෙන්වන කතා පුවත් පහතරට විහාර සිත්තම් කලාවට එක්වීම ය. දොඩන්දුවේ ශෛලබිම්බාරාමය ද යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම්වලට දැඩිලෙස ගොදුරු ව ඇති බව පෙනේ. ඒ අනුව දොඩන්දූව ශෛලබිම්බාරාමය විහාරස්ථානයේ සිතුවම්හි නිරූපිත යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම පිළිබඳ අධ්‍යයනය කරමින් විමර්ශනයට ලක් කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

## පර්යේෂණය ක්‍රමවේදය

මෙම පර්යේෂණ කාර්යයේ දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් පර්යේෂණාත්මක ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි අධ්‍යයන මූලාශ්‍රය වශයෙන් පරිශීලනය කර ඇති අතර ද්විතීයික මූලාශ්‍රය ලෙස ශෛලබිම්බාරාමය විහාරස්ථානයේ සිතුවම් විමර්ශනයට ලක් කිරීම සිදු කර ඇත.

## උපන්‍යාසය

ශෛලබිම්බාරාමය විහාරස්ථානයේ සිතුවම් පිළිබඳ අධ්‍යයනය කරමින් විමර්ශනයට ලක් කිරීම.

**සාකච්ඡාව**

## යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම හා පහතරට බෞද්ධ සිතුවම් කලාවේ ආරම්භය

මෙරටට පැමිණි පෘතුගීසි ජාතිකයන් පළමුවෙන් සිය ආධිපත්‍ය තහවුරු කර ගත්තේ දකුණු පළාතේ මුහුදුබඩ ප්‍රදේශවල ය. පෘතුගීසි ආධිපත්‍ය යටතේ මුහුදුබඩ ප්‍රදේශවල බෞද්ධ සංස්කෘතිය අත්‍යන්තයෙන් ම පිරිහී ගියේ ය. ඔවුහු බෞද්ධ විහාරාම මුළුමනින්ම විනාශ කරමින් බෞද්ධ සංස්කෘතියට ඉඳුරා පටහැනි දුර්දාන්ත සමාජ පරිසරයක් ස්ථාපිත කරමින් රටේ පාලනය ගෙන ගියහ. පෘතුගීසින්ගෙන් පසු මුහුදුබඩ ප්‍රදේශවල බලය අල්ලාගත් ලන්දේසීන්ගෙන් පෘතුගීසින්ගෙන් තරම් බුදු දහමට හානියක් නොවී ය. ලක්දිව සම්පූර්ණයෙන්ම යටත් කර ගැනීමේ ආශාවක් හෝ රෙපරමාදු ක්‍රිස්තියානි ධර්මය බලහත්කාරයෙන් සිංහලයන් පිට පැටවීමේ බලාපොරොත්තුවක් හෝ ඔවුන්ට නොවී ය. ඔවුන්ගේ එක ම අරමුණ වූයේ ශ්‍රී ලංකාව වෙළෙඳ මධ්‍යස්ථානයක් කර ගැනීම ය. දකුණුබඩ ප්‍රදේශයේ පහතරට ශෛලියට අයත් විහාර සිතුවම් නිර්මාණය වූ යුගය වන විට මුහුදුබඩ ප්‍රදේශවල පාලනය පැවතියේ ඉංග්‍රීසින් සතුව ය. ඔවුහු බුදු සසුනට ඉතා තීක්ෂණ අන්දමින්ද්‍රෝහිකම් කළහ. බෞද්ධ චින්තනයට එරෙහි ව ඉංග්‍රීසීන් ගෙන ගිය ප්‍රචාරක ව්‍යාපාරය මුහුදුබඩ ප්‍රදේශවල විසූ බෞද්ධ භික්ෂූන් මුහුණ දුන් බරපතළ ම අභියෝගය විය.

## පහතරට සිතුවම්හි දක්නට ලැබෙන යුරෝ-කේන්ද්‍රීය ආභාසය

භික්ෂූන් වහන්සේලා විසින් අරඹන ලද මේ මහා සමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ක්‍රියාශීලී සාමාජික පිරිස සිත්තරු ය. පහතරට සිත්තරුන් චිත්‍රකර්මය ප්‍රගුණ කළේ උඩරට සිත්තරුන් ඇසුරෙහි වුවත් ප්‍රායෝගික ව චිත්‍රකරණයෙහි යෙදුණේ පහතරට දී ය. එම සිත්තරුන්ගෙන් ව්‍යාප්ත වූ සිත්තර පරම්පරාවලට සම්බන්ධ වූයේ ද සිංහල තරුණ පිරිස් ය. මේ නිසා සිදු වූයේ විහාර සිතුවම්වලට ඔවුන්ට හුරුපුරුදු බටහිර පන්නයට හැඩ ගැසී තිබුණු භෞතික පරිසරය ප්‍රවේශ වීම ය. සියවස් හතරක් තරම් දීර්ඝ කාලයක් මුහුදුබඩ ප්‍රදේශවල පැවතියේ බටහිර ආධිපත්‍යය ය. පහතරට සිතුවම් නිර්මාණය වන යුගය වන විට මුළුමනින් ම යුරෝපීය බලපෑම ජන ජීවිතයට එක්ව තිබුණි. මේ ජීවිත කාලය පුරා අසා දැක පුරුදු දෙය ඔවුන්ගේ චිත්‍ර කර්මාන්තවලට පිවිසීම ස්වාභාවික ය. පහතරට සිතුවම් කලාවට බටහිර ආභාසය (**යුරෝ-කේන්ද්‍රීය ආභාසය**) ප්‍රවිෂ්ට වූයේ ඒ අනුව ය. බටහිර සංස්කෘතියේ නිස්සාරත්වය පෙන්වා දීමේ අරමුණින් ඉදිරිපත් කරන්නට යෙදුණු විහාර සිතුවම්වලට බටහිර සංස්කෘතියේ අංග ලක්ෂණ එක් විය. මෙහි දී චිත්‍රකරණය කෙරෙහි යුරෝපීය ආභාසය කෙතරම් තීව්‍ර ලෙස බලපා ඇතිදැයි කිවහොත් ඇතැම් විට සිත්තරාට තමන් සිතුවම් කරන්නේ කවර කාලයකට අයත් සිදුවීමක් දැයි අමතක වී ඇති බව පෙනේ.

මේ අනුව යුරෝපීය බලපෑම මත මෙම සිතුවම් කලාවට ගෘහ භාණ්ඩ, උපකරණ, ඇඳුම් පැලඳුම්, යාන වාහන ආදි අංග ලක්ෂණ රැසක් එක් විය. ඒ අතර; යුරෝපීය දිගු සාය, හැට්ට, දිගු ගවුම් මෝස්තර, පිහාටු සහිත තොප්පි, සෝමනය (හිසට යෙදූ රෙදිකඩ), බොත්තම් සහිත කබා, කුඩය, රෝස මල්, ලියවැල්, මිදි පොකුරු ආදි මෝස්තර, තේ පෝච්චිය, කැබිනෙට්ටු, රෝම ඉලක්කම් සහිත ඔරලෝසු, කනප්පු, හැඳි,

පිඟන්, වියන් සහිත ඇඳන්, හාන්සි පුටුව, කවිච්චි, කනප්පු, මල් බඳුන්, දම්වැල් සහිත සාක්කු ඔරලෝසු, විසිතුරු එල්ලෙන ලාම්පු, බිත්ති ලාම්පු, පඩික්කන්, පැනල් සහිත දොර පියන් හා ජනේල, මහල් නිවාස, කුලුනු සහ බරාඳ, ලී තරප්පු පේළි, අර්ධ කවාකාර වා කවුළු, දුම් පයිප්ප, තිර රෙදි, යුරෝපීය වාද්‍ය භාණ්ඩ ආදි අංග බහුලව දැකිය හැකි ය. මෙහි දී විශේෂයෙන් මහල් නිවාස දැක්වීමේ දී ඉහළ මහල්වල වූ අර්ධ කවාකාර වා කවුළු ද ග්‍රිල් සහිත ජනේල ද මුෂරාබි (musharabies) යනුවෙන් හැඳින් වූ ඉහළ මහල්හි බරාඳ ද ප්‍රථමයෙන් හඳුන්වා දෙනු ලැබුවේ පෘතුගීසීන් විසින් වීම විශේෂිත ය. මෙලෙස නිර්මාණය වූ පහතරට සිතුවම් දැකිය හැකි විහාරස්ථාන බොහොමයක් ලක්දිව මුහුදුබඩ ප්‍රදේශවලින් හමුවේ. ඒ අතර; දොඩන්දූව ශෛලබිම්බාරාම විහාරස්ථානයෙහි නිරූපිත සිතුවම්හි යුරෝපීය ලක්ෂණ අන්තර්ගත බව පැහැදිලි ය.

### දොඩන්දූව ශෛලබිම්බාරාමය

ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ ගාල්ලට නුදුරු ව පිහිටි වර්තමානයේ දොඩන්දූව නමින් හැඳින්වෙන ප්‍රදේශයේ ශෛලබිම්බාරාමය පිහිටා ඇත. විහාරස්ථානයේ කීර්තියට හේතු වී ඇති දර්ශනීය විහාර මන්දිරය පෞරාණික වූත් විශාල වූත් ගොඩනැගිල්ලකි. ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ පෙන්වන මෙම ගොඩනැගිල්ල ආරුක්කු සහිත ආලින්දයකින් ද චිත්‍ර කර්මාන්තවලින් සරසන ලද පිට මාලයකින් හා ඇතුළු මාලයකින් ද සමන්විත ය. ශෛලබිම්බාරාමයෙහි විහාර සිතුවම් ඇත්තේ ප්‍රතිමා මන්දිරයෙහි පමණි. ප්‍රතිමා මන්දිරයෙහි ඇතුළු ගර්භය බුද්ධ ප්‍රතිමා සඳහා වෙන් කර ඇති අතර, එහි සෑම බිත්තියක ම තීරු හතරක් වන සේ තිරස් ලෙස බෙදා සිතුවම් ඇඳ ඇත. මෙම අධ්‍යයනය යටතේ බෞද්ධ සිතුවම් කලාවේ අන්තර්ගත යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම ප්‍රකට කරන ලක්ෂණ රැසක් දොඩන්දූවේ ශෛලබිම්බාරාමයේ සිතුවම් තුළින් හඳුනාගත හැකි විය. එම ලක්ෂණ අනු මාතෘකා කිහිපයක් යටතේ පහතින් වර්ගීකරණය කර සාකච්ඡා කර ඇත.

### බ්‍රිතාන්‍ය රාජ්‍ය ලාංඡන නිරූපණය

දොඩන්දූවේ ශෛලබිම්බාරාමය ද යුරෝ-කේන්ද්‍රීය බලපෑම්වලට දැඩි ලෙස ගොදුරු ව ඇති බව පෙනේ. විහාර සිත්තම් කලාවේ පොදු සම්මත ලක්ෂණ පවා මෙහි දී ඉවත් ව ගොස් ඇත. විහාර මන්දිරය ඉදිකර ඇත්තේ ඕලන්ද ගෘහ නිර්මාණ ශිල්පය අනුව යමිනි. හැම දොරටුවක් ම ආරුක්කුවකින් සමන්විත වන අතර, ඇතුළු කුටියට පිවිසෙන දොරටුවේ මකර තොරණ තිබිය යුතු ස්ථානයේ ඒ වෙනුවට විශාල ආරුක්කුවක් යොදා තිබෙනු පෙනේ. එය විසිතුරු මල් හා ලියකම්වලින් අලංකෘත අඩි 14ක් පමණ පළලින් යුත් ආරුක්කුවකි. එය මුදුනෙහි සිංහයා සහ කඟවේනා සහිත බ්‍රිතාන්‍ය රාජ්‍ය ලාංඡනය දැකිය හැකි ය. මෙය පහතරට බෞද්ධ විහාරස්ථානවලින් හමුවන යටත්විජිත  බලය උත්කර්ෂයට නැගූ වැදගත් දෘශ්‍ය සංඥාවක් ලෙස බ්‍රිතාන්‍ය රාජ්‍ය ලාංඡනය දැකිය හැකි ය (එලක 01).

## යුරෝපීය ඇඳුම්- පැලඳුම් භාවිතය

යුරෝපීය ඇඳුම්- පැලඳුම් සහ අපරදිග විලාසිතා යුරෝපීය බෞද්ධ කතා පුවත්පත්වල මහේශාක්‍ය බව ප්‍රභූත්වය නිරූපණය සඳහා යොදා ගැනීම යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම පෙන්නුම් කරන තවත් වැදගත් සාධකයකි. එම වස්ත්‍රාභරණ අතර යුරෝපීය දිගු සාය, හැට්ට, දිගු ගවුම් මෝස්තර, පිහාටු සහිත තොප්පි, සෝමනය (හිසට යෙදූ රෙදිකඩ), බොත්තම් සහිත කබා ආදි විවිධ යුරෝපීය ඇඳුම්- පැලඳුම් භාවිතය දැකිය හැකි ය. යුරෝපීය ඇඳුම්- පැලඳුම් සහිත ප්‍රභූ චරිත ප්‍රතිමා මන්දිරයෙහි සිතුවම් තුළින් හඳුනාගත හැකි ය.

මහමායා දේවිය විසින් දක්නා ලද ස්වප්නය (ඵලක 02) හා සුද්ධෝදන මහරජ නිමිත්ත පාඨකයන් ගෙන්වා ස්වප්නය පිළිවිසීම යන දෙවන හා තෙවන දර්ශන දෙකෙහි සුද්ධෝදන රජුන්ගේ වාසලෙහි ද යුරෝපීය ලක්ෂණ බෙහෙවින් දැකිය හැකි ය. මහාමායා දේවිය සැතපෙන්නේ වියන් ඇඳක ය. ඒ යටින් ඇති පඩික්කමක් ද කුලුනු සහිත ආරුක්කුව මධ්‍යයෙහි වූ විසිතුරු එල්ලෙන පහනක් ද වේ. මහාමයා දේවියගේ හිසෙහි සෝමනයකි. සුද්ධෝදන රජු හිඳ සිටින්නේ ඇඳි සහිත සුව පහසු පුටුවක ය. තව ද කනප්පු, බිත්ති ලාම්පු හා තිර රෙදි ආදිය ද දැකිය හැකි අතර, මහරජුගේ ඔටුන්න ද යුරෝපීය ආකාරයෙන් සිතුවම් කරන ලද්දකි. මහාමායා දේවිය දෙව්දහ නුවරට පෙරහරින් වැඩම වන බව දැක්වෙන සිතුවමේ දෝලාවෙන් යන මහාමායා දේවිය සෝමනයක් සහිතව ද දෝලාව තිරරෙදි සහිත කවුළුවකින් ද යුක්ත ය.

ප්‍රසූත මංගල්‍යයෙන් අනතුරු ව එලැඹෙන සුද්ධවාස බ්‍රහ්මාදීන් පිළිගත් පසු කුමාර රත්නය යස පදවි නාහාරය කොට කිඹුල්වත්පුරයට පෙරහරින් වැඩමවන බව දැක්වෙන දර්ශනයෙහි පෙරහැරේ ගමන් කරන ළමුන් හැඳ සිටින්නේ බටහිර පන්නයේ ගවුම් ය (ඵලක 03). සිදුහත් කුමරු පවා ඇඳ සිටින්නේ ගවුමකි. මෙහි කුඩා දරුවන් තිදෙනෙකි. ඒ තිදෙනා ම එසේ ගවුම්වලින් සැරසී සිටිනු දැකිය හැකි ය. මෙලෙස ශෛලබිම්බාරාමය විහාරස්ථානයේ සිතුවම්හි නිරූපිත යුරෝ-කේන්ද්‍රීය ඇඳුම්- පැලඳුම් භාවිතය සුවිශේෂී වේ.

## අපරදිග ගෘහ භාණ්ඩ, දෛනික උපකරණ සහ මෙවලම්

යුරෝපීයන් භාවිත කළ විවිධ භාණ්ඩ, දෛනික උපකරණ සහ මෙවලම් සමාජීය ප්‍රෞඪත්වය හැඟවීමේ සංකේත ලෙස පහතරට විහාර සිතුවම්වල යොදා ගැනීම දෘෂ්ටිවාදයේ බලපෑම පෙන්නුම් කරන තවත් වැදගත් සාධකයකි. නාටක ස්ත්‍රීන්ගේ විසුළු දැක්වෙන සිතුවමෙහි ඔවුන් අත ඇත්තේ යුරෝපීය පන්නයේ වාද්‍ය භාණ්ඩයන් ය (ඵලක 04). හිසෙහි සෝමනයන් ය. සිද්ධාර්ථ කුමරු වැතිර සිටින්නේ වියන් සහිත ඇඳක ය. ඊට පසෙකින් ඉහළ මහළට ප්‍රවේශ වීම සඳහා වූ යුරෝපීය පන්නයේ බරාඳ සහිත දැවමය තරප්පු පෙළකි. ඉහළ මහල ද යුරෝපීය ගෘහ නිර්මාණ අංග ලක්ෂණවලින් යුක්ත බව ද මැනවින් පෙනේ.

රජගහ නුවර බිම්බිසාර මහරජ රාජ්‍යයෙන් ආරාධනා කරන බව දැක්වෙන අවස්ථාවේ "බිම්බිසාර මහරජතුමාණන්ගේ වාසල'' යනුවෙන් නම් කර ඇති සිතුවම පුරා ම බටහිර ලක්ෂණ පැතිරී පවතී (ඵලක 05). පුටු, කනප්පු ආදි ගෘහ භාණ්ඩ, බිත්ති ලාම්පු, මල් බඳුන් ආදිය මෙන් ම වා කවුළු ද රජුගේ ඔටුන්න ද යුරෝපීය ලක්ෂණවලින් පිරී ඇත. මාළිගය නිර්මාණය පවා බටහිර ගෘහ නිර්මාණ ලක්ෂණවලින් යුක්ත ය.

සරණ කුමාරයාගේ කථාවෙහි, භාර්යාව ආභරණ ආශාවෙන් බොරු ලෙඩ ගත් බව පෙන්වන චිත්‍රයෙහි, සයන, පුටු වැනි ගෘහ භාණ්ඩ හා තිර රෙදි යුරෝපීය ලක්ෂණ පෙන්වයි (ඵලක 06). සරණ කුමාරයාගේ නිවසෙහි කුලුනු සහ ඔවුන් ඇඳ සිටින වස්ත්‍රවල මෝස්තර ද බටහිර ආභාසය ලබමින් සිතුවමට නඟා තිබේ. එමෙන්ම එම ගෘහය නිම කර ඇත්තේ දේවස්ථානයක ඉදිරිපස බිත්තියෙහි හැඩයට සමාන වන අයුරින් වීම විශේෂ ය.

සුද්ධෝදන රජතුමා ප්‍රසාදය තැනවීමට නියම කළ බව දැක්වෙන චිත්‍රයෙහි (ඵලක 07) මධ්‍යයෙහි දම්වැල් සහිත යුරෝපීය පන්නයේ එල්ලෙන ලන්තෑරුමකි. මාළිගය ඉහළ යුරෝපීය පන්නයේ අර්ධ කවාකාර වා කවුළුවක් හා බටහිර පන්නයේ කුලුනු වේ. ඊට දකුණු පසින් ඇති කොටසේ පැනල් සහිත දොර පියන්වල ලැටිස් මෝස්තරවලින් ද බිත්ති ලාම්පු හා බරාඳ සහිත ඉහළ මහලෙන් ද යුරෝපීය ලක්ෂණ ප්‍රබලව ප්‍රකට වේ.

**කොකේසියානු ලක්ෂණ සහිත මානව රූප**

කොකේසියානු ලක්ෂණ සහිත මානව රූප ප්‍රභූත්වය නිරූපණය සඳහා යොදා ගැනීම යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම පෙන්නුම් කරන තවත් වැදගත් සාධකයකි. විහාරස්ථානයන්හි නිරූපිත මානව රූප නියෝජනය කරනුයේ යුරෝපීයයන්ගේ කායික ස්වරූපයයි. දොඩන්දූවේ ශෛලබිම්බාරාමයේ දක්නට ලැබෙන සිදුහත් කුමරුගේ මාලිගය ඉදි කරන විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා (ප්‍රධාන ගෘහ නිර්මාණ ශිල්පියා) නිරූපණය කර ඇත්තේ ද යුරෝපීය ජාතිකයකු ලෙස වීම සුවිශේෂී කරුණකි. (මංජු ශ්‍රී,'දොඩම්දූවේ සිතියම්,' සිළුමිණ,07.07.1957, මහින්ද 2007: 222:365)

ක්‍රි.ව. 16වැනි සියවසේ පටන් ලක්දිව මුහුදුබඩ ප්‍රදේශය යුරෝපීයයන්ට නතුව තිබුණි. මේ හේතුවෙන් එම ප්‍රදේශවල විසූ සිත්තරුන්ට නිරතුරුව අසන්නට දකින්නට ලැබුණේ යුරෝපීය ලක්ෂණයන් ය. ඔවුන්ගේ ජීවිතවලට ද එම ලක්ෂණ බද්ධ ව තිබුණි. මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ එම යුගයේ මුහුදුබඩ ප්‍රදේශවල බෞද්ධ සිතුවම් කලාවට ද යුරෝපීය ලක්ෂණ එක්වීම ය. බුද්ධ කාලීන සිදුවීම් හා ජාතක කතා නිරූපණයේ දී පහතරට සිතුවම් ශිල්පියා නොදැනුවත් ව ම එම යුරෝපීය ලක්ෂණ සහිත රූ බෞද්ධ සිතුවම්වලට අන්තර්ගත කරන්නට විය.

## අපරදිග වාස්තු විද්‍යා ලක්ෂණ සහිත පසුබිම් දර්ශන

අපරදිග වාස්තු විද්‍යා ලක්ෂණ සහිත පසුබිම් දර්ශන ආදි බහුල ව පහතරට විහාර සිත්තම් කලාවට එක්වීම ශ්‍රී ලංකාව යටත්විජිතකරණය සිදු වූ ක්‍රියාදාමයේ තවත් එක් ප්‍රතිඵලයකි. සරණ කුමාරයාගේ කථාවෙහි, භාර්යාව ආභරණ ආශාවෙන් බොරු ලෙඩ ගත් බව පෙන්වන චිත්‍රයෙහි, සයන, පුටු වැනි ගෘහ භාණ්ඩ හා තිර රෙදි යුරෝපීය ලක්ෂණ පෙන්වයි (ඵලක 06). සරණ කුමාරයාගේ නිවසෙහි කුලුනු සහ ඔවුන් ඇඳ සිටින වස්ත්‍රවල මෝස්තර ද බටහිර ආභාසය ලබමින් සිතුවමට නගා තිබේ. එමෙන්ම එම ගෘහය නිම කර ඇත්තේ දේවස්ථානයක ඉදිරිපස බිත්තියෙහි හැඩයට සමාන වන අයුරින් වීම විශේෂ ය. ඒ සමග ම පෙනෙන ප්‍රාසාදයේ ඉහළ යුරෝපීය ආභාසය පෙන්වන අර්ධ කවාකාර වා කවුළුවකි. මන්දිර දෙක අතර හිඩැස පිරිවීමට යොදා ගෙන ඇත්තේ බටහිර සම්ප්‍රදායේ පාවෙන අතුරිකිලි මෝස්තරයකි. මාළිගය ඉහළ යුරෝපීය පන්නයේ අර්ධ කවාකාර වා කවුළුවක් හා බටහිර පන්නයේ කුලුනු වේ. ඊට දකුණු පසින් ඇති කොටසේ පැනල් සහිත දොර පියන්වල ලැටිස් මෝස්තරවලින් ද බිත්ති ලාම්පු හා බරාඳ සහිත ඉහළ මහලෙන් ද යුරෝපීය ලක්ෂණ ප්‍රබලව ප්‍රකට වේ.

## සමාලෝචනය

බුද්ධකාලීන සිදුවීම් හා ජාතක කතා නිරූපණයේ දී පහතරට සිතුවම් ශිල්පියා නොදැනුවත් ව ම එලෙසින් යුරෝපීය ලක්ෂණ බෞද්ධ සිතුවම්වලට අන්තර්ගත කරන්නට විය. ඒ අනුව දොඩන්දූව ශෛලබිම්බාරාම විහාරස්ථානයෙහි නිරූපිත සිතුවම්වල යුරෝපීය ලක්ෂණ අන්තර්ගත බව පැහැදිලි ය.

මේ අනුව යටත්විජිත යුගයේ ලක්දිව මුහුදුබඩ තීරයේ නිර්මාණය කරවන ලද දොඩන්දූව ශෛලබිම්බාරාමය විහාරස්ථානයෙහි ඇති සිතුවම්වල යුරෝපීය ලක්ෂණ රාශියක් නිරූපිත බව පැහැදිලි ය. ප්‍රථමයෙන් පෘතුගීසීන් ද දෙවනුව ලන්දේසීන් ද තෙවනුව ඉංග්‍රීසීන් ද මෙරටට හඳුන්වා දුන් යුරෝපීය ආභාසය මත මෙම සිතුවම් කලාවට යුරෝපීය ඇඳුම්- පැලඳුම් භාවිතය, කොකේසියානු ලක්ෂණ සහිත මානව රූප, අපරදිග ගෘහ භාණ්ඩ, දෛනික උපකරණ සහ මෙවලම්, අපරදිග වාස්තු විද්‍යා ලක්ෂණ සහිත පසුබිම් දර්ශන ආදි බහුල ව දැකිය හැකි ය.

## මූලාශ්‍රය

චූටිවොංග්ස්, නන්දන., ප්‍රේමතිලක, ලීලානන්ද. සහ සිල්වා, රෝලන්ඩ්. (1990). **ශ්‍රී ලංකා බිතුසිතුවම්. කරගම්පිටිය.** කොළඹ : ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. මහින්ද හිමි, උණුවතුරබුබුලේ. (2007). **දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර.** කොළඹ : එස් ගොඩගේ සහ සහෝදරයෝ. ලලිත කලා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය. (2017). **ජයතු**: මංගලිකා ජයතුංග, ප්‍රණාමාභිවන්දනා. දළුගම: කැලණිය.

## ක්ෂේත්‍ර ගවේෂණ

ගවේෂණය. දොඩන්දූව ශෛලබිම්බාරාමය. 2022-04-2



ඵලක 01

බ්‍රිතාන්‍ය රාජ්‍ය ලාංඡන නිරූපණය,
දොඩන්දූවේ ශෛලබිම්බාරාමය, ගාල්ල.



ඵලක 02
මහමායා දේවිය දුටු ස්වප්නය,
දොඩන්දූවේ ශෛලබිම්බාරාමය, ගාල්ල.



**එලක 03**
**කිඹුල්වත්පුරයට පෙලහරින් වැඩමවන බව,**
**දොඩන්දුවේ ශෛලබිම්බාරාමය, ගාල්ල.**



**එලක 04**
**නාටක ස්ත්‍රීන්ගේ විසුළු දැකීම,**
**දොඩන්දුවේ ශෛලබිම්බාරාමය, ගාල්ල.**



එලක 05
බිම්බිසාර මහරජතුමාණන්ගේ වාසල,
දොඩන්දුවේ ශෛලබිම්බාරාමය, ගාල්ල.



එලක 06
භාර්යාව ආභරණ ආශාවෙන් බොරු ලෙඩ ගත් බව,
දොඩන්දුවේ ශෛලබිම්බාරාමය, ගාල්ල.



එලක 07
සුද්ධෝදන රජු ප්‍රසාදය තැනවීමට නියම කළ බව,
දොඩන්දූවේ ශෛලබිම්බාරාමය, ගාල්ල.

# ගන්නෑ පත්තුවේ ශිලා ලේඛන පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

**පුරාවිද්‍යාඥ මංජුල කරුණාතිලක**

## පර්යේෂණ ප්‍රදේශය හා ඓතිහාසික තොරතුරු

ශ්‍රී ලංකාවේ කඩයිම් බෙදීම් අනුව ඓතිහාසික වශයෙන් සුවිශේෂත්වයක් ගන්නා කෝරළ අතර, සතර කෝරළයට ප්‍රධාන තැනක් හිමි විය. උඩරට රාජධානියේ රජවාසල කටයුතු සමඟ අවියෝජනීය සබඳතාවක් පැවති සතර කෝරළයට අයත් ගල්බොඩ කොරළයේ ගන්නවය පත්තුව කෑගල්ල දිස්ත්‍රික්කයේ ඊසාන දිගින් උඩරට රාජධානියට ආසන්නයෙන්ම පිහිටා තිබූ පාලන බල ප්‍රදේශයයි. වර්තමාන පරිපාලන බෙදීම් අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හීනටිපන ග්‍රාම නිලධාරි බල ප්‍රදේශය තුළ මෙම පර්යේෂණ ක්ෂේත්‍රය පිහිටා ඇත.

ගන්නෑ පත්තුව හෙවත් ගන්නවය පත්තුව ලෙස හඳුන්වන මෙම ප්‍රදේශය පැරණි ග්‍රාමීය පාලනය තුළ ආරච්චි වසම් දෙකකින් සමන්විත විය (Bell 1892:98). ගන්නවය පත්තුව තුළ ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන කිහිපයක් පිළිබඳ පැරණි වාර්තා පවතී. මොල්ලිගොඩ මහඅදිකාරම් විසින් ඉදිකරන ලද අංවාරම විහාරය, වසර සියයකට පූර්වයෙන් කුඩා ඇල්ලේවත්තේ රාළ සහ ගම්වැසියන් විසින් සාදවන ලද හීනටිපනේ විහාරය, මාකඩවර විහාරය, මල්වත්තේ මාවෙල විහාරය, හයවන පරාක්‍රමබාහු රජ දවස ඉදිකරන ලදැයි සඳහන් මාවෙල කන්ද ලෙන් විහාරය ඒ අතර විශේෂයෙන් වැදගත් ස්ථානයන් කිහිපයකි (Bell 1892:99). ගන්නවය පත්තුවට අයත් මෙම ස්ථාන හා ඒ ආශ්‍රිතව සැලකිය යුතු ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම්, සාක්ෂි, සාධක රැසක් ප්‍රදේශයේ ඓතිහාසිකත්වය ගොඩනැගීමට හේතු වී ඇත.

## පර්යේෂණ අරමුණු

ගන්නවය පත්තුවේ ශිලා ලේඛන පිළිබඳ සිදුකළ පර්යේෂණාත්මක අධ්‍යයනයක් වන මෙමගින් අදාළ පර්යේෂණ ප්‍රදේශය හා හඳුනාගත් ශිලා ලේඛන පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදු කිරීම මෙන්ම ඒ තුළින් නිවැරදි අර්ථ නිරූපණයන් ඉදිරිපත් කිරීම, අදාළ ලේඛන ස්ථිර වශයෙන්ම පැරණි මූල බ්‍රාහ්මී අවධියට අයත් ශිලා ලේඛනද යන්න නිශ්චිතව තහවුරු කර ගැනීම ආදිය මෙහි පුළුල් අරමුණ වේ.

එහි දී පුස්තකාල අධ්‍යයනයන් හා ක්ෂේත්‍ර අධ්‍යයනයන් තුළින් හඳුනා ගන්නා ලද ශිලා ලේඛන පිළිබඳ විශ්ලේෂණය කිරීම මූලික පර්යේෂණ ක්‍රමවේදය විය. පර්යේෂණ ප්‍රදේශය තුළින් හඳුනා ගන්නා ශිලා ලේඛන හා ඒ ආශ්‍රිත ප්‍රදේශවල සංක්ෂිප්ත ඓතිහාසික තොරතුරුවලට අදාළව ශිලා ලේඛනවල නාම ව්‍යවහාරයන් සම්බන්ධයෙන් වන ග්‍රාම නාම පිළිබඳ ප්‍රාමාණික විශ්ලේෂණයක් කිරීම ද මෙමගින් අපේක්ෂා කරනු ලැබේ. දැනට වාර්තාගත කොට ඇති ශිලා ලේඛනවල වර්තමාන පිහිටීම් හා නාම ව්‍යවහාරයන්

අනුව පවතින ගැටලු මෙන්ම ශිලා ලේඛන ලෙස හඳුනා ගෙන ඇති ඇතැම් ලේඛන සම්බන්ධයෙන් පවතින ගැටලු සඳහා විශ්ලේෂණයක් මෙන්ම අර්ථ නිරූපණ සඳහා තහවුරුවක් ලබාදීමටද මෙමගින් බලාපොරොත්තු වනු ඇත.

## ගන්නවය පත්තුවේ හඳුනා ගන්නා ලද ශිලා ලේඛන

කෑගල්ල දිස්ත්‍රික්කයේ ක්‍රි.පූ. 3 - 1 සියවස් කාලයට අයත් මූල බ්‍රාහ්මීය ලෙන් ලිපි විශාල ප්‍රමාණයක් හඳුනා ගෙන ඇති අතර, ඒ තුළින් ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය, ප්‍රදේශීය පරිපාලනය, මුදල් ක්‍රමය, ආර්ථිකය ආදි බොහෝ සාමාජීය ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ විශාල තොරතුරු ප්‍රමාණයක් හෙළිදරව් කර ගැනීමට හැකියාව ලැබී ඇත. ඒ අතර යටහලෙන, හුණුවල, ලෙනගල ආදි ස්ථානවලින් හමු වී ඇති මූල බ්‍රාහ්මීය අවධියට අයත් ශිලා ලේඛන වැදගත් සාක්ෂි සපයයි. කෑගල්ල දිස්ත්‍රික්කය පුරාම දළ වශයෙන් මූල බ්‍රාහ්මීය අවධියට අයත් ශිලා ලේඛන සහිත ස්ථාන 27ක් පමණ හඳුනා ගෙන ඇති අතර, මේ දක්වා ඒ ඒ ස්ථානවලින් හඳුනා ගෙන ඇති සියලු ශිලා ලේඛන වාර්තාගත කර ඇතත් ඇතැම් ස්ථානවල තවමත් ලේඛනගත නොවූ ශිලා ලේඛන පවතින බව නිරීක්ෂණය වී ඇත.

විශේෂයෙන් ගන්නවය පත්තුවේ ශිලා ලේඛන පිළිබඳ සිදු කරන මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ප්‍රදේශය තුළ හඳුනා ගන්නා ලද ශිලා ලේඛන හා අක්ෂර සටහන් ආදී ලේඛන හතක් පිළිබඳ මෙහි දී කරුණු විශ්ලේෂණය කිරීමට බලාපොරොත්තු වේ.

1. නාවන්දල අංගේ ගල්ලෙන් සංකීර්ණයේ පිහිටි ලෙන් ලිපිය
2. නාවන්දල ගම - (රුවන්පුර කොටසක) දිගන හේන නමැති ඉඩමේ පිහිටි ලෙන් ලිපිය
3. මාවෙල කන්ද විහාරයේ ලෙන් විහාරයට ඇතුළුවන දොරටුවෙහි කොරවක්ගලෙහි කොටා ඇති ලිපිය
4. ලෙන් විහාරයේ ප්‍රධාන ලෙනෙ කටාරමට පහළින් කොටා ඇති ලිපිය
5. විහාර පරිශ්‍රයේ තැනින් තැන පිහිටි ගල් බැම්/ගල් පුවරු/ලෙන් පියස්සෙහි ආදි තැනින් තැන කොටා ඇති විවිධ අක්ෂර සටහන් හා සංකේත හෝ රූප
6. මාවෙල කන්ද ලෙන් විහාර භූමියේ කැලෑබද කුඩා ගල් ලෙනක ඇති හතරැස් කොටුවක සංකේතය /බ  අක්ෂර සටහන
7. විහාරයට අයත් භූමියේ කුඩා ගල් ලෙනක ඇති ලෙන් ලිපිය

ඒ අනුව මෙම ශිලා ලේඛනවලට අමතරව බෙල්ගේ කෑගල්ල වාර්තාවට අනුව ගන්නෑ පත්තුවේ කඩඉම් සලකුණු කිහිපයක් පිළිබඳව වාර්තා වේ. ඒ අනුව 'අලුත් නුවර දේවාලයේ සිට මයිලක් පමණ දුරින් පදදෙනි කන්දේ "බඩ සිහ" යනුවෙන් අක්ෂර චතුර්යයකි. කහවන්දල (ගන්නෑපත්තුව) ගලක් මත විශාල "ශ්‍රී" අක්ෂරයකි' (Bell 1892:103). එහෙත් මෙම සලකුණු ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී හඳුනාගත නොහැකි විය. එසේ

වුවද ඉහත අංක 1 සිට 7 දක්වා වූ ශිලා ලේඛන හා ඒ සම්බන්ධ තොරතුරුවල පවතින පරස්පරතා රැසක් හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය බෙහෙවින් රුකුලක් වූ බව සඳහන් කළ යුතුය. ඒ අනුව ග්‍රන්ථාරූඪව හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ලේඛනගතව ඇති මෙම ශිලා ලේඛන පිළිබඳ සුවිශේෂී අභියෝගාත්මක කරුණු රැසක් මෙම පර්යේෂණය තුළින් අනාවරණය කර ගැනීම විශේෂයෙන් සඳහන් කළ යුතුය.

## 1. නාවන්දල අංගේ ගල් ලෙන් සංකීර්ණයේ පිහිටි ලෙන් ලිපිය

වර්තමාන පරිපාලන බෙදීම් අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හීනටිපන ග්‍රාම නිලධාරි වසමට අයත් නාවන්දල ගම මධ්‍යයේ පිහිටි උඩුමුල්ල හන්දියෙන් කිලෝමීටර් 1.5 ක් පමණ හීනටිපොනේ කන්ද දෙසට යන විට ගල් ලෙන් තුනකින් යුත් "අංගේ" නමින් ව්‍යවහාරයේ පවතින ගල්ලෙන් සංකීර්ණය හමුවේ.

මෙය මහනුවර රාජධානිය සමයේ විහාරස්ථානයක් ලෙස පැවති බවට ජනශ්‍රැති හා ජනප්‍රවාද මෙන්ම පැරණි ගම්වාසීන්ගේ තොරතුරු ද මැනවින් සාක්ෂි දරයි. දැනට වල් බිහිවී ඇති මෙම ස්ථානයේ පූර්වයේ විහාරස්ථානයක් පැවති බවත් මෙම විහාරය නාවන්දල ගමෙහි පිහිටි වාසලාවාස අංගේ ගල්ලෙන් විහාරය ලෙස ව්‍යවහාරව පැවති බවත් 19 වන සියවස මැද භාගයේ විහාරස්ථානය විනාශයට ලක්වූ බවත් සඳහන් වේ. නාවන්දල උන්නාන්සේ නමින් සඳහන් භික්ෂූන් වහන්සේ විහාරවාසීව සිටි බවත් විහාරස්ථානයේ අයිතිය සම්බන්ධයෙන් වන නීතිමය ලියවිල්ලකට අනුව පැහැදිලි වේ. මහනුවර ලේඛනාගාරයේ පෞද්ගලික ලේඛන අංශයේ තැන්පත් කර ඇති 1857.01.29 දාතම සහිත මෙම ලියවිල්ල මධ්‍යම දිසාවට අයත් මහනුවර මගුල් මඩුවේ දිස්ත්‍රික්ක උසාවියට සියලු වරද හැර ලියා ඔප්පු කර ඇති රපෝර්තු පත්‍රයකි. එයට අනුව නාවන්දල උන්නාන්සේට අයිති වූ වතු හෝ කුඹුරු කිසිවක් නොමැති බවත් නාවන්දල බදුවලින් ලත් පවුම් තුනෙන් මාකඩවර කපුරු මුදියන්සේ නමැති අයෙකුට නීත්‍යානුකූලව හිමිවීමෙන් මතු මෙම විහාරය අතහැර ගිය විහාරවාසී හිමිගෙන් පසු ස්ථානයේ පැවති ගොඩනැගිලි කාලයාගේ ඇවෑමෙන් මුළුමනින්ම විනාශයට ලක්වී ඇත. ඒ අනුව මෙම භූමි භාගය මේ වන විට නාවන්දල ගම පදිංචි චන්ද්‍රසිරි නමැත්තෙකුගේ සහ තවත් කිහිප දෙනෙකුගේ පුද්ගලික හිමිකම් යටතේ පවති. පුරාවිද්‍යාත්මකව සුවිශේෂි වැදගත්කම් සහිත පුරාවිද්‍යාත්මක ස්ථානයක් වන මෙහි කටාරම් සහිත මධ්‍යම ප්‍රමාණයේ ගල්ලෙන් තුනකි. දැනට පවතින තොරතුරු හා ජනප්‍රවාද අනුව විහාරලෙන, ගල්ඇන්දලෙන සහ මැදලෙන නමින් හඳුන්වන කටාරම් සහිත ගල් ලෙන් තුනක් මෙහි දක්නට ලැබේ. විහාරස්ථානය අභාවයට යාමෙන් පසු පෞද්ගලික අයිතියට පත් මෙම භූමිය දැනට වල්බිහිව ගල්ලෙන් තුන පමණක් පුරාවිද්‍යාත්මක සාධක ලෙස ශේෂව පවති. කටාරම් කෙටූ ගල් ලෙන් තුනෙන් මධ්‍යයේ ඇති කුඩා ලෙන එනම් මැද ලෙන භාවනානුයෝගී කටයුතු සඳහා ඉතාමත් යෝග්‍ය ස්ථානයක් බව නිරීක්ෂණය වේ. මෙහි මූල බ්‍රාහ්මීය අවධියට අයත් ලෙන් ලිපියකි.

**පෙළ** - ග ප ති ශ ම ණ ක ශ ලෙ (ඡායාරූපය I)

**අර්ථය** - ගෘහපති ශමණගේ ලෙන

වමේ සිට දකුණට කොටා ඇති මෙම ලිපිය ඉතා හොඳින් ආරක්ෂිතව පවතින අතර, අවසන් අකුර හරවා කොටා (දකුණේ සිට ලියන අයුරින්) ඇති බව හඳුනා ගත හැකිය. ලිපිය අනුව අර්ථවත් වන්නේ "ගෘහපති ශමණගේ ලෙන" යන්නයි. ඒ අනුව ගෘහපති ශමණගේ ලෙන සංඝයා විෂයෙහි පූජා කරන ලද බව මෙමගින් අර්ථවත් වනු ඇතැයි සමකාලීන ලෙන් ලිපි අධ්‍යයනයේ දී පැහැදිලි වේ.

මෙම ශිලා ලේඛනය පිළිබඳ විශ්ලේෂණයේ දී පැහැදිලි වන කරුණු කිහිපයකි. එච්.සී.පී. බෙල් ඔහුගේ Report on The Kegalle District(1892) කෘතියෙහි මෙම ලිපිය පිළිබඳ වාර්තා කර නොමැත. එසේම වර්ෂයේදී මහාචාර්ය සෙනරත් පරණවිතානයන් විසින් සම්පාදිත Inscriptions of Ceylon (1970) ග්‍රන්ථයෙහිද මෙම ලිපිය පිළිබඳ සඳහන් නොවේ. එහෙත් 1973.07.30 දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙම ලෙන් ලිපිය ලේඛනගත කර ඇති බව දෙපාර්තමේන්තුවේ ශිලා ලේඛන ලියාපදිංචි ලේඛනය අනුව හඳුනාගත හැකිය. ඒ අනුව එය කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කෝරළයේ ගන්නවය පත්තුවේ උඩුමුල්ල ග්‍රාම සේවා වසමට අයත් හීනටිපන අංගේ අරඹ නමැති ඉඩමේ පිහිටි ලෙන ලෙස එහි සටහන්ව ඇත. ශිලා ලේඛන ලියාපදිංචි කිරීමේ ලේඛනයේ අංක 2877 යටතේ (A1024) ලියාපදංචි කර ඇති මෙම ලේඛනයේ "ගපති සුමනකශ" ලෙස වාර්තා කර ඇත. එහෙත් ඒ පිළිබඳ යම් ගැටලු සහගත තත්වයන් රැසක් පවති. ඊට හේතු වන්නේ මෙම ශිලා ලේඛනය වාර්තාගත කර ඇත්තේ දෝෂ සහිතව බැවිනි. එනම්,

I. මෙම ලිපිය සත්‍ය වශයෙන්ම පිහිටා ඇත්තේ නාවන්දල ගම අංගේ ගල්ලෙන් සංකීර්ණයේ පිහිටි ගල් ලෙනක වන මුත් මෙහි ස්ථාන නාමය හීනටිපොනේ ලෙස සඳහන් කොට තිබීම.
II. හීනටිපන ග්‍රාම නිලධාරි වසම වෙනුවට උඩුමුල්ල ලෙස සඳහන් වීම.
III. "ශමණ" යන්න "සුමන" යනුවෙන් කියවා තිබීම.
IV. අවසාන අක්ෂරය වන "ලෙ" යන්න හඳුනා ගෙන නොමැති අතර එය ඉවත් කර ලේඛනගත කිරීම.

ඒ අනුව "ශමණ" යන්න "සුමන" ලෙස කියවා ඇති අතර "ලෙ" යන්න ලේඛනගත කර නැත. ඒ අනුව "ශ" යන්න "ස"ලෙසත් "ණ" කාරය "න" ලෙසත් වාර්තා කර ඇති අතර, "ලෙ"යන්න ලොප් වී ඇත. එසේම පිහිටීම පිළිබඳ සටහන්ද දෝෂ සහිතය. මේ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ලේඛනගත කර ඇති ලිපිය අනුව අර්ථ ගැන්වෙන්නේ "ගෘහපති සුමන" යන්නයි. එහෙත් සත්‍ය වශයෙන්ම මෙම ලිපිය අනුව " ග ප ති ශ ම ණ ක ශ ලෙ" යන්නෙහි නිවැරදිම අර්ථ ගැන්වීම 'ගෘහපති ශමණගේ ලෙන' යන්න විය යුතු බව පැහැදිලි වේ. ඒ අනුව ස්ථානීයව හෝ ප්‍රාදේශීයව සිටි ගෘහපතියකුගේ ප්‍රදානයක් ලෙස මෙම ලෙන සංඝයා විෂයෙහි පූජා කරන්නට ඇතැයි නිගමනය කළ හැකිය. කුමන හේතුවක් මත මෙලෙස

කියවා ඇත්ද යන්න නිශ්චය නොවේ. එහෙත් ලිපිය පියවි ඇසින් නිරීක්ෂණය නොකොට කරන ලද ලේඛනගත කිරීමක් විය හැකි බව පැහැදිලි වනු ඇත.

## 2. නාවන්දල - (රුවන්පුර කොටසක) දිගන හේන නමැති ඉඩමේ පිහිටි ලෙන් ලිපිය

**පෙළ** - උපශක තිශහ ලෙණේ

**අර්ථය** - උපාසක තිස්සගේ ලෙණ

මෙම ලෙන් ලිපිය සම්බන්ධයෙන් කරුණු රැසක් සංශෝධනයන්ට ලක්විය යුතුව තිබේ. එච්.සී.පී. බෙල් Report on the Kegalle District (1892) ග්‍රන්ථය මඟින් මෙම ලිපිය පිළිබඳ පළමුවරට වාර්තා කර ඇතත් එය වාර්තා කර ඇත්තේ හීනටිපනේ ස්ථාන නාමය සඳහන් දිගනහේන ලෙසය. එහි සටහන්ව ඇත්තේ " Upasaka Asaga lene" (උපසක අසග ළෙණෙ) ලෙසය. ඒ අනුව "උපාසක අසගේ ලෙන" ලෙස මෙය අරුත් ගන්වා ඇත (Bell 1892:142).

එහෙත් සෙනරත් පරණවිතානයන් සම්පාදිත Inscription of Ceyolon (1970) ග්‍රන්ථයේ අංක 806 ලෙස සඳහන් ලෙන් ලිපිය මෙය වන අතර, එතුමන් සඳහන් කර ඇත්තේ "උපසක අසහ ලෙන" ලෙසය. ඒ පිළිබඳ විශ්ලේෂණයේදී හඳුනාගත හැකි වන්නේ මෙම ලෙන් ලිපිය සඳහා පරණවිතාන ස්පර්ශ ලාංඡන ලබා නොගෙන පූර්ව වාර්තාව වන බෙල් වාර්තාවම පාදක කරගෙන නැවත සටහන් කර ගන්නට ඇති බවකි. ඊට හේතු වන්නේ Inscriptions of Ceylonහි මෙම ලිපියේ ස්පර්ශ ලාංඡන පිටපත් ඇතුළත් නොවීමයි. ඒ අනුව ඉන්පසු ශ්‍රී ලංකාවේ ලියැවුණු ශිලා ලේඛන ආශ්‍රිත ලිපි හා පර්යේෂණ, තොරතුරු වාර්තා බොහොමයක මෙය "හීනටිපනේ දිගනහේන ලෙසත්, උපසක අසහ ලෙන" ලෙසත් අඛණ්ඩව මේ වන තෙක් වාර්තා කිරීම ගැටලුවකි. 'සබරගමුවේ ශිලා ලිපි සංග්‍රහය ' ලෙස ලිපියක් සපයන පුරාවිද්‍යා චක්‍රවර්ති එල්ලාවල මේධානන්ද ස්වාමීන් වහන්සේ මෙම ලිපිය "හිනටිපනේ" ලෙන් ලිපිය ලෙස ගෙන " උපශක අශහ ලෙණෙ" ලෙස සඳහන් කිරීම (සබරගමුව වංශකථාව:2003) නිදසුන් වශයෙන් පෙන්වා දිය හැකිය. ඒ අනුව මෙම සියලු වාර්තා හා ලිපි, පූර්වතම වාර්තාව වන බෙල් වාර්තාව පරිශීලනයෙන් සම්පාදනය කරන්නට ඇති බව පැහැදිලි වේ. එහිදී කිසිවෙකු විසින් ස්පර්ශ ලාංඡන ලබා ගැනීමක් හෝ පියවි ඇසින් නිරීක්ෂණය කිරීමක් හෝ නොකොට කරන ලද වාර්තා කිරීම් තුළ මෙම දෝෂ සහිතව ලේඛනගත වීම සිදු වන්නට ඇති බව පැහැදිලි වේ. ඒ අනුව ශිලා ලේඛන පිළිබඳ ලංකාවේ ප්‍රකාශිත ප්‍රධානතම ලේඛන කිහිපයකම දෝෂ සහිතව සඳහන් වීම හේතුවෙන් මෙම ලිපිය තව දුරටත් සාවද්‍ය ලෙස ඉතිහාසගත වෙමින් පවති.

එබැවින් මෙම ලෙන් ලිපිය පිළිබඳ විශ්ලේෂණය කොට නිවැරදි අර්ථ නිරූපණයන් ඉදිරිපත් කිරීම ඉතිහාසගත තොරතුරු නිවැරදි කිරීමට මහත් පිටුවහලක් වනු ඇත. මෙය දකුණේ සිට වමට කියවන අයුරින් කොටා ඇති ලිපියකි.

1. මෙම ලෙන් ලිපියේ ස්ථාන නාමය ලෙස සටහන්ව ඇති හීනටිපොනේ යන්න නාවන්දල ගම දිගනහේන රුවන්පුර ලෙස සංශෝධනය විය යුතුය. ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පැරණි පත්තිරු පරීක්ෂා කොට බැලීමේදී මෙය මනාව සනාථ වනු ඇත.

2. තවද ලිපියේ සඳහන් පෙළ "උපශක තිශහ ලෙණේ" ලෙස නිවැරදි විය යුතුය. ඒ අනුව 'උපාසක තිස්සගේ ලෙණ'' ලෙස පරිවර්තනය විය යුතුව ඇත.

3. එලෙස නිවැරදි වීමේ දී පූර්ව වාර්තාවල සඳහන් ''අස'' යන්න ''තිස'' ලෙස අර්ථ ගැන්විය යුතු බව ද මැනවින් පැහැදිලි වේ. මූල බ්‍රාහ්මීය අක්ෂරවල "අ" දළ සැලසුම 1 අනුවත් "ති" දළ සැලසුම II අනුවත් විය යුතු වුවද මෙය දකුණේ සිට වමට ලියවුණු අක්ෂර සහිත ලිපියක් බැවින් දළ සැලසුම IIIට අනුව සඳහන් වන්නේ දකුණේ සිට වමට ලියන "ති" යන්න බව නිශ්චිතවම පැහැදිලි වනු ඇත. ඒ අනුව උපශක තිස්සගේ ලෙණ යන්න මෙම ලිපියේ නිවැරදිම කියවීම බව සඳහන් කළ යුතුය.

4. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශිලා ලේඛන ලියාපදිංචි කිරීමේ නාමාවලියේ අංක 2878, 1973.07.30 දිනැතිව A 1025 යටතේ ලේඛනගත කර ඇති මෙම ලිපිය දකුණේ සිට වමට ලියැවී ඇති අක්ෂර උඩු යටිකුරු කර ලියා තිබෙන අතර ලිපියේ පෙළ ''උපශක තිශහ ලෙණේ'' යනුවෙන් දක්වා ඇත. ඒ අනුව ඉහත බොහෝ වාර්තාවලින් කියැවෙන අර්ථ නිරූපණය නිවැරදි කොට ''උපශක තිශහ ලෙණේ'' යන්න මැනවින් තහවුරු වන බව පැහැදිලි වේ (ඡායාරූපය II) .

## 3. මාවෙල කන්ද විහාරයේ ලෙන් විහාරයට ඇතුළු වන දොරටුවෙහි කොරවක්ගලෙහි කොටා ඇති ලිපිය

මාවෙල කන්ද ගල්ලෙන් රජමහා විහාරයේ ප්‍රතිමා ගෘහයට ඇතුල් වන දොරටුවේ කොරවක්ගලෙහි උඩ කොටසේ කොටා ඇති අකුරු හතරකින් යුතු මෙම ලිපිය තරමක් ගැටලු සහගත හඳුනා ගැනීමක් බව කිව හැකිය. කෑගලු දිස්ත්‍රික්කයේ ශිලා ලේඛන පිළිබඳ මෑතකාලීනව ලියවුණු ශාස්ත්‍රීය ලිපි කිහිපයකම මෙම සෙල් ලිපිය පිළිබඳ සටහන් කර ඇති බව පුස්තකාල පරිශීලනයේදී පැහැදිලි විය. එම ලේඛන අනුව " බතිමශ" ලෙස සඳහන්ව ඇති මෙම ලිපියේ (ඡායාරූපය III/දළ සැලසුමVI) පෙළ අනුව "බැතිමතාගේ" යන්නත් ඇතැම් තැන්හි "බත්තිම" යන්නත් අරුත් ගැන්වෙන බවත් මෙය ක්‍රි.පූ. 2-1 වැනි සියවසට අයත් වන බවත් සඳහන් වේ (ශිලා ලේඛන ලියාපදිංචි ලේඛන/ අඹන්වල, කරුණාරත්න 2010:105). එහෙත් මෙම ලෙන් විහාරය හයවන පරාක්‍රමබාහු රජු සමයේ එනම්, ( ක්‍රි.ව. 1410 - 1462) ඉදි කළ විහාරයක් බවට සාහිත්‍ය මූලාශ්‍රය සාක්ෂි දරයි (Bell 1892:99). එසේම මෙම අක්ෂර හතර පිළිබඳ පැහැදිලිව සනාථ කළ

හැකි කරුණු කිහිපයක් තුළ මෙම ලිපිය මූල බ්‍රාහ්මීය අවධියට (ක්‍රි.පූ. 3 - ක්‍රි.ව. 1) අයත් අක්ෂර සහිත ලිපියක් නොවන බව සනාථ වනු ඇත. ඒ අනුව මෙම අක්ෂරවල මූලික ස්වරූපය අනුව "ති" අක්ෂරය ක්‍රි.පූ. 1 වන සියවස දෙවන භාගයට අයත් විය යුතුය (දළ සැලසුම IV). එසේ වුවහොත් මෙහි සඳහන් " ම" අක්ෂරය දළ සැලසුම V පරිදි විය යුතුව ඇත. ක්‍රි.පූ. 3 - 1 කාලයේ ලියවුණු මූල බ්‍රාහ්මීය අක්ෂරවලට අනුව අක්ෂර පරිණාමය ඉතාම පැහැදිලි විකාශනයක් පවතින බැවින් මෙම අක්ෂර හතර එකම කාලයක නියෝජනයක්ද යන්න පිළිබඳ විවාදයට ලක් කළ යුතුය.

එසේම ලෙන් විහාරයේ තවත් ස්ථාන කිහිපයක මෙයට සමාන අක්ෂර සහිත නූතන සිංහල අක්ෂර කොටන ලද ගල් පුවරුවක්ද හමුවේ. එහි සඳහන් අක්ෂර අධ්‍යයනයේදී පැහැදිලි වන්නේ මෙම අක්ෂර නූතන සිංහල අක්ෂර හා පැරණි මූල බ්‍රාහ්මීය අක්ෂර සමඟ මිශ්‍රව මූල බ්‍රාහ්මීය අක්ෂර පිළිබඳ යම් අවබෝධයක් තිබූ විහාරවාසී භික්ෂූන් වහන්සේ කෙනෙකු හෝ වෙන යම් ගම්වැසියකු විසින් පසුකාලීනව කොටන ලද අක්ෂර බවයි. ඒ අනුව "බතිමශ" යන අක්ෂර හතර එකම කාලයට අයත් නොවන බව තහවුරු වන බැවින් හා පසුකාලීනව සිදු කරන ලද මැදිහත්වීම් බවට පර්යේෂණ ක්ෂේත්‍රය තුළම පැහැදිලි සාධක පවතින බැවින් මෙම සෙල් ලිපිය මූල බ්‍රාහ්මීය අවධියට අයත් සෙල් ලිපියක් නොවන බව පැහැදිලි වනු ඇත. තව ද මෙම කරුණ වඩාත් තහවුරු කරන කරුණක් වන්නේ මීට ආසන්නයේ මූල බ්‍රහ්මීය අවධියට අයත් අංගේ ගල් ලෙන් සංකීර්ණයේ ඇති ලිපියෙහි, 'ති' යන්න නිවැරදිව සටහන් වීමයි. එකම කාලයක නියෝජනයක් නම් 'ති' යන්න දළ සැලසුම II පරිදි විය යුතුය.

එසේ වුව ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශිලා ලිපි සංග්‍රහයේ බ්‍රාහ්මී ලිපියක් ලෙස ලේඛනගත කර ඇති මෙම ලිපියෙහි පෙළ "මතිබශ" ලෙස සඳහන් කොට ඇත. අදාළ ලේඛනගත කිරීම තුළ හා මෙම විශ්ලේෂණයට අනුව බොහෝ දුරට අභියෝගයට ලක් විය යුතු ලිපියක් ලෙස මෙම ලිපිය හඳුනාගත හැකිය.

### 4. ප්‍රධාන විහාර ලෙනෙහි කටාරමට පහළින් මූල බ්‍රාහ්මී අවධියට අයත් ශිලා ලේඛනයකි

(ඡායාරූපය IV).

පසුකාලීනව (බොහෝ දුරට) මහනුවර සමයේදී විහාරය සඳහා ඉදි කළ ඉදිරිපස බිත්තියට කොටසක් වැසී ඇති බැවින් සම්පූර්ණ ලිපිය පැහැදිලිව කියවීමට අපහසුව පවතී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මෙම ලිපිය ලේඛනගත කර නොමැති අතර, 2010 වසරේදී එය මුල්වරට අනාවරණය කර ගෙන ඇත (අඹන්වල කරුණාරත්න 2010:104). එම පර්යේෂණ ලිපියට අනුව මෙම ලිපිය අංකිත තාක්ෂණය උපකාරයෙන් ප්‍රතිනිර්මාණය කර ඇත (ඡායාරූපය V). එම ඵලකය අනුව ලිපිය පහත පරිදි කියවා ඇත. **(පරු මක (කු) යන ව ගපති ශම කුලශ (ලෙණේ)** ප්‍රමුඛ කුයන ද ගෘහපති ශම පවුලේ ද ලෙන ලෙස අර්ථ ගන්වා ඇත.

## 5. විහාර පරිශ්‍රයේ තැනින් තැන පිහිටි ගල් බැම්/ගල් පුවරු/ලෙන් පියස්සෙහි ආදි තැනින් තැන කොටා ඇති විවිධ අක්ෂර සටහන් හා සංකේත හෝ රූප

මාවෙල කන්ද ලෙන් විහාර පරිශ්‍රයේ තැනින් තැන නිරීක්ෂණයට ලක්වන අක්‍රමවත් ලෙස ගල්වල කොටන ලද සටහන් රැසක් හඳුනාගත හැකිය. මෙම සටහන් මෑත ඉතිහාසය තුළ මානව මැදිහත්වීමකින් අක්‍රමවත් ලෙස සිදු කරන ලද ඒවා ලෙස ඉතා හොඳින් නිරීක්ෂණය වේ.

I. විහාරස්ථානයේ ප්‍රධාන විහාර ලෙන පසුකර සංඝාවාසය දෙසට යන විට බෝධිය අසල බිම ඇති සෘජුකෝණාස්‍රාකාර ගල් ලැල්ලක අක්ෂර සටහන් රැසක් දක්නට ලැබේ. ඉංග්‍රීසි කැපිටල් අකුරින් “SENARATH” යන්නත් සිංහල අක්ෂරවලින් “බංදුල” යන්නත් අපැහැදිලිව කොටන ලද තවත් අක්ෂර සටහන් කිහිපයක්ද එහි දැකගත හැකිය (දළ සැලසුම VII/ඡායාරූපය VI). එම සටහන් අතර බ්‍රාහ්මී අක්ෂරවලට අදාළ “බ” හා “ම” අක්ෂරවලට ආසන්න හැඩ ඇති අක්ෂර සටහන් කිහිපයක්ද පවතී.

II. බෝධිය සහිත මළුවට බසින පියගැට පෙළ පැත්තක පිහිටි ගලක තවත් ඉංගිසි අකුරින් DAH (දළ සැලසුම VIII/ ඡායාරූපය VII) ලෙස සටහනකි.

III. සංඝාවාසයට පිවිසෙන පඩිපෙළ පහළ ගල් තලාවේ සිංහල “මා” අක්ෂර සටහනකි (දළ සැලසුම IX/ඡායාරූපය VIII)

IV. එම පඩිපෙළ එක් ගල් ලැල්ලක කළ ගෙඩියක රූපයකි (ඡායාරූපය IX)

V. එම පියගැට ඉහළම ගල් ලැල්ල සඳකඩ පහනක් සැකසීමට ගත් උත්සාහයක ප්‍රාථමික අදියරක් බවට සාධක පවතී (ඡායාරූපය X).

VI. සංඝාවාසය පිහිටි ගල් ලෙනෙහි කටාරමට ඉහළින් මාවෙල ලෙස සිංහල අක්ෂර සටහනකි (දළ සැලසුම X/ඡායාරූපය XI). සංඝාවාසය ඉදිරිපිට බිමෙහි කැසිකිළි ගලක් නිර්මාණයට සකස් කළ මූලික ආකෘතියක් ලෙස හඳුනාගත හැකි ගල් ලැල්ලකි (ඡායාරූපය XII).

මෙම අක්ෂර සටහන්, කැටයම් හා සංකේත පිළිබඳ විශේෂයෙන් පැහැදිලි කිරීම් අවශ්‍ය නොවේ. මෙය මෑත ඉතිහාසය තුළ යම් මානව මැදිහත්වීමක ප්‍රතිඵලයක් බව ඉතා හොඳින් පැහැදිලි වනු ඇත. එහෙත් මෙම සලකුණු හා අක්ෂර සටහන් පිළිබඳ සඳහන් කිරීම මෙම පර්යේෂණයේ අනිවාර්ය වැදගත් අවශ්‍යතාවක් වනුයේ අංක 3 හා 6 යටතේ විස්තර කරන ලිපි බොහෝ පර්යේෂකයන් බ්‍රාහ්මී අක්ෂර ලෙස හඳුනා ගැනීමත්, එම හඳුනා ගැනීම් විශ්ලේෂණාත්මකව අභියෝගයට ලක් කිරීම සඳහා අංක 3 හා ‘බ’ අක්ෂරය සඳහන් අංක 6 ලිපි ප්‍රබල තහවුරුවක් ලබාදීම නිසාත් ය.

### 6. මාවෙල කන්ද ලෙන් විහාර භූමියේ කැලෑබද කුඩා ගල් ලෙනක හතරැස් කොටුවක සංකේතයක් නැතිනම් "බ" අක්ෂර සටහනක් දැකිය හැකිය (ඡායාරූපය XIII).

මෙය ද බ්‍රාහ්මී අක්ෂර අනුව **"බ"** අක්ෂරය ලෙස ඇතැම් පුරාවිද්‍යාඥයන් හඳුනා ගෙන ඇති බව ඒ සම්බන්ධ පර්යේෂණ ලිපි හා වාර්තා අනුව පැහැදිලි වේ (අඹන්වල, කරුණාරත්න 2010:105). එහෙත් මෙම සටහනද ඉහත අංක 5 යටතේ විස්තර කළ පරිදි එවැනි අවිධිමත් ක්‍රියාකාරකම් ඔස්සේ සිදු වූ බව පැහැදිලිව තහවුරු වනු ඇත.

### 7. විහාරයට අයත් භූමියේ කුඩා ගල් ලෙනක ඇති ලෙන් ලිපිය

විහාරභූමියේ ආසන්නයේ ඇති තවත් ලෙනක පරුමක -ම-හ(ඩ)කව ලෙස සඳහන් බ්‍රාහ්මීය අක්ෂර සහිත ලිපියක් හමුවේ. එයට අනුව ප්‍රමුඛ යන්න පමණක් පැහැදිලිව අරුත් ගැන්විය හැකි අතර, සෙසු අක්ෂර පැහැදිලිව නොපෙනේ. එයද අංකිත තාක්ෂණය යටතේ ගනු ලැබූ ඡායාරූපයක පිටපතක් මෙහි දැක්වේ (අඹන්වල, කරුණාරත්න 2010:104) (ඡායාරූපය XIV).

### සමාලෝචනය

ගන්නෑ පත්තුවේ ශිලා ලේඛන පිළිබඳ මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය තුළින් පැහැදිලිවම හඳුනාගත හැකි බ්‍රාහ්මීය ශිලා ලේඛන හතරක් පිළිබඳව තහවුරු වේ. නාවන්දල අංගේ ගල්ලෙන් සංකීර්ණයේ ලෙන් ලිපිය, රුවන්පුර කොටසකට අයත් දිගන හේන පිහිටි ගල් ලෙන් ලිපිය, මාවෙල කන්ද ගල් ලෙන් විහාරයෙහි ප්‍රධාන ලෙන් විහාරයෙහි ලිපිය හා විහාර භූමිය ආසන්නයේ ඇති කුඩා ලෙනක පිහිටි ලෙන් ලිපිය යන ලිපි හතර වේ. ඒ අනුව අංක 3 හා 6 යටතේ සඳහන් කළ ලිපි ස්ථිරවම මූල බ්‍රාහ්මීය අවධියට අයත් අක්ෂර නොවන බව තහවුරු කරමි.

මෙම ශිලා ලේඛන පිළිබඳ විමර්ශනයේදී ගහපතිවරුන්, උපාසකවරුන්, පරුමකවරුන් ප්‍රධානව විසූ ප්‍රදේශයක් ලෙස ගන්නෑ පත්තුව හඳුනාගත හැකිය. ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තව සිටි මෙම ගම් ප්‍රධානීන් මෙම පර්යේෂණ ප්‍රදේශය තුළ වැදගත් හඳුනා ගැනීම් ලෙස පෙන්වා දිය හැකිය. මූල ඓතිහාසික අවධියෙන් පසු උඩරට රාජධානි සමඟ ඉතා සමීප සබඳතාවක් පැවති ප්‍රදේශයක් ලෙසද ගන්නෑපත්තුව විශේෂ වැදගත්කමක් උසුලන බව මෙමගින් තහවුරු වනු ඇත.

ශ්‍රී ලංකාවේ මූල බ්‍රාහ්මීය අවධියට අයත් ශිලා ලේඛන අධ්‍යයනයේදී ගමිකවරුන්, පරුමකවරුන්, ගහපතීන් මෙන්ම බතවරුන්ද හමුවේ. පුරාතන ශ්‍රී ලංකාවේ සමාජ සංස්ථාවේ යම් යම් සමාජ ස්තර නියෝජනය කරන මොවුහු බොහෝ දුරට ගම් ප්‍රධානී නැතිනම් ප්‍රාදේශීයව වූ යම් ප්‍රභූත්වයක් ලැබූ අය වූහ. ඒ අතර, ගහපතීන් සමාජයේ කුඩාම සමාජ ඒකකය වූ පවුල හෙවත් කුටුම්භයක මූලිකයා වූ (ගෘහ මූලිකයා) ගෘහපති හැඳින්වීමට යොදා ගත් බව පැහැදිලි වේ (ධීරානන්ද හිමි 2004:195). ගහපතීන්හට සමාජයේ ධනවත් හා

උසස් තත්වයක් මෙන්ම මූල්‍ය පාලනය හා සමාජ කටයුතුවල වගකීම පැවරී තිබූ බව පෙනේ. එසේම වෛශ්‍ය කුලයට අයත් ඉඩම් හිමි, ධනවත් වාණිජ කර්මාන්වල නිරතවූවන්ගෙන් ගහපතීන් පැවත එන බවත් ඉන්දියාවේ මෙන් නොව ශ්‍රී ලංකාවේ ගහපතිවරුන් වඩා පුළුල් පදනමකින් යුතු වූ බවත් ඔවුන් විවිධ වෘත්තීන්හි නිරතවූවන් බවත් සඳහන් වේ (බණ්ඩාර 2011:23). ශ්‍රී ලංකාවේ මූල බ්‍රාහ්මීය ලෙන් ලිපි රාශියක් ගහපතීන් පිළිබඳව හමුවෙන අතර, ඔවුන් උතුරුමැද හා වයඹ පළාත් ආශ්‍රිතව වැඩි වශයෙන් ව්‍යාප්තියක් පෙන්නුම් කරයි (බණ්ඩාර 2011:24). බස්නාහිර පළාතින් ගෘහපතීන් පිළිබඳ අභිලේඛන සාධක හමු නොවෙතත් කෑගල්ල දිස්ත්‍රික්කයේ ලෙන් ලිපි කිහිපයක ගහපතීන් පිළිබඳ සඳහන් වේ. නැකතිගේහේන රංවල ලෙන් ලිපියක - ගපති තිහලිය ලෙසත්, පදවිගම්පළ - ගපති උපශක ලෙසත් හමුවේ (මෙධානන්ද හිමි 2003:143). ඒ අනුව නාවන්දල අංගේ ගල් ලෙන් ලිපිය හා ප්‍රධාන විහාර ලෙනෙ ලිපි මගින් හඳුනා ගන්නා ගහපති 'ශමණීසහ "ගපති  ශම" (අක්ෂර අඩුවෙන් කියවා ඇති), දිගනහේන ලිපිය මගින් හඳුනා ගන්නා "උපසක තිස්ස" සහ ප්‍රධාන විහාර ලෙනේ ලිපිය හා අසල ඇති කුඩා ලෙනෙහි ලිපිය මගින් හඳුනා ගන්නා "පරුමක" යන අයවළුන් සමකාලීන සමාජයේ උසස් සමාජ ස්තරයක් නියෝජනය කළ ප්‍රාදේශීය ප්‍රභූවරයන් ලෙස විසූ අයවළුන් බව පැහැදිලි වන අතර, ඔවුන් මෙම ලෙන් කරවා පූජා කරන්නට ඇති බව සමකාලීන මූලබ්‍රාහ්මීය ශිලා ලේඛන විශ්ලේෂණය අනුව නිගමනය කළ හැකිය. එහෙත් සමකාලීන ශිලා ලේඛන විමර්ශනයේදී පරුමක යන්න පාරම්පරිකව ලැබූ අභිධානයක් බවත් ඇතැම්විට පරුමකයකුගේ භාර්යාවද පරුමක ලෙස හඳුන්වා ඇති බවත් පැහැදිලි වේ. රිටිගල ලිපියක පරුමක අනුධිය යන සඳහන මගින් බල්ලාට නාග සහ ඔහුගේ බාල සොහොයුරු වට්ටගාමිණිගෙන් පසුව රාජ්‍යයට පැමිණි අනුලා දේවිය මෙම පරුමක අනුධිය යන්නෙන් අර්ථ නිරූපණය වන බව පැහැදිලි වේ. පාලියේ හා සිංහලයේ 'ඩ' යන්න 'ළ' බවට පත්වීම පොදු ලක්ෂණයක් වන හෙයින් අනුලා යන්න තහවුරු වන බව සඳහන් වේ (එල්ලාවල, 1968:36). එබැවින් මෙම ලිපි දෙකේ සඳහන් පරුමකයන් ප්‍රාදේශීය ප්‍රභූ නායකයන් බව ස්ථිරවම තහවුරු කළ හැකි වුවද ප්‍රභූවර්යෙකු හෝ ප්‍රාදේශීය ප්‍රධානියෙකුද නැතහොත් ඔවුන්ගේ භාර්යාවන්ද වෙනත් ප්‍රාදේශීය පාලිකාවන්ද යන්න නිශ්චිත නොවේ.  එසේම නාවන්දල අංගේ ලෙන් ලිපියේ සඳහන් "ගහපති ශමණ" හා මාවෙල ප්‍රධාන විහාර ලෙනේ ලිපියේ සඳහන් "ගපති ශම" බොහෝ දුරට එක් නියෝජනයක් විය හැකිය. එක් ප්‍රාදේශීය කලාපයක් තුළ එකම කාල වකවානුවක කරවා ඇති මෙම ලෙන් දෙක තුළින් ඒ බව තහවුරු වේ.

බොහෝ පර්යේෂණ ලිපි, පත්‍රිකා හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හඳුනා ගැනීම් අනුව බ්‍රහ්මීය අක්ෂර සහිත ලිපියක් ලෙස මේ වන විට ලේඛනගත කර ඇති විහාර ලෙනට ප්‍රවේශ වන පියගැටපෙළහි කොරවක් ගලෙහි ඇති ලිපිය පැහැදිලිව මුල් බ්‍රාහ්මීය අවධියට අයත්, ශිලා ලේඛනයක් නොවන බව තහවුරු වේ. තවද ඊට පැහැදිලි සාක්ෂි පවතින බැවින් එම ලිපිය පසුකාලීන මානව මැදිහත්වීම් මත කොටන ලද අක්ෂර සටහනක් බව පැහැදිලි වනු ඇත. එසේම අංක 5 යටතේ විස්තර කළ අකුමවත් සටහන් හා සලකුණු හා නිර්මාණ කොටස් ඊට වඩාත් සාක්ෂි ලෙස පෙන්වා දිය හැකිය. ඒ අනුව මෙතෙක් පුරාවිද්‍යා පර්යේෂකයන්ගේ අධ්‍යයනයට ලක් වුණු මූලබ්‍රාහ්මීය අක්ෂර සහිත ලිපියක් ලෙස සලකනු ලැබූ මෙම ශිලා ලේඛනය ක්‍රි.පූ. 3 - 1 කාලයට අයත් ශිලා ලේඛනයක් නොවන බවට නිගමනය කළ හැකිය.

ගන්නෑ පත්තුව, උඩරට රාජ්‍යයත් සමග පැවති සබඳතා මත ඓතිහාසිකවත් පවතින සාධක මත පුරාවිද්‍යාත්මකවත් පොහොසත් සමාජ ස්තරයක් නියෝජනය කළ ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය. එසේම වර්ග කිලෝමීටර් දෙකක් වැනි කුඩා ප්‍රදේශයක් තුළ පරුමක, ගහපති, උපසක යන ප්‍රාදේශීය ප්‍රභූන් කිහිප දෙනෙකුගේ නියෝජනයක් පැවතීමට මෙම ප්‍රදේශය උසස් මට්ටමක සමාජ තත්ත්වයක් දැරූවන්ගේ ව්‍යාප්තියක් පවතින්නට ඇතැයි පැහැදිලිව නිගමනය කළ හැකිය. මේ කාලපරිච්ඡේදයේ සඳහන් වන පරුමකයන්ගෙන් බහුතරයක් වෛශ්‍ය කුලයට අයත් ධනවත් පුද්ගලයන් බව හඳුනාගත හැකිය. ඒ අනුව ගන්නෑපත්තුවේ විසූවන්ද යම් පිළිගත් කුලවත් හා ධනවතුන් ලෙස සිටි බව නිගමනය කළ හැකිය. මෙතෙක් සිදු කරන ලද පර්යේෂණ හා වාර්තා කිරීම් අනුව ශිලා ලේඛනයන්හි පවතින ගැටලු නිරවුල් කර ගැනීමටත් වැරදි ලෙස කර ඇති අර්ථ නිරූපණයන් නිවැරදි කර ගැනීමටත්, සාවද්‍ය හඳුනාගැනීම් ප්‍රතික්ෂේප කිරීමටත් මෙම පර්යේෂණය තුළින් හැකියාව ලැබුණි. ඒ අනුව මෙම පර්යේෂණාත්මක ලිපිය තවදුරටත් සාවද්‍ය කරුණු ඉතිහාසගතවීම නිවැරදි කරගැනීමට අනාගත පර්යේෂකයන්ට වඩාත් ඉවහල් වනු ඇත.

### මූලාශ්‍රය


අමරවංශ හිමි, කොත්මලේ. (1969). **ලක්දිව සෙල්ලිපි**. කොළඹ : ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

අඹන්වල, චන්දිම බණ්ඩාර සහ කරුණාරත්න, මහින්ද. (2010). ‘මලය දේශයට තවත් පිවිසුමක්- කඩුගන්නාව පහළ මාවෙල රජමහා විහාරය පිළිබඳ සිදුකෙරුණු නව පුරාවිද්‍යාත්මක අනාවරණ කිරීම් හා මලය දේශය.’**ජාතික පුරාවිද්‍යා සමුළුව**.කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

එල්ලාවල, එච්. (1968). **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය**. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ධීරානන්ද හිමි, හඟුරන්කෙත. (2004). **රාජ්‍යත්වය, රාජ්‍ය සහ ආගම**. වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

බණ්ඩාර, නිලන්ති. (2001).‘ශ්‍රී ලංකාවේ මුල්කාලීන දේශපාලන ධූරවලිය (මූල බ්‍රාහ්මීය සෙල්ලිපි ඇසුරින්).’**ආර්ය විභූෂණ. මහාචාර්ය අභය ආර්යසිංහ අනුස්මරණ ග්‍රන්ථය**, මාලිංග අමරසිංහ (සංස්:) කොළඹ 10:ඇස් ගොඩගේ සහ සහෝදරයෝ .

මේධානන්ද හිමි, එල්ලාවල. (2003).‘සබරගමුවේ ශිලා ලිපි සංග්‍රහය’.**සබරගමුව වංශ කතාව- වෙළුම 1**. පණ්ඩුල ඇඳගම (සංස්:) සබරගමුව පළාත් සභාව.

Bell, H.C. P. (1892). ***Report on the Kegalle District***.Ceylon: Government Printer.

Paranavithana, S. (1970***). Inscriptions of Ceylon, Vol 1***. Colombo : Department of Archaeology.


### අතිරේක මූලාශ්‍රය


1857.01.29 දිනැති මධ්‍යම දිසාවේ මහනුවර මගුල් මඩුවේ දිස්ත්‍රික්ක උසාවියට රපෝර්තු පත්‍රය - මහනුවර ලේඛනාගාරය (පෞද්ගලික ලේඛන කාණ්ඩය)

2019.10.27 ඉරිදා මව්රට පත්‍රය (මහාවංශ අතිරේකය) එම්.පී.එම්.ඩබ්.හේවාධිපති.

ශිලා ලේඛන ලියාපදිංචි ලේඛන බාණ්ඩ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)





**ඡායාරූපය I**




ඡායාරූපය **II**




ඡායාරූපය **III**



ඡායාරූපය **IV,V**




**“SENARATH”**ලෙස යොදා ඇති අක්ෂර




බන්දුල ලෙස යොදා ඇති අක්ෂර

ඡායාරූපය **VI**




ඡායාරූපය **VII**
**"DAH"** ලෙස යොදා ඇති අක්ෂරසටහන



ඡායාරූපය **VIII**



ඡායාරූපය **IX** –කළගෙඩියක රූපය



ඡායාරූපය **X**




ඡායාරූපය **XI**



ඡායාරූපය **XII**



ඡායාරූපය **XIII**



ඡායාරූපය **XIV**





දළ සැලසුම VI VIX




දළ සැලසුම VII




දළ සැලසුම VIII



දළ සැලසුම IX



දළ සැලසුම X

**ඡායාරූපය XV**

# සංස්කෘතික උරුම කළමනාකරණයේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටලු: 1940 අංක 09 දරන පුරාවස්තු ආඥාපනත ප්‍රමුඛ ව්‍යවස්ථාපිත නීති ඇසුරින්

**එස්. ආර්. එල්. රෝසා**

## හැඳින්වීම

ශ්‍රී ලංකාව  වර්ග කිලෝමීටර 65610ක භූමි ප්‍රමාණයකින් යුත් ඉන්දියානු සාගරයේ පිහිටි කුඩා දිවයිනකි. මෙරට මානව ජනාවාසකරණයේ ආරම්භයේ සිට වර්තමානය දක්වා මානව සමාජයේ ක්‍රියාකාරීත්වය දෙස අවධානය යොමු කිරීමේදී සංස්කෘතිකමය වශයෙන් වැදගත්කමක් දරන්නා වූ උරුමයන් රැසක් හඳුනාගත හැකි අතර කාලයත් සමග අපගේ මුතුන්මිත්තන් ගොඩ නැගූ අතීත සමාජය, ඔවුන්ගේ ඉදි කිරීම්, විවිධ නිර්මාණ පුරාවිද්‍යාත්මක උරුමයන් බවට පත් වී ඇත. රාජ්‍යයක සමාජ සංස්ථාව තුළ වැරදි යැයි නීතිය මගින් දක්වා ඇති මානව ක්‍රියාකාරකම් පාලනය කිරීම නීතිය මගින් සිදු කරන අතර ඒ සම්බන්ධයෙන් කාලීන අවශ්‍යතා මත ව්‍යවස්ථාදායකය විසින් ව්‍යවස්ථා සම්පාදනය කරනු ලැබේ. මෙරට සංස්කෘතික උරුමයන්ගේ සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඍජු හා වක්‍ර වශයෙන් දායක කර ගත හැකි ව්‍යවස්ථා රැසක් මෙරට නීති පද්ධතිය තුළ ක්‍රියාත්මක වේ. එම නීතීන් සංස්කෘතික උරුම කළමනාකරණයේදී භාවිත කිරීමේදී ඇතිවන ගැටලු පිළිබඳ මෙහිදී අධ්‍යයනය කරනු ලබයි. ඒ ඔස්සේ සංස්කෘතික උරුම කළමනාකරණයේදී නීතියේ දායකත්වය වඩාත් ඵලදායීව යෙදීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණය තුළින් සිදු කරනු ලබයි.

## පර්යේෂණ ගැටලුව හා අරමුණ

සංස්කෘතික උරුම කළමනාකරණය තුළ උරුමයන්ගේ ආරක්ෂාව සඳහා නීතිය ක්‍රියාත්මක වීමේදී ව්‍යවස්ථා ආශ්‍රිතව ගැටලු පවතීද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව වන අතර ඒ තුළින් සංස්කෘතික උරුම ආරක්ෂණ ව්‍යවස්ථා තුළ පවතින ගැටලු පරස්පරතා නීති සංශෝධනය අන්තර්ජාතික නීති තත්වයන් සමඟ ගැළපීම අන්තර්ජාතික මාර්ගෝපදේශයන් අනුගමනය කිරීම පිළිබඳව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම කළමනාකරණයේදී යොදා ගනු ලබන ව්‍යවස්ථා පිළිබඳව අධ්‍යයනය කරමින් සංස්කෘතික උරුම කළමනාකරණයේදී අත්දැකීමට සිදුවන ගැටලු පිළිබඳ අධ්‍යයනය කරන මෙම පර්යේෂණයේදී ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය භාවිත කරන ලදී. පුරාවස්තු ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මෙරට බලපැවැත්වෙන ප්‍රධානතම ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනය වශයෙන් 1940 අංක 09 දරන පුරාවස්තු ආඥාපනත හඳුනා ගත හැකි අතර එම ව්‍යවස්ථාව මූලික කර ගනිමින් සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ඍජු හා වක්‍ර වශයෙන් දායකත්වය සපයන 1980 අංක 57 දරන මධ්‍යම

සංස්කෘතික අරමුදල පනත, 1988 අංක 73 දරන සංස්කෘතික දේපළ පනත, 1990 අංක 16 දරන ජාතික වැදගත්කමක් දරන පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධ පනත, 1889 දණ්ඩ නීති සංග්‍රහය, 1990 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත, 1942 අංක අංක 31 දරන ජාතික කෞතුකාගාර ආඥා පනත සහ 2005 අංක 05 සංචාරක පනත ආදි ව්‍යවස්ථා ගණනාවක් හඳුනා ගත හැකි අතර එම ව්‍යවස්ථා අධ්‍යයනය තුළින් සංස්කෘතික උරුම ආරක්ෂණයේදී උද්ගත වන ගැටලු හඳුනා ගැනීම සිදුකරනු ලැබේ.

**සාකච්ඡාව**

රටක උත්තරීතර නීතිය ලෙස සැලකෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. එය රාජ්‍යයේ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ, යන ආයතනයන්හි සැකැස්ම ඇතුළුව එම රාජ්‍යයේ සුවිශේෂී අනන්‍යතාවන්ට ප්‍රමුඛස්ථානය ලබා දෙමින් මූලික නීතිය දක්වයි. මෙරට සංස්කෘතික උරුමයන්ගේ පිළිබඳ නිසි අවධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලබාදී තිබේද යන්න විමර්ශනය කිරීමේදී "එකලාව හෝ අන් අය සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහස" (14(ඊ),ආ.ක්‍ර.ව්‍ය. ශ්‍රී ලංකාව; 1978). ආදි වශයෙන් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ නෛතික විධානයක් දක්වයි. මෙරට සුවිශේෂී අනන්‍යතාවක් වන සංස්කෘතික උරුමයන් සම්බන්ධයෙනු "සංස්කෘතිය භුක්ති විඳීම" යන වාක්‍ය ඛණ්ඩයට පමණක් සීමා වී ඇත. අසල්වැසි ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඉන්දීය සංස්කෘතියේ වටිනා උරුමයන් ආරක්ෂා කිරීම රාජ්‍යයේ මූලික යුතුකමක් වශයෙන් දක්වා ඇත (51A (f), The Constitution; India). එය ඉන්දියානු රජය විසින් එරට උරුමයන්ට ලබාදී තිබෙන ඉහළ පිළිගැනීමක් බව පෙන්වා දිය හැකිය. එමෙන්ම නේපාලයේ සංස්කෘතිය සහ උරුමයන් ආරක්ෂා කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අයිතිවාසිකම (32 (3), The Constitution, Nepal) එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පිළිගෙන ඇත.

මෙරට දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් හඳුන්වා දුන් අටවන උපලේඛනයේ I ලැයිස්තුව වන පළාත් සභා ලැයිස්තුව යටතේ ජාතික වැදගත්කමකින් යුතු යැයි පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මඟින් හෝ නීතියක් යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද ඒවා හැර පෞරාණික සහ ඓතිහාසික ස්මාරක හා වාර්තා නව වන උපලේඛනයේ III ලැයිස්තුව වන සමගාමී ලැයිස්තුව යටතේ ජාතික වැදගත්කමකින් යුක්ත බවට පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මඟින් හෝ නීතියක් යටතේ ප්‍රකාශයට පත්කරනු නොලැබ ඇති පුරාවිද්‍යාත්මක භූමි සහ නටබුන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අනුමැතීන්ට යටත්ව නීති සෑදීමේ බලය පළාත් සභා වෙත පවරා ඇත. එය එක්තරා ආකාරයකට ඒ ඒ පළාත් ආශ්‍රිත උරුමයන් වඩාත් හොඳින් ආරක්ෂා කිරීමට අවධානය යොමු කිරීමේ සාධනීය තත්වයක් මෙන්ම අනෙත් අතට මෙරට පළාත් පාලන නියෝජිතයන්ගේ අදාළ විෂයීය දැනුම හා එහිදී කෙතරම් දුරට අධ්‍යයන සිදු කොට ප්‍රඥප්තීන් සකස් කරනවාද යන්න ගැටලු සහගත වන අතර එය උරුම සඳහා අහිතකර ලෙස බලපෑ හැකිය. යම් පුද්ගලයෙක්ට මෙම සංස්කෘතික උරුමයන් අජීවී වස්තූන් ලෙස පෙනී ගියද එය සත්‍ය ලෙසම අතීත සමාජය වර්තමානය තුළ ජීවමාන කරවන ප්‍රබලතම සාධකයක් ලෙස උරුමයන්

පෙන්වාදිය හැකිය. එබැවින් සංස්කෘතික උරුම කළමනාකරණය සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී එය ඉතාමත් ප්‍රවේශම් සහගතව සහ සංවේදීව සිදු කළ යුතු කාර්යභාරයක් වන්නේ ඉතා කුඩා අතපසු වීමකින් හෝ වැරදි තීරණයක් නිසා උරුමයන්ට හානියක් සිදු වුවහොත් එය යථා තත්වයට පත් කිරීම සිදු කළ නොහැකි බැවිනි. 2020 වර්ෂයේදී කුරුණෑගල බුවනෙකබාහු රාජ සභා මණ්ඩපය කඩා ඉවත් කිරීම ආශ්‍රිත සිදු වීම මේ සඳහා පැහැදිලි නිදසුනක් සපයන අතර එහිදී නීතිය හා තීරණ ගැනීමේ බලය සම්බන්ධයෙන් වගකීම කුමන පාර්ශ්වයන් වෙත යොමු වුවද ඉන් සිදු වූ හානිය නැවත යථාතත්වයට පත් කළ නොහැකිය.

1940 අංක 9 පුරාවස්තු ආඥා පනතට හඳුන්වා දුන් 1998 අංක 24 සංශෝධන පනතේ දීර්ඝ නාමය අනුව "ශ්‍රී ලංකාවේ පුරාවස්තු සහ ශ්‍රී ලංකාව තුළ ඇති ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ස්ථාන සහ ගොඩනැගිලි වඩා හොඳින් සංරක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ ආඥා පනතක්" වශයෙන් ක්‍රියාත්මක වන 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනත පුරාවස්තු ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් මෙරට පවතින ප්‍රධානතම ව්‍යවස්ථාව වේ. මෙම මව් පනතට 1955, 1998 සහ 2005 යන වර්ෂයන්හිදී සංශෝධන සිදු කර ඇති අතර 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනත පුරාවස්තුවල අයිතිය, පුරාවස්තු සොයා ගැනීම කැණීම්, පැරණි ස්මාරක, වෙන් කළ පුරාවිද්‍යා ප්‍රදේශ, පුරාවස්තු අපනයනය, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල හා කාර්යයන්, වෙනත් කරුණු, සහ අර්ථනිරූපණ යන කොටස් අටක් යටතේ වගන්ති 49කින් සමන්විත වේ. නීතිය සම්බන්ධයෙන් යථාදෘෂ්ටවාදී නීති ගුරුකුලයේ ප්‍රමුඛයෙකු වන ජෝන් ඔස්ටින් විසින් ප්‍රකාශ කරනු ලබන්නේ මිනිසුන් නීතියට ගරු කරන්නේ නීතියට ඇති බිය නිසා බවයි. එනම් නීතිය මගින් දණ්ඩන නියමයන් පැනවීම කෙරෙහි මෙහිදී විශේෂ අවධානයක් යොමු කරනු ලබයි. මෙම තත්වය පුරාවස්තු ආඥා පනත තුළ විමර්ශනය කර බැලීමේදී පුරාවස්තු සොරකම් කිරීමට අදාළ වැරදි (15 (අ) වගන්තිය, පුරාවස්තු සංශෝධන පනත; 1998) පුරාවස්තු විනාශ කිරීමට අදාළ වැරදි (15 (ආ) වගන්තිය, පුරාවස්තු සංශෝධන පනත; 1998) සම්බන්ධව දණ්ඩනය වශයෙන් දඩ මුදල් වැඩි කිරීම 1998 සහ 2005 සංශෝධන මගින් සිදු කිරීම යම්තාක් දුරකට උරුම විනාශ කිරීම අවම කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ගයක් බව පෙන්වා දිය හැකි වුවද එම නිසාම පමණක් මිනිසුන් උරුම විනාශ කිරීම සඳහා නොපෙලඹේ යැයි පැවසිය නොහැකිය.

| | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2019 ජූනි දක්වා | 2018 | 2017 | 2016 |
| පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කරමින් සිදු කරන ලද වැරදි | 163 | 332 | 290 | 203 |
| පුරාවස්තු විනාශ කිරීමට අදාළව සැකකරුවන් සහ වැරදිකරුවන් සම්බන්ධයෙන් නඩු පැවරීම් | 464 | 824 | 631 | 565 |

| | | | | |
|---|---|---|---|---|
| පුරාවස්තු වැරදි සඳහා අධිකරණය විසින් එකතු කර ගන්නා ලද දඩ මුදල් (රුපියල්) | 7,6285,00 | 21,884,000 | 18,983,000 | 21,295,800 |

**වගුව 1: Management of the Archeological Heritage of Sri Lanka, Report No : CAS/C/PER/A/ARC/2019, National Audit Office, National Audit Office, Page 8**

පුරාවස්තු ආඥා පනත යටතේ වරදකට චෝදනා ලැබූ තැනැත්තෙකුට හෝ චූදිතයකු වූ තැනැත්තෙකු ඇප මත මුදා නොහැරිය යුතු බව (15 (ඇ) වගන්තිය, පුරාවස්තු සංශෝධන පනත; 1998) දැක්වීම සාධනීය පියවරක් බව පෙන්වා දිය හැකිය. එය උරුම විනාශයේ බරපතළ බව පෙන්වා දීමකි.

රජයේ ඉඩම්වල හැර යම් ඉඩමක පිහිටි පැරණි යම් ස්මාරකයක් විනාශ වීමේ හෝ ඉවත් කරනු ලැබීමේ හෝ අන් අනතුරකට නැතහොත් අවිචාරී ක්‍රියා හේතුවෙන් හෝ නොසැලකිලිමත්කමින් ඊට හානි සිදු වන අවස්ථාවක ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු ආරක්ෂිත ස්මාරකයක් ලෙස නියම කිරීමට අමාත්‍යවරයාට හැකිය. ආරක්ෂිත ස්මාරකයක් ලෙස නියම කිරීමට අදහස් කරන බව ගැසට් පත්‍රයේ නිවේදනයක් කිරීමේ අවශ්‍යතාව පනතේ විශේෂ කොට සඳහන් කොට තිබේ. නිවේදනය නිකුත් කරන අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් යම් විරෝධතාවක් තිබේ නම් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධන පනතේ 12 වගන්තිය අනුව අමාත්‍යවරයා අවශ්‍ය යැයි සිතන්නේ නම් නැවතත් පරීක්ෂණයක් පැවැත්වීමට හැකිය. එසේ යම් ස්මාරකයක් සංස්කෘතික ආරක්ෂිත ස්මාරකයක් බවට පත් කිරීමේ ක්‍රියාවලිය සංකීර්ණ කර තිබීම තීරණ ගැනීමේ කාර්යයන්හිදී ගැටලුවක් බව නිරීක්ෂණය කළ හැකිය.

සංස්කෘතික උරුමයන් සුරක්ෂණයෙහිලා මූල්‍ය දායකත්වයක් සැපයීමේ අරමුණ ඇතිව යුනෙස්කෝ ලෝක උරුම සම්මුතියට පාර්ශ්වකරුවකු වීමට සමගාමීව දේශීය ව්‍යවස්ථාදායකය විසින් සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම සඳහා සම්මත කර ගන්නා ලද ප්‍රධානතම ව්‍යවස්ථාවක් වශයෙන් 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත පෙන්වා දිය හැකිය. පනතේ 4 වගන්තිය යටතේ දේශීය විදේශීය ත්‍යාග භාර ගැනීම අරමුදල සතු දේපළ විකිණීමට, අරමුදලේ කර්තව්‍යයන් ඉටු කර ගැනීම සඳහා ගිවිසුම්වලට එළඹීම අරමුදලේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ කාරණාවලට අදාළ රීති සෑදීමට ආදි වශයෙන් අරමුදලේ පාලක මණ්ඩලයට විශාල බලතල ප්‍රමාණයක් ලබා දී ඇත. මෙහි විශේෂත්වය වන්නේ සංස්කෘතික උරුමයන් මෙන්ම පාරම්පරික කලා ශිල්ප ප්‍රවර්ධනයේලා කටයුතු කරන පුරවැසියන් සඳහාද උදව් උපකාර දිරිගැන්වීම් පිළිබඳ අවධානය යොමු කිරීමයි. එබැවින් මෙම ව්‍යවස්ථාව මෙරට සංස්කෘතික උරුම කළමනාකරණයේ වැදගත් සංධිස්ථානයක් බව ප්‍රකාශ කළ හැකිය. ග්‍රාමීය වශයේ මෙරට දේශීය කලා නිර්මාණ කටයුතුවල නිරත වන්නන් ලියාපදංචි කිරීම කෙරෙහිද තවදුරටත් අවධානය යොමු කරන්නේ නම් පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එය ප්‍රයෝජනවත් වන බව දැක්විය හැකිය. ඕනෑම විෂය ක්ෂේත්‍රයක මුදල් අවභාවිත වීම විමතියට කරුණක් නොවන අතර එහිදී සිදු කළ යුතු වන්නේ කාලීන

අවශ්‍යතාවන්, කාලීන ගැටලු හා සමාජ වාතාවරණයන් නිවැරදිව අවබෝධ කර ගනිමින් නිසි මූල්‍ය පරිපාලනයක් කරමින් එම අක්‍රමිකතා සඳහා විසඳුම් සෙවීමයි. විශේෂයෙන් මෙම අරමුදල මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන බැවින් විදේශිකයන්ගේ සංචාරක ප්‍රවේශ පත්‍ර අලෙවිය හා උරුම පරිශ්‍රයන් ආශ්‍රිත සංචාරකයන්ගේ යටිතල පහසුකම් සංවර්ධනය සහ මධ්‍යම සංස්කෘතික අරමුදලේ මුදල් අවභාවිත වීම වැළැක්වීමට නව නීති සම්පාදනය උදෙසා ව්‍යවස්ථා සංශෝධනයන් කෙරෙහි යොමු වීම කාලෝචිත බව පෙන්වා දිය හැකිය.

සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමේදී එය එම පරිශ්‍රය තුළම එනම් එම භූමිය තුළ මෙන්ම කෞතුකාගාර ආශ්‍රිතවද සිදු කරනු ලැබේ. එබැවින් උරුම කළමනාකරණයේදී කෞතුකාගාර මඟින්ද විශාල සේවයක් සැලසෙන අතර එමගින් සංස්කෘතික භාණ්ඩ සඳහා වැඩි ආරක්ෂාවක් හිමිවේ. ජාතික කෞතුකාගාර පිහිටුවීම සහ පවත්වා ගෙන යාම සඳහා වූ 1942 අංක 31 දරන ජාතික කෞතුකාගාර ආඥා පනත මේ සම්බන්ධ නීති තත්වයන් දක්වන අතර එහි 12 වගන්තිය කෞතුකාගාරවල තිබෙන භාණ්ඩවලට අලාභ පැමිණවීමේදී ඇති වන වගකීම යටතේ සිවිල් නඩුවක් මාර්ගයෙන් හානියට පත් භාණ්ඩයේ වටිනාම මෙන් දෙගුණයකට සමාන මුදලක් රජයට ගෙවිය යුතු බව දක්වයි. නමුත් කෞතුක භාණ්ඩයක වටිනාකම තක්සේරු කිරීම සහ මුදලින් එම හානිය පියවීම පිළිබඳ නැවත සිතා බැලිය යුතුය. 2012 මාර්තු මස කොළඹ ජාතික කෞතුකාගාරය තුළ තිබී අස්ථානගත වූ 18 සහ 19වන සියවස්වලට අයත් කඩු හා අනෙකුත් කෞතුක භාණ්ඩ සොරකම මෑතකාලීනව වැඩි අවධානයක් යොමු වුවද පසුව එය කාලයේ වැලි තලාවෙන් යටපත් වූ අතර එවැනි අවස්ථාවලදී හෝ නීතියේ නව සංශෝධන කෙරෙහි අවධානය යොමු කිරීමට උත්සහ නොකිරීම මෙරට නෛතික යාන්ත්‍රණයේ දුර්වලතාවකි.

ශ්‍රී ලංකාව තුළ යම් උරුමයක් සංස්කෘතික උරුම දේපළක් වශයෙන් හඳුනා ගනිමින් එය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් නෛතික තත්වයන් දක්වන 1988 අංක 73 සංස්කෘතික දේපළ පනතද වැදගත් ව්‍යවස්ථාවකි. ඒ අනුව සංස්කෘතික දේපළ සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව, ශ්‍රී ලංකාව තුළ සංස්කෘතික උරුමයන් හා එවැනි වස්තූන් වඩා හොඳින් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව සහ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා දායකත්වය සපයන ඕනෑම සිද්ධියක් මත කාලයෙන් කාලයට සංස්කෘතික දේපළ සභාව සමඟ සාකච්ඡා කර කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් ගැසට් පත්‍රයේ පළ කරන දැන්වීමකින් සංස්කෘතික දේපළක් වශයෙන් ලියාපදිංචි කිරීමේ හැකියාව අමාත්‍යවරයා සතුව පවතින බව පනත අවධාරණය කරයි (සංස්කෘතික දේපළ පනතඃ 11 වගන්තිය 1988). මෙය බොහෝ අවස්ථාවලදී රටේ සාමාන්‍ය ජනතාව සමඟ ගැටුම්කාරී තත්වයන් ඇති වන අවස්ථාවක් බවට පත්ව ඇත. එය වඩාත් සංකීර්ණ ගැටලු නිර්මාණය කරන්නේ පෞද්ගලික සන්තකයේ ඇති දේපළක් සංස්කෘතික දේපළක් වශයෙන් ලියාපදිංචියේදීය (සංස්කෘතික දේපළ පනතඃ 12 වගන්තිය 1988). මෙම අවස්ථාවේදී ඇති වන ආරවුල් ඉඩම් ආරවුල් බවට පත් වන අතර එම ගැටලු නිරාකරණයේදී ඉඩම් නීතිය යොදා ගැනීමට සිදු වේ. නමුත් ඉඩම් ආරවුල් විසඳීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමේදී ගත වන කාලය ඉතාමත් දීර්ඝ වන අතර එය දෙපාර්ශ්වයටම වෙහෙසකර ක්‍රියාදාමයක් බවට පත් වන ආකාරය නිරීක්ෂණය කළ හැකිය. එය උරුම කළමනාකරණයට බාධාවකි.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක කටයුතුවල ස්ථායීතාවය හා ගුණාත්මක භාවය, උරුමය සම්බන්ධ ක්‍රියාකාරී සැලසුම්, ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් 2006 ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ජාතික ප්‍රතිපත්තියද මෙරට නෛතික යාන්ත්‍රණයේ නව පියවරක් වශයෙන් පෙන්වා දිය හැකිය. ව්‍යවස්ථාපිත නීති පැවතියද ඒවා ක්‍රියාත්මක කිරීමේදී ඇති වන ගැටලුද සංස්කෘතික උරුම කළමනාකරණයේදී හඳුනාගත හැකිය. දේශපාලනික මැදිහත් වීම්, සාමාන්‍ය ජනතාවගෙන් සිදු වන බලපෑම් විශේෂයෙන් අනවසර ඉඩම් භුක්තිවිඳීම, හදිසි ස්වාභාවික ආපදා ආදිය මෙහිදී නිරීක්ෂණය කළ හැකිය. එවැනි අවස්ථාවලදී උරුම ආරක්ෂණය සඳහා පියවර ගැනීමේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම මෙන්ම වේගවත් විය යුතුය. ඒ සඳහාද අවශ්‍ය පියවර ගැනීමේ බලධාරීන් හා කමිටු පත් කිරීම කෙරෙහිද අවධානය යොමු කළ යුතුය.

වර්තමානයේදී රටක නීති පද්ධතිය පිළිබඳ විමසා බැලීමේදී දේශීය නීතිය මෙන්ම අන්තර්ජාතික නීතියද එකසේ වැදගත් වේ. මක් නිසාදයත් අද සමස්ත ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත්ව ඇති අතර ආර්ථික වයෙන් කෙතරම් ශක්තිමත් ස්වාධීන රාජ්‍යයකට වුවද අන්තර්ජාතික සම්බන්ධතාවලින් තොරව දෛනික කටයුතු පවත්වාගෙන යාම අසීරුය. සංස්කෘතික හා ස්වාභාවික උරුම ආරක්ෂණය සඳහා අන්තර්ජාතික වශයෙන් ලෝකයේ පවතින ප්‍රධානතම නෛතික ලියවිල්ල වශයෙන් 1972 යුනෙස්කෝ ලෝක උරුම සම්මුතිය හැඳින්විය හැකි අතර ශ්‍රී ලංකාව 1980 ජූනි 6 වන දින ඒ සඳහා පාර්ශ්වකාර රාජ්‍යයක් වශයෙන් අත්සන් තබා ඇත. එබැවින් එම සම්මුතියේ මාර්ගෝපදේශ අනුගමනය කිරීමේ නෛතික යුතුකමක් ශ්‍රී ලංකාවට පවතී. එලෙස කටයුතු කිරීමේ නෛතික වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජාත්‍යන්තර සම්මේලන, සමිතිවලට සහ වෙනත් මණ්ඩලවලට සහභාගිවීම සහ සහ ඒවායේදී එළඹෙන තීරණ ක්‍රියාත්මක කිරීම, විදේශ රටවල් සමග සන්ධානවලට සහ ගිවිසුම්වලට ඇතුළත්වීම සහ විදේශ රටවල් සමග වූ සන්ධාන, ගිවිසුම් සහ සම්මුති ක්‍රියාත්මක කිරීම නවවන උපලේඛනයේ II ලැයිස්තුව යටතේ විදේශ කටයුතු මඟින් දක්වා ඇත.

**ලෝක උරුම සම්මුතිය උරුමයන් සංස්කෘතික හා ස්වාභාවික වශයෙන් දෙයාකාරයකින් අර්ථ නිරූපණය කරන අතර ස්මාරක යටතේ ගෘහ නිර්මාණ කටයුතු, මූර්ති, පින්තාරු, පුරුවිද්‍යාත්මක ව්‍යුහ, ශිලා ලේඛන, ලෙන් ආදි විශ්වීය වශයෙන් වැදගත් ඓතිහාසික, කලාත්මක හා විද්‍යාත්මක අගයන්ගෙන් යුක්ත වූ අංගයන් ද ගොඩනැගිලි යටතේ වාස්තු විද්‍යාත්මකව වැදගත් වන තනිව හෝ එක් සමූහයක් ලෙස පවතින්නා වූ ඓතිහාසික, කලාත්මක හා විද්‍යාත්මක අගයන්ගෙන් යුක්ත ගොඩනැගිලිද පරිශ්‍රය යටතේ මිනිසාගේ හෝ සොබාදහමේ සහ මිනිසාගේ ඒකාබද්ධ එකතුවෙන් කරන ලද විශ්වීය වශයෙන් වැදගත් ඓතිහාසික, කලාත්මක, මානවවංශ සහ මානව විද්‍යාත්මක අගයන්ගෙන් යුක්ත වූ ක්ෂේත්‍රද ආදි වශයෙන් සංස්කෘතික උරුමයන් ප්‍රධාන අංශ ත්‍රිත්වයක් යටතේ හඳුනා ගනු ලබයි** (යුනෙස්කෝ ලෝක උරුම සම්මුතියඃ 1 වගන්තිය 1972). අනෙකුත් ජාත්‍යන්තර සම්මුතීන්ට සාපේක්ෂව ලෝක උරුම සම්මුතිය ප්‍රායෝගික ක්‍රමවේදයන් සහ කාලීන ගැටලු කෙරෙහි ඉක්මනින් අවධානය යොමු කිරීම කැපී පෙනෙන ලක්ෂණයක් වේ. උරුම සම්මුතිය හරහා ජාත්‍යන්තර සහයෝගිතාව සහ හවුල් වගකීම අපගේ පොදු

සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ඵලදායී ලෙස සංරක්ෂණය කිරීම සහතික කරන අතර එමගින් ලෝක ප්‍රජාව සහ සංස්කෘතීන් අතර ගෞරවය සහ අවබෝධය පෝෂණ කරමින් ඔවුන්ගේ තිරසර සංවර්ධනයට දායක වේ. ( Strategic Action Plan for the Implementation of the World Heritage Convention 2012-2022, General Assembly, UNESCO; 2011).

යුනෙස්කෝ ලෝක උරුම සම්මුතිය යටතේ පවත්වාගෙන යනු ලබන ලෝක උරුම ලැයිස්තුව (World Heritage List, <https://whc.unesco.org/en/list>) යටතේ ශ්‍රී ලංකාවේ උරුමයන් අටක් ලෝක උරුම වශයෙන් නම් කර ඇත. ඉන් අනුරාධපුර පූජා නගරය (1982), පොලොන්නරුව නගරය (1982), සීගිරිය (1982), මහනුවර නගරය (1988), පැරණි ගාලු නගරය හා ගාලු කොටුව (1988), රන්ගිරි දඹුල්ල විහාරය (1991) යන උරුමයන් හයම සංස්කෘතික ලෝක උරුම ලෙස නම් කර ඇති අතර සිංහරාජ රක්ෂිතය (1988), මධ්‍යම කඳුකරය (2010) ස්වාභාවික ලෝක උරුම වශයෙන් නම් කර ඇත. භූමි ප්‍රමාණයෙන් කුඩා රාජ්‍යයක් වුවද උරුම ලැයිස්තුව යටතේ මෙරට උරුමයන්ට ලැබී ඇති ඉහළ පිළිගැනීම මෙරට උරුම කළමනාකරණයේ විශාල ජයග්‍රහණයකි. නමුත් එය ඉදිරි අනාගතය වෙනුවෙන් නිසි කළමනාකරණයකින් යුතුව පවත්වා ගැනීම අප සතු වගකීමක් වන අතර එහිදී විද්‍යාත්මක පසුබිමක් යටතේ පුරාවිද්‍යාත්මක උරුම සංරක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම මෙන්ම මානව මැදිහත් වීම් පාලනය කිරීම සඳහා ශක්තිමත් නීති පද්ධතියක අවශ්‍යතාවද එකසේ වැදගත් වන බව උරුම සම්මුතිය අධ්‍යයනයේදී නිරීක්ෂණය කළ හැකිය. පාර්ශ්වකාර රාජ්‍යයන් තම භූමිය තුළ හඳුනා ගන්නා සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම කාර්යක්ෂම සහ ක්‍රියාකාරී පියවර ගැනීම කළ යුතුය. (යුනෙස්කෝ ලෝක උරුම සම්මුතිය: 5 වගන්තිය 1972 ). උරුමයන් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය සඳහා අවශ්‍ය නීතිමය, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන හා මූල්‍යමය කටයුතු සඳහා පියවර ගැනීම. එම කටයුතු වෙනුවෙන් ජාතික හෝ ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටු වීම (යුනෙස්කෝ ලෝක උරුම සම්මුතිය : 5(e) වගන්තිය 1972 ). මේ යටතේ දේශීය නීති පද්ධතිය වර්ධනය කිරීම සම්මුතිය අවධාරණය කර ඇත. තවද උරුම කළමනාකරණයේදී මහජන සහභාගීත්වය ලබා ගැනීමේ වැදගත්කමද සම්මුතිය අවධාරණය කරයි.

දේශීය හා විදේශීය සංචාරකයන් උරුම කළමනාකරණයේ ප්‍රධාන මෙවලමක් වශයෙන් දැක්විය හැකිය. ඒ ඔවුන්ගෙන් රටට ලැබෙන ආර්ථික ලාභ මෙන්ම මෙරට උරුමයන් ලෝකයට දැන ගැනීමට සැලැස්විය හැකි සන්නිවේදන ක්‍රමවේදයක් වශයෙනි. එහිදී දේශීය සංස්කෘතික උරුමයන් පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමේ ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ඡායාරූපකරණය පෙන්වා දිය හැකිය. විශේෂයෙන් විදේශීය සංචාරකයන් සංචාරයේ නිරතව ඔවුන්ගේ මතක සටහන් එකතු කර ගනු ලබන්නේ ඡායාරූපකරණය හරහාය. එවැනි පසුබිමක මෙරට උරුමයන් ඡායාරූපකරණයේදී අනවශ්‍ය ලෙස අනම්‍ය ක්‍රියාපටිපාටීන් අනුගමනය කිරීම කෙරෙහි සැලකිලිමත් විය යුතුය. මෙරට පුරාවිද්‍යා පරිශ්‍රයන් ආශ්‍රිතව විමර්ශනය කිරීමේදී බොහෝ ස්ථානයන් විශේෂයෙන් සිතුවම්, ආගමික ස්ථාන, කෞතුකාගාර ආශ්‍රිත කෞතුක වස්තු ඡයාරූපගත කිරීම තහනම් කර ඇත. සිතුවම් සම්බන්ධයෙන් එම තහනම යම්තාක් දුරකට විද්‍යාත්මක පදනමක් සහිතව අවශ්‍ය නමුත් ඇතැම් ස්ථාන සම්බන්ධයෙන් එසේ ඡායරූපකරණය තහනම්

කිරීමේ පදනම කුමක්ද යන්න ගැටලු සහගතය. වර්තමානයේ තාක්ෂණික දියුණුවත් සමඟ ඡායාරූපකරණය වීඩියෝගත කිරීම ඉතාමත් පහසු දෙයක් වන ඒ නිසාම අනවසර ඡායාරූප ගැනීම් පිළිබඳ ගැටලු ඉස්මතු විය හැකිය. 2015 දෙසැම්බර් 30 දින සිට සීගිරි සිතුවම් ඡායාරූපකරණය තහනම් වූ අතර එය මෙරට පවතින විශිෂ්ට සිතුවම් සමූහයක් ආරක්ෂා කිරීම සඳහා ගත් කාලීන පියවරක් ලෙස පෙන්වා දිය හැකිය. ඊට අමතරව 1940 දෙසැම්බර් 23 දිනැති 8698 දරන ගැසට් පත්‍රය මගින්ද මේ සම්බන්ධ නීති තත්වයන් දක්වා ඇත. පුරාවිද්‍යාත්මක උරුමයන් ඡායාරූපකරණය පිළිබඳ විධිමත් නීතියක් ජාතික මට්ටමෙන් නොමැති බව නිරීක්ෂණය කළ හැකි අතර ඒ සඳහා කටයුතු සම්පාදනය කිරීම ව්‍යවස්ථාදායකයේ මැදිහත්වීම අවශ්‍ය බව පෙන්වා දිය හැකිය.

ව්‍යවස්ථාදායකය විසින් නිර්මාණය කරනු ලබන නීතිය කෘත්‍රිම ප්‍රපංචයක් වන අතර එයට සජීවී ක්‍රියාත්මක භාවයක් ලැබෙන්නේ මානව ක්‍රියාකාරීත්වය තුළිනි. ඒ අනුව ඕනෑම විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ යාවත්කාලීන වූ ව්‍යවස්ථාපිත නීතියක් මෙන්ම එම නීතිය පිළිබඳ අවබෝධයක් සහිත පුරවැසියන් සිටීමද නීතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට මනා පිටිවහලක් වේ. "*Ignorantia juris non excusat*" නීතිය නොදැනීම සමාවට කරුණක් නොවන බව නීතියේ පිළිගත් සංකල්පයකි. (Barlow v. United States, 32 US 404; 1833) මෙරට අනිවාර්ය මූලික අධ්‍යාපනය ලබා දෙන පාසල් විෂය නිර්දේශයන් නිරීක්ෂණය කිරීමේදී කිසිදු අවස්ථාවක නීතිය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා දීමක් සිදු නොවන බව පැහැදිලි වේ. සාමාන්‍ය ජනතාවට නීතිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා දීමට නිසි ක්‍රියාපටිපාටියක් නොමැතිව පවත්නා නීතිය පිළිබඳ රටේ පුරවැසියන්ගෙන් අවබෝධයක් බලාපොරොත්තු වීමද ප්‍රශ්න සහගත වේ.

### නිගමන සහ යෝජනා

සමස්තයක් වශයෙන් සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා මෙරට නීති පද්ධතිය තුළ ප්‍රමාණවත් නීති නොපවතින්නේ යැයි පැවසිය නොහැකි අතර ක්ෂේත්‍ර ගණනාවක් පුරා විසිරුණු නීති තත්වයන් පැවතීම සහ කාලීන අවශ්‍යතා, සමාජ ගැටලු කෙරෙහි දක්වන අවධානය අඩු බවක් සහ එම තත්වයන් සැලකිල්ලට ගනිමින් ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය මන්දගාමීව සිදු වීම ප්‍රධානතම දුර්වලතාවය ලෙස පෙන්වා දිය හැකිය.

ඉහත හඳුනා ගන්නා ලද සංස්කෘතික උරුම කළමනාකරණයේදී මෙරට ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයක් ආශ්‍රිත ගැටලු කෙරෙහි අවධානය යොමු කරමින් ව්‍යවස්ථා සංශෝධන කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එහිදී උරුමයන් විනාශ කිරීමට අදාළ වැරදි සම්බන්ධයෙන් දඩ මුදල් හෝ වෙනත් දණ්ඩණයන් පමණක් ඉහළ දැමීම එකම විසඳුම නොවන අතර කාලීන සමාජ ගැටලු කෙරෙහිද අවධානය යොමු කළ යුතුය. විශේෂයෙන් යුනෙස්කෝ ලෝක උරුම සම්මුතියේ පාර්ශ්වකාර රාජ්‍යයක් වශයෙන් එහි දැක්වෙන මාර්ගෝපදේශයන් සහ අනෙකුත් අන්තර්ජාතික නෛතික තත්වයන් කෙරෙහි තව දුරටත් අවධානය යොමු කළ යුතුය. තවද සංචාරක කර්මාන්තය හරහා රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සැපයීමට මෙරට සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් හේතු වන බැවින් පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඒ සඳහා ලැබී තිබෙන නෛතික ආරක්ෂාව පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි අතර අනාගත ආණ්ඩු ක්‍රම

ව්‍යවස්ථා සංශෝධන හෝ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේදී මෙරට සංස්කෘතික උරුමයන් පිළිබඳ වැඩි අවධානයක් යොමු විය යුතුය.

සංස්කෘතික උරුම පරිශ්‍රයන් හා පෞද්ගලික ඉඩම් පරිභෝජනය ආශ්‍රිත ගැටලු නිරාකරණයේදී උරුම ආරක්ෂණය මෙන්ම සාමාන්‍ය ජනතාවගේ ඉඩම් පරිභෝජනයද එකසේ වැදගත් වන බැවින් ඉඩම් ආරවුල් නිරවුල් කිරීමේ නීතිමය කටයුතු සඳහා ගත වන කාලය කෙරෙහි විශේෂ සැලකිල්ලක් යොදමින් එකී නීති තත්වයන් සංශෝධනය කළ යුතුය. උරුම කළමනාකරණය සහ සංචාරක කර්මාන්තය එකිනෙකට ඒකාබද්ධ වූ ක්ෂේත්‍රයක් බැවින් දේශීය හා විදේශීය සංචාරකයන් උරුම පරිශ්‍රයන් තුළ හැසිරීම සහ එම උරුමයන් ආරක්ෂා කිරීමට ඔවුන්ගේද දායකත්වය ලබා ගත හැකි වන ආකාරයෙන් නීතිය වර්ධනය විය යුතුය. එහිදී මෙම සියලු නෛතික ක්‍රියාමාර්ගයන් මෙරට සංස්කෘතික උරුමයන් අනාගත පරම්පරාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ අභිප්‍රාය පෙරදැරිව නිර්මාණය විය යුතුය.

**මූලාශ්‍රය**


1940 අංක 09 දරන පුරාවස්තු ආඥාපනත
1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධන පනත
1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත
1988 අංක 73 දරන සංස්කෘතික දේපළ පනත
1942 අංක 31 දරන ජාතික කෞතුකාගාර ආඥා පනත
1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ශ්‍රී ලංකාව
Convention concerning the protection of the World Cultural and Natural Heritage, UNESCO World Heritage Convention, 1972
Cathy Lynne Costin, Legal and Policy Issues in the Protection of Cultural Heritage in South Asia and the Pacific, Cultural Heritage in Asia and the Pacific: Conservation and Policy Proceedings of a Symposium held in Honolulu, Hawaii, September 8-13, 1991)Prashantha B. Mandawala, Sheard Global experiences for Protection of Built Heritage, International Committee on Legal Administrative and Financial Issues.The fusion of law and ethics in cultural heritage management: The 21st Century confronts archaeology, Hilary A. Soderland and Ian A. Lilley, Journal of Field Archaeology, Published 2015.Strategic Action Plan for the Implementation of the World Heritage Convention 2012-2022, 18th General Assembly (UNESCO, 2011) by Resolution 18 GA 11, r Vision for 2022

# ස්ත්‍රීත්වය, මාතෘත්වය, හා ප්‍රාග් ඓතිහාසික සංකේත : රාවණා ඇල්ල කැණීමෙන් හමුවූ ශෛලමය මූර්තියක් ඇසුරෙන් සිදු කළ ප්‍රජානන පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**කසුන් රුහිරු මධුසංක**

**හැඳින්වීම.**

සංකේත නිර්මාණය කිරීම යනු සංකීර්ණ හැසිරීම් සහිත නූතන මානවයාගේ සංකල්පීය චින්තන ධාරාවේ ප්‍රජානනාත්මක දියුණුවක් මෙන්ම උසස් සංකේතාත්මක අන්තර්සන්නිවේදනයේ සංජානනාත්මක ඇඟවීමකි (Madhusanka 2021). එය මානව පරිණාමයේ ගමන් මඟෙහි ජීව විද්‍යාත්මක, පාරිසරික විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක චින්තන ධාරාවේ ද පිළිබිඹුවකි (ibid). ප්‍රාග් දඩකරු අන්නගවේෂකයන් (prehistoric hunter gatherers) ඔවුන්ගේ අදහස්, හැඟීම් හා විශ්වාස අන්තර්සන්නිවේදනය සඳහා භාවිත කර ඇති දෘශ්‍යමය මාධ්‍ය අතර සිතුවම් හා මූර්තිමය නිර්මාණ එම්පැලියෝලිතිකය පුරාවට දැක ගත හැකි අතර එය වඩා පුළුල් පරාසයක් පුරා පැතිර ඇත (Beck 2000). එහිදී අභිචාරමය කටයුතු සඳහා මෙන්ම සෞන්දර්යාත්මක අදහස් සන්නිවේදනය සඳහාද නිර්මාණය කළ මූර්තිවල පැවැත්ම විශ්වීයව පිළිගන්නා නමුත් සොයා ගැනීමේ මෙන්ම ඒවා පුරාවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් අර්ථ දැක්වීමේ හිඟකම හේතුවෙන් එහි මුල් සාක්ෂි සඳහා වන හිමිකම් පිළිබඳවත් එහි පරිණාමය හා විසරණය පිළිබඳවත් පුරාවිද්‍යාත්මක වාර්තා අසම්පූර්ණව පවතී (Morley 2003; Bar-Yosef 2002). පුරාතන මූර්තිමය සංකේත නිර්මාණයෙහි ආරම්භය පැලියෝලිතිකයෙ ජීවත්වූ මානවයන් විසින් මුල්මවරට හඳුනා ගන්නා ලද බවට පිළිගන්නා අතර එම කාලට අයත් මූර්තිද මේ වන විට හඳුනා ගෙන ඇත (Mithen 2006). එනමුත් පුරාවිද්‍යාඥයන් විසින් ලෝකයේ විවිධ ප්‍රාග් ඓතිහාසික ක්ෂේත්‍ර ආශ්‍රිතව මෙතෙක් සොයා ගෙන ඇති මූර්ති අතර වීනස්, ස්ත්‍රීත්වය, මාතෘත්වය ආදී සංකේතාත්මක නිර්මාණ ඉතා දුලබය (Clark 2003). ඒ අතර ඔස්ට්‍රියාවේ ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කරන වසර 30,000ක් පමණ පැරණි Venus of Willendorf මූර්තිය, ප්‍රංශයේ වසර 27,000 - 22,000 පැරණි Laussel Woman, ජර්මනියේ වසර 35,000 - 40,000ක් පැරණි Venus of Hohle Fels, ජර්මනියේ වසර 30,000ක් පැරණි Venus of Galgenberg, Moravia, Czech Republicවලින් හමුවූ වසර 29,000 - 25,000ක් පැරණි Venus of Doli Vestonice, The French Pyreneesවලින් හමුවූ වසර 24,000 - 26,000ක් පැරණි Venus of Lespugu, ප්‍රංශයෙන් හමුවූ වසර 25,000ක් පැරණි Venus of Brassempouy ආදි ප්‍රතිමා පෙන්වා දිය හැකිය (Esleman 2003; Nelson 1990). එමෙන්ම කාන්තා යටිකය හා ජනනේන්ද්‍රිය (Vagina) පිළිබඳව හමු වන සාධක අතර Czech Republicහි Pavilion/Moravian කෞතුකාගාරයේ ඇති මැමත් හස්තිකුගේ දතකින් සෑදූ නිර්මාණය (Marshack,1972) මෙන්ම Les Eyzies හි Musée National de Préhistoire (කෞතුකාගාරයේ) ප්‍රදර්ශනය

කරනු ලබන පැලියෝලිතිකට අයත් Vagina සංකේත සහිත ශෛලමය සහ අස්ථිමය පුරාවස්තු එකතුව පෙන්වා දිය හැකිය (Cook:2013, Beltrán:1967, Dellus:1978, Delporte:1979, Duhard:1988, Eshleman:2003, Leroi:1973, Mortillet:1906, Muller-Beck:1987, Peyrony:1946, Robert:1946, Srejovic:1972). එමෙන්ම ශ්‍රී ලංකාවේ වල්මීතලාව හුණුගල්ගේ කැණීමෙන් ද මෙවන් ගණයට ගැනිය හැකි බවට අදහස් කරන මූර්ති කිහිපයක් හමු වී ඇති අතර ඒවා ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වබට විශ්වාස කරයි (Somadeva 2022).

නමුත්, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ශෛලමය නිර්මාණ අතර ස්ත්‍රීත්වය හා මාතෘත්වය නිරූපණය කරන කාන්තා ජනනේන්ද්‍රිය (Vagina) නිරූපිත සිතුවම් හා මූර්තිමය සාධක ඉතා විරලය. එනමුත් රාවණා ඇල්ල කැණීමෙන් හමුවූ එක් පාෂාණයක මානවයා උවමනාවෙන්ම නිර්මාණය කරන ලද හැඩගැන්වීම් කිහිපයක් දැක ගත හැකිය.

දේශගුණික කලාප අතුරින් *Zone E*හි පිහිටා ඇති මෙම ගුහාව කිරිඳි ඔයෙන් පෝෂණය ලබන රාවනා ඇල්ල සමීපයෙහි පිහිටා ඇත. P.E.P දැරණියගල විසින් 1945 වසරේ දී රාවනා ඇල්ල ගුහාව පූර්ණ ලෙස කැණීම් කොට ඇති අතර එමගින් මානව සැකිලි අවශේෂ, ගුරු ගල් ආලේපිත මානව හිස් කබල් කොටස්, වඳුරන්ගේ හා කුඩා ක්ෂීරපායී සතුන්ගේ අවශේෂ මෙන්ම මුහුදු බෙලිකටු අවශේෂද සොයා ගෙන ඇත (Deraniyagala 1953). එමෙන්ම සිරාන් දැරණියගල විසින් 1985දී නැවත එම ස්ථානය කැණීම් කරන ලදී (Deraniyagala 1992; Perera 2010). මෙම ස්ථාන කාල නිර්ණය කර නොතිබුණත් හමු වන ශෛලමය සාධක හා මානව සාධක බාහිර රූප විද්‍යාත්මක සංසන්දනාත්මක අධ්‍යයනයෙන් මෙය එම්පැලියෝලිතිකය/ ජ්‍යාමිතික ශුද්‍රශිලා යුගයට අයත් බව සිතිය හැකිය.

එහිදී ජාතික කෞතුකාගාරයේ තැම්පත් කර ඇති රාවණා ඇල්ල කැණීමෙන් හමුවූ A3/ 15.09.45 දරන ශිලා නිර්මාණයෙහි සුවිශේෂී මානව හැසිරීම් හා ප්‍රකාශනයන් මූර්තිමය ලෙස සංකේතාත්මකව නිර්මාණය කර ඇති බව හඳුනා ගත හැකිය. එබැන් මෙම පුරාවස්තුවෙහි කලාත්මක, සෞන්දර්යාත්මක හා සංකේතාත්මක සුවිශේෂීතාව කුමක් ද?, එම සංකේත නිර්මාණය කර ඇති තාක්ෂණය හා උපයෝගීතාව කුමක් ද?, සහ එහි ප්‍රජනනාත්මක ප්‍රකාශනයන් මොනවාද? යන පර්යේෂණ ගැටලු මුල් කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

**ක්‍රමවේදය**

පුරාවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විග්‍රහ කිරීමේදී සාක්ෂරතාව නොමැති ප්‍රජාව විසින් නිර්මාණය කරන ලද කලාත්මක බවින් යුත් සංකේතාත්මක නිර්මාණයන්හි ගැබ්ව ඇති ප්‍රකාශනයන් අර්ථකථනය කිරීම න්‍යායික හා ක්‍රමවේදමය ගැටලු මතු කළ ද ප්‍රජානන පුරාවිද්‍යාව, ප්‍රජානන සංකල්පීය මානව විද්‍යාව ආදි ප්‍රවේශයන් තුළින් උක්ත ගැටලු නිරාකරණය කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. එහිදී උක්ත

සංකල්ප හා ප්‍රවේශද පෙරදැරිව Prof. Robert G.Bednarik, Prof. Emmanuel Anati ආදි පර්යේෂකයන්ගේ අදහස්ද මුල් කොට පුස්තකාල අධ්‍යයනයෙන් අනතුරුව මෙවැනි පර්යේෂණ සිදු කළ දේශීය සහ විදේශීය පර්යේෂකයන් සමග සාකච්ඡා කරන ලදී. අනතුරුව මෙම ශෛලමය නිර්මාණය අන්වීක්ෂීය පරීක්ෂාවටත්, බාහිර රූපවිද්‍යාත්මක සංසන්දනාත්මක අධ්‍යයනයටත් බඳුන් කරන ලදී.

**සාකච්ඡාව**

15.09.45 දරන මෙම ශිලා නිර්මාණය දිගින් මිලිමීටර 77.47ක් වන අතර පළල මිලිමීටර 57.07ක් වේ. පාෂාණයෙහි මතු පිට එක්පසෙක මධ්‍යයෙහි ගල් ආයුධයක් මගින් නිර්මාණ කරන ලද මිලිමීටර් 5ක් පමණ ගැඹුරට හාරන ලද රේඛාවක් හඳුනාගත හැකි අතර එහි මධ්‍යයෙහි ගුරුගල් ආලේප කර ඇත. පාෂාණයෙහි අනෙක් පස මෙවන් ආකාරයට සැදූ සෙන්ටිමීටර් 1.5ක් පමණ ගැඹුරට හාරන ලද රේඛාවක් හඳුනාගත හැකි අතර එය මතු පිටින් ඉතා සුමට කර ඇත. මෙම පාෂාණමය නිර්මාණය ''Ear stretchers'' ලෙස P.E.P දැරණියගල විසින් නම් කරන ලද (Deraniyagala 1953) නමුත් ප්‍රමාණයෙන්, බරින් හා ප්‍රාග් ඓතිහාසික කැණීම් මගින් හමුවී ඇති ''Ear stretchers'' සමඟ බාහිර රූපවිද්‍යාත්මක අධ්‍යයනයෙන් අනතුරුව එය එවැන්නක් නොවන බව මෙම පර්යේෂණයේදී හඳුනා ගන්නා ලදී.

මෙම ශිලා නිර්මාණය මගින් කාන්තා ජනනේන්ද්‍රිය (Vagina) නිරූපණය කරන බව පැලියෝලිතිකයේ හමුවී ඇති මෙවන් නිර්මාණ සමඟ සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමේදී පෙනේ. එමෙන්ම මෙම නිර්මාණ ප්‍රාග් ඉතිහාසය තුළ කාන්තාවගේ සශ්‍රීකත්වය උත්කර්ෂයට නංවන දෘශ්‍යමය නිර්මාණ ලෙස හඳුනාගත හැකිය. මෙමගින් ස්ත්‍රීත්වය මෙන්ම ගැහැණු දරුවන් වැඩිහිටි ජීවිතය සඳහා ඇතුලත් වී ඇති බව පෙන්නුම් කරයි. මෙම සංකල්පීයව නිර්මාණය කර ඇති Vaginaහි එක් පසෙක ගුරුගල් පුරවා හෝ ආලේප කිරීම මගින් කාන්තාව වැඩිහිටි ජීවිතයට අවතීර්ණව ඇති බවක් සංකේතවත් කරයි. එහිම අනෙක් පස ඉතා හොඳින් සුමට කර ඇත. මෙය යාතුකර්ම සඳහා භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙසත් එය ප්‍රාග් ඓතිහාසික කාන්තාවගේ ප්‍රජනනය හා මාතෘත්වයේ එක් නිරූපණයක් ලෙසත් පෙනේ.

මෙවැනිම ක්‍රියාවක් වල්මීතලාව හුණුගල්ගේ කැණීමෙන් හමු වී ඇති Vaginaහිද දැකගත හැකිය. ඒ අනුව ගත් කල මෙය හුදකලාවූ එක්තරා සිදුවීමක් නොවන බවත් ප්‍රාග් ඉතිහාසය තුළ විශ්වාසනීය යාතුකර්මික අවශ්‍යතාවක් මත පවත්වා ගෙන ආ විශ්වාසයක් බවත් පෙනේ. රාවණා ඇල්ල කැණීමෙන් හමු වූ සිදුරු කරන ලද හා වර්ණ ගන්වන ලද හිස් කබල් කොටස් මගින් මෙවැනි යාතුකර්මික හා අභිචාරමය විශ්වාස රාවණා ඇල්ල ගුහාවේ විසූ මානවයන් සතුව තිබූ බවට තවදුරටත් තහවුරු කරයි.

මෙලෙස එක් පාෂාණයක දෙපසෙහිම Vagina නිර්මාණය කර එහි එක් පසෙක ගුරුගල් ආලේප කර තිබීමත් අනෙක්පස සුමට කිරීමත් මගින් දෘශ්‍යමය වශයෙන් ප්‍රාග් මානව චින්තනය සම්ප්‍රේෂණය කරනු ලබයි. මෙහි ගුරුගල් මගින් ලේ සංකේතවත් කරයි. මේ සඳහා ප්‍රාග් ඉතිහාසය තුළ රතු හා කහ ගුරුගල්

භාවිත කර ඇත. සාම්ප්‍රදායික ජන ව්‍යවහාරය හා විශ්වාසය තුළ ‘ලේ’ හෙවත් රුදිරය යනු යාතුකර්මවලදී කිලි ලෙස හැඳින්වේ. මෙහිදී Vaginaහි රුධිරය සංකේතවත් කිරීම මගින් රක්ත ප්‍රදරය හෙවත් කිලිමාලය නිරූපණය කරයි. එනම් දරුවන් බිහි කිරීමෙන් අනතුරුව නොනවත්වා රුධිරය ගැලීම සහ කාන්තා ‘ඔසප්’ වීම නතර නොවීමයි (Vimalawathi 2022). දේශීය ව්‍යවහාරයේ ලේමාලය, අසෘග්දරය ලෙසින්ද හඳුන් වන්නේ දරුණු ලෙස කිලිමාලය හැදීම වන අතර එමගින් නොනවතින ලේ වහනය වීම මගින් කෘෂ වී මරණයට පත්වේ.

කිලිමාලය හෙවත් රක්ත ප්‍රදරයට හේතු ලෙස දේශීය වෙදකමෙහි දැක්වෙන්නේ නුසුදුසු විරුද්ධ ආහාර ගැනීම, අජීර්ණකර ආහාරපාන ගැනීම, අතිමෛථුනය, කෑ පිට කෑම, පහර වැදීම, දහවල නිදීම ආදි දෑ දැක්වෙන අතර ප්‍රාග් මානව ජීවන රටාව විමසා බැලීමේදී උක්ත කාරණා බොහෝ අවස්තාවන්හි සිදුවිය හැකි බව සිතිය හැකිය. ඒ අනුව 15.09.45 දරන රාවණා ඇල්ල කැණීමෙන් හමුවූ මෙම ශිලා නිර්මාණය මගින් ස්ත්‍රීත්වය සහ මාතෘත්වය පිළිබඳ අදහස සහ කාන්තා ජනනේන්ද්‍රිය (Vagina) නිරූපණය මෙන්ම රක්ත ප්‍රදරය හෙවත් කිලිමාලය මෙන්ම ඒ සඳහා සිදු කරන යාතුකර්ම පිළිබඳව ප්‍රජනනාත්මක අදහසක් සංජානනය කරන බව පෙන්වා දිය හැකිය.

**මූලාශ්‍රය**


Bar-Yosef.O, 2002, The Upper Paleolithic Revolution, Annual Reviw of AnthropologyBeltrán, A, Robert, R., Gailli R, 1967: La Cueva de Bédeilhac, Zaragoza 1967Beck. M,2000, Female Figurines in the European Upper Paleolithic,University of Pennsylvania PressClark.S.R, 2003,Representing the indus Body:Sex, Gender, Sexuality and the Anthropomorpic Terracotta Figurines from Harappa, Asian Perspectives

Cook, J. (2013). *Ice Age art: arrival of the modern mind.* The British MuseumDelluc, G.&B., 1978: Les manifestations graphiques aurignaciennes sur support rocheux des environs des Eyzies (Dordogne), Gallia préhistoire, Tome

Delporte H., 1979: L'image de la femme dans l'art préhistorique, Paris, Picard

Deraniyagala P.E.P, 1953, Ferro – Lithic or Early Historic Terracotta Statuary and a Cist from Ceylon, Spolia Zeylanica, Ceylon Government at the Government Press

Deraniyagala P.E.P, 1953, Some Aspects of the Prehistory of Ceylon, Part III, Spolia Zeylanica, Ceylon Government at the Government Press

Deraniyagala S.U, 1992,The Prehistory of Sri Lanka,Department of Printing, Government of Sri Lanka

Duhard J., Roussot A., 1988: Le gland pénien sculpté de Laussel (Dordogne), Bulletin de la Société préhistorique française

Eshleman. C 2003, *Juniper Fuse: Upper Palaeolithic Imagination & the Construction of the Underworld.* Wesleyan University Press.

Leroi-Gourhan A., 1973: Prähistorische Kunst: d. Ursprünge d. Kunst in Europa, Herder

Madhusanka.W.R.K,2021, **ප්‍රාග් ඓතිහාසික සංගීතය ප්‍රතිනිර්මාණය කිරීම බෙල්ලන්බැඳි පැලැස්ස කැණීමෙන් හමුවූ මානව අස්ථියක් ඇසුරෙන් සිදුකල අත්හදාබැලීමේ පුරාවිද්‍යා අධ්‍යයනයක්**, Proceeding of N.A.S.2021, Department of Archaeology

Marshack, A., 1972: The Roots of Civilization: the Cognitive Beginning of Man’s First Art, Symbol and Notation New York, McGraw-Hill

Mithen, S. (2006). *The Singing Neanderthals.* Phoenix (UK ed. Edition)

Morley I, 2003, The evolutionary Origins and Archaeology of music, Cambridge university

Mortillet A. de, 1906: Deux curieuses pièces de la grotte du Placard, Bulletin de la Société préhistorique française

Müller-Beck, H. and Albrecht, G. (Ed.), 1987: Die Anfänge der Kunst vor 30000 Jahren Theiss: Stuttgart

Nelson.S, 1990, Diversity of the Upper Paleolithic ‘Venus’ Figurines and Archaeological Mythology, American Anthropological Association

Peyrony D., 1946: Périgord, Gallia, Tome 4

Perera, H.N. 2010, Prehistoric Sri Lanka, late Pleistocene rock shelters and an open air site Robert, R., 1946: Fouilles à la grotte de Bédeilhac, Bulletin de la Société préhistorique

Somadeva,R:2022,About Pre historic Vagina, 7 May, P.G.I.A.R, Colombo, Sri Lanka

françaiseSrejovic, D., 1972: Europe's first monumental sculpture: new discoveries at Lepenski Vir (New aspects of antiquity)

Vimalawathi.B,2022, About Kilimalaya, 20 May, No 33.Kekuluwela, Aralaganvila, Sri Lanka

# නූතන ස්තූප සංරක්ෂණය; පුරාවිද්‍යාත්මක අගයන් ආරක්ෂා කරමින් කාලීන අවශ්‍යතා සපුරා ගැනීම

ඩබ්.එම්. චින්තක සඳරුවන්

## හැඳින්වීම

පුරාවිද්‍යාත්මක උරුමය සම්බන්ධයෙන් කාලීනව විවිධ මතවාදයන් සමාජගත වී ඇති අතර ඒවා දේශීය මෙන්ම විදේශීය මූලයන්ගෙන් ජීවය ලබයි. ලාංකික සමාජය තුළ බෞද්ධ දර්ශනය මත පදනම්ව උරුමයේ පැවැත්ම සිදුව ඇති බව ඒ පිළිබඳව සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් ගම්‍යමාන වේ. නමුත් රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමත්, රාජධානි නැගෙනහිරට විතැන් වීමත් සමග බෞද්ධ සංස්කෘතිය මගින් බිහි කළ මෙරට සංස්කෘතිය ක්‍රමිකව බිඳ වැටීම ආරම්භ වූ බව දැක්වීම අසත්‍යයක් නොවනු ඇත. එසේම 1815 වන විට මෙරට රාජ්‍යාණ්ඩුව සම්පූර්ණයෙන්ම විනාශ වීමත් සමග පුරාවිද්‍යාත්මක උරුමය තවදුරටත් මෙරට වාසීන්ගේ බැඳීමෙන් දුරස් වේ. කෙසේ වෙතත් පසුකාලීනව මෙරට උරුමයන් පිළිබඳ යටත්විජිත පාලකයෝ යම් යම් ක්‍රමවේද අනුගමනය කළ අතර, එහිදී මූලික වාර්තාගතකරණ ක්‍රමවේදයන්ගේ සිට කැණීම්, සංරක්ෂණ කාර්යය සඳහා මැදිහත්වීම් සිදු කළහ. නමුත් යටත්විජිත පාලනය තුළදී උරුම ස්ථාන හා ස්මාරක සම්බන්ධයෙන් සිදු කරන මැදිහත්වීමේ ස්වරූපය එතෙක් කාලයක් පුරා ලාංකිකයන් පවත්වා ගෙන ආ ක්‍රමවේදයන්ගෙන් සම්පූර්ණයෙන්ම පරිබාහිර වූ බව අවබෝධ කර ගත හැකි වේ. බ්‍රිතාන්‍ය පාලකයන් ඉන්දියාවේ පුරාවිද්‍යා ස්මාරක කළමනාකරණය කිරීමට ගනු ලැබූ හා සකස් කළ යෝජනාවලි මෙරටදීද අත්හදා බැලීමට ලක් කරන ලදී. එහිදී ද්‍රව්‍ය මූලික සංරක්ෂණ ක්‍රමවේද පිළිබඳවත්, පවතින ආකාරයෙන්ම උරුම ස්ථාන හා ස්මාරක ආරක්ෂා කර ගැනීමටත් කටයුතු කරන ලදී. ඇතැම් අවස්ථාවලදී මෙරට බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාර මෙහෙය වූ කණ්ඩායම් විසින් මෙම ක්‍රමවේදයන්ගෙන් බැහැරව ඇතැම් ස්මාරක පැරණි ස්වරූපයටම යාවත්කාලීන කරන ලදී. 1873 දී නාරන්විට සුමනසාර හිමි බෞද්ධ පුනර්ජීවන කණ්ඩායම් සමග එක්ව රුවන්වැලි සෑය ප්‍රතිසංස්කරණය කිරීම මෙයට හොඳ නිදර්ශකයකි. කෙසේ වෙතත් 1931 බරා ප්‍රතිපත්තිය, 1964 වැනිස් පත්‍රිකාව වැනි දෑ මගින් ගෝලීය ස්මාරක සංරක්ෂණයට ද්‍රව්‍ය මූලක සංකල්ප හඳුන්වා දුන් අතර, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත්, 1980 දශකයේදී මධ්‍යම සංස්කෘතික අරමුදලද මෙම ක්‍රමවේද භාවිත කරමින් මෙරට ස්මාරක ආරක්ෂා කර ගැනීමට කටයුතු කළේය. නමුත් මෙම සංරක්ෂණ සංකල්ප ආසියාතික රටවල් සඳහා යෝග්‍ය නොවූ අතර, 1994 නාරා සමුළුව විසින් මෙම සංකල්ප අභියෝගයට ලක් කරන ලදී. ඒ අනුව දශක කිහිපයකට පසුව සංරක්ෂණ ක්‍රමවේද ක්‍රමිකව වෙනස් කරමින් ප්‍රජාව මූලික කරගත් උරුම ස්ථාන සංරක්ෂණය හා කළමනාකරණ ක්‍රමවේදයන් භාවිත කරන්නට උත්සාහ දැරීය. එහි පළමු අවස්ථාවක් ලෙස 1998 වර්ෂයේදී ත්‍රස්ත ප්‍රහාරයකින් විනාශ වී ගිය බෞද්ධයන්ගේ මුදුන් මලකඩ බඳු දළදා මාළිගාව නැවත ප්‍රතිනිර්මාණය දැකිවිය හැකිය (විජේසූරිය, 2021:11). ඒ අනුව යමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෑතකාලීනව ස්තූප සංරක්ෂණය සඳහා දිගු කාලීන ආරක්ෂණ වැඩ පිළිවෙළක් සකස් කරන ලදී. එමගින් ස්මාරක සතු පුරාවිද්‍යාත්මක ලක්ෂණ ආරක්ෂා කර

ගැනීමත්, ජීව කාලය උපරිම කිරීමත්, ස්මාරකයේ පූර්ණ අංග නිර්මාණය කරමින් ප්‍රජා මූලික බැඳියාවක් ඇති කිරීමට කටයුතු කරයි. මෙහිදී ඒ පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ.

**අරමුණු**

මෙරට උරුම ස්ථාන හා ස්මාරක නිර්මාණාත්මක අවධියේ සිට පවත්වා ගත් ආකාරය හා ඒවා අතර තිබූ ප්‍රජා කේන්ද්‍රිය සහසම්බන්ධය අවබෝධ කර ගැනීම මෑතකාලීනව ස්මාරක සංරක්ෂණයේදී අවධානය යොමු කළ යුතු විශේෂ කරුණක් බව හඳුනා ගත් අතර, විනාශ වී ගිය ස්තූප නැවත ප්‍රතිනිර්මාණයේදී ප්‍රජා අවශ්‍යතාවන්ට ප්‍රමුඛත්වය දීමත් පුරාවිද්‍යාත්මක ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් අන්තර්ජාතික ප්‍රතිපත්තීන් අනුගමණය කිරීමත් කළ යුතු කාර්යයකි. මෙම විශේෂ අරමුණු ආරක්ෂා කර ගනිමින් ස්මාරක ප්‍රතිසංස්කරණය කිරීමේ වැදගත්කම ජනගත කිරීම මෙහි මුඛ්‍ය අරමුණ වේ.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා 2000 දශකයේ සිට මෙරට සංරක්ෂණය කළ ස්තූප පිළිබඳව අධ්‍යයනය කළ අතර, ඒවා මෑතකාලීනව පවතින ස්වරූපයත් මුහුණ පා ඇති ගැටලු පිළිබඳවත් සොයා බලන ලදී. එහිදී දශක ගණනාවක් සංරක්ෂණය හා මැදිහත්වීම් සිදු කරමින් ස්තූප නිර්මාණ කාර්යය අවසන් කළ අනුරාධපුරය, ජේතවනාරාම ස්තූපය හා අභයගිරිය ස්තූපය ආදර්ශක ලෙස තෝරා ගන්නා ලදී. ඒ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෑතකාලීනව සංරක්ෂණය කර ඇති කුඩා ස්තූප වන එප්පාවල නාවාගල ස්තූපය, පොළොන්නරුව උනගලා වෙහෙර, මැදවච්චිය මෙත්තපී වෙහෙර, තණමල්විල සීමාපච්ච යන ස්තූප සංරක්ෂණ නව ක්‍රමවේද අනුව සංරක්ෂණය කිරීම් සිදු කර ඇති ස්තූප ලෙස හඳුනා ගත් අතර, මෙම ස්තූප පාදක කර ගනිමින් උක්ත ප්‍රස්තුතය සාධනය කිරීම සිදු කරයි.

**විමර්ශනය**

දාගැබ යන වචනය සංස්කෘතයේ එන 'ධාතු' සහ 'ගර්භ' යන වචනයන්ගෙන් බිඳී ආ වචනාර්ථයක් ලෙස ගැනේ (වික්‍රමගමගේ, සී. 1990:16). ඒ අනුව ස්තූප, ථූප, තුබ, තුභ, චෛත්‍ය, වෙහෙර යන විවිධ පර්යාය නාම මේ සඳහා භාවිත වනු දැකිය හැකිය (ප්‍රේමතිලක, 1998:210). ස්තූපයක් නිර්මාණය කිරීම මූලිකවම බෞද්ධ සංකල්පයක් නොවන බව දැනගත යුතු අතර, එය ජෛනාගමිකයන් විසින් හා නොයෙක් යක්ෂ ඇදහිලිකරුවන් විසින් සිරිතක් කොට ගෙන තිබූ බව භාරතීය ඉතිහාසය පිළිබඳව විමසීමෙන් හඳුනාගත හැකි කරුණකි (වික්‍රමගමගේ, සී. 1990:18). ස්තූප සෑදීම ප්‍රාග්-බෞද්ධ චාරිත්‍රයක් වූ බවත් චක්‍රවර්තී මහරජවරුන් ද ථූපහාර පුද්ගලයන් බව බුදුන්ම මහාපරිනිබ්බාණ සූත්‍රය තුළ විස්තර කරයි (Davids, Vol, II:156). පරණවිතාන සඳහන් කරන පරිදි, 'බුදුසමයේ පහළ වීමට පෙර සිට තිබූ ආගම් ඇතැම් චෛත්‍ය ඉදි කරවන ලද්දේ තම රජවරුන්ගේ මෘත ශරීර තැම්පත් කිරීමට විය හැකිය' බව දක්වයි (පරණවිතාන, 1997:2). පුරාණ ස්තූප නිර්මාණය වීමේ ආරම්භය ඉන්දීය මූලාශ්‍රයන් සම්බන්ධ බවත් ස්තූපය වෛදික

ඉන්දියාවේ ශ්මශාන ප්‍රභවය කොට ගෙන නිර්මාණය කළ බව ෆර්ගසන් විස්තර කරයි (වික්‍රමගමගේ, 1990:9). ඒ පිළිබඳ හොඳම නිදර්ශකයන් ඊජිප්තු පිරිමිඩ සුසාන අපට සපයයි. කෙසේ වෙතත් බෞද්ධ ස්තූප නිර්මාණය වීම පිළිබඳව බුද්ධකාලීනව සිටම තොරතුරු හමුවේ. බුදුන් වහන්සේගේ අගසව් දෙනම වූ සැරියුත් හා මුගලන් තෙරවරුන්ගේ භෂ්මාවශේෂ තැම්පත් කර ස්තූප කිරීමට බුදුන් අවසර දුන් බවත් (වික්‍රමගමගේ, 1990:11), ලක්දිව බුද්ධ කාලීනවම ස්තූප දෙකක් ගොඩනැංවූ බවත් (මහාවංසය, I: 33-39), මූලාශ්‍රයෙහි සඳහන් වේ. කෙසේ වෙතත් බුදු දහම නිල වශයෙන් මෙරට ස්ථාපිත වීමෙන් පසු ප්‍රථමවරට ස්තූපයක් ඉදි කර ඇත්තේ දේවානම්පියතිස්ස රාජ (ක්‍රි.පූ. 250-210) සමයේදීය. ඒ පිළිබඳ විස්තරයක් මහාවංසයේ මෙන්ම දීපවංසයේද සඳහන් වේ (1959: 15:24-27). ඉන් පසුකාලීනව කුඩා ප්‍රමාණයේ මධ්‍ය ප්‍රමාණයේ හා මහා පරිමාණයේ ස්තූප ආකෘතීන් කලින් කලට නිමැවුණු බවත්, ඒවාට කාලීනව නවාංග එක් වීමත්, නවකම් කිරීමත් සිදු වූ බව හඳුනාගත හැකි වේ. එසේම බෞද්ධ සංකල්ප අනුව යමින් මෙම ස්මාරක කළමනාකරණය කර ගැනීම කාලීනව සිදු වූ බවත්, ඒ සඳහා නිර්දේශ බෞද්ධ දර්ශනයේ එන මූලික ඉගැන්වීම් කේන්ද්‍රකර ගෙන ආභාසය ලබා ඇති බව පෙනේ (ගුණවර්ධන, 2005:14). බුදුන් වහන්සේ ජීවත්ව සිටි අවධියේදී සංඝයා වහන්සේලා සඳහා විහාරාරාම ගොඩනැඟිලි තම වාසස්ථාන ලෙස පරිහරණය කිරීමට අනුදැන වදාළ අතර ඉක්බිතිව ඒවායේ ඇති විය හැකි කැඩීබිඳීයාම්, ක්ෂය වීම් ආදී ස්වාභාවික උපද්‍රව සඳහා අලුත්වැඩියා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ග විස්තර කර ඇත. ඒවා මෙසේය,

*01. සුදු පැහැ, කළු පැහැය හා ගුරු පැහැ පිළියම් කිරීම.*

*02. රළු බිත්තියේ සුදු පැහැය නොරැඳෙන විට දහයියා කුඩු අත්ලෙන් තුනී කොට සුදු පැහැය සකස් කිරීම.*

*03. ගුරු පැහැය නොරැඳෙන විට කුඩු මුසු මැටි අත්ලෙන් මැද ගුරු පැහැය ගැනීම.*

*04. බිත්තියේ තැනින් තැන බිංදු වශයෙන් උස්ව නැඟී සිටියේ නම් රෙදි කඩකින් පිස දැමීම.*

*05. බිම කළු පැහැය ගැනීම සඳහා ගැඩවිලි පස්, තෙල්ලි හා මැලියම් අත්ලෙන් මැද ගැම.*

*06. විහාර බිත්ති දිරන විට ලී විද කණු සිටුවා බිත්ති බැඳීම.*

*07. විහාර බිත්ත තෙමෙන විට එහි ආරක්ෂාව සඳහා වාසුගොම, අළු මැටි එකට මිශ්‍රකොට පැළැල්ලක් එයට සම්බන්ධ කර ගැනීම (ගුණවර්ධන,* 2005:14-15).

මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ බෞද්ධ සංඝයා වහන්සේලා තම ආරාම නඩත්තු කළ බවත් ක්‍රිස්තු පූර්ව යුගයේ සිටම කළමනාකරණ කටයුතු පිළිබඳව දැන සිටි බවත්ය. අංගුත්තර නිකායට අයත් චුල්ල වග්ගයේද බෞද්ධ සංඝයා වහන්සේලා සඳහා විහාරාරාම ඉදි කිරීම, රැකබලා ගැනීම හා ඒවා ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි මැදිහත් වීමට අනු දැන වදාළා ඇත.

*''අනුජානාමි භික්ඛවේ නවකම්මං දාතුං*
*නවකම්කො භික්ඛවේ භික්ෂු උත්සුක්කං*

*ආපජ්ජිස්සති කිත්ති නූකො විහාරො*

*ඛිප්පං පරියොසනං ගච්ජෙය්‍යාති*

*ඛණ්ඩප්ලුල්ලං පටිසංඛරිස්සති (චුල්ලවග්ග පාලි -02 කාණ්ඩය* 2005:170) ''

'නවකර්ම කරන්නා වූ භික්ෂුව විහාර කටයුතු අවසානය කෙසේ කරන්නේදැයි උත්සාහවත් වන බවත්, කැඩීබිඳී ගිය තැන් ප්‍රතිසංස්කරණය කරන බවත් මින් ගම්‍ය කරයි. නව කර්ම සිදු කිරීමේදී උරුමයෙහි භෞතික ස්වරූපය මත කාර්ය සාධන කාලය තීරණය කිරීමටද අනුමැතිය ලැබී ඇති ආකරයද චුල්ලවග්ග පාලියේ දක්වා ඇත.

*''අනුජානාමි භික්ඛවේ අකතං වා විහාරං විප්පකාතාං වා වනකමමං දාතුං*

*ඛුද්දකෙ විහරේ කම්මං ඔලොකෙතවා ඡපපංච වසසිකං නවකමමං දාතුං*

*අඩ්ඪයොගෙ ඛමං ඔලොකෙතවා සතතටඨ වසසිකං නවකමමං දාතුං*

*මහලලකෙ පාසාදෙවා කමං ඔලොකෙතවා දස ද්වාදස වසසිකං නවකමමං දාතුං (චුල්ලවග්ග-පාලි 02 කාණ්ඩය,* 2005: 210). ''

මෙහි දක්වා ඇති 'කම්මං ඔලොකෙතවා' යන්න තුළින් අදහස් වන්නේ 'කළ යුතු කාර්ය බලා' යන්නයි (මල්සිරි, 2011: 38). ඒ අනුව යමින් මෙම බෞද්ධ සංස්කෘතිය අනුව නිර්මිත දෑ රාජකීයන්, ඇමති - ඇමති මෙන්ම ගම් ප්‍රධානීන් විසින් සිදු කරන ලද බවත්, එහිදී ස්තූප ඉදි කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සිදු කර ඇති බවත් දැනට ශේෂව පවතින සාධක තුළින් හඳුනා ගත හැකිය. ස්තූප නිර්මාණය කිරීමේදී කුඩා, මධ්‍යම හා මහා පරිමාණයේ ස්තූප නිර්මාණය කර ඇති අතර, ඒවා පවත්වා ගෙන යාම නඩත්තු කිරීම ආදිය සඳහා විවිධ ක්‍රමවේද භාවිත කළ බව හඳුනාගත හැකිවේ. ලක්දිව ප්‍රථම ස්තූපය වශයෙන් පිළිගනු ලබන්නේ දේවානම්පිය තිස්ස (ක්‍රි.පූ. 250-210) රජු විසින් ඉදි කරන ලද ථූපාරාමයයි *මහාවංශය (ප්‍රථම භාගය),* 1996:121 :24-65). මෙම ස්තූපය ප්‍රථම ස්තූපය වූ නිසාත් බුදුන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැම්පත් කර ඇති නිසාවෙනුත් පසුව රජ වූ රාජ්‍ය අනුප්‍රාප්තිකයන් මෙම උරුමයේ ආරක්ෂාව සඳහා විවිධ කටයුතු සිදු කළ බව හඳුනා ගත හැකිය (ගුණවර්ධන, 2005:23).

| කාර්යය | පාලකයා |
| --- | --- |
| ස්තූපයේ ආරක්ෂාවට ගල් ආවරණයක් සැකසීම | ලජ්ජිතිස්ස රජු (ක්‍රි.ව. 119-109) |
| කැඩී ඉඳී ගිය තැන් අලුත්වැඩියාව | ගෝඨාභය රජු (ක්‍රි.ව. 253-266) |
| ස්තූපයේ උපරිබාගයේ රනින් ඡත්‍රයක් පැලඳවීම | පළමුවැනි උපතිස්ස රජු (ක්‍රි.ව. 368-410) |
| සමස්ත ස්තූපය ප්‍රතිසංස්කරණය | ධාතුසේන රජු (ක්‍රි.ව. 459-477) |
| ධාතු ගර්භය, ස්තූපයේ පියස්ස ඇතුළු අලුත්වැඩියා කිරීම් | පළමුවැනි අග්ගබෝධි රජු(ක්‍රි.ව. 575-608) |
| කැඩී ඉඳී ගිය තැන් අලුත් වැඩියාව | දෙවැනි කස්සප රජු (ක්‍රි.ව. 650-659) |

මෙම කරුණු පිළිබඳව විමසිලිමත්ව බැලීමේදී රාජ්‍ය පාලකයා හා පාලිතයන් විසින් කලින් කලට විවිධ මැදිහත් වීම් ස්තූපය සම්බන්ධයෙන් සිදු කර ඇති අතර එය කාලීන අවශ්‍යතාවක් ලෙස සලකා ඇති බව

හඳුනාගත හැකි ලක්ෂණයකි. ඇතැම් විට එම නවකම් කිරීම් මගින් පාලකයන්ගේ හා පාලිතයන්ගේ අපේක්ෂා හා හැකියා ප්‍රතිනිර්මාණය කළ බවද උපකල්පනය කළ හැකි වේ. කෙසේ වෙතත් මෙහිදී අධ්‍යයනයට බඳුන් කරනු ලබන ස්තූප කාලීනව සිදුවන හායන තත්ත්වයන් නිසාවෙන් විනාශ වී තිබූ ස්තූප වන අතර, විවිධ පාර්ශ්වයන්ගේ ඉල්ලීම් මත මෙම ස්තූප කැණීම් කොට සංරක්ෂණ කාර්යයන් සිදු කරනු ලැබ ඇත. මෙම කාර්යන් තුළදී ස්තූප නැවත ගොඩ නැගීම් කාර්යය සඳහා ප්‍රජා මූලික සහභාගීත්වය ප්‍රධාන වන අතර, ඔවුන්ගේ මූල්‍ය දායකත්වය හා සහභාගීත්වයත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණයත් හා තාක්ෂණික මග පෙන්වීමත් මේ සඳහා ලබා දෙමින් සංරක්ෂණ කටයුතු සිදු කිරීම් සිදු කර ඇත. මෑතකාලීනව සැදැහැවතුන් හා බෞද්ධ භික්ෂූන්ගේ අවශ්‍යතා හා ආකල්පය වන්නේ තම විහාරස්ථ ස්තූපයේ සුදුහුණු පිරියම් කර කොත් පැලැඳවීමයි. නමුත් පුරාවිද්‍යාත්මක නියමයන්ට අනුව ස්තූප කැණීම්වලින් පසුව ස්තූප සංරක්ෂණයේදී ස්තූපයේ පැරණි සාධක ආරක්ෂා කර ගනිමින් සංරක්ෂණ කාර්යය සිදු කළ යුතු වේ. මෙම අපේක්ෂාවන් ද්විත්වයම සපුරා ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යෝජනාවලි සකස් කර ඇති අතර, එහිදී ස්තූපයේ ශේෂ වී ඇති පැරණි ස්තර හැකි තරම් දුරට ආරක්ෂා කර ගනිමින් ස්තූපය ගොඩ නැගීමටත් ස්තූප සංරක්ෂණ කාර්යය අවසානයේ හුණු පිරියම් කොට කොත් පැලැඳවීමත් සිදු කරනු ලැබේ.

එප්පාවල, කටියාව, නාවාගත ස්තූපය සංරක්ෂණය කිරීමේදී කැණීම්වලින් අනාවරණය කර ගත් මුල් නිර්මාණයේ පුරාවිද්‍යාත්මක අගයට කිසිදු හානියක් සිදු නොවන පරිදි තහවුරු කිරීම කර ඇත. මෙම සංකල්පය උරුම සංරක්ෂණයේ තත්‍යභාවය නැතහොත් නිර්මලභාවය ලෙසද සාකච්ඡාවට ගැනේ. සංරක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයනවල නිරතවන්නන්ට කෘතියේ මුල් ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා මෙම ක්‍රියාවලිය වැදගත් වේ. නාවාගල චෛත්‍යයේ පළමු සහ දෙවන පේසා මේ අයුරින් සංරක්ෂණය කර ඇත්තේ ඉහත සංකල්පය යථාර්ථයක් බවට පත් කර ගනිමිනි. නාවාගල චෛත්‍යයේ ගර්භය විශාල වශයෙන් ගරා වැටී තිබුණු අතර ශේෂව තිබුණු සාධක මතින් එහි නියමිත හැඩය වන බුබ්බුලාකාර හැඩය හඳුනා ගෙන ඒ අනුව නව සහ පැරණි ගඩොල් හැකි තාක් භාවිත කරමින් නැවත ඉදි කිරීම සිදු කර ඇත. ප්‍රාකාර බැමි, පීඨිකා ආදිය ද මෙලෙස ප්‍රතිසංස්කරණය කර ඇත. ස්තූප කැණීමෙන් හමු වූ ස්තූප ආකෘති හැඩැති රන් සහ වීදුරු කරඬුවල හතරැස් කොටුව, කොත්කැරැල්ල සහිතව අංග සම්පූර්ණව නිර්මාණය කර තිබීමෙන් පැරණි මුල් ඉදි කිරීම් අවධියේ චෛත්‍යය හැඩය පිළිබඳ යම් අදහසක් ලබා ගත හැකි විය. ඒ අනුව පුරාවිද්‍යාත්මක සාධක අනුව යමින් මෙම චෛත්‍යයේ හතරැස්කොටුව සහ කොත්කැරැල්ල නැවත ඉදි කිරීම සිදු කර ඇත. එසේම පළමු හා දෙවන පේසාවල තිබූ තරමක් විශාල බොරදම් ගල් 50%ක් පමණ ප්‍රමාණයක් විනාශ වී තිබූ අතර පේසාව ඉදිකිරීමට අවශ්‍ය එම බොරදම් ඉංජිනේරු ගඩොල් යොදා ගනිමින් පෙර තිබූ ආකාරයට ම සකස් කිරීම සිදු කර ඇත (ආකෘති ගල් සකස් කිරීම). ඒ අනුව චෛත්‍ය පේසාවේ පහළම කොටසෙහි ඉපැරණි බොරදම් ගල් දැකිය හැකි අතර දෙවන පේසාවේ දක්නට ලැබෙන්නේ එම ආකෘතිය අනුව නව ගඩොල් යොදමින් ඉදි කළ බොරදම් ගල් වේ. මෙතුළින් ස්තූපයේ පුරාවිද්‍යාත්මක අගයන් ආරක්ෂා කර ගැනීමට හැකි වී ඇත. පහතින් දක්වා ඇති එප්පාවල, කටියාව, නාවාගත ස්තූපය කැණීම් කිරීමෙන් පසු ගර්භය සංරක්ෂණය සඳහා සකස්

කළ සැලසුම වන අතර (සැලසුම් අංක 01), එහි දක්වා ඇති පරිදි ස්තූප කැණීමෙන් පසුව සංරක්ෂණය කිරීමේදී පුරාවිද්‍යාත්මක අගයන් ආරක්ෂා කර ගනිමින් සම්පූර්ණ ස්තූපයම ඉදි කර කොත් පැලඳවීම සිදු කර ඇත. එහිදී පුරාවිද්‍යාත්මක සාධක පැවති පැරණි පේසාවන්, පැරණි ස්තූපයේ මුල් අවධියේ ඉදි කළ ස්තූපයේ කොටසක් ශේෂ කරමින් ස්තූප සංරක්ෂණය අවසන් කර ඇත. තෝරා ගන්නා ලද ස්තූප සම්පූර්ණයෙන්ම පාහේ විනාශ වී පැවති ස්තූප බැවින් ඒවායේ පමණක් බොහෝ අවස්ථාවල පේසාවන් පමණක් පැරණි ස්වරූපයෙන්ම ආරක්ෂා කර ගැනීමට හැකියාව තිබිණ. පොළොන්නරුව උණගලා වෙහෙරෙහි ස්තූපය (සැලසුම් අංක 02) සම්පූර්ණයෙන්ම විනාශ වී තිබූ අතර දැඩි පරිශ්‍රමයක් යොදා ස්තූප සංරක්ෂණ කාර්යය අවසන් කරන ලදී. එහිදී ස්තූපය සම්පූර්ණයෙන්ම සුදුහුණු පිරියම් කිරීමට අදාළ විහරස්ථ දායක සභාව හා පාර්ශ්වකරුවන් ඉල්ලීම් කළ ද පුරාවිද්‍යාත්මක ලක්ෂණ ආරක්ෂා කර ගැනීම අවශ්‍ය බැවින් එසේ නොකළ හැකි බව දන්වා ඇති අතර, කෙසේ වෙතත් පසුව ඒ සඳහා අකමැත්තෙන් එකඟ වී ස්තූප සංරක්ෂණ අවසන් කර ඇත. නමුත් පසුව විහාරස්ථ දායක සභාව පුරාවිද්‍යාත්මක ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සිදු කළ සංරක්ෂණ කාර්ය අගය කිරීමට ලක්කර ඇත. මැදවච්චිය මෙත්තපී විහාර ස්තූපයද නිධන් සොරුන්ගේ ග්‍රහණයට ලක්ව ගර්භයේ සුළු ප්‍රමාණයක් පමණක් ශේෂව පැවතී ඇති අතර, ස්තූප කැණීම්වලින් පසු විහාරස්ථ දායක සභාව ස්තූපයේ පුරාවිද්‍යාත්මක ලක්ෂණ ආරක්ෂා කරමින් සංරක්ෂණය කර දෙන මෙන් ඉල්ලීම් කර ඇත. මෙම ස්මාරකය උස් ස්ථානයක පිහිටීම නිසා ඓතිහාසික භූ දර්ශනය නැවත සකස් කිරීමට හැකිවීමත්, ස්තූපය සම්පූර්ණයෙන්ම සංරක්ෂණය කිරීමෙන් එහි පැවැත්ම තහවුරු වන බැවින් හා ආගමික අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම උදෙසා ස්තූපය සම්පූර්ණයෙන්ම සංරක්ෂණය කර කොත් පැලඳවීම සිදු කර ඇත. 2017 වර්ෂයේ මෙම සංරක්ෂණ කාර්යය ආරම්භ කර ඇති අතර, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය යටතේ තාක්ෂණික ශ්‍රම දායකත්වය ලබා දීමත්, විහාරස්ථ දායක සභාව මගින් භෞතික ද්‍රව්‍ය සපයා දීමත් සිදු කර ඇත. තණමල්විල සීමා පච්ච ආරණ්‍ය සේනාසනයේ ඇති ස්තූප ගොඩැල්ල කැණීමෙන් පසුව සංරක්ෂණය කිරීම සඳහා පූර්ණ මූල්‍ය ප්‍රතිපාදන පෞද්ගලික සමාගමක් විසින් දරනු ලැබූ අතර, 2022 වර්ෂයේදී ස්තූපයේ කොත් පැලඳවීම සිදු කරන ලදී. මෙම ස්තූපයේ ද පේසාවළලු, ප්‍රාකාර බැම්ම හා ගඩොලුමය සළපතල මලුව පුරාවිද්‍යාත්මක ලක්ෂණ ආරක්ෂා වන ලෙස සංරක්ෂණය කිරීම සිදු කරන ලදී.

**සමෝධානය**

මෙරට බෞද්ධාගමික ස්මාරක ඉදි කිරීම හා කළමනාකරණය කිරීම සඳහා ගනු ලැබූ ක්‍රමවේද පිළිබඳව පුළුල් විමසීමක් කරන්නේ නම් එය කලින්කල පාලකයාගේ අභිමතාර්ථ හා ඔවුන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමටත් පාරම්පරිකත්වය හා අනන්‍යතා ආරක්ෂා කර ගැනීමටත් සිදු කළ බව හඳුනා ගත හැකිවේ. ඒ පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍රය, පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය තුළින් තොරතුරු අනාවරණය වේ. මෙම ක්‍රමවේදය යටත්විජිත පාලන යුගය තුළදී වෙනසකට ලක් වූ බව හඳුනාගත හැකිය. ද්‍රව්‍ය මූලික සංරක්ෂණ ක්‍රම ජනප්‍රියත්වයට පත්වීමත් ඒ මත සංරක්ෂණ ක්‍රමවේද සකස් වීම නිසා නිලධාරී අවශ්‍යතා පුරාවිද්‍යාත්මක උරුමයේ ආරක්ෂණය සඳහා භාවිත කළ බව පෙනේ. නමුත් කාලීනව මෙම මතවාද ආසියාතික රටවල්

අභියෝගයට ලක් කරනු ලබන අතර, විවිධ අණපණත් හා ප්‍රඥප්ති මගින් උරුම ස්ථාන කළමනාකරණය සඳහා නව ක්‍රමවේද අත්හදා බලයි. එහිදී ආසියාතික රටවල භාවිත වූ ප්‍රජා මූලික සංකල්ප මත ස්මාරක පවත්වා ගෙන ඒම පිළිබඳව සාකච්ඡාවට බඳුන් වන අතර, පුරාවිද්‍යාත්මක උරුමය හා බද්ධව කටයුතු කරනු ලබන පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය ලබා දෙමින් උරුම ස්ථාන සතු අගයන් ආරක්ෂා කරගනිමින් ස්මාරක සංරක්ෂණයට න්‍යායන් සකස් වේ. ඒ අනුව ප්‍රජා මූලික උරුම කළමනාකරණ සැලසුම් ලොව තුළ පිළිගැනීමට ලක්වන අතර, මෙරටද එම සංකල්ප අතහදා බැලීම සිදු කරයි. ඒ අනුව ස්මාරක සංරක්ෂණයේදී මෑතකාලීනව ප්‍රජා සහභාගීත්වය පුළුල් අන්දමින් ක්‍රියාත්මක වේ. මෙම නිසා බොහෝ සංරක්ෂණ කාර්යයන් පහසු වී ඇති අතර, එතුළින් ස්මාරකයේ ආරක්ෂාව පැවැත්ම හා ස්මාරකය හා බැඳියාවක් ඇතිවීම සිදු වී ඇති බව අධ්‍යයනයේදී පැහැදිලි විය.

### මූලාශ්‍රය


ආනන්ද මෛත්‍රෙය, බී. සහ ජනාන්ද, යූ. (2005). **චුල්ලවග්ග පාලි (02 කාණ්ඩය).** දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ගුණවර්ධන, පී. (2005). **පුරාවිද්‍යා උරුමය ආකෘති, සංකල්ප සහ කළමනාකරණය**. රාජගිරියඃ සමන්ති පොත් ප්‍රකාශකයෝ.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. (1959). **දීපවංසය.** කොළඹ : ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

පරණවිතාන, එස්. (1997). **ලංකාවේ ස්තූපය.** බත්තරමුල්ල : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.


ප්‍රේමතිලක, එල්. (1998). **දැගැබ (අපේ සංස්කෘතික උරුමය, ද්විතීක කාණ්ඩය).** කොළඹ :සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

මල්සිරි, ඩබ්.අයි. (2011), **ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යා උරුම සංරක්ෂණයේ ඓතිහාසික විකාශය.** කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.


වික්‍රමගමගේ, සී. (1990). **ස්තූප.** නුගේගොඩ : ද කොලිටි ප්‍රින්ටස්.

විජේසූරිය, ඩබ්. (2021). **දළදා මාලිගාව ප්‍රතිසංස්කරණය ඃහානි වූ ජන අනන්‍යතාන නැවත ගොඩ ගැනීමක් ලෙස.** කොළඹඃ ICOMOS Sri Lanka.

ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත, බටුවන්තුඩාවේ. (1996). **මහාවංශය (ප්‍රථම භාගය)**, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.


**සැලසුම් අංක 01**




**සැලසුම් අංක 02**



**නාවාගල ස්තූප සංරක්ෂණයේ අවස්ථාවක්**

# පුරාවිද්‍යා උරුම කළමනාකරණය සඳහා මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම

**මල්ෂා මධුශානි රණසිංහ**

යම්කිසි සමාජයක් සතු පුරාණ ස්මාරක, ගොඩනැගිලි ඇතුළු චංචල හා නිශ්චල පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කරගැනීමේ, මතුකර ගැනීමේ, තහවුරු කිරීමේ, නැවත ප්‍රයෝජනයට ගැනීමේ හා හැකි උපරිම කාලයක් විනාශ නොවී පවත්වා ගැනීමේ කාර්යය විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව, තිබෙන සීමිත සම්පත් වඩාත් කාර්යක්ෂමව හා සඵලදායී ලෙස යොදා ගනිමින් සිදු කිරීමේ ක්‍රියාවලිය පුරාවිද්‍යා උරුම කළමනාකරණය ලෙසට හඳුන්වනු ලබයි.

පුරාවිද්‍යා උරුම කළමනාකරණ ක්‍රියාවලිය හා සබැඳි ප්‍රධාන සම්පත් ද්විත්වයකි.

- උරුම අංග
- මානව සම්පත

පුරාවිද්‍යාව හා සබැඳි උරුම අංග සංස්කෘතික උරුමය වේ. මිනිසා විසින් තම සංස්කෘතීන්ට අදාළ ව නිර්මාණය කර ඇති අතීතයට අයත් විවිධ අගයන්ගෙන් යුක්ත වූ නිර්මාණ සංස්කෘතික උරුමය ලෙසට නිර්වචනය කළ හැකි අතර, ප්‍රධාන වශයෙන් මෙම සංස්කෘතික උරුමය ස්පර්ශීය හා අස්පර්ශීය වශයෙන් දෙවර්ගයකි. තවදුරටත් විමර්ශනය කර බැලීමේ දී ස්පර්ශීය උරුමය චංචල උරුමය හා නිශ්චල උරුමය ලෙසට ද බණ්ඩනය කළ හැකි අතර ම අස්පර්ශිත සංස්කෘතික උරුම ව්‍යවහාරික උරුම ක්‍රියාකාරී උරුම හා වාග් විද්‍යාත්මක උරුම ලෙසට බණ්ඩනය කළ හැකි වේ.

උක්ත උරුම අංගයන් නිසි අයුරින් කළමනාකරණය කරමින් ආරක්ෂා කරමින් දිගු අනාගතයක් කරා රැගෙන යෑමේ සුවිශේෂී මෙහෙවර ඉටු කරනු ලබන්නේ මිනිසා විසිනි. ඒ සඳහා මිනිසා විසින් සපයනු ලබන ශ්‍රමයට විශේෂිත ස්ථානයක් හිමිවේ. ශ්‍රමය සපයන පුද්ගලයින් සේවා දායකයන් ලෙස හඳුන්වනු ලබන අතර කුමන හෝ ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් තම කායික හෝ මානසික ශක්තිය සපයන පුද්ගලයන් මානව සම්පත ලෙසට හැඳින්වේ.

උරුම කළමනාකරණ ක්‍රියාවලියෙහි සියලු ම අංශයන්හි ප්‍රධානතම කාර්ය භාරය සිදු කරනු ලබන්නේ මානව සම්පත විසිනි. මේ හේතුවෙන් මානව සම්පත සුවිශේෂී වේ. මෙම මානව සම්පත සජීව, සප්‍රාණික මෙන් ම ක්‍රියාකාරීවීම හේතුවෙන් උරුමය සඳහා වන මැදිහත්වීම් ඉහළ මට්ටමකින් කිරීමට හැකියාව ලැබේ. බාහිර පාර්ශ්වයන් තුළ ආයතනික ප්‍රතිරූපය ගොඩ නැංවීමේ හැකියාව ඔවුන් කෙරෙහි පවතී. සිතීමට හා ප්‍රතික්‍රියා දැක්වීමට හැකිවීම තුළින් අවශ්‍ය අවස්ථාවන්හි නිවැරදි ආකාරයෙන් මැදිහත්වීම් සිදු

කළ හැකිවේ. අරමුණු හා පරමාර්ථ සාධනය කර ගැනීමෙහිලා විධිමත් ලෙස සංවිධානය වී කටයුතු කිරීමේ හැකියාවෙන් යුක්ත ය. පුහුණුව හා සංවර්ධනය මඟින් මානව සම්පත්වල අගය වැඩි කර ගැනීමට හැකියාව පවතී. මෙමඟින් කාර්යක්ෂම හා සඵලදායී උපයෝජනයක් සිදු වන අතර සංවිධානයේ අරමුණු කෙරෙහි ඉතා වේගයෙන් ළඟාවීමේ හැකියාවක් පවතී. අනෙකුත් සම්පත්වලට නොමැති නිර්මාණශීලී හැකියාව මානව සම්පත සතු ය. පුද්ගලයාගෙන් පුද්ගලයාට විවිධත්වයක් පැවතීම මානව සම්පත සතු සුවිශේෂී අංගයක් මෙන් ම වැදගත් අංගයක් ද වේ. මානව සම්පත අභිප්‍රේරණය කිරීම තුළින් සේවක කාර්යක්ෂමතාව වැඩිකර එය ආයතනයේ ඵලදායීතාවයේ වර්ධනයට උපයෝගී කර ගත හැකි වේ. අනෙකුත් සියලුම සම්පත් පිළිබඳ තීරණ ගැනීම, සෙසු සම්පත් පාලනය කිරීමේ සුවිශේෂී හැකියාවෙන් යුක්ත වීම ද මානව සම්පතෙහි සුවිශේෂී ලක්ෂණ ලෙසට පෙන්වා දිය හැකි ය.

උරුම කළමනාකරණ ක්‍රියාදාමය තුළ මානවයාගේ භූමිකාව අතිශය වැදගත් වීම හේතුවෙන් අදාළ අරමුණු හා පරමාර්ථ සාධනය කර ගැනීම උදෙසා මානව සම්පත් කළමනාකරණය අතිශය වැදගත් කාලීන අවශ්‍යතාවකි. ''සංවිධානයක අරමුණු හෝ පරමාර්ථ ඉටුකරගැනීම සඳහා යෝග්‍ය හා තෘප්තිමත් මානව සම්පතක් ජනිත කරවා ගැනීමත් ඔවුන් කාර්යක්ෂමව හා සඵලදායීව උපයෝජනය කර ගැනීමත් ඔවුන් අඛණ්ඩව පවත්වා ගැනීමත් ඇතුළත් සමස්ත ක්‍රියාවලිය'' මානව සම්පත් කළමනාකරණය යනුවෙන් හැඳින්වේ (ඕපාත, 1995).

නිවැරදි දේ නිවැරදි ලෙස කිරීමට එනම් සඵලදායිතාවය හා කාර්යක්ෂමතාව අත්පත්කර ගැනීමට හා ඒ තුළින් ආයතනයේ අරමුණු හා පරමාර්ථ ක්‍රමානුකූලව සාර්ථකව අත්පත් කරගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය ආයතනයක් සඳහා අත්‍යවශ්‍ය වේ. මීට අමතර ව සංකීර්ණ ආයතනික ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා, ආයතනික ගතික පරිසරයට ප්‍රතිචාර දැක්වීම සඳහා, ආයතනික පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා, සාමූහික ප්‍රතිඵල අත්පත් කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණ ක්‍රියාවලියෙහි නියුක්ත වන ආයතන අතුරින් ප්‍රධානතම නෛතික බලය හිමි ආයතනය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යි. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ නිසි කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි දැක්ම වන අතර, මෙරට පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය කිරීමේ අග්‍රගණ්‍ය ආයතනය වශයෙන් සහ ප්‍රධාන නියාමන ආයතනය වශයෙන් ක්‍රියාකිරීම මෙහි මෙහෙවර යි. මෙහෙවර සපුරාලීම අරබයා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පරමාර්ථ පහත පරිදි වේ (ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයීම් අංශය, 2017).

- මානව හා ආයතනික සම්පත් ප්‍රවර්ධනය
- සමස්ත පුරාවිද්‍යා උරුමය ආරක්ෂණය
- පුරාවිද්‍යා ස්ථාන ස්මාරක සහ චංචල පුරාවස්තු ලේඛනගත කිරීම
- පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජන අවබෝධය ප්‍රවර්ධනය කිරීම

- පුරාවිද්‍යාත්මක ස්ථාන ස්මාරක හා චංචල පුරාවස්තු සංරක්ෂණය හා නඩත්තුව
- පර්යේෂණ

මෙම අරමුණු හා පරමාර්ථ සාධනය කරගැනීම උදෙසා ආයතනයෙහි ප්‍රධානතම සම්පතක් වන මානව සම්පත කළමනාකරණය කිරීම සිදු කළ යුතු අතර ඒ සඳහා මානව සම්පත් කළමනාකරණයේ ප්‍රධාන කාර්යයන් කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කිරීම වැදගත් වේ.

මානව සම්පත් කළමනාකරණයේ ප්‍රධාන කාර්යයන් අතර ප්‍රථම අදියර රැකියා නිර්මාණය යි. රැකියා නිර්මාණය යනු ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට හැකි වන සේ කාර්යයන් කුඩා කොටස්වලට නැතහොත් ඒකකවලට බෙදා වෙන්කිරීමේ කාර්යය යි. මෙහි දී වෘත්තීය ශිල්ප ක්‍රමය අනුව රැකියා නිර්මාණය වැදගත් ය. විවිධ වෘත්තීන්ට ගැළපෙන සේ රැකියා නිර්මාණය කිරීම වෘත්තීය ශිල්ප ක්‍රමය වශයෙන් හඳුන්වනු ලබයි. රැකියා නිර්මාණය කිරීමේ දී කාර්යක්ෂමතා මූලිකාංගය අනුගමනය කිරීමෙන් එම රැකියාව කාර්යක්ෂම රැකියාවක් බවට පත්වේ. විශේෂ ප්‍රාගුණ්‍යයය ඇති වන සේ කුඩා කොටස්වල විභාජනය කරන ලද එක් එක් කාර්යයන් සඳහා වෙන වෙන ම පුද්ගලයන් පත් කර දිගු කාලයක් එම පුද්ගලයන් අදාළ කාර්යයන්වල නිරත කරවීම මඟින් රැකියාව විශේෂීකරණය කළ හැකි ය. රැකියා නිර්මාණයේ දී චර්යායාත්මක මූලිකාංග කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් වේ. මෙහි දී කුසලතා විවිධත්වය මත පදනම් ව එනම් සේවකයන්ට විවිධ වූ දක්ෂතා හා නිපුණතා භාවිත කිරීමට හැකි වන සේ එක් එක් රැකියාවේ විවිධ වූ ක්‍රියාකාරකම් අන්තර්ගත කර සේවකයන්ට තමා ඉගෙන ගත් විවිධ දක්ෂතා හා නිපුණතා තම රැකියාවන් තුළ දී භාවිත කිරීමට ඉඩප්‍රස්තාව ලැබෙන ආකාරයෙන් රැකියා නිර්මාණය වැදගත් වේ. මෙහි දී රැකියා කාර්යක්ෂමතා හා සේවාදායක තෘප්තිය යන ද්විත්වය ම ආරක්ෂා වේ.

රැකියා නිර්මාණයෙන් අනතුරුව රැකියා විශ්ලේෂණය සිදු කළ යුතු වේ. රැකියා පිළිබඳ විවිධ තීරණ ගැනීම සඳහා ආයතනයේ එක් එක් රැකියා පිළිබඳ තොරතුරු එකතුකිරීමේ විධිමත් ක්‍රියාවලිය රැකියා විශ්ලේෂණය යි. මේ මඟින් රැකියා අලුතින් නිර්මාණය කිරීම සඳහා දත්ත හා තොරතුරු ලබා ගැනීමට හැකි වන අතර රැකියා ප්‍රතිනිර්මාණය කිරීමේ දී අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා ගැනීමට ද හැකියාව ලැබේ. සේවා දායකයන් තෝරා ගැනීමේ දී එක් එක් රැකියාව සාර්ථකව ඉටු කිරීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප හඳුනා ගැනීමට හැකි වන්නේ ද සේවා දායක පුහුණු හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට හැකි වන්නේ ද රැකියා විශ්ලේෂණය මඟිනි.

ආයතනයේ ප්‍රශස්ත මානව සම්පත් ප්‍රමාණයක් නඩත්තු කිරීම සඳහා නිසි මානව සම්පත් සැලැස්මක් අවශ්‍ය වේ. ආයතනයේ අපේක්ෂිත පුරප්පාඩු සඳහා යෝජිත පුද්ගලයන් ගැළපීම හා සම්බන්ධ පුරෝකථනය මානව සම්පත් සැලසුම්කරණයයි (ඕපාත, 1995). ආයතනයේ සියලුම අංශ පිළිබඳව හොඳින් සොයා බලා සංවිධානයේ කාර්ය අවශ්‍යතාව සඳහා අවශ්‍ය සේවක පිරිස ඌනතාවයක් ද අතිරික්තයක් ද

නොමැතිව අවශ්‍ය ප්‍රමාණයට අවශ්‍ය ගුණයෙන් යුතු ව නිවැරදි වේලාවට නිවැරදි පුද්ගලයා නිවැරදි ස්ථානයට අනුයුක්ත කිරීමට මානව සම්පත් සැලසුම් කළ යුතුය.

ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට හැකි වන දැනුම, කුසලතා, ආකල්ප සහිත රැකියා අපේක්ෂකයින් ආයතනය වෙත ඇද ගැනීම සඳහා ආයතනය ගන්නා ක්‍රියාමාර්ග සේවක ආකර්ෂණය නමින් හැඳින්වේ. මෙම ක්‍රියාවලිය මානව සම්පත් කළමනාකරණයේ අතිශය වැදගත් කාර්යයකි. මෙමගින් සේවා නියුක්තිය පිණිස සුදුසුකම් ඇති පුද්ගලයන් කැඳවා ඔවුන්ගේ සංචිතයක් ආයතනය තුළ ගොඩ නගා ගැනීම වැදගත්ය.

සේවාදායක ආකර්ෂණය තුළින් ජනිත කරගත් අයදුම්කරුවන්ගේ සංචිතයෙන් ආයතනයේ ඇබෑර්තු පිරවීමට වඩාත්ම යෝග්‍ය අයදුම්කරුවන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සේවකයන් තෝරා ගැනීමේ කාර්ය භාරයයි. ආයතනයේ අරමුණු පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය සේවකයන් තෝරා ගැනීම අතිශය වැදගත් වේ.

පුළුල් ලෙස ආකර්ෂණය කරගත් පුද්ගලයන්ගෙන් නිවැරදි තෝරා ගැනීමක් සිදුකර, නිවැරදි පුද්ගලයාට සේවා නියුක්තිය පිරිනැමීම කළමනාකරණයේ වගකීම යි. ආයතනයට බඳවා ගත් සේවාදායකයාට රැකියාවේ අන්තර්ගත කටයුතු රාජකාරී හා වගකීම් ආදිය ආයතනික ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ආදිය හඳුන්වාදීම තුළින් නිවැරදි ව රාජකාරිය සඳහා අනුස්ථාපනය කිරීම වැදගත් වේ.

ආයතනයක වර්තමාන හා අනාගත ඉලක්කයන් සපුරා ගැනීම සඳහා මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය වැදගත් වේ. සේවකයන්ගේ හා කණ්ඩායම්වල දක්ෂතා දැනුම නිපුණතා වර්ධනය කිරීම මෙහි අභිප්‍රාය යි. දැනුමෙන්, කුසලතාවයෙන් හා නිවැරදි ආකල්පයන්ගෙන් හෙබි සේවාදායකයන් ආයතනයට සම්පතකි. මානව සම්පත් සංවර්ධනය තුළින් සිදු වන්නේ මානව ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම යි. සේවකයා සතු දක්ෂතා නිපුණතා වර්තමානයට මෙන් ම අනාගතයට ද ගැළපෙන අයුරින් යාවත්කාලීන කිරීම පුහුණුව මගින් අපේක්ෂා කෙරේ. ආයතනයේ සංවර්ධනයටත්, පුද්ගල සංවර්ධනයටත් මානව සම්පත පුහුණුව හා සංවර්ධනය ප්‍රයෝජනයක් වනු ඇත. මේ මඟින් සේවක කාර්ය සාධනය වර්ධනය කර ගැනීමේ අවකාශය ලැබේ.

මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය තුළ දී සේවක කාර්යඵල ඇගයීම වැදගත් කාර්ය භාරයකි. සේවක සංවර්ධනය හා ඔවුන් සම්බන්ධ විවිධ තීරණ ගැනීම පිණිස සේවකයා විසින් සිය රැකියාවේ කටයුතු රාජකාරී හා වගකීම් යම් නිශ්චිත කාලයක් තුළ ඉටුකරන ලද ප්‍රමාණය පූර්ව තීරණය කරන ලද ප්‍රමිතීන්ට අනුව තක්සේරු කිරීම කාර්යඵල ඇගයීම යි. මෙහි දී සේවකයා සේවා ඉලක්ක කරා ළඟා වී ඇද්ද ළඟා වෙමින් පවතී ද නොඑසේනම් අදාළ කාර්යයන් සඳහා සුදුසු නොවන බව හෝ තීරණය කළ හැකි ය. මෙහි දී සේවකයා අදාළ කාර්යයයේ තවදුරටත් රඳවා තබන්නේ ද නැතහොත් සේවාදායක ආදේශනයක් සිදු කළ යුතු ද යන්න තීරණය කළ හැකි ය.

මානව සම්පත් කළමනාකරණයේ සුවිශේෂී මෙන්ම සේවකයන් කළමනාකරණය සඳහා ම වැදගත් වූ මානව සම්පත් කළමනාකරණ කාර්යයක් ලෙස උපායශීලී මානව සම්පත් කළමනාකරණය පෙන්වා දිය හැකි ය. ආයතනයට නිවැරදි හා යෝග්‍ය සේවාදායකයන් ආකර්ෂණය (අද්දවා ගැනීම) කර ගැනීමත්, ඔවුන් ආයතනය තුළ සුදුසු පරිදි තෘප්තිමත් ව හා ඵලදායී ව රඳවා තබා ගැනීමත්, ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය කිරීමත් උපායශීලී මානව සම්පත් කළමනාකරණය තුළින් සිදුවේ. උපායශීලීත්වය මඟින් ආයතනයේ සමස්ත අරමුණු නැතිනම් සංයුක්ත අරමුණු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකර ගැනීම සඳහා එම ආයතනයේ මානව සම්පත් සමඟ අවස්ථානුකූල ව අවස්ථානෝචිත ව නිර්මාණශීලී ව කටයුතු කරයි.

මානව සම්පත් කළමනාකරණයේ දී වැඩ පරිසරය හා වැඩ කිරීමේ තත්ත්වයන් පාලනය කිරීම වැදගත් වේ. ආයතනය තුළ සුදුසු සංවිධාන රටාවක් පැවතීම ද යහපත් වැඩ පරිසරයකට සුදුසු තත්ත්වයකි. ආයතනයේ සේවකයන් අතර වැඩ බෙදී ඇති අයුරු, බලතල වගකීම් ආදිය සේවක තෘප්තිය හා කාර්යක්ෂමතාව ළඟාකර ගත හැකි වන අයුරින් සංවිධානය කර තිබිය යුතු ය. එකිනෙකාට දක්වන ගරු කිරීම, අගය කිරීම, විශ්වාසවන්තව හා අවංකව කටයුතු කිරීම හා සමාන අන්තර් පුද්ගල සම්බන්ධතාවක් වැඩ පරිසරයේ සාමාජිකයන් හෙවත් සේවක හා සේවා යෝජකයන් අතර පැවතිය යුතු වේ. එවිට ගැටුම් අවම සුහදශීලී මානුෂවාදී වැඩ පරිසරයක් නිර්මාණය කරගත හැකිවේ.

වත්මන් ලෝකයේ ආයතනික පරිසරය තුළ වැඩි අවධානයක් යොමු කරනු ලබන මාතෘකාවක් වශයෙන් රැකියා ආතතිය හඳුන්වාදිය හැකි ය. රැකියා ආතතිය ආයතනයේ සේවකයන්ගේ ජීව විද්‍යාත්මක සහ මානසික සුවතාවට ඍජු ව ම අහිතකර ලෙස බලපාන අතර ඒ තුළින් අයහපත් ආකාරයේ චර්යාවන් නිසා අවසානයේ සමස්ත ආයතනික කාර්යඵල අඩු වීමට හේතු වෙයි. රැකියා ආතතිය ඇති වීම සඳහා රැකියා පරිසරය සම්බන්ධ විවිධ සාධක බලපානු ලබයි. ආතති කළමනාකරණය කිරීමේ දී රැකියා ආතතිය ඇතිවීම සඳහා බලපානු ලබන හේතූන් හෝ ආතති සහ එයින් ඇතිවන ප්‍රතිඵල පිළිබඳ අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. සේවාදායකයන් ඉටු කළ යුතු කාර්යයන් හා වගකීම් පැහැදිලි නොවීම, අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් කාර්යයන් සහ වගකීම් පැවරීම, සේවාදායක සුබ සාධනය පහළ මට්ටමක තිබීම, අවශ්‍ය පුහුණුව හා සංවර්ධනය ලබා නොදීම, වෘත්තීය උපදේශන සේවා ලබා නොදීම, දුර්වල රැකියා තත්ත්වයන් ආදී විවිධාකාර සාධක හේතුවෙන් සේවක ආතතිය ඇති වන බැවින් සංවිධාන චර්යාත්මක වෙනස්කම් සිදු කිරීම, අභිමතාර්ථ තබා ගැනීම, කණ්ඩායම් ගතිකත්වය, ගැටුම් කළමනාකරණය, ආයතනික ක්‍රියා, තීරණ ගැනීමේ කුසලතා, ආයතනික සංවර්ධනය කිරීමේ ශිල්පීය ක්‍රම ආදී විවිධාකාරයේ චර්යාත්මක හා මානව සම්පත් කළමනාකරණ ශිල්ප ක්‍රම රැකියා ආතතිය සඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා යොදාගත හැකි ය.

ආයතනයේ සේවක පිරිස අභිප්‍රේරණාත්මක ව පවත්නා ගෙන යාම තුළින් ආයතනයට ප්‍රතිලාභ රාශියක් අත් පත් කරගත හැකි ය. පුද්ගල අවශ්‍යතා තෘප්තිමත් කර ඔවුන් සතුටට පත් කර ඔවුන් මානසික වශයෙන් සිය කාර්යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා පෙලඹවීම අභිප්‍රේරණය යි. සේවකයන් දිරි ගැන්වීම, පෙලඹවීම,

ඔවුන් ප්‍රබෝධයෙන් සිටීම, ඔවුන්ගේ අභිමානය ඉහළ යාම, යහපත් දේ වෙත යොමු වීම අභිප්‍රේරණය මඟින් සිදුවේ. මෙය සේවක කාර්යක්ෂමතාව හා ඵලදායිතාව උපරිමයෙන් ලබාගැනීමට මග පැදෙයි.

දුක් ගැනවිලි සේවක ප්‍රශ්නයකි. එබැවින් දුක් ගැනවිලි විසඳීම මානව සම්පත් කළමනාකරණ කාර්යයකි. ආයතනයක් තුළ සේවය කරන මානව සම්පත් තමන්ට අසාධාරණයක් ඇති වූ බව සිතා ඇති කර ගන්නා මානසික කලකිරීමක් දුක් ගැනවිල්ලක ස්වභාවයයි. ඒ තුළින් අදාළ සේවාදායකයාගේ කාර්යඵල අඩු වී ඵලදායීතාවයට අහිතකර ලෙස බලපායි. මෙය සේවක කාර්යක්ෂමතාවට ඍජු ව ම බලපෑම් එල්ල කරයි. ආයතනයේ අරමුණු කරා සාර්ථකව ළඟා වීමට නම් ක්‍රියාකාරී දුක්ගැනවිලි කළමනාකරණය පුද්ගල කළමනාකරණයේ ඉතාමත් අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් ව ඇත.

සේවා දායකයන්ගේ සේවා නියුක්තියේ ඇතිවන වෙනස්කම් සේවාදායක චලන යන්නෙන් අදහස් කරයි. උසස් කිරීම්, මාරු කිරීම්, නවතාලීම්, පහත දැමීම් යනාදිය මෙම වෙනස්කම් නැතහොත් වෙනස්වීම්වලට අයත් වේ. උසස් කිරීම්, මාරු කිරීම්, නවතාලීම් යන සේවාදායක චලන සිදු කිරීමේ දී වඩා නිවැරදි ව නීත්‍යානුකූල ව හා සාධාරණ ලෙස සිදු කිරීම මානව සම්පත් කළමනාකරණයේ දී බලාපොරොත්තු වේ. එසේ නොවුණහොත් සේවක තෘප්තියට අහිතකර ලෙස බලපා සේවක කාර්යක්ෂමතාව හා ඵලදායීතාව පිරිහීමට හේතු වේ.

ශ්‍රී ලංකාව තුළ පුරාවිද්‍යා උරුමය කළමනාකරණය කිරීමේ නියමු ආයතනය වශයෙන් ක්‍රියාත්මක වන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආයතනික අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා වඩාත් යෝග්‍ය හා තෘප්තිමත් මානව සම්පතක් ජනිත කරවා ගැනීමටත්, ඔවුන් කාර්යක්ෂමව හා සඵලදායීව උපයෝජනය කර ගැනීමටත්, ඔවුන් අඛණ්ඩව පවත්වා ගැනීමටත්, උක්ත මානව සම්පත් කළමනාකරණ කාර්යයන් කෙරෙහි අවධානය යොමු කිරීම කාලෝචිත අවශ්‍යතාවක් වේ.

**මූලාශ්‍රය**


ඕපාත, එච්.ඩී.එන්.පී. (1995). **සේවා මණ්ඩල කළමනාකරණය.** කර්තෘ ප්‍රකාශනයකි.

මැන්දිස්, ටී. සහ ගුණරත්න, එස්. (2016). **උරුම කළමනාකරණ ප්‍රවේශය.** මහනුවර : නෙත්වින් ප්‍රින්ටර්ස්.

ගුණවර්ධන, පී. (2005). **පුරාවිද්‍යා උරුම කළමනාකරණය ආකෘති හා සංකල්ප,** ජා ඇල : සමන්ති ප්‍රකාශකයෝ.

ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයීම් අංශය. (2017). **කාර්ය සාධන වාර්තාව.** කොළඹ : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

විජේසූරිය, පී. (2021). **සංස්කෘතික උරුමයන් සංරක්ෂණය හා කළමනාකරණය : නව ප්‍රවණතා.** ICOMOS Sri Lanka.

# පූර්ව බ්‍රාහ්මී "අ" අක්ෂරයෙහි සම්මත රූපය නූතන තාක්ෂණය භාවිතයෙන් ප්‍රතිනිර්මාණය කළ හැකි ද ?

**ආචාර්ය දම්මි බණ්ඩාර**

## ප්‍රවේශය

මානව වර්ගයා අනාදිමත් කාලයක් තුළ අත්පත් කරගත් ප්‍රවණතා අතරින් අක්ෂර කලාව අද්විතීය ස්ථානයක වැජඹෙයි. මිනිසා අත්පත් කරගත් අක්ෂර කලාව ආකස්මිකව පැන නැගුණක් නොව පියවර කිහිපයක් පසු කරමින් ක්‍රමක්‍රමයෙන් වර්ධනය වූවක් බවට මානව ඉතිහාසය සාක්ෂි දරයි.

ශ්‍රී ලාංකේය අක්ෂර භාවිතයෙහි ආරම්භය මහින්දාගමනයට පෙර යුගය කරා ගමන් කරන බව සාහිත්‍යමය, අක්ෂර විද්‍යාත්මක මෙන් ම පුරාවිද්‍යාත්මක සාධක මඟින් ද ස්ඵුට වේ. නමුත් ශ්‍රී ලංකාවේ අක්ෂර භාවිතය පිළිබඳ දෘශ්‍යමය සාධක බහුලව හමුවනුයේ සම්මත වර්ෂයට පෙර - ක්‍රිස්තු පූර්ව - තුන්වන සියවසේ දී ය. එතැන් සිට සම්මත වර්ෂ පළමුවන සියවස මධ්‍ය භාගය අතර කාලයට අයත් අක්ෂර හඳුන්වන්නේ පූර්ව බ්‍රාහ්මී අක්ෂර නමිනි. මෙම අක්ෂර ලංකාව පුරා විසිරී ඇති ලෙන්වල දැකිය හැකි ය.

## පර්යේෂණ ගැටලුව

වර්තමාන සිංහල හෝඩියේ **අ** අක්ෂරය ද විවිධ පුද්ගලයන් සහ විවිධ ස්ථානවල එකිනෙක හැඩවලින් ලියා ඇත. විවිධ වෙනස්කම් සහිත ව **අ** අක්ෂරය සටහන් කළත් එම අක්ෂරයට නිශ්චිත හැඩයක් තිබේ. අතීත ශ්‍රී ලාංකිකයන් භාවිත කළ මුල් ම අක්ෂර හෝඩියේ එනම් පූර්ව බ්‍රාහ්මී හෝඩියේ **අ** අක්ෂරය ද විවිධ එකිනෙකට වෙනස් රූපවලින් සෙල්ලිපිවල ලියා ඇත. පූර්ව බ්‍රාහ්මී **අ** අක්ෂරය විවිධාකාරයෙන් ලියූව ද එම අක්ෂරයට ද සම්මත වූ නිශ්චිත හැඩය පිළිබඳ සංකල්පයක් අතීතයේ දී තිබෙන්නට ඇත. එසේ නම් එම හැඩය කුමක් ද යන ගැටලු මූලිකව මෙම පර්යේෂණය දියත් කරන ලදී.

## පර්යේෂණ අරමුණ

පූර්ව බ්‍රාහ්මී **අ** අක්ෂරයේ මූලික හැඩය නූතන තාක්ෂණය භාවිත කරමින් නැවත ප්‍රතිනිර්මාණය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය විය.

### පර්යේෂණ ක්‍රමවේදය

දැනට ප්‍රකාශයට පත්වී ඇති සියලු පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපිවල ඇති **අ** අක්ෂර රූප පර්යේෂණය සඳහා පාදක කරගත් අතර එම දත්ත ක්‍රම දෙක යටතේ මෙම පර්යේෂණයට භාජනය කරන ලදී. මෙහි දී ලැබූ ප්‍රතිඵලවල වෙනසක් සිදු වූයේ ද යන්න පිළිබඳ අදාළ ස්ථානවල දී සාකච්ඡා කරන ලදී.

### සාහිත්‍ය විමර්ශනය

වත්මන් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාවේ විවිධ විෂය ක්ෂේත්‍රයන් නූතන තාක්ෂණික ක්‍රම උපයෝගී කරගෙන පර්යේෂණ සිදු කරයි. ලෝකයේ දියුණු රටවලට සාපේක්ෂව ශ්‍රී ලාංකේය පුරාවිද්‍යා පර්යේෂණ සඳහා නූතන තාක්ෂණය භාවිත කිරීම අවම මට්ටමක පවතී.

තාක්ෂණික වශයෙන් දියුණු රටවල් සෙල්ලිපි පර්යේෂණ සඳහා නූතන තාක්ෂණය භාවිත කිරීමේ ප්‍රවණතාවක් වත්මන් ලෝකය තුළ ප්‍රචලිත වෙමින් පවතී. නමුත් ශ්‍රී ලංකාවේ සෙල්ලිපි පර්යේෂණ සඳහා විද්‍යාත්මකව නූතන තාක්ෂණය භාවිත නොවෙන තරම් ය. මේ ආකාරයට අක්ෂර හැඩයන් හඳුනා ගැනීම පිළිබඳ පර්යේෂණයක් මෙතෙක් ශ්‍රී ලංකාවේ සිදු වී නොමැත.

### පූර්ව බ්‍රාහ්මී හෝඩිය

පූර්ව බ්‍රාහ්මී හෝඩිය නිර්මාණය වී ඇත්තේ ස්වර පහක් හා ව්‍යංජන 31 සුසංයෝග වීමෙනි. මේ අක්ෂර 36 න් **අ, ඉ, උ, එ, ඔ** යන අක්ෂර පහ ස්වරාක්ෂර ය. ඉතිරි සියලු ම අක්ෂර ව්‍යංජනාක්ෂර වේ. පූර්ව බ්‍රාහ්මී ලේඛන සඳහා නිරන්තරයෙන් භාවිත කර ඇත්තේ **අ, ඉ, උ, එ, ඔ, ක, ග, ච, ජ, ට, ඩ, ණ, ත, ද, න, ප, බ, ම, ය, ර, ල, ව, ස, හ** යන අක්ෂර 24 ය. මීට අමතරව **ඛ, ශ** අක්ෂර ද්වයේ භාවිතය බහුල බවට සාධක බොහෝ වේ. **ඛ, ඡ, ඨ, ඪ, ධ, ථ, භ** වැනි මහප්‍රාණ අක්ෂර ඉතාමත් කලාතුරකින් යෙදුන සැටියක් දකිය හැකිය (බන්දුසේන සහ සේනාරත්න 1997: 14). මෙම සියලු අක්ෂර සමකාලීන ඉන්දීය අශෝක ලිපිවලත් භාරුත් හා සාංචි යන තැන්වල වේදිකා සහ තොරන්වල ලේඛනවලත් දඹදිවින් සොයාගෙන ඇති ආදිම ප්‍රාකෘත ලිපිවලත් ඇති අක්ෂරවලට සමාන ය (Parnavitana 1970: xvii).

මෙම ලිපිවල ඇති අක්ෂර රූප එකිනෙක පරීක්ෂා කිරීමේ දී ඒවායෙහි රූපීය හැඩ වෙනස් බව හඳුනා ගෙන ඇත. මේ විවිධ රූප බොහෝමයක් කලානුරූප වෙනස්කම් නොව ලිපිකාර ශෛලිය හෝ පිහිටි ස්ථානය අනුව සිදු වූ වෙනස්කම් ය ( Parnavitana 1970: xxi). එම නිසා මේ අක්ෂර පදනම් කර ගෙන පූර්ව බ්‍රාහ්මී අක්ෂරවලට පුරා අක්ෂර විද්‍යාත්මකව නිශ්චිත හැඩයක් පිළිබඳ සම්මුතියකට එළඹීමට නොහැකි වී ඇත. සෙල්ලිපි එකිනෙක පරීක්ෂා කිරීමෙන් අක්ෂරවල සම්මත හැඩය පිළිබඳ නිගමනයකට එළඹිය නොහැකි

නම් ඒ හැඩය හඳුනාගත හැකි වෙනත් විකල්ප ක්‍රම මොනවාද යන්න අත්හදා බැලීම සිදු කළ යුතු ය. ඒ සඳහා විද්‍යාත්මකව පිළිගත හැකි සාධාරණීය ක්‍රමවේදයක් නූතන තාක්‍ෂණික ක්‍රමවේදය ඔස්සේ සිදු කිරීමට හැකි ය.

**අ අක්‍ෂර**



පූර්ව බ්‍රාහ්මී හෝඩියේ පළමු අක්‍ෂරය මෙය වේ. එම අක්‍ෂරය මේ කාලය නියෝජනය කරන සෙල්ලිපිවල සුලබ ව දැකිය හැකි ය. සෑම විට ම මෙම අක්‍ෂරය ලියා ඇත්තේ සිරස්ව ගිය ලම්බ රේඛාවකට වම් පසින් රේඛා දෙකක් සම්බන්ධ කිරීමෙනි. අක්‍ෂරයට වම්පසින් එක්වන ලම්බක රේඛාවල වක්‍රවීම් හේතුකොට ගෙන **අ** අක්‍ෂරයේ එකිනෙකට විෂම රූප දැකිය හැකි ය (Paranavitana, 1970: xvii). එනම්



සිරස් ඉරට වම් පසින් කෙටි වක් ඉරි දෙකක් සම්බන්ධ කිරීමෙන් ලියන කෝණාකාර හැඩති අක්‍ෂරය



වම්පසින් එක්වන තිරස් රේඛා දෙක එක්තරා දුර ප්‍රමාණයක දී සිරස් රේඛාව සමඟ කෝණාකාරව එක් වේ.




සිරස් ඉරට වම් පසින් චන්ද්‍රාකාර කෙටි ඉරි දෙකක් එකතු කළ ලතාකාර අක්‍ෂරය.

එසේ ම මෙයට අමතරව ඇතැම් අක්‍ෂරවල ඉහළ අංශය කෝණාකාර ය. පහළ අංශය වක්‍රාකාර ය. වම් තිරස් රේඛා සිරස් රේඛාව හා සමඟ එක්වන දුරවල වෙනස්වීම් බොහෝ ය. මෙලෙස ලෙන් ලිපිවල ඇති **අ** අක්‍ෂර විවිධ හැඩවලින් යුක්ත බව විශද වේ. ඇතැම් අවස්ථාවල එකම සෙල්ලිපියෙහි පවා මේ අක්‍ෂර වෙනස දැකිය හැකිවේ (එම).



**සෙල්ලිපිවල දැකිය හැකි වෙනස් හැඩවල අක්ෂර කිහිපයක්**




**එකම ලිපියේ අක්ෂර වෙනස දක්වන අවස්ථාවක්**

ඉන්දියාවේ බ්‍රාහ්මීය අක්ෂර හඳුනාගත් අවස්ථාවේ සිට මේ දක්වා සාම්ප්‍රදායිකව ම සිරස් රේඛාවකට වම්පසින් කෝණාකාරව රේඛා දෙකක් එක්වන හැඩය දක්වන රූප **අ** අක්ෂරය ලෙස හඳුනා ගත් අතර එම අක්ෂරය අතීතයේ දී ලිවීමේ දී අනුගමනය කළ ඇති රීතීන් මොනවාද යන්න පිළිබඳ අවධානය යොමු කර නො මැත.

මෙම අක්ෂරයෙහි රූපය කුමන ආකාරයෙන් පවතින්නට ඇති ද යන්න සෙවීමට තරම් නූතන තාක්ෂණය දියුණු වී ඇත. ඒ අනුව සිදු කළ මෙම පර්යේෂණයේ දී අනුගමනය කළ පියවර පිළිබඳ පහතින් දක්වා ඇත.


මේ වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව බොහෝමයක් ලෙන් ලිපි සොයා පිටපත් කර ප්‍රකාශයට ද පත් කර හමාර ය. එම නිසා **අ** අක්ෂරයෙහි රූපීය ස්වරූපය සෙවීම සඳහා එම ස්පර්ශ ලාංඡනවල ඡායාරූප පර්යේෂණ නියැදි ලෙස භාවිත කරන ලදී. ස්පර්ශ ලාංඡන පැහැයෙන් එකිනෙක හා වෙනස් නොවෙයි. නමුත් ගල්වල ඇති සෙල්ලිපි ඡායාරූප ගැනීමේ දී විවිධ පැහැයෙහි වෙනස්කම් සිදු විය හැකි ය. මෙම පර්යේෂණයේ දී පැහැය යන කරුණට වඩා වැදගත් ස්ථානයක් හිමි වන නිසා වඩාත් සාර්ථක නියැදිය වූයේ ස්පර්ශ ලාංඡන භාවිතය යි. එසේ ම නූතන තාක්ෂණය හැසිරවීමේ දී Matlab ප්‍රමුඛ පරිගණක මෘදුකාංග භාවිත කරන ලදී.

මුලින් ම සෙල්ලිපි ඡායාරූපවලින් පහළ රූප සටහනෙහි දැක්වෙන ආකාරයට දිග පළල සහ බර එක ම ප්‍රමාණයකට සිටින ආකාරයට **අ** අක්ෂර වෙන් කිරීම සිදු කරන ලදී. මේ ආකාරයට විවිධ හැඩ සහිත **අ** අක්ෂර මෙම පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී.



සෙල්ලිපිවල දැකිය හැකි වෙනස් හැඩවල අක්ෂර කිහිපයක්

පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපිවල අක්ෂර බොහෝමයක් නිශ්චිත පදනම් රේඛාවක් සහිතව ලියා නොමැත. බොහෝ විට එම අක්ෂර ලියා ඇත්තේ ලෙනෙහි කටාරයෙහි හැඩය සැලකිල්ලට ගෙන ය. මේ නිසා අක්ෂර පිහිටා ඇත්තේ එකිනෙක දිශාවලට ය. පරිගණක භාවිත කරමින් එම අක්ෂර සියල්ල පදනම් රේඛාවකට එනම් නිශ්චිත දිශානතියකට අනුව හරවා ගැනීම සිදු කරන ලදී. අක්ෂර හැරවීමේ ක්‍රියාවලියේ දී ජනනය කරන ලද අමතර ඉඩ ප්‍රමාණය කළු පැහැයෙන් දිස්විය. අක්ෂරය සෙල්ලිපියෙන් වෙන් කිරීම පහත රූපයේ a අක්ෂරයෙන් ද හැරවීම සහ අමතර ඉඩ කළු පැහැති වීම b රූපයෙන් ද පැහැදිලි වේ.






**A සහ C රූපවලින් මුල් රූපය පෙන්වන අතර B සහ Dවලින් හැරවීම නිරූපණය වෙයි.**




අක්ෂරය පදනම් රේඛාවෙහි පිහිටවූ පසු සිදු කරන ලද්දේ මෙම රූපයෙහි මධ්‍ය ලක්ෂය සොයා ගැනීම යි. ඒ සඳහා අදාළ මෘදුකාංගය (Matlab) භාවිත කරමින් 1 සහ 0 සමන්විත ද්විමය ආරාවකට (two dimensional array) අක්ෂරය පරිවර්තනය කරන ලදි. එහි දී 1 අංකය මගින් සුදු පැහැය ද 0 මගින් කළු පැහැය ද නිරූපණය විය. ඉන් පසු අක්ෂර රූපය එහි මධ්‍යයට සම කර ගන්නා ලදි.

අක්ෂරය සහිත රූපයේ මධ්‍ය සොයා ගැනීමෙන් අනතුරුව මේ පර්යේෂණය මාන දෙකක් ඔස්සේ පරීක්ෂාවට බඳුන් කරන ලදී. එලෙස මධ්‍ය සොයාගත් අක්ෂර නැවත ඡායාරූප බවට පරිවර්තනය කරගත් අතර එම සියලු ම අක්ෂර ඡයාරූප බවට පරිවර්තනය කිරීමෙන් තොර ව (two dimensional array) ද යන මේ දෙයාකාරයට ම පරීක්ෂා කිරීම සිදු විය.

පළමුවෙන් ම ඡායාරූප බවට පරිවර්තනය කළ අක්ෂරවල ඇති පලුදු Adobe Photoshop භාවිත කරමින් ඉවත් කළේ ය. ඡායාරූප බවට පරිවර්තනය නොකළ (two dimensional array) අක්ෂර නැවත අදාළ මෘදුකාංගය භාවිත කර 0 යොදා පලුදු කළු කිරීම ද සිදු කිරීමෙන් පසු ඒවා ඡායාරූප බවට පරිවර්තනය කරන ලදී. මෙම ක්‍රම දෙකට ම සකස් කරගත් අක්ෂර නියදි වෙන වෙන ම නියදි 10, 20, 30, 40 සහ 50 ආදි ලෙස භාවිත කරමින් එකිනෙකට සමපාත කර විද්‍යාත්මක ක්‍රමයකට අනුකූල ව මෘදුකාංගයට ඇතුළත් කිරීමෙන් **අ** අක්ෂර ප්‍රතිනිර්මාණය කර ගන්නා ලදී.

පහතින් දැක්වෙන්නේ ඒ ආකාරයට ප්‍රතිනිර්මාණය කළ අක්ෂරයන් ය. එම වගුවේ A අක්ෂරයෙන් Adobe Photoshop මගින් පලුදු ඉවත් කර සකස් කර ගත් අක්ෂර ද B තීරුවෙන් මෘදුකාංගය භාවිත කරමින් පලුදු ඉවත් කර ගත් ඡායාරූප ආශ්‍රයෙන් ප්‍රතිනර්මාණය කළ අක්ෂර ද දැක්වෙයි.

| N | Font type A | Font type B | Matching |
|---|---|---|---|
| 10 |  |  | 87.1% |
| 20 |  |  | 88.2% |
| 30 |  |  | 90.1% |

| | | | |
|---|---|---|---|
| 40 |  |  | 91.3% |
| 50 |  |  | 90.9% |



අතීතයේ දී පවතින්නට ඇති ප්‍රතිනිර්මාණය කළ **අ** අක්ෂරයේ හැඩය මෙහි දැක්වෙයි. ලෙන් ලිපි පරීක්ෂා කර බැලීමේ දී බොහෝ අවස්ථාවල සුළු වෙනස්කම් සහිත ව වුව ද භාවිත කර ඇත්තේ වම්පසින් එක්වන රේඛා දෙක වක්‍රාකාර හැඩයක් ගත් අක්ෂර ය. විද්‍යාත්මක ක්‍රමයට ප්‍රතිනිර්මාණය කළ අක්ෂරයේ ඇත්තේ ද මෙවැනි වම් රේඛා වක්‍රාකාර හැඩයක් සහිත අක්ෂරයකි. බහුල භාවිත යන කරුණින් ද අක්ෂරයේ හැඩය පිළිබඳ යම් ඉඟයක් ලබා ගත හැකි ය.

**නිගමනය**

විද්‍යාත්මක ක්‍රමයට අනුව නිර්මාණය කළ **අ** අක්ෂරයේ රූපය භාවිත කළ අක්ෂර ඡායාරූප ප්‍රමාණය අනුව වෙනස් විය. යොදා ගත් ඡායාරූප ප්‍රමාණය අනුව අක්ෂර කෙළවර නිමාව වෙනස් විය. නමුත් හැඩය වෙනස් නොවූ බව ඉහත රූප සටහන අධ්‍යයනයෙන් පැහැදිලි වෙයි. ඡායාරූප 30 සිට 50 දක්වා යොදා නිර්මාණය කළ අක්ෂර අන්තවල නිමාව සැලකිය යුතු වෙනසක් විද්‍යාමාන නොවී ය. එම නිසා අදාළ පර්යේෂණවල දී 30 - 50ත් අතර ඡායාරූප යොදා ගැනීම ප්‍රමාණවත් බව අනාවරණය විය. පරිගණක ආශ්‍රිත ව සිදු කරන ස්වයංක්‍රීය අක්ෂර හඳුනා ගැනීම් පද්ධති නිර්මාණය කිරීම සඳහා මෙම පර්යේෂණ ක්‍රමවේදය වැඩි දියුණු කිරීමෙන් භාවිත කළ හැකි ය.

**මූලාශ්‍රය**

Gunasekara, Bandusena. (1996). "Akuru Upatha (in Sinhala)". Colombo: Godage.
Paranavitana, S. (1970). *Inscriptions of Ceylon*. Colombo : Department of Archaeology.

# ඓතිහාසික ගනේඋඩ රජමහා විහාරයේ සඳකඩපහණ පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**නර්මදා දක්ෂිණි විතානගේ**

## හැඳින්වීම

'වැවයි දාගැබයි ගමයි පන්සලයි' අතීතයේ ගම වෙනුවෙන් නිර්මාණය වුණ හොඳ ම සංකල්පය යි. පුරාණ සිංහල ගම දෙස බලන කල ගමට පන්සලත්, පන්සලට ගමත් නැතිව ම බැරි විය. මේ අතර පවතිනුයේ බිඳ හෙළිය නොහැකි සමීප සම්බන්ධතාවකි. බෞද්ධ විහාරස්ථාන සිංහල සංස්කෘතියේ උරුමය සමඟ රැඳී පවතී. යම් රටක, ජාතියක ජීව වායුව බඳු මෙවැනි විහාර මගින් සිදුවන ශාස්ත්‍ර ඥාන වර්ධනය, හෙළිදරව් කෙරෙන අතීත බෞද්ධයාගේ සංස්කෘතික උරුමය, කලාවේ අදීනත්වය මෙන් ම කලා කෞශල්‍යය ද වර්තමානයට ඉතා වැදගත් වේ.

කළුතර දිස්ත්‍රික්කය හෙවත් පස්යොදුන් කෝරළයේ මදුරාවල ප්‍රාදේශීය ලේකම් බල මණ්ඩලයට අයත් අංක 816 (A) බටහිර වරකාගොඩ ග්‍රාම නිලධාරී වසමේ වරකාගොඩ ගී කියන කන්ද වතු යායට යාබද ව පිහිටි ඓතිහාසික මෙන් ම පෞරාණික ශ්‍රේෂ්ඨත්වයක් උසුලන ගනේඋඩ පුරාණ රජමහා විහාරයේ බෞද්ධ ගෘහ නිර්මාණ, විවිධ කැටයම් සහ මූර්ති ආදී කලා නිර්මාණ දක්නට ලැබෙන හෙයින් පුරාවිද්‍යා වටිනාකමකින් යුතු සිද්ධස්ථානයකි. ශේෂ ව ඇති නටබුන් අතරින් පැරණි විහාර සංකීර්ණ ගොඩනැගිල්ල සහ පැරණි ගොඩනැගිල්ල වාස්තු විද්‍යාත්මක අතින් ද වඩා වැදගත්කමක් උසුලයි. එ මෙන් ම විවිධ කැටයමින් සරසන ලද ගල් කුලුනු, සඳකඩපහණ සහ එහි ඇති තවත් චංචල පුරාවස්තු විහාරයේ පෞරාණික ශ්‍රේෂ්ඨත්වය තව තවත් තීව්‍ර කරයි. උක්ත කරුණු කෙරෙහි සාවධාන වෙමින් ගනේඋඩ රජමහා විහාරයේ සඳකඩපහණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී.

## පර්යේෂණ ගැටලුව

වරකාගොඩ ගනේඋඩ රජමහා විහාරයේ සඳකඩපහණ කවර යුගයක් නිරූපණය කරන්නේ ද? යන්න පර්යේෂණ ගැටලුව වශයෙන් යොදා ගැනේ.

## පර්යේෂණ අරමුණු

අනුරාධපුර, පොලොන්නරුව, දඹදෙණිය, යාපහුව, ගම්පොළ සහ කෝට්ටේ යන යුගවල දී පස්යොදුන් කෝරළය ඓතිහාසික වශයෙන් වැදගත් වූ ආකාරය විමසා බලමින් වරකාගොඩ ගනේඋඩ පුරාණ රජමහා

විහාරයේ ශේෂ ව පවතින සඳකඩපහණෙහි සුවිශේෂී ලක්ෂණ අධ්‍යයනය කරමින් කවර යුගයකට අයත් ද යන්න සොයා බැලීම පර්යේෂණ අරමුණ යි. මෙහි දී සඳකඩපහණ යුග කිහිපයක පරිණාමීය ලක්ෂණ සනිටුහන් කරමින් නිර්මාණය වී ඇත්නම් ඒ පිළිබඳ විමර්ශනය කිරීම සහ එහි ඇති කැටයම් පිළිබඳ අවධානය යොමු කිරීම පර්යේෂණ උප අරමුණු වශයෙන් හඳුන්වා දිය හැකි ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ විධික්‍රමය යටතේ පුස්තකාලයීය පරිශීලනය ගවේෂණාත්මක අරමුණින් යුතු ව යොදා ගැණින. තව ද සහභාගිත්ව නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා මගින් ද දත්ත එක් රැස් කරගන්නා ලදී.

**උපන්‍යාසය**

මෙම විහාරස්ථානය ක්‍රිස්තුවර්ෂ 15 වන සියවසට අයත් යැයි සැලකුව ද ඊට පසුකාලීන ලක්ෂණ ද මෙම සඳකඩපහණ නිර්මාණය වීමට බලපාන්නට ඇතැයි යනුවෙන් උපන්‍යාසයක් ගොඩනගා ගැණින.

**සාකච්ඡාව**

"පස්යොත්න නම් වූ රාජ්‍ය දිගින් පළලින් පස්යොදුන් වටින් විසි යොදුන් මැදි වූ රට"(අභයවර්ධන, 1978: 194) කි. එනම් දිගින් හා පළලින් යොදුන් පහ බැගින් විසි යොදුන් වට ප්‍රමාණයකින් යුත් වර්තමාන කළුතර දිස්ත්‍රික්කය ඈත අතීතයේ පංචයෝජන රටයි, පස්යොදුන් රට, පස්යොදුන් කෝරළය යනුවෙන් හැඳින්විය. අතීතයේ පස්යොදුන් රට යනුවෙන් හැඳින් වූ මෙම ප්‍රදේශය පසු ව බිහි වූ පස්යොදුන් කෝරළයට වඩා විශාල භූමි ප්‍රදේශයක් විය. පසු ව එය රයිගම් කෝරළය, බෙන්තර වළල්ලාවිට කෝරළය හා කුකුළු කෝරළය ආදි කෝරළවලට වෙන් විය.

පස්යොදුන් කෝරළය වඩා වැදගත් වන්නේ පොළොන්නරුවේ රාජ්‍ය විචාළ I වන විජයබාහු රජතුමාගේ (ක්‍රි.ව 1055- 1110) මරණයත් සමඟ යි. I වන විජයබාහු රජතුමා මිය යන විට එතුමාගේ පුත් වික්‍රමබාහු කුමරු ඈපා පදවිය දරමින් රුහුණේ වාසය කරයි. මේ සමඟ ඇතිවන දේශපාලන බල අරගලය උත්සන්න වීමත්, විජයබාහු රජුගේ නැගණිය වූ මිත්තා දේවිය විසින් ඇගේ පුතුන් වන මාණාභරණ, කිත්සිරිමේඝ සහ සිරිවල්ලභ යන කුමාරවරුන් පෙරදැරි කර ගනිමින් එවකට යුව රජු ව සිටි ජයබාහු කුමරු මහරජු වශයෙන් අභිෂේක ගන්වා යුවරජු තනතුරට සිය පුත් මාණාභරණ ව පත් කරන ලදී. මහාවංසයට අනුව, " **ඒ වික්‍රමබාහු ක්ෂත්‍රීය තෙමේ දකුණු දෙස බෝසෙනේ පව් නම් ගමදී යුද කොට ඒ තුන්දෙනා පැරදවී. එකල්හි මම මේ සියලු සතුරන් මුල්සුන් කරමැ' යි සිතා පලායන්නාවූ උන් පියවර පසු පස්සෙහි ලුහුබැන්දේ**

**ය. ඔවුහු ද පස්යොදුන් රට බලකොටුවට ගියෝ ය"** (61 පරිः 34 ගාථාව). මේ අවස්ථාවේ වික්‍රමබාහු රජු සහ මාණාභරණ අතර ඇති වන සටනේ දී වික්‍රමබාහු ජය ගන්නා අතර මිත්තා දේවියගේ පුතුන් වන මාණාභරණ, කිත්සිරිමේඝ සහ සිරිවල්ලභ යන කුමාරවරුන් 'පස්යොදුන් රට/ පංඡ යෝජන රට්ඨ' යන ප්‍රදේශයට පසු බැස්ස බවට ඉතිහාස කතාවේ සඳහන් වේ.

මින් අනතුරුව I වන පරාක්‍රමබාහු රාජ්‍ය (ක්‍රි.ව1153- 1186) සමය මෙම ප්‍රදේශය සම්බන්ධයෙන් ඓතිහාසික වශයෙන් වැදගත් වේ. සිය දේශපාලන ගමන් මඟ සකස් කරමින් සිටින අවස්ථාවේ සිය පියාට (මිත්තා කුමරියගේ පුත් මාණාභරණ) ජීවිතාරක්ෂාව සලසා දුන් පස්යොදුන් රට කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. **"පස්යොදුන් මහමඩ හා කුඩා විග් කප්පවා එයින් ජලය ගංගාවල හෙළා කෙත් පැවැත්තීය"(මව. 68 පරිः 52 ගාථාව)** යනුවෙන් I වන පරාක්‍රමබාහු රජු පස්යොදුන් රට වගුරුබිම්වල ජලය ගංගාවලට හරවා කෘෂිකාර්මික අතින් සශ්‍රික කරමින් සිය ආධිපත්‍යය තව තවත් තහවුරු කර ගත් බව සඳහන් ය.

වර්ෂ 1215 දී ඇති වූ කාලිංග මාඝ ආක්‍රමණය සමඟ පොලොන්නරු රාජ්‍ය බිඳ වැටීම සහ රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය සමඟ II වන පරාක්‍රමබාහු රාජ්‍ය සමය (ක්‍රි.ව 1236- 1270) තුළ නැවතත් මෙම ප්‍රදේශය ඉතිහාසගත වෙයි. "**ඉක්බිති රජ මහ ඇමති තෙමේ බෙන්තොට වෙහෙර පටන් කළුගංතොට දක්වා යොදුනක් පුළුල් තන්හි පරාක්‍රමබාහු නමින් ප්‍රසිද්ධ කොට..."** (මව. 86 පරිः 44 ගාථාව) යනුවෙන් II වන පරාක්‍රමබාහු රජ දවස දේවපතිරාජ නම් ඇමැති ලවා කළුතර ප්‍රදේශයේ කර වූ කටයුතු පිළිබඳ ව සඳහන් වේ. දඹදෙණි රාජ්‍යයේ පරිහානියත් යාපහුව නැගී ඒමත් ඉන් අනතුරු ව ගම්පොළ ලංකාවේ අගනුවර බවට පත්විය. ඒ සමයේ වර්තමාන කළුතර දිස්ත්‍රික්කය ආශ්‍රිත ප්‍රදේශ අගනුවර සමඟ පැවති සබඳතාව තව තවත් වැඩි විය. මෙ සමය වන විට ගම්පළ රාජධානිය ඉස්මතු විය. අලකේශ්වරගේ (ක්‍රි.ව 1409) 'පාලනයෙන් අනතුරු ව පිරිහීමට පත් වන ගම්පොළ රාජධානිය බිඳ වැටෙන්නට විණ. ඉන් අනතුරුව කෝට්ටේ කීර්තිධර පාලකයෙකු වූ VI වන පරාක්‍රමබාහු (ක්‍රි.ව 1415- 1467) රජුගේන් පසු ව ඇති වූ සුවිශේෂි දේශපාලන පෙරළිය (ක්‍රි.ව 1521 විජයබා කොල්ලය) සමඟ මෙම කෝට්ටේ රාජධානිය කෝට්ටේ, රයිගම, සීතාවක වශයෙන් බෙදී ගියේ ය. මේ බෙදීම් අතරින් අපට වැදගත් වන රයිගම් රාජ්‍ය, රයිගම් බණ්ඩාර යටතේ පාලනය වූ අතර ඉන් පසු මෙම රයිගම් ප්‍රදේශය රයිගම් කෝරළය සහ පස්දුන් කෝරළය යනුවෙන් දෙකට බෙදිණි. රයිගම් බණ්ඩාරගේ මරණයත් සමඟ රයිගම සීතාවකට ඈඳා ගන්නා ලදී. මේ වන විට පෘතුග්‍රීසි බලය උත්සන්න වෙමින් පැවති අතර වීදිය බණ්ඩාරගේ ආගමනයත් පැළැඳ බලකොටුව ඉස්මතු වීමත් සිදු විය. (ක්‍රි.ව 1553- 1555) ඔහුගේ පලා යාම සහ මරණය සමඟ මෙම පස්දුන් කෝරළය පෘතුගීසින් අතට පත් විය. මෙපරිද්දෙන් පස්දුන් කෝරළයේ ඓතිහාසික වැදගත්කම සැකෙවින් පෙළ ගැස්විය හැකි ය' (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007).


මෙම ප්‍රදේශයෙහි එනම් පස්දුන් කෝරළයේ ගගබඩ පත්තුවට අයත් ගනේඋඩ රජමහා විහාරය VI වන පරාක්‍රමබාහු රජ දවසට අයත් වන බව (2015: 299-300) මෙම විහාරයේ ඇති සෙල්ලිපියක් අනුසාරයෙන් හෙට්ටිආරච්චි පවසයි.

ඉහත දී සඳහන් කළ පරිදි මෙම විහාරයේ දැනට විද්‍යමාන පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු ගොඩනැගිලි දෙකක් ඇත. ඉන් එක් ගොඩනැගිල්ලක් විහාර සංකීර්ණයේ උතුරු දිශානුගත ව පිහිටා ඇති පැරණි ප්‍රවේශ මාර්ගය යැයි සැලකෙන නටබුන් පියගැටපෙළ කෙළින් ම පිහිටා ඇත. මෙම පියගැටපෙළ පසු කරමින් පැමිණි පසු හමු වන්නේ සඳකඩපහණයි. මෙම සඳකඩපහණ කොටස් හතරකින් නිර්මාණය කර ඇත. එනම්,

- රේඛාවකින් වෙන් කළ රූකම් නොකළ පදනම් පාටිකා කොටස
- අර්ධකවාකාර කොටස
- පාටිකාව ලෙස ගත් කොටසේ ම අල්ප උන්නත ව මතු කර ඇති අර්ධකවාකාර කොටසෙන් දෙපසට විහිදුන නැඩය වැනි කොටස
- සහ අර්ධකවාකාර කොටසින් ම පිටතට පන්නා නිර්මාණය කරන ලද කුඩා රවුම් පඩිය වශයෙනි.



**ඡායාරූප 01**




**දළ රූප සටහන- 01**

දළ රූප අංක 01හි අංකනය කර ඇති පරිදි මෙහි දිග පළල සෙන්ටිමීටර්වලින් දක්වා ඇත.

1- 102cm
2- 142cm
3- 42cm
4- 40cm
5- 19cm
6- 18cm


පහළොස්වන සියවස පමණ වන විට සඳකඩපහණේ හැඩය වෘත්තාකාර වන අතර ඊට පසු කාලයේ සඳකඩපහණට කුඩා වෘත්තාකාර කොටසක් එක් කිරීම දක්නට ලැබේ. මහනුවර දළදා මාළිගාවේ වාහල්කඩ පිහිටි සඳකඩපහණ ඒ සඳහා නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. "කලා ශිල්පියා පදක්කම සහිත මාලයක රූපකාය අනුගමනය කිරීමට උත්සාහ කරන්නට ඇතැයි යන්න බස්නායක පවසයි " (බස්නායක, 1990ඃ 148) මහනුවර දළදා මාලිගයේ සඳකඩපහණක් පිළිබඳව අදහස් දක්වමින් හෝකාට් පවසනුයේ, 'මෙම සඳකඩපහණ 17/18 සියවසිවලට අයත් බවටත්, ශිල්පියාගේ නිර්මාණ ශක්තිය නැති බව වසන්නට අලුත් හැඩයන් හා සංකීර්ණ වකයන් යොදයි. අර්ධ වෘත්ත සඳකඩපහන් සරල හෙයින් එය ලොවාදු කොට තනයි' යනුවෙනි. (ගොඩකුඹුර, 1982. උද්ධෘතයඃ හෝකාට්ඃ 15)

“අවසාන කාලවල සඳකඩපහණට ඉදිරියෙන් ප්‍රමාණයෙන් ඊට වඩා බොහෝවිට කුඩා වූ අමතර රවුම් පඩියකි. සමහර විටක මේ පඩිය සඳකඩපහණේ පිටතට පැන්නූ කොටසකි. අන් සමහර විටක වෙන ම ගලකි.” (ගොඩකුඹුර, 1982: 06)

මේ අනුව 15වන සියවසට අයත් යැයි සැලකෙන ගනේඋඩ රජමහා විහාරයේ සඳකඩපහණේ අර්ධකවාකාර කොටසෙන් ම පිටතට පැන්නූ කුඩා රවුම් ගල් පඩිය ලොවාදූ සඳකඩපහණ් නිර්මාණයේ මූලික අවස්ථාවක් ලෙස අපට සැලකිය හැකි ය.

ගනේඋඩ රජමහා විහාරයේ සඳකඩපහණේ දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ පඩිපෙළට සම්බන්ධ කරන ස්ථානයේ දැකගත හැකි අඩසඳ සහ පිටතට පැන්නවූ පාටිකා කොටසේ අර්ධ උන්නතව නිමවා ඇති දෙපසට විහිදෙන නැඩ කොටසයි. (මෙය හරියාකාරව ම නිම කර නොමැති අතර ගල් කැපුම්වලින් අපට පැහැදිලි ව නිරීක්ෂණය කළ හැකි ය)

“ගම්පළ යුගය වන විට සඳකඩපහණේ ආකෘතිය හා සැලසුම් රටාව ද සැලකිය යුතු වෙනස්කම්වලට ලක් වී තිබුණි. මෙම යුගයට අයත් සඳකඩපහණ්වල කැපී පෙනෙන ලක්ෂණයක් නම් වෘත්තය විශාල වීම හා දෙපස වෘත්තාකාර නැමි එක්කර තිබීමයි” (සිරිමල්වත්ත, 2012: 35). පසුකාලීන ව මෙවැනි හැඩයේ සඳකඩපහන් මහනුවර යුගය නියෝජනය කරනු ඇත. (උදාහරණ දළදා මාලිගයේ සඳකඩපහණ්) ගනේඋඩ සඳකඩපහණේ ද මෙවන් ම තීරුවක් දැකගත හැකි ය. මෙම අඩසඳ කොටසින් දෙපසට විහිදෙන සේ අර්ධ උන්නත ව මතු කෙරූ නැඩ දෙකට පසු ව රේඛාවකින් වෙන් කරන ලද රූකම් නොකරන ලද තීරයකි. එහි කිසිදු රූකමක් නොවේ. මෙය ශෛලමය පඩිපෙළට සම්බන්ධ කිරීමට යෙදූ හරස් පටියක් සේ දිස් වේ.




**දළ රූපසටහන- 02**

රේඛාවකින් වෙන් කරන ලද හරස් පටිය.

අර්ධ උන්නතව මතු කරන ලද අඩසඳෙන් දෙපසට විහිදුණු කොටස.

'ගම්පළ යුගය වන විට මේ පියගැටපෙළ සම්බන්ධ වන හරස් පටිය විශේෂ ලකුණක් බවට පියනන්ද හිමි පවසයි' (1997:62). මෙවැනි ලකුණක් කෝට්ටේ යුගයට අයත් වන හොරණ රජමහා විහාරස්ථානයට අයත් වන සඳකඩපහණක දැකිය හැකි ය. එනම් ආචාර්ය කහටපිටියේ රාහුල හිමි පවසන පරිදි, මෙය පඩි පේළිය හා එක එල්ලේ සම්බන්ධ නොවෙයි. "එක්තරා පදනමක් සඳකඩපහණේ සැරසීම් වළල්ලත් පඩි පේළියත් අතර දිස් වෙයි. එහෙත් එම සඳකඩපහණ නිර්මාණය කරන ලද ගලින් ම නිර්මාණය කිරීමට කලාකරුවා සමත් වී ඇති බව පෙනෙයි. මෙහි ආරම්භක කොටස සැරසීම්වලින් තොර ව පැවතීම ද තවත් විශේෂ ලක්ෂණයකි" (1965: 29).

එමෙන් ම සඳකඩපහණේ වටදාරය ඉදිරියට නැමුණ වක දෙකකින් කෙළවර වේ. එය ඉහත සඳහන් කළ ශෛලමය පියගැට පෙළට සම්බන්ධ වන රේඛාවකින් වෙන් කළ රූකම් නොකරන ලද හරස් පඩිය දෙකෙළවර තෙක් දිගට වක්‍ර කර ඇත.

සඳකඩපහණේ වට දාරයට අනතුරු ව අර්ධකවය තුළ රේඛාවක් ඇඳ තවත් අර්ධ කවයක් ඉස්මතු කරයි. ගනේඋඩ රජමහා විහාරයේ සඳකඩපහණ මුළුමනින් ම කැටයම් රහිත වූවක් යැයි ප්‍රකාශ කළ නොහැකි ය. මන්දයත් රේඛාවකින් වෙන් කරන ලද කොටසේ තරමක් විශාල ලියවැලක් කැටයම් කර ඇති බවට ශේෂ ව ඇති සාක්ෂ්‍ය අනුව නිගමනය කළ හැකි ය. අඩකවයේ මැදට වන්නට එවන් ලිය වැලක ලකුණු පැවතිය ද එය නිශ්චිතව ම කිව නොහැකි ය. එහි මධ්‍යයේ බොහෝමයක් කටු පහරවල් දැකි ය හැකි ය. ගල් පතුරක් ද ගැල වී ගිය සේයාවක් ද තිබේ. "පසුකාලීනව බිහි වූ සඳකඩපහණට උද්භිදමය රටා අතිශයින් ඇතුළත් වීමට මූලාදර්ශය වූයේ ගම්පොළ යුගයේ බිහි වූ ලියවැල් ආදියෙන් සමන්විත සඳකඩපහණ යැයි සඳහන් වේ" (පියනන්ද, 1997: 62).

මහනුවර යුගය වන විට කැටයම් සඳහා ලියවැල් බහුල ව භාවිත වූ ආකාරය එම යුගය නියෝජනය කරන සඳකඩපහණ්වලින් අපට දැකිය හැකි ය. ගනේඋඩ රජමහා විහාරයේ සඳකඩපහණ රේඛාවකින් වෙන් කොට තරමක් විශාල ලියවැලක් කැටයම් කිරීමට ගත් උත්සාහය (දළ රූප සටහනේ තිත්වලින් පෙන්වා ඇති පරිදි) සහ නව හැඩයක සඳකඩපහණක් නිර්මාණයට ගත් ප්‍රයත්නය අපට පෙනී යන්නේ රූකම්කරුවාගේ එම කාලවකවානුව තුළ සිතේ මැවුණු හෝ ආදර්ශ සිතුවමක තිබූ සැරසිලිවල ස්වභාවය නිසාවත් ද? යන්න යි. 15 වන සියවසයට අයත් යැයි සැලකෙන ගනේඋඩ රජමහා විහාරයේ ඇති මෙම සඳකඩපහණෙහි ඇති සුවිශේෂ ලකුණු අනුව මෙම සඳකඩපහණ තත් යුගයන්හි ක්‍රමික පරිණාමයකට ලක් ව ඊට පසු ආදර්ශ මුල් කර ගනිමින් කෝට්ටේ අවසානයත්, මහනුවර ආරම්භයත් යන කාල පරාසය තුළ නිර්මාණය වන්නට ඇති බව පෙනී යයි.

**පර්යේෂණ අනාවරණ හා නිගමන**

- ලොවාදු හැඩයේ සඳකඩපහන් නිර්මාණය කිරීමේ මූලික පියවරක් ලෙස ගනේ උඩ රජමහා විහාර සඳකඩපහණ හැඳින්විය හැකි ය.
- මහනුවර යුගයේ දැකගත හැකි අඩසඳට දෙපසින් නෙරා ගිය නැඩ කොටස කලාකරුවා පාටිකා කොටසේ ම (පාදම් ගලෙහි ම) අල්ප උන්නත ව මතු කිරීමට උත්සාහ ගෙන ඇත.
- ගම්පළ යුගයේ සමාරම්භක පියගැටපෙළට සම්බන්ධ කර ඇති හරස් පඩි නිර්මාණය ද දැකගත හැකි ය. මෙහි ඇත්තේ රූකම් නොකරන ලද තීරුවකි.
- දැනට ශේෂ ව ඇති ලියවැල් කැටයමත්, එහි දැකිය හැකි ලක්ෂණත් අනුව මෙම සඳකඩපහණ රයිගම අවසානය, කෝට්ටේ යන යුගයන්හි (15 වන සියවස) ක්‍රමික පරිණාමීය ලක්ෂණ උරුම කර ගනිමින් සහ ඒවා පසු කරමින් නව මුහුණුවරකින් යුතු ව මහනුවර යුගයේ ආරම්භක අවස්ථාව වන විට නිර්මාණය වන්නට ඇති බව නිගමනය කළ හැකි ය.

**මූලාශ්‍රය**


අභයවර්ධන, එච්. ඒ. පී. (1978). **කඩඉම් පොත් විමර්ශනය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ගොඩකුඹුර, චාර්ල්ස්. (1982). **සඳකඩපහණ.** කොළඹ : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

පියනන්ද හිමි, අටබාගේ. (1997). **ගම්පළ යුගයේ මූර්ති ශිල්පය.** කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

බස්නායක, එච්. ටී. (1990). **ශ්‍රී ලංකාවේ මූර්ති හා කැටයම්, මූර්ති කලාව.** (හතර වැනි වෙළුම) කොළඹ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

රාහුල, කහටපිටිය. (1965). 'කෝට්ටේ යුගයේ සඳකඩපහන්'. **කලා සඟරාව. (20 වන කලාපය)** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1995). **ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු.** කොළඹ: ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍ර ආයතනය.

ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ සහ ශ්‍රී දේවරක්ෂිත පඬිතුමා, බටුවන්තුඩාවේ. 1957. **මහාවංසය- ප්‍රථම භාගය.** රත්නාකර යන්ත්‍රාල

ශ්‍රී ලංකාව. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. (2007) **ශ්‍රී ලංකාවේ ඉතිහාසය- දෙවන කොටස.** ශාස්ත්‍රෝදය ග්‍රැෆික් මුද්‍රණාලය.

සිරිමල්වත්ත, වාසනා. (2006). **සඳකඩපහණ සෞන්දර්යාත්මක විමර්ශනය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හෙට්ටිආරච්චි, කරුණාසේන. (2015). 'කළුතර දිස්ත්‍රික්කයට අයත් අභිලේඛන'. **කළුතොට ශාස්ත්‍රීය සංග්‍රහය**- කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

# Re-reading of the Sigiriya Lion

**W.L.A. Buddisha Jayashan Weerasuriya**

## Introduction

Sigiriya is one of the most sought after archaeological sites in Sri Lanka. Therefore, Sigiriya can be identified as a place that has attracted a lot of attention from researchers and the general public both nationally and internationally. This research also focuses on another interpretation of Sigiriya that has caused such controversy. That is the ideology that has been formed about the Sigiriya Lion. There have been a number of conflicting opinions about the Sigiriya Lion among researchers as well as the general public in recent times.

The debate over the Sigiriya Lion has taken an academic perspective at one time and a racist one at another. Therefore, it is clear from the literature survey that various researchers have tried to present the interpretations of the Sigiriya Lion more logically. This research analyzes the various opinions expressed by the previous researchers on the Sigiriya Lion. Further, this research has analyzed the traditional villagers' views on the Sigiriya Lion scientifically, and has come up with opinions which were not well emphasized by previous researchers.

This research paper identifies the field of the Sigiriya Archaeological site,explores various theories about the Sigiriya Lion, presents new theories about the Sigiriya Lion and further confirms it scientifically.

## Methodology

As the first step of the research methodology the contents of historical sources on Sigiriya and the various interpretations made by later researchers in relation to those facts were studied critically. As an extension of the literary review the various opinions put forward by various individuals and organizations about the Sigiriya Lion on social media were also explored.


The second and most important step in the research is participatory observation. For this, various discussions were first held with the traditional villagers of Sigiriya, Thalkote and Pidurangala Grama Niladari Divisions. Secondly, the researcher tried to confirm the scientific significance of the Sigiriya Lion through the oral tradition. To confirm this, three-pronged analysis was used which are photographic analysis, literary analysis, and linguistic analysis . During the photographic analysis, the Sigiriya rock was photographed from a distance of one and two kilometers.

Further, the Sigiriya graffiti on the Sigiriya Lion were studied in the literary analysis to nurture the new definition.

In linguistic analysis, an analysis was made of the formation of the term Sigiriya. The findings of these three analyses will ultimately confirm the traditional villagers' interpretation of the Sigiriya Lion more scientifically.

## Results and Discussions

Sigiriya is world-famous for its secular architecture and garden architectures and it is a place of secular as well as religious significance that has been inhabited from time immemorial since prehistoric times) Bandaranayake 1984:6; Paranavitana 1956: cciv, 1970:67; Solangarachchi 1990:110). With the British colonial government and its exposure to the world in the 19th century, it gained global attention and various researchers, art critics and the general public came up with hypotheses and interpretations of various creations of Sigiriya. Many such ideologies about the Sigiriya Lion, the centre of this research, have been around since the last century, and are being explored more scientifically, focusing on the interpretation of the villagers around Sigiriya.





**(Map 01: Sigiriya study area)**


There are various opinions among scholars about the Sigiriya Lion. The Sigiriya Lion has always been associated with the name Sigiriya. Many people believe that the stairs at Sigiriya are named after a lion-like staircase. They believe that *"Sinha"* + *"Giriya"* is Sigiriya because it has to be climbed through the lion's throat. According to Arisen Ahubudu, a member of the Hela Hawula language organization representing the Colombo literary era, the term "Sigiriya" was derived from *"Siva"* + *"Giriya"* (Ahubudu 2000:180-181). They were of the opinion that the name Sigiriya was created with the story of the Ravana myth which cannot be believed historically or archaeologically. But as archaeologists, that unconfirmed opinion must be dismissed without question. Furthermore, the fact that the term "Sigiriya" was derived from *"Sinha"* + *"Giriya"* is the opinion expressed by the experts such as Senarat Paranavithana and Senaka Bandaranayake as well. I think the Sigiriya villagers' interpretation of the overall appearance of the Sigiriya rock is parallel with the formation of the name Sigiriya. This idea is more correct according to the archaeology, ethnology and linguistic aspects. Researchers seem to have forgotten the simple principle used by the ancient Lankans to name places. In studying the factors that influenced the formation of the name Sigiriya, it is important to look not only at the construction of the Sigiriya

rock but also at its overall appearance. Failure to do so has led to various misconceptions about Sigiriya on social media.

It can be agreed that the linguistic feature of *"Sinha"* + *"Giriya"* was the basis for the name Sigiriya. Researchers seem to have been misled by the lion-footed staircase and the imaginary lion figure built along with it. It seems that researchers have misunderstood not only the stairs with lion feet but also the two words *"Sinha"* + *"Giriya"*. Although "*Giriya"* means an organ called the throat, the word *"Giriya"* has other meanings in the Sinhala language. *"Giriya"* means rock. "*Sinha"* + *"Giriya"* means the throat of a lion as well as the rock of a lion (Mahā Sinhala Shabdhakoshaya 2005:678). Also, names like *Malayagira*, *Giridivaina* and *Chethiya Giriya* are found in history as a rock rather than throat. When Sigiriya got its name, it is more practical to think that it was linguistically based on its appearance than on the structure inside. The villagers of the traditional villages around Sigiriya are not aware of the idea of a lion's throat and their traditional story is that the rock with the appearance of a lion is Sigiriya.

The fact that the Lion scene at Sigiriya is visible to anyone around Sigiriya proves that its appearance was the basis for the formation of the name Sigiriya. This can be seen in the photographs of Sigiriya from a distance. There is also an imaginary drawing of the Sigiriya rock created by combining the lion image shown in those photographs.





**(Fig 01: Sigiriya rock visible to Pidurangala)** **(Fig 02: Imaginary image of the lion at Sigiriya)**

The lion shape of Sigiriya is clearly visible from the major landmarks such as Pidurangala, Māpāgala and Thalkote wewa which surround the Sigiriya rock. (Map 01). It is conceivable that the villagers in the past who had a close connection with the nature, when observing the shape of Sigiriya from a distance may have seen the lion image we see today and used the name Sigiriya for the rock.

When we look at the naming of villages and other important places in ancient Sri Lanka, it is clear that those places were named based on a certain distinctive feature. For example, *Athugala*, a rock close to the city of Kurunegala, got its name from the shape of an elephant on the rock. The Rajagala Archaeological Site in the Ampara District can be identified as a place that confirms this fact historically. Instead of the name Rajagala, the area was formerly known as *"Girikumbheela"*. *"Kumbheela"* means crocodile in Pali and in the past Rajagala was known as "*Girikumbhila"* with the idea of a crocodile shaped rock. The shape of a crocodile can be clearly seen from a distance. The naming of Sigiriya may be due to the appearance of the rock like Rajagala (Mandawala et al 2018:6-8). In addition, the rocks such as *Katusukonda, Andāgala, Ritigala, Kudumbigala, Tudugala, Batalegala and Kababaragala* have been given names according to their shape. It is thus clear that the rocks were named by the ancient people according to their shape. Furthermore, the villages have been given names according to the characteristics of *Deniya*, *Pitiya*, *Wewa*, *Wela*, *Ovita*, *Kanda*, *Thota* and etc. Sigiriya also has a simple feature of naming language based on special features. From ancient times, people have seen the image of a lion on the Sigiriya rock from a distance, so it can be assumed that it was later used as Sigiriya in the sense of *Sinha + Giriya* or *Sinha gala*.

The lion face of the Sigiriya rock, as highlighted in this research, is naturally formed in the northern part of the rock, and the lion-footed staircase on the Sigiriya rock faces north. Due to the north-facing orientation, it can be assumed that the main focus of the Sigiriya design is on the north. It may be assumed that perhaps the shape of the lion's face in the rock in the north-facing direction was later created creatively with a preference for that side.

Many references to the Sigiriya Lion are also found in the graffiti on the Sigiriya Mirror Wall. The information about the lion mentioned in this graffiti is also an important source that should be

explored in this study. Studying the Sigiriya graffiti reveals references to lions such as *"Seeraju", "Sihimiyan"* and *"See"* (Paranavitana 1956: No.205, No.576, No.476). Many of those graffiti say that many visitors to Sigiriya were amazed to see the Sigiriya Lion. Mentioning that they were amazed to see the Sigiriya lion after climbing the Sigiriya rock, it is clear that they saw the stairs with the lion's feet and composed the graffiti. According to ancient legends about the lion at Sigiriya, it is possible that King Kasyapa I created the lion's feet on the rock of Sigiriya.

Although the traditional villagers superstitiously believed that the appearance of Sigiriya rock was not a natural creation but a human creation, we as researchers could not agree with that idea. Considering the rock composition of Sigiriya rock, it is clear that this rock was formed during the pre-Cambrian period by the accumulation and condensation of magma in the interior of the earth. Garnet Hornblende Biotite (Gt-Hb-Bt) Gneiss is the lowest of the rock units. Biotite Hornblende Migmatitic Gneiss (Bt-Hb) is the middle rock unit. The higher rock unit contains Garnet Gneiss. The lion's paws show a distinct demarcation between the upper and middle rock units. Granitic Gneiss to the west and Impure Marble to the east make up the ground layer's adjacent rock units (Jayasinghe 2010:308). It is clear that the Sigiriya rock got that shape due to the above features of the rock formation. The rock has this unique shape depending on the speed of rock digestion and is naturally shaped like a lion.

Another interesting interpretation which has become very popular on social media recently is that the remains at the Sigiriya Lion staircase depicts a bird's shape, not a lion. Ishanka Malsiri has logically confirmed that it depicts a lion (Malsiri 2017:293-296). But it is a problem that studies on the lion of Sigiriya do not pay attention to the overall appearance of Sigiriya as emphasized in this research. It is more logical to assume that Lion's Staircase may have been based on Lion's story, which was popular then.

## Conclusion

The above research has tried to confirm that Sigiriya got its name because of its appearance rather than the lion foot staircase of Sigiriya. There, the general opinion held by researchers and the general public regarding the name of Sigiriya is that Sigiriya came into being because it had to be

climbed through the lion's throat. It is possible that the idea put forward by the researchers may have contributed to the formation of that idea in the general public. However, the above research has shown that Sigiriya got its name from its natural environment rather than its built environment. Whether linguistically, literary, or folkloric, there is ample evidence to support that view. It is not difficult for anyone approaching Sigiriya or looking at Sigiriya from a surrounding area like Pidurangala to stick to this idea.

## Acknowledgement

Special thanks to Mr. Sumudu Saman (Pinthu), Mr. Shehan Dhanapala, Mr. Isuru Udawatta, Ms. Dilumrasi Randulani, Mr. Sahan Haputantiri and the villagers around Sigiriya for their support in conducting this research.

## References

Ahubudu, A. (2000). *Lanka Gam Nam Wahara*, Colombo: S. Godage & Brothers Pub.

Bandarayake, S. (1984). *Sigiriya First Archaeological Excavation and Research Report*, Colombo: Central Cultural Fund.

Bandaranayake, S. (2010). *"Sigiriya: Notes on the Conjectural Reconstruction of the Palace and the Staircase"*, Sirinimal Lakdusinghe Felicitation Volume, Prishantha Gunawardhana, Gamini Adikari, R.A.E. Coningham (ads), Battaramulla: Neptune Publications, pp. 25-40.

Jayasinghe, P. (2010). *"Geological Background of Some Archaeological Sites of Sri Lanka"*, Sirinimal Lakdusinghe Felicitation Volume, Prishantha Gunawardhana, Gamini Adikari, R.A.E. Coningham (ads), Battaramulla: Neptune Publications, pp. 303-313.

*Mahā Sinhala Shabdhakoshaya*, Harischandra Wijetunga (ed.) (2005). Colombo: M.D. Gunasena & Co.

Malsiri, I. (2017). *"Sigiri Sinhapādha Pilibandha Newatha Vimasā Balimak"*, Proceedings, 3rd National Buddhist Conference, Anuradhapura: Bhiksu University of Sri Lanka.

Mandawala, P.B., P. Kannangara, Ven. D. Amila Thero, K. Hettiarachchi and A. Kapukotuwa (2018). *Rajagala Puravidya Paryeshana*, Colombo: Department of Archaeology.

Paranavitana, S. (1956). *Sigiri Graffiti*, Vol. II, London: Oxford University Press.

Paranavitana, S. (1970). *Inscriptions of Ceylon*, Vol. I, Colombo: Department of Archaeology.

Solangarachchi, R. (1990). *"Preliminary Explorations in the Eastern Precinct"*, The Settlement Archaeology of the Sigiriya Dambulla Region, Colombo: Postgraduate Institute of Archaeology.

# ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් වෙහෙරබැදිකන්ද ආරාම සංකීර්ණයෙහි ඇති අප්‍රකාශිත ගිරි ලිපි පිළිබඳ අධ්‍යයනයක්

**පූජ්‍ය කන්තලේ සුමිත්ත හිමි**

**තනුර දයානන්ද**

## හැඳින්වීම

මෙම පර්යේෂණ පත්‍රය මඟින් ඉදිරිපත් කරනු ලබන ශිලාලේඛන සියල්ල ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගෝමරන්කඩවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කිඹුල්පැටියාව ග්‍රාමසේවා වසමට අයත් පැරණි ආරාම සංකීර්ණයක දක්නට ඇත. කිඹුල්පැටියාව වැවට ඉහළින් ඇති රක්ෂිත භූමියට අයත් මෙම ආරාමය ප්‍රාදේශීය ජනතාව වෙහෙරබැදි කන්ද වශයෙන් හඳුන්වනු ලබයි. 2022 වර්ෂයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම ආරාම සංකීර්ණ භූමියෙන් ගිරි ලිපි තුනක් සොයාගෙන ඇතත් ඒවා මෙතෙක් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කොට නැත. වර්තමානය වන විට නිධන් පහරනන් විසින් මෙහි ඇති පැරණි ස්තූපය ඇතුළු ආරාමික වාස්තු විද්‍යාත්මක අංග බොහොමයක් විනාශ කර ඇතත් ශිලාලේඛනවලට බරපතළ හානි සිදු කොට නොතිබීම වාසනාවකි. අප්‍රකාශිත මෙම ගිරි ලිපි 3 ක්‍රිස්තු වර්ෂ 2-4 සියවස් අතරට අයත් වන අතර ඒ මඟින් අතීතයේ දී මෙම ආරාමය හැඳින් වූ නාමයත්, විහාරයට පූජා කරන ලද කෙත් වතු ආදිය පිළිබඳවත් නව තොරතුරු රාශියක් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබේ. අපගේ කියවීමට අනුව මෙම විහාරයේ පැරණි නාමය **ගබිරිවලි විහාරය නම් වෙයි.** මේ හැර අප්‍රකාශිත මෙම ගිරි ලිපි අධ්‍යයනය කිරීම තුළින් සමකාලීන සමාජයේ ආගමික, දේශපාලනික හා සාමාජීය තොරතුරු බොහෝමයක් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

## සාකච්ඡාව


නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගෝමරන්කඩවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ අංක 231, ගල්කඩවල ග්‍රාමනිලධාරී වසමට අයත් මෙහි භූගෝලීය ස්ථානීය පිහිටීම උතුරු අක්ෂාංශ 08˚42’31.0’ හා නැගෙනහිර දේශාංශ 80˚ 39’ 55.17.4’’ක් ද මුහුදු මට්ටම් උස මීටර් 30 ක් පමණවේ. ගෝමරන්කඩවල සිට තිරප්පනය මාර්ගයේ පැමිණි පසු ගල්කඩවල ගම්මානය හමුවේ. එහි දී හමුවන කිඹුල්පැටියාව වැව අසල ඇති බොරලු කපන ලද පාරේ විදුලි වැට දක්වා පැමිණ එතැනින් කුඹුරු යායක් මැදින් වැලිවැව වැකන්ද අසලට පැමිණිය යුතු ය. එම වැකන්ද දිගේ කිලෝමීටර් තුනක් එනවිට වැලිවැවේ පිටවාන හමුවේ. ඉන් කිලෝමීටර් දෙකක් පැමිණි විට වෙහෙරබැදි කන්ද රක්ෂිතය ඇත. එහි ගරාවැටුණු ස්තූපය අසල උක්ත ශිලාලේඛන හමුවේ. මෙම ශිලාලේඛන සියල්ල ම ගිරිලිපි වන අතර ක්‍රිස්තු වර්ෂ දෙවෙනි සහ

හතරවෙනි සියවස් අතරට අයත් ය. අක්ෂර අපර බ්‍රාහ්මී වන අතර, නූතන සිංහල භාෂාවෙන් ලියවී ඇති ගිරි ලිපි තුනකි. පළමු ලිපිය ස්තූපය අසල ගල් තලාවේ ස්තූපයට ආසන්නයේම පහළින් මධ්‍යයට වන්නට පිහිටා ඇති අතර දෙවන ලිපිය ස්තූපය අසල ගල් තලාවේ ඉහළ කෙරවලේහි දිගට කොටා ඇති ලිපියකි. තෙවන ලිපිය ඉහත ගිරිලිපි දෙකට ඉදිරිපිට ගල්තලාවේ පහතින් බෑවුමේ කොටා ඇත. මෙම ශිලාලේඛන පිහිටි ස්ථානයේ පුරාවිද්‍යාත්මක වැදගත්කම අතින් පැරණි නටබුන්ව ගිය ස්තූපයක් දැකිය හැකි අතර ඒ අවට ගල්කෙම්, ගල් කොවා කිහිපයක් හා පැරණි ගොඩනැගිල්ලක් තිබූ බවට සාධක දැකිය හැකි ය.

## පළමු ගිරි ලිපිය

මෙහි අක්ෂර අනුව ක්‍රිස්තු වර්ෂ 2-3 අතර කාලයට අයත් අක්ෂරය. පේළි හතරක ගිරි ලිපියක් වන මෙහි දිග සෙන්ටි මීටර් 162 හා පළල සෙන්ටි මීටර් 70 වේ. අක්ෂරයක් දළ වශයෙන් දිගින් සෙන්ටි මීටර් 11 සහ පළලින් සෙන්ටි මීටර් 12කි. අක්ෂර පැහැදිලි ලිපියකි. අමාත්‍යවරයෙකුගේ පුත්‍රයෙකු ස්තූපයකට පෑල් තුනක කුඹුරු පූජා කිරීමක් පිළිබඳ තොරතුරු අන්තර්ගත ය. මකන විළිය නම් කෙත් යායට අයත් තුන් පෑලක කුඹුරු සගබත නම් ඇමතිගේ මහමිත්ත නම් පුත්‍රයා විසින් ගබිරිවිල නම් විහාරයේ ඇති ස්තූපයට පූජා කර ඇති බව මූලික අදහස යි. ඒ අනුව මෙහි සඳහන් ගබිරිවලි නම් විහාරය මේ ශිලාලේඛන තුන සහිත භූමි භාගය විය හැකි ය. ඊට අයත් ස්තූපය මේ ලිපියට උඩින් ඇති ගරා වැටුණු ස්තූපය බව නිශ්චිත ය. ඒ අනුව ඉහත දීමනාව මේ සඳහා සිදු කරන ලද්දකි. මෙහි රජු සහ කාලය පිළිබඳ ව අන්තර්ගත නොවේ. මෙහි සඳහන් කුඹුරු සහ කෙත් යාය මේ අවට ප්‍රදේශයේ හෝ දැනට කැලයෙන් වැසී ගිය ප්‍රදේශයේ පිහිටියා වන්නට පුළුවන. වර්තමානය වනවිට මෙය කැලෑබද වුවත් තත්කාලීන යුගයේදී ජනයා පිරිගිය සහ රාජ රාජ මහාමාත්‍යාධින් ගැවසුණු ප්‍රදේශයක් බවත් භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් වැඩසිටි ආරාම සංකීර්ණයක් බවටත් අවට ප්‍රදේශය පරීක්ෂාවේදී පැහැදිලි ය. මෙහි අක්ෂර තරමක් වැදගත් බවක් උසුලයි. විශේෂයෙන් ''ල,හ,ත'' යන අක්ෂර තුන වෘත්තාකාර හැඩයක් ගෙන ඇති අතර ''ග'' අක්ෂරයේ වම්පසින් ඇති ආරම්භක කොටස වෘත්තාකාරව ඇතුලට නැමී ඇත. ඒ අනුව මෙහි පෙළ පහත දක්වා ඇත.

## ස්පර්ශ ලාංඡනය



**පෙළ :-**

(1) මකනවිළිය කෙතහි මත සගබ

(2) තහ පුත මහමිතය (වි)මලි බතහ තිද

(3) පයක කුබර ගබිරිවලි වහරහි චෙය

(4) හි දිනිම්

**අර්ථය :-**

මකන විළිය නම් කෙතට අයත් තුන් පෑලක කුඹුරු අමාත්‍ය සගබතගේ පුත්‍ර වූ මහමිත්තය මලිබත විසින් ගබිරිවලි විහාරයේ ස්තූපය සඳහා පූජා කරන ලදී.

**විවරණ -**

**මකනවිළිය කෙතහි**

මකනවිළිය යනු ස්ථාන නාමයකි. කෙතහි කුඹුර යන්න අර්ථ දෙයි (රණවැල්ල 2004:78). ගල්ලෙන් විහාරය (Paranavitana 1970 :98) කයිකාවල (Ibid : 99) ආදි බ්‍රාහ්මී ලිපිවලද කෙත යන්න දක්නට ලැබේ. භික්ෂූන් සඳහා මෙන් ම වෙහෙර විහාර හා විවිධ විහාර අංග සඳහා රජවරුන්, අමාත්‍යවරුන්, ප්‍රභූන් මෙන් ම රටේ සාමාන්‍ය ජනතාව විවිධ අවස්ථාවල තමන්ට හිමි කුඹුරු මෙන් ම කුඹුරුවලින් ලද ආදායම පූජා කළ බවට සාධක මේ යුගයට අයත් සෙල්ලිපි තුළින් අනාවරණය වේ. උදාහරණ ලෙස භාතිය රජු හා අමාත්‍ය මළිතය චෛත්‍ය සඳහා කළ කුඹුරු පූජාවක් ගැන දුනුමඩලාකන්ද ගිරි ලිපියේ (Paranavitana 1983 : 10) දැක්වේ. වසභ රජුගේ දේවනාග නම් අමත්‍යවරයා කුඹුරු කරීස විසි දෙකක් සංඝයාට පූජා කළ බව කාසිමොටායි ගිරි ලිපියේ (Ibid : 73-75) දැක්වේ. තෝරවමයිලෑව විහාර ගිරි ලිපියේ (අමරවංශ හිමි 1969 : 86) මහ අතුල ඇමති දහසක්දී මිලටගත් තිසවිය, රතවිය, දමවිය, මතුක යන කුඹුරුවලින් 1/8 ක කොටස බැගින් තිසපවත සෑයට හා භික්ෂූන්ට පූජා කර තිබේ.

**මත**

අමාත්‍ය යන අර්ථ දේ (රණවැල්ල 2004:239). අමාත්‍ය යනු රාජ්‍ය තාන්ත්‍රික ව්‍යුහයේ ප්‍රධාන තනතුරක් ලෙස සැලකිය හැකි ය. මත වශයෙන් කඳුරුවැව ලිපියක ද සඳහන් වේ (Paranavitana 1970 :97). වේවැල්තැන්න ලෙන් ලිපියක (වික්‍රමසිංහ සහ කරුණාරත්න 2000 : 75) මහමත වශයෙන් ද කඳුරුවැව ගිරි ලිපියක (Paranavitana 1983 : 56) මහ අමෙතිය වශයෙන්ද මේ තනතුර පිළිබඳ සඳහන් ය.

**තිද පයක**

'විහාරයට තුන් පෑලක් දෙන ලදී' යන්න ඉන් අර්ථවත් වේ. පයල යනු කිසියම් වැවකින් අස්වද්දන්නට යෙදුණ පැරණි කුඹුරු මැනීම සඳහා යොදා ගත් ක්‍රමවේදයක් ලෙස මෙය පෙන්වා දිය හැකි ය. ඒ බව පැරණි ශිලාලේඛන තුළින් සඳහන් වේ. ඒ බව අනුරාධපුරය, මිහින්තලේ වැනි ස්ථානයන්හි දැකිය හැකි ය (Dias 1991: 31, 34) පයළ යන ශබ්දයෙන් පෑළ කියයි. (පිටක > පයළ > පෑළ) මාතර පළාතේ පෑළකට කුරුණි දොළොසකි. වී කුඩය යනු අර්ථයයි (විමලකීර්ති හිමි 1957 : 1,34).

**චෙයහි**

චෙයහි යනු චෛත්‍යය යන්න අර්ථ ගන්වයි (රණවැල්ල 2004:103). චෙත යනු සංකෘ. චෛත්‍ය, පාලි. චෙතිය වේ. චෙත යන වචනය විවිධ රූපයන්ගෙන් කාලෙන් කාලෙට දැකිය හැකි ය. චෙත යන වචනය චෙය හෙවත් සෑය ලෙසින් විපරීතව සටහන් වූ අවස්ථා ද වේ. උදාහරණ ලෙස හේරත් හම්මිල්ලෑව ගිරි ලිපියේ (Paranavitana 2001 : 197) "චෙයහි" යන්න සටහන් ව ඇත. කතරගම කිරිවෙහෙර අංක 02 පුවරු ලිපියෙහි ද “මගල මහ චෙය” ලෙස සඳහන් වේ. (Paranavitana 1933 : 218) ක්‍රිස්තු වර්ෂ නවවන ශත වර්ෂයේ දී භාෂාවේ මේ වචනය සෙය සහ සෑ යන රූපවලින් දිස්වේ. මෙහි නවීන සිංහල පදය සෑය වේ (එම : 216). වෙහෙරබැදි කන්ද ලිපියේ දැක්වෙන පරිදි අමාත්‍ය සඟබතගේ පුත්‍ර වූ මහමිත්තය මලිබත ගබිරිවලි විහාරයේ චෙය හෙවත් චෛත්‍ය වෙනුවෙන් ප්‍රදානය කර ඇත. මේ සෙල්ලිපිය අසල ම ඉපැරණි චෛත්‍යයක නටබුන් පවතින අතර (මේ වන විට එම චෛත්‍ය නිදන් හොරුන් විනාශකර ඇත) ඉහත ප්‍රදානය මේ චෛත්‍ය උදෙසා කළ බව ඒ අසලින් ම මේ දීමනාව කොටා සටහන් තබා තිබීමෙන්ම පැහැදිලි වේ.

**දිනිම්**

'දිනිම් යනු දෙන ලදී' හෝ 'පූජා කරන ලදී' යන්න අර්ථ ගැන්වේ. මෙය 'දී' (දීමෙහි) ධාතුවෙන් නිෂ්පන්න වූ ප්‍රථම පුරුෂ අතීත කාල ඒක වචන ක්‍රියා පදයක් ලෙස දැක්විය හැකි ය. මේ පදය බොහෝ සෙල්ලිපිවල පාලියෙන් දින්න හෙවත් දිනි ලෙස හෝ දිනෙ ලෙස සටහන් ව තිබේ. අම්පාර දිස්ත්‍රික්කයේ මුල්ලිකොලුදුමලෙයි ලෙන් ලිපියේ (Paranavitana 1970 : 37) “ දිනෙ” ලෙස ද රිටිගල ආඩියාකන්ද ලිපියෙහි (එම : 20) “ දනි ” ලෙස ද එය සටහන් ව තිබේ. අතීත කාල ක්‍රියා සඳහා එම කාල කෘදන්ත භාවිත කිරීම මධ්‍ය ඉන්දීය භාෂාවේ ප්‍රකට ලක්ෂණයකි. එය පූර්ව බ්‍රාහ්මී යුගය (ක්‍රිස්තු පූර්ව 3 - ක්‍රිස්තු වර්ෂ 1) තුළ ලංකාවට ද බලපෑ ඇති බව මෙහි දී පැහැදිලි වේ (ඩයස් 1996 : 37).

**දෙවන ගිරි ලිපිය.**

ඉහත ශිලාලේඛනය පිහිටි ගල්තලාවේ ම ඉහළ කෙරවළේ දිගට පිහිටා ඇත. ලිපිය පිටපත් කරන අවස්ථාව වන විට ලිපියේ අවසන් කොටස පසින් වැසී තිබුණ අතර පස් හාරා මතු කර ගැනිමෙන් පසු පිටපත් කරන ලදී. තනි පෙළක ලිපියකි. චතුරස්‍රාකාර හැඩයකින් යුක්තව කොටා ඇති අතර දිගින් සෙන්ටි මීටර් 400 හා පළල සෙන්ටි මීටර් 40කි. අක්ෂරයක් දළ වශයෙන් දිගින් සෙන්ටි මීටර් 18 සහ පළලින් සෙන්ටි මීටර් 15කි. අක්ෂරවලට අනුව මෙහි කාලය ක්‍රිස්තු වර්ෂ 1-2 සියවස් අතරට අයත් ය. පැහැදිලි අක්ෂර සහිත ලිපියකි. මෙහි ඇති ගිරි ලිපි තුන අතුරින් මුලින් ම කොටන ලද සෙල්ලිපිය මෙය යි. අක්ෂර අනුව ඒ බව පැහැදිලි ය. එසේ ම පළමු ලිපියේ ගබිරිවලි නම් විහාරස්ථානය පිළිබඳ ව සඳහන් අතර, එහි චෛත්‍යය පිළිබඳව සඳහන් නමුත් ඊට නමක් ලබා දී නොමැත. දෙවනියට ඇති මෙම ශිලාලේඛනයෙන් එම චෛත්‍යය රකියපවස ලෙස හඳුනාගත හැකි ය.

මෙහි අක්ෂර අතුරින් දොළොස්වෙනියට පිහිටි අක්ෂරය යටිකුරු ත්‍රිකෝණයකි. මෙය අක්ෂර කෙටිමේදි ශිල්පියා අතින් වූ දොසක් විය හැකි ය. එසේම ''ච'' අක්ෂරය කෙටිමේ දී එම අක්ෂර අනෙක් පස හරවා කොටා ඇති බව පැහැදිලි ය. එසේම ඊට පසුව ඇති අක්ෂර ''තහට'' බැවින් චතහට ලෙස ගෙන චෛත්‍යය යන අර්ථයෙන් ඉදිරිපත් කළ හැකි ය. තිස්ස තෙරුන් විසින් කරවන ලද රකිය පවස නම් චෛත්‍යය වස් විසීමේ කාර්යය සඳහා දෙන ලද බවත්, තත්කාලීන යුගයේ වස් විසීමේ කාර්යයන් සඳහා පැමිණෙන භික්ෂූන් වහන්සේලාගේ ආගමික කටයුතු සිදු කිරීම පිණිස මෙම පූජාව සිදු කරන ලදැයි ද අර්ථය ලෙස ඉදිරිපත් කළ හැකි ය. ඒ අනුව මෙහි පෙළ පහත දක්වා ඇත.

**ස්පර්ශ ලාංඡනය**



**පෙළ -**

(1) තිස තෙරහ රකිය පවස චතහට වස ගනිය වට ගනිය

**අර්ථය -**

(1) තිස්ස තෙරුන් විසින් (කරවන ලද) රකිය පවස නම් ස්තූපය වස් **විසිම (වෘත්තිය) පිණිස දෙන ලදී.**

**තෙවන ගිරි ලිපිය -**

පෙර සඳහන් කරන ලද ගිරි ලිපි දෙක පිහිටි ගල්තලාවට ඉදිරියෙන් පිහිටි ගල්තලාවේ පහත බෑවුමේ මෙය හමුවේ. පෙළි දෙකකි. ස්ථාන කිහිපයක අක්ෂර හඳුනාගත නොහැකි ලෙස කැඩී ඇත. එබැවින් මෙහි සම්පූර්ණ අර්ථය ම ඉදිරිපත් කළ නොහැකි ය. ලිපි දිගින් සෙන්ටි මිටර් 260 හා පළල සෙන්ටි මීටර් 45කි. අක්ෂරයක් දළ වශයෙන් දිගින් සෙන්ටි මීටර් 10 සහ පළලින් සෙන්ටි මීටර් 8කි. අක්ෂර ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසට අයත්ය. සිද්ධම - යහපතක් වේවා යනුවෙන් සාම්ප්‍රදායික ක්‍රමයට ලිපිය ආරම්භ කර ඇත. එහි 'සි' අක්ෂරය පැහැදිලි අතර, අනෙක් අක්ෂර තුනෙහි ඡායාමාත්‍රයක් ඇති අතර කැඩී ගොසිනි. නමුත් මෙහි ''කුටිබි'' නම් ගමක් පිළිබඳවත් එහි කුඹුරු පිළිබඳවත් සඳහන් වේ. ඒ අනුව පෙළ සහ අර්ථය පහත දක්වා ඇත.



**පෙළ :-**

(1) සිද්ධම --- වලිහි ---තහකුබර කුටිබිගම කෙ(තහි) කරහිච එක

(2) (ච)තරරක කෙතහි කරිහි චතර - - - කරි - කරිහිච

**අර්ථය :-**

(පූර්ණ අර්ථය දිය නොහැකිය.) කෙතකට අයත් කුඹුරක් ද කුටිබිගමේ කෙතෙහි කරිස ප්‍රමාණයක් ද චතරරක නම් කෙතෙහි කරිස සතරක් ද පූජා කර ඇති බව මෙහි සදහන් වේ.

**සංක්ෂිප්තය -**

ඉහත සෙල්ලිපි සාධක අනුව අනාවරණය වනුයේ ක්‍රිස්තු වර්ෂ දෙවැනි සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ හතරවන සියවස දක්වා මෙම වෙහෙරබැදි කන්ද ආරාමික ස්ථානය ඉතා සමෘද්ධිමත් ආගමික ආයතනයක් වශයෙන් පවතින්නට ඇති බව යි. ක්‍රිස්තු වර්ෂයෙන් දෙවන සිසවස වන විට ද මෙකී ආරාමය සැදැහැතියන්ගේ අනුග්‍රහයට ලක් වූ බවක් පෙනී යයි. එම අවධියේ දී මෙම ස්ථානය **ගබිරිවලි** විහාරය ලෙසින් හඳුන්වා ඇත. මෙහි පැවති ස්තූපය **රකිය පවස** නම් වූ බව හඳුනාගත හැකි විය. වර්තමානයෙහි ජනාවාසවලින් ඈත් ව මහ වන මැද හුදකලා ගල් පර්වතයක් මත දඩයමේ හා මී කැඩිමට යන පුද්ගලයන්ගේ පමණක්

වන්දනයට ලක් වන මෙම ආරාමය අතීතයේ දී ඉතා දියුණු ආරාමික ස්ථානයක් වශයෙන් රාජකීය අනුග්‍රහය සහිතව වැජඹුණු ප්‍රදේශයේ ප්‍රමුඛතම බෞද්ධ ආරාමික මධ්‍යස්ථානය වූ බව උක්ත සෙල්ලිපි මඟින් මනාව අනාවරණය වී ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරවංශ හිමි, කොත්මලේ, 1969 ***ලක්දිව සෙල්ලිපි,*** කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ඩයස්, මාලිනී, 1996, ***ලක්දිව සෙල්ලිපිවලින් හෙළිවන සිංහල භාෂාවේ ප්‍රතයාර්ථ නාමයන්ගේ විකාශනය,*** (ක්‍රි.පූ. 3 ශ.ව. ක්‍රි.ව. 10 ශත වර්ෂය දක්වා), *ශිලා ලිපි සංග්‍රහය* III වෙළුම, කොළඹ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

රණවැල්ල, සිරිමල්, 2004, ***සිංහල සෙල්ලිපි වදන් අකාරාදිය***, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ. 1957, ***ශිලාලිපි සංග්‍රහය.*** (සංස්). මොරටුවඃ ඩී. ජී. දොඩංගොඩ සමාගම.

Dias, Malini, 1991 *Epigraphical Notes*, Nos.1-18, Sir Marcus Fernando Road Colombo 7, Sri Lanka, Department of Archaeology.

Paranavitana, S., 1933, ***Epigraphia Zeylanica, Vol. III,*** London, Oxford University Press.

Paranavitana, S., 1970, ***Inscriptions of Ceylon, Vol. I,*** Early Brahmi Inscriptions, Colombo - 07, Department of Archaeology.

Paranavitana, S.,Karunarathna Saddhamangala & Veluppillai, A. 1973 ***Epigraphia Zselanica vol ,***Ceylon. vi Archaeological Survey of Ceylon , Published by the Department of Archaeology.

Paranavitana. s. 1983, ***Inscriptions of Ceylon, vol ii,*** Archaeological survey of Ceylon, published by the Department of Archaeology, Sri Lanka.

Paranavitana. s. 2001***, Inscriptions of Ceylon, vol ii part ii,*** Archaeological survey of Ceylon, published by the Department of Archaeology, Sri Lanka.

# උතුරු මැද පළාතෙන් හමු වූ අප්‍රකාශිත ශිලා ලේඛන කිහිපයක් පිළිබඳ අධ්‍යයනයක්

පූජ්‍ය බැරගම සද්ධානන්ද හිමි
පූජ්‍ය ගම්මහේගේවැව අමිත හිමි
ගාමිණී සමරනායක
නිලංක උදාර ජයරත්න
චමෝද් සඳරුවන්

## හැඳින්වීම

ශාස්ත්‍රවේදී අලුත් දිවුල්වැව සෝමතිලක හිමියන් සහ සංවර්ධන නිලධාරී එච්.එම්.එස්. හේමන්ත මහතාගේ දැනුවත් කිරීම මත, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ලිඛිත අවසරය ලබාගෙන 2021.07.25 සහ 26 දෙදින උතුරුමැද පළාතේ ස්ථාන කිහිපයක සිදු කරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණයකදී මෙතෙක් ප්‍රකාශයට පත් නොවූ සෙල් ලිපි තුනක් සොයා ගැනීමට හැකියාව ලැබුණි (සිතියම් අංක 01).

ඉන් එක් ලිපියක් නීරාවිය නයිපෙණගල ප්‍රදේශයේ පිහිටා ඇත. අනෙක් ලිපි දෙක, වන අලි නිතර ගැවසෙන ආලංකුලම හා හබරණ රක්ෂිතයට මායිම්ව පිහිටා තිබුණි. එම ස්ථානවලට ගමන් කිරීම අතිශය දුෂ්කර විය. අලුත් දිවුල්වැව ග්‍රාමයේ සිට ට්‍රැක්ටරයක ආධාරයෙන් රක්ෂිතය හරහා වැටී ඇති දුෂ්කර මාර්ග ඔස්සේ කි.මී. නවයක පමණ වනය තුළට ගමන් කිරීමෙන් අනතුරුව, සෙල්ලිපිය ඇති ස්ථානයට තවත් කි.මී. 3ක් පමණ පා ගමනින් ගමන් කළ යුතු විය. එම ස්ථානවලට ගමන් කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය සහ ප්‍රවාහන පහසුකම් ලබා දීමට ඉදිරිපත් වූයේ අලුත් දිවුල්වැව ග්‍රාමයේ පදිංචි සාලින්ද ලක්ෂාන්, අෂාන් මදුරංග, බන්දුල විජේසූරිය, ලලිත් විතාන, කසුන් මධුසංඛ, චානුක නවීන්, අකිල කේෂාන්, ගයාන් සපුමල් සහ වජිර රණසිංහ ඇතුළු කණ්ඩායමයි. (ඡායාරූප අංක 01,02)

## පර්යේෂණ ගැටලුව

රජරට කලාපයේ පැවති සමාජ පසුබිම අධ්‍යයනය කිරීමේදී නීරාවිය නයිපෙණගල ගිරිලිපිය, නාගස්වැව ටැම් ලිපිය සහ කටුවාවලගොඩ පුවරු ලිපියෙහි අන්තර්ගතව පවතින වටිනාකම් කෙබඳුද?.

## පර්යේෂණ අරමුණ

ලිපිවල අන්තර්ගතව පවතින දේශපාලනික, ආර්ථික, ආගමික, සාමාජික, සංස්කෘතික තොරතුරු අධ්‍යයනය කිරීම සහ සමාජගත කිරීම.

**සාකච්ඡාව**

**01 - නීරාවිය නයිපෙනගල ගිරිලිපිය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 93 තුලාන ග්‍රාම නිලධාරී වසමෙහි නීරාවිය නයිපෙණගල ගිරි ලිපිය (N $08^{0}$26'38.9" E $080^{0}$32'43.2") පිහිටා ඇත. (ඡායාරූප අංක 03) රඹෑව සිට වව්නියාව A9 මාර්ගයේ කි.මී. 2ක් පමණ ගමන් කිරීමෙන් වැලිඔය හංදියට පැමිණිය හැකිය. වැලිඔය හංදියේ සිට රත්මල්ගහවැව මාර්ගයේ කි.මී. 1.4 පමණ ගමන් කළ පසු බොරලුඉන්න හංදිය හමුවේ. එම හංදියෙන් දකුණට හැරී කල්ලන්චිය-කපිරිග්ගම මාර්ගයේ කි.මි. 2.4 ගිය පසු ගිනිකටුවැව ගම්මානයෙන් දකුණට හැරී වළවා හැංගුණ වැව ග්‍රාමයට වැටී ඇති බොරලු මාර්ගයේ මීටර් 800ක් පමණ ගිය විට නයිපෙණගල නමින් හැඳින්වෙන ස්ථානයට පිවිසිය හැකිය.

ගිරිලිපිය පිහිටි ගල්තලාව උතුර-දකුණ දිශානුගතව පිහිටා තිබේ. ලිපිය පිහිටි ස්ථානයට කේන්ද්‍රගතව ආරාමික නටබුන් සාධක දක්නට ලැබේ. ශිලාලේඛනයට ගිනිකොන දිශාවෙන් මීටර 30ක් පමණ දුරින් පර්වත පෘෂ්ඨය මත ඉදි කරන ලද ස්තූපයක සාධක පවති. නිධන් හොරුන්ගේ ග්‍රහණයට ලක් වී ඇති එම ස්තූපයේ දැනට ශේෂව ඇත්තේ විසිරී ඇති ගඩොල් කැබලි පමණි. සෙල් ලිපියට මීටර් හතරක් දුරින් උතුරු දිශාවට බරව පිහිටි පර්වත පෘෂ්ඨය මත කේතුකාවාට කිහිපයක් සහ ඉදි කිරීමක් සඳහා කපන ලද චතුරස්‍රකාර කට්ට සලකුණු කිහිපයක් වේ. සෙල් ලිපියට මීටර් 20ක් පමණ නැගෙනහිර දිශාවෙන් ආයත චතුරස්‍රකාර ඉදි කිරීමක සාධක ද වේ. එම ඉදි කිරීමෙහි දැනට ශේෂව ඇත්තේ චතුරස්‍රකාර සලකුණු සහිත පාදස්ථල (කුලුනු පාදම්) පමණි. අපගේ පර්යේෂණයට ලක්වන ශිලා ලේඛනය අක්ෂර ලක්ෂණ අනුව ක්‍රි.ව. 02 හා 03 සියවස්වලට අයත් වන අතර අක්ෂර පේළි හතරකින් යුක්ත වේ. කෙසේ වෙතත් මෙම ලිපියෙහි අක්ෂර කීපයක් ගෙවී ගොස් ඇති හෙයින් එම අක්ෂර මදක් සැක සහිතව කියවා අර්ථ ගනු ලැබිණි.



ලිපියෙහි පෙළ

1- **සිදධ/ රකිපොඩමනගම වසිය**
2- **චුනක මතහ (පුත) චතර**
3- **තුමහ අකහ (දිනි) බ(දො)**
4- **රි පගහ චෙත දිනි**

**5- අර්ථය හා විශ්ලේෂණය.**

යහපතක් වේවා! රකිපොඩමන ගමෙහි වාසය කරන චුනක අමාත්‍යවරයාගේ පුත්‍ර සතර විසින් තමාගේ අක දී (වැයකොට) චේතිය හා බද්ධ දොරටුවෙහි පියගැට දෙන ලදී.

සෙල්ලිපියෙහි එන **බදොරි** යන්නට **බද්ධ ද්වාරය** යන අරුත් ගත්තෙමු. **පගහ** යන පදයෙන් **පදගඩ** හෙවත් **පියගැට** යන්න අදහස් කළ බව සැලකිය හැකිය.

**02 - නාගස්වැව ටැම් ලිපිය**

වර්තමානයේ නාගස්වැව නමින් හැඳින්වෙන ස්ථානයේ පිහිටි ලේඛනය ක්‍රි.ව. 9-10 සියවස්වලට අයත් ටැම් ලිපියකි. එම ලේඛනය ගලෙන් බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලුත් දිවුල්වැව ග්‍රාමයට කි.මී.12ක් පමණ ඊශාන දෙසින් ආලංකුලම හා හබරණ රක්ෂිතයට මායිම්ව පිහිටි පුරාණ වැව් බැම්මක පිහිටා තිබේ. (N $08^0$17'30.7" E $080^0$50'17.0") මුලින් ටැම් ලිපිය පිහිටි ස්ථානය නිධන් සොයන්නන් සෙ.මී.290ක් පමණ ගැඹුරට හාරා සෙල්ලිපියටද හානි කොට පසෙකට ඇද දමා තිබේ. ටැම් ලිපිය කොටස් හතරකට කඩා වෙන් කර ඇති අතර එහි ටැබෙහි පහළ කොටස මේ වන විට අස්ථානගතය. කොටස් දෙකකින් යුක්ත අක්ෂර සහිත මධ්‍ය සීමාවේ උස සෙ.මී. 108කි. එහි පළල සෙ.මී. 16කි. රළු නිමාවක් සහිත මුහුණත් සතරකින් යුක්ත ටැබෙහි මුහුණත් තුනක අක්ෂර පේළි සටහන් කර ඇත (ඡායාරූප අංක 04). ලිපියෙහි එක් පේළියක් හැර සෙසු පේළි පහසුවෙන් කියවා ගැනීමේ හැකියාව ඇත.



**ලිපියෙහි පෙළ**

| අ | ආ | ඉ |
|---|---|---|
| 1 අභාසලමෙ | 1 රක්සා | 1 ගෙරි වැ |
| 2 වන් මපුර් | 2 දෙකැ බැ | 2 මියර නො |
| 3 මුකා පස් ව | 3 ල්ලෙ ස | 3 මඬවනු |
| 4 න්නෙහි | 4 ම් දරුැය | 4 ඉසා මෙ |
| 5 වැපැ පුර ද | 5 න ගිවි | 5 කළ කෙ |
| 6 ස වැකහි | 6 ස්වා පි | 6 නෙක් වු |
| 7 ඇත් වෙහෙ | 7 සිම්බුරුැ | 7 ව පෙරෙනා |
| 8 රබ ද (වා) | 8 වත වැ | 8 ට්ටු අ |
| 9 (ගලු) ගමෙ දෙ | 9 මිය ර | 9 ණ මැකු |
| 10 කැබැලි ලද් | 10 (ට් ලනු) | 10 වාහ |
| 11 මහ මාඩැබි | 11 (ඉසා මිවු) | |

**අර්ථය**

මහරජුගේ අභිෂේකයෙන් පස්වන වර්ෂයෙහි වප් (ඔක්තෝබර්) මාසයෙහි පුර දසවක දිනදීය. ඇතුල් විහාරය බද (වාගලු) නම් ගමෙහි ඉඩම් කොටස් දෙකක් ලද ප්‍රධාන තීරුබදු නිලධාරි රක්ෂා විසින් එම ඉඩම් කැබලි දෙකට අයත් ජල බද්ද රාජ්‍ය නිලධාරීන්ගේ සම්මතය ඇතිව (වැව් බැම්මෙහි ආරක්ෂාවට යොදවන ලදී) මී ගව (එළ) ගවයන් ලවා වැව් බැම්ම නො පෑගවිය යුතුය. යමෙකු මෙය කරන්නේ නම් පෙරනාට්ටු (බහිරංග) නිලධාරීයාගේ අණ උල්ලංඝනය කළා නම් වෙයි.

**විශ්ලේෂණය**

වසර දහසක් පමණ පැරණි මෙම ලේඛනය පිහිටුවීමට දායකත්වය සපයා ඇත්තේ රක්ෂා නැමැත්තෙකි. ඔහුගේ තනතුර "මහ මාඩැබී" යනුවෙන් දක්වා ඇත. වෙනත් අභිලේඛනවල මෙම තනතුරු දක්වා ඇත්තේ මාඩබී, මාඩැබි සහ මාඩම්බියා වශයෙනි. මෙම තනතුරු පිළිබඳ දීර්ඝ විමර්ශනයක් කරන පරණවිතාන එමඟින් තීරු බදු අය කරන නිලධාරියා අර්ථවත් වන බව පෙන්වා දෙයි (Paranavitana 1933: 256). මැදඋයන්ගොඩ විමලකිත්ති හිමියන්ගේ අදහස වන්නේ එම තනතුර මඟින් නගරයක ප්‍රධානියා අර්ථවත්වන බවය (විමලකිත්ති හිමි 1957:170). මෙහි දී පරණවිතානගේ මතය වඩාත් සාධනීය බව පෙනේ. ඒ අනුව ලිපියෙහි සටහන්ව ඇති **මහ මාඩැබී** යන තනතුර රජයේ ප්‍රධාන තීරු බදු නිලධාරි බව ගම්‍යවේ. ඔහුට **ඇත් වෙහෙර** හෙවත් ඇතුල් විහාරය බද **වාගලුව** නමැති ගමෙහි පිහිටි ඉඩම් කැබලි දෙකක අයිතිය

තිබූ බව කියැ වේ. එම ඉඩම් කැබලි දෙකෙහි බද්ද රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුමැතිය සහිතව වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා යොදවා තිබේ.

වාගලුව යන ග්‍රාමය කවර ස්ථානයක පිහිටියේද යන්න සහ රක්ෂාට අයත් ඉඩම් කැබලි දෙකට කවර භූමි ප්‍රමාණයක් අයත් වන්නේද යන්න පැහැදිලි නැත. එහෙත් අනුරාධපුර යුගයට අයත් පොලොන්නරු රාජ සභා මණ්ඩප ලිපිය (Paranavitana 1943:40) සිව්වන මිහිඳු රජුට අයත් අනුරාධපුර ඇතුල්නුවර යන ලිපිවලද රාජ්‍ය නිලධරයන් පරිහරණය කරන ලද 'දෙකැබලි' (කැබලි දෙක) ඉඩම් ගැන සඳහන්ව ඇත (Wickramasinghe 1912:116).

නාගස්වැව ටැම්ලිපියෙහි කියැවෙන ආකාරයට ඉඩම් කැබලි දෙකට අයත් ජල බද්ද වැව් බැම්මෙහි සිදුවන විවිධ කඩතොළුවීම් පිළිසකර කිරීමට යොදවන්නට ඇති බව උපකල්පනය කළ හැකිය. එසේම ප්‍රතිසංස්කරණය කරන ලද වැව් බැම්ම (වැ මියර) මත මී ගවයන් සහ එළ ගවයන් ගෙන යාම තහනම් කරමින් නියෝග පනවා තිබේ. එය හුදෙක්ම ගව කුරවලින් වැ නියරට සිදු වන හානිය අවම කර ගැනීම සඳහා යොදන ලද උපක්‍රමයකි. එම නියෝග කඩ කිරීම පෙරනාට්ටු (බහිරංග) නිලධාරියාගේ අණ උල්ලංඝනය කිරීමක් බවද අවධාරණය කර ඇත.

ඒ අනුව මෙම ශිලා ලේඛනය කරුණු කිහිපයක් නිසා විශේෂ වේ. පුරාණ වැව් බැම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳව කරුණු අනාවරණය වීම ඒ අතර ප්‍රධාන වේ. ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තා වී ඇති ශිලා ලේඛන අතුරින් වැව් බැම්ම මතින් ගවයන් ගෙන යාම තහනම් කොට නීති පනවා ඇති එකම ශිලා ලේඛනය මෙම ලිපිය වීමද විශේෂත්වයකි. ක්‍රි.ව. 9-10 සියවස් අතරට අයත් වන මෙම ලිපියෙහි කියැවෙන **පෙරනාට්ටු** හෙවත් **බහිරංග** නමැති රාජ්‍ය නිලධාරියා තත්කාලීන වාරි කර්මාන්තය හා සම්බන්ධ පුද්ගලයකු බවද අනුමාන කළ හැකිය. මෙම ලේඛනයෙහි මහ රජෙකු පිළිබඳව සඳහන්ය. එහෙත් ඔහු **"අභාසලමෙවන්"** යන අභිධානයෙන් ලිපියෙහි පෙනී සිටින හෙයින් ඔහුගේ පුද්ගල නාමය හඳුනා ගැනීම දුෂ්කරය. අක්ෂර ලක්ෂණවලට අනුව ලේඛනය අයත් වන්නේ ක්‍රි.ව. 9-10 සියවස් අතරටය. එම කාල සීමාවේදී පාලකයන් දෙදෙනෙකු පමණ 'අභාසලමෙවන්' යන අභිධානය යොදා ගෙන ඇත. එම පාලකයන් දෙදෙනාගෙන් එක් අයකු 5වන කාශ්‍යප රජතුමා (914-923) වන අතර අනෙක් පාලකයා 4වන දප්පුල (ක්‍රි.ව. 923-935) රජතුමාය. ඒ අනුව මෙම ලේඛනය මොවුන් දෙදෙනාගෙන් එක් අයෙකුට අයත් විය යුතුය. 4වන දප්පුල රජතුමාට රක්ඛ ඉලංග නම් සෙන්පතියකු සිටි බවද වංශකථාවේ කියැවේ (මහාවංසය 1967: 51, 10). කෙසේ නමුත් සෙල්ලිපියෙහි කියැවෙන මාඩැබ් රක්සා සහ 4වන දප්පුල රජතුමාගේ සෙන්පතියා වූ රක්ඛ ඉලංග නම් සෙන්පතියා එකම පුද්ගලයකුද යන්න හඳුනා ගැනීම සැක සහිතය.

**03 - කටුවාවලගොඩ පුවරු ලිපිය**

නාගස්වැව ටැම්ලිපිය පිහිටි ස්ථානයට ගිනිකොන දෙසින් කි.මී. 5ක් පමණ දුරින් හබරණ රක්ෂිතයට මායිම්ව පිහිටි කටුවාවලගොඩ (N 08$^{0}$15'00.1'' E 080$^{0}$51'27.4'') නමින් හැඳින්වෙන ස්ථානයෙහි මෙම

පුවරු ලිපිය පිහිටා ඇත. මෙහි දිග සෙ.මී: 124ක් වන අතර පළල සෙ.මී: 40කි. ගනකමද සෙ.මී: 16කින් යුක්ත පුවරුවක තිරස් අතට යෙදූ ඉරි අතර ලිපිය සටහන් කර තිබුණි. පේළි 16කින් යුක්ත පුවරු ලිපියෙහි ඉහළ කොටස විමනාකාර සැරසිල්ලකින් යුක්තය. අක්ෂර ලක්ෂණවලට අනුව මෙම ලේඛනය පොලොන්නරුව යුගයේ රචනා කරන ලද දමිළ ලේඛනයක් ලෙස උපකල්පනය කළ හැකිය. ස්වාභාවික ඛාදනයන් හේතුකොට ගෙන ලේඛනයෙහි අක්ෂර සහිත මුහුණත බෙහෙවින්ම ගෙවී ගොස් ඇති හෙයින් කියවා අර්ථ ගැන්වීමේ හැකියාවක් නොමැත.



පුවරු ලිපිය පිහිටා ඇති අවකාශය තුළ නටබුන්ව පවතින ඉදිකිරීම් කිහිපයක් වේ. ලිපියට මීටර් 2ක් පමණ දුරින් ගල්කණු සහිත ඉදි කිරීමක් වෙයි. එම ඉදි කිරීම මධ්‍යයෙහි මීටර් 1.5ක් පමණ ගැඹුරට නිධන් සොයන්නන් හාරා දමා ඇත. පුවරු ලිපිය පිහිටි ස්ථානයට මීටර් 11ක් පමණ දුරින් උතුරු දිශාවෙන් ගල් කණු සහිත තවත් ඉදි කිරීමක් වෙයි. එම ඉදි කිරීමෙහි දැනට ශේෂව පවතින කුලුනු ප්‍රමාණය 27කි. දළ වශයෙන් එක් කණුවක උස සෙ.මී. 260කි. මතු පිට නිරීක්ෂණය වන සාධකවලට අනුව එම ඉදි කිරීම පිළිම ගෙයක් ලෙස හඳුනා ගැනීමේ හැකියාව ඇත. මෙම පරිශ්‍රයේ ස්ථාන කිහිපයක ස්තූප කිහිපයක නටබුන්ද වෙයි. එම ස්තූප සියල්ල මේ වන විට නිධන් හොරුන්ගේ ග්‍රහණයට දැඩිව ලක්ව ඇත. තවද මෙම පරිශ්‍රයේ ස්ථාන කිහිපයක යබොර සහ වළං කැබලි විශාල වශයෙන් දක්නට ලැබේ.

**නිගමනය**

අපගේ අවධානයට යොමු වූ ශිලා ලේඛන අතර ආලංකුලම හා හබරණ රක්ෂිතයට මායිම්ව පිහිටි ක්‍රි.ව.9-10 සියවස් අතර කාලයට අයත් වන නාගස්වැව ලිපිය ශ්‍රී ලංකාවේ තත්කාලීන වාරි කර්මාන්තය හා බැඳුණු

රාජ්‍ය යාන්ත්‍රණය හා සැලසුම්කරණය පිළිබඳව කියැවෙන විශේෂිත ලේඛනයකි. ලිපියෙහි කියැවෙන පුරාණ වැව් බැම්ම සහිත ජල මූලාශ්‍රයද විශේෂිත වාරි වටිනාකම් සහිත එකතුවකි. වැව් බැම්ම ප්‍රතිසංස්කරණයට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා සැලැස්මක් ක්‍රියාත්මක වීම, වැව් බැම්මේ ආරක්ෂාව සඳහා නීති පනවා තිබීම සහ එම ක්‍රියාවන් පාලනය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන් පත් කර තිබීම මඟින් ඒ බව සනාථ වේ. ඒ අනුව උතුරු මැද කලාපීය වාරි කර්මාන්තයේ සුවිශේෂ ක්‍රියාවලිය පිළිබඳව කරුණු කිහිපයක් අනාවරණය කෙරෙන ලේඛනයක් ලෙස නාගස්වැව ටැම්ලිපිය පෙන්වාදිය හැකිය.

***(මෙම ශිලා ලේඛන පිළිබඳව අපව දැනුවත් කිරීමෙන් හා මාර්ගෝපදේශනය ලබා දීමෙන් සහාය දැක්වූ ශාස්ත්‍රවේදී අලුත් දිවුල්වැව සෝමතිලක හිමි, සංවර්ධන නිලධාරි එච්.එම්.එස්. හේමන්ත මහතා ඇතුළු අලුත් දිවුල්වැව ගම්වාසී සැමට ගෞරවනීය ස්තුතිය පුද කරමු. අධ්‍යයනය සඳහා අවශ්‍ය ලිඛිත*** අවසරය ලබා දීමට කටයුතු කළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය අනුර මනතුංග මහතා, අභිලේඛන හා නාණක විද්‍යා අංශයේ සහකාර අධ්‍යක්ෂ නාමල් කොඩිතුවක්කු මහතා, සංවර්ධන නිලධාරි කන්තලේ සුමිත්ත හිමියන් ඇතුළු සැම ද ගෞරවයෙන් සිහිපත් කරමු)

**එලක**




**සිතියම - ශිලාලේඛන පිහිටීම**





**ඡායාරූප අංක 01, 02 අධ්‍යයනය සඳහා සහාය දැක් වූ ප්‍රදේශවාසීන්**



ඡායාරූප අංක 03 - නීරාවිය නයිපෙණගල ගිරි ලිපිය



ඡායාරූප අංක 04 - නාගස්වැව ටැම් ලිපිය

**මූලාශ්‍රය**

විමලකිත්ති හිමි, මැදඋයන්ගොඩ. (1957). **ශිලා ලේඛන සංග්‍රහය**- 4 වන කොටස. මොරටුව : ඩී. පී. දොඩන්ගොඩ සහ සමාගම.

ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ. **මහාවංසය.** (1967). (සංස්.) කොළඹ : රත්නකාර පොත් සමාගම.

Paranavitana, S. (1933). ***Epigraphia Zeylanica***, *Vol. III.* London : Archaeological Survey of Ceylon, Oxford University Press.

Paranavitana, S. (1943). ***Epigraphia Zeylanica***, *Vol. IV*. London : Archaeological Survey of Ceylon, Oxford University Press.

Wickremasinghe, D.M.Z. (1912). ***Epigraphia Zeylanica.*** *Vol. I.* London : Archaeological Survey of Ceylon, Oxford University Press.

# මහනුවර රාජධානියේ යුද හේවායින් හා එහි සංවිධාන ව්‍යූහය පිළිබඳව තුලනාත්මක අධ්‍යනයක්

**සුභසිංහ ආරච්චිගේ ප්‍රසන්න**

ක්‍රිස්තු පූර්ව 490 දී "වූ" රාජධානියේ සන්-ට්සු යුධ කලාව පිළිබඳව දක්වමින් පවසා ඇත්තේ "පරාජයට එරෙහි ආරක්‍ෂාව" යනුවෙනි. එහි අදහස වන්නේ රාජ්‍යයක් සෑම විටෙකම ආරක්‍ෂක උපාය මාර්ගයන්ගෙන් හා ආරක්ෂක සංවිධාන සහිතව පවත්වාගත යුතු බවයි (ගෝවින්නගේ:2015.51). නමුත් අධිරාජ්‍යවාදී විදේශීය ඉතිහාසකරුවන් බොහෝ අවස්ථාවන්හිදී මහනුවර රාජ්‍යයේ රණ ශූරත්වය පිළිබඳව මෙන්ම ආරක්‍ෂක විධිවිධාන වාර්තාකර ඇත්තේ ඉතාම දියාරු ස්වරූපයකිනි. එවන් සාවද්‍ය හා අවඥා සහගත වාර්තා ලෙස මාර්කෝ පෝලෝ වැනි අයගේ අදහස් නිදසුන් ලෙස දක්විය හැකිය. එහිදී ඔහු පවසා ඇත්තේ "මේ දූපතේ මිනිසුන් කිසි ලෙසකින් සටන්කාමී නොවන අතර ඒ වෙනුවට පහත් හා ලජ්ජාශීලින් වේ" යනුවෙනි. බ්‍රිතාන්‍ය ජාතික ජේම්ස් කොඩිනර් ද මෙවැනිම ලෙස "සිංහලයෝ දුප්පත්, අහිංසක, උදාසීන හා යුදකාමී නොවන ජාතියක් වන අතර ඔවුහු උපේක්‍ෂා සහගත, මෘදු, බියාදු හා ලජ්ජාශීලී ජාතියක් වෙති" යනුවෙන් දක්වා ඇත (පෙරේරා:2015.41). එසේම ආරක්‍ෂක සංවිධාන කටයුතුද නිසි පරිදි සිදු නොවූ ආකාරයක් රොබට් නොක්ස් වාර්තා කොට ඇත. මහනුවර හමුදාවන්ට ආහාර සපයන දෙපාර්තමේන්තුවක් හෝ ආහාර හෝ ඉඳුම් හිටුම් පිළිබඳව සොයා බලන නිලධාරින් හෝ නොමැති නිසා සෙබළුන්ට තමාට අවශ්‍ය ආහාර පාන රැගෙන ගොස් පිසගත යුතුවිය. තමාගේ ආහාර පාන නිම වූ පසු යළි ආහාර ගෙන ඒම පිණිස ඔවුන් සිය නිවෙස් කරා යා යුතුය. තල් අතුද රැගෙන යන ඔවුන් රාත්‍රී නාවාතැනට දුව රිටක් ආධාරයෙන් ආවරණයක් සකසා ගනී (කරුණාරත්න:2012.198) යනුවෙන් දක්වා ඇත. එසේම මහනුවර රාජධානිය පිළිබඳව ප්‍රමාණවත් අධ්‍යයනයක් සිදු කර ඇති ලෝනා දේවරාජා වැනි විද්වතුන්ගේ අදහස වී ඇත්තේ මහනුවර රාජධානියේ සීමිත ආර්ථික තත්ත්වයක් පවතින බැවින් එහි රජුට ස්ථිර යුද සේනාවක් නඩත්තු කළ නොහැකි වූ බවයි. එසේම මහනුවර රාජධානිය උපයෝගී කොට ගත් යුද්ධ උපක්‍රම හමුවේ ආරක්‍ෂක ප්‍රයන්තය සඳහා විශාල යුධ සේනාවක අවශ්‍යතාවක්ද නොමැති බවයි. ආරක්‍ෂාව වෙනුවෙන් රාජ්‍ය වටා පිහිටි ස්වාභාවික වන වැස්ම, කඳු හා මෝසම් වැසි මගින් ඇති කළ ජල ගැලීම් ප්‍රයෝජනයට ගෙන ඉතා සරල ගරිල්ලා සංග්‍රාමික ක්‍රම භාවිතයට ගැනීමට පෙලඹීම මත විශාල හමුදාවක අවශ්‍යතාවක්ද නොවූ බවයි. එසේම දිසාවේවරු සතුව තුවක්කු කීපයක් තිබූ නමුත් ඒවා වැඩි වශයෙන් භාවිතා කරන ලද්දේ උත්සව කටයුතු සඳහා පමණක් වන බවයි (දේවරාජා:1997.263). නමුත් මේ අරබයා සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් සිදු කළ අධ්‍යයනවලදී පෙනී ගිය කරුණක් වූයේ බොහෝ විද්වතුන්ගේ පොදු පිළිගැනීම වී ඇත්තේ මහනුවර රාජ්‍යයේ ස්වාධීනත්වය ආරක්ෂා වීමට බලපෑ ප්‍රධාන හේතු සාධකය එහි වූ ස්වාභාවික පරිසරය වන බවයි. එම භූගෝලීය සාධක ජයගත නොහැකිව සතුරු සේනාවන් සෑම අවස්ථාවකදීම පරාජයට පත්වූ බවයි. නමුත් මහනුවර රාජධානියේ යුධ ඉතිහාසය පිළිබඳව සියුම් ලෙස අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ එය එකම සාධකය විය නොහැකි ආකාරයකි. අනාදිමත් කාලයක සිට සිංහල රජවරුන්ගේ ප්‍රධාන වගකීම වී ඇත්තේ රට, දැය හා සමය වෙනුවෙන් පෙනී සිට සතුරන්ගෙන් එය

ආරක්ෂාකර ගැනීමයි. එසේම සිය රාජ්‍යයේ සියලු වැසියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමයි. එවන් ජාතියකට උරුමකම් කියන මහනුවරුන් යුධමය වශයෙන් නිලීන දියාරු ප්‍රතිපත්තියක් අනුගමනය කරන්ට ඇතැයි සිතීම උගටහය. ඒ අනුව මෙම පරීක්ෂණයේදී අප විසින් ගොඩ නැගූ උපන්‍යාසය වූයේ දේශගුණය හා භූ ගෝලීය සාධක මහනුවර රාජධානියේ ආරක්ෂාව උදෙසා බලපෑ එකම හේතු සාධකය විය නොහැකි බවයි. එය අර්ධ සත්‍යයක් ලෙස සැලකීමයි. එසේම රාජ්‍යයේ ස්වාධීනත්වය උදෙසා එහි වූ ආරක්ෂක සංවිධානයද ප්‍රධාන හේතු සාධකයක් විය හැකි බවයි. ඒ අනුව තත්කාලීන සමාජ පාලන යාන්ත්‍රණයේ වූ යුධ හේවායන් හා එහි සංවිධාන ව්‍යූහය පිළිබඳව ප්‍රමාණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙහි මුඛ්‍ය පරමාර්ථය ලෙසින් දැක්විය හැකිය. මෙහිදී ගුණාත්මක දත්ත රැස් කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කළ අතර, පර්යේෂණ ගැටලුව ලෙසින් මහනුවර රාජධානියේ යුධ හේවායින් හා එහි සංවිධාන ව්‍යූහය කෙබඳු ද? යන්නයි. මහනුවර රාජධානියේ පැවති සුවිශේෂ ආරක්ෂක සංවිධාන සැලැස්ම අනුරාධපුර හා පොළොන්නරුව වැනි පෙර පැවති රාජධානිවල පැවැති ආරක්ෂක සංවිධාන ක්‍රමවේද හා සංසන්දනාත්මක ලෙසින් විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ යුධ සේනා සංවිධානයේ කූට ප්‍රාප්තිය මහනුවර යුගයේදී සිදුව ඇති බවයි. ඒ අනුව පැරණි රාජධානී තුළ පැවැති පරිපාලන ක්‍රමවේදවල ආභාසය ලබමින් ඒවා ක්‍රමානුකූලව වඩා සංකීර්ණ මට්ටම දක්වා ගොඩ නගා ගැනීමක් මෙහිදී හඳුනාගත හැකිය. විශේෂයෙන් මධ්‍යගත පාලන යාන්ත්‍රණය හා ප්‍රාදේශීය පාලන යාන්ත්‍රණය යන ක්‍රමවේද දෙක ඉතා සාර්ථක ආකාරයෙන් මෙන්ම ශක්තිමත් ආකාරයෙන් මෙහි ක්‍රියාත්මකව ඇත. මධ්‍යගත පාලනය යටතේ ප්‍රධාන වශයෙන් දෙපාර්තමේන්තු තිස් තුනක් (33) ක්‍රියාත්මකව පැවතී ඇති අතර එම දෙපාර්තමේන්තුවල කාර්යභාරයන් පිළිබඳව සලකමින් ප්‍රධාන කාණ්ඩ කීපයක් යටතේ වර්ග කළ හැකිය. එනම් රාජ්‍යයේ පරිපාලන කටයුතු සඳහා දහයක් (10)ද ආදායම් හා භාණ්ඩාගාර සම්බන්ධව හතරක් (04)ද රජුගේ

| ප්‍රධාන නිලධාරියා | ඔහුට අයත් දෙපාර්තමේන්තුව/කාර්යංශය |
|---|---|
| 01- ගජනායක නිළමේ | ඇත් හමුදාව හා කුරුවේ කාර්යාංශය භාරව |
| 02- අතපත්තුවේ ලේකම් | අංග ආරක්ෂක හමුදාව භාරව |
| 03- වෙඩිකාර ලේකම් | කාලතුවක්කු සේනාංක භාර කටයුතු |
| 04- වඩනතුවක්කු ලේකම් | තුවක්තකු සේනාංක භාර |
| 05- කොඩිතුවක්කු ලේකම් | කොඩි තුවක්කු සේනාංක භාරව |
| 06- දුනුකාර ලේකම් | දුනුවායන් පිළිබඳව කටයුතු |
| 07- පඩිකාර ලේකම් | වැටුප් ගෙවන යුධ සේනාංක භාරව |
| 08- රන් ආයුධ මඩුවේ ලේකම් | වාසල ආයුධ ගබඩාව භාරව |
| 09- කුණම් මඩුවේ ලේනම් | දඩ බල්ලන් හා ආරක්ෂක හේවායින් භාරව |
| 10- මඩුවේ ලේකම් | මහනුවර නගරයේ ආරක්ෂක විධිවිධාන භාරව |
| 11- අස්පන්තියේ මුහන්දිරම් | අසරු හමුදා සේනාංක හා අස් පංතිය භාරව |
| 12- සුදලියේ මුහන්දිරම් | සුදලිය සටන් පුහුණු පාසල භාරව |
| 13- මරුවල්ලියේ මුහන්දිරම් | මරුවල්ලියේ සටන් පුහුණු පාසල භාරව |

පෞද්ගලික අවශ්‍යතා වෙනුවෙන් හයක් (6) වෙන්වී ඇති අතර ආරක්ෂක කටයුතු හා යුධ සේනා සංවිධානය වෙනුවෙන් වෙන්කළ දෙපාර්තමේන්තු දහතුනක් (13) මෙහිදි හඳුනාගත හැකි අතර ඒවා පහත පරිදි දැක්විය හැකිය.

මීට අමතරව ප්‍රාදේශීය පාලනය යටතේ, දිසාවන් ලෙස රාජ්‍ය කොටස්වලට බෙදා ප්‍රාදේශීය පාලකයන් යටතේ සිදු කෙරී ඇත. මෙහිදී හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණයක් නම් ඒ සෑම පරිපාලන ඒකකයක් තුළ ම සිවිල් පාලනය හා ආරක්ෂක කටයුතු කෙරෙහි වගකීම් පැවරුණු නිලධාරී ධූරාවලියක් මගින් සිදු කිරීමයි. එහිදී දිසාවේ යටතේ සිවිල් පාලනය හා ආරක්ෂක කටයුතු ඒ අනුව පත් කළ නිලධාරීන් දෙදෙනෙකු යටතේ සිදු කෙරී ඇත. **(සැලසුම් අංක 01)** මෙහි අතපත්තු මොහොට්ටාල යුධ සේනා සංවිධානයේදී ප්‍රමුඛත්වය ගෙන කටයුතු කර ඇති අතර දිසාවේ මුර මඬුව මුර කළ ආරක්‍ෂක භට පිරිස්ද මොහු යටතේ විය. එසේම මොහු යටතේ පාලනය වූ අතපත්තු මිනිසුන් යුද හේවාකම් සඳහා ඍජුවම දායක විය යුතු අතර ඔවුන් වෙනත් රාජකාරිවලින් මෙන්ම වෙනත් බදුවලින්ද නිදහස් කොට ඇත. සෑම කෝරළයක් තුළම අතපත්තු මොහොට්ටාල යටතේ පාලනය වූ ආරච්චිවරුන් එම හේවායන් රැස් කිරීම සඳහා සහයදී ඇත. දිසාවනිය තුළ තෙවන ප්‍රධාන නිලයවන කොඩිතුවක්කු මොහොට්ටාලද ඍජුවම දිසාවනිය තුළ ආරක්‍ෂක සංවිධානය වෙනුවෙන් පත් කළ නිලයක් වේ. මොහුගේ ප්‍රධාන රාජකාරිය වූයේ දිසාවනිය තුළ තිබූ කොඩිතුවක්කු ආරක්‍ෂා කිරීම හා ඒ සඳහා යෙදවූ හේවා වසම් පාලනය කිරීමයි.

ඔහුගේ සහය සඳහා සෑම පත්තුවක් සඳහාම මුහන්දිරම්වරයෙක්ද ඒ යටතේ වූ දුරයා නමින් හැඳින්වූ නිලධාරියෙක්ද විය. මෙම නිලධාරීන් දිසාවනිය තුළ හමුදාවන් එකතු කිරීම අවි ආයුධ නිෂ්පාදය කිරීම වැනි කටයුතු සිදු කර ඇත. මෙම විශ්ලේෂණය අනුවද තහවුරු වන්නේ මහනුවර රාජ්‍ය පාලකයින් සියලුම කාර්යයන්ට වඩා රාජ්‍ය පරිපාලනයේදී ආරක්ෂක සංවිධානය කෙරෙහි වඩා වැඩි බරක් නිතැතින්ම යොදා ඇති බවයි. මෙහි ආරක්ෂක කටයුතු සඳහා ඇති කළ දෙපාර්තමේන්තු අතර ඇතැම් දෙපාර්තමේන්තු කෝට්ටේ හා සීතාවක වැනි රාජධානිවලද ක්‍රියාත්මක වී ඇති අතර ඇතැම් දෙපාර්තමේන්තු පූර්ණ ලෙසින් ම මහනුවර රාජධානියේ අවශ්‍යතාව මත පිහිටුවා ගත් නව දෙපාර්තමේන්තු ලෙසින් හඳුනාගත හැකිය. මෙම දෙපාර්තමේන්තු තුළ විවිධ අන්දමේ යුද හේවායින් සංවිධානගත කර පැවති බව හඳුනාගත හැකිය. එසේම මහනුවර යුගයේ යුද හේවායින් හා එහි සංවිධාන ව්‍යුහය පිළිබඳව සැලකිය යුතු තොරතුරු ප්‍රමාණයක් ලේකම් මිටි ආශ්‍රයෙන් අනාවරණය කරගත හැකිය. ඒ අනුව පැහැදිලි වන ප්‍රධන කරුණ නම් මහනුවර යුගයේ පාලකයින් සිය සේනාවන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර ඇති බව පෙනී යාමයි. ඒ සඳහා නිදසුනක් ලෙස දුම්බර දුනුකාර ලේකම් මිටියේ සඳහන් වන රාජ්‍ය සේවයට සම්බන්ධ වුණු නිත්‍ය දුනුකාර හේවායින් පිළිබඳ තොරතුරු පෙන්වාදිය හැකිය. ඔවුන් සිදු කළ සේවය පිණිස රජු ඉඩම් ප්‍රදානය කර ඇති බව එයින් ගම්‍ය වන අතර, දුම්බර පන්සිය පත්තුවෙන් මෙම හමුදා ඒකකයට එක් වුණ හේවායින් සඳහා වෙන් කළ ගමබඩ වැවිලි මෙපමණ යැයි ගණන් බලා සටහන් කර ඇත. එහි සඳහන් හේවායින් ලෙස දුනුකාර හේවායින් එකසිය දෙන්නෙකුද ලංසකාරයින් දාහත් දෙනෙකු ද පටිසාන නම් අවි දරන්නන් දහනම දෙනෙකු සිටි බව දක්වා ඇත. එසේම රාජකීය හේවා අංශයට සතර

කෝරළයට අයත් පත්තුවලින් එකතුකර ගන්නා ලද හේවායින් පිළිබඳව හතර කෝරළේ මහ ලේකම් මිටියේ සඳහන්ව ඇත (අභයවර්ධන 2009: 200). මීට අමතරව යුධ හේවායින් පිළිබඳව ලියවුණු ලේකම් මිටි ලෙස දේවමැදි හත්පත්තුවේ දුනුමාලේ මල්හාමි විදානගේ ලේකම් මිටිය, මාතලේ හමුදාවේ ලේකම් මිටිය හා මහ අතපත්තුවේ ලේකම් මිටිය වැනි ලේඛන පෙන්වා දිය හැකි අතර මෙමගින් අවශ්‍ය සේනා සංවිධානාත්මක අයුරින් රැස්කොට ඇති බව තහවුරු කරගත හැකිය. එසේම බෝවලවත්ත පොත් ගුල් විහාරයේ තිබී පසුව තලවතුරේ සියඹලාවත්තේ ආරච්චිලෑ ගෙදර පුංචිරාළ නමැත්තා පිටපත් කර ඇති පුස්කොළ පොතක අතීත දළදා පෙරහැර පෙළ ගැසුණු ආකාරය පෙන්වාදී ඇත (සෝමදාස 1958:57). එහිදීද දිසාවේ යටතේ සංවිධානය වූ යුධ හේවායින් පිළිබඳව තොරතුරු අනාවරණය කරගත හැකි අතර පෙරහැරේ ගමන්ගත් එම යුධ හේවායින් අනුපිළිවෙළ අනුව පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

| **පෙරහැරේ ගමන් කළ අනුපිළිවෙළ** | **පෙරහැරේ ගමන් කළ ප්‍රධාන නිලධාරියා හා කාර්යංශය** |
|---|---|
| 01 | ගජනායක නිලමේ ප්‍රමුඛ ඇත් පංතිය |
| 02 | කොඩිතුවක්කු ලේකම් හා හමුදාව |
| 03 | සතරකෝරලේ දිසාව හා හමුදාව |
| 04 | සත්කෝරලේ දිසාව හා හමුදාව |
| 05 | මාතලේ දිසාව හා හමුදාව |
| 06 | සබරගමු දිසාව හා එහි හමුදාව |
| 07 | තුන් කොරලේ දිසාව හා හමුදාව |
| 08 | ඌව හා වලපනේ දිසාව හා හමුදාව |
| 09 | උඩපලාත නිලධාරීන් හා හමුදාව |
| ...22 | අතපත්තු ලේකම් හා හේවායින් |
| ...31 | නුවරකලාවිය දිසාවේ හා හමුදාව |
| ...35 | වෙඩිකාර ලේකම් හා හමුදාව |
| ...37 | වඩනතුවක්කු ලේකම් හා හමුදාව |

මහනුවර රාජධානියේ සමස්ත දේශපාලනික අර්ථශාස්ත්‍රයම කේන්ද්‍රවී තිබුණේ ගොවිතැන මතය. එනිසා ඉඩම් බුක්තිය මත පදනම් වූ රාජකාරී ක්‍රමය තුළ ඔවුන් අවශ්‍යතාව අනුව යුධ සේවය වෙත අනුයුක්ත කොටගෙන ඇත. එනිසාම යුධමය වාතාවරණයක් මතද ආහාර හිගයක් ඇතිවීම වළක්වා ගැනීමට මහනුවර පාලකයන් හට හැකිවී තිබේ. මේ අනුව මහනුවර රාජධානියේ යුධ හේවායින් හා එහි සංවිධාන ව්‍යූහය පිළිබඳව සැලකීමේදී පඩිකාර පේරුව හා ගන්කාර පේරුව ලෙසින් ප්‍රධාන හමුදාමය ඒකක දෙකක් මහනුවර රාජධානියේ අවසන් කාල සීමාව වන විට සක්‍රීයව පැවති බව හඳුනාගත හැකිය.

**පඩිකාර පේරුව -**

මෙය මධ්‍ය පාලනය යටතේ පවත්වාගෙන යනු ලැබූ පඩිකාර හේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය විය. එහි ප්‍රධාන නිලධාරියා පඩිකාර ලේකම් විය. ඔහු යටතේ මෙම හේවා කණ්ඩය පාලනය සඳහා පඩිකාර මුදියන්සේ රාළ, පඩිකාර ආරච්චිල, පඩිකාර ගමරාළ, පඩිකාර කන්කානම, පඩිකාර දුරයා වැනි සුළු නිලධාරීන් රැසකගේ දායකත්වය ලැබී ඇත (අභයසිංහ 1969:217). මොවුන්ගේ රාජකාරී සඳහා වැටුප් ගෙවීමක් සිදුවිය. පෘතුගීසී ආක්‍රමණිකයෙකු වූ අසවේදු ගේ තර්ජන හමුවේ එයට මුහුණ දීම සඳහා රජු කුලී ගෙවනු ලබමින් දකුණු ඉන්දීය වඩුග සටන්කරුවන් යොදා ගැනීමේ ආරම්භය විමලධර්මසූරිය රජු සමයේ සිදුව ඇති බැවින්, පඩිකාර පේරුවේ ආරම්භය මෙම රජ දවස සිදුව ඇතැයි සැලකිය හැකිය (පෙරේරා 2015:26). නමුත් එය ස්ථිර හමුදා ඒකකයක් බවට පත්කිරීම කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස සිදුවී ඇති අතර මුල් අවස්ථාවේ එහි විසිඑක් දෙනා බැගින් වූ කණ්ඩායම් හතරකින් යුත් අසූ හතර දෙනෙකුට සීමා වී ඇත. පසුව රාජාධිරාජසිංහ රජ දවස තිස් දෙදෙනෙකුගෙන් යුත් කණ්ඩායම් හතකින් යුක්ත වූ අතර පසු කාලීනව එක් කණ්ඩායමක හේවායින් පනහ දක්වා වැඩි කර ඇත. නමුත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජ දවස එක් කණ්ඩායමකට තිස්දෙනා බැගින් වූ කණ්ඩායම් විසිතුනක් පවත්වා ගනිමින් හේවායින් හයසිය අනූව දක්වා වර්ධනය කර තිබුණි (පීරිස් 1964:98). ඉංග්‍රීසි ජාතික ඩොයිලි 1810 දෙසැම්බර් 1-9 දින සටහන්වල දක්වා ඇත්තේ රජු සතු පඩිකාර හේවා බල ඇණිය මලයානු ජාතිකයන් 250-300ක් අතර ප්‍රමාණයකින්ද කාපිරි ජනයා 200 පමණද ඉන්දීය ජාතිකයන් 20 දෙනෙකුගෙන්ද පමණ යුක්ත වූ බවයි.

**ගන්කාර පේරුව -**

මෙයට මධ්‍ය පාලනය යටතේ පැවති හමුදාමය කාර්යාංශ කීපයක්ද හේවාවසම් මගින් සංවිධානය වුණ ඒකකයන්ගෙන්ද සැදුම් ගෙන තිබුණි. මෙම සේවා කටයුතු සඳහා නියම සුදුසුකම් ලද ඇත්තන් ලෙසින් සැලකුවේ උඩ රට කුල ධූරාවලියේ ගොවිගම නම් කුලයට අයත් පුද්ගලයන්ය. මෙම හේවා කටයුතු වෙනුවෙන් මොවුන් වෙත කුලී ගෙවීමක් සිදු නොකෙරුණු අතර ඒ වෙනුවට ඉඩම් භුක්තිය මත සිදුකළ රාජකාරී ක්‍රමය ක්‍රියාත්මක විය. ඒ අනුව රටේ අත්‍ය අවශ්‍ය යුදමය තත්ත්වයන් හමුවේ එම පිරිස් යුදමය කටයුතු සඳහා රැස්කර ගැනීමේ හැකියාව පැවතුණි. ප්‍රධාන වශයෙන් මොවුන්ගේ සාමාන්‍ය රැකියාව ගොවිතැන වුවද බද්ධ කාර්යාංශ යටතේ සංවිධානය වුණ වෙනත් ශිල්පීන්ද මේ අතර විය. යුධ සේවා හෝ මුර කිරීම් වැනි ආරක්ෂක කටයුතුවලින් නිදහස් සෑම විටෙක ම ඔවුන්ගේ කුලයන්ගෙන් බලාපොරොත්තු වුණ රාජකාරීවල ඔවුන් නිරත විය යුතු විය. දිසාවනි සතු හේවා වසම් තුළින් අවශ්‍ය බළ සෙන් රැස් කිරීමේ පූර්ණ වගකීම එම දිසාවනිය භාර දිසාවේ වෙත පැවරී තිබුණි. ඒ අනුව දිසාවගේ බලය මනින ලද්දේ ද බළ සෙන් රැස් කිරීමේ හැකියාව මත විය (අභයවර්ධන 2009:148). දිසාවේ ප්‍රමුඛ නිලධාරියා වුවද දිසාවේ යටතේ සිටි අතපත්තු මොහොට්ටාල අතපත්තු ජනයා රැස් කළ අතර කොඩිතුවක්කු මොහොට්ටාල විසින් සිය හේවා වසම් තුළින් හේවායන් රැස් කරන ලදී.

ඒ අනුව මෙම ගන්කාර පේරුව හා පඬිකාර පේරුව මගින් සංවිධානය වූ මහනුවර රාජ්‍යයේ සමස්ත යුද සංවිධානය හේවා බළ ඇණි, පොදු සේවා කණ්ඩායම්, යුද අභ්‍යාස හා පුහුණු ආයතන ලෙස ප්‍රධාන කොටස් තුනක් යටතේ වර්ග කර හඳුනාගත හැකිය. **(සැලසුම් අංක 02)**

01. **<u>අස් පන්තිය -</u>** අතීතයේ පටන් ම අශ්වයින් යුධ කටයුතු සඳහා යොදවාගෙන ඇති අතර එහිදී ක්ෂණිකව සතුරා වෙත පහරදීම සඳහා මෙන්ම පලා යාමටද ක්ෂණික පණිවිඩ යැවීම් වැනි කටයුතු ද සිදුවිය. එසේම රජුගේ විවිධ උස්සව අවස්ථාවලදී රාජ්‍ය බලය විදහා පෑම සඳහාද අසුන් භාවිතකර ඇත. මහනුවර යුගයේදී රජුගේ රාජකීය අශ්වයන් මෙන්ම යුද අශ්වයන් භාර සියලු කටයුතු හා අසරුවන් මෙම කාර්යාංශය යටතේ සංවිධානය කොට තිබුණි. මෙම කාර්යාංශය ඍජුවම මධ්‍යම පාලනයට නතු වූ අතර මෙහි ප්‍රධාන නිලධාරීයා ලෙස අස් පන්තියේ ලේකම් මහත්තයා නොහොත් අස් පන්තියේ මුහන්දිරම් විය (අභයවර්ධනඃ2009.193). ඔහු යටතේ මුදියන්සේ රාළ, ආරච්චිල, ගමරාළ, කංකානම හා දූරයා වැනි නිලධාරී පිරිසක්ද වූහ.

02. **<u>ඇත් පන්තිය -</u>** රජුගේ රාජකීය ඇත් පන්තිය හා ඇත් සේනාව මෙම කාර්යාංශය යටතේ සංවිධානය කර තිබුණි. ඇතුන්ද අසුන් මෙන් විවිධ උත්සව ආදියේදී රාජ්‍ය බලය විදහා පෑම වැනි කටයුතුවල යොදවා ගත්තද ඇත් සේනාව යුද අවස්ථාවන්හිදී ප්‍රධාන ප්‍රහාරක සේනාංකයක් ලෙස උපයෝගී කොටගෙන ඇත. විශේෂයෙන් කඳු ආශ්‍රිත සටන්වලට වඩා පහත් තැනි බිම්වල සිදුකළ සටන්වලදී සුවිශේෂ කාර්යභාරයක් මෙම සේනාංකය මගින් සිදුකර ඇත. සතුරන්ගේ බලකොටු ආදි බාධක ඉවත්කර ගැනීමටද අවි ආයුධ හා භාණ්ඩ ප්‍රවාහනය කර ගැනීමටද මෙමගින් විශාල පිටුවහලක් ලැබුණි. මෙම කාර්යාංශයද මධ්‍යම පාලනය යටතේ පැවති අතර එහි ප්‍රධාන නිලධාරියා ගජනායක නිලමේ වූ අතර මොහු යටතේද මුදියන්සේ, මුහන්දිරම්, ආරච්චිල, ගමරාළ, කංකාණම, විදානේ හා දූරයා වැනි නිලධාරී මණ්ඩලයක් විය.

03. **<u>දුනුකාර හේවායින් -</u>** මෙම කාර්යාංශයද මධ්‍ය පාලනය යටතේ පැවති අතර දුනුකාර ලේකම් මෙහි ප්‍රධාන නිලධාරියා ලෙසින් කටයුතු සංවිධානය කළ අතර ඔහුගේ කටයුතු විධිමත් කර ගැනීම සඳහා සුළු නිලධාරීහු රැසක් ද වූහ. මොවුන් ප්‍රධාන යුධ අවිය ලෙසින් දුන්න හා ඊතල භාවිතකර අත. මෙම දුනුකාර හේවායින් නිත්‍ය හමුදා අනුබණ්ඩයක් වුවද එම හේවායින් සඳහා වැටුප් ගෙවීමක් සිදු නොකෙරුණි. ඒ වෙනුවට රාජකාරි ක්‍රමය යටතේ පැවති ඉඩම් භුක්තිය දුනුකාර හමුදාව වෙත හිමිව තිබූ බව මෙම දුනුකාර ලේකම් මිට්ය අනුව පැහැදිලි වේ. පෘතුග්‍රීසී ජාතික ක්වේරෝස් සඳහන් කර ඇත්තේ ද දාසයවැනි සියවසේ අග භාගය වන විට මහනුවර රජු සතුව දුනු හී රැගත් 50,200 ක පමණ පාබළ බළ සේනාවක් සිටි බවයි (අභයවර්ධන 2009ඃ194).

04. **<u>කොඩිතුවක්කු හෙවත් ගින්ජල් හේවායින් -</u>** මොවුන්ද අතපත්තු හේවායින් මෙන් මධ්‍ය පාලන යටතේද දිසාවනි තුළද වෙනම සංවිධානය කර තිබූ ආකාරය දැකිය හැකිය. මධ්‍ය පාලනය යටතේ ප්‍රධාන නිලධාරියා ලෙසින් කොඩිතුවක්කු ලේකම් කටයුතු කළ අතර ඔහු යටතේ කොඩිතුවක්කු මුදියන්සේ රාළ, මුහන්දිරම්

රාළ, ආරච්චිල, ගමරාළ, කංකාණම, විදානේ හා දුරයා යන සෙසු නිලධාරී පන්තියක් යටතේ පාලනය විය. දිසාවනි තුළදී දිසාවගේ යටතේ වූ කොඩිතුවක්කු මොහොට්ටාල මෙම හේවායින් භාරව කටයුතු මෙහෙයවා ඇති අතර ඔහු යටතේ මුහන්දිරම්වරුන් හා මහදුරයා, හේවා දුරයා හා දුරයා වැනි නිල දරූ සුළු නිලධාරී මඬුල්ලක්ද දැකිය හැකිය. මෙම හේවා බණ්ඩයන් බොහෝ විට පදු නම් කුලයට අයත් ජනයාගෙන් සැදුම්ගෙන තිබුණි (විමලානන්ද 1962:297). මෙම හේවායින් කොඩිතුවක්කු අතැතිව යුද කටයුතු සඳහා දායක වූ අතර දිසාවනි තුළ එම අවි රැස්කොට තිබූ කොඩිතුවක්කු මඬුව රැකවල් කිරීමද මුර සේවාවල යෙදීමද මොවුන්ගේ ප්‍රධාන රාජකාරිය විය.

05. <u>**වඩනතුවක්කු හේවායින් -**</u> තුවක්කු අතැතිව සටන් සඳහා යොමු වුණ හේවායින් මෙම කාර්යාංශයට අයත් විය. මෙම හමුදා ඒකකය සෘජුවම මධ්‍ය පාලනයට අයත්විය. මෙහි ප්‍රධාන නිලධාරියා ලෙසින් වඩනතුවක්කු ලේකම් වුණු අතර රජුගේ තුවක්කු මොහු භාරයේ තිබුණි.

07. <u>**බොංඩිකුල (කාලතුවක්කු) සේනාංකය -**</u> තරමක් විශාල වූ ලෝහමය කාලතුවක්කු භාවිතයට ගත් හේවායෝ මෙයට ඇතුළත් වූහ. මෙහි ප්‍රධාන නිලධාරියා ලෙස වෙඩිකාර ලේකම් වූ අතර මෙම කාර්යංශය ද සෘජුව ම මධ්‍යම පාලනයට නතුවිය. එසේම මෙම සේනාංකය ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් ආරම්භ කරන ලද්දකි (Silva 1972: 82). මොවුන්ද ඉඩම් බුක්තිය මත රාජකාරී කළ අතර අන් සේනාංක තුළ මෙන්ම මෙහිද වෙඩිකාර ලේකම් මහත්තයා යටතේද අන් කාර්යාංශ යටතේ මෙන් මෙහිද සෙසු නිලධාරී ධුරාවලියක් දැකිය හැකිය.

08. <u>**අතපත්තු හේවායින් -**</u> මොවුන් අතපත්තු කාර්යාංශය යටතේ මධ්‍ය පාලනයට නතුව පැවති ප්‍රධාන හේවා බණ්ඩයක් ලෙසින් ක්‍රියාත්මක වූවකි. මෙම අතපත්තු කාර්යාංශයේ ප්‍රධානියා ලෙසින් අතපත්තුවේ ලේකම් කටයුතු කළ අතර ඔහුගේ සෙසු නිලධාරීන් ලෙසින් අතපත්තු මුදියන්සේ රාළ, අතපත්තු මුහන්දිරම්, අතපත්තු ආරච්චි හා අතපත්තු විදානේවරුන් කටයුතුකර ඇත. මොවුන්ගේ ප්‍රධාන රාජකාරිය වී ඇත්තේ රජුගේ අංග ආරක්ෂකයින් ලෙස කටයුතු කිරීම, රජ වාසල ආරක්ෂක කටයුතු හා නගරයේ ආරක්ෂක කටයුතු සිදු කිරීමයි. මහ අතපත්තු ලේකම් මිටිය අනුව රාජාධිරාජසිංහ රජ දවස (ක්‍රි.ව.1781-1798) ආරච්චිවරුන් සහ හේවායින් ගණන් බලා ඇත්තේ අතපත්තු පදනම් කොට ගෙනය. ඒ අනුව යටිනුවර මහ අතපත්තුව, යටිනුවර අතපත්තුව, උඩුනුවර අතපත්තුව, සාරසිය පත්තුව, තුම්පනේ අතපත්තුව, තුම්පනේ නාරංවිල අතපත්තුව, දුම්බර අතපත්තුව, උඩසිය පත්තුවේ අතපත්තුව, හේවා හැට අතපත්තුව, හේවාහැට වෙළුගොඩ අතපත්තුව, ගලගෙදර අතපත්තුව හා මැදසිය පත්තුවට අයත් අතපත්තු හේවායින් පිළිබඳව තොරතුරු සඳහන් වේ. එසේ ම සුවිශේෂී අවශ්‍යතා මත මෙම හේවායින්ද යුද කටයුතු සඳහා යොදා ගෙන ඇති බව ක්‍රිස්තු වර්ෂ 1628දී සෙනරත් රජු යාපනය පෙදෙස් නිදහස්කර ගැනීම සඳහා අතපත්තුව භාර නිලධාරීන් යටතේ පන්දහසක පමණ සේනාවක් යෙදවීමෙන් තහවුරු කරගත හැකිය (පෙරේරා 2015:25). එසේම සෑම දිසාවනියක් තුළම අතපත්තු මොහොට්ටාල යටතේද අවශ්‍යතා මත අතපත්තු ජනයා හේවායින් ලෙස රැස් කරගැනීමේ ක්‍රමවේදයක් විය. එම සේනා මෙහෙයවීම හා අණ දීමේ වගකීම දිසාව සතුවිය. මොවුන්ගේ

රාජකාරී ක්‍රමයට දිසාවගේ මැදුර මුර කිරීමද දිසාවේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීමද ඇතුළත් වූ අතර අවශ්‍යතා මත රජ වාසල හා නගරයේ ආරක්ෂාව සඳහාද කැඳවා ඇත. එවන් අවස්ථාවකට නිදසුනක් ලෙස සතර කෝරළයෙන් හේවායින් නමසිය හතළිස් දෙදෙනෙකුගෙන් (942) යුත් පිරිසක් රජ වාසල ආරක්ෂාවට යොදා ගත් බව දේවමැදි හත්පත්තුවේ දුනුමාලේ මල්හාමි විදානේගේ ලේකම් මිටියේ සඳහන් වන පුවතින් පෙනීයයි. එය ක්‍රි.ව.1762දී මහනුවරට දූතයෙකු ලෙස පැමිණි මදුරාසි බ්‍රිතාන්‍ය පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වූ ජෝන් පයිබස්ද රජ වාසල ආරක්ෂක කටයුතු පිණිස යොදවා සිටි හත් අටසීයක හේවායින් දුටු බවට සිදු කරණු ලබන වාර්තාවෙන් තහවුරු වේ (අභයසිංහ 1998:193).

**09. <u>මඩුවේ හේවායින් -</u>** මෙම මඩුවේ කාර්යාංශය ගොවිගම මිනිසුන්ගෙන් සැදුම්ලත් ශක්තිමත් බළ ඇණියක් වූ අතර මොවුන් වෙත නිල ඇඳුමක්ද සපයා තිබූ බවක් සඳහන් වේ. ඒ අනුව සුදු පැහැති හැට්ටයක්ද රතු පැහැති හිස් වැසුමක්ද විය. මේ යටතේ වෙනම ඒකක හතක් ක්‍රියාත්මක වී ඇති අතර කීර්ති ශ්‍රී රාජසිංහ රජ (ක්‍රි.ව.1747-1781) දවස ලන්දේසීන්ගෙන් එල්ලවූ පීඩනය නිසා කුක්කම් මඩුව ලෙසින් පවත්වාගෙන ආ කාර්යාංශයද මෙහි අටවන ඒකකය ලෙසින් අනුයුක්ත කොට වඩාත් ශක්තිමත් කිරීමට ක්‍රියාකර ඇත (පීරිස් 1964:97). මුල් කාලීනව මොවුන් වෙත වැටුප් ගෙවීමක් සිදුකෙරුණද පසුව මෙම මඩුවේ රාජකාරීද ඉඩම් භුක්තිය මත පදනම් විය. පරවේණි හා පැවරු ක්‍රමයන් මගින් එම ඉඩම් ප්‍රදානය කළ අතර ඒ ඒ පළාත් තුළ පිහිටි ඉඩම් ප්‍රමාණයන් මත මෙහි හේවා පිරිස් අඩු වැඩි විය. මොවුන්ගේ ප්‍රධාන රාජකාරි ලෙස නගරයේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීම හා මුර සේවාවල යෙදීම, දිසාවේ ආරක්ෂාව හා අවශ්‍යතාව මත යුද කටයුතු සඳහා පැමිණීම සිදුවිය.

**10. <u>අලුත්පන්නේ හේවායින් -</u>** ක්‍රිස්තු වර්ෂ 1810දී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (ක්‍රි.ව.1798-1815) පිහිටවූ ස්ථිර හමුදා බණ්ඩය අලුත්පන්නේ හේවායින් ලෙස සලකා ඇත. මොවුන් දස දෙනාගේ සිට විස්ස දක්වා වූ කණ්ඩායම් හතක් මෙයට ඇතුළත් වූ අතර උඩ රටවල් හතෙන් මේ සඳහා හේවායින් තෝරාගන්නා ලදී (පීරිස් 1964: 100). මෙම අලුත් පේරුවද මඩුවේ කාර්යාංශය යටතේ පාලනය වූ අතර මොවුන් ස්ථිර හේවා බණ්ඩයක් වූ බැවින් ඉඩම් බුක්තිය මත රාජකාරීයට ඇතුල් කර ගන්නා ලදි.

**11. <u>අප්පුහාමිලා -</u>** මොවුහු රජුගේ සැතපෙන ගේ, පැතැටි වාහල්කඩ, හා රජුගේ රං ආයුධ මණ්ඩපයේ ආරක්ෂාව භාරව ක්‍රියාකළ සුවිශේෂ හේවායින් පිරිසක් වූහ. මෙම විශ්වාසනීය රාජ පුරුෂයන් අප්පුහාමී ලෙස හැඳින්වීම ඔවුන් වෙත පටබැඳී ගෞරව නාමයක්ද විය (විමලානන්ද 1962:227). සැතපෙනගේ අප්පුහාමිලා මහ සැතපෙනගේ මුහන්දිරම් යටතේ ද රං ආයුධ මණ්ඩපයේ රැකවල් කළ අප්පුහාමිලා රං ආයුධ මණ්ඩපයේ ලේකම් යටතේද සංවිධානය කර තිබුණි.

**<u>ඉලංගම් මඩු -</u>** සාමාන්‍යයෙන් ඉලංගම් ලෙසින් හැඳින්වූයේ අවි ආයුධ ඇසුරෙන් සිදු කරන පාරම්පරික සටන් කලාවකි. එය අංගං සටන් සම්ප්‍රදායේ එක් අංශයක් වූ අතර එම සටන් පුරුදු පුහුණු කරන ලද ස්ථාන ඉලංගම් මඩු ලෙසින් හැඳින්විය. ඒ අතරින් මරුවලිය හා සුදලිය යන සටන් පුහුණු පාසල් දෙක

ප්‍රමුඛව පැවති බව සිතිය හැක්කේ මධ්‍ය පාලනයට නතු කළ කාර්යාංශ දෙකක් ලෙස මෙම ගුරු කුල දෙක පවත්වා ගෙන යාම නිසාවෙනි. සුදලිය සටන් පාඨශාලාව භාරව සුදලියේ මුහන්දිරම්ද මරුවල්ලිය පාඨශාලාව භාරව මරුවල්ලියේ මුහන්දිරම් වරයෙකුද පත්කර සිටි අතර මොවුන් යටතේ එම කටයුතු පාලනය කෙරිණි.

මෙම සෘජු හමුදාමය කාර්යාංශයන්ට අමතරව තවත් කාර්යාංශ කීපයක් පොදු සේවාවන් ලෙසින් හඳුනාගත හැකි අතර එයට හොරණෑ ආදි සංගීත භාණ්ඩ වැයූ ශිල්පීන් ඇතුළත් කාර්යාංශය තම්පොරු මුහන්දිරම් යටතේද බෙර වාදකයෝ සිංහක්කාර මුහන්දිරම් යටතේද වූහ. මොවුන්ගේ මෙම තූර්ය වාදනයන් වෙනත් කටයුතු සඳහා මෙන්ම යුදමය අවස්ථාවන්හිදී රණබෙර වාදකයන් ලෙසින්ද ක්‍රියාත්මක වී ඇත. එසේම පණිවිඩ කරන නිලමේ යටතේ පැවති කාර්යාංශය මගින් මහනුවර රාජධානිය තුළ විවිධ ආකාරයේ සන්නිවේදන කටයුතු සිදු කෙරුණු අතර ඒ තුළින්ම රාජ්‍යයේ ආරක්‍ෂාවට අවශ්‍ය කරන ඔත්තු සේවා/චරපුරුෂ සේවාද ක්‍රියාත්මක විය. එසේ ම රාජධානියේ වෙද මැදුරු හා වෙදුන් භාර කටයුතු බෙත්ගේ මුහන්දිරම් යටතේ ඇති කාර්යාංශය මගින් ක්‍රියාත්මක වූ අතර යුදමය අවස්ථාවන්හිදී තුවාලකරුවන් සම්බන්ධව කටයුතු කිරීම එයට පැවරුණු තවත් රාජකාරියක් විය. මීට අමතරව මහනුවර රාජධානියේ රජවරුන් යුද කටයුතු සඳහා වැද්දන්ගේ සහයද ලබාගෙන තිබුණි (පීරිස් 1964: 192). එහිදී ඔවුන්ගේ දුනු හී මගින් අන් අයට නොදෙවැනිව එම වැදි සේනා ක්‍රියාකර ඇති අතර එම වැදි ජනයාද මහනුවර හේවාපන්නයට උරුමකම් කියූ ගොවිගම කුලයෙහි ලා සලකා ඇත. මේ අනුව හඳුනාගත හැකි සුවිශේෂ ලක්‍ෂණයක් වන්නේ විවිධ යුද කාර්යාංශයන් සෘජුවම යුද කටයුතු සඳහා දායක වූ ප්‍රහාරක සේනාංක ලෙසද ඇතැම් දෙපාර්තමේන්තු ආරක්‍ෂක බළ මුළු ලෙසද තවත් කාර්යාංශ කීපයක් යුදමය කටයුතු සඳහා වක්‍රාකාරයෙන් අවශ්‍ය සේවා සැපයීමේ අංශ ලෙසින් ක්‍රියාත්මක වී ඇති ආකාරයයි. එසේම ඉහත දක්වා ඇති යුදමය කාර්යාංශයන්ට අමතරව ජාතික හදිසි අවස්ථාවන්හිදී මිනිසුන් යුද කටයුතු සඳහා අනිවාර්යෙන්ම බඳවාගන්නා ක්‍රමවේදයක්ද විය. ඒ අනුව රජුගේ ගබඩාගම් තුළින් යුද කටයුතු පිණිස හැඩි දැඩි පිරිමින් රැස් කරගන්නා ලදී. රොබට් නොක්ස්ද සඳහන්කර ඇත්තේ අග නුවරින් උපදෙස් ලැබුණු විගස දිසාවේ යටතේ සිටි මොහොට්ටාලවරුගේ සහයෙන් දිසාවනි තුළින් හේවායින් රැස්කොට අගනුවරට යැවූ බවයි. මොවුහු බහුතරය ගොවීහු වූහ. මෙම ක්‍රියාදාමයම 1810 නොවැම්බර් 24 වනදා ජොන් ඩොයිලිද සිය දින පොතේ සඳහන් කර ඇත්තේ ගබඩා ගම්වල සිටි ශක්තිමත් පිරිමින් දහස් ගණනක් දුනුම්දීම් මත මහනුවරට රැස්කර ගැනීමට හැකිවූ බවයි. එසේම එම පිරිස් සෑම විටෙකම සිය දිසාවනියට අයත් කොඩිය යටතේ එක් රැස් වූ බවයි (පෙරේරා 2015:28). මෙම හේවායින් යුදමය අවස්ථාවන්හිදී බටහිර රටවල සෙබළුන් මෙන් සුවිශේෂී යුද ඇඳුමක් භාවිත කළ බවට හෝ ආචාර පෙළපාළි පැවැත්වූ බවට සාධක දැකිය නොහැකිය. නමුත් ශ්‍රී ලංකාවේ බල පැවැත්වූ සියලුම රාජධානීන් හා සංසන්දනය කිරීමේදී මහනුවර රාජධානියේ ආරක්ෂක සංවිධාන වැඩපිළිවෙළ තුළ යුද හේවායින් ඉතා දියුණු මට්ටමකින් සංවිධාන ගතකර තිබූ බව පෙනීයයි. එය ආරක්ෂක සංවිධානයේ සුවිශේෂ ලක්ෂණයක් ලෙසින් මෙහිදී හඳුනාගත හැකි අතර සියවස් ගණනාවක් පුරාවට මෙම රාජ්‍ය යුදමය වශයෙන් කිසිවෙකුටත් යටත් කළ නොහැකි වීමට එය ප්‍රමුඛ සාධකයක් වී ඇති බවටද මෙහිදී නිගමනය කළ හැකිය.

## මූලාශ්‍රය


අභයවර්ධන, එච්.ඒ.පී. (2009). **ලේකම් මිටි විමර්ශනය.** කොළඹ : ජාතික ලේඛන ආරක්ෂක දෙපාර්තමේන්තුව.

අභයසිංහ, ටිකිරි. (1969). **පෘතුගීසීන් හා ලංකාව.** පන්නිපිටිය :ස්ටැම්ෆර්ඩ් ලේක් (පුද්) සමාගම.

අභයසිංහ, පී.ඇම්.පී. (1998). **උඩරට විත්ති.** කතෘ ප්‍රකාශන

කරුණාරත්න, ඩේවිඩ්. (2012). **එදා හෙළ දිව.** කොළඹ : ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

ගෝවින්නගේ,මාලනී. (2015). **සත්-ට්සුගේ යුද කලාව.** බත්තරමුල්ල : දර්ශන ප්‍රකාශන.

දේවරාජ ශ්‍රීමතී හා වෙනත්. (1977). **උඩරට රජධානිය.** කොළඹ: සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම.

පීරිස්, රැල්ෆ්. (1964). **සිංහල සමාජ සංවිධානය.** කොළඹ : සීමාසහිත සමන් ප්‍රකාශකයෝ.


පෙරේරා, ගැස්ටන්. (2015). **කන්ද උඩරටින් නැගුණු පෘතුගීසි විරෝධය (පෘතුගීසීන්ට එරෙහි උඩරට සංග්‍රාම ඉතිහාසය).** කොළඹ : විජිතයාපා ප්‍රකාශන.

විමානනන්ද, තෙන්නකෝන්. (1962). **උඩරට මහ කැරැල්ල (2කොටස).** කොළඹ : ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.


සෝමදාස, කේ.ඩී. (1958). **මහනුවර ශ්‍රී පුෂ්පදාන ස්වර්ණ ජයන්ති සංග්‍රහය.** (දළදා පෙරහැර පේළි ගස්වන අන්දම). මහනුවර : පුෂ්පදාන සමිතිය.

Silva.C.R. (1972). The Portuguese in Ceylon 1617-1638. Kave & Company.


**සැලසුම් අංක 01 - දිසාවනියක පරිපාලන ව්‍යුහය**



**<u>සැලසුම් අංක 02 - මහනුවර රාජධානියේ යුද සංවිධාන සැලැස්ම.</u>**



# පස්යොදුන් රට ස්තූප පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් (ඓතිහාසික යුගයේ සිට විසිවන සියවසේ මුල් භාගය දක්වා)

**ටී.කේ.ඒ. සෙනෙවිරත්න**

ස්තූප යනු වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්වල අගනා නිර්මාණයකි. දාගැබ, තූඹ, ථූප යන නම්වලින් හැඳින්වෙන්නා වූ මෙකී ස්තූප ගොඩනැගීම ආරම්භ වූයේ බුද්ධකාලයේ සිටය (වික්‍රමගමගේ 2009: 11). මහින්දාගමනයත් සමග ලංකාවේ ස්ථාපිත වූ මෙකී බෞද්ධාගමික සංස්කෘතිය විවිධ යුගවලදී රාජ්‍යත්වයට පත් වූ පාලකයන් විසින් ප්‍රයෝජනයට ගැණුනු අවස්ථාවක් ලෙස අහස් කුසට විහිදී ගිය දැවැන්ත ස්තූප වන ථූපාරාමය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, අභයගිරිය ආදි ස්තූප පෙන්වාදිය හැකිය. මෙම ස්තූපයන් පිළිබඳව බොහෝ විද්වතුන් විසින් නොයෙක් පර්යේෂණයන් සිදු කොට පර්යේෂණ ග්‍රන්ථ, පර්යේෂණ පත්‍රිකා එළිදැක්වීම මෙන්ම එම ස්තූප පිළිබඳව වාද විවාද, සාකච්ඡා වැනි විවිධ වූ වැඩසටහන් පවත්වා තිබේ. ඒ අතර කිසිවෙකුගේ කතාබහට ලක් නොවන නමුදු අවකාශය සිසාරා විහිදී ගිය නිහඬව වැජඹෙන ස්තූප මේ ලක්දෙරණේ තවමත් ශේෂව පවතී. ඒ අතරින් බොහෝ දෙනෙකුට අසන්නට, දකින්නට නොලැබෙන පස්යොදුන් රට ස්තූප පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා මෙම ක්ෂේත්‍ර ගවේෂණය සිදු කරන ලදී.

ශ්‍රී ලංකාද්වීපයේ පවතින පළාත් අතරින් ප්‍රධානම පළාත වන බස්නාහිර පළාතේ පිහිටි කළුතර දිස්ත්‍රික්කය වර්ග කි.මී. 1598 ක වපසරියකින් යුත් භූමි ප්‍රදේශයකි (සංඝසුමන හිමි 2015: 65). අතීතයේදී දිස්ත්‍රික්කයේ ඓතිහාසික භූමි සීමාව නිර්මාණය වී පැවතියේ ප්‍රදේශයට ආවේණික වූ භූගෝලීය පරිසරයට අනුකූලවය. කළුතර දිස්ත්‍රික්කය අතීතයේදී හඳුන්වා ඇත්තේ පස්යොදුන් රට යනුවෙනි (කන්නන්ගර 2019: 24). කඩයිම්පොතෙහි සඳහන්වන කරුණක් උපුටා දක්වන කන්නන්ගර පවසන්නේ පස්යොදුන් රට ලෙස ව්‍යවහාරයට පත්ව ඇත්තේ මෙම ප්‍රදේශය අතීතයේදී **යොදුන් පහකින් සමන්විතව පැවති නිසා** බවයි (කන්නන්ගර 2019: 24). ඒ අනුව ඔහු මෙහි දේශ සීමාව වශයෙන්, **උතුරු සීමාව කළු ගඟ, දකුණු සීමාව බෙන්තර ගඟ, බටහිර සීමාව බස්නාහිර මුහුදු වෙරළ හා නැගෙනහිර සීමාව නවයොදුන්රට** වශයෙන්ද දක්වා තිබේ (කන්නන්ගර 2019: 24). පස්යොදුන් රට පිළිබඳව ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කිරීමේ දී **මහාවංසයත්, ගලපාතවිහාර ලිපියත්** බෙහෙවින් උපකාරී වේ. නිදසුනක් ලෙස **"පස්යොදුන් රට මහමඩ හා කුඩාවිල් කප්පවා එයින් ජලය ගංගාවලට හෙලා කෙත් පැවැත්වීය."** (මහාවංසය 2012: 68, 51-53 ගාථා) යනුවෙන් සඳහන් වේ.

මෙහිදී අධ්‍යයනය කරනු ලැබුවේ අනුරාධපුර යුගයේ සිට 1948 දක්වා පස්යොදුන්රට පිහිටි ස්තූපයන්ය. එනම් වරකාගොඩ ගනේඋඩ (වෙහෙර) චෛත්‍යගොඩැල්ල, පොල්ගම්පල වික්‍රමශිලා පිරිවෙනේ ස්තූපය**,** කැකුණදොළ රජ මහ වෙහෙර (පතිරාජ පිරිවෙනේ) ස්තූපය, අලුත්ගම කන්දේ විහාරයේ ස්තූපය, කළුතර

දූවේ විහාරයේ ස්තූපය, අලුත්ගම කල්‍යාණාරාම පුරාණ විහාරයේ ස්තූපය, පයාගල පොතුවිල වෙහෙරගලකන්ද විහාරයේ ස්තූපය, මීගහතැන්න විද්‍යාරාම පිරිවෙනේ ස්තූපය, ඕවිටිගල විහාරයේ ස්තූපය, පයාගල ඇතගම සුමනාරාම විහාරයේ ස්තූපය, බෝම්බුවල සුබෝධිරාජාරාම විහාරයේ ස්තූපය, මූලමහාවිහාරයේ ස්තූපය, බෙල්ලන ශ්‍රී ධර්මපාල මහ පිරිවෙනේ ස්තූපය සහ කළුගල ආරණ්‍ය සේනාසනයේ ස්තූපය යන ස්තූපයන්ය. මෙකී ස්තූප ව්‍යාප්තිය අනුව කලාපය පුරාම පුරාතන ජනාවාස ව්‍යාප්තිය හා ආරාම ස්ථානගත වී ඇති බව දකගැනීමට හැකි විය. ගනේඋඩ පුරාණ රජමහා විහාරය පොළොන්නරු යුගය දක්වා ඈතට විහිද යන ඉතිහාසයක් ඇති ස්ථානයක් ලෙස සැලකේ (දේවිකා 2016: 32-34). ඒ අනුව වරකාගොඩ ගනේඋඩ (වෙහෙර) චෛත්‍ය ගොඩැල්ල පෙලොන්නරු යුගයට අයත් වන බවට අපට නිගමනය කළ හැකිය.

පර්යේෂණයට ලක්කරනු ලැබූ පස්යොදුන් රට ස්තූප පිළිබඳ විමසිලිමත්ව අධ්‍යයනය කිරීමේදී එම ස්තූපයන් හි හැඩය පිළිබඳව දකගත හැකි වූ විශේෂ ලක්ෂණය වූයේ පර්යේෂණය කළ ස්තූප සියල්ලම ඝණ්ටාකාර හැඩයෙන් යුක්ත වීමයි. මෙම පස්යොදුන් රට ස්තූප පිළිබඳ අධ්‍යයනය කිරීමේදී එම ස්තූපවලටම ආවේණික වූ සැරසිලි කිහිපයක් හඳුනාගත හැකි විය. ඒ අතර නෙළුම් මල, පලාපෙති, ඉර, හඳ, ලියවැල, බෝ පත්‍ර දකගත හැකි වූ අතර ඇතැම් ස්තූපවල සිංහයා, ඇතා, කඟවේනා, බුද්ධ ප්‍රතිමා, දේව ප්‍රතිමා, මිනිස් රූප හා විවිධ මල් මෝස්තර දකගත හැකි විය. මා විසින් පර්යේෂණය ලක් කරන ලද ස්තූප සියල්ල අතරින් වරකාගොඩ ගනේඋඩ (වෙහෙර) චෛත්‍ය ගොඩැල්ල සහ කළුතර දූවේ විහාරයේ ස්තූපයේ සැරසිලි කිසිවක් දක්නට නොලැබුණි. පස්යොදුන් රටට අයත් ස්තූපවල ඒවාට ආවේණික ඉදි කිරීම් ලක්ෂණ ප්‍රකට වන අතර ස්තූපයේ වේදිකාව, පේසාව, ගර්භය, හතරැස් කොටුව, දේවතා කොටුව හා කොත්කරැල්ල යන ස්ථානයන්හි ඉර, හඳ, නෙළුම් මල, ලියවැල, බෝපත්, පලාපෙති යනාදි වූ සිංහල සැරසිලි මෙන්ම කඟවේනා වැනි බ්‍රිතාන්‍ය සැරසිලිද මෙකී ස්තූපවල දකගත හැකිය. ඒ අනුව සූර්යය සංකේතය පවතින ස්තූප අතර අලුත්ගම කන්දේ විහාරයේ ස්තූපයෙහි ස්තූප වේදිකාව මත සහ හතරැස් කොටුව මත, ඕවිටිගල විහාරයේ පිහිටි ස්තූපයේ හතරැස් කොටුව මත, ඇතගම සුමනාරාම විහාරයේ පිහිටි ස්තූපයේ හතරැස් කොටුව මත සහ බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙනේ ස්තූපයේ හතරැස් කොටුව මත මෙකී සූර්යය සංකේතය දකගත හැකිය (ඡායාරූප අංක 1, 2, 3, 4, 5). අලුත්ගම කන්දේ විහාරය, ඕවිටිගල විහාරය, ඇතගම සුමනාරාම විහාරය සහ බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙන යන විහාරස්ථානවල පිහිටි ස්තූපයන්හි හතරැස් කොටුවේ එක් පසෙක චන්ද්‍ර සංකේතය නිරූපණය කර ඇති අයුරු දකගත හැකිය (ඡායාරූප අංක 6, 7, 8, 9). සිංහල සැරසිලි අතර පවතින තවත් සැරසිලි විශේෂයක් වන ලියවැල සහ නෙළුම් මල යනාදි වූ සැරසිලි රටා පොල්ගම්පල වික්‍රමශිලා පිරිවෙන, කැකුණදොළ රජමහා විහාරය, මීගහතැන්න විද්‍යාරාම පිරිවෙන, අලුත්ගම කන්දේ විහාරය, ඕවිටිගල විහාරය, ඇතගම සුමනාරාම විහාරය සහ බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙන තුළ ඉදිකර ඇති ස්තූපවල දකගත හැකිය (ඡායාරූප අංක 10, 11, 12, 13, 14, 15, 16, 17, 18). බුද්ධ ප්‍රතිමා සහ බුදුන්ට වන්දනාමාන කරන ආකාරයට සිටින මානව රූප පෙළක් (ඡායාරූප අංක 19, 20) කළුගල ආරණ්‍යයේ පිහිටි ස්තූපයේ දකගත හැකි අතර මෙකී සිංහල සැරසිලිවලට අමතරව විදේශීය ආභාසයෙන් යුක්තව ස්තූපය මත නිර්මාණය කරන ලද සැරසිලි ලක්ෂණ දකගත හැකිය.

ඒ අතර බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙනේ ස්තූපයේ හතරැස් කොටුවේ නැගෙනහිරින් පිහිටි කොටුව මධ්‍යයේ කඟවේනකුගේ හිසක ආකෘතියක් නිර්මාණය කර තිබේ (ඡායාරූප අංක 21).

මෙම ප්‍රදේශයේ අතීතයේ සිට ක්‍රමක්‍රමයෙන් පැවතගෙන ආ කළුගල් නෙළීමේ තාක්ෂණය සිහිගැන්වීම පිණිස සම්පූර්ණයෙන්ම කළුගල් භාවිත කර ඉදි කරන ලද ස්තූප හතරක් අපට දැකගත හැකිය. පොල්ගම්පල වික්‍රමශිලා පිරිවෙන, කළුතර දූව විහාරය, මීගහතැන්න විද්‍යාරාම පිරිවෙන හා කළුගල ආරණ්‍ය සේනාසනය යන විහාරස්ථාන වල පිහිටි ස්තූප මෙලෙස කළුගල් භාවිතා කර ඉදිකරන ලද ස්තූප වේ (ඡායාරූප අංක 22, 23, 24, 25).

මෙම අධ්‍යයනයට භාජනය කළ ස්තූප අතරින් බොහෝමයක් වසර සියය ඉක්මවා ඇති බැවින් පුරාවිද්‍යා ස්මාරක වශයෙන් නම් කළ හැකිය. නමුත් සමහර ස්තූප තවමත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ස්මාරක තත්වයට පත් වී නොමැත. පුරාවිද්‍යා ස්මාරක වශයෙන් මෙම ස්තූප සියල්ලම ලියාපදිංචි කරන්නේ නම් එය ඉතා වැදගත් කර්තව්‍යයකි.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අස්සජි හිමි, හල්වතුරේ. (2005). සුබෝධි උපසම්පදා පුණ්‍ය මහෝත්සවය. කළුතර : තේජානි ප්‍රින්ටර්ස්.
කන්නන්ගර, පත්මසිරි. (2019). යගිරල මහින්ද සංකාසන. තලගල: ඕඩී ප්‍රින්ටර්ස්
දේවිකා මානෙල්, ජී.ඒ. (2016). මදුරාවල පුරා විත්ත. උතුරු කළුතර : පියසර මුද්‍රණ ශිල්පියෝ.
පරණවිතාන, එස්. (1997). ලංකාවේ ස්තූපය. බත්තරමුල්ල : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
පිත්තවල, සංඝසුමන හිමි. (2015). කළුතොට ශාස්ත්‍රීය සංග්‍රහය. කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
පෙරේරා, වික්ටර්. (2017). කළුතර දිසාව. කොළඹ : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
බණ්ඩාර සිරිනාම, ඒ. ජී. (2007). කළුවාමෝදර ශ්‍රී කල්‍යාණාරාම පුරාණ මහා විහාරස්ථානයේ තැන්පත් කර ඇති ශ්‍රී ලංකාවේ ඉපැරණි විශාලතම බුද්ධ ප්‍රතිමා වහන්සේ වන්දනීයත්වයට පත්කිරීමේ පුණ්‍ය මහෝත්සවය වෙනුවෙන් නිර්මිත සමරු කලාපය. අලුත්ගම : ශ්‍රීපාලි ප්‍රින්ටර්ස්.
මහාවංශය සිංහල. (2012). කොළඹ : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
රතනසාර හිමි, තිරාණගම. (1967). බෞද්ධ ස්තූප. කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
වික්‍රමගමගේ, චන්ද්‍රා. (2010). ස්තූප. මහරගම : තරංජි ප්‍රින්ට්ස්.
විජේතිලක, මතුගම මහින්ද. (2010). සියවසක උරුමය ස්වර්ණ ජයන්ති සමරු කලාපය. ශ්‍රී ධර්මපාල මහ පිරිවෙන් ආදි ශිෂ්‍ය සංගමය.
සමරදිවාකර, අනුරුද්ධ. (2001). කන්දේ විහාරය. බොරලැස්ගමුව:රංජිත් ග්‍රැෆික්ස්.
සමරනායක, එස්. ඩී. ඩබ්. (2011). 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරුව. මීගහතැන්න: විද්‍යාරාම විද්‍යායතන පිරිවෙන් විහාරස්ථානය.
සමරසුන්දර, නිමල්. (2012). කැකුණදොළ රජමහ වෙහෙර හා පතිරාජ පිරිවෙණ, බත්තරමුල්ල : සදීපා ප්‍රින්ටර්ස්.
සුමනසේකර, ජයන්ත. (1998). දූවේ මහා වෙහෙර හා බැඳුණු ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය. හෝමාගම : සෙනෙවිරත්න ප්‍රින්ටර්ස්.
සුමනසේකර, ජයන්ත. (2003). දෙස බස රැස පුබුදු කල කලමුල්ලේ පඬිරුවන. බත්තරමුල්ල : සුමන ප්‍රකාශන.



ඡායාරූප අංක 1: සූර්යයා සහ උද්භිද සැරසිලි
(අළුත්ගම කන්දේ විහාරය)



ඡායාරූප අංක 3: සූර්යයා
(ඕවිටිගල විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 4: සූර්යයා
(ඇතගම සුමනාරාම විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 5: සූර්යයා
(බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙනේ ස්තූපය)



ඡායාරූප අංක 6: චන්ද්‍රයා, නෙළුම් මල
(කන්දේ විහාරයේ ස්තූපය)




ඡායාරූප අංක 7: චන්ද්‍රයා සහ සිංහ මුහුණු
(ඕවිටිගල විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 8: චන්ද්‍රයා
(ඇතගම සුමනාරාමයේ ස්තූපය)



ඡායාරූප අංක 9: චන්ද්‍රයා
(බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙනේ ස්තූපය)




ඡායාරූප අංක 10: ලියවැල
(පෙල්ගම්පල වික්‍රමශිලා පිරිවෙනේ ස්තූපය)



ඡායාරූප අංක 11: ලියවැල
(ඕවිටිගල විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 12: ලියවැල
(බෝම්බුවල විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 13: ලියවැල
(මූලමහා විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 14: ලියවැල
(බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙනේ ස්තූපය)



ඡායාරූප අංක 15: නෙළුම් මල්
(වෙහෙරගලකන්ද විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 16: නෙළුම් මල්
(ඇතගම සුමනාරාම විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 16: නෙළුම් මල
(මීගහතැන්න විද්‍යාරාම පිරිවෙනේ ස්තූපය)



ඡායාරූප අංක 17: නෙළුම් මල
(ඕවිටිගල විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 18: නෙළුම් මල
(ඇතගම සුමනාරාම විහාරයේ ස්තූපය)



ඡායාරූප අංක 19: බුද්ධ ප්‍රතිමා
(කළුගල ආරණ්‍ය සේනාසනයේ ස්තූපය)



ඡායාරූප අංක 20: වැඳගෙන සිටින මිනිස් රූප
(කළුගල ආරණ්‍ය සේනාසනයේ ස්තූපය)




ඡායාරූප අංක 21: කඟවේනා
(බෙල්ලන ශ්‍රී ධර්මපාල පිරිවෙනේ ස්තූපය)



ඡායාරූප අංක 22: පොල්ගම්පල
වික්‍රමශිලා පිරිවෙනේ ස්තූපය



ඡායාරූප අංක 23:
කළුතර දූවේ විහාරයේ ස්තූපය



ඡායාරූප අංක 24:
මීගහතැන්න විද්‍යාරාම පිරිවෙනේ (විවේකාරාමය)
ස්තූපය

DEPARTMENT OF ARCHAEOLOGY தொல்பொருட் திணைக்களம்



ඡායාරූප අංක 25:
කළුගල ආරණ්‍ය සේනාසනයේ ස්තූපය

# යාපහුව රාජධානියේ පුරාණ වැව පිළිබඳව වාරි පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඒ.එච්.එම් ජනක මහේෂ් අතපත්තු

ආර්.එම් ලක්මාල් රත්නායක

## හැඳින්වීම

මානව ජනාවාසකරණයේදී ජලය අත්‍යවශ්‍ය සාධකයක් වී තිබේ. ඒ නිසා බොහෝ මානව ජනාවාස අතීතයේ ගොඩ නැගුණේ ජලය පහසුවෙන් ලබා ගත හැකි ජල මූලාශ්‍රයක් සහිත භූමියක වේ. ලෝකයේ ඉපැරණි ශිෂ්ටාචාර විශාල ගංගා නිම්න ආශ්‍රිතව බිහිවීමට හේතු වූයේ උක්ත කරුණයි. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස බොහොමයක සධාක හමු වන ස්ථාන ආශ්‍රිතව ස්වාභාවික ජල මූලාශ්‍රයක්ද දැකගත හැකි වීම විශේෂ කරුණකි. දැනට හමුවන සාධක අනුව පූර්ව ඓතිහාසික අවධියේදී වියළි කලාපිය මානව ජනාවාසකරණය වීමේදී කෘත්‍රිම ජල එක් රැස් කර ගැනීමද උපයෝගී කර ගෙන ඇත. ගම් වැව් නිර්මාණය වීමේ ආරම්භක අවධිය මේ ලෙස සනිටුහන් වන්නේ පූර්ව ඓතිහාසික අවධියේය.

මුල් ඓතිහාසික අවධිය වන විට ගම් වැව් නිර්මාණය වීම වැඩි වශයෙන් සිදු වන විට නාගරික අවශ්‍යතා සඳහා මහ වැව් නගර ආශ්‍රිතව නිර්මාණයවීමද දැක ගත හැකි වේ. ඉන් පළමුවැන්න පණ්ඩුකාභය රාජ්‍ය දවස අනුරාධපුර නගරය ආශ්‍රිතව නාගරික ජන අවශ්‍යතා සඳහා වැව් තුනක් ඉදි කිරීමයි. පසුකාලීනව වාරි ශිෂ්ටාචාරය ක්‍රමයෙන් වර්ධන වී විශාල පරිමාණයේ වැව් කෘෂි අවශ්‍යතා සේම නාගරික අවශ්‍යතා සඳහා නිර්මාණය කර ගෙන තිබේ.

මෙරට වියළි කලාපයේ රාජධානි නිර්මාණය වූ ස්ථානවල එහි අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා වැව් නිර්මාණය කර තිබීම දැක ගත හැකි සුවිශේෂ කරුණකි. අනුරාධපුර, සීගිරිය, පොලොන්නරුව වැනි ජලාශ්‍රිත ශිෂ්ටාචාරය වර්ධනය වී පැවති අවධියේ මෙරට මහා වාරි කර්මාන්තය සුලබ වුවත් නිරිතදිග රාජධානි සමය අවධියේදී වාරි සංස්කෘතිය කෙරෙහි එතරම් අවධානයක් යොමු නොවී තිබේ. නමුත් මධ්‍යකාලීන අවධියේදී කෙටි කලක් මෙරට රාජධානියක්ව පැවති යාපහුව රාජධානිය ආශ්‍රිතව නිර්මාණය කර තිබූ නාගරික ජල අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා යොදා ගත් මහ වැවක සාධක හඳුනා ගත හැකි වේ. මෙම පර්යේෂණයේදී එම ඉපැරණි යාපහුව නගරයේ වැව හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

## 02 පර්යේෂණ ගැටලුව හා පර්යේෂණ අරමුණු

ඉපැරණි යාපහු රාජධානියේ නාගරික ජල අවශ්‍යතාව සම්පූර්ණ කර ගෙන ඇත්තේ කෙසේද යන්න පර්යේෂණ ගැටලුව ලෙස යොදා ගනිමින් යාපහුව වැව පිහිටි භූමිය හඳුනා ගැනීම හා එහි ජල මූලාශ්‍රය හඳුනා ගැනීම මෙහි ප්‍රධාන පර්යේෂණ අරමුණු විය ( ඡයාරූප අංක-03.1).

### 03 පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දත්ත එක් රැස් කර ගැනීම සඳහා යාපහුව රාජධානිය හා ඒ අවට ප්‍රදේශයේ ඓතිහාසිකත්වය හඳුනා ගැනීමට පුස්තකාල ගවේෂණය යොදා ගන්නා ලදී. එහිදී ඓතිහාසික තොරතුරු පිළිබදව අධ්‍යයනය කිරීම සඳහා සාහිත්‍ය හා පූර්ව පර්යේෂණ වාර්තා අධ්‍යයනය කිරීම සිදු කළේය. යාපහුව වැව පිහිටි භූමියට අදාළ දත්ත එක් රැස් කර ගැනීම සඳහා ක්ෂේත්‍ර ගවේෂණය සිදු කළ අතර එම සමහර දත්ත විශ්ලේෂණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතියද යොදා ගන්නා ලදී.

### 04 යාපහුව- ඓතිහාසික පසුබිම

යාපහුව රාජධානිය පිහිටි ප්‍රදේශය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට වර්තමාන යුගය දක්වා පියවර කිහිපයක් පසුකරමින් පැමිණ තිබේ. ඒ අනුව ප්‍රාග් ඓතිහාසික යුගය ගැන තොරතුරු අනාවරණය කර ගත හැකි ප්‍රධාන ම සාධකයක් ලෙස ශිලා මෙවලම් හඳුන්වා දිය හැකිය. ඒ අනුව තිරුවානා, කහඳ ආදි පාෂාණ වර්ග ගල් ලෙන් තම වාසස්ථානය ලෙස යොදා ගෙන තිබේ. ඒ බව පුරාවිද්‍යා දෙපාර්තුමෙන්තුවේ 2001 වර්ෂයේ ගවේෂණ වාර්තාවේ පෙන්වා දෙන ආකාරයට යාපහුව පුරා ස්ථානයේ මොණරකන්දේ ස්ථාන තුනකින් දිවුල්ලැව උස්ගල නම් ස්ථානයෙන් ද කයිකාවල විහාර බිමෙන්ද ප්‍රාග් ඓතිහාසික තොරතුරු අනාවරණය වූ බව පෙන්වා දෙයි. එම වාර්තාව අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාස තිබූ බවට සාධක වශයෙන් ඉහත සඳහන් කළ ස්ථානවලින් භාවිත කළ, නොකළ තිරුවානා වටගල් හා භාවිත කළ රත් හිරියල්,කහඳ තිරිවානා අපද්‍රව්‍ය වශයෙන් තිරුවානා ගල් මෙවලම් හමු වී ඇත.

ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසු ආරම්භ වන්නා වූ මූල ඓතිහාසික යුගයේදී යාපහුව හා අවට ප්‍රදේශයේ මානව ක්‍රියාකාරකම් සිදුව ඇති බවට සාධක හඳුනා ගත හැකිය. යාපහු පර්වතයට නිරිත දිශාවෙන් 2Kmක් පමණ දුරින් පිහිටි පින් වැව මෙගලිතික සුසාන භූමිය හා යාපහුව අවට පිහිටි ගල් ගුහා අධ්‍යයනයේදීද මූල ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු අනාවරණය වේ.

කාලිංග මාඝ මර්දනකාරි පාලන සමයේ (ක්‍රි:ව 1214-1235) සුබ සෙනවියා ප්‍රදේශයේ ආරක්ෂාව සඳහා යාපහුව බල කොටුවක් කරවා වාසය කළ බව (මව. 81පරි : 18 ගාථාව) සඳහන් වේ. මහාවංශය පෙන්වා දෙන ආකාරයට ii වන පැරකුම් පුත් iv වන විජයබාහු ක්‍රි:ව (1270-1272) රජු චන්ද්‍රභාණු නම් විදේශ ආක්‍රමිකයා යාපහුව සමීපයේදී පරාජයට පත් කොට ලංකාව එක්සත් කර යාපහු නගරය පිරිකෙව් කොට පවුරු තැනවීමත් එහි මාහැඟි රජ ගෙයක් තනවා බුවනකබා නම් සිය සොයුරා එහි රැඳවීමත්ය. (මව. 88 පරිː 77,80 ගාථා) විජයබාහු සහ බුවනෙකබා යන දෙසොහොයුරන් අතර වු සහජීවනයත්, මේ දෙදෙනා යාපහුව හා සම්බන්ධතා පිළිබඳ වංශකතානුගත විස්තර කෙරෙන සෙල්ලිපියක් යාපහුවට නුදුරු තුත්තිරි වෙල නම් ස්ථානයෙන් ලැබී තිබේ. එහි දෙවන පරාක්‍රමබාහු රජුගේ විසිනමවැනි රාජ්‍ය වර්ෂයෙහි (ක්‍රි:ව1265) විජයබාහු, බුවනකබාහු යන දෙබෑයන්ගේ අනුදැනුමෙන් කළ ඉඩම් ප්‍රදානයක් පිළිබඳව මෙම

ලිපියේ විස්තර වේ. ප්‍රදානය ලද්දාගේ නම මෙහි මැකී ගොසිනි (දිසානායක 2001:11). ශිලාලේඛනයට අනුව ක්‍රි:ව 12වන සියවසට අයත් වන බැවින් මෙහි අක්ෂර වින්‍යාසයෙහි පරිණාමීය ප්‍රබල අවස්ථාවක් පෙන්නුම් කරන බව කිව හැකිය.

ඒ අනුව යාපහුව අගනගරයක් ලෙස පැවති කෙටි කාල සීමාවේ රටේ අගනගර ලෙස පැවති ස්ථාන අතරින් දෙවැනි වන්නේ නම් ඒ දැදිගම රාජධානියට පමණකි. එසේ වුවද අගනගරයක් වශයෙන් යාපහුවේ ශේෂව ඇති පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂයන්හි ප්‍රමාණය දෙවැනි වනුයේ අනුරාධපුර, පොලොන්නරුව, සීගිරිය සහ ඇතැම් විටක මහනුවරට පමණකැයි පරණවිතාන මහතා (ASCAR REPORT:1948:20) පවසයි.

**සාකච්ඡාව**

යාපහුව ප්‍රදේශය අයත් වන්නි හත්පත්තුව පිළිබඳ සලකා බැලීමේදී දැක ගත හැකි වන්නේ දිවයිනේ වැඩිම ගම් වැව් හා එල්ලංගා ප්‍රමාණයක් පිහිටා ඇති ප්‍රදේශයක් වශයෙනි. යාපහුව රාජධානිය පිහිටි භූමිය අවටද වාර්තමානයේද විශාල වශයෙන් කුඩා ගම් වැව් රැසක් දැක ගත හැකි වේ. ඒ අතර මේ පර්යේෂණයට බඳුන් වූ ඉපැරණි යාපහුව වැව පිහිටා ඇත්තේ යාපහුව රාජධානියේ දකුණු ප්‍රදේශයේ ය. යාපහුව රාජධානිය බලකොටුවක් ලෙස ඇතුළු දිය අගලකින් හා පිට දිය අගලකින් වට කර ඇති නිසා වැව් බැම්මේ එක් කෙළවරක් සීමා වන්නේ දකුණු දොරටුව අසලින් පිට දිය අගලේ බැම්මටය. වැව් බැම්මේ අනෙක් කෙළවර දිගු වන්නේ යාපහුව පර්වතයට දකුණින් පිහිටි මොණරකන්ද නම් ශේෂ කන්දේ සීමාවටය.

ඒ අනුව මෙම වැව සඳහා වැව් බැම්ම නිර්මාණය කිරීමේ දී භාවිත කර ඇත්තේ ශේෂ කඳු දෙකක අතර වන පටු රැලි භූමි ස්වභාවයයි. මින් යාපහුව පර්වතය මීටර් 239ක් පමණ උසකින් යුක්ත වන අතර මොණරකන්ද මීටර් 150ක් පමණ උසකින් යුක්ත පර්වතයක් වේ. මෙම පර්වත දෙක අතර පරතරය කිලෝමීටර් දෙකක පමණ දුරකින් යුක්ත වේ. මේ නිසා මේ භූමිය රැලි සහිතව නිර්මාණය වී තිබේ. යාපහුව වැව නිර්මාණය කර ගැනීම සඳහා උපයෝගී කර ගෙන ඇත්තේ භූමියේ ඇති මේ පිහිටීමේ ලක්ෂණයයි. මෙය පටු බිම් කඩක් නිසා වැව් බැම්ම මගින් එය හරස් කළ විට පහසුවෙන් ජලය රැස් කර ගැනීමේ හැකියාව පවතී. කෙසේ වෙතත් වියළි කලාපයේ එල්ලංගාවලට අයත් ගම් වැව් නිර්මාණය කර ගැනීමට උපයෝගී කර ගෙන ඇත්තේ වියළි කලාපය පුරා දක්නට ලැබෙන මේ රැලි සහිත ස්වභාවය වේ. එවැනි රැලි භූමි මත වර්ෂා කාලයේ ගලා යන ජලය කුඩා වැව් බැම්මක් යොදා සාදා ගත් ගම් වැව් වර්තමානයේද විශාල වශයෙන් යාපහුව අවට ප්‍රදේශයෙන් හඳුනා ගත හැකි වේ. නමුත් යාපහුව රාජධානියට අයත් ඉපැරණි වැව, ගම් වැවකට වඩා තරමක් විශාල ප්‍රමාණයේ මහා වැවක ලක්ෂණවලින් යුත් එකක් බවට නිරීක්ෂණය කළ හැකිය.

වැවේ වැව් බැම්ම දිගින් මීටර් 600ක පමණ ප්‍රමාණයකින් යුක්ත වන අතර උපරිම උස මීටර් හතකට ආසන්න අගයක් ගනී. භූමියේ ස්වභාවය අනුව වැව් බැම්මේ උස විවිධ ස්ථානවල වෙනස් වුවත් මුහුදු මට්ටමේ සිට උස එක සමානව පවත්වා ගෙන යන අයුරින් නිර්මාණය කර ඇත. දැනට යාපහුව පුරාවිද්‍යා

දෙපාර්තමේන්තුවේ කෞතුකාගාරය තිබෙන රථ ගාල භූමියේ පටන් මොණරකන්දට ආසන්න ගල් තලාවක් දක්වා සම්පූර්ණ වැව් බැම්ම හඳුනා ගත හැකි වේ. එහි ස්ථාන දෙකකින් බිඳී යාම් සිදු වී තිබේ. යාපහුව ගල්ටන්වැව මහා මාර්ගය දිව යන්නේ වැව් බැම්ම හරහා බැවින් එම ස්ථානයෙන් වැව් බැම්ම බිඳී ගොස් ඇත. ඊට අමතරව වැවේ මැද ස්ථානයකට වන්නට තවත් තැනකින් වැව් බැම්ම බිඳී ගොස් තිබේ. එය සමහර විට යාපහුව වැව විනාශ වූ කාලවකවානුවට ආසන්න කාලයකදී සිදු වූ දෙයක් වන්නට ඇත. දැනට වැව් බැම්මේ ඇතුළු පැත්තේ ස්ථාන කීපයකින්ම සම්පූර්ණ රළ පනාවට අයත් සාධක හඳුනා ගැනීමට හැකිය. රළ පනාව කුඩා ප්‍රමාණයේ කළුගල් යොදා ගෙන විධිමත්ව බැමි කීපයක් ලෙස නිර්මාණය කර ඇත ( ඡයාරූප අංක-01.). නමුත් දැනට පවතින සාධක අනුව මෙම වැවේ සොරොව්වක් හෝ සොරොව් ඇලක් හඳුනා ගැනීමට නොහැකිය. වැව් බැම්මේ මැද බිඳී ගොස් ඇති කොටස අසලින් වැවේ පිට වානෙන් ජලය පිටවන වාන් ඇල තිබෙන නිසාම සහරවිට එම ස්ථානයේ සොරොව්ව තිබෙන්නට ඇතියි සිතිය හැකිය.

වැවේ පිටවාන හඳුනා ගත හැකි වන්නේ වැව් බැම්මේ දකුණු කෙළවරේ මොණරකන්දට ආසන්නවය. එහි ඇති ගල්තලාව උපයෝගී කර ගෙන පිටවාන නිර්මාණය කර ඇත. වාරි තාක්ෂණයේදී බොහෝ වැව්වල පිටවාන නිර්මාණය කර ගෙන ඇත්තේ ස්වාභාවික ගල් තලාවක් උපයෝගී කරගෙනය. ඊට හේතු වූයේ වාන් ජලය පිටවී යාමේදී ඇති වන සේදී යාම වළක්වා ගැනීමයි. යාපහුව වැවෙන්ද එය හඳුනා ගැනීමට හැකියාව ලැබේ. මෙහි පිටවාන කෘත්‍රිමව කිසිම ඉදි කිරීමක් ඉදි කළ බවක් නොපෙනන අතර ස්වාභාවික ගල් තලාව වැව් බැම්මටම සම්බන්ධව පැවතීමත් ගල් තලාව වැව් පහළම කොටසට වඩා උසින් පිහිටා තිබීමත් එයට හේතු වී ඇත. වැවේ පිට වාන් ඇල අදටද වර්ෂා කාලයේදී සක්‍රියව පවතී. එහි වාන් ඇල ඒ අයුරින්ම පවතින අතර වර්තමානයේදීද වර්ෂා කාලයේ එම ස්ථානයට එකතු වන ජලය යාපහුව වැවේ ඇල මාර්ගය මගින් ඊට ආසන්නයේ පිහිටි බමුණාකොටුව මහ වැව නම් වැවට එකතු වීම සිදුවේ. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ඉපැරණි යාපහුව වැව වැව් එල්ලංගාවක වැවක් ලෙස සම්බන්ධවී තිබීමයි.

වර්තමානයේදීද වැවේ ඇතුළු පැත්තේ වැව් බැම්ම අසල ස්ථානවල දිය සිරාවලින් යුත් වගුරු ස්වභාවයේ පරිසරයක් දැකගත හැකි වේ ( ඡයාරූප අංක-07) . ඒ නිසාම වර්තමානය වන විට ඒ අවට ගම්වාසීන් වැව සම්පූර්ණයෙන්ම කුඹුරු බවට පරිවර්තනය කර ගෙන තිබේ. ඒ නිසා වැවේ නිශ්චිත සීමාවක් හඳුනා ගැනීමේ හැකියාවක් නැත. වැව් බැම්මේ මුහුදු මට්ටමේ සිට පවතින උසත් වැවේ ඇතුළු පැත්තේ මුහුදු මට්ටම් උසත් ගණනය කිරීම මගින් දළ වශයෙන් වැවේ සීමාව හඳුනා ගැනීමට උත්සහා ගන්නා ලදී. ඒ අනුව යාපහුව වැවේ ප්‍රමාණය පිළිබදව සැලකිලිමත් වීමේදී හඳුනා ගත හැකි වන්නේ වර්ග කිලෝ මීටර් දෙකක ප්‍රමාණයකට ආසන්නව ව්‍යාප්තව තිබෙන්නට ඇති බවයි .මේ අනුව දැනට යාපහුව වැවට නැගෙනහිරින් පිහිටි අඹගස්වැව හා පලුගස්වැව අතීතයේ යාපහුව වැවේම කොටස් ලෙස පවතින්නට ඇතැයි සිතිය හැකි වේ (සැලසුම් අංක-07.).

ප්‍රදේශයේ පවතින ජන මතයන් අනුව එකක් නම් යාපහුවට නැගෙනහිරින් හා කිලෝමීටර් එකොළහක දුරින් පිහිටි දැනට බිඳී ගොස් ඇති මඩගල්ල වැවෙන් ඇල මාර්ගයක් යාපහුව වැව පෝෂණය කළ බවයි. මඩගල්ල වැව යාපහුව රාජධානිය පැවති සමයේදීද සක්‍රියව පවතින්නට ඇත. ඒ පිළිබඳව ඇති ඓතිහාසික සාධක නම් පොලොන්නරු අවධියේ පළමුවන විජයබාහු රජු ප්‍රතිසංස්කරණය කළ මහා මඩගල්ල වැව වන බවයි (විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය -1942-409). මී ඔය හරස් කරමින් මෙම විශාල ජලාශය නිර්මාණය කර තිබේ. මී ඔයත් දැදුරු ඔයත් අතර ප්‍රදේශයට ජලය ලබා ගැනීමේ අරමුණින් මෙය නිර්මාණය කරන්නට ඇත. යාපහුව වැව පිහිටි ප්‍රදේශයට වඩා මඩගල්ල වැව පිහිටි භූමිය උසින් යුක්ත වුවද එයින් යාපහුව වැව පෝෂණය කළේද යන්න පිළිබඳව පැහැදිලි සාධක දැනට හඳුනා ගැනීමට නොහැකි වේ. මේ පිළිබඳව වැඩි දුරට පර්යේෂණ සිදු කළ යුතුය.

ප්‍රදේශයේ තවත් පවතින විශ්වාසයක් නම් යාපහුව වැවට කිලෝමීටර් හයක් පමණ නැගෙනහිරින් පිහිටි දියබැටේ කන්දෙන් ලැබෙන ජල පාරකින් යාපහුව වැව පෝෂණය වූ බවයි. දියබැටේ කන්ද පිළිබඳව සැලකිලිමත් වීමේදී එය මුල් ඓතිහාසික අවධියේ පටන් ජනාවාසව පැවති භූමියක් වේ. පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් යුත් ලෙන් ගණනාවක්ද මහල්ලක නාග රජු පූජා කළ වැවක් පිළිබඳවද දියබැටේ කන්ද ආශ්‍රිතව පුරාවිද්‍යාත්මක සාධක හමුවේ (පරණවිතාන 1970 : 99). ඒ නිසා මෙම ප්‍රදේශය යාපහුව රාජධානි සමයේදීද ජනාවාසව පවතින්නට ඇත. ඒ වගේම වර්තමානයේදීද දියබැටේ කන්ද ජල පෝෂක ප්‍රදේශයක්ව පවතින අතර වර්ෂා කාලයේදී දියබැටේ කන්දෙන් පෝෂණය වන ගම් වැව් තුනක් මේ වටා හඳුනා ගත හැකිය. නමුත් දැනට පවතින සාධක මත දියබැටේ කන්දෙන් පෝෂිත යාපහුව වැවට ඇල මාර්ගයක් හඳුනා ගැනීමේ හැකියාවක් නැත.

නමුත් යාපහුව වැවේ ජල මූලාශ්‍රය හඳුනා ගැනීමේදී ඉහත සඳහන් දියබැටේ කන්දෙන් ජලය පැමිණි බවට වන මතය තරමක් විමර්ශනය කළ යුතු කරුණකි. මෙම පර්යේෂණයේදී ඉපැරණි යාපහුව වැවේ ජල මූලාශ්‍රය හඳුනා ගැනීමේදී වඩාත් අවධානයක් යොමු කළේ මේ මතය කෙරෙහිය. භූගෝලීය තොරතුරු පද්ධතිය මගින් සමීක්ෂණය කිරීමේදී පැහැදිලි වන්නේ යාපහුව වැව පිහිටි භූමියට නැගෙනහිරින් පිහිටි ප්‍රදේශය උසින් යුක්ත වේ. මුහුදු මට්ටමේ සිට උස යාපහුව වැවට සාපේක්ෂව දියබැටේ කන්ද ප්‍රදේශය වන තෙක් උස වැඩිවීම සිදුවේ (සැලසුම් අංක-08.). යාපහුව වැවට ඉහළ නැගෙනහිර ප්‍රදේශයෙන් ඊට ආසනයේම පයිලිගම ගම්මානයේ පිහිටි අඹගස් වැව හා පලුගස් වැව නමින් තවත් ගම් වැව් දෙකක් හඳුනා ගත හැකිය. මෙහි පලුගස්වැවේ වාන් ජලය අඹගස්වැවට ලැබේ. අඹගස්වැව පිහිටා තිබෙන්නේ යාපහුව වැවට කිලෝමීටරයක පමණ දුරකින් ඊට ඉහළිනි. මෙම වැව් දෙක පෝෂණය වන්නේ එහි උස් භූමියෙන් එන අගාර ජල මාර්ගයන්ගෙන් වේ. වර්ෂා කාලයේදී සක්‍රිය වන කුඩා ජල මාර්ග හෙවත් අගාර සහිත පහත් භූමියක බැමි බැඳ වැව නිර්මාණය කර ගැනීමෙන් වර්ෂා කාලයේදී වැවේ වතුර රැස්කර ගැනීම සිදු කළ හැකි වේ. දැදුරු ඔය නිම්නයට අයත් මෙම කලාපයේ මේ ක්‍රමයට ඉදි කළ මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ වැව් විශාල වශයෙන් හඳුනා ගැනීමට හැකිය. ඒ අනුව යාපහුව වැවේ ජල පෝෂක ප්‍රදේශයට වන්නට ඇත්තේ වැවට නැගෙනහිරින් පිහිටි උස් භූමි ප්‍රදේශයයි. යාපහුව පර්වතය හා මොණරකන්ද පර්වතය

අතර රැලි භූමි ස්වභාවය උපයෝගී කර ගෙන පහත් භූමියක වැව් බැම්ම බැඳ තිබීම මගින් වර්ෂා කාලයේදී හොඳින් සක්‍රිය වන කුඩා ජල මාර්ග හෙවත් අගාරවලින් ජලය එකතු කර ගැනීමට හැකිවී තිබේ. ප්‍රදේශයේ ගැමි විශ්වාසයේ වන දියබැටේ කන්දෙන් වැව පෝෂණය වුවාය කියන මතය තරමක් දුරට නිවැරදි වන්නේ මේ අගාර දියබැටේ කන්ද අයත් දේශයේ සිටම කුඩා ජල මාර්ග වර්ෂා කාලයේදී යාපහුව ප්‍රදේශයට අයත් පහත් භූමියට වර්තමානයේදීද ගලා එන බැවිනි. යාපහුව වැවට ආසන්නයේ පිහිටි පයිලිගම අඹගස්වැවට ගලා එන දියබැටේ ප්‍රදේශයෙන් ආරම්භවන කුඩා ප්‍රමාණයේ ඇල මාර්ගයක්ද හඳුනා ගැනීමට හැකි වේ. ඉහතින් සඳහන් කළ අනෙක් වැව් පෝෂණය වන්නේ එම ජල මාර්ගවලිනි. මීට අමතරව යාපහුව පර්වතයෙන් හා මොණරකන්ද පර්වතයෙන් වර්ෂා කාලයේදී ගලා එන ජල මාර්ගවලින්ද යාපහුව වැව පෝෂණය වන්නට ඇත.

## නිගමන හා යෝජනා

දැනට නටබුන්ව පවතින යාපහුව වැව යාපහු රාජධානි සමයේ නිර්මාණය කළ නාගරික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වන වැවක් බවට නිගමනය කළ හැකි වේ. අනුරාධපුර, පොලොන්නරු සමයේ මහ වැව් නිර්මාණකරණය සුලබ වුවත් නිරිතදිග ශිෂ්ටාචාරය අවධියේ එවැනි වාරි සංස්කෘතියක් දක්නට නොලැබෙන නිසා මෙය වැදගත් කාරණයක් වේ. දැනට කුරුණෑගල රාජධානි සමයේදී නගරයේ අවශ්‍යතා සඳහා නිර්මාණය කළ රන්තාලිය නම් වැව කුරුණෑගල නගර මධ්‍යයේ දැකගත හැකි වේ. මෙය ද එවැනි ආකාරයේ යාපහුව නගරයේ පිහිටි වැවක් ලෙස සිතිය හැකි වේ. අක්කර කීපයක් පුරා ව්‍යාප්තව පවතින මෙම වැව මහ වැවක් ලක්ෂණ රැගත් මධ්‍ය පරිමාණයේ වැවක් ලෙස නිගමනය කළ හැකි වේ. මේ වැවට නිශ්චිත ජල පෝෂක මාර්ගයක් නැති මුත් වියළි කලාපීය ගම් වැව්වල දැක ගත හැකි ජල පෝෂක ක්‍රමවේදය වන කුඩා ජල මාර්ග හෙවත් අගාරවලින් එන ජල මාර්ග මත යාපහුව වැවද පෝෂණය වන්නට ඇත. දැනට වැව සම්පූර්ණ වශයෙන් අබලන්ව නටබුන්ව පැවතියත් වැවේ සම්පූර්ණ වැව් බැම්ම, රළ පනාව, පිටවාන සක්‍රිය වාන් ඇල හඳුනා ගත හැකි වේ. මෙය යාපහුව රාජධානි සමයට අයත් වැදගත්ම පුරාවිද්‍යාත්මක උරුමයක් නිසාවෙන් නැවත උරුම කළමනාකරණ ක්‍රමවේදයන් මත ප්‍රතිසංස්කරණය කළ යුතුය. එමගින් යාපහු රාජධානියේ පැරණි භූ දර්ශනය ප්‍රතිනිර්මාණය කිරීමටද හැකියාවක් ලැබෙන අතරම ප්‍රදේශයේ ජනයාටද මහගු පිටුවලක් සැලසෙනු ඇත.

## මූලාශ්‍රය

අවුසදහාමි, උඩුල බණ්ඩාර. (1999). **වැව**. හිගුරක්ගොඩ:සිරි ප්‍රින්ටර්ස්.
දිසානායක, සෙනරත්. (2011). **යාපහුව.**
පල්ලෙතැන්න, තිලිණ. (2015). **යාපහුව අවට පුරාවිද්‍යා හා මානවවිද්‍යා ගවේෂණය**. මධ්‍යම සංස්කෘතික මධ්‍යස්ථානය: යාපහුව ව්‍යාපෘතිය.
**මහාවංසය.** (2011). නැදිමාල :බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
**යාපහුව**. (2001). කොළඹ :පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
**ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය**. (1970). විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

විතානාච්චි,චන්දන රෝහණ. (2017). **පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය.** කොළඹ : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
ASCAR REPORT. (1984). Colombo: Department Of Archaeology
Deraniyagala, S.U. (1992). *Pre History of Sri Lanka*. Colombo: Department Of Archaeology
Paranavithana, S. (1970). *Inscription of Ceylon, vol-1*. Colombo : Department of Archaeology.

## ඇමුණුම්



**( ඡායාරූප අංක-01 - අධ්‍යයන ප්‍රදේශය )**



**ඡායාරූප අංක-02 - රළ පනාව**




ඡායාරූප අංක-03 -වැවේ අභ්‍යන්තරය පෙනෙන අයුරු





ඡායාරූප අංක-04 -වැවේ පිට වාන




ඡායාරූප අංක-05 - වැවේ අභ්‍යන්තර පෙනෙන අයුරු


149000
149500
150000
150500
151000
291800
291200
290600
290000
289400
288800
N
W
E
S
Legend
Train_Road
Mionr Road
Main_Road
Extimate Tank
Rock Area
Water Bodies
Build up Area
Paddy
Open_Area
Scrub
0
0.175
0.35
0.7 Kilometers

(සැලසුම් අංක-07 : වැවේ වපසරිය )




(සැලසුම් අංක-08- වැවේ ජල මූලාශ්‍රය හා ඒ අවට භූ විෂමතාව)

# අම්පාර වෙහෙරගල ආරණ්‍ය සේනාසන අප්‍රකාශිත සෙල්ලිපි පිළිබඳ අභිලේඛනාත්මක අධ්‍යයනයක්

චම්පා වික්‍රමආරච්චි
ආචාර්ය දම්මි බණ්ඩාර

## පර්යේෂණ ගැටලුව

මෙම ස්ථානයේ ඇති අප්‍රකාශිත සෙල්ලිපිවල අන්තර්ගත ඓතිහාසික තොරතුරු මොනවා ද යන ගැටලු මූලිකව මෙම පර්යේෂණය දියත් කරන ලදී.

## පර්යේෂණ අරමුණු

ශ්‍රී ලාංකේය ඉතිහාසය හැදෑරීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය මෙන් ම සෙල්ලිපි මූලාශ්‍රය ද ඉවහල් කර ගත හැකි ය. මෙයින් මහාවංසය වැනි සාහිත්‍ය මූලාශ්‍රය ලියැවී ඇත්තේ අදාළ සිද්ධිවලට පසු කාලීනව ය. සෙල්ලිපි අදාළ සිදුවීමට සමකාලීනව ලියා ඇත. එනිසා ඒවාහි ඇති ඓතිහාසික තොරතුරු අතිශයෝක්තියෙන් තොර ය. එමෙන් ම ඒවායෙහි ගැබ් වී ඇති තොරතුරු ද නිවැරදි ය. මේ නිසා සත්‍ය වූත් නිවැරදි වූත් ඉතිහාසයක් ගොඩ නැගීම සඳහා සෙල්ලිපි සපයන දායකත්වය අතිමහත් ය. එවැනි වැදගත්කමක් හිමි සෙල්ලිපි ආශ්‍රයෙන් මෙම ස්ථානයේ මෙන් ම ඒ අවට පැවති ඓතිහාසික වටාපිටාව හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ විය.

එසේ ම මෙම සෙල්ලිපි මෙතෙක් ප්‍රකාශයට පත් වී නොමැති නිසා ඒවා කියවා ජනගත කිරීම ද මෙම පර්යේෂණයේ එක් අරමුණක් විය.

සෙල්ලිපි කාලයාගේ ඇවෑමෙන් පාරිසරික තත්ත්වයන් පදනම් කරගෙන ක්‍රමයෙන් විනාශයට පත් වේ. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා යෙදිය හැකි පිළියම් අවම වේ. එම නිසා මේ ලිපි කියවා ප්‍රකාශයට පත් කර එහි දත්ත සුරක්ෂිත කිරීම ද මෙම පර්යේෂණයේ අනු අරමුණකි.

## සාහිත්‍ය විමර්ශනය

මෙම ලිපි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේ සෙල්ලිපි සොයා පිටපත් කර පර්යේෂණය කරන අවස්ථාව වන විට ද මෙම සෙල්ලිපි කිසිවෙකුත් කියවා නොතිබුණි.

## ප්‍රවේශය

අම්පාර දිස්ත්‍රික්කයේ වෙහෙරගල ගම කේන්ද්‍රකර ගනිමින් වෙහෙරගල ආරණ්‍ය සේනාසනය පිහිටා තිබේ. වෙහෙරගල උතුරු බෑවුමේ කටාරම් කෙටූ ලෙනේ, පැරණි ගඩොල්, ගලෙහි කැපූ පියගැට පෙළක්, දාගැබ් ගොඩැල්ලක්, කේතුකාවාටයක්, සෙල්ලිපි ඇතුළු පුරාවිද්‍යාත්මක නටබුන් රැසක් දක්නට ලැබේ. මෙම භූමි පරිශ්‍රයෙන් පැරණි සෙල්ලිපි 11ක් ද දැනට සොයාගෙන ඇත. ඉන් එකක් ගිරි ලිපියකි. අනෙක් සියල්ල ලෙන් ලිපි වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මඟින් 2014දී අදියර දෙකක් යටතේ මෙම ලිපි පිටපත් කර ඇත.

ලෙන්වල විහිදීම හා මෙහි ඇති සෙල්ලිපිවලින් අතීතයේ මෙය සක්‍රීය ආගමික මධ්‍යස්ථානයක් ව පැවති බව මනාව පැහැදිලි වේ. ඒ අයුරින් ම මෙම භූමිය වර්තමානයේ දී ද ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලාගේ භාවනා මධ්‍යස්ථානයකි. වර්තමානයේ ද ජීවමාන ආගමික මධ්‍යස්ථානයක් ලෙස පැවතීම ද සෙල්ලිපි ආරක්ෂාවීම සඳහා එක් හේතුවක් වී ඇත.

ආරණ්‍ය සේනාසන භූමි පරිශ්‍රයෙන් හමු වන සෙල්ලිපි 4109 සිට 4111 දක්වා හා 4160 සිට 4166 දක්වා වූ අංක යටතේ ලියාපදිංචි කර ඇත. ඉහත සඳහන් කළ ආකාරයට ඉන් එකක් ගිරි ලිපියකි. අනෙක් සියල්ල ලෙන් ලිපි ය. මෙම ලිපි අතරින් ලියාපදිංචි අංක 4110 ලෙන් ලිපිය බෙහෙවින් දිරාපත් වී ඇත. එසේ ම ලියාපදිංචි අංක 4111 ගිරි ලිපිය මධ්‍යයේ සුළු හායනයක් දැකිය හැකි ය. අනෙක් ලිපි සියල්ල හොඳ තත්ත්වයේ පවතී.

## පිහිටීම හා ගමන් මාර්ගය

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උණුවතුර බුබුල ග්‍රාම නිලධාරි වසමට අයත් වෙහෙරගල ගම කේන්ද්‍ර කරගෙන වෙහෙරගල ආරණ්‍ය සේනාසනය පිහිටා තිබේ. අම්පාර මහඔය මාර්ගයේ මහඔය මංසන්ධිය තෙක් පැමිණ අරලගංවිල මාර්ගය ඔස්සේ කිලෝ මීටර් දෙකක් පමණ ගමන් කිරීමේ දී හමුවන මංසන්ධියෙන් දකුණට හැරී බෝගස හන්දිය තෙක් පැමිණ ඉන් ටික දුරක් ගමන් කිරීමෙන් වෙහෙරගල ආරණ්‍ය සේනාසනයට ප්‍රවේශ විය හැකි ය.

## ස්ථානීය ලෙන් ලිපි

ශ්‍රී ලංකාවට බුදු දහම දායාද වීමත් සමඟ ම එහි ආලෝකය අගනුවර වටා කේන්ද්‍රගත නො වී ශ්‍රී ලංකාවේ පරිධියෙහි පිහිටි මෙවැනි ප්‍රදේශ කරා ද විහිදුණ බව මෙම විහාරස්ථ ලෙන් ලිපිවලින් මනාව පසක් වේ. එසේ ම ලෙන්ලිපි, විහාරස්ථානයේ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව යුගය දක්වා ඇත කාලයකට ගමන් කරන බව ප්‍රකාශ කරන ප්‍රබල සාධකයකි.

වෙහෙරගල ආරණ්‍ය සේනාසන භූමියෙන් මේ වනවිට අප්‍රකාශිත ලෙන් ලිපි 10ක් හමු වී ඇත. මේ අතරින් ලියාපදිංචි අංක 4110 බෙහෙවින් දිරාපත් වූ ලිපියකි. එසේ ම 4109 ලිපියෙහි ද ලිපි දෙකක සාධක වේ. එහි අක්ෂර කිහිපයක් පමණක් අපහසුවෙන් හඳුනාගත හැකි ය. අනෙක් ලිපි සියල්ල හොඳ තත්ත්වයෙන් ආරක්ෂා වී තිබෙයි.

අතීතයේ දී මෙම ආගමික මධ්‍යස්ථානයේ වැඩ සිටි භික්ෂූන් වහන්සේලා උදෙසා ලෙන් සකස් කර පූජා කිරීමට භික්ෂූන් වහන්සේලා, බතවරුන්, ගමිකවරුන් හා සාමාන්‍ය ජනතාව යන සමාජයේ සෑම තරාතිරමක ම පුද්ගලයන් දායක වී ඇති බව මෙහි ඇති ලෙන් ලිපි සාක්ෂි දරයි.

බ්‍රාහ්මී සෙල්ලිපි සාමාන්‍යයෙන් ලියා ඇත්තේ වමේ සිට දකුණට ය. එක්තරා අවධියක දී බ්‍රාහ්මී අක්ෂර වමේ සිට දකුණට සහ දකුණේ සිට වමට යන දෙයාකාරයටම ලියන ලද බව බියුලර්ගේ අදහසක් විය. එහෙත් මේ පිළිබඳ ව විද්වතුන් අතර එකඟත්වයක් නො තිබිණි. එහෙත් ශ්‍රී ලංකාවෙන් ලැබෙන මුල් ම ලිපි අතර දකුණේ සිට වමට ලියූ ලිපි 32ක් ද පේළියක් දකුණේ සිට වමට සහ තවත් පේළියක් වමේ සිට දකුණට යන ආකාරයට ලියූ ලිපි 7 ද දැනට හමු වී ඇත (සිරිසෝම 1990: 7). මේවා බුස්ට්‍රොෆෙඩොන් (Boustrophedon) ක්‍රමයට ලියූ ලේඛනවලට උදාහරණ වශයෙන් දැක්විය හැකි බව පරණවිතාන මහතා සඳහන් කරයි (Paranavitana 1970: xxii). ඛරෝෂ්ටි ලේඛන මෙන් බ්‍රාහ්මී ලේඛන ද මුලින් ම දකුණේ සිට වමට ලියන්නට ඇතැයි දූවේගල ලිපියේ දිශානුක්‍රමය පිළිබඳ කරුණු දක්වන ඩී. සී. සර්කාස් ප්‍රකාශ කරයි (එම). එසේ ම මූල බ්‍රාහ්මී යුගයේ දී මෙම සාමාන්‍ය ක්‍රමය ඉක්මවා ලේඛනගත කළ ක්‍රමවේදයන් කිහිපයක් ම වේ (බණ්ඩාර 2008: 35). මෙම ස්ථානයේ ද සාමාන්‍ය ක්‍රමය ඉක්මවා යමින් රචනා කළ ලිපි දෙකක් වේ. ලියාපදිංචි අංක 4109 ලිපිය ලියා ඇත්තේ පහළ සිට ඉහළට කියවන ආකාරයට ය. එසේ ම ලියාපදිංචි අංක 4164 ලිපිය ලියා ඇත්තේ දකුණේ සිට වමට ය.

දකුණේ සිට වමට ලියූ සෙල්ලිපිවල එක් එක් අක්ෂර ද එම පිළිවෙළට ම ලියා ඇත. එහෙත් එයට විරුද්ධ ව යන අවස්ථා ද ඇති බව පරණවිතාන මහතා වැඩි දුරටත් සඳහන් කරයි (එම). එම ලිපි පිළිබඳ වැඩි විස්තරයක් මෙහි අන්තර්ගත නොවේ. නමුත් දකුණේ සිට වමට ලියූ සෙල්ලිපිවල ස්පර්ශ ලාංඡන අධ්‍යයනය කිරීමෙන් එම අවස්ථා හඳුනාගත හැකි ය.

මෙම ලිපිවලින් බහුතරයක අක්ෂර ද එම ආකාරයට ම (නොපිටට) සටහන් කර ඇත. වෙහෙරගල ආරණ්‍ය සේනාසනයේ ඇති දකුණේ සිට වමට ලියූ ලිපියෙහි සියලු අක්ෂර සටහන් කර ඇත්තේ එම ආකාරයට ම ය. රස්නකෑව (එම: නො.116), මුතුගල්ල (එම: නො.310), දීවෙල (එම: නො.61) වැනි දකුණේ සිට වමට ලියූ ලිපිවල අක්ෂර නොපිටට හා සාමාන්‍ය ක්‍රමය යන දෙයාකාරයට ම ලියා තිබේ. කොට්ටදැමූහෙළ දකුණේ සිට වමට ලියූ ලිපියෙහි අක්ෂර සටහන් කර ඇත්තේ නිවැරදි දිශාවට අනුව ය. අක්ෂර නොපිටට හා උඩු සහ යටි දිශාවන්ට සටහන් කළ ලිපි මිහින්තලයේ ලිපි (එම: නො. 6, 16) අතර වේ. අක්ෂරවල

දිශානතියෙහි බහුවිධතා දර්ශනය වුවත් ප්‍රස්තුත ලිපි 39 ම පෙළ කියවිය යුත්තේ දකුණේ සිට වමට ය. මෙය මෙම ලිපි ලිවීමේ දී අනුගමනය කළ රීතියක් බව පැහැදිලි වෙයි.

සාමාන්‍ය වශයෙන් පූර්ව බ්‍රාහ්මී ලිපි ක්‍රිස්තු පූර්ව තුන සිට ක්‍රිස්තු වර්ෂ පළමුවන (ඩයස් 1996: 6) සියවස් අතර යුගයට අයත් වේ. නමුත් පූර්ව බ්‍රාහ්මී ලිපිවල ඇති ඇතැම් අක්ෂර විද්‍යාත්මක සාධකවලින් ඒවා පූර්ව බ්‍රාහ්මී යුගයේ මුල් හෝ අපර කාලයට අයත් වේ ද යන අදහසක් ලබා ගත හැකි ය. අංක 4110 ලිපියෙන් මෙම ස්ථානයේ කාලය නිශ්චිත කරගත හැකි ය. පූර්ව බ්‍රාහ්මී "ග" අක්ෂරයේ මූලික රූප දෙකක් වේ. රේඛා දෙක ඉහළ දී කෝණාකාර ව එක්වීම එක් රූපයකි. අනෙක් රූපයේ දී රේඛා දෙක එක් වන්නේ වක්‍රාකාර ව ය. මෙම රූපාන්තර අතරින් වක්‍රාකාර "ග" අක්ෂර රූපය වඩා පැරණි බව පරණවිතාන මහතාගේ අදහසයි (Paranavitana 1970: xviii). මෙම ලිපියේ ද ඇත්තේ වටකුරු හැඩයේ "ග" අක්ෂර රූපයකි. එනම් අක්ෂර විද්‍යාත්මක සාධක අනුව මෙම ලිපිය පූර්ව බ්‍රාහ්මී යුගයේ මුල් කාලයට අයත් බව පැහැදිලි වේ.

මෙම ස්ථානයෙන් හමු වූ අප්‍රකාශිත සංස්කරණය නොකළ ලෙන් ලිපි නමය පිළිබඳ අදහසක් ලබා ගැනීම සඳහා ඒවාහි ලියාපදිංචි අංකය, පෙළ හා අර්ථය පිළිවෙළින් පහත දැක්වේ.

**ලෙන් ලිපිය අංක 1**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙම ලෙන් ලිපියෙහි ස්පර්ශ ලාංඡනය ලියාපදිංචි කර ඇත්තේ අංක 4160 යටතේ ය. සමස්ත වශයෙන් ලිපියේ දිග සෙන්ටි මීටර් 196 කි. පළල සෙන්ටි මීටර් 43 ක් වේ. ස්පර්ශ ලාංඡන පිටපත අනුව මෙය පේළි දෙකක ලිපියක් ය. ක්‍රිස්තු පූර්ව දෙවන හා ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවස් අතර කාලයට අයත් මූල බ්‍රාහ්මී අක්ෂරවලින් මෙම ලිපිය රචනා කර ඇත. අක්ෂර ප්‍රමාණයෙන් විශාල ය. සාමාන්‍යයෙන් අක්ෂරයක උස සෙන්ටි මීටර් 8 - 16 ත් අතර වේ. පළල සෙන්ටි මීටර් 9 - 12 ත් අතර ප්‍රමාණයකි.



**පෙළ**

1. බත නුගහ ලෙණෙ
2. අගත අනගත චතු දිශ ශගශ

**අර්ථය**

බත නුගගේ ලෙන සිව් දිශාවෙන් පැමිණි නො පැමිණි සංඝයාට (පූජා කරන ලදි).

## ලෙන් ලිපිය අංක 2

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙම ලෙන් ලිපියෙහි ස්පර්ශ ලාංඡනය ලියාපදිංචි කර ඇත්තේ අංක 4161 යටතේ ය. සමස්ත වශයෙන් ලිපියේ දිග සෙන්ටි මීටර් 294 කි. පළල සෙන්ටි මීටර් 56ක් වේ. ස්පර්ශ ලාංඡන පිටපත අනුව මෙම ලිපියෙහි ද පේළි දෙකක් වේ. මෙම ලිපිය රචනා වී ඇත්තේ මූල බ්‍රාහ්මී අක්ෂරවලිනි. අක්ෂර ප්‍රමාණයෙන් විශාල ය. සාමාන්‍යයෙන් අක්ෂරයක උස සෙන්ටි මීටර් 10 - 23ත් අතර වේ. පළල සෙන්ටි මීටර් 12-20 ත් අතර ප්‍රමාණයකි.



**පෙළ**

1. ගමික චුමි පුත ගමික අශලිය ලෙණෙ
2. අගත අනෙගත චතු දිශ ශගශ

**අර්ථය**

ගම්පති චුමිගේ පුත් ගම්පති අසලියගේ ලෙන සිව් දිශාවෙන් පැමිණි නො පැමිණි සංඝයාට.

## ලෙන් ලිපිය අංක 3

මෙම ලිපියෙහි ලියාපදිංචි අංක 4162 වේ. සමස්ත වශයෙන් ලිපියේ දිග සෙන්ටි මීටර් 265 කි. පළල සෙන්ටි මීටර් 28ක් වේ. මෙය තනි පෙළක ලිපියක් ය. මෙම ලිපිය කොටා ඇත්තේ ද මූල බ්‍රාහ්මී අක්ෂරවලිනි. අක්ෂර ප්‍රමාණයෙන් විශාල ය. සාමාන්‍යයෙන් අක්ෂරයක උස සෙන්ටි මීටර් 6 - 15 ත් අතර වේ. පළල සෙන්ටි මීටර් 9 - 10 ත් අතර ප්‍රමාණයකි.



**පෙළ**

අශයහ මහ ලෙණෙ මනපදශ(න) නම ලෙණෙ ශගශ

**අර්ථය**

අසයගේ මනපදසන නම් මහ ලෙන සංඝයාට

## ලෙන් ලිපිය අංක 4

මෙය ලෙන් ලිපියකි. මෙම ලෙන් ලිපියෙහි ස්පර්ශ ලාංඡනය ලියාපදිංචි කර ඇත්තේ අංක 4163 යටතේ ය. සමස්ත වශයෙන් ලිපියේ දිග සෙන්ටි මීටර් 158 කි. පළල සෙන්ටි මීටර් 25 ක් වේ. ස්පර්ශ ලාංඡන පිටපත අනුව මෙය තනි පෙළක ලිපියකි.

මෙම ලිපිය රචනා කර ඇත්තේ ක්‍රිස්තු පූර්ව දෙවන හා ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවස් අතර කාලයට අයත් මූල බ්‍රාහ්මී අක්ෂරයෙනි. සාමාන්‍යයෙන් අක්ෂරයක උස සෙන්ටි මීටර් 9 - 17ත් අතර වේ. පළල සෙන්ටි මීටර් 16 - 9 ත් අතර ප්‍රමාණයකි.



**පෙළ**

තිශ දත තෙරශ ලෙණෙ ශගශ

**අර්ථය**

තිස්ස දත්ත තෙරුන්ගේ ලෙන සංඝයාට

## ලෙන් ලිපිය අංක 5

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙම ලෙන් ලිපියට ලබා දී ඇති ලියාපදිංචි අංකය 4164 ය. සමස්ත වශයෙන් ලිපියේ දිග සෙන්ටි මීටර් 240 කි. පළල සෙන්ටි මීටර් 25ක් වේ. මෙය තනි පෙළක සීමිත අක්ෂර ප්‍රමාණයක් සහිත ලිපියක් වේ. සාමාන්‍යයෙන් බ්‍රාහ්මී සෙල්ලිපි ලියා ඇත්තේ වමේ සිට දකුණට. මෙම සම්මත ක්‍රමය ඉක්මවා යමින් මෙම ලිපිය රචනා කර ඇත. සාමාන්‍යයෙන් අක්ෂරයක උස සෙන්ටි මීටර් 10 - 14 ත් අතර වේ. පළල සෙන්ටි මීටර් 6 - 8 ත් අතර ප්‍රමාණයකි.



**පෙළ**

ශගශ ශදි තුව තගනඅ තගඅ ණෙලෙ ශකටගො

(ගොටකශ ලෙණෙ අගත අනගත චතු දිශ ශගශ)

**අර්ථය**

ගොටකගේ ලෙන සිව් දිශාවෙන් පැමිණි නො පැමිණි සංඝයාට.

## ලෙන් ලිපිය අංක 6

ලියාපදිංචි අංක 4165 වන ලෙන් ලිපියේ දිග සෙන්ටි මීටර් 208 කි. පළල සෙන්ටි මීටර් 25ක් වේ. සාමාන්‍යයෙන් අක්‍ෂරයක උස සෙන්ටි මීටර් 8 - 13 ත් අතර වේ. පළල සෙන්ටි මීටර් 6 - 11 ත් අතර ප්‍රමාණයකි.



**පෙළ**

(ග)පති වෙලුශ ලෙණෙ අගත අනගත චතු දිශ ශගශ

**අර්ථය**

ගෘහපති වෙලුගේ ලෙන සිව් දිශාවෙන් පැමිණි නොපැමිණි සංඝයාට.

## ලෙන් ලිපිය අංක 7

මෙම ලිපියේ ලියාපදිංචි අංකය 4166 වේ. ලිපියේ දිග සෙන්ටි මීටර් 224 කි. පළල සෙන්ටි මීටර් 28 ක් වේ. ක්‍රිස්තු පූර්ව දෙවන හා ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවස් අතර කාලයට අයත් මූල බ්‍රාහ්මී අක්‍ෂරවලින් මෙම ලිපිය රචනා කර ඇත. අක්‍ෂර ප්‍රමාණයෙන් විශාල ය. සාමාන්‍යයෙන් අක්‍ෂරයක උස සෙන්ටි මීටර් 9 -20 ත් අතර වේ. පළල සෙන්ටි මීටර් 15 - 10 ත් අතර ප්‍රමාණයකි.



**පෙළ**

බත ශුමහ ලෙණ මනපදශනෙ ශගශ

**අර්ථය**

පූජ්‍ය සුම්මගේ මනපදසන ලෙන සංඝාට.

**ලෙන් ලිපිය අංක 8**

වෙහෙරගල ආරණ්‍ය සේනාසනයේ ඇති විශාලතම ලෙන් ඇතුළත බිත්තියේ මෙම ලිපිය ලියා ඇත.

මෙය බෙහෙවින් දිරාපත් වූ ලිපියකි. අක්ෂර කිහිපයක් පමණක් අපහසුවෙන් හඳුනා ගත හැකි ය. ලිපිය පිළිබඳ සියලු විස්තර හා නිගමනවලට එළැඹිය හැක්කේ මෙම අක්ෂර කිහිපය මත පිහිටා ය. අක්ෂර අනුව එය ලිපියේ අවසානය විය යුතු ය. අනෙක් අක්ෂර කිසිසේත් ම හඳුනා ගත නො හැකි ය.

කියවාගත හැකි අක්ෂර අනුව ලිපියේ අන්තර්ගතව ඇත්තේ සංඝයාට කළ පූජාවකි. එය ලෙන් පූජාවක් විය හැකි ය. මෙම යුගයේ ඇති ලිපි බොහෝමයක සඳහන් ව ඇත්තේ ලෙන් පූජාවන් පිළිබඳ ව ය. එසේ ම මෙය ලෙන් ලිපියකි. මේවා ඉහත සඳහන් අනුමානය සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් නිදර්ශක වේ. නමුත් ලෙන් ප්‍රදානය සිදු කළ පුද්ගලයන් හෝ වෙනත් කිසිදු තොරතුරක් අනාවරණය කර ගත නො හැකි ය.



**පෙළ**

----------------------- ශගශ දිනි

**අර්ථය**

---------------- (මෙම ලෙන) සංඝයාට පූජා කරන ලදි.

DEPARTMENT OF ARCHAEOLOGY SRI LANKA ශ්‍රී ලංකා

**ලෙන් ලිපි අංක 9**

සමස්ත වශයෙන් ලිපියේ දිග සෙන්ටි මීටර් 110 කි. පළල සෙන්ටි මීටර් 90 ක් වේ. ස්පර්ශ ලාංඡන පිටපත අනුව මෙය පේළි තුනක ලිපියක් ය.

ක්‍රිස්තු පූර්ව දෙවන හා ක්‍රිස්තු වර්ෂ පළමු වන සියවස් අතර කාලයට අයත් මූල බ්‍රාහ්මී අක්ෂරවලින් මෙම ලිපිය රචනා කර ඇත. අක්ෂර ප්‍රමාණයෙන් විශාල ය. සාමාන්‍යයෙන් අක්ෂරයක උස සෙන්ටි මීටර් 10-19 ත් අතර වේ. පළල සෙන්ටි මීටර් 8-9 ත් අතර ප්‍රමාණයකි.

| මූලික රූප | සංස්කරණය |
|---|---|
|  |  |



**පෙළ**

i 1. ශ ග ශ

2. උතර ශමණය ලෙණෙ

ii 3. ණිලෙ

**අර්ථය**

i උත්තර භික්‍ෂුවගේ ලෙන සංඝයාට (පූජා කරන ලදි)

ii ලෙණ

## වෙහෙරගල ආරණ්‍ය සේනාසන ගිරි ලිපිය

වෙහෙරගල ආරණ්‍ය සේනාසන භූමියේ හමු වන එක ම ගිරි ලිපිය මෙය යි. ලිපියේ මධ්‍යයේ සැලකිය යුතු හායන තත්ත්වයක් වේ. නමුත් ලිපිය කියවා අර්ථගැන්වීමට එය බාධාවක් නො වේ. අනෙකුත් අක්‍ෂර ඉතා හොඳ තත්ත්වයෙන් ආරක්‍ෂිත ය.

මෙම ලිපියේ පසේ බුදුන් වහන්සේ නමක් පිළිබඳ ව අන්තර්ගත වේ. ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු වර්ෂ 2-4 කාලයට අයත් ගිරි ලිපි දෙකක පසේ බුදුවරුන් පිළිබඳ ව සඳහන් වේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිග්ගල ගිරි ලිපිය (Paranavitana 2001: 291) හා පර්යේෂණයට ලක් කෙරෙන මෙම වෙහෙරගල ආරණ්‍ය සේනාසන ගිරි ලිපිය එම සෙල්ලිපි දෙක යි. දිග්ගල ලිපියෙන් කියැවෙන්නේ එතැන දසවෙනි පසේ බුදුන්ගේ ථූපය තිබූ බව ය. දෙවන සියවසේ පසේ බුදුවරයෙකු විසූ බව කිසිදු ග්‍රන්ථයක සඳහන් නො වන නිසා එකල ආගමික විශ්වාසයන් ගැන සෙවීමේ දී මේ සෙල්ලිපිය වැදගත් වේ (හෙට්ටිආරච්චි 1990: 72). කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිග්ගල ගිරි ලිපිය මේ වන විට විනාශ වී හමාර ය. තවමත් සුරක්‍ෂිත ව ඇත්තේ මෙතෙක් අප්‍රකාශිත ව ඇති මෙම ලිපිය පමණි. එනිසා තනි පෙළක කෙටි ලිපියක් වුව ද එය මෙම ස්ථානයට පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකේය ශිලාලේඛන ඉතිහාසයට ම සුවිශේෂී ලිපියකි.

සාමාන්‍යයෙන් මෙම ලිපියේ දිග සෙන්ටි මීටර් 240කි. පළල සෙන්ටි මීටර් 30කි. එසේ ම මෙහි අක්‍ෂරයක සාමාන්‍ය උස සෙන්ටි මීටර් 7-20 අතර වේ. පළල සෙන්ටි මීටර් 10-4 1/2 පමණ ය. අක්‍ෂර විද්‍යානුකූල ව බැලීමේ දී මෙම ලිපිය ක්‍රිස්තු වර්ෂ දෙක-හතර සියවස් අතර කාලයට අයත් වේ.



**පෙළ**

දස මිනි පචෙක බුද තුබෙ පගිය උවසික කරිතෙහි (ස්පර්ශ ලාංඡන 2. 10)

**අර්ථය**

දසමිනි පසේ බුදුරජාණන් වහන්සේගේ ස්තූපය පගිය උපාසිකාව විසින් කරවන ලදි.

**විවරණ**

**දස**

දස යන වචනයෙන් සංඛ්‍යාත්මක අදහසක් ගම්‍ය වේ. බ්‍රාහ්මී සෙල්ලිපිවල යෙදුණ "දස" යන වචනය සකස් වී ඇත්තේ පාලි භාෂාවේ "දස" (බුද්ධදත්ත 1998: 234) හා සංස්කෘත භාෂාවේ "දශම්" (අලගියවන්න 2004: 366) යන වචනවලිනි. "දස" යන වචනය මූල බ්‍රාහ්මී සෙල්ලිපිවල සිට ම විවිධ සංඛ්‍යාවන් හැඳින්වීම සඳහා භාවිත කර තිබේ.

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ මොට්ටයාකල්ලු ලෙන් ලිපියේ සහෝදරයන් දස දෙනෙකු පිළිබඳ ව සඳහන් කිරීමට "දස බතික" යනුවෙන් යෙදා තිබෙයි (Paranavitana 1970: 37). එසේ ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිග්ගල ලිපියේ පසේ බුදුවරුන් දස දෙනෙකු පිළිබඳ ව ප්‍රකාශ කිරීමට ''දසවෙනි" යනුවෙන් භාවිත කර ඇත (Paranavitana 2001: 291). වේරගල ගිරි ලිපියේ ''දස කහවණ" යනුවෙන් කහවණු දහයක් පිළිබඳ ව කියැවේ (එම: 242). නීලපනික්කන්කුළම් ගිරිලිපියේ ද "දස කොටසහි" යනුවෙන් කොටස් දහයක් පිළිබඳ ව සඳහන් ය (එම: 257).

මෙලෙස ඇතැම් සෙල්ලිපිවල සචේතනික හා අචේතනික නාමපදවල සංඛ්‍යා දැක්වීම සඳහා "දස" යන සංඛ්‍යාත්මක නාම විශේෂණය යොදා ගෙන ඇත.

**පචෙක බුද**

මෙම සෙල්ලිපියෙහි යෙදුන පචෙක බුද යන වචනය සකස් වී ඇත්තේ සංස්කෘත භාෂාවේ ප්‍රත්‍යෙක බුද්ධ හා පාලි භාෂාවේ පච්චේක බුද්ද (බුද්ධදත්ත 1998: 286) යන වචන නිරුත්පන්න වීමෙනි. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි පසේ බුදුරජාණන් වහන්සේ හඳුන්වා දී ඇත්තේ පච්චේකමුනි යනුවෙනි (සෝරත හිමි 1956: 499).

බෞද්ධ දර්ශනය අනුව පසේ බුදු යනු තුන්තරා බෝධියෙන් එකකි. සම්මා සම්බුද්ධ සහ මහ රහත් යනු ඉතිරි බෝධි දෙක ය. ඉන්දීය බෞද්ධ සම්ප්‍රදාය තුළ පසේ බුදුවරුන් බුද්ධත්වය සාක්ෂාත් කරගත් යානය ප්‍රත්‍යෙක බුද්ධයානය ලෙස සඳහන් වේ (Kloppenborg 2006: 1 - 3).

පසේ බුදුවරුන් පිළිබඳ අධ්‍යයනය සඳහා තොරතුරු ලැබෙන්නේ අල්ප වශයෙනි. විනය පිටකයෙහි පසේ බුදුවරුන් පිළිබඳ ව ඍජු ව සඳහන් නොවෙයි. නමුත් සූත්‍ර පිටකයේ විශේෂයෙන් ඛුද්ධක නිකායේ පසේ බුදුවරුන් පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ (Kloppenborg 2006: 1 – 3).

මිහිඳු මහතෙරුන් විසින් සිංහල භාෂාවෙන් කරන ලද ශුද්ධ වූ සිංහලාර්ථ අට්ඨකතා මාගධී නිරුක්තියට පෙරළීම සඳහා බුද්ධඝෝෂ හිමියන් මහානාම රජ දවස ලංකාවට පැමිණ මහා විහාර දූරසංඛකර ග්‍රන්ථාකර පිරිවෙන වෙසෙමින් සියලු සිංහල අටුවා කතා මාගධී නිරුක්තියෙන් පැවැත්වූ බව මහාවංසය ප්‍රකාශ කරයි (මහාවංසය 1996: පරි.37, ගාථා.223-248).

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස ආරම්භයේ සිට අවම වශයෙන් ක්‍රිස්තු වර්ෂ දෙවන සියවස දක්වා ශ්‍රී ලංකාව තුළ සිංහලයෙන් ලිවීම ආරම්භ වූ අටුවා පොත් පසුකාලීනව බුද්ධඝෝෂ හිමියන් විසින් පාලියට පරිවර්තනය කරන ලදී. බහුලව පසේ බුදුවරුන් පිළිබඳ ව සඳහන් වන්නේ මෙම අටුවා පොත්වල බව Rai Kloppenborg සඳහන් කරයි (Kloppenborg 2006: 1 - 3).

සූත්‍ර පිටකයේ මජ්ඣිම නිකායේ ඉසිගිලි සූත්‍රයෙහි පසේ බුදුවරුන් 500ක් ඉසිගිරි පර්වතයේ බොහෝ කාලයක් වැඩ වාසය කළ බව බුදුන් වහන්සේ දේශනා කර ඇත. අරිට්ඨ, උපරිට්ඨ, තගරසිඛී, යසස්සි, සුදස්සන, පියදස්සි, ගන්ධාර, පිණ්ඩෝල ආදි ලෙස මෙම බුදුවරු 500 හි නම් එහි සඳහන් වෙයි (සිංහල මජ්ඣිම නිකාය 2010: 669-671).

මෙම ලිපිය අයත් කාලයට අයත් කුරුණෑගල දිග්ගල ගිරි ලිපියේ '' දසවන පචෙක බුදහ තුබෙ'' යනුවෙන් පසේ බුදු කෙනෙකු පිළිබඳ ව සඳහන් වෙයි (Paranavitana 2001: 291). දිග්ගල ලිපිය පිළිබඳ විවරණයක් සපයන පරණවිතාන සඳහන් කරන්නේ වර්තමානයට වඩා වෙනස් බෞද්ධාගමික සංකල්ප පිළිබඳ විශ්වාස පැවති බවට මෙම ලිපියෙන් සාක්ෂි සපයන බවයි (එම).

සෙල්ලිපිවල යෙදෙන තුබ, තුබෙ යන වචන සකස් වී ඇත්තේ සංස්කෘත භාෂාවේ ස්තූප හා පාලි භාෂාවේ (බුද්ධදත්ත 1998: 230) ථූප යන වචන නිරුත්පන්න වීමෙනි. ශ්‍රී ලංකාවේ ප්‍රථම ඓතිහාසික ස්තූපය වන්නේ ථූපාරාමයයි (මහාවංසය 1996: පරි.17, ගාථා. 54-64). බුදු දහමේ ආලෝකය ශ්‍රී ලංකාව පුරා විහිදීමට සමගාමීව ස්තූප නිර්මාණය ද ව්‍යාප්ත වූ බව රිටිගල වේවැල්තැන්න ලෙන් ලිපිය, රජගල මිහිඳු ලිපිය, බඹරකන්ද, සැස්සේරුව සහ බිල්ලෑවේගල (Paranavitana 1970: 21, 35, 63, 79, 88) ආදි බොහොමයක් මූල බ්‍රාහ්මී ලිපිවල ස්තූප පිළිබඳ සඳහන් වීමෙන් පැහැදිලි වෙයි.

ස්තූප නිර්මාණය සඳහා බරපැන දැරූ අවස්ථා, ස්තූප අංග පිළිබඳ ව මෙන් ම ස්තූප නාමකරණයට ලක් කළ අවස්ථා ආදී තොරතුරු ද මේ සෙල්ලිපිවල අන්තර්ගත වේ.

**උවසික**

සෙල්ලිපිවල යෙදෙන උපසික යන වචනය සකස් වී ඇත්තේ සංස්කෘත, පාලි භාෂාවල උපාසිකා හා පැරණි සිංහලයේ උවැසි යන වචන නිරුත්පන්න වීමෙනි (Paranavitana 2001: 328; බුද්ධදත්ත හිමි 1998: 120) මූල බ්‍රාහ්මී සෙල්ලිපිවල උපසික යන වචනයේ භාවිතය සුලබ ය (Paranavitana 1970: cxvii-cxviii). සෙල්ලිපිවල රාජකීය කාන්තාවන් පරුමකවරුන්ගේ භාර්යාවන් මෙන් ම සාමාන්‍ය ජන සමාජයේ වෙසෙන කාන්තාවන් ද උපාසිකා යනුවෙන් තමන් ව හඳුන්වා ගෙන ඇත. ඒ අනුව සමාජය නියෝජනය කළ සෑම තරාතිරමක ම කාන්තාවන් උපාසිකාවන් වශයෙන් තමන් ව හඳුන්වා ගෙන ඇති බව පැහැදිලි වේ (එම).

අපර බ්‍රාහ්මී යුගයේ සෙල්ලිපිවල උපසික යන වචනයේ භාවිතය දුලබ ය. දැනට ප්‍රකාශයට පත් ව ඇති අපර බ්‍රාහ්මී ලිපි අතරින් එම වචනය භාවිත කර ඇත්තේ සෙල්ලිපි තුනක පමණි. එනම් ගනේවිහාර ගල් ආසන ලිපියේ උපාසිකාවක පිළිබඳ ව සඳහන් ය (Paranavitana 2001: 286). සිතුල්පව්ව ගිරි ලිපියක " උපසිය සමත" (උපාසිකා සමත) පිළිබඳ ව ද (එම: 261-262) ද රුවන්වැලි දාගැබ පුවරු ලිපියේ "උපාසික චිත" (උපාසිකා චිත්තා) (Paranavitana 1983: 110-111) පිළිබඳ ව ද කියැවේ. මුල් කාලයේ බහුලව භාවිත වූ උපාසිකා යන වචනය මෙම යුගය වන විට දුලබ ලෙස භාවිත කිරීම නිසා ඇතැම් විට කාන්තාවන් හැඳින්වීම සඳහා සමකාලීන සමාජයේ වෙනත් අභිධාන භාවිත වන්නට ඇතැයි ද අනුමාන කළ හැකිය.

**කරිතහි**

සෙල්ලිපිවල යෙදෙන කරිත, කරිතෙ, කරිතහ යන වචනය සකස් වී ඇත්තේ සංස්කෘත හා පාලි භාෂාවේ කාරිත යන වචන නිරුත්පන්න වීමෙනි (Paranavitana 1970: 105). මෙම වචනයෙන් කරවන ලදි යන අර්ථය ගම්‍ය වේ. මූල බ්‍රාහ්මී සෙල්ලිපිවල සිට පසුකාලීන සෙල්ලිපි දක්වා ම ''කරිත" යන වචනය හෝ එහි විචල්‍ය රූපයන් විවිධ අවස්ථා නියෝජනය කරමින් භාවිත වී ඇත.

**නිගමනය**

බුදු දහමේ ආලෝකය ලැබී ටික කලකින් ම අනුරාධපුරය ප්‍රධාන නගරයට පමණක් සීමා නොවී ඇත ප්‍රදේශ කරාද එහි බලපෑම ලැබුණ බව මෙහි ඇති ලෙන් ලිපි කියා පායි. එසේ ම එම ලිපි තුළින් එකල සමාජ තත්ත්වය පිළිබඳ අදහසක් ලබාගත හැකි වේ. සාමාන්‍ය ජනතාව පමණක් නොව බන වැනි සමාජ තත්ත්වයන් හිමිකරගත් පිරිසක් ද ලෙන් ලිපි පූජා කිරීමට දායක වී ඇත.

එසේ ම මෙහි ඇති ගිරි ලිපිය මෙම ස්ථානයට පමණක් නොව ශ්‍රී ලාංකේය ඉතිහාසයට ම වැදගත් කමක් සහිත ඓතිහාසික තොරතුරුක් ගැබ් ව ඇත. එම නිසා මෙම ලිපි මගින් මෙම ස්ථානයේ ඓතිහාසිකත්වය මෙන් ම ලාකේය ආගමික ඉතිහාසය තවදුරටත් පුළුල් පර්යේෂණ සිදු කළ යුතු බවට යම් ඉගියක් ද ලබා

## ආශ්‍රිත ග්‍රන්ථ


අභිලේඛන හා නාණක විද්‍යා අංශය, **ශිලා ලිපි ලියාපදිංචි කිරීමේ ලේඛනය**. කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ඩයස්, මාලිනී. (1996). **ලක්දිව සෙල්ලිපිවලින් හෙළිවන සිංහල භාෂාවේ ප්‍රත්‍යාර්ථ නාමයන්ගේ විකාශනය.** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

බණ්ඩාර, නිලන්ති. (2008) ***පුරාණ ශ්‍රී ලංකාවේ සමාජය* (බ්‍රාහ්මී ශිලාලේඛන ඇසුරින්).** කඩවත : කඩුල්ල ප්‍රකාශන.

බුද්ධත්ත නාහිමි, පොල්වත්තේ, (1998). **පාලි සිංහල වදන් අකාරාදිය.** සිස්ටලැම්ටික් ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

විජේසේකර, නන්දදේව (සංස්.). (1990). **අභිලේඛන, දෙවන වෙළුම, ක්‍රිස්තු පූර්ව 3 සියවස සිට ක්‍රිස්තු වර්ෂ 65 දක්වා ශ්‍රී ලංකාවේ පැරණි බ්‍රාහ්මී සෙල්ලිපි.** කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත (සංස් 2). (1996). **මහාවංසය**. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Kloppenborg, R. (2006). (e-edition) *The paccekabudda*: A Buddhist Ascetic, A Study of the Concept of the Paccekabuddha in pali Canonical and Commentarial Literature, Kandy: The Wheel Publication

Paranavitana, S. (1970). *Inscriptions of Ceylon. Vol. I, Early Brahmi Inscriptions*. Colombo: Department of Archaeology.

Paranavitana, S. (1983). *Inscriptions of Ceylon. Vol. II, Part I, Late Brahmi Inscriptions*, Colombo: Department of Archaeology.

Paranavitana, S. (2001). *Inscriptions of Ceylon. Vol. II, Part II, Late Brahmi Inscriptions*. Colombo: Department of Archaeology.


# පුරාවිද්‍යා උරුමයන් සංරක්ෂණය උදෙසා නැනෝ තාක්ෂණයෙහි උපයෝගීතාව

**පී.ඩබ්ලිව්.සී.කේ.රන්තිලිණි**

## නැනෝ තාක්ෂණය

පෙරළියක් සිදුකළ හැකි වර්තමාන ලෝකයේ වඩාත් කතාබහට ලක්වන විෂය පථයක් ලෙස නැනෝ තාක්ෂණය හඳුන්වා දිය හැකි ය. නැනෝ යන පදය ව්‍යුත්පන්න වී ඇත්තේ "Dwarf" නම් වචනයෙනි. මෙහි අර්ථය අඟුටුමිටි යන්නයි (Waked,2011).

ලෝකයේ ප්‍රගමනය උදෙසා නැනෝ තාක්ෂණය හඳුන්වා දුන් මහාචාර්ය රිචර්ඩ් ෆෙයිමන් (Richard Feynman:1918-1988) නැනෝ තාක්ෂණයේ පියා ලෙස හැඳින්වේ (www.nano.gov/nanotech-101). නැනෝමීටරයක් යනු මීටරයකින් බිලියනයකින් පංගුවකි. එනම් $10^{-9}$ m වේ. සරලව ගතහොත් සාමන්‍ය මිනිස් හිසකෙස් ගසක ප්‍රමාණයට වඩා නැනෝ පරිමාණයේ තන්තුවක් 80,000 ගුණයකින් කුඩා ය. (ඡායාරූපය-01) නැනෝ-පදාර්ථ යනුවෙන් හඳුන්වනු ලබන්නේ 1nm-100nm පරිමාණයේ පදාර්ථයන් වේ. (Waked,2011), (Whatmore,2006) එනම්, ඕනෑම වස්තුවක දිග, පළල, උසයන පරාමිතීන්ගෙන් එකක් හෝ නැනෝ තාක්ෂණය නිර්වචනය වන 1nm-100nm අතර පරිමාණයේ ඇත්නම් එය නැනෝ පදාර්ථයක් ලෙස සලකනු ලැබේ. නැනෝ තාක්ෂණයේ විශේෂත්වය වනුයේ අණු සහ පරමාණුවල හැසිරීම් පාලනයට හැකිවීමයි. සාමන්‍ය ප්‍රමාණයේ පදාර්ථවල භෞතික සහ රසායනික ගුණ සැසඳීමේ දී නැනෝ පදාර්ථවල එම ගුණයන් බොහෝ සෙයින් වෙනස් වේ. නිදසුනක් ලෙස ඒවායේ වර්ණය, ශක්තිය, සන්නායකතාව සහ ප්‍රතික්‍රියාශීලීතාවය වැනි ලක්ෂණ වෙනස් ය. උදාහරණ ලෙස කාබන් නැනෝ ටියුබ්, වානේවලට වඩා සිය ගුණයක් ශක්තිමත්වන අතර හය ගුණයක් සැහැල්ලු වේ. නැනෝ පදාර්ථවලට ඉහළ රසායනික ප්‍රතික්‍රියා හැකියාවක්, ඉහළ උත්ප්‍රේරක ක්‍රියාකාරීත්ව හැකියාවක්, ඉහළ දෘඩතාවයක් සහ ඉහළ වායු අවශෝෂණය කිරීමේ හැකියාවත් වැනි ලක්ෂණත් පවතී (Whatmore,2006) .




***ඡායාරූපය-01***
*www.researchgate.net* ගෙන් උපුටා ගන්නා ලදී.

## නැනෝ තාක්ෂණයේ යෙදවුම්

වර්තමානය වන විට ලෝකයේ සියලුම ක්ෂේත්‍රයන්හි විප්ලවීය වෙනස්කම් සිදු කිරීමට නැනෝ තාක්ෂණය යොදා ගැනේ.

**ඇඟලුම් ක්ෂේත්‍රය:** ඉහළ ආතන්‍ය ශක්තිය, අද්විතීය මතුපිට ව්‍යුවහය, කල්පැවැත්ම, ජල විකර්ෂණ හැකියාව, ප්‍රතික්ෂුද්‍ර ජීවී ගුණාංග, ගින්නට ප්‍රතිරෝධීබව, මෘදු සහ සැහැල්ලු බව ආදි ගුණාංග ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන උදෙසා නැනෝ පදාර්ථ භාවිතයට හේතු සාධක සැපයේ. නැනෝ තාක්ෂණය ආශ්‍රිතව නිපදවන ලද රෙදි ආදියේ කුණු- දූවිලි සේදීම අවශ්‍ය නොවන බව පර්යේෂකයන් සාර්ථක ව අත්හදා බලා තහවුරු කර ඇත (www.nanowerk.com).

**සෞඛ්‍ය ක්ෂේත්‍රය:** සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉතාමත් වැදගත් කාර්යයන් උදෙසා නැනෝ තාක්ෂණය භාවිත කෙරේ. විද්‍යාඥයින් විසින් පිළිකා සුව කිරීම සඳහා අදාළ ඖෂධ එම ස්ථාන වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා නැනෝ අංශු භාවිත කරනු ලැබේ (Sutradhar & Amin,2014). බහු ක්‍රියාකාරී නැනෝ අංශු පහසුවෙන්ම මෙම ඖෂධ ඉලක්කගත ස්ථානය වෙත රැගෙන යාම සිදු කෙරේ. මීට අමතරව ගෝලීය කෝවිඩ් -19 වසංගත තත්වය හමුවේ ආරක්ෂිත උපක්‍රම ලෙස නැනෝ මුඛ ආවරණ නැනෝ විෂබීජ නාශක ලොව පුරා ප්‍රචලිත විය (www.slintec.lk). තවද නවීනතම තාක්ෂණික ක්‍රමවේදයක් ලෙස නැනෝබොට් (Nano-Bot) තැනීම, එනම් ශල්‍ය වෛද්‍යවරුන් ලෙස ක්‍රියාකරන ක්ෂුද්‍ර ප්‍රමාණයේ රොබෝවරුන් තැනීම පිළිබඳ විද්‍යාඥයන්ගේ අවධානය යොමු වී පවතී. මෙම ක්‍රමවේදය අභ්‍යන්තර ව්‍යුහයන් අලුත්වැඩියා කිරීම හා ප්‍රතිස්ථාපනයට යොදා ගත හැකි ය(Moore,2021). ඉන්දියාවේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනය (*Institute* of Advanced Study in Science and Technology) මගින් pH අගයට ප්‍රතිචාර දක්වන ස්මාට් වෙළුම් පටියක් නිපදවා ඇත. එමගින් තුවාලයේ pH අගය අවශ්‍ය පරිදි පවත්වාගෙන යාම සිදු කෙරේ Deb *et al* .,2020). මීට අමතරව නැනෝ සංවේදක මගින් රෝග නිර්ණය කිරීම් ආදිය කල්තියා සිදුකරනු ලැබේ (Saylan *et al*.,2022).

**කෘෂිකාර්මික ක්ෂේත්‍රය;** නැනෝ තාක්ෂණය මගින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී දැවැන්ත කාර්යභාරයක් සිදු කෙරේ. නැනෝ පොහොර, නැනෝ පළිබෝධනාශක ආදිය ලෝකය පුරා ප්‍රචලිතව ඇත. නැනෝ ද්‍රව්‍ය භාවිතය මගින් පැතිරෙන රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම, පොහොර යෙදීමේ දී පෝෂක අලාභය/නාස්තිය අවම කිරීම, පළිබෝධ සහ පෝෂකවල මනා කළමනාකරණය තුළින් අස්වැන්න වැඩි කිරීම සිදු වේ (Prasad *et al*.,2017). මීට අමතරව නැනෝ සංවේදක භව-බෝගවලට වැළඳිය හැකි රෝග කල්තියා හඳුනා ගැනීමට භාවිත කරනු ලැබේ. තව ද ආහාර පිළිබඳ සැලකීමේ දී ආහාරවල ගුණාත්මකභාවය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා නැනෝ ඇසුරුම් භාවිත කිරීම සිදු කරනු ලැබේ

(Ashfaq *et al*.,2022). මීට අමතරව ඉදි කිරීම් හා නිෂ්පාදන ක්ෂේත්‍රයේ ද ඉතා වැදගත් අමුද්‍රව්‍ය ලෙස නැනෝ තාක්ෂණය මගින් නිපදවූ ද්‍රව්‍යයන් භාවිත කෙරේ (Mohajerani *et al*.,2019).

ඉහත සඳහන් උදාහරණ සලකා බැලීමේ දී ක්ෂේත්‍ර ගණනාවක් සඳහා නැනෝ තාක්ෂණය භාවිතය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය මේ ආකාරයට ක්ෂේත්‍ර ගණනාවක භාවිත කරන නැනෝ තාක්ෂණය පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ දී ද වර්තමානය වන විට ලොව දියුණු රටවල් විසින් භාවිත කිරීම සිදු කරනු ලැබේ.

**පුරාවිද්‍යා උරුමයන් සංරක්ෂණය උදෙසා නැනෝ තාක්ෂණය**

නවතම ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයේ නිර්වචනය අනුව පුරාවිද්‍යාව යනු භූමියේ ඇති ගොඩනැගිලි සහ වස්තූන්ගේ කොටස් පරීක්ෂා කිරීමෙන් අතීත සංස්කෘතීන් හා ඉතිහාස කාල පරිච්ඡේදයන් පිළිබඳ නිර්ණය කිරීමය (www.oxfordlearnersdictionaries.com). ශ්‍රී ලංකාවේ 1940 පුරාවිද්‍යා ආඥා පනතට අනුව 1815 මාර්තු දෙවන දා එනම් උඩරට ගිවිසුම අත්සන් තැබූ දිනට පෙර නිර්මාණය කරන ලද බවට සැලකෙන කිසියම් ගොඩනැගිල්ලක්, යම් ආකාරයකින් රැගෙන යා ඇති වස්තුවක් හෝ සංස්කෘතික අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කොට ප්‍රකාශ කරන ලද වසර සියයකට වඩා පැරණි ස්මාරකයක් පුරාවස්තුවක් ලෙස හැඳින් වේ (www.bbc.com/sinhala/sri-lanka-46791918). පසුගිය වසර කීපය පුරාවට ම පුරාවස්තු ස්මාරක ආදිය ඒවායේ ව්‍යුහාත්මක අඛණ්ඩතාවයට අඩු වැඩි වශයෙන් බලපාන ලෙස ජීව විද්‍යාත්මකව, රසායනිකව හෝ භෞතික වශයෙන් නිරන්තරයෙන් හායනය වීමේ තර්ජනයට ලක්ව ඇති බැවින් මෙම සංස්කෘතික උරුමයන් සුරැකීම ගෝලීය වශයෙන් වැදගත් අවශ්‍යතාවක් බවට පත් වී තිබේ. මෙම අතීත සංස්කෘතික උරුමයන් ගවේෂණය කර හඳුනා ගෙන එම උරුමයන් සංරක්ෂණය උදෙසා ගන්නා ක්‍රියාමාර්ග සඳහා නැනෝ තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයට ගැනීම සිදු කළ හැකි ය. ශෛලමය, දාරුමය, තන්තුමය මාධ්‍යන්ගෙන් නිර්මාණය වූ පුරාවස්තු මෙන්ම, පැරණි ස්මාරක හා ගෘහනිර්මාණ ශිල්පයේ ලෝක සංස්කෘතික උරුමයන් සංරක්ෂණය උදෙසා නැනෝ තාක්ෂණය භාවිත කිරීම පිළිබඳ සමාලෝචනයක් සිදු කිරීමට වර්තමාන අධ්‍යනයේ අපේක්ෂාවයි.

සාමාන්‍යයෙන් ඕනෑ ම සංරක්ෂණ ප්‍රතිකාරයක් සඳහා ජාත්‍යන්තර ලෙස ස්ථාපිත මූලධර්ම අනුගමනය කළ යුතු ය. සංරක්ෂණය සඳහා භාවිත කරන ප්‍රතිකර්මය වස්තුවේ අඛණ්ඩතාව සහ මූලික ස්වරූපය වෙනස් නොකළ යුතු ය. භාවිත කරන ප්‍රතිකාරය දිගු කාලයක් ස්ථායීව පැවතිය යුතු ය (Ion *et al*.,2018). පුරාවස්තු සංරක්ෂණයේ දී පුරාවස්තුව නිර්මිත ද්‍රව්‍යයේ ගුණාංග, සංරක්ෂණ තත්ත්වයන්, හායනය වීමේ යාන්ත්‍රණය, පාරිසරික සාධක ආදිය සලකා බලා නිවැරදි සංරක්ෂණ ප්‍රතිකර්මය උදෙසා සුදුසු ද්‍රව්‍ය හා ක්‍රියාපටිපාටිය තෝරා ගැනීම වැදගත් වෙයි. එහි දී අනුරූපීතාව, ජලවාෂ්ප නිසාවන බලපෑම, විනිවිද

යාමේ හැකියාව, කල් පැවැත්ම, ජීවවිද්‍යාත්මක ප්‍රතිරෝධය, භාවිත ක්‍රමවේදයේ සෞඛ්‍ය ගැටලු ආදිය පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

## ශෛලමය පුරා වස්තු සංරක්ෂණයේ දී නැනෝ තාක්ෂණයෙහි භාවිතය

පුරාවිද්‍යාත්මක උරුමයන් පිළිබඳ සැලකීමේ දී ශෛලමය පුරාවිද්‍යාත්මක උරුමයන් ලොව පුරා ඉතාමත් සුලබ ය. මෙම ශෛලමය පුරාවස්තුන් හායනය උදෙසා භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක සාධක රැසක් බලපානු ලැබේ. සංස්කෘතික උරුම සංරක්ෂණය සඳහා නැනෝ තාක්ෂණය භාවිතයට ගැනීමේ දී ශෛලමය උපස්තරයට බෙහෙවින් අනුරූපවන නිෂ්පාදන සැලසුම් කෙරේ. මෙම නැනෝ අංශු ප්‍රමාණයෙන් ඉතා කුඩා වීම නිසා නැනෝ ද්‍රව්‍යවලට හානියට පත් පාෂාණ ස්කන්ධයන්හි ගැඹුරට විනිවිද යා හැකි ය. පාෂාණ යනු ස්වභාව ධර්මයේ ඇති අකාබනික ද්‍රව්‍යයක් වන අතර එහි සංයුතිය ප්‍රධාන වශයෙන් සකස් වී ඇත්තේ ඔක්සිජන්(O), සිලිකන්(Si), ඇලුමිනියම්(Al), යකඩ(Fe), කැල්සියම්(Ca), සෝඩියම්(Na), පොටෑසියම්(K), මැග්නීසියම්(Mg) වැනි මූලද්‍රව්‍යවලිනි. ග්‍රැනයිට්, ක්වාට්ස්, කිරිගරුඬ, බාසල්ට් ආදි විවිධ පාෂාණ විශේෂ ආභරණ, මූර්ති, කැටයම්, ආයුධ සහ ඉදිකිරීම් සඳහා ඈත අතීතයේ සිටම භාවිත කර ඇත. කාලයාගේ ඇවෑමෙන් ආරක්ෂිත ස්තර වල දුර්වල බව උෂ්ණත්වය උච්ඡාවචනයන්, වර්ෂාපතනය වෙනස්වීම් හා පරිසර දූෂණය ආදිය නිසා මෙම නිර්මාණ ක්‍රමයෙන් විනාශ වෙමින් පවතී. එබැවින් මෙම ද්‍රව්‍ය සංරක්ෂණය උදෙසා දැඩි අවධානය යොමුව ඇත (Dei & Salvadori,2006). පාෂාණ සංරක්ෂණයට ඇති ප්‍රධානම අභියෝග ලෙස සැලකෙන්නේ උපස්තරය අනන්‍යතාව රැක දී ජලභීතික මතුපිටක් නිර්මාණය කරගැනීම යි. තව ද දූෂකවලින් ආරක්ෂා කර ගැනීම සහ කාබනික අකාබනික අංශු තැන්පත් වීම පාලනය සිදු කළ යුතු ය. වර්තමානයේ ශෛලමය නිමවුම් සංරක්ෂණය ප්‍රතිසංස්කරණය සඳහා භාවිත කරන ජලභීතික ආලේපන, පිරිසිදුකාරක, ස්වයං පිරිසිදු කිරීමේ හැකියාව සහිත නැනෝ අංශු ආදිය පිළිබඳ ලොව නන් දෙසින් වාර්තා වෙයි.

මහාචාර්ය Ion සහ ඇගේ පර්යේෂණ කණ්ඩායම විසින් රොමේනියාවේ Basarabi Chalk Churchහි කාලගුණික සාධක නිසා හායනයට ලක් වන ගල් ආකෘතිවල යාන්ත්‍රික ගුණ වැඩි දියුණු කර හායනයට ඔරොත්තු දෙන තත්ත්වයට පත් කිරීමට පර්යේෂණ සිදුකරන ලදී. එහි දී රිදී(Ag), ස්ට්‍රොන්ටියම්(Sr), සින්ක්(Zn), බේරියම්(Ba), පොටෑසියම් (K) සමඟ කාබනීකෘතනැනෝ හයිඩ්‍රොක්සි ඇපටයිඩ්(HAp) සාර්ථකව ගල් ආකෘති සඳහා යොදවන ලදී (Ion *et al*.,2014). එසේම නැනෝ HAp කිරිගරුඩ හා හුණුගල් උදෙසා සාර්ථකව අත්හදා බලා ඇත. උදාහරණ ලෙස අම්ල වැසි විබාදනයට එරෙහිව කිරිගරුඬ සඳහා ආරක්ෂිත ප්‍රතිකාරයක් ලෙස නැනෝ HAp පරීක්ෂාවට ලක් කළ අතර එමඟින් කිරිගරුඬවල ප්‍රතිරෝධය වැඩි දියුණු වනබව නිරීක්ෂණය කරනු ලැබී ය (Scherer,2011). ඉතාලියේ රෝම නගරයේ බැසිලිකා

නෙප්චූන් දේවස්ථානයේ (Bacilica of Neptune) කිරිගරුඬ මතුපිට වූ කළු පැහැති කබොල ඉවත් කිරීම උදෙසා කාබන් නැනෝට්යුබ් (CNT) සාර්ථක ව භාවිත කර ඇත (David *et al*.,2020). එමෙන් ම අකාබනික පාෂාණමය පුරාවිද්‍යාත්මක උරුමයන්වල පවතින සිදුරු පිරවීම උදෙසා කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ් $Ca(OH)_2$, මැග්නීසියම් හයිඩ්‍රොක්සයිඩ් $Mg(OH)_2$, බේරියම් හයිඩ්‍රොක්සයිඩ් $Ba(OH)_2$,, ස්ට්‍රොන්ටියම් හයිඩ්‍රොක්සයිඩ් $Sr(OH)_2$ වැනි සමහර අකාබනික ද්‍රව්‍ය නැනෝ සංයුක්ත කාරක ලෙස ද දැනටමත් භාවිත කෙරේ. තව ද ඉතාලියේ මහාචාර්ය La Russa සහ කණ්ඩායම හුණුගල් සහ කිරිගරුඬ සාම්පල මත *Aspergillus niger* දිලීරයට එදිරි ව ටයිටේනියම් ඔක්සයිඩ් ($TiO_2$) නැනෝ අංශුවල කාර්යක්ෂමතාව අධ්‍යයනය කරන ලදී. ප්‍රතිඵල ලෙස සාම්පල් වර්ග දෙකෙහිම දිලීර වර්ධනය නිෂේධනය සිදු විය. මීට අමතරව නැනෝ ප්‍රතිකර්ම සිදු කරන ලද හුණු ගල් මතුපිට සූර්ය විකිරණ බලපෑම අවම බවත් තහවුරු කර ඇත (La Russa *et al*.,2012). ඒ අනුව හුණුගල්, කිරිගරුඬ ආශ්‍රිත පුරාවිද්‍යාත්මක උරුමයන් සුරැකීම උදෙසා $TiO_2$ නැනෝ අංශු භාවිතයට ගත හැකි ය.

**දාරුමය පුරාවස්තු සංරක්ෂණයේ දී නැනෝ තාක්ෂණයෙහි භාවිතය**

දැව සහ පාෂාණ යනු ලෝකයේ බොහෝ ප්‍රදේශවල පිහිටුවා ඇති විවිධ වර්ගයේ ව්‍යුහයන් නිෂ්පාදනය උදෙසා භාවිත කරන ලද පැරණිතම මූලද්‍රව්‍යයන් වේ (Öztank,2010). මුල දී මෙම ද්‍රව්‍ය විවිධ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භාවිත කරන ලද අතර පසුව විවිධ අලංකාර වස්තූන් නිෂ්පාදනයට යොදා ගෙන ඇත. දැව යනු ස්වභාධර්මයේ විවිධ සාධක සහ ජීවීන්ගේ වාසස්ථානවීම ආදි ක්‍රියාවලීන් නිසා අඛණ්ඩතාවට හානි සිදු වන කාබනික ද්‍රව්‍යයකි. උදාහරණ ලෙස දැවයේ ව්‍යුහාත්මක ශක්තිය නැති වීමට තුඩු දෙන අධික උෂ්ණත්වය, ඉහළ ලවණතාව (මුහුදු සුළංවල ඇති, දැව උපස්තරය බරපතළ වෙනස්කම් ඇති කරන ඉහළ ආර්ද්‍රතාවය, කෘමීන් ආදි නිසා වන ජීව විද්‍යාත්මක හානිය මගින් දැව මෘදු, කැඩෙන හා පිපිරෙන සුලු බවට පත් කෙරේ. එබැවින් පර්යේෂකයන් විසින් දැව සඳහා දිගුකල් පැවැත්මක් ලබා දීමට නව ක්‍රමවේදයක් සෙවීම උදෙසා විවිධ පර්යේෂණ පවත්වනු ලැබේ. එහි ප්‍රතිඵල ලෙස නැනෝ තාක්ෂණය දාරුමය නිෂ්පාදන ආරක්ෂාව උදෙසා යොදා ගැනීම පෙන්වා දිය හැකි ය.

දැවවල අභ්‍යන්තර ව්‍යුහය සම්බන්ධයෙන් ගත් කල එහි බිත්තියේ සෙලියුලෝස් සහ මයික්‍රොෆයිබ්‍රිල(Microfibrils) අතර අවකාශය අර්ධ වශයෙන් පිරීම නිසා අණුක පරිමාණයේ සිදුරු පවතී. කුඩා නැනෝ අංශුවලට කාර්යක්ෂම ලෙස දැව තුළ ගැඹුරට විනිවිද යාමට හැකි නිසා දැව මතුපිට රසායනය වෙනස් කිරීමට හා එහි සාධනීය ගුණාංග වැඩි දියුණු කිරීමට හැකියාව ලැබේ. මීට අමතරව නැනෝ අංශුවේ ප්‍රමාණය ලී බිත්තියේ සිදුරු විෂ්කම්භයට වඩා කුඩා නම් සම්පූර්ණයෙන් විනිවිද යාමට හා ව්‍යාප්තියට අවකාශය සැලසේ (Papadopoulos *et al*.,2019). සාමාන්‍යයෙන් 50 nm ප්‍රමාණයේ $TiO_2$

නැනෝ අංශු තුනී සමජාතිය තට්ටුවක් මගින් දැවයේ ස්වාභාවික පෙනුම වෙනස් නොකර අභ්‍යන්තර ව්‍යුහය ආවරණය කරන බව වාර්තා වේ. $TiO_2$ නැනෝ අංශු මගින් ප්‍රතිකර්ම සිදු කරන ලද දැව විකිරණයන්ට නිරාවරණය කර පරීක්ෂා කිරීමේ දී පාලිත නියැදියට සාපේක්ෂව වර්ණය වෙනස්වීමට ප්‍රතිරෝධී වී ඇති බව තහවුරු විය. තව ද පාරජම්බුල කිරණ (UV කිරණ) සහ තෙතමනයන්ට නිරාවරණය වීම නිසා දැවය සහ එහි ආලේපනය අතර ඇති සියුම් ස්තරයේ ආස්තරණය නිසා ඇතිවෙන ඉරි තැලීම් ආදිය දැවවලට ZnO නැනෝ අංශු භාවිතයෙන් වළක්වාගත හැකි බව අධ්‍යයනයකින් ඉදිරිපත් කර ඇත (Borges *et al*.,2018). ඉතාලියේ මහාචාර්ය De Filo  සහ කණ්ඩායම නැනෝ ද්‍රව්‍ය දැව සඳහා දිලීර නාශක ජෛව නාශක ලෙස කාර්යක්ෂමතාව අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණය සිදු කරන ලදී. එහි දී $TiO_2$ නැනෝ  අංශු දැවයට ප්‍රතිකාර ලෙස භාවිත කර ඇති අතර දැව ශීඝ්‍ර ලෙස දිරාපත් වීමට හේතුවන්නා වූ *Hypocrea lixli, Mucor circinellodies* යන දිලීර සමඟ $TiO_2$ නැනෝ අංශු සම්බන්ධ වේ. $TiO_2$ මගින් ප්‍රතිකාර කළ සාම්පලවල දිලීර ජනපදකරණය වළක්වන බව තහවුරු විය (De Filpo *et al*.,2013).

තව ද ඉන්දියාවේ Shiny ඇතුළු කණ්ඩායම දැව සංරක්ෂණ ගුණ ඇති බව දන්නා ශාක සාරයන් ආශ්‍රිතව කොපර් ඔක්සයිඩ් නැනෝ අංශු ලබා ගන්නා ලදී. මෙහි දී කොහොඹ කොළ (*Azadirachta indica*), මගුල් කරඳ (*Pongamic pinnata*), ගඳපාන (*Lantana camera*)සහ දොඩම් ලෙලි සාරය(*Citrus reticalata*) කොපර් ඔක්සයිඩ් (CuO) නැනෝ අංශු ලබා ගැනීමට යොදා ගෙන ඇත. පාලිත නියැදිය හා සසඳන විට ශාක නිස්සාරණයෙන් ලබාගත් නැනෝ අංශු යෙදීමෙන් දැව මාස හයක කාලයක් සඳහා වේයන්ගෙන් ආරක්ෂා වෙන බව සොයාගෙන ඇත. ලෝහමය නැනෝ අංශු උදෙසා තිරසාර නිෂ්පාදන ක්‍රමවේදයන් ලෙස ශාකසාර මත පදනම් වූ සංස්ලේෂණ මාර්ගය සංවර්ධනය කිරීම තුළින් පරිසර හිතකාමී අයුරින් ජෛව හායනයෙන් දැව ආරක්ෂා කිරීමට හැකි වනු ඇත. ලෝහමය නැනෝ අංශු සහ ශාක සාරයන් එකිනෙකට බද්ධ වී සාර්ථක ප්‍රතිඵල බලාපොරොත්තු විය හැකි ය (Shiny *et al*.,2019).

මීට අමතර ව දැව ආලේපනයක් ලෙස සින්ක් ඔක්සයිඩ් (ZnO) නැනෝ අංශු භාවිතය සිදු කර ඇත. එම දැව කුට්ටි සම්බන්ධයෙන් ගන්නා විට භූගත වේයන්ගේ පරිභෝජනය සැලකිය යුතු මට්ටමින් අඩු වී ඇති බව සහ එය වේයන්ගේ මරණ අනුපාතය වැඩි වීමට හේතු වූ බව තහවුරු කරනු ලැබී ය.· මීට අමතරව දැවමය පුරාවස්තුවල යාන්ත්‍රික ශක්තිය, ජල විකර්ෂක හැකියාව ආදිය ඉහළ නැංවීමටත්, අනවශ්‍ය දැව ප්‍රසාරණය වැළැක්වීමටත් නැනෝ තාක්ෂණය භාවිතයෙන් සිදු කරන ප්‍රතිකර්ම භාවිත කළ හැකි ය (Scherer,2011). දැවමය නිමැවුම් පිළිබඳ සැලකීමේ දී මිනිසා විසින් සොයා ගන්නා ලද දැවයේ වැදගත්ම යෙදුම්වලින් එකක් වන්නේ කඩදාසි නිෂ්පාදනයයි.

## කඩදාසි හා ලෙදර් සංරක්ෂණය සඳහා නැනෝ තාක්ෂණයේ භාවිතය

පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ලේඛන පිළිබඳ සැලකීමේදී අම්ල උත්ප්‍රේරක මගින් සෙලියුලෝස් ජල විච්ඡේදනය කිරීම කඩදාසි දිරාපත් වීමට මූලිකවම බලපානු ලැබේ. 18වන ශතවර්ෂය ආරම්භයේ දී කඩදාසි නිෂ්පාදන තාක්ෂණයේ සිදු වුණු විකාශනයත් සමඟ කඩදාසි වැඩි වශයෙන් ප්‍රතික්‍රියාශීලී ද්‍රව්‍ය සහ ආම්ලික ද්‍රව්‍ය භාවිතයට ගෙන ක්ලෝරීන් (Cl) මගින් (බ්ලීච්) වර්ණහරණයට ලක් කිරීමෙන් සාදා ගනු ලැබේ. උෂ්ණත්වය, ආලෝකය, ආර්ද්‍රතාව වැනි පාරිසරික සාධකවල වෙනස්වීම්වලට දිගුකාලීනව නිරාවරණය වීම මගින් කඩදාසිවල රසායනික හායන ක්‍රියාවලිය වේගවත් වේ. එබැවින් කඩදාසි කල් තබා ගැනීමේ දී ආම්ලිකතාවයන් උදාසීන කිරීම (Deacidification) පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. මෙම ගැටලුවට විසඳුම් ලෙස බොහෝ අවස්ථාවල දී ආම්ලිකතාවයට එරෙහි වූ ක්ෂාරීය මාධ්‍යයක් හඳුන්වා දීම සිදුකරනු ලැබේ. මේ සඳහා සුදුසුම ක්‍රමවේදය ලෙස නිර්ජලීය ද්‍රාවක භාවිතය දැක්විය හැකි ය. භාවිත කරන ද්‍රාවණවල අඩු ධ්‍රැවීයතාව සංරක්ෂණයේ දී මෙම ලේඛනවලට භාවිත කර ඇති තීන්ත දිය වීම අවම කෙරේ (Giorgi *et al*.,2002). ක්‍රි.ව.14,17,19,20 වැනි සියවස්වලට අයත් රෙදිකඩවල සහ කඩදාසිවල ආම්ලික කහ පැහැය ඉවත් කිරීම සහ කඩදාසි නිෂ්ක්‍රීය කිරීමට නැනෝ සහ ක්ෂුද්‍ර අංශු භාවිත කෙරේ. මෙම ක්‍රමවේදය කඩදාසිවලට මෙන් ම කැන්වස්වලට ද යෙදිය හැකි ය. වර්තමානයේ මෙම කඩදාසි සංරක්ෂණය කෙරෙහි භාවිත කරන ක්‍රමවේදයක් ලෙස කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ් $Ca(OH)_2$ නැනෝ අංශු විසුරුවා ඇති මධ්‍යසාර මත පදනම් වූ නව ක්‍රමයක් හඳුන්වා දී ඇත. මෙම නව ක්‍රමවේදය පරිසර හිතකාමී වන අතර මිල අඩු වේ. මේ සඳහා නැනෝ පරිමාණයේ සහ මයික්‍රෝන ප්‍රමාණය $Ca(OH)_2$ නැනෝ අංශු යොදාගනියි. $Ca(OH)_2$ අංශු සෙලියුලෝස් තන්තු මත තැන්පත් වූ පසු වාතයේ ඇති කාබන් ඩයොක්සයිඩ් ($CO_2$) සමග ප්‍රතික්‍රියා කර කඩදාසි තන්තු මත කැල්සියම් කාබනේට් ($CaCO_3$) සංචිතයක් සාදනු ලැබේ. මෙම ක්‍රියාවලිය මගින් කඩදාසිවල pH අගය දීර්ඝකාලීන ව පාලනය කෙරේ (Malešič *et al*.,2019). මීට අමතර ව මැග්නීසියම් හයිඩ්‍රොක්සයිඩ් $Mg(OH)_2$ නැනෝ අංශු සමග කඩදාසි ප්‍රතිකාර කරවීම සඳහා ඉහත අධ්‍යයනය තවදුරටත් සිදු කර ඇත. ආලෝකයට නිරාවරණය වීම නිසා $Mg(OH)_2$ සෙලියුලෝස් උපස්තරය ඔක්සිකාරක ක්ෂය වීමේ වේගය අඩුකරන බව සොයා ගෙන ඇත. මධ්‍යසාරවල විසුරවා හරින ලද නැනෝ අංශු ඉසීම හා කාවැද්දීම හෝ ගිල්වීම මගින් කඩදාසිවලට ප්‍රතිකාර කිරීම සිදු කළ හැකි ය. භාවිත කරන වාෂ්පශීලී, පරිසර හිතකාමී සහ අඩු පෘෂ්ඨීක ආතතිය පැවතීම තුළින් ඒවා ඝන අංශු සඳහා වාහක ලෙස ක්‍රියා කරන අතර නැනෝ අංශුවලට ඒකාකාරී ලෙස සෙලියුලෝස් තන්තුවල ගැඹුරට විනිවිද යාම තහවුරු කෙරේ. පැරණි යටත් විජිත සමයේ කඩදාසිවල මතුපිට බහුල ව දක්නට ලැබෙන දිලීරවලින් කඩදාසි කෞතුක වස්තුවලට වන හානිය වැළැක්වීම උදෙසා මැග්නීසියම් ඔක්සයිඩ් (MgO) නැනෝ අංශුවලින් පැරණි කඩදාසිවලට ප්‍රතිකාර කරන ලදී. 18 වන සියවසේ මුල් භාගයේ වූ කඩදාසි සාම්පල මත MgO නැනෝ අංශු විසුරුවා හැරීමෙන් එම කඩදාසි කෞතුක වස්තුවල පෙනුම/ස්වභාවය වෙනස් නොවී *Aspergillus niger*, *Cladosporiumm cladosporide* සහ *Trichoderm reesei* දිලීර ජනපදකරණය ඵලදායී ලෙස

වැළකෙන බව නිරීක්ෂණය කරන ලදි. මීට අමතරව මෙම ප්‍රතිකාරය *A. niger, T. reesei* දිලීරවල ක්‍රියාකාරීත්වය වළක්වන බව තහවුරු විය ( Malešič *et al*.,2019).

නැනෝ තාක්ෂණය පුරාවිද්‍යාව උදෙසා භාවිතයට ගත හැකි ආකාරය පිළිබඳ ලෝකයේ විද්‍යාඥයන්ගේ අවධානයට පාත්‍රව ඇති බව පෙන්වා දීමට තවත් කදිම නිදසුනක් ලෙසින් අබ්හාර්හි (Abhar) මහාචාර්ය Khamesh විසින් සිදුකරන ලද ලෙදර්/සම් මගින් සාදන පොත් කවර, බැක්ටීරියා සහ දිලීරවලින් ආරක්ෂා කර ගැනීම දැක්විය හැකි ය. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස පොත් කවර මත ක්ෂුද්‍ර ජීවී ජනපදකරණය නැනෝ අංශු මගින් සාර්ථක ව පාලනය වන බව තහවුරු විය (Khamseh 2016).

**ගෘහ නිර්මාණ හා ස්මාරක සංරක්ෂණය උදෙසා නැනෝ තාක්ෂණයේ භාවිතය**

වායුගෝලීය දූෂණය, කාබනික ද්‍රව්‍ය තැන්පත් වීම, ජෛවීය ක්‍රියාකාරකම් හේතුවෙන් ස්මාරක හා ගොඩනැගිලිවල බාහිරය විශාල වශයෙන් හායනය සිදු වේ. උදාහරණ ලෙස පරිසර දූෂණයේ ප්‍රතිඵල ලෙස ඇතිවන අම්ල වැසි ආදිය නිසා ටජ්මහල් වැනි කිරිගරුඬ ස්මාරක හායනය වීමේ දැඩි අවදානමකට ලක්වී තිබේ. මෙම ක්‍රියාපටිපාටීන් වළකා ගැනීම සඳහා නැනෝ අංශු ආශ්‍රිත පිළියම් භාවිතය අද වන විට සිදු වේ. ගෘහ නිර්මාණයන් උදෙසා නැනෝ තාක්ෂණය භාවිතය පිළිබඳ සලකා බැලීමේ දී නැනෝ වාස්තු විද්‍යාව සුප්‍රකට මාතෘකාවකි. නැනෝ වාස්තු විද්‍යාව යනු නව නැනෝ විප්ලවයේ දී ගෘහ නිර්මාණ ශිල්පය උදෙසා විසි එක්වන සියවසේ නැනෝ ද්‍රව්‍ය, උපකරණ, සැලසුම් සහ න්‍යායන් භාවිත කරන ආකාරයයි (Waked,2011). එමගින් දූවිලි, ලවණ ආදිය නිසා අධික ලෙස දූෂණය වීම සහ ගොඩනැගිලි මුහුණත් මත ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය වීම වළක්වන අතර මතුපිට ඇති ක්ෂුද්‍රජීවී ගහන නිසා ඇති වූ ජෛව පැල්ලම්, කුණු-දූවිලි පහසුවෙන් ඉවත් කිරීමට ඉඩ සැලසේ. මේ ආකාරයට පරිසර දූෂණය නිසා වන හායනයන් සමනය කිරීමට නැනෝ ද්‍රව්‍ය සතු හැකියාව, ස්වයං පිරිසිදු කිරීමේ හැකියාව, ප්‍රතික්ෂුද්‍ර ජීවි බලපෑම වැනි ගුණාංග ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා නැනෝ ද්‍රව්‍ය භාවිතය උදෙසා ඉහළ නැඹුරුතාවක් ඇති කිරීමට අත්වැලක් සපයයි. උදාහරණයක් වශයෙන් 2006 වසරේ ඉතාලියේ රෝම නගරයේ ආරා පැසිස් කෞතුකාගාරයට (Museum of the Ara Pacis) ආලේපනයක් ලෙස නැනෝ තාක්ෂණය ආශ්‍රිතව නිපද වූ සුදු පැහැය භාවිත කර ඇත. නැනෝ අංශුවල පෙර සඳහන් කළ සුවිශේෂී ගුණාංග නිසා එම ගොඩනැගිල්ලේ මතුපිට සුදු පැහැය දැඩි ලෙස දූෂිත නගරයක් තුළ නොනැසී පවත්වාගැනීමට හැකියාව ලැබී ඇත. මීට අමතර ව වාස්තු විද්‍යාත්මක කටයුතු සඳහා භාවිත



***ඡායාරූපය-02*** වම්පස රූපයː පිරිසිදු කිරීමට පෙර, දකුණුපස රූපය ː පිරිසිදු කිරීමෙන් පසු, කඩඉරි මගින්ː පිරිසිදු කිරීමේ කලාපය. [https://www.nanowerk.com/spotlight/spotid=52761.php](https://www.nanowerk.com/spotlight/spotid=52761.php) ගෙන් උපුටා ගන්නා ලදි.

කරන දැව සහ පාෂාණ සංරක්ෂණය කිරීමට පෙර සඳහන් කළ අයුරින් $Si_2O_3$, $Ti_2O_3$ නැනෝ අංශුවල භාවිතයේ සාර්ථකත්වය පිළිබඳ ඉතාලියේ මහාචාර්ය Santina විසින් සිදු කරන ලද පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ද තහවුරු විය (Di Salvo,2014). තව ද ජලය තුළ ස්ථායි හයිඩ්‍රොජෙල් (Hydrogel) සකස් කිරීම සඳහා නැනෝ තාක්ෂණය භාවිතයට ගැනීම මහාචාර්ය Lassara ඇතුළු කණ්ඩායම විසින් පර්යේෂණයට බඳුන් කරන ලදි. එහි දී ඔවුන් Hydrogel සඳහා නැනෝටියුබ්වල ස්ථායිකරණ බලපෑම ප්‍රයෝජනයට ගන්නා ලදී. මෙම සකසන ජෙලය වායුගෝලීයකාරකවලට නිරාවරණය වූ පෘෂ්ඨ මත ඇති අපද්‍රව්‍ය කෙරෙහි ඉහළ බැඳීමක් ඇති කර ගෙන ඉවත් කිරීම පහසු කෙරේ. පර්යේෂකයින් විසින් ඉතාලියේ මැඩ්රේ මරියා දේවස්ථානයේ(church of Madre Maria) පිහිටි ප්ලැසිඩෝ කෘෘස්ගේ අවමංගල්‍යය (Placido Caruso-Funeral) නම් කිරිගරුඬ ස්මාරක මත පිරිසිදු කිරීම් කටයුතු සඳහා මෙම ජලයේ ක්‍රියාකාරීත්වය පරීක්ෂාවට ලක් කර අත්හදා බලන ලදී.(ඡායාරූපය-02) එමගින් සාධනීය ප්‍රතිඵල ළඟා කර ගන්නා ලදී (www.nanowerk.com).




*ඡායාරූපය-03*

තව ද නැනෝ ආලේපන ඓතිහාසික උරුමයන්හි පෘෂ්ඨ මත ආලේප කිරීමෙන් ස්වයං පිරිසිදු කිරීමේ කාරක ලෙස ක්‍රියාත්මක වේ. මෙම නැනෝ ප්‍රතිකාර සිදු කිරීමෙන් පසු එම පුරාවස්තුවල දූෂක ද්‍රව්‍ය තැන්පත් වීමෙන් වෙන අපිරිසිදුවීම මඟින් බාහිර දිරාපත් වීමේ ක්‍රියාවලින්ගේ ශීඝ්‍රතාව අඩු කෙරේ. පර්යන්ත ස්ථායීතාව, ජීවවිද්‍යාත්මක සහ රසායනික නිෂ්ක්‍රීය බව, විෂ නොවන බව, අඩු පිරිවැය, UV කිරණ හා දෘශ්‍ය ආලෝක කිරණවලට ස්ථායි බව, විවිධ පරිසරයන්ට හොඳින් අනුවර්තනය වීමේ හැකියාව සහ ජල විකර්ෂණ ගුණ තිබීම ආදිය මෙම ස්වයං පිරිසිදු කිරීමේ ක්‍රියාවලියට හේතු වේ. ඒ අනුව පසු ගිය වසර කිහිපය පුරාවට ම ශෛලමය බිත්ති සහ සිතුවම්වල සල්ෆහරණකාරක (Desulfating) ලෙස ද නැනෝ අංශුවල යෙදීම් පිළිබඳ පර්යේෂණ පවත්වමින් පවතී.

## බිතු සිතුවම් සංරක්ෂණය උදෙසා නැනෝ තාක්ෂණයේ භාවිතය

ප්‍රථම වතාවට බිතු සිතුවම් පිරිසිදු කිරීම සහ සංගත කිරීම සඳහා නැනෝ තාක්ෂණය යෙදීමේ ලා පුරෝගාමී වූයේ මහාචාර්ය Baglioni සහ කණ්ඩායම යි. ඉන් අනතුරුව ශෛලමය පුරාවස්තු උදෙසා ද නැනෝ අංශු භාවිතය Dei සහ Salvodori නම් විද්‍යාඥයින් විසින් ආරම්භ කරන ලදි.[29] ඉතාලියේ Cappella

Brancacci හි Mascaccioගේ බිතු සිතුවම, Beato Angelicoගේ San Marco Abbeyහි බිතු සිතුවම් සහ Piero della Francescaගේ Arezzo සිතුවම ආදිය සංරක්ෂණයට නැනෝ තාක්ෂණය ආශ්‍රිත නව ක්‍රමවේද භාවිත කර ඇත (Baglioni *et al.*,2003). ( ඡායාරූපය-03)

මයිකල් ද්‍රාවණ, ජෙල් සහ ක්ෂුද්‍ර ඉමල්ෂන් භාවිත කර සිතුවම් පිරිසිදු කිරීම හා ප්‍රතිස්ථාපනය සිදු කර ඇත. තව ද බිත්ති සහ තෙල් සිතුවම්වලින් දුම්මල ආදිය ඉවත් කිරීමට සහ බිතුසිතුවම් සංගත කිරීම සඳහා නැනෝ තාක්ෂණය පදනම් කර ගැනීම ලොව පුරා වාර්තා වේ.

**ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයන් සංරක්ෂණයට නැනෝ තාක්ෂණය**

ඉහත සඳහන් වූ අයුරින් ලෝකයේ රටවල් පුරාවිද්‍යාත්මක උරුමයන් සංරක්ෂණය සඳහා නැනෝ තාක්ෂණය භාවිතයට ගත්ත ද ශ්‍රී ලංකාව තුළ පුරාවිද්‍යාත්මක උරුමයන් සුරැකීම උදෙසා නැනෝ තාක්ෂණය භාවිතයට නොගන්නා තරම් ය. වසර 2500කට වඩා ඉපැරණි ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන දේශයක් වශයෙන් ශ්‍රී ලංකාව සතු පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු උරුමයන් මෙතෙකැයි කිව නොහැකි ය. තවමත් පුරාවිද්‍යාඥයන්ගේ අවධානයට ලක් නොවූ උරුමයන් ද රැසකි. මෙම පුරාවිද්‍යාත්මක උරුමයන් වේගයෙන් විනාශයට ලක්වෙමින් පවතී. ඉතා ශීඝ්‍රයෙන් විනාශ වන මෙම උරුමයන් සුරැකීමට විද්‍යාත්මක පරීක්ෂණ ප්‍රමාණය ඉහළ නැංවීම සහ නවීන තාක්ෂණය භාවිතයට ගැනීම කඩිනම් අවශ්‍යතාවකි. ලොව පුරා පුරාවිද්‍යාත්මක උරුමයන් රැක ගැනීම උදෙසා නැනෝ තාක්ෂණ භාවිතයට ගෙන සිදු කර ඇති පර්යේෂණ ආදිය මූලබීජය කොටගෙන ඉදිරියේ දී ශ්‍රී ලංකාව තුළ පුරාවිද්‍යාත්මක උරුමයන් සංරක්ෂණය උදෙසා නැනෝ තාක්ෂණය භාවිතයට ගත යුතු ය. එහි දී නැදුන්, බුරුත, තේක්ක, මහෝගනී, කොස්, කළුවර ආදි ඉහළ වටිනාකමකින් යුතු නානා විධ දාරුමය පුරාවස්තූන් සංරක්ෂණයට ද, එළිමහන් පරිසරවල ඇති ස්මාරක, පිළිම සහ වාස්තුවිද්‍යාත්මක උරුමයන් පාරිසරික හානිවලින් ආරක්ෂා කර ගැනීමට පෙර සඳහන් කළ ක්‍රමවේදයන් යොදා ගත හැකි ය. මීට අමතරව ජාතික ලේඛනාගාරය සතු ලේඛනයන් සහ පුස්තකාලවල ඉපැරණි පොත්පත්වල ආරක්ෂාව උදෙසා ද නැනෝ තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගත හැකි ය. සීගිරිය වැනි ඓතිහාසික උරුමයන්හි පාෂාණ මත ඇඳි සිතුවම් ස්තර සංරක්ෂණට, පුරාවිද්‍යාත්මක උරුමයන්හි ක්ෂුද්‍ර ජීවී හායනයන් වළක්වා ගැනීම ආදියට ශ්‍රී ලංකාව තුළ නැනෝ තාක්ෂණය භාවිතයට ගත හැකි ය. පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ මෙම තාක්ෂණය භාවිතයට පවතින ප්‍රධාන බාධාවන් වන්නේ අවශ්‍ය ප්‍රමාණවත් තරම් පහසුකම් නොමැතිවීම සහ ප්‍රමාණවත් දැනුම සහිත විද්වතුන්ගේ හිඟතාවයයි. මෙම ගැටලු සඳහා සාර්ථකව මුහුණ දීමට ප්‍රධාන වශයෙන් පුරාවිද්‍යාව ආශ්‍රිතව නැනෝ තක්ෂණය භාවිතයෙන් කරන පර්යේෂණ ප්‍රමාණය වැඩි කළ යුතු ය. තව ද ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය, මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමත් අත්‍යවශ්‍යයෙන් සිදු කළ යුතු ය. මීට අමතරව පුරාවිද්‍යාඥයන්ට සහ තාක්ෂණික නිලධාරීන්ට විදෙස්ගත පුහුණු ලබා දී එම තාක්ෂණය ශ්‍රී ලංකාවට රැගෙන ආ යුතු ය. අනාගතයේ දී ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව උදෙසා නැනෝ තාක්ෂණය භාවිතය පිළිබඳ

පර්යේෂණ සිදු කරන විද්‍යාඥයින්ට මූලාශ්‍රයක් ලෙස මෙම අධ්‍යයනය යොදාගත හැකි වේ යැයි හුදෙක් අපේක්ෂා කෙරේ.

## නිගමනය

නැනෝ තාක්ෂණය ලොව පුරා අතිශයින් කතාබහට ලක්වන ක්ෂේත්‍රයකි. නැනෝ පදාර්ථ සතු සාධනීය ගුණාංග නිසා පසුගිය දශක කිහිපය තුළ පුරාවිද්‍යාත්මක උරුමයන් සුරැකීමට නැනෝ පදාර්ථවල භාවිතයන් ලොව නන් දෙසින් වාර්තා වී ඇත. සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය උදෙසා ලෝහමය, අලෝහමය නැනෝ පදාර්ථයන් දායකවන ආකාරය සිත්ගන්නා සුලුය. ශෛලමය, දාරුමය, තන්තුමය පුරාවස්තු සහ වාස්තුවිද්‍යාත්මක උරුමයන් මතු පරපුරටත් ආරක්ෂාකර දීමට මෙම තාක්ෂණය සාර්ථක ව භාවිත කළ හැකි ය. නවීන තාක්ෂණය හා මුසු වූ ලෝකයේ ශ්‍රී ලංකාව ද නුදුරේ දී ම පුරාවිද්‍යාත්මක උරුම සුරැකීම උදෙසා නැනෝ තාක්ෂණය භාවිතයට ගත හැකි නම් එය ඉතා අගනේ ය.

## මූලාශ්‍රය


Ashfaq, A., Khursheed, N., Fatima, S., Anjum, Z. and Younis, K., 2022. Application of nanotechnology in food packaging: Pros and Cons. *Journal of Agriculture and Food Research*, p.100270.

Baglioni, P., Giorgi, R. and Chen, C.C., 2003, June. Nanoparticle technology saves cultural relics: Potential for a multimedia digital library. In *Online Proceedings of DELOS/NSF Workshop on Multimedia Contents in Digital Libraries* (pp. 2-3).

Borges, C.C., Tonoli, G.H.D., Cruz, T.M., Duarte, P.J. and Junqueira, T.A., 2018. Nanoparticles-based wood preservatives: the next generation of wood protection?. *Cerne*, *24*, pp.397-407

David, M.E., Ion, R.M., Grigorescu, R.M., Iancu, L. and Andrei, E.R., 2020. Nanomaterials used in conservation and restoration of cultural heritage: an up-to-date overview. *Materials*, *13*(9), p.2064.

De Filpo, G., Palermo, A.M., Rachiele, F. and Nicoletta, F.P., 2013. Preventing fungal growth in wood by titanium dioxide nanoparticles. *International Biodeterioration & Biodegradation*, *85*, pp.217-222.

Deb, A., Konwar, A. and Chowdhury, D., 2020. pH-responsive hybrid jute carbon dot-cotton patch. *ACS Sustainable Chemistry & Engineering*, *8*(19), pp.7394-7402.

Dei, L. and Salvadori, B., 2006. Nanotechnology in cultural heritage conservation: nanometric slaked lime saves architectonic and artistic surfaces from decay. *Journal of cultural Heritage*, *7*(2), pp.110-115.

Giorgi, R., Dei, L., Ceccato, M., Schettino, C. and Baglioni, P., 2002. Nanotechnologies for conservation of cultural heritage: paper and canvas deacidification. *Langmuir*, *18*(21), pp.8198-8203.

https://www.bbc.com/sinhala/sri-lanka-46791918(Accessed on 20th May 2022)

https://www.nano.gov/nanotech-101/what/definition (Accessed on 20th May 2022)

https://www.nanowerk.com/spotlight/spotid=42713.php (Accessed on 20th May 2022)

https://www.nanowerk.com/spotlight/spotid=52761.php(Accessed on 20th May 2022)

https://www.oxfordlearnersdictionaries.com/definition/english/archaeology (Accessed on 20th May 2022)

https://www.researchgate.net/figure/Figure1-Comparison-between-human-hair-and-nanofiber-web-3_fig1_329829241 (Accessed on 20th May 2022)

https://www.slintec.lk/nano-products/(Accessed on 20th May 2022)

Ion, R.M., Doncea, S.M. and Ţurcanu-Caruțiu, D., 2018. Nanotechnologies in Cultural Heritage-Materials and Instruments for Diagnosis and Treatment. *Novel Nanomaterials. IntechOpen*, pp.173-190.

Ion, R.M., Turcanu-Carutiu, D., Fierascu, R.C. and Fierascu, I., 2014. Chalk stone restoration with hydroxyapatite–based nanoparticles. *Sci. Bull. Valahia Univ. Mater. Mech*, *9*, pp.16-19.

Khamseh, H.A.E.I.D.E.H., 2016. Conservation of leather historical object by Nano technology in archaeology found (Sample study cover leather book). *Journal of Fundamental and Applied Sciences*, *8*(2), pp.276-283.

La Russa, M.F., Ruffolo, S.A., Rovella, N., Belfiore, C.M., Palermo, A.M., Guzzi, M.T. and Crisci, G.M., 2012. Multifunctional TiO2 coatings for cultural heritage. *Progress in Organic Coatings*, *74*(1), pp.186-191.

Malešič, J., Kadivec, M., Kunaver, M., Skalar, T. and Cigić, I.K., 2019. Nano calcium carbonate versus nano calcium hydroxide in alcohols as a deacidification medium for lignocellulosic paper. *Heritage Science*, *7*(1), pp.1-14.

Mohajerani, A., Burnett, L., Smith, J.V., Kurmus, H., Milas, J., Arulrajah, A., Horpibulsuk, S. and Abdul Kadir, A., 2019. Nanoparticles in construction materials and other applications, and implications of nanoparticle use. *Materials*, *12*(19), p.3052.

Moore, S., 2021. An Overview of Nanobots and the Most Recent Developments. *AZoNano, viewed*, *12*.

Öztank, N., 2010. An investigation of traditional Turkish wooden houses. *Journal of Asian Architecture and Building Engineering*, *9*(2), pp.267-274.

Papadopoulos, A.N., Bikiaris, D.N., Mitropoulos, A.C. and Kyzas, G.Z., 2019. Nanomaterials and chemical modifications for enhanced key wood properties: A review. *Nanomaterials*, *9*(4), p.607.

Prasad, R., Bhattacharyya, A. and Nguyen, Q.D., 2017. Nanotechnology in sustainable agriculture: recent developments, challenges, and perspectives. *Frontiers in microbiology*, *8*, p.1014.

Salvo, S., 2014. Nanotechnology for cultural heritage. *Science, Technology and Society: An International Journal*, *2*(2), pp.28-32.

Saylan, Y., Akgönüllü, S. and Denizli, A., 2022. Nanosensors for medical diagnosis. In *Nanotechnology for Hematology, Blood Transfusion, and Artificial Blood* (pp. 195-213). Elsevier.

Scherer G.W. New treatment for corrosion-resistant coatings for marble and consolidation of limestone; Proceedings of the Jardins de Pierres: Conservation de la Pierre Dans Les Parcs; Jardins et Cimetières, Paris. 22–24 June 2011; pp. 289–294.

Shiny, K.S., Sundararaj, R., Mamatha, N. and Lingappa, B., 2019. A new approach to wood protection: Preliminary study of biologically synthesized copper oxide nanoparticle formulation as an environmental friendly wood protectant against decay fungi and termites. *Maderas. Ciencia y tecnología*, *21*(3), pp.347-356.

Sutradhar, K.B. and Amin, M., 2014. Nanotechnology in cancer drug delivery and selective targeting. *International Scholarly Research Notices*, *2014*.

Waked, A.M., 2011. Nano materials applications for conservation of cultural heritage. *WIT Transactions on The Built Environment*, *118*, pp.577-588.

Whatmore, R.W., 2006. Nanotechnology—what is it? Should we be worried?. *Occupational Medicine*, *56*(5), pp.295-299.

# රත්නපුර දිස්ත්‍රික්කයේ වලව් පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් (තෝරාගත් වලව් කිහිපයක් ආශ්‍රයෙන්)

**එච්.කේ. දීපිකා දිල්හානි අත්තනායක**

ලක්දිව නිර්මිත ගෘහ නිර්මාණ ශිල්පයේ තවත් එක් පැතිකඩක් වශයෙන් වලව්ව නමින් හැඳින්වෙන ප්‍රභූ නිවාස මාදිලිය හඳුන්වා දිය හැකිය. රජතුමාට පහළ ශ්‍රේණිවල සිටි රාජ්‍ය නිලධාරියා දක්වා වූ ප්‍රභූන් ජීවත් වූ නිවාස වලව් නමින් හැඳින්විය. එනම් ලක්දිව වැඩවසම් සමාජ ක්‍රමයේ සමාරම්භය සමගින් ධනවත්, බලවත්, තෙදවත් හා කුලවත් ප්‍රභූ පැලැන්තියක් බිහි වූ අතර ඔවුහු තම බලය, ධනය, තේජස පෙන්වනු වස් පුළුල් අංග උපාංග සහිත නිවෙස් තම නිවහන ලෙසින් තනවා ගත්හ. එකී නිවහන හෙවත් ගෘහය සමාජය තුළ වලව්ව නමින් ප්‍රචලිත විය.

රත්නපුර දිස්ත්‍රික්කය සබරගමු පළාතට අයත් දිස්ත්‍රික්ක අතරින් එකක් වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17කින් සමන්විත මෙහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15කම වලව් 170කට අධික සංඛ්‍යාවක් හඳුනා ගෙන ඇත. මඩුවන්වෙල වලව්ව, කුරුවිට එක්නැලිගොඩ වලව්ව, ගොඩකවෙල ඇම්ටියගොඩ වලව්ව, ඇලපාත වලව්ව, එල්ලාවල වලව්ව, රත්වත්ත වලව්ව, තානායම් වලව්ව, මකුල් ඉන්න වලව්ව, මහවලතැන්න වලව්ව, මොරහැල උඩවෙල වලව්ව, ඉද්දමල්ගොඩ වලව්ව, එලමල්පේ වලව්ව සහ මාකඳුර වලව්ව ඉන් සුවිශේෂී වලව් කිහිපයකි. මේ වලව් අතරින් මහවලතැන්න වලව්ව, මොරහැල උඩවෙල වලව්ව, ඉද්දමල්ගොඩ වලව්ව, එලමල්පේ වලව්ව, විකිලිය වලව්ව යන වලව් මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි. එතෙක් පැවති ස්වදේශීය ගෘහ නිර්මාණ හා යටත්විජිත ගෘහ නිර්මාණ ලක්ෂණ ද සංකලනය වෙමින් නව අංග සහිතව මෙම වලව් ඉදි කර තිබීම සුවිශේෂීත්වයකි. කෙසේ නමුත් තරමක් එකිනෙකට වෙනස් අංග මෙන්ම සමාන අංග ලක්ෂණ මේවායෙහි දැක ගත හැකිය.

ලක්දිව සෙසු වලව්වලට මෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ වලව් රැසකටම හිමිව ඇත්තේ ඛේදජනක ඉරණමකි. මෙහි බොහෝමයක් වලව් සම්පූර්ණයෙන්ම විනාශ වී ගොස් ඇති අතර තවත් සමහරක් විනාශ වෙමින් පවතී. තවත් රැසක් මේ වන විටත් විකුණා දමා ඇති අතර ඇතැම් ඒවා ව්‍යාපාරික ආයතන බවට පරිවර්තනය වී ඇත. එමෙන්ම ඇතැම් වලව් සංචාරක හෝටල් බවට පත්ව ඇති අතර බෙහෝමයක් වලව්වල පැරණි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ වෙනස් කරමින් නව ආකාරයකට නිමවා ඇත. මෙම වලව්වල වාස්තුවිද්‍යා ඉදි කිරීම් වර්තමානය වන විට මෙරටින් තුරන් වී යමින් පවතී. මෙම පෞරාණික වටිනා වාස්තුවිද්‍යාත්මක ශිල්පීය ක්‍රමවේදයන් අභාවයට යාමට නොදී ඉදිරි පරම්පරාවට දැක බලා ගැනීම උදෙසා, අධ්‍යාපනය සඳහා අවශ්‍ය සියලුම දූදරුවන් වෙනුවෙන් මෙන්ම වියැකෙමින් යන දේශිය ගෘහනිර්මාණ කලාවට හා ඒ හා බැඳුණු ඉතිහාසයට නව ජීවයක් ලබා දීම සඳහා මෙම උරුමය රැක ගැනීම අවශ්‍යව පවතී. රත්නපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් වලව් කිහිපයක් ඇසුරු කර ගනිමින් ඒවායෙහි වාස්තුවිද්‍යාත්මක සැකැස්ම හා පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකම පිළිබඳ මෙම අධ්‍යයනය සිදු කෙරිණි.

## රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටීම

සබරගමු පළාත තුළ පිහිටි කෑගල්ල හා රත්නපුර යන ප්‍රධාන දිස්ත්‍රික්ක දෙකෙ අතුරින් විශාලතම දිස්ත්‍රික්කය රත්නපුර දිස්ත්‍රික්කයයි. උතුරින් කෑගල්ල හා නුවරඑළිය දිස්ත්‍රික්කවලින්ද, දකුණින් ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවලින්ද, බස්නාහිරින් කළුතර හා කොළඹ දිස්ත්‍රික්කවලින්ද, නැගෙනහිරින් නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවලින්ද සීමා වී ව පිහිටන මෙය උතුරු අක්ෂාංශ $60^{0}$ සිට $7^{0}$ අතර හා නැගෙනහිර දේශාංශ $80^{0}$ සිට $81^{0}$ අතරඋන්නතාංශයකින්පිහිටා ඇත (සිතියම් අංක1.2.1) )https://www.parliament.lk).

## රත්නපුර දිස්ත්‍රික්කයේ තෝරා ගත් වලව්වල පිහිටීම, ආරම්භක වර්ෂය, නිර්මාතෘ ජීවත්වූ පුද්ගලයින් හා පෙළපත් විකාශය.

### පිහිටීම, ආරම්භක වර්ෂය, නිර්මාතෘ

| වලව්වේ නම | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ.කො | ග්‍රා.නි.ව | ආරම්භක වර්ෂය | නිර්මාතෘ |
|---|---|---|---|---|---|
| මහවලතැන්න වලව්ව | රත්නපුර | බලංගොඩ | මහවලතැන්න | ක්‍රි.ව. 1800 දී පමණ | ඇන්. ඩී. එන්. මහවලතැන්න අධිකාරම් වරයා ය. |
| | | | | ක්‍රි.ව. 1900 හා 1911 | සැමුවෙල් ඬේවිඩ් මහවලතැන්න |
| ඉද්දමල්ගොඩ වලව්ව.(වර්තමාන වලව්ව) | රත්නපුර | පැල්මඩුල්ල | බත්ගම්ගොඩ | 1800යේ මුල්භාගයේ දී | ඉද්දමල්ගොඩ ලොකුකෝරළේ බස්නායක නිලමේ |
| මොරහැල උඩවෙල වලව්ව | රත්නපුර | ඉඹුල්පේ | මද්දෙතලාව | 1700 ගණන්වල | මොරහැල දිසාවේ |
| එලමල්පේ වලව්ව | රත්නපුර | ගොඩකවෙල | පනාවල | ක්‍රි.ව. 1508 දී පමණ | එලසමුණි බමුණා |
| විකිළිය වලව්ව. | රත්නපුර | බලංගොඩ | විකිළිය | ක්‍රි.ව. 1896 | ටී.බී.මුල්ගම |

**සිතියම් අංක 1.3.1.,1.3.2,1.3.3,1.3.4**

## ජීවත්වූ පුද්ගලයන් හා පෙළපත් විකාශය.

### මහවලතැන්න වලව්ව.-:

මහවලතැන්න පරම්පරාවේ මූලාරම්භය පනානේ දසනායක මුදියන්සේගේ පරම්පරාවෙන් ආරම්භව රත්වත්ත පරම්පරාව දක්වා විකාශනය වී ඇත. මහවතතැන්න පෙළපතේ ආරම්භකයාය පනානේ දසනායක මුදියන්සේගේ පුතෙකි. ඔහු ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාගේ කාලයේ තංජම ගම්වසමේ මුලැදෑනිවරයා වූ තංජම මුදියන්සේගේ පුතුන් දෙදෙනාගෙන් එක් පුතෙකි. මෙතුමාට පුතුන් 13 දෙනෙකු සිටි බවත් ඉන් එක් පුතෙකු හෙවත් තංජම මුදියන්සේගේ මුණුපුරෙකු මහවල තැන්නෙහි නිවසක් සාදා

පදිංචි ව ඇති අතර පදිංචි වීමෙන් පසු මහවලතැන්න බණ්ඩාර බවට පත්ව ඇත. මහවලතැන්න පරම්පරාවේ ආරම්භකයා හා නිර්මාතෘ මෙතුමා ය. බොහෝ තැන්වල සඳහන් වන්නේ මහවලතැන්න වික්‍රමසිංහ චන්‍ද්‍රසේකර සෙනවිරත්න මුදියන්සේ අධිකාරම් නම් අයෙකු නිර්මාතෘ වන බව යි (විජේරත්න,201:264). කසුන් ෂනිල් රත්වත්ත මහතාට අනුව ද මුලින් ම මහවගතැන්න වලව්ව ඉදි කරනු ලැබුවේ මහවගතැන්න වික්‍රමසිංහ චන්‍ද්‍රසේකර සෙනවිරත්න මුදියන්සේ අධිකාරම්තුමා ය. මේ අනුව මහවලතැන්න බණ්ඩාර, මහවගතැන්න වික්‍රමසිංහ චන්‍ද්‍රසේකර සෙනවිරත්න මුදියන්සේ, මහවලතැන්න බස්නායක රාළහාමි යනු එක් අයෙකුය. මෙතුමා අහංගම කතළුව වලව්වේ ගුණසේකර කුමාරිහාමි සමඟ විවාහ වූ අතර විවාහයෙන් පසුව පුතෙකු හා දියණියක ලැබූ අතර පුතා සැමුවෙල් ඩෙවිඩ් මහවලතැන්න (එස්.ඩී මහවගතැන්න) වන අතර දියණිය ඇසිලින් මහවලතැන්න විය. දියණිය එල්ලාවල වලව්වේ ප්‍රැන්සිස් තියඩෝර් එල්ලාවල සමඟ විවාහ වූ අතර සැමුවෙල් ඩෙවිඩ් මහවලතැන්න එම වලව්වෙහිම එස්ලින් එල්ලාවල සමඟින් විවාහ වී ඇත. මහවලතැන්න පරම්පරාවේ දෙවෙනියා මොහු ය. විවාහයෙන් පසුව ඔහුට දියණියන් තිදෙනෙකු ලැබිණි. එලන් මහවලතැන්න, රොස්මන් හිල්ඩා කොන්ස්ටයින් මහවලතැන්න හා මේබල් මහවලතැන්න එම දියණියෝ තිදෙනා වූහ. නමුත් පරම්පරාව රැගෙන යාමට පුතෙකු නොවූ හෙයින් ඥාති පුතෙකු වන එච්.ඒ. ගුණසේකර (හෙන්රි අභයවික්‍රම ගුණසේකර) ඔහුගේ පුතු ලෙස හදා වඩාගෙන තිබේ. තුන්වෙනි දියණිය වූ මේබල් මහවලතැන්න එල්ලාවල වලව්වේ සිරි එල්ලාවල සමඟ විවාහ වූ අතර හෙන්රි අභයවික්‍රම ගුණසේකර විවාහ වූයේ ඇවැස්ස නෑනා වූ එලන් මහවලතැන්න කුමාරිහාමි සමඟ ය. දෙවන දියණිය වූ රොස්මන් හිල්ඩා කොන්ස්ටයින් මහවලතැන්න කුමාරිහාමි බාන්ස් රත්වත්ත සමඟ විවාහ විය (ඡායාරූප අංක 1.3.2.1.). පුතෙකු නොවූ හෙයින් මහවලතැන්න පරපුර ඩෙවිඩ් මහවලතැන්න මහතාගෙන් අවසන් වූ අතර මෙතුමාගේ මරණින් පසු ඩෙවිඩ් මහවලතැන්න රටේ මහතාගේ දෙවනි දියණිය වූ රොස්මන් හිල්ඩා කොන්ස්ටයින් මහවලතැන්න කුමාරිහාමිට වලව්වේ උරුමය හිමි විය. ඇයට **සිරිමාවෝ රත්වත්ත** (ඡායාරූප අංක 1.3.2.3.), **පැට්‍රීයා රත්වත්ත, බාන්ස් ෂෙල්ටන් රත්වත්ත, සීවලී රත්වත්ත, මැක්සින් රත්වත්ත හා ක්ලිෆ්ර්ඩ් රත්වත්ත** (ඡායාරූප අංක 1.3.2.2.) යනුවෙන් දරුවෝ සය දෙනෙක් වූහ. ඇයගෙන් පසු ක්ලිෆ්ර්ඩ් රත්වත්ත මහතාට වලව්වේ හිමිකාරීත්වය ලැබෙන අතර ඔහු මල්ලිකා කුමාරිහාමි සමඟ විවාහ වූ අතර ඔවුන් දෙපළට දරුවෝ තිදෙනෙක් වූහ. ඔවුන් නම් **මිල්කා රත්වත්ත කුමාරිහාමි, කවිෂ්කා රත්වත්ත කුමාරිහාමි හා කසුන් ශනිල්ක රත්වත්තය** ය. රත්වත්ත සමඟ විවාහ වූ නිසා එතැන් සිට මතවලතැන්න වලව්වෙන් රත්වත්තේ පරම්පරාවක් බිහිවිය.

**ඉද්දමල්ගොඩ වලව්ව.-:**

ඉද්දමල්ගොඩ පරම්පරාවේ ආරම්භකයින් සම්බන්ධයෙන් ලේඛනගත තොරතුරු හමු වන්නේ 17 වන සියවසේ දී පමණ ය. ඉද්දමල්ගොඩ බස්නායක නිලමේ නම් අයෙකු මුලින් ම ජීවත් ව ඇති බව සඳහන් වේ. 1800 ගණන්වල ඉද්දමල්ගොඩ ලොකුකෝරළේ බස්නායක නිලමේ නම් අයෙකු පිළිබඳව සඳහන් වේ. මොහු ඉද්දමම්ගොඩ මුල් වලව්වේ පදිංචිව සිටි අයෙකි. මොවුන් දෙදෙනා කවරුන් සමඟ විවාහය සිදු කරන ලද්දේ ද යන්න සම්බන්ධ සඳහනක් නොමැත. කෙසේ නමුත් ඉද්දමල්ගොඩ ලොකුකෝරළේ බස්නායක නිලමේගේ පුත්‍රයකු සම්බන්ධ තොරතුරු සඳහන් වේ. ඔහු අභයකෝන් අතපත්තු මුදියන්සේ

ඉද්දමල්ගොඩ නිලමේ නම් විය. ඔහු පැල්මඩුල්ලේ වාරිගම වලව්වේ පුංචි කුමාරිහාමි සමඟ විවාහ විය. 1852 දී දියණියක ලැබුණු අතර ඇය ඉද්දමල්ගොඩ පුංචි කුමාරිහාමි නම් වූ බවත් වර්තමාන හිමිකරු වන ඇලපාත මහතා ප්‍රකාශ කළහ (ඡායාරූපය අංක 1.2.3.6.) එක්නැළිගොඩ සිව්වෙනි දිසාව ඉද්දමල්ගොඩ පුංචි කුමාරිහාමි සමඟ විවාහ විය. එම ඔවුන් දෙපළට එක් පිරිමි දරුවෙකු ලැබුණු අතර දරුවා ලැබීමෙන් පසු ඇය ඔහුගෙන් වෙන් ව බදුල්ලේ රඹුක්පොත වලව්වේ ලොකුබණ්ඩාර රටේ මහත්තයා සමඟ විවාහ විය. ඔවුන් දෙපළට **රඹුක්පොත සිල්වා කුමාරිහාමි, ඇලිස් රඹුක්පොත ඇලපාත කුමාරිහාමි, සෝමා රඹුක්පොත දසනායක කුමාරිහාමි හා ස්වර්ණලතා ඉද්දමල්ගොඩ මොලමුරේ කුමාරිහාමි ලෙස දරුවෝ සතර දෙනෙක් වූහ.** ඉද්දමල්ගොඩ රඹුක්පොත කුමාරිහාමිට වලව්වේ හිමිකාරීත්වය හිමි වූ අතර ඇය රත්නපුර ඇලපාත වලව්වේ ඇලපාත දිසාවෙ සමඟ විවාහ විය. ඔහුගේ පුතා ඉද්දමල්ගොඩ ඇලපාත හෙවත් උපාලි නිශ්ශංක ඉද්දමල්ගොඩ ඇලපාත වන අතර වර්තමාන හිමිකරු මෙතුමා වේ.

**මොරහැල උඩවෙල වලව්ව-:**

මොරහැළ පෙළපත හා නැදුම්ගමුව පෙළපත යන පෙළපත් දෙකක පුද්ගලයින් මෙහි ජීවත්ව තිබේ. විහිදිගම තෙරුන්නාන්සේ නම් අයෙකුගෙන් මෙම පෙළපත ඇරඹි බව පුස්කොළ සන්නසක සඳහන් ව ඇත. ඔහුගෙන් පසු පිළිවෙන් ටී.බී. පුංචි බණ්ඩාර මොරහැල කෝරළේ මහත්තයා, කාල් බණ්ඩාර නැදුම්ගමුව හා කාල් බණ්ඩාර නැදුම්ගමුව මහතාගේ දියණිවරුන්ට වලව්වේ හිමිකාරීත්වය ලැබී ඇත. වර්තමානයේ දී මෙම දියණිවරුන් මෙහි වාසය කරනු ඇත.

**එලමල්පේ වලව්ව-:**

එලසමුණි බ්‍රාහ්මණයා හෙවත් එලමල්පේ බ්‍රාහ්මණයා එලමල්පේ වලව්වේ ආරම්භකයා වුවත් එලමල්පේ වලව්වේ මූලික කරගෙන ඇරඹෙන දෙල්ගොඩ පරම්පරාව ආරම්භ වන්නේ ඇගේ දියණියගේ විවාහයෙන් පසු ව ය. එනම් කලවානේ දෙල්ගොඩ සිටි විජේරාම නම් බමුණා හා විවාහ වීමෙන් පසුව ය. ඔවුන් දෙපළට විවාහයෙන් පසුව දරුවන් පස්දෙනෙකු ලැබුණි. ඉන් බාල ම පුතා පුංචි බණ්ඩාර දිසාවේ ය. ඔහුට දරුවන් දෙදෙනෙකු වූ අතර බාල ම දරුවා තෝමස් දෙල්ගොඩ විය. ඔහුට දරුවන් නව දෙනෙකු වූ අතර එඩ්වින් දෙල්ගොඩ බාල ම පුතා විය. එතුමාගේ බාල පුතා ගාමිණී සරත් දෙල්ගොඩ වන අතර වර්තමාන හිමිකරු මොහු ය. ඔහුට **හේෂාන් දෙල්ගොඩ හා ලක්මිණි දෙල්ගොඩ** යනුවෙන් දරුවෝ දෙදෙනෙක් ඇත.

**විකිළිය වලව්ව-:**

තෙන්නකෝන් මුදියන්සෙලාගේ ටිකිරිබණ්ඩාර මුල්ගම විකිළිය වලව් පෙළපතේ ආරම්භකයා විය. මෙතුමා බිබිලේ ලොකු කුමාරි හාමි සමඟ විවාහ වූ අතර විවාහයෙන් පසු දරුවෝ සිව් දෙනෙක් ලැබූහ. පිරිමි ළමුන් දෙන්නෙකු හා ගැහැණු දරුවන් දෙදෙනෙකු වූ අතර ඒ අතරින් වැඩිමහල් පුත්‍රයා කොළොන්න කෝරලේ මහත්තයා හෙවත් එඩ්වින් මුල්ගම වේ. දෙවෙනියා විකිළිය වත්තේ සීසී ඇල්බට් ය. ඇලන් කුමාරිහාමි හා ඇලිස් මුල්ගම කුමාරිහාමි ගැහැණු දරුවෝ දෙදෙනා වූහ. දූවලා දෙදෙනා තරුණ වියට පත් වූ පසුව කටුගහ වලව්වට විවාහ කර දුන්හ. එඩ්වින් මුල්ගම මුල්ගම වලව්වෙහි ම (මහගේ) සිටි අතර

විකිළිය වත්තේ සීසී ඇල්බට් විවාහ නොවන අතර එම පරම්පරාව ඉදිරියට ගෙන යාමට අයෙක් නොවී ය. ඇලන් මුල්ගම කුමාරහාමි කටුගහ උඩහ වලව්වේ බුද්ධදාස කටුගහ මහතා සමඟ විවාහ වීමෙන් පසු විකිළිය වලව්වෙහි පදිංචියට පැමිණ ඇත. ඔවුන් දෙපළට දරුවන් දෙදෙනෙකු ලැබුණු අතර දෙදෙනා ම ගැහැණු දරුවෝ වූහ. බණ්ඩාරණායක හේරත් මුදියන්සේගේ නාලිනී කටුගහ කුමාරිහාමි වැඩිමහල් දුව වන අතර බණ්ඩාරණායක හේරත් මුදියන්සේගේ රෝහිණී කටුගහ කුමාරිහාමි බාල දියණිය විය. රෝහිණී කටුගහ කුමාරිහාමි රත්නපුර මාරලිය වලව්වෙ ලයනල් බර්ඩ් විජේවර්ධන තෙන්නකෝන් සමඟ විවාහ වී එම වලව්වෙහිම පදිංචි වී ඇත. ඔවුන් දෙපළට චාරුණී රූපිකා විජේවර්ධන තෙන්නකෝන් කුමාරිහාමි සහ තේජාන් නිලිමිණී විජේවර්ධන තෙන්නකෝන් කුමාරිහාමි යනුවෙන් දියණියන් දෙදෙනෙකු වූ අතර ඉන් චාරුණී රූපිකා විජේවර්ධන තෙන්නකෝන් කුමාරිහාමි රජවක නැදුම් ගමුව වලව්වේ වාසල විජේසුන්දර මුදියන්සෙලාගේ ලක්ෂ්මන් විජේසුන්දර සමඟ විවාහ වී මෙම වලව්වෙහි පදිංචි ව ඇත. ඔවුන් දෙපළට භාග්‍යා ගිම්හානි විජේසුන්දර කුමාරිහාමි පණ්ඩුක ජනිත මහීදර විජේසුන්දර බණ්ඩාර යනුවෙන් දරුවෝ දෙදෙනෙක් වෙති.

**අධ්‍යයනයට යොදාගත් වලව්වල පුරාවිද්‍යාත්මක හා වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ**

**මහවලතැන්න වලව්ව.-:**

අභ්‍යයන්තර හා බාහිර ව්‍යුහය.-: ඉංග්‍රීසි ජාතික ගෘහනිර්මාණ ශිල්පියෙකු විසින් නිර්මාණය කරන ලද ගෘහනිර්මාණ සැලැස්මක් මත ඉදි කරන ලද වලව්ව අඩි තුනක් උස්වූ පාදම මත ඉස්තෝප්පු කාමරය, ආලින්දය, කාර්යාල කාමරය, නිදන කාමර හතරයි, සේවක කාමරය, ගබඩා කාමර දෙකයි, මුළුතැන්ගේ, මැද මිදුල, වී කොටන කාමරය, වී අටුව, සුවිසල් කුලුනු හා ආරුක්කු යන අංගවලින් සමන්විත වේ. මේ අතරින් වර්තමානය වන විට නිරූපද්‍රිත ව දැකගත හැකි වනුයේ කෑම සාලය හෙවත් කෑම කාමරය දක්වා වූ කොටස පමණක් ය (ඡායාරූප අංක 1.4.1),(සැලසුම් අංක 1.4.1,1.4.2).

**වාස්තුවිද්‍යාත්මක ඉදි කිරීම් ලක්ෂණ.-:**

අඩි 10යි අඟල් 10ක් පමණ පළලකින් හා අඩි 30 අගල් තුනක් පමණ දිගකින් යුක්ත වලව්ව ඉදිරිපස ප්‍රධාන ගොඩනැගිල්ලෙන් ඉදිරියට නෙරා ආ ස්තොප්පුවකි. එයට දකුණින් වූ ආලින්දයේ ඉදිරියට නෙරා ආ කොටස දිගින් අඩි 14ක් හා පළල අඩි 30යි අඟල් තුනක් පමණ වන අතර අනෙක් කොටස දිගින් අඩි 61ක් හා පළලින් අඩි 10යි අඟල් 6ක් පමණ වේ (ඡායාරූප අංක 1.4.2) (සැලසුම් අංක 1.4.). වලව්වේ ආලින්දය වෙතට පිවිසිය හැකි ආරුක්කු තුනකින් සමන්විත බිත්තිය අඩි 30ක් පමණ පළලකින් යුත්තය (ඡායාරූප අංක 1.4.3). දෙපසින් වූ කුඩා ආරුක්කු දෙකහි කවුළුවක් අඩි තුනයි අඟල් 11ක් පමණ පරතරයක් ගන්නා අතර විශාල ආරුක්කුවේ කවුළුවෙහි පරතරය අඩි අටක් පමණ වේ. පිවිසුමේ දෙපස ආරුක්කු දෙක වක්‍රාකාර හැඩයක් ගන්නා අතර මධ්‍යයේ ආරුක්කුව වක්‍රාකාර හැඩයෙන් මිදී තරමක් ත්‍රිකෝණාකාර ස්වාභාවයක් ගනු ඇත. ආලින්දය කොටසෙහි දෙපස නැගෙනහිරින් හා බටහිරින් උතුරට මුහුණලා ඇති ආරුක්කු කවුළුවේහි පරතරය අඩි 9යි අඟල් 10ක් පමණ වේ. ඉදිරියට නෙරා ආ ආලින්දය කොටසෙහි දෙපසින් බටහිරට හා නැගෙනහිරට මුහුණලා ආරුක්කු දෙකක් ද වේ. ආලින්දය ඉදිරියේ වූ ආරුක්කුව

කලාත්මක බවින් යුක්ත අතර ආරුක්කු රේඛාමය කැටයම් මද වශයෙන් මතු කර දක්වා ඇත. මෙම ආරුක්කුමය බිත්ති ගඩොලින් බැඳ හුඹස් මැටි, මී පැණි හා බඹර පැණි මිශ්‍ර බදාමයක් ගා හුණු පිරියම් කර තිබීම විශේෂත්වයකි. දොර කවුළු හා ජනෙල් කවුළුවලට ඉහළින් තීරු කිහිපයකින් ආරුක්කුමය හැඩ එකිනෙක සම්බන්ධව මතුකර දක්වා ඇති අතර අභ්‍යන්තරයේ ඇතිවන උණුසුම පාලනය කිරීම සඳහා එම ආරුක්කුමය රටාවන්ට ඉහළින් වා කවුළු යොදා තිබේ. සාලය මධ්‍යයේ සුවිසල් ආරුක්කුවකි එය ලංකාවේ ඇති පැරණිතම වලව් අතරින් විශාලතම ආරුක්කුව වේ (ජයන්ත විජේරත්න 2019:267). අභ්‍යන්තරයට හා පිටතට විවෘත වන දොරපියන්වලින් සමන්විත වන අතර අභ්‍යන්තරයේ දොර පියන් තුනකින් යුතත් වීදුරු කැබලි එක්කර නිර්මාණය කර ඇති අතර බාහිර දොර පියන් දෙකකින් යුත්ත ව සම්පූර්ණයෙන් ම දැවයෙන් නිම කර ඇත. දොර උළුවහු චතුරස්‍රාකාර කළුගල් පාදමක් මත කුඩුම්බියක් ආධාරයෙන් සම්බන්ධ වේ (ඡායාරූප අංක 1.4.4). ජනේලයක් උස අඩි පහයි අඟල් හතක් පමණ හා පළල අඩි පහයි අඟල් තුනක් පමණ වන ජනෙල්වල පියන් අභ්‍යන්තරයට හා පිටතට විවෘත කළ හැකි අතර අභ්‍යන්තරයේ පියන් හතරක් හා පිටතින් දැවමය පියන් දෙකකි.

**ඉද්දමල්ගොඩ වලව්ව.-:**

අභ්‍යයන්තර හා බාහිර ව්‍යුහය.-: සිංහල හා ඕලන්ද ගෘහ නිර්මාණයට අනුව ඉදි කරන ලද වලව්ව පළලින් අඩි 104ක් වන චතුරස්‍රාකාර බිම් සැලැස්මකට අනුව තනවා ඇත. අඩි 2 1 / 2ක් පමණ උස් වූ කළුගල් පාදමක් මත ආලින්දය, සාලය, කෑම කාමරය, නිදන කාමර, මැද මිදුල, සේවකයන්ගේ කාමර, කරත්ත කාමරය, විශාල කුළුණු, දැව කණු, සෝල්දරය, විශාල දොර ජනෙල් හා උළුවහු, නිමවා ඇති අතර පිය ගැට පෙළ, තාප්පය, සිංහල උළු සෙවිලි කළ වහලය, ගණකම බිත්ති, ආරුක්කු, ජල කාණු යන අංගයගෙන් ද යුක්තය (සැලසුම් අංක 1.4.4,1.4.5).

වාස්තුවිද්‍යාත්මක ඉදි කිරීම් ලක්ෂණ.-: දිගින් අඩි 104ක් හා පළලින් අඩි 11ක් පමණ වන ඍජුකෝණාස්‍රාකාර හැඩයෙන් යුත් සුවිසල් ආලින්දයක් හා එයට දකුණු පසින් දිග අඩි 50ක් හා පළල අඩි 14ක් පමණ වන කුඩා ආලින්දයකි. එහි අඩි හයක් පමණ වන වට ප්‍රමාණයකින් යුත් සුවිසල් කුලුනු තුනකින් සමන්විත වන අතර ගෙබිම අඟල් කිහිපයක් උස් ව චතුරස්‍රාකාර බිම් ගල් අතුරා නිමවා ඇත. කෑම කාමරය හා නිදන කාමර සතරට මැදිව දිගින් හා පළලින් අඩි 27 x 23 පමණ ප්‍රමාණයෙන් යුත් සාලය එය වෙතට පිසීමට සිව් දෙසින් දොර කවුළු දෙක බැගින් අටකි. සාලය හා මැද මිදුල අතර දිගින් හා පළලින් අඩි 50 x 16ක් පමණ වන ඍජුකෝණාස්‍රාකාර හැඩයෙන් යුත් කෑම කාමරයකි. විශාලත්වය අතින් කුඩා ම නිම කර නිදන කාමර දහයකි. එක් කාමරයක සිට තවත් කාමරයකට පිවිසීමට හැකි ලෙස එක් කාමරයක පිවිසුම් දොරටු කිහිපයක් තිබීම ද විශේෂත්වයකි ඍජුකෝණාස්‍රාකාර හැඩති සුවිසල් මැද මිදුල වර්තමානය වන විට ගරා වැටී ගොස් ය. අඩි 5 අඟල් 5ක් පමණ පළලකින් සමන්විත ඉස්තොප්පුවක් මැද මිදුල වටා ඉදි කර තිබූ අතර එහි උතුරු දෙසින් වන ඉස්තෝප්පුව පමණක් ශේෂ ව ඇත. මෙහි උස් වූ කළුගල් පාදමක් මත කුඩුම්බියක් ආධාරයෙන් සවි කරන ලද දැවයෙන් කළ සතරුස් කණු පේළියක් වන අතර දැනට ශේෂ ව ඇත්තේ ඉන් කණු අටක් පමණි. වර්ෂා කාලයේ දී මැද මිදුලට වැටෙන ජලය බැස යාම සඳහා නිම වූ ජල

කාණුවක් එය වටා නිමවා ඇති අතර එහි ද දක්නට ලැබෙන්නේ ශේෂ වූ කොටසක් පමණ ය. සේවක කාමර, කුස්සිය, කෑම කාමරය යන කාමර තුළට ආලෝකය ලබා ගැනීම සඳහා මෙම මැද මිදුල නිමවා ඇත. ඕලන්ද ගෘහ නිර්මාණයන්ගේ බලපෑම නිරූපණය වන ද්විත්ව හා තනි කුලුනු කිහිපයකි. බද කොටස අඩි හතරක පමණ වටප්‍රමාණයකින් යුත්තව වක්‍රාකාර හැඩයෙන් චතුරස්‍රාකාර වේදිකාවක් හා අලංකාර වේදිකා ශීර්ෂයකින් නිමවූ ද්විත්වව යෙදූ කුලුනු හතක් හා දෙපස බිත්තියට තනිව යෙදූ කුලුනු දෙකකි. වලව්ව ඉදිරියේ සුවිසල් මිදුලකි. මෙය වටා කුඩා ගල් කැබලි එක් කර නිමවන ලද සුවිසල් ප්‍රාකාර මිටි තාප්පයකි. තාප්පයෙහි අඩි කිහිපයක් දුරින් උස් ව නිම කරන ලද කලාත්මක කුලුනු කොටස්වලින් සමන්විත ය.

**මොරහැල උඩවෙල වලව්ව-:**

අභ්‍යන්තර හා බාහිර ව්‍යූහය.-: දිගින් හා පළලින් අඩි 77 x 57 1/2 පමණ විශාලත්වයකින් සමන්විත වලව්වෙහි බිම් මට්ටමේ සිට අඩි 2 1/2 පමණ උස් වූ කළුගල් පාදම මත ඉස්තෝප්පුව, ආලින්දය, සාලය, කෑම කාමරය, කළුවර කාමරය, නිදන කාමර 3යි, මැද මිදුල, කුස්සිය, ගබඩාකාමර, වී අටුව, පොල්කාමරය, කන්තෝරු කාමරය, විහාර කාමරය, නාන කාමරය, චිම්නිය සෝල්දරය, දැව කණු හා වක්‍රාකාර කුලුනු, සිමෙන්ති පිරි මැදි ගෙබිම, දැවයෙන් කළ සිවිලිම, පියන් දෙකේ දොර ජනෙල් යන අංගයගෙන් සමන්විතය (ඡායාරූප අංක 1.4.5, 1.4.6,),(සැලසුම් අංක 1.4.6,1.4.7) .

වාස්තුවිද්‍යාත්මක ඉදි කිරීම් ලක්ෂණ.-: 1919 දී පමණ වලව්ව ඉදිරියෙහි දිගින් අඩි 15 අඟල් 6 හා පළිලින් අඩි 15 අඟල් 1 පමණ වන ස්තෝප්පුවක් ඉදි කර ඇති අතර එහි ගෙබිම දෙපස ගෙබිමෙන් මදක් ඉහළට නෙරා එන අයුරින් මල් පෝච්චි තැබීම සඳහා තීරු දෙකක් වෙන් කර ඇත. මල් පෝච්චිවලට ජලය දැමීමේදී ඉස්තෝප්පුව අභ්‍යන්තරයට ජලය ගලා ඒම ඉන් වළකනු ඇත. ඉස්තෝප්පුව දෙපසින් අඩි 2 අඟල් 4ක පමණ වට ප්‍රමාණයකින් යුක්ත ද්විත්ව කුලුනු 4ක් හා තනි කුලුනු 2කි. වක්‍රාකාර හැඩයෙන් යුත් ශීර්ෂය හා පාදමෙහි වූ වේදිකා දෙක වෙන වෙනම සම්බන්ධ නොකර නිමවා තිබීම මෙහිදී විශේෂ වන අතර ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පය පිළිබිඹු වේ(ඡායාරූප අංක 1.4.8). දිගින් හා පළලින් අඩි 21 x 10ක් පමණ සාලයකි. එයට දකුණින් අටස්‍රාකාර හැඩයක් ගන්නා කෑම කාමරයකි. මැද මිඳුලෙන් එන ආලෝකය කෑම කාමරයට වැටීමට දකුණු දෙසින් වූ බිත්තියෙහි තරමක් විශාල ජනෙල් කවුළුවකි. කෑම කාමරයට දකුණු පසින් අඩි 21ක් පමණ පළල මැද මිදුලකි. මැද මිදුලට වැටෙන ජලය පිට කර හැරීම සඳහා මැද මිදුලෙහි වයඹ දෙසින් නිර්මාණය කරන ලද ජල කාණුවකි. මැද මිදුල වටා වීඅටුව, පොල් කාමරය හා විහාර කාමරය යන අංගයන්ගෙන් සමන්විත වන අතර වර්තමානයෙහි එහි වෙනස්කම් සිදු කර තිබෙනු ඇත. දැවයෙන් කළ පඩි පෙළක් සහිත වලව්වෙහි බටහිර දෙසින් වූ නිදන කාමර තුනට ඉහළින් සොල්දර තුනක් දැක ගත හැකිය. ඉස්තෝප්පුව, ආලින්දය හා කෑම කාමරයට ඉහළින් දැව පටි යොදා සිවිලිම සකසා ඇති අතර ස්තෝප්පුව හා කෑම කාමරයට ඉහළින් වූ සිවිලිම වහලයෙහි හැඩයට අනුව නිමවා තිබීම විශේෂත්වයකි. ජනෙල්වල විශේෂත්වය වන්නේ අභ්‍යන්තරයට හා බාහිරට විවෘත කළ හැකි ලෙස ජනෙල් පියන් 4කින් සමන්විත වීමය. අභ්‍යන්තරයේ වූ ජනෙල් පියන් වීදුරු යොදා නිමවා ඇති අතර

බාහිර ජනෙල් පියන් දැවයෙන් පමණක් සකසා ඇත. අභ්‍යන්තර ජනෙල් පියන් වසා තිබියදී බාහිර ජනෙල් පියන් පමණක් විවෘත කළ හැකි වීම නිසා ඉතා හොඳින් ආලෝකය නිවස තුළට පතිත වන අතරම මැසි මදුරුවන් වැනි සතුන් ඇතුල්වීම වළකයි (ඡායාරූප අංක 1.4.6 )

**එලමල්පේ වලව්ව-:**

අභ්‍යන්තර හා බාහිර ව්‍යූහය.-: දිගින් අඩි 60ක් හා පළලින් අඩි 45ක් පමණ විශාලත්වයෙන් යුක්ත වලව්ව සාම්ප්‍රදායික ගෘහ නිර්මාණ ශිල්පය හා ලන්දේසී ගෘහ නිර්මාණ ශිල්පය  සම්මිශ්‍රණව ඉදි කරන ලද්දකි. එය ආලින්දය, සාලය, කළුවර කාමරය, කෑම කාමරය, කුස්සිය, නිදන කාමර 3යි, මස් කාමරය, ඊට අමතරව පුංචි ඉස්තෝප්පුව, බුදු කුටිය උස් වූ පාදම, සෝල්දරය (ඡායාරූප අංක 1.4.10), සනකම හා සුදු හුණු පිරියම් කළ බිත්ති, පෝටිකෝව, සිංහල උළු සෙවිලි කළ වහලය, පියගැට පෙළ, පියන් දෙක සහිත දොර කවුළු හා ජනෙල් කවුළු, ද්විත්ව කුලුනු, දුම් කවුළුව යන අංගයගෙන් සමන්විතය (ඡායාරූප අංක 1.4.8).(සැලසුම් අංක 1.4.8,1.4.9)

වාස්තුවිද්‍යාත්මක ඉදි කිරීම් ලක්ෂණ.-: කළු ගල් කුට්ටි භාවිත කරමින් අඩි 2ක් පමණ උස් වූ පාදමකි. වර්ෂා කාලයේදී ජලය නිවස තුළට කාන්දු වීමෙන් වළක්වා ගැනීම සඳහා අඩි 1 1/2ක් පමණ ඝණකම බිත්ති හා උළු කැට විශාල ප්‍රමාණයක් සමන්විතව වහලය දරා ගැනීමට හැකි ලෙස පාදම නිමවා ඇත. ආලින්දය දිග අඩි 43ක් පමණ හා පළල අඩි 12ක් පමණ වන ඍජුකෝණාස්‍රාකාර හැඩයෙන් යුත් අතර එම හැඩයේම පළල අඩි 9ක් හා දිග අඩි 26ක් පමණ වන සාලයකි. සාලය වෙතට දොර පියන් විවෘත කරන ආකාරයෙන් නිමවා තිබීමත් පිවිසුම් දොරටු දෙක එක එල්ලේ ස්ථානගත කිරීමත් තුළින් සාලයේ අවහිරතාව මඟහරවා ගෙන ඇත. දිග අඩි 28ක් හා පළල අඩි 9ක් පමණ වන ඍජුකෝණාස්‍රාකාර හැඩයක් යුක්තව කෑම කාමරයක් හා දිගින් අඩි 21ක් හා පළලින් අඩි 13ක් පමණ වන කුස්සියක්ද වේ. කුස්සිය වෙනම මුදුන් බිත්ති සහිත වහලයකින් යුක්තව ප්‍රධාන ගොඩනැගිල්ල හා සම්බන්ධ කරමින් නිමවා ඇත. ප්‍රධාන ගොඩනැගිල්ලේ වහලය ඔස්සේ එන ජලය හා කුස්සියේ වහලය ඔස්සේ එන ජලය බැස යාමට ප්‍රධාන ගොඩනැගිල්ලේ වහලය හා කුස්සියේ වහලය සම්බන්ධ වන ස්ථානය අතර දැවයෙන් කළ පීල්ලකි (ඡායාරූප අංක 1.4.9). ලන්දේසී ගෘහ නිර්මාණ ශිල්පය පිළිබිඹු වන කුස්සියෙහි කෑම පිසීමේදී රැස් වන දුම පිටව යාම සඳහා නිමවූ දුම් කවුළුවක්ද වේ (ඡායාරූප අංක 1.4.11). දැවයෙන් කළ දොර අගුළු දැක ගත හැකිය. මෙම අගුලෙහි විශේෂත්වය වන්නේ හරස් අතට දමන තිරස් පොල්ල නිසා පිටතින් දොර ඇතුලට තල්ලු කිරීමට නොහැකි වන ලෙස සිරවීමය (ඡායාරූප අංක 1.4.12). ජනෙල් කවුළුවල ත්‍රිකෝණ දෙකක් එකට සම්බන්ධ කළ ස්වාභාවයක් දිස් වන සිරස් කිතුල් පොලු වේ. හිඩැස් අතරින් පිටත සිට බලන්නෙකුට ඇතුළත නොබෙනෙන ලෙසත් ඇතුළත සිට බලන්නෙකුට පැහැදිලිව පිටත පෙනෙන ආකාරයෙනුත් නිමවා තිබීම විශේෂත්වයකි.

**විකිළිය වලව්ව-:**

අභ්‍යයන්තර හා බාහිර ව්‍යුහය.-: දිගින් අඩි 72ක් හා පළලින් අඩි 35ක් පමණ වන ඍජුකෝණාස්‍ර ආකෘතික සැලැස්මක් මත ඉදි වූ වලව්ව ඉස්තෝප්පුව, සාල දෙකයි, කෑම කාමරය, කාර්යාල කාමරය, නිදන කාමර හතරයි, මැද මිදුල, කුස්සිය, ගබඩා කාමර දෙකකින් සමන්විත වේ.(ඡායාරූප අංක 1.4.13)(සැලසුම් අංක 1.4.10,1.4.11)

වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් ලක්ෂණ.-: බිම් මට්ටමේ සිට අඩි 1 1/2ක් පමණ උස් වූ කළු ගල් පාදමක් මත දිගින් හා පළලින් අඩි 15 x 15 පමණ වන ඉස්තෝප්පුවක්, දිගින් හා පළලින් අඩි 15 x 9ක් පමණ වන ආලින්දයක්, එයට යාබදව දකුණු පසින් පළලින් හා දිගින් අඩි 10 x 15 සාලයකි (ඡායාරූප අංක 1.4.15). ආලින්දයට නැගෙනහිර දෙසින් කාර්යාල කාමරය හා බටහිර දෙසින් නිදන කාමරයත්, සාලය දෙපස නිදන කාමර දෙකකුත් පිහිටා ඇත. දිගින් හා පළලින් අඩි 24 x 8ක් පමණ වන කෑම කාමරයක්, අඩි 9 x 9 දිගින් හා පළලින් සමන්විත කාර්යාල කාමරයක්, අඩි 9 x 9 දිගින් හා පළලින් යුත් සමචතුරස්‍රාකාර කාමරයක්, දෙවන සාලය දෙපස වූ නිදන කාමර දෙක අඩි 10 x 9 දිගින් හා පළලින් යුත් ඍජුකෝණාස්‍රාකාර හැඩයේ කාමර දෙකක්, එය දිගින් අඩි 9 පළලින් අඩි 8 වන ඍජුකෝණාස්‍රාකාර හැඩයෙන් යුත් සිර කාමරයක් වේ. මධ්‍යයේ වූ සාලය හා එම සාලයට බටහිර දෙසින් ඇති නිදන කාමරයට ඉහළින් වන, මධ්‍යයේ වූ සාලයට නැගෙනහිර දෙසින් වූ නිදන කාමරය හා සිර කාමරයට ඉහළින් හා කෑම කාමරයට ඉහළින් සොල්දර තුනකි (ඡායාරූප අංක 1.4.16). අඩි 31 අඟල් 1/2 x අඩි 4යි අඟල් 10ක දිග පළලකින් යුත් ලෑටිස් තීරු හතරක් ඉස්තෝප්පුවෙහි දෙපසින් වන දැව කණු අතර තිරස් අතට යොදා තිබේ (ඡායාරූප අංක 1.4.17). අඩි 8යි අඟල් 7ක් පමණ උසකින් යුත් සතරැස් කළුගල් පාදමකට කුඩුම්බියක් ආධාරයෙන් සවි කරන ලද කුලුනුවල ශීර්ෂය තනි ලීයෙන්ම නිමවා තිබීම විශේෂ ලක්ෂණයකි.

**වලව්වල භාවිත ගෘහ භාණ්ඩ හා සෙසු උපකරණය**

**මහවලතැන්න වලව්ව**

- කුරහන් ගල
- බෙහෙත් අඹරන ගල්
- වෘතාකාර හා අටස්‍රාකාර මේස
- මේස ලාම්පු
- ඇඳුම් රදවනය

**විකිළිය වලව්ව**

- ග්‍රැමෆොනය
- පැරණි ගුවන් විදුලිය
- බස්තම
- මරායුධ
- කෙණ්ඩිය
- හෙප්පුව
- ආභරණ පෙට්ටිය
- ලියන මේසය
- පුවක් ලියනය
- සේරක්කලය

**මොරහැල වලව්ව**

- වී අටුව
- දෝලාව


(ඡායාරූප අංක 1.5.1-1.5.11).

**මූලාශ්‍රය**

ඇදගම, පණ්ඩුල. (2003). **සබරගමු වංශ කථාව.** සබරගමු පළාත් සභාව.

ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (1942). **සපරගමුවේ පැරණි ලියවිලි**. කොළඹ : ජනලංකා ප්‍රෙස්.
ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (1967). **සපරගමු දර්ශන**. රත්නපුර : ශාස්ත්‍රෝදය.
ප්‍රේමකීර්ති, රණතුංග. **සබරගමුවේ පුරාණ නින්දගම්.** 03 කොටස (ඉරිදා ලංකාදීප 2017.11.26 රසවිත අතිරේකය)
බණ්ඩාර, උදය ඇමටියගොඩ. (2006). **සබරගමුවේ වංශ කතාව**. කුලියාපිටිය : ශාස්ත්‍රෝදය.
විජේරත්න, එච්. එම්. ජේ. (2019). **රත්නපුර දිස්ත්‍රික්කයේ වලව් පෙළපත් කිහිපයක්**. නුගේගොඩ :සරස ප්‍රකාශකයෝ.

## සිතියම්, ඡායාරූප හා සැලසුම්



**සිතියම් අංක 1.2.**
**1 රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටීම.**




**සිතියම් අංක 1.3.1.**
**මහවලතැන්න වලව්වේ පිහිටීම.**



**සිතියම් අංක 1.3.2.**
**ඉද්දමල්ගොඩ වලව්වේ පිහිටීම.**




**සිතියම් අංක 1.3.3.**
**මොරහැල වලව්වේ පිහිටීම.**



**සිතියම් අංක 1.3.4.**
**එලමල්පේ වලව්වේ පිහිටීම.**



**1.3.2.1.රොස්මන්ඩ් හිල්ඩා කොන්ස්ටයින් හා බාන්ස් රත්වත්ත**
**https://www.google.com/**



**1.3.2.2.**
**කමල් රත්වත්ත**
**https://www.sundaytimes.lk/**



**1.3.2.3. සිරිමා මැතිනිය හා දොන් සොලමන් ඩයස් බණ්ඩාරනායක ගේ විවාහය**
**https://www.google.com/**



**1.3.2.4. කෝරළේ මහත්තයා හා ඔහුගේ දරුවන් දෙදෙනා**



**1.3.2.5.ඇලන් මුල්ගම කුමාරිහාමිනේ**



**1.3.2.6. ඉද්දමම්ගොඩ පුංචි කුමාරිහාමි**
**https://roar.media**



**1.4.1. මහවලතැන්න වලව්ව ඉදිරි පස**



1.4.2. ආලින්දය ඇතුලත කොටස



1.4.3. ඉදිරි ආරුක්කු තුන



1.4.4. කුඩුම්බි ගල් පාදම



1.4.5. සිවිලිම



1.4.6. පියන් දෙකේ



1.4.7 ස්තෝප්පු වෙහි වන ද්ත්ව කුළුණු



1.4.8. එලමල්පේ වලව්වේ ඉදිරි පෙණුම



1.4.9. දැව පීල්ල



1.4.10. සෝල්දරය



1.4.11. දුම් කවුළුව



1.4.12. දොර අගුළු



1.4.13. වලව්වෙ ඉදිරි පෙනුම



1.4.15. සාලය



1.4.16. සාලයට ඉහළ සොල්දරය අභ්‍යයන්තරය



1.4.17. ලැටිස් තීරු



1.5.1. කුරහන් ගල



1.5.2. බෙහෙත් අඹරන ගල්



1.5.3. අටස්‍රාකාර මේසය



1.5.4. මේස ලාම්පු



1.5.5. ඇඳුම් රදවනය



1.5.6. දෝලාව



1.5.7. ග්‍රැමෆෝනය



1.5.8. පැරණි ගුවන් විදුලිය




1.5.9. බස්තම



1.5.10. පුවක් ලියනය



1.5.11. සේරක්කලය




01 ස්තොප්පුව
02 ආලින්දය
03 සාලය
04 නිදන කාමර
05 කෑස සාලය
06 කාර්යාල කාමරය


1.4.1.මහවල තැන්න වලව්වේ බිම් සැලසුම



1.4.2. මහවලතැන්න වලව්වේ ඉදිරි පෙනුම




1.4.3. ආරුක්කු තුන සහිත පිවිම් ආරුක්කුව.




01 ආලින්දය
02 කුඩා ආලින්දය
03 සාලය
04 කෑම කාමරය
05 ස්තෝප්පුව
06 නිදන කාමර
07 කරත්ත කාමරය
08 සාමාන්‍ය ජනයාට රුද සිටීමේ කාමර
09 කුස්සිය
10 මැද මිදුල
11සේවකයිගේ කාමර
12 ජල කාණු
13 පිය ගැට පෙළ
14 ඉදිරි මිදුල
15 තාප්පය


1.4.5. මොරහැල වලව්වේ බිම් සැලැස්ම.



1.4.4 ඉද්දමල්ගොඩ වලව්වේ ඉදිරි පෙණුම.




1.4.6. මෙරහැල වලව්වේ ඉදිරි පෙනුම.



01 ස්තෝප්පුව
02 ආලින්දය
03 සාලය
04 කෑම කාමරය
05 නිදන කාමර 3යි
07 ගබඩාකාමර
06 විහාර කාමරය
08 මැද මිදුල
09 කුස්සිය
10/11 ස්තෝප්පුව
12වීඅටුව හා පොල්කාමරය
13 කරත්ත කාමරය

1.4.7. මෙරහැල වලව්වේ බිම් සැලැස්ම.




1. ආලින්දය
2. සාලය
3. කළුවර කාමරය
4. කෑම කාමරය
5. කුස්සිය
6. නිදන කාමර
7. මස්කාමරය
8. පුංචි ස්තෝප්පුව
9. බුදු කුටිය


1.4.8. එලමල්පේ වලව්වේ බිම් සැලැස්ම.




1.4.9 එලමල්පේ වලව්වේ ඉදිරි පෙනුම.



**1.4.10. කිළිය වලව්වේ පැති පෙනුම.**




**1.4.11. කිළිය වලව්වේ බිම් සැලැස්ම**



Ivory carvings - Ridee Viharaya